**රූප සටහන 1**




**ශ්‍රී ලංකාවේ ජාතික මාර්ග පද්ධතිය**

## හැඳින්වීම

2011 වර්ෂය සඳහා වන මාර්ග සංවර්ධන අධිකාරියේ මෙම වාර්ෂික වාර්තාව මාර්ග සංවර්ධන අධිකාරියේ සංවිධානමය හා මෙහෙයුම් අංශයන් පිළිබඳව සංක්ෂිප්තව සාකච්ඡා කරනා අතර කාර්ය සාධනය හා ශාක්ෂාත් කිරීම් පිළිබඳව වඩා විස්තරාත්මක තොරතුරු සපයයි.

වාර්තාව ආරම්භයේදී මා.සං.අ.යේ මෙහෙයුම් අංශයන් පිළිබඳව දළ විශ්ලේෂණයක් සපයා ඇති අතර, මා.සං.අ.යේ සංවිධාන අංශය පිළිබඳව 2 වැනි පරිච්ඡේදයේදී සාකච්ඡා කර ඇත. 3 වැනි පරිච්ඡේදයේදී සෑම මෙහෙයුම් අංශයකම කාර්යයන් හා වගකීම පිළිබඳව ගණනය කිරීමක් සිදුකර තිබේ. වාර්තාවේ 4 වැනි පරිච්ඡේදයේදී වර්ෂය තුළ සෑම අංශයකම වැඩ හා සේවා පිළිබඳව සවිස්තරාත්මකව සාකච්ඡා කරයි.

මා.සං.අ. එහි කාර්යයන් හා වගකීම් ඉටුකිරීමේදී මුහුණදුන් ප්‍රතිරෝධයන් හා එවැනි ප්‍රශ්න පාලනය කිරීමට ගන්නා ලද පියවරයන් වාර්තාවේ 5 වැනි පරිච්ඡේදයෙන් ඉදිරිපත් කර ඇත.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් සෘජුවම කළමනාකාරිත්වය භාරගැවන ලද සෑම විදේශ අරමුදල් ව්‍යාපෘතියන් පිළිබඳවම සවිස්තරාත්මක තොරතුරු 6 වැනි පරිච්ඡේදයට අන්තර්ගත කර තිබේ.

මා.සං.අ.යේ සමස්ත මූල්‍ය සාධනය 7 වැනි පරිච්ඡේදයෙන් ඉදිරිපත් කර ඇති අතර, ශාක්ෂාත් කිරීම්, පරමාර්ථයන් හා අරමුණු 8 වැනි පරිච්ඡේදයෙන් දක්වා තිබේ.

මා.සං.අ.යේ මූල්‍ය ප්‍රකාශයන් ඇමුණුම් 1 දක්වා තිබෙන අතර, සමස්ත මූල්‍ය සාධනය වාර්තාවේ ඇමුණුම් 11 දක්වා ඇත.



**පටුන**


| | පිටු අංක |
|---|---|
| **1 වැනි පරිච්ඡේදය** | **1** |
| **දළ විශ්ලේෂණය** | **1** |
| **2 වැනි පරිච්ඡේදය** | **6** |
| **මාර්ග සංවර්ධන අධිකාරිය - ආයතනය පිළිබඳ හැඳින්වීමක්** | **6** |
| 2.1 මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්යභාරය | 7 |
| 2.2 *මා.සං.අ.යේ කළමනාකාරිත්වය* | 7 |
| 2.3 දැක්ම, මෙහෙවර, පරමාර්ථ හා අරමුණු | 9 |
| 2.4 මා.සං.අ.යේ ආයතන ව්‍යුහය | 10 |
| 2.5 මා.සං.අ.යේ සේවකයන් | 10 |
| 2.6 කාර්ය අංශයන් | 11 |
| 2.7 පළාත් ව්‍යුහය | 13 |
| **3 වැනි පරිච්ඡේදය** | **17** |
| **අංශවල කාර්යයන් හා වගකීම්** | **17** |
| 3.1 නඩත්තු කළමනාකරණ හා ඉදිකිරීම් අංශය | 17 |
| 3.2 වැඩ අංශය | 19 |
| 3.3 ඉංජිනේරු සේවා අංශය | 20 |
| 3.4 මාර්ග සැලසුම් අංශය | 21 |
| 3.5 ග්‍රාමීය පාලම් ඉදිකිරීම් ඒකකය | 22 |
| 3.6 පර්යේෂණ හා සංවර්ධන අංශය | 23 |
| 3.7 ඉඩම් අත්පත්කර ගැනීම් හා ප්‍රතිස්ථාපන අංශය | 24 |
| 3.8 පාරිසරික හා සමාජීය සංවර්ධන අංශය | 25 |
| 3.9 සැලසුම් අංශය | 27 |
| 3.10 අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශය | 29 |
| 3.11 වත්කම් කළමනාකරණ හා ආදායම් අංශය | 30 |
| 3.12 යාන්ත්‍රික අංශය | 31 |
| 3.13 පුහුණු අංශය | 32 |

3.14 නීති අංශය 34

3.15 ප්‍රසම්පාදන අංශය 35

3.16 පරිපාලන අංශය 35

3.17 මුදල් අංශය 36

3.18 අභ්‍යන්තර විගණන අංශය 37

**4 වැනි පරිච්ඡේදය 40**

**කාර්ය සාධනය 2011 40**

4.1 මාර්ග නඩත්තුව ක්‍රියාත්මක කිරීම 40

4.2 දේශිය අරමුදල් යටතේ මහාමාර්ග සංවර්ධනය 41

4.3 පාලම් ඉදිකිරීම 43

4.3.1 ජාතික මහාමාර්ගවල හානිවූ / දුබල පාලම් ප්‍රති නිර්මාණය 43

4.3.2 ග්‍රාමීය පාලම් ඉදිකිරීම 44

4.4 මාර්ග හා පාලම් සැලසුම් කිරීම 49

4.4.1 මාර්ග සැලසුම් කිරීම 49

4.4.2 පාලම් සැලසුම් කිරීම 61

4.5 මාර්ග හා පාලම් වැඩවල තත්ත්ව පාලනය 66

4.6 ඉඩම් අත්පත්කර ගැනීම හා ප්‍රතිස්ථාපනය 71

4.7 පාරිසරික හා සමාජීය ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කිරීම 73

4.8 සැලසුම්කරණය හා වාර්තාකරණය 76

4.9 ශ්‍රී ලංකාව තුල පුනරුත්ථාපන මාදිලියන් සංවර්ධනය කිරීම හා භාවිතයේ යෙදීම 82

4.10 දත්ත රැස්කිරීම හා ඇගයීම 83

4.11 රථවාහන දත්ත රැස්කිරීම 87

4.12 ජාතික මහාමාර්ග තත්ත්වයට නැංවීම සඳහා මාර්ග පවරා ගැනීම 88

4.13 මාර්ග ආරක්ෂාව හා රථවාහන කළමනාකරණය 88

4.14 කළමනාකරණ තොරතුරු පද්ධතිය නඩත්තුව 93

4.15 අධිවේගී මාර්ග කළමනාකරණය 95

4.16 වත්කම් කළමනාකරණය හා ආදායම් රැස්කිරීම 95

4.17 යාන්ත්‍රික සේවා 98

4.18 මිනිස්බල සංවර්ධනය 100

4.19 නීති සේවා 106

4.20 ප්‍රසම්පාදන සේවා 107

4.21 පිරිස් කළමනාකරණය 108

4.22 මූල්‍ය කළමනාකරණය 111

4.23 අභ්‍යන්තර විගණන කාර්ය සාධනය 113

**5 වැනි පරිච්ඡේදය 116**

**ප්‍රගතියට බාධාවන් 116**

5.1 මාර්ග හා පාලම් කටයුතු ක්‍රියාත්මක කිරීම 116

5.2 සැලසුම්කරණය හා වාර්තාකරණය 117

5.3 කළමනාකරණ තොරතුරු පද්ධතිය නඩත්තු කිරීම 118

5.4 යාන්ත්‍රික සේවා 118

5.5 මිනිස්බල සංවර්ධනය 120

5.6 ප්‍රසම්පාදන සේවා 120

5.7 අභ්‍යන්තර විගණන කාර්යයන් 120

**6 වැනි පරිච්ඡේදය 122**

**විදේශ අරමුදල් ව්‍යාපෘති 122**

6.1 දක්ෂිණ අධිවේගී මාර්ගය 122

6.2 කොළඹ-කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 134

6.3 පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතිය 137

6.3.1 අදියර 1 හා අදියර 3 138

6.3.2 අදියර 2 141

6.4 කොළඹ-මහනුවර විකල්ප මාර්ගය (උතුරු නැගෙනහිර අධිවේගී මාර්ගය) 142

6.5 ජපන් ආධාර ව්‍යාපෘතිය 143

6.6 විවිධ විදේශාධාර ව්‍යාපෘතිය (MFAP) 149

6.7 ලෝක බැංකු අරමුදල් යෙදූ මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය 151

| | |
|---|---|
| 6.8 ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය | 153 |
| 6.9 මාර්ග ජාල වැඩි දියුණු ව්‍යාපෘතිය | 158 |
| 6.10 උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය (NRRP) | 163 |
| 6.11 ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය (PRP) | 167 |
| 6.11.1 ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය 1 වැනි අදියර (PRP – 1) | 167 |
| 6.11.2 ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය 2 වැනි අදියර (PRP – 2) | 171 |
| 6.12 උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය (NRCP) | 176 |
| 6.13 මාර්ග ව්‍යාපෘති සැකසීමේ පහසුකම (RPPF) | 178 |
| 6.14 චීන ප්‍රදාන ආධාර ව්‍යාපෘතිය (CGAP) | 179 |
| 6.15 එක්සත් රාජධානි වානේ පාලම් ව්‍යාපෘතිය | 179 |
| 6.16 ගැටුම් හානි ප්‍රදේශයේ හදිසි ව්‍යාපෘති | 184 |
| **7 වැනි පරිච්ඡේදය** | **188** |
| **මාර්ග සංවර්ධන අධිකාරියේ සමස්ත මූල්‍ය සාධනය** | **188** |
| **8 වැනි පරිච්ඡේදය** | **191** |
| **පරමාර්ථ හා අරමුණු සාධනය** | **191** |
| ඇමුණුම් – I 2011 වර්ෂය තුළ සමස්ත මූල්‍ය සාධනය හා මූල්‍ය ප්‍රකාශ | 193 |
| අමැණුම් –II විගණකාධිපතිවරයාගේ වාර්තාව | |

## කෙටි යෙදුම්

| | |
|---|---|
| AASL | ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපල ගුවන් ගමන් |
| ADB | ආසියානු සංවර්ධන බැංකුව |
| ADG | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| ADT | සාමාන්‍ය දෛනික රථවාහන |
| AFD | ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය |
| AO&M | වත්කම් මෙහෙයුම් හා නඩත්තු |
| BD | පාලම් සැලසුම් |
| BIQ | මූලික තොරතුරු ප්‍රශ්ණාවලිය |
| BOQ | ප්‍රමාණ බිල්පත් |
| Br. No. | පාලම් අංකය |
| CEA | මධ්‍යම පරිසර අධිකාරිය |
| CKAH | කොළඹ-මහනුවර විකල්ප මාර්ගය |
| CKE | කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය |
| CRWB | කොළඹ-රත්නපුර-වැල්ලවාය-මඩකලපුව |
| DCP | ගතික කේතු මිහි විදීම |
| D.EE | සැලසුම් ඉංජිනේරු |
| DG | අධ්‍යක්ෂ ජනරාල් |
| EDCF | ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල |
| EE | විධායක ඉංජිනේරු |
| EIA | පාරිසරික බලපෑම් තක්සේරුව |
| EOT | කාලය දිගු කිරීම |
| EPF | සේවක අර්ථසාධක අරමුදල |
| EPL | පරිසර ආරක්ෂණ බලපත්‍රය |
| ERD | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව |
| ESD | පාරිසරික හා සමාජීය සංවර්ධන අංශය |
| ETF | සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල |
| FS | ශක්‍යතා අධ්‍යයනය |
| FWD | පතිත බර උත්ක්‍රමණ මීටරය |
| GIS | භූ තොරතුරු පද්ධති |
| GOSL | ශ්‍රී ලංකා රජය |
| GPAR | ගාලු වරාය ප්‍රවේශ මාර්ගය |
| GPS | ජාත්‍යන්තර ස්ථානීය පද්ධතිය |
| HDM – 4 | මහාමාර්ග සංවර්ධන හා කළමනාකරණ – 4 |
| HIHD | හම්බන්තොට ජාත්‍යන්තර කේන්ද්‍රීය සංවර්ධනය |
| HIMS | මහාමාර්ග තොරතුරු කළමනාකරණ පද්ධතිය |
| HSR | මහාමාර්ග අනුපාත උපලේඛනය |
| ICLP | වාණිජ නීති හා භාවිතය පිළිබඳ අධ්‍යයනය |
| ICTAD | ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය |
| IEPSL | ශ්‍රී ලංකා පාරිසරික වෘත්තීය ආයතනය |
| IESL | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය |
| IT | තොරතුරු තාක්ෂණය |

| | |
|---|---|
| JAP | ජපන් ආධාර ව්‍යාපෘතිය |
| JBIC | ජාත්‍යන්තර සහයෝගිතාව පිළිබඳ ජපන් බැංකුව |
| JICA | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය |
| KFAED | අරාබි ආර්ථික සංවර්ධනය පිළිබඳ කුවේට් බැංකුව |
| LAIS | ඉඩම් අත්පත්කර ගැනීමේ තොරතුරු පද්ධතිය |
| LAQ | ඉඩම් අත්පත්කර ගැනීම |
| LiDAR | ආලෝක අනාවරණ හා පරාස |
| LOA | පිළිගැනීමේ ලිපිය |
| LCB | දේශීය තරඟකාරී ලංසු |
| MCC | චීන මෙටලජිකල් කෝපරේෂන් සමාගම |
| MFAP | විවිධ විදේශාධාර ව්‍යාපෘතිය |
| MFNSV | බහුකාර්ය ජාල සමීක්ෂණ රථය |
| MIS | කළමනාකරණ තොරතුරු පද්ධතිය |
| MM&C | නඩත්තු කළමනාකරණ හා ඉදිකිරීම් |
| NAITA | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය |
| NBT | ජාතිය ගොඩනැඟීමේ බද්ද |
| NHSP | ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය |
| NIBM | ජාතික ව්‍යාපාරික කළමනාකාරිත්ව ආයතනය |
| NPD | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව |
| NRCP | උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය |
| NRMP | ජාතික මහාමාර්ග පිළිබඳ ප්‍රධාන සැලැස්ම |
| NRRP | උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය |
| NWP | වයඹ පළාත |
| NWS&DB | ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය |
| OCH | පිටත වටරවුම් මාර්ගය |
| OD | මුල් ගමන් ස්ථාන |
| OFID | ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ ඔපෙක් අරමුදල |
| PCB | කළු කාබන් දහනය |
| PCU | මගී කාර් ඒකකය |
| PD | ව්‍යාපෘති අධ්‍යක්ෂ |
| PIP | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම |
| PM&R | වත්කම් කළමනාකරණ හා ආදායම් |
| PMU | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය |
| PRP | ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘති |
| PSC | පෙරසවි කොන්ක්‍රීට් |
| R&D | පර්යේෂණ හා සංවර්ධන |
| RAA | පර්යේෂණ සහකාරවරු |
| RBCU | ග්‍රාමීය පාලම් ඉදිකිරීම් ඒකකය |
| RDA | මාර්ග සංවර්ධන අධිකාරිය |
| RIS | මාර්ග තොරතුරු පද්ධතිය |
| RNIP | මාර්ග ජාල වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය |
| ROW | මාර්ග අයිතිය |

| | |
|---|---|
| RP | ප්‍රතිස්ථාපන සැලසුම් |
| RPPF | මාර්ග ව්‍යාපෘති සැකසුම් පහසුව |
| RSAP | මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය |
| SCPTA | සිංගප්පූරු සහයෝගිතා වැඩ සටහන පුහුණු ප්‍රදානයන් |
| SD&CC | රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව |
| S.D.EE | ජ්‍යෙෂ්ඨ සැලසුම් ඉංජිනේරුවන් |
| SDFL | කුසලතා සංවර්ධන අරමුදල |
| SIDA | ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන සහයෝගිතා ආයතනය |
| SLFI | ශ්‍රී ලංකා පදනම් ආයතනය |
| SLIDA | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| SLLR&DC | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන සංස්ථාව |
| SOR | බඳවා ගැනීමේ පරිපාටිය |
| STDP | දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය |
| TAARP | සුනාමි හානි ප්‍රදේශ පුනරුත්ථාපන ව්‍යාපෘතිය |
| TEC | තාක්ෂණික ඇගයීම් කමිටුව |
| TIIP | ත්‍රිකුණාමල ඒකාබද්ධ යටිතල ව්‍යුහ ව්‍යාපෘතිය |
| TOO | කාර්මික සහකාරවරුන් |
| TOR | අනුදේශ |
| UDA | නාගරික සංවර්ධන අධිකාරිය |
| UKSBP | එක්සත් රාජධානි වානේ පාලම් ව්‍යාපෘතිය |
| UOM | මොරටුව විශ්ව විද්‍යාලය |
| UOP | පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| UOR | රුහුණු විශ්ව විද්‍යාලය |
| VAT | එකතුකල අගය මත බද්ද |
| WB | ලෝක බැංකුව |
| WLAN | රැහැන් රහිත ප්‍රාදේශිය ජාලය |
| WS | වැඩ පරිපාලකවරුන් |



# දළ විශ්ලේෂණය

# 1 වැනි පරිච්ඡේදය
# දළ විශ්ලේෂණය

මාර්ග ජාලය වනාහි ඉතාමත් වටිනා සමාජ වත්කමක් වන අතර, ජන සමාජයේ ආර්ථික, සමාජීය, සංස්කෘතික හා පාරිසරික යහ පැවැත්මට මූලික වේ. ශ්‍රී ලංකාවේ මාර්ග ජාලය පළාත් හරහා රටේ සම්පූර්ණ ජනගහනය වෙත ප්‍රවේශය සපයන ඝනත්වයෙන් යුත් මනාව ස්ථාපිත වූවකි. කෙසේ නමුත් 1978 ට පසුව රථවාහන ගමනාගමනය ස්ථාවරව වර්ධනය වීම සමඟ ප්‍රවාහන පද්ධතියේ අඩු සංචලතාවයක් නිර්මාණය කරමින්, ප්‍රමාණවත් නොවන තත්‍වයට පත්විය. අනෙක් අතට වැඩිවන ඇක්සල් බර විසින්, මාර්ග වේදිකා ව්‍යුහය අබලන්වීම, මාර්ග ජාලයේ ප්‍රමාණවත් ආයු කාලය අඩු කරමින්, බහුතර මාර්ග සංඛ්‍යාවක් පුනරුත්ථාපනය කිරීම හා ධාරිතාව වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවයක් නිර්මාණය විය. මාර්ග සංවර්ධන අධිකාරිය පවත්නා මාර්ග ජාලය පුනරුත්ථාපනය කිරීමේ හා වැඩි දියුණු කිරීමේ තිරසාර වැඩ සටහනක් ක්‍රියාත්මක කරමින් සිටී.

තවද මාර්ග සංවර්ධන අධිකාරිය පළාත් පාලන සභා වලට හා පළාත් පාලන ආයතනවලට අයත් මාර්ග පවරා ගන්නා අතර, ඒවා ජාතික මහාමාර්ග ලෙස ලේඛනගත කරනු ලබයි. ජාතික මහාමාර්ග ලෙස (A හා B පන්තියේ මාර්ග) වර්ගීකරණය කරන ලද මාර්ග කි.මී.12020 ක් හා පාලම් 4456 ක් නඩත්තුව සඳහා මා.සං.අ. විෂය පථයට ගැනෙයි.

## ජාතික මහාමාර්ග නඩත්තු කිරීම

ජාතික මහාමාර්ග අවුරුද්ද පුරා අබලන්වීම් වැළැක්වීමට සේවා තත්ත්වය සතුටුදායක ලෙස පවත්වා ගැනුමට විධිමත්ව නඩත්තු කළ යුතු වේ. මා සං අ නඩත්තු කටයුතු සඳහා ඉහළම ප්‍රමුඛතාව දෙන අතර, ඍජු ශ්‍රම ක්‍රමය යටතේ හෝ ප්‍රදේශවල ඉක්ටාඩ් ආයතනය යටතේ ලියා පදිංචි පුද්ගලික කොන්ත්‍රාත්කරුවන් මගින්, එය ක්‍රියාත්මක කරනු ලැබේ. මාර්ග නඩත්තුව සඳහා අවශ්‍ය සම්පූර්ණ අරමුදල් මාර්ග නඩත්තු භාර අරමුදලින් වෙන්කෙරෙන අතර, මාර්ග තත්ත්ව තක්සේරු අනුව ප්‍රදේශයන්ට අරමුදල් මුදාහැරීම කරනු ලබයි.

නිතිපතා නඩත්තුවට අමතරව, මා සං අ සතුව වැලි මුද්‍රිත තාර ආලේපය වැනි වාරික/නඩත්තු ක්‍රියාත්මක කිරීමේ ක්‍රමයක් ඇති අතර, අවම වශයෙන් වසරකට කි.මී. 1200ක් වැලි මුද්‍රිත තාර ආලේපනය කරනු ලබයි. 2011 වර්ෂය තුළ මාර්ග කි.මී.1191.37 ක වැලි මුද්‍රිත තාර ආලේපනය කරන ලදි.

## මාර්ග පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම

මාර්ග පුනරුත්ථාපනයද මාර්ග ජාලය සේවා තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා එකසේ වැදගත් වේ. පුනරුත්ථාපනය, මාර්ගවල නොවැළැක්විය හැකි ලෙස සේවා තත්ත්වය බිඳ වැටීම හා ප්‍රවාහන කඩා වැටීම් වළක්වමින්, ප්‍රයෝජනවත් ජීවිත කාලය දිගු කිරීමට උපකාරී වේ.



ජීවිත කාලයක් පැරණි මාර්ග පුනරුත්ථාපනය කිරීම, අතිරේක ධාරිතාවක් එක් කරමින් වැඩි දියුණු කිරීමෙන් තොරව මාර්ගයේ ජාලයේ අපේක්ෂිත ජංගමතාවය සාක්ෂාත් කිරීම සඳහා ධාරිතාව, ධාවන තත්ත්වය, මාර්ග ආරක්ෂාව හා රථවාහන කළමනාකාරිත්වය යන ප්‍රමුඛ සාධක ගැටළු විසඳිය යුතුය. 2011 වර්ෂය තුළ පුනරුත්ථාපනය කළ හා වැඩි දියුණු කළ මාර්ගවල සම්පූර්ණ දිග කි.මී. 337.98 කි.

## ජාතික මහාමාර්ගවල පාලම් පුනරුත්ථාපනය හා යළි ඉදි කිරීම

අපගේ මාර්ග පද්ධතියේ කොටසක් හා පාලම් නඩත්තුව, පුනරුත්ථාපනය හා යළි ඉදිකිරීම ඉටුකළ යුතු වේ. දුබල හා පටු පාලම් සිරවීම් නිර්මාණය කරයි. බර සීමා හා

රථවාහන ආකිරණතා ඇති කරයි. බොහෝ වැඩි දියුණු වැඩ සටහන්වලට පාලම් සහ නඩත්තු අලුත්වැඩියා හා යළි ඉදිකිරීම් අයත් වෙයි. එසේ නමුත් බොහෝ අවස්ථාවල පාලම් හැර දමනු ලැබේ. මා සං අ 2011 වර්ෂය තුළ වානේ පාලම් 33 ක නිමකර පාලම් 24 ක වැඩ ඉටු කෙරෙමින් පවති.

**අධිවේගි මාර්ග ඉදිකිරීම.**



අධි සංචලතාවයෙන් යුත්, අන්තර් පළාත් මහාමාර්ග හා අධිවේගි මාර්ග පිළිබඳ අදහස 21 වැනි සියවස ආරම්භයේදි සමාජ, ආර්ථික සංවර්ධන අරමුණු අනුව යමින්, ගම්‍යතාවයක් අත්කර ගත්තේය. ජාතික මාර්ග මධ්‍ය සැලැස්ම (NRMP) මහාමාර්ග හා අධිවේගි මාර්ග කි.මී. 594 ක් සැලකිල්ලට යොමු කරමින් 2007-2017 කාලය සඳහා පිළියෙල කරන ලදි. අධිවේගි මාර්ග 3 ක් ඉදිකිරීම දැනටමත් ආරම්භ කර ඇති අතර, දකුණු අධිවේගි මාර්ගය නිමකර 2011 නොවැම්බර් 27 දින මහජනයා සඳහා විවෘත කරන ලදි. අළුතින් ඉදිකරන ලද දක්ෂිණ අධිවේගි මාර්ගය කි.මී. 95.275 කින් යුක්ත වන අතර එය ජාතික මහාමාර්ගයක් ලෙස ප්‍රකාශයට පත්කර, 2011 තුළ අධිවේගි මාර්ගයක් ලෙස ගැසට් ගත කරන ලදි.

**සැලසුම්කරණය හා වැඩ සටහන්කරණය**

මාර්ග සංවර්ධන අධිකාරියේ සමස්ත මෙහෙයුම, පරමාර්ථ හා ඉලක්කවලට අනුව සැලසුම්කරණයෙන් ආරම්භ වේ. නඩත්තු හා පුනරුත්ථාපනය සඳහා වාර්ෂික වැය සටහන ප්‍රාදේශියව රැස්කරගත් තොරතුරු පදනම් කර ගන්නා අතර, වැඩි දියුණු කිරීමේ වැඩ සටහන හා ජා.මා.ම.සැ. (NRMP) මත පදනම් වේ. මාර්ග නඩත්තුවේ සිට මහා පරිමාණ මාර්ග ව්‍යාපෘති කටයුතු දක්වා ක්‍රියාත්මක කිරීමට ප්‍රථමයෙන් සැලසුම් කළ යුතු වේ. 2011 වර්ෂය තුළ ව්‍යාපෘති 14ක් සඳහා ව්‍යාපෘති යෝජනා පිළියෙල කල අතර, ව්‍යාපෘති 15 ක් සඳහා සංකල්ප පත්‍රිකා පිළියෙල කරන ලදි.

**රථවාහන කළමනාකරණය හා මාර්ග ආරක්ෂාව**

මාර්ග සංවර්ධන අධිකාරිය මාර්ග ජාලය ආරක්ෂණ උපද්‍රවවලින් නිදහස්ව තබා ගැනිමට සියලුම උත්සාහයන් දරණ අතර මාර්ග භාවිතා කරන්නන්ගේ ආරක්ෂාව වැඩි දියුණු කිරීමට අඛණ්ඩව පියවර ගනිමින් සිටි. මාර්ග ආරක්ෂා අංගයන් සියලු වැඩි දියුණු කිරීම් හා නව ඉදිකිරීම් කටයුතු වලට සම්බන්ධකර ඇත. 2011 වර්ෂය තුළ

මංසන්ධි 3 ක් සඳහා සංඥා සැලසුම් සහිත අතුරු මාර්ග 4 ක් සඳහා හා එක් විකල්ප මාර්ගයක් හා සඳහා රථවාහන කළමනාකරණ අධ්‍යයනයක් සිදු කෙරෙමින් පවතී.




### මාර්ග හා පාලම් සැලසුම්

මා.සං.අ. මහාමාර්ග හා පාලම් සැලසුම් පිළිබඳ විශේෂිත හැකියාවන් සහිත, ප්‍රධාන සිවිල් ඉංජිනේරුමය ආයතනයකි. තවද මා.සං.අ.වෙනත් රාජ්‍ය ආයතන හා පුද්ගලික අංශයේ ආයතනවලට මහාමාර්ග හා පාලම් සැලසුම් පිළිබඳව උපදේශක සේවා සපයනු ලබයි. 2011 වර්ෂය තුල පාලම් 101 ක් සඳහා පාලම් සැලසුම්ද මාර්ග කි.මී. 265.5 ක් සඳහා මාර්ග සැලසුම්ද නිමකරන ලදි.



### ආදායම් රැස්කිරීම

මාර්ග සංවර්ධන අධිකාරිය උපදේශක සේවා සැපයීමෙන් බාහිර ක්ෂේත්‍ර සඳහා සැලසුම් නිර්මාණය හා රසායනාගාර පරීක්ෂණ මගින් ආදායම් උපයනු ලබයි. එහි වත්කම් වන සාප්පු සංකීර්ණ, ප්‍රචාරණ තොරන්, විවේක උද්‍යාන මගින් අයහාර ලබා ගන්නා අතර බස් නැවතුම්, රූපවාහිනී රැහැන් කණු හා ප්‍රචාරණ පුවරු ලොතරැයි කුටි සහ අනවසර ප්‍රචාරණ පුවරු ආදියෙන් ආදායම් උපයනු ලබයි. 2011 වර්ෂය තුළ එසේ උපයාගත් ආදායම රු: 90,313,474.40 කි.

### මූල්‍ය සාධනය

2011 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දේශීය සහ විදේශීය අරමුදල්ද ඇතුළුව සමස්ත අරමුදල් ප්‍රතිපාදන රු.මිලියන 118.531 ක් වන අතර, වාර්ෂික වියදම රු.මි. 97,817 කි. සමස්ත අරමුදල්වලින් විදේශ අරමුදල්වල දායකත්වය 50% කට අධික විය.

වගු අංක 1: අරමුදල් මූලාශ්‍ර මත පදනම් වූ මූල්‍ය සාධනය

| අරමුදල් මූලාශ්‍රය | ප්‍රතිපාදන (රු:මිලියන) | වියදම (රු:මිලියන) |
|---|---|---|
| දේශීය අරමුදල් (DF) | 34, 365 | 31, 453 |
| විදේශාධාර ණය (FAL) | 61, 685 | 46, 173 |
| විදේශ ආධාර ප්‍රදාන (FAG) | 1, 810 | 1, 379 |
| ප්‍රතිපූර්ණ විදේශාධාර ණය (RFAL) | 1, 250 | 920 |
| ප්‍රතිපූර්ණ විදේශාධාර ප්‍රදාන (RFAG) | 200 | 1 |
| ප්‍රතිපූර්ණ අරමුදල් | 0 | 0 |
| විදේශාධාරවලට අනුබද්ධ දේශීය අරමුදල් (FARDF) | 19, 221 | 17, 892 |
| **එකතුව** | ***118, 531*** | ***97, 817*** |

වගු අංක 2: පළාත් මත පදනම් වූ මූල්‍ය සාධනය

| අරමුදල් මූලාශ්‍රය | ප්‍රතිපාදන (රු:මිලියන) | වියදම (රු:මිලියන) |
|---|---|---|
| බස්නාහිර | 36,876 | 29,981 |
| මධ්‍යම | 6,741 | 4,578 |
| දකුණ | 17,463 | 14,552 |
| උතුර | 7,127 | 5,524 |
| නැගෙනහිර | 9,823 | 7,281 |
| වයඹ | 4,325 | 4,030 |
| උතුරුමැද | 28,110 | 24,779 |
| ඌව | 4,215 | 3,519 |
| සබරගමුව | 3,850 | 3,573 |
| **එකතුව** | ***118, 531*** | ***97, 817*** |

රූප සටහන 2: මූලාශ්‍ර මත පදනම් වූ මූල්‍ය සාධනය




රූප සටහන 3: පළාත් මත පදනම් වූ මූල්‍ය සාධනය





# මාර්ග සංවර්ධන අධිකාරිය -
# ආයතනය පිළිබඳ හැඳින්වීමක්

# 2 වැනි පරිච්ඡේදය

## මාර්ග සංවර්ධන අධිකාරිය - ආයතනය පිළිබඳ හැඳින්වීමක්

මාර්ග සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ වරාය හා මහාමාර්ග ක්ෂේත්‍රයේ ඉහළම ආයතනය වන වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති එක් ආයතනයකි. මෙම අමාත්‍යාංශය වරාය හා මහාමාර්ග විෂයයන් වලට යටත්ව ප්‍රතිපත්ති හා වැඩ සටහන් සම්පාදනය කිරීම පිළිබඳ වගකීම දරයි.

මාර්ග සංවර්ධන අධිකාරිය (මා සං අ) 1981 අංක 73 දරණ මා සං අ පණත යටතේ සංස්ථාපිත කරන ලදුව 1986 දී මහාමාර්ග දෙපාර්තමේන්තුවේ අනුප්‍රාප්තිකයා බවට පත්විය. එතැන් පටන් මාර්ග සංවර්ධන අධිකාරිය ජාතික මහාමාර්ග ජාලය නඩත්තු කිරීමේ හා තත්ත්වය නැංවීමේ වගකීම දරණ ආයතනය බවට පත්විය.

### 2.1 මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය භාරය

මාර්ග සංවර්ධන අධිකාරිය රටේ ප්‍රමුඛ මහාමාර්ග අධිකාරිය වන අතර ජාතික ( ඒ පංතිය) හා ප්‍රධාන (බී පංතිය) මහාමාර්ග අන්තර්ගත ජාතික මහාමාර්ග ජාලය නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා පවත්නා ජාලය අභිවර්ධනය කිරීම පිණිස නව මහාමාර්ග, පාලම් හා අධිවේගී මාර්ග සැලසුම් කිරීම, නිර්මාණය කිරීම හා ඉදිකිරීම සඳහා වගකීම දරයි. ජාතික මහාමාර්ග ජාලය 2011 අවසානයේ මාර්ග කි.මී.12020 ක් හා පාලම් 4456 (පරායනය මී. 3 ට වැඩි) කින් සමන්විත විය.

### 2.2 මාර්ග සංවර්ධන අධිකාරියේ කළමනාකාරිත්වය

මාර්ග සංවර්ධන අධිකාරියේ කළමනාකාරිත්වය ක්‍රියාත්මක කරනු ලබන්නේ ගරු මහාමාර්ග හා මාර්ග සංවර්ධන ඇමතිවරයා විසින් පත්කරනු ලැබූ කළමනාකරණ මණ්ඩලයක් විසිනි. කළමනාකරණ මණ්ඩලය රටේ ජාතික මහාමාර්ග ජාලය සංවර්ධනය කිරීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව ඇමතිවරයාට වගකියනු ලැබේ.

2011 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පැවැත්විණි.

2011 වර්ෂය තුළ කළමනාකාරිත්ව මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය.

**2011 ජනවාරි-දෙසැම්බර් කාල පරිච්ඡේදය තුළ කළමනාකාරිත්ව මණ්ඩලය**

ආර්.ඩබ්.ආර්. ප්‍රේමසිරි මහතා – සභාපති

ඕ. රත්නවීර මහතා - සාමාජික
(මාර්ග සංවර්ධන අධිකාරියේ ක්‍රියාකාරි අධ්‍යක්ෂ)

පි. දිසානායක මහතා - සාමාජික
(අතිරේක ලේකම්-මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය)

එම්. ගංගාදරන් මහත්මිය - සාමාජික
(අධ්‍යක්ෂ-විදේශ සම්පත් දෙපාර්තමේන්තුව)

ටී.එම්. හේරත් මහතා - සාමාජික
(අතිරේක ලේකම්-තාක්ෂණ, බලශක්ති අමාත්‍යාංශය)

ඒ.ඩබ්.එම්. සරත්චන්ද්‍ර මහතා - සාමාජික
(අධ්‍යක්ෂ සැලසුම්-ප්‍රවාහන අමාත්‍යාංශය)

එල්.බී.එස්.බී. දයාරත්න මහතා - සාමාජික
(ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්-ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය)

කේ.එල්.එල්. ප්‍රේමනාත් මහතා - සාමාජික
(සාමාන්‍යාධිකාරී-ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය)

බී.ඒ. පීරිස් මහතා - සාමාජික
(අධ්‍යක්ෂ ජනරාල්-භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය)

හේම මාදිවෙල මහතා - සාමාජික

ඩබ්. විජේරත්න මහතා - සාමාජික

කේ.ඒ. ගාමිණී මහතා - සාමාජික

නවරත්න සේනානායක මහතා - සාමාජික

## 2.3 දැක්ම, මෙහෙවර, පරමාර්ථ හා අරමුණු.

### දැක්ම

විශිෂ්ඨ ජාතික මහාමාර්ග පද්ධතියක් සැපයීම තුළින් දැයේ බලාපොරොත්තු මුදුන් පමුණුවන මහාමාර්ග ඉංජිනේරු විද්‍යාවේ බහුවිධ විෂයන්හි විශිෂ්ඨත්වයක් දරණ ප්‍රමුඛ ජාතික ආයතනය ලෙස ඇගයීමට පාත්‍ර වීම.

### මෙහෙවර

මාර්ග අංශයේ ප්‍රමුඛ ජාතික ආයතනය වශයෙන්, ජාතියේ සාමාජික ආර්ථික සංවර්ධනයට මග පෑදීම සඳහා මහජනතාව සහ භාණ්ඩ ප්‍රවාහනය වෙනුවෙන් පරිසර හිතකාමී අයුරින්, පිළිගත හැකි මට්ටමේ ආරක්ෂාව සහ පහසුව සහිතව, සංචලතාව සහ ප්‍රවේශය සහතික කරමින්, ප්‍රමාණවත් හා කාර්යක්ෂම ජාතික මහාමාර්ග පද්ධතියක් සැපයීම.

### පරමාර්ථ හා අරමුණු

- ප්‍රමාණවත් ජාතික මහාමාර්ග ජාලයක් ශාක්ෂාත් කිරීම.
- පිළිගත හැකි තත්ත්වයෙන් මාර්ග නඩත්තු කිරීම මගින්, ජාතික මහාමාර්ග ජාලය තුළ පිළිගත හැකි මට්ටමේ සංචලතාවක් ස්ථාපිත කිරීම.
- අධි සංචලතාවයෙන් යුතු අධිවේගී මාර්ග ජාලයක් සැපයීම.
- මාර්ග භාවිත පිරිවැය අඩු කිරීමට පියවර ගැනීම.
- ජාතික මහාමාර්ග ජාලය තුළ මාර්ග ආරක්ෂණය වැඩි දියුණු කිරීම.
- සියලු ක්‍රියාකාරකම් වලදී පරිසර ආරක්ෂණය සහතික කිරීම.
- වත්කම් හා ආයෝජන කාර්යක්ෂමව භාවිතය සහතික කිරීම.
- මාර්ග සංවර්ධන අධිකාරියේ සමස්ත කාර්ය සාධනය නැංවීමට ආයතන සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.
- දේශීය මාර්ග ඉදිකිරීමේ කර්මාන්තය සංවර්ධනයට සහාය දීම.

## 2.4 මාර්ග සංවර්ධන අධිකාරියේ ආයතන ව්‍යුහය

මාර්ග සංවර්ධන අධිකාරිය මහාමාර්ග හා පාලම් සැලසුම්කරණය, නිර්මාණය, ඉදිකිරීම, නඩත්තුව හා මහාමාර්ග ආරක්ෂණය යන විෂයයන්හි විශේෂඥ හැකියාවන්ගෙන් යුක්ත ප්‍රධාන සිවිල් ඉංජිනේරු ආයතනයකි. මාර්ග සංවර්ධන අධිකාරියට පවරන ලද කාර්යයන් ක්‍රියාත්මක කිරීමට හා එහි පරමාර්ථය හා අරමුණු ඉටුකිරීමට එහි ආයතන ව්‍යුහය නිර්මාණය කර ඇත.

කළමනාකරණ මණ්ඩලය යටතේ මාර්ග සංවර්ධන අධිකාරියේ සංවිධානය අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රධාන විධායක නිලධාරියා වේ. අළුතෙන් අනුමත වූ ආයතන ව්‍යුහය යටතේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් 5 දෙනෙකු හා අධ්‍යක්ෂවරු 17 දෙනෙක් විවිධ කාර්යයන් ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහාය වෙති.

මීට අමතරව මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය යටතේ වන ව්‍යාපෘති කළමනාකරණ ඒකක භාර ව්‍යාපෘති අධ්‍යක්ෂවරු 19 ක් වන අතර, ඔවුහු මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා මගින් මාර්ග සංවර්ධන අධිකාරියට සම්බන්ධ වී සිටිති. මාර්ග සංවර්ධන අධිකාරියේ ආයතන ව්‍යුහය රූප සටහන් 4 හි දක්වා ඇත.

## 2.5 මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන්.

මාර්ග සංවර්ධන අධිකාරියේ ස්ථිර හා කොන්ත්‍රාත් පදනම මත සේවය කරන ඉංජිනේරු, කාර්මික, පරිපාලන, ගිණුම් හා වෙනත් සහායක කාර්ය මණ්ඩලයෙන් සමන්විත 4562 ක සේවක බලකායක් සිටී. ඊට අමතරව 2011 අවසානයේ එයට දෛනික නඩත්තු කටයුතු සඳහා පත්කල ස්ථිර කම්කරුවන් 4024 ක් සහ කොන්ත්‍රාත් පදනම මත කම්කරුවන් 2428 ක් විය. විවිධ සේවා වර්ගවලට අයත් සම්පූර්ණ අනුමත සේවක සංඛ්‍යාව පහත දැක්වෙන වගුවේ සඳහන් වේ.

*වගු අංක 3: මාර්ග සංවර්ධන අධිකාරියේ සංක්ෂිප්ත අනුමත සේවක සංඛ්‍යා දර්ශකය*

| සේවා වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව |
|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවය | 84 |
| ඉංජිනේරු සේවය. | 583 |
| පරිපාලන සේවය | 143 |
| තොරතුරු තාක්ෂණ සේවය | 17 |
| ගිණුම් සේවය | 97 |
| නීති සේවය | 06 |
| තාක්ෂණික සේවය - 1 | 102 |
| තාක්ෂණික සේවය - 2 | 832 |
| ලිපිකරු සේවය | 1497 |
| සහායක කාර්ය මණ්ඩලය | 2601 |
| කම්කරුවන් | 4024 |
| **එකතුව** | **9986** |

## 2.6 කාර්ය අංශයන්

මාර්ග සංවර්ධන අධිකාරියේ ආයතන ව්‍යුහයේ කාර්ය අංශ 18 ක් වන අතර ඉන් වත්කම් කළමනාකරණ හා ආදායම් ඒකකය සහ අධිවේගී මාර්ග කළමනාකරණ ඒකකය හැර, අනෙකුත් අංශ 16 කම අධ්‍යක්ෂවරයෙකු ප්‍රධානත්වය දරයි. පහත දැක්වෙන අංශ 03 හි අධ්‍යක්ෂවරු අධ්‍යක්ෂ ජනරාල්වරයාට සෘජුවම වාර්තා කරති.

යාන්ත්‍රික අංශය
නීති අංශය
අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශය

පහත දැක්වෙන අංශ 3 හි අධ්‍යක්ෂවරුන් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වත්කම් මෙහෙයුම් හා කළමනාකරණ වෙත සෘජුවම වාර්තා කරනු ලබයි

**නඩත්තු කළමනාකරණ හා ඉදිකිරීම් අංශය**
**වැඩ අංශය**
**ග්‍රාමීය පාලම් ඉදිකිරීම් ඒකකය**

මෙම අංශ 3 ට අමතරව වත්කම් කළමනාකරණ හා ආදායම් ඒකකයද අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (වත්කම් මෙහෙයුම් හා කළමනාකරණ) යටතට ගැනෙන අතර, වත්කම් කළමනාකරණ හා ආදායම් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ඔහු වෙත අධ්‍යක්ෂ නඩත්තු කළමනාකරණ හා ඉදිකිරීම් මගින් වාර්තා කළ යුතුය.

පහත දැක්වෙන අංශ 5 අධ්‍යක්ෂවරුන් සෘජුවම අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉදිකිරීම් සැලසුම්) වෙත වාර්තා කරනු ලබයි.

***ඉංජිනේරු සේවා අංශය***
***මහාමාර්ග සැලසුම් අංශය***
***පර්යේෂණ හා සංවර්ධන අංශය***
***ඉඩම් අංශය***
***පාරිසරික හා සමාජීය සංවර්ධන අංශය***

අධ්‍යක්ෂ සැලසුම් (සැලසුම් අංශය) අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ජාල සැලසුම් වෙත වාර්තා කරනු ලබයි.

**අභ්‍යන්තර විගණන අංශය** සහ තාක්ෂණික විගණන අංශය සෘජුවම මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාගේ පාලනය යටතේ තබා ඇත. ඒ අනුව අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) හා නියෝජ්‍ය අධ්‍යක්ෂ (තාක්ෂණික විගණන) වාර්තා කරනුයේ සභාපතිවරයාටය.

පහත දැක්වෙන අංශ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මුදල්) ගේ විෂය පථය යටතට ගැනෙනු ලබයි.

***පරිපාලන අංශය***
***මුදල් අංශය***
***ප්‍රසම්පාදන අංශය***
***පුහුණු අංශය***

මෙතෙක්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මුදල්) වරයෙකු පත්කර නොමැති බැවින්, එකී අංශ අධ්‍යක්ෂ ජනරාල්වරයාට වාර්තා කරනු ලැබේ.

බොහොමයක් විදේශ අරමුදල් ව්‍යාපෘති හසුරුවනු ලබන්නේ අදාළ ව්‍යාපෘති කළමනාකරණ ඒකක විසින්, වන අතර ඒවා වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ස්වාධීන ව්‍යාපෘති කළමනාකරණ ඒකක වශයෙන් ක්‍රියාත්මක වෙයි. එම ව්‍යාපෘති කළමනාකරණ ඒකක පහත සඳහන් වේ.

- දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
- කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය පිළිබඳ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
- ජපන් ආධාර ව්‍යාපෘතිය පිළිබඳ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
- ලෝක බැංකු අරමුදල් යෙදූ මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය පිළිබඳ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
- එක්සත් රාජධානි වානේ පාලම් පිළිබඳ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

- විවිධ විදේශාධාර ව්‍යාපෘතිය පිළිබඳ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
- මාර්ග ව්‍යාපෘති සැකසුම් පහසුව පිළිබඳ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
- කොළඹ-මහනුවර විකල්ප මහාමාර්ගය පිළිබඳ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
- පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය අදියර 1 හා 3 පිළිබඳ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
- පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය අදියර 2 පිළිබඳ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
- ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය පිළිබඳ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
- උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය පිළිබඳ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
- ගැටුම් හානි ප්‍රදේශවල හදිසි ව්‍යාපෘතීන් පිළිබඳ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
- මාර්ග ජාල වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
- උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය 1 පිළිබඳ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
- උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය 2 පිළිබඳ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
- ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය 1 පිළිබඳ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
- ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය 2 දකුණ පිළිබඳ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
- ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය 2 උතුර පිළිබඳ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

මෙම ව්‍යාපෘති කළමනාකරණ ඒකක වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයට වගකියන ස්වාධීන ගිණුම් ඒකක පවත්වාගෙන යනු ලබයි. මෙම ව්‍යාපෘති කටයුතු මා සං අ මට්ටමෙන් සම්බන්ධීකරණය කරනු ලබන්නේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ව්‍යාපෘති) විසිනි.

මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකක පිළිබඳ සංවිධාන ව්‍යුහය 5 වැනි රූප සටහනෙන් දක්වා ඇත.

## 2.7 පළාත් ව්‍යුහය

මාර්ග සංවර්ධන අධිකාරියේ පළාත් ව්‍යුහය යටතේ, පළාත්භාර අධ්‍යක්ෂවරු 10 දෙනෙකු අධ්‍යක්ෂ නඩත්තු කළමනාකරණ හා ඉදිකිරීම් වෙත වාර්තා කරති. නැගෙනහිර පළාත ප්‍රදේශ 2 කට බෙදා ඇති හෙයින්, එම පළාතේ පළාත්භාර අධ්‍යක්ෂවරු 2 කු සිටින අතර එක් අයෙක් මඩකලපුවේද අනික් අය අක්කරපත්තුවේද සිටී. පළාත්භාර අධ්‍යක්ෂවරයා යටතේ, සෑම දිස්ත්‍රික්කයක් සඳහාම ප්‍රධාන ඉංජිනේරුවරයෙකු සිටින අතර, සෑම කොට්ඨාශයක් සඳහාම විධායක ඉංජිනේරුවරයෙකු සිටී. පළාත්භාර අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන ඉංජිනේරුවරුන් හා විධායක ඉංජිනේරුවරුන්ට වැඩ ප්‍රමාණය අනුව පත්කරන ලද ඉංජිනේරුවරුන් හා තාක්ෂණික කාර්ය මණ්ඩලයේ සහාය ලැබේ.




**කෙටි යෙදුම්**

ADG - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
DD - නියෝජ්‍ය අධ්‍යක්ෂ
C.EE. - ප්‍රධාන ඉංජිනේරු
EE.E - විධායක ඉංජිනේරු
PMUs - ව්‍යාපෘති කළමනාකරණ ඒකක
MM&C - නඩත්තු කළමනාකරණ හා ඉදිකිරීම් අංශය
PM&R - වත්කම් කළමනාකරණ හා ආදායම්
RBCU - ග්‍රාමීය පාලම් ඉදිකිරීම් ඒකකය
ES - ඉංජිනේරු සේවා
R&D - පර්යේෂණ හා සංවර්ධන
ESD - පාරිසරික හා සමාජ සංවර්ධන
Admin. - පාලන
Procure. - ප්‍රසම්පාදන
EOM&MD - අධිවේගි මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ

## *රූප සටහන 5*




**කෙටි යෙදුම්**

ADG - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
PD - ව්‍යාපෘති අධ්‍යක්ෂ
DD - නියෝජ්‍ය අධ්‍යක්ෂ
STDP - දක්ෂිණ අධිවේගී සංවර්ධන ව්‍යාපෘතිය
CKE - කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය
OCH - පිටත වටරවුම් මාර්ගය
WB - ලෝක බැංකු අරමුදල් මාර්ග ආංශික සහායක ව්‍යාපෘතිය
RNIP - මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය
NRRP - උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය
PRP - ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය
PRP2S - ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 2 දකුණ
PRP2N - ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 2 උතුර
JAP - ජපන් ආධාර ව්‍යාපාතිය
UKSB - එක්සත් රාජධානි වානේ පාලම් ව්‍යාපාතිය
MFAP - විවිධ විදේශාධාර ව්‍යාපෘතිය
CKAH - කොළඹ-මහනුවර විකල්ප මාර්ගය
CARE - හානියට පත් ප්‍රදේශවල හදිසි ව්‍යාපෘති
NRCP - උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය
RPPF - මාර්ග ව්‍යාපෘති සැකසුම් පහසුව
NHSP - ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය

# අංශවල කාර්යයන් හා වගකීම්



# 3 වැනි පරිච්ඡේදය
# අංශවල කාර්යයන් හා වගකීම්

## 3.1 නඩත්තු කළමනාකරණ හා ඉදිකිරීම් අංශය

මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශිය සංවිධානයේ ප්‍රධානත්වය ප්‍රධාන කාර්යාලයේ නඩත්තු කළමනාකරණ හා ඉදිකිරීම් අංශය දරයි. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (වත්කම් මෙහෙයුම් හා නඩත්තු) හා අධ්‍යක්ෂ (නඩත්තු කළමනාකරණ හා ඉදිකිරීම්) අධ්‍යක්ෂ ජනරාල්වරයාට වෘත්තිමය සහාය දෙන අතර, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගේ සහාය ඇතිව පළාත්භාර අධ්‍යක්ෂවරුන්ගේ කටයුතු පාලනය හා සම්බන්ධීකරණය කරනු ලබයි. පළාත්භාර අධ්‍යක්ෂවරුන් 10 දෙනෙකු සිටින අතර, සෑම පළාත්භාර අධ්‍යක්ෂවරයෙකුටම පරිපාලන දිස්ත්‍රික්කයක් භාර ප්‍රධාන ඉංජිනේරුවන් දෙදෙනෙකු හෝ තිදෙනෙකු සිටිති. සෑම ප්‍රධාන ඉංජිනේරුවරයෙකුටම කොට්ඨාශයේ මාර්ග කිලෝමීටර් ගණන අනුව විධායක ඉංජිනේරුවරුන් දෙදෙනෙකු හෝ තිදෙනෙකු ප්‍රධාන ඉංජිනේරුවරයාට සහාය වෙති.

*වගු අංක : 4 මාර්ග සංවර්ධන අධිකාරියේ විෂය පථය යටතට ගැනෙන පළාත්වල මාර්ග හා පාලම්*

| *පළාත* | *A පන්තියේ මාර්ග (කි.මී.)* | *B පන්තියේ මාර්ග (කි.මී.)* | *සමස්ත දුර (කි.මී.)* | *පාලම් ගණන* |
|---|---|---|---|---|
| බස්නාහිර | 374.48 | 1208.75 | 1583.23 | 788 |
| වයඹ | 353.22 | 971.09 | 1324.31 | 463 |
| දකුණ | 346.88 | 1018.50 | 1365.38 | 473 |
| මධ්‍යම | 408.57 | 1330.79 | 1739.36 | 626 |
| උතුරුමැද | 495.20 | 698.64 | 1193.84 | 361 |
| සබරගමුව | 415.57 | 804.18 | 1219.75 | 698 |
| ඌව | 471.04 | 693.19 | 1164.23 | 437 |
| උතුර | 734.49 | 524.12 | 1258.61 | 276 |
| නැගෙනහිර | 619.55 | 551.13 | 1170.68 | 334 |
| ***එකතුව*** | ***4219.00*** | ***7800.39*** | ***12019.39*** | ***4456*** |

### කාර්යයන් හා වගකීම්

මාර්ග නඩත්තු කටයුතු (ඒ හා බී පංතියේ මාර්ග) හා මාර්ග වත්කම් ආරක්ෂණය, මෙහෙයුම හා නඩත්තුව පළාත්වල පළාත්භාර අධ්‍යක්ෂවරුන්ගේ මග පෙන්වීම යටතේ, ප්‍රාදේශිය කාර්යාල විසින්

ඉවුකරනු ලබයි. මීට අමතරව කලින් කලට පවරණ පරිදි මාර්ග සංවර්ධන අධිකාරි නොවන පාලම් හා මාර්ග ඉදිකිරීමද ඉටුකරනු ලබයි.

**නඩත්තු කටයුතු**

**එදිනෙදා නඩත්තුව**

- පලුදු මැකීම හා වල් එළිකිරීම
- වල් එළිකිරීම
- සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම
- කාණු හිස් කිරීම හා නැවත කැපීම
- ස්කුපර් කාණු කැපීම
- බෝක්කු හිස් කිරීම හා රොන්මඩ ඉවත් කිරීම
- මාර්ග ලිබඩු පිරිසිදු කිරීම හා තින්ත ආලේපනය
- පාලම් හා බෝක්කුවල තීන්ත ආලේපනය

**අත්‍යාවශ්‍ය නඩත්තු / හදිසි කටයුතු**

- නායයෑම් හා වෙනස්වීම් ඇතුළු ගංවතුර හානි ප්‍රතිසංස්කරණය

**වාරික නඩත්තුව**

- පදනම් හා පෘෂ්ඨ නිවැරදි කිරීම්
- පෘෂ්ඨ ඇතිරීම්
- මාර්ග උරහිස් ග්‍රේඩර් කිරීම හා නැවත බොරළු යෙදීම

**පුනරාවර්තන නඩත්තුව**

- වලවල් බැසීම්, පිපිරීම්, පළුදු හා පෘෂ්ඨ විෂමතා අළුත්වැඩියාව
- මාර්ග අන්ත හා උරිස් අන්ත නිවැරදි කිරීම

**වෙනත් ප්‍රධාන කටයුතු**

- ජාතික මහාමාර්ග නඩත්තුව (ඒ හා බී පංති මාර්ග)
- කොන්ත්‍රාත් පාලනය, ටෙන්ඩර් පිළියෙල කිරීම හා ප්‍රසම්පාදන කටයුතු
- කල් දිගු කිරීම් (EOT) හා වෙනස්වීම් පිළියෙල කිරීම හා තක්සේරු කිරීම

- මාර්ග හා දුබල පාලම් ඉදිකිරීම් පිළිබඳ වාර්ෂික ප්‍රගති වාර්තා පිළියෙල කිරීම
- අංශය මෙහෙයවන වැඩ පිළිබඳව වාර්ෂික ව්‍යාපෘති වාර්තා, මාසික ප්‍රගති වාර්තා හා සතිපතා වාර්තා පිළියෙල කිරීම
- වත්කම් කළමනාකරණය හා ආදායම් (ප්‍රචාරණ පුවරු, ප්‍රචාරණ තොරන්, මාර්ග සංඥා, වෙළඳ පුවරු, මධ්‍යයනය හා වටරවුම් ආදිය)
- මාර්ග වැලි මුද්‍රිත තාර ආලේපනය කිරීම
- පාරු නඩත්තු කිරීම
- ගොඩනැගිලි හා සංචාරක නිවාස නඩත්තු කිරීම
- ඇස්පෝල්ට් මිශ්‍රණ යන්ත්‍රාගාර කළමනාකරණය හා මෙහෙයවීම

## 3.2 වැඩ අංශය

වැඩ අංශය, දේශීය අරමුදල් යටතේ ජාතික මහාමාර්ගවල සියලු මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීමේ කාර්යයන්හි පූර්ව ඉදිකිරීම් හා ඉදිකිරීම් අදියර මෙහෙයවීම කරයි.

**පූර්ව ඉදිකිරීම් - අදියර 1**

- ටෙන්ඩර් ලේඛන පිළියෙල කිරීම
- දේ.ත.ල. යටතේ ප්‍රසම්පාදන සඳහා කැඳවීම
- ලංසු ලේඛන නිකුත් කිරීම
- ලංසු විවෘත කිරීම
- එකඟතා පළ කිරීමේ ලිපි (LOA) නිකුත් කිරීම

**කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමෙන් පසුව භාරගන්නා කටයුතු - අදියර 11**

- මූල්‍ය හා භෞතික ප්‍රගතිය ආවේක්ෂණය
- ඉදිකිරීම් කටයුතුවල තත්ත්වය පිළිබඳව පරීක්ෂාව, සොයා බැලීම හා ඕනෑම තීරණාත්මක ප්‍රශ්න පිළිබඳව උපදෙස් දීම
- අදාල ප්‍රධාන ඉංජිනේරුවරයා කොන්ත්‍රාත් සඳහා ඔහුට මග පෙන්වීම
- පහත සඳහන් දෑ සඳහා අනුමැතිය සඳහා ඇගයීම් හා නිර්දේශ කිරීම
    - ගෙවීම් සහතික
    - කොන්ත්‍රාත්වල උච්චාවචන
    - කාලය දිගු කිරීම
    - අතිරේක ඉල්ලීම්
    - අවසන් කිරීම (ප්‍රගතියක් නොමැති අවස්ථාවලදී)
- ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන සහ විසඳුම් සඳහා නිර්දේශ කිරීම
- ව්‍යාපෘති පරීක්ෂාව
    - මාසික භෞතික ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම
    - මාසික මූල්‍ය ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම

## 3.3 ඉංජිනේරු සේවා අංශය

ඉංජිනේරු සේවා අංශය මාර්ග සංවර්ධන අධිකාරියේ විශේෂිත අංශවලින් එකක් වන අතර එය අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (වත්කම් සංවර්ධන) ගේ විෂය පථය යටතට ගැනෙයි. පාලම් සැලසුම් අංශය පාලම් සැලසුම් කිරීම පිළිබඳව සහ අධ්‍යක්ෂ ඉංජිනේරු සේවා හා ජ්‍යෙෂ්ඨ සැලසුම් ඉංජිනේරුවන්, සැලසුම් ශිල්පීන් හා වෙනත් සහායක කාර්ය මණ්ඩලය ඇතුළුව අංශය විසින් ඉටුකරනු ලබන කාර්යයන් සඳහා වගකිව යුතු වේ.

මෙම අංශයේ ප්‍රාථමික වගකීම, පාලම් සැලසුම්, පාලම් වැඩි දියුණු කිරීම් හා පුනරුත්ථාපන ව්‍යාපෘති සඳහා ප්‍රවේශ මාර්ග සැලසුම් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීමට ඉඩම් අත්පත් කර ගැනීම, මහජන සේවාවල යටිතල ව්‍යුහයන් ප්‍රතිස්ථාපනය කිරීම හා මෙම පාලම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අදාළ ක්‍රියාත්මක කිරීම් අංශවලට උපදේශන සේවා හා සහාය සේවා සැපයීමය.

ඉහත සඳහන් කාර්යයන් ඉටුකිරීම සඳහා පහත දැක්වෙන කාර්යයන් සමඟ අදාළ වෙනත් කටයුතු අංශය විසින් ඉටුකරනු ලැබීය.

- පාලම් ව්‍යාපෘති සඳහා ශක්‍යතා අධ්‍යයන හා පාලම් සැලසුම් යෝජනා සූත්‍රකරණය ඇතුළුව මූලික වැඩබිම් විමර්ශන (පදනම් සමීක්ෂණ හා රථවාහන සමීක්ෂණ හැර)
- පාලම් ව්‍යාපෘති සඳහා ප්‍රවේශයන්, වැඩ ඇඳීම්, ටෙන්ඩර් ලේඛන, ඉංජිනේරු ඇස්තමේන්තු හා ඉඩම් අත්පත් කර ගැනීමේ ලේඛන ඇතුළුව බෝක්කු, පාලම්, උමං මාර්ග සහ ගුවන් පාලම්වල විස්තරාත්මක ඉංජිනේරුමය සැලසුම්
- ඇඳීම්වලට අනුව ක්‍රමානුකූලව ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂයෙන්ම සැලසුම් කිරීමේ අදියරේදී අපේක්ෂිත වූවාට වඩා වෙනත් තත්ත්වයන්ට මුහුණදුන් අවස්ථා වලදී උපදෙස් සැපයීම
- පවත්නා පාලම් ශක්ති ගැන්වීමේදී හා අළුත්වැඩියාවන් අවශ්‍යවන අවස්ථාවලදී ඒවා පිළිබඳ පරීක්ෂා කිරීම් හා සැලසුම් සැකසීම
- අසම්මත දිගින් යුතු පෙරසවි කොන්ක්‍රීට් බාල්ක හා වානේ බාල්ක සඳහා සැලසුම් ගණනයන් සිදු කිරීම
- ආදර්ශ ඇඳීම් පිළියෙල කිරීම
- 2011 වර්ෂය සඳහා අනුපාතික විශ්ලේෂණ හා පාලම් ඇස්තමේන්තු යාවත්කාලීන කිරීම හා මිල උච්චාවචන දර්ශක පිළියෙල කිරීම
- කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් කරන විකල්ප සැලසුම් හා උපදේශකයන් විසින් ඉදිරිපත් කරන සැලසුම් වාර්තා පරීක්ෂා කිරීම
- ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් විසින් ඉල්ලා සිටින අවස්ථාවලදී ව්‍යාපෘති කළමනාකරණ ඒකක වලට සේවා ලබාදීම.

- ජාතික ජල සම්පාදන හා ජලාපවාහ මණ්ඩලය සඳහා පාලම් හරහා ජලනල එලීමට සුදුසු වේදැයි නිර්ණය කිරීම සඳහා පාලම් පරීක්ෂා කිරීම හා ඩයලොග් ටෙලිකොම් ආයතනය සඳහා සුදුසු වේදැයි නිරීක්ෂණය කිරීම සඳහා පාලම් පරීක්ෂා කිරීම

## 3.4 මාර්ග සැලසුම් අංශය

මාර්ග සැලසුම් අංශය 1986 මා සං අ ආරම්භයේ සිටම මා සං අ තුළ විශේෂිත අංශයකි. එය අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (වත්කම් සංවර්ධන) ගේ විෂය පථයට ගැනෙන එක් අංශයකි. මාර්ග සැලසුම් අංශය අධ්‍යක්ෂවරයෙකු විසින් ප්‍රධානත්වය දරණ අතර ඔහුට නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු සැලසුම් ඉංජිනේරුවන් (12) හා සහායක කාර්ය මණ්ඩලයකගේ සහයෝගය ලැබේ.

මෙම අංශය මාර්ග හා කාණුවල ජ්‍යාමිතික සැලසුම්, අන්තර්ජේදන වැඩි දියුණු සැලසුම්, තත්‍ය ඉදිකිරීම් සඳහා රථවාහන සංඥාපිත අන්තර් ජේදන සැලසුම් කිරීම හා ඉංජිනේරුවන් පුහුණු කිරීම් සිදු කරනු ලබයි. මෙම අංශය මා සං අ විසින් කුලී පදනම මත උපදේශකයන් විසින් පිළියෙල කරන ලද අධිවේගී මාර්ග / අන්තර් ජේදන සැලසුම් සමාලෝචනය කිරීමේ හා සැලසුම් සඳහා එකඟතාවය / අනුමැතිය ලබාදීමේ වගකීම දරයි. ඊට අමතරව පහත විස්තර කෙරෙන දෛනික හා විශේෂිත කාර්යයන් මාර්ග සැලසුම් අංශය විසින් ඉටුකරනු ලබයි.

- නව ප්‍රධාන මහාමාර්ග / අධිවේගී ව්‍යාපෘති හා ප්‍රධාන මහාමාර්ග වැඩි දියුණු / පුනරුත්ථාපන ව්‍යාපෘති සඳහා විමර්ශන, විස්තරාත්මක භූ ලක්ෂණ සමීක්ෂණ, ඉංජිනේරුමය සැලසුම් ක්‍රියාත්මක කිරීම, කොන්ත්‍රාත් ඇදීම්, ප්‍රමාණ බිල්පත් හා ඉංජිනේරුමය ඇස්තමේන්තු පිළියෙල කිරීම
- ප්‍රාදේශීය කාර්යාල හා වෙනත් රාජ්‍ය ආයතනවලට මාර්ග සැලසුම් පිළිබඳ උපදේශක සේවා සැපයීම, රාජ්‍ය ආයතන විසින් ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති සඳහා ප්‍රධාන මාර්ග සැලසුම් පිළියෙල කිරීම
- ප්‍රදාන ආයතන අරමුදල් මත විදේශ උපදේශකයන් විසින් ප්‍රධාන නව මහාමාර්ග / අධිවේගී ව්‍යාපෘති හා මාර්ග වැඩි දියුණු / පුනරුත්ථාපන ව්‍යාපෘති සඳහා පිළියෙළ කරන ශක්‍යතා අධ්‍යයන, මාර්ග ස්ථාන අධ්‍යයන හා විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් ආවේක්ෂණය කිරීම
- මහාමාර්ග සැලසුම් ප්‍රමිති, සැලසුම් මාර්ගෝපදේශ, සූත්‍රකරණ හා යාවත්කාලීන කිරීම සහ ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග සහ ප්‍රධාන මහාමාර්ග සැලසුම් කිරීම සඳහා සැලසුම් අත්පොත් පිළියෙල කිරීම.
- ඉංජිනේරුවන් අධිවේගී මාර්ග සැලසුම් කිරීම ඇතුළු මාර්ග සැලසුම් ක්ෂේත්‍රය පිළිබඳව සහ වෘත්තිය පුනරීක්ෂණ සඳහා පුහුණු කිරීම.

- ව්‍යාපෘතිවල ඉඩම් අත්පත් කර ගැනිම සම්බන්ධ ස්ථාන සඳහා ඉඩම් අත්පත් කර ගැනිමේ යෝජනා පිළියෙල කිරීම හා මහජන පැමිණිලි විමර්ශනය සහ සම්බන්ධිත ප්‍රශ්න නිරාකරණය කිරීම.
- ඔටෝ ඩෙස්ක් සිවිල් 3 ඩී මෘදුකාංග යොදාගෙන කරනු ලබන විස්තරාත්මක සිවිල් ඉංජිනේරු සැලසුම්වලට ගැලපෙන ඉංජිනේරුමය භූ ලක්ෂණ සමීක්ෂණ පැවැත්වීම සඳහා පිරිවිතර පිළියෙල කිරීම.
- භූ ස්ථාන (GPS) ස්ථාපනය කිරීමේදි සියලුම පළාත් නිලධාරීන්ට මග පෙන්වීම උපදෙස් දිම හා මෙම කේන්ද්‍රස්ථාන සම්බන්ධ කිරීමේදි මිනුම් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය.
- උපදේශකයන් විසින් පිළියෙල කර ආ. සං. බැ, වි.අ. ආ. ව්‍යා, ලෝ. බැ, ජා.ම.ආ.ව්‍යා. හා මා.ව්‍ය.සැ.ප. ආදි ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් විසින් ඉදිරිපත් කරන සැලසුම් සමාලෝචනය කර අදහස් දැක්වීම හා ඒකාබද්ධ පරීක්ෂා හා අවශ්‍ය කෙරෙන නිවැරදි කිරීම් සිදු කිරීම. ඒ අතරම විස්තරාත්මක ඉංජිනේරුමය සැලසුම් පිළියෙල කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් වෙනුවෙන්, උපදේශකවරුන්ට නිසි මාර්ගෝපදේශ සැපයීම.
- මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්ෂණික පුස්තකාලය කළමනාකරණය හා උසස් දැනුම අත්පත් කර ගැනිම සඳහා නව පොත්පත් සහිතව යාවත්කාලින කිරීම.
- භූ ලක්ෂණ සමීක්ෂණ පැවැත්වීම සඳහා ප්‍රසම්පාදන කටයුතු කිරීම.

## 3.5 ග්‍රාමීය පාලම් ඉදිකිරීම් ඒකකය.

ග්‍රාමීය පාලම් ඉදිකිරීම් ඒකකය 2007 වර්ෂය අග කොටසේදි මාර්ග සංවර්ධන අධිකාරිය තුළ පිහිටුවන ලද්දේ ග්‍රාමීය සමාජයට ආර්ථික මධ්‍යස්ථානවලට ළගාවීමට හැකිවනු පිණිස ග්‍රාමීය ප්‍රදේශවල පාලම්, හදිසි අළුත්වැඩියාවන් සහ අඩු වියදම් පාලම් සැපයීම සඳහා වේ. අඩු වියදම් පාලම් ඉදිකරන ලද්දේ අතහැර දමන ලද ගර්භිත වානේ පාලම් කොටස් පාවිච්චියට ගනිමිනි. මෙම ඒකකයට අයත් පැස්සුම්කරුවන් ක්‍රියාකරුවන් වැනි ග්‍රාමීය පාලම් ඉදිකිරීම් ඒකකය පුහුණු කම්කරුවන් හා පළාත්වල ඍජු කම්කරුවන් යොදා ගනිමින් වැඩ කරනුයේ ඉදිකිරීම් වියදම් අඩු කිරීම සඳහාය.

ග්‍රාමීය පාලම් ඉදිකිරීම් ඒකකය අඟුලාන දුම්රියපළ පාරේ අංක 50 පිහිටි පරිපාලන කාර්යාලය හා රත්මලාන බොරුපන පාරේ මාර්ග සංවර්ධන අධිකාරියේ පර්යේෂණ හා සංවර්ධන අංශ පරිශ්‍රයේ පිහිටි කම්හලකින්ද සමන්විතය.

ග්‍රාමීය පාලම් ඉදිකිරීම් ඒකකයේ කාර්ය වන්නේ,

- ප්‍රධාන වශයෙන් පැරණි පාලම් ගලවා ඉවත් කරන වානේ කොටස් යොදා ගනිමින්, ග්‍රාමීය පාලම් ඉදිකිරීම (අවශ්‍ය වූ විට නව වානේ කොටස්ද යොදාගනු ලබයි)
- ඉහත සඳහන් කටයුතු වලට සම්බන්ධ ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීම
- මාර්ග සංවර්ධන අධිකාරියේ පළාත්භාර ඉංජිනේරුවන් විසින් ඉටුකරන ග්‍රාමීය පාලම් උපව්‍යුහ කටයුතු අධීක්ෂණය කිරීම
- හදිසි තත්ත්වයන් යටතේ, බේලි පාලම් ඉදිකිරීමේ වැඩ කටයුතු
- මාර්ග සංවර්ධන අධිකාරියේ වානේ පාලම්වල ප්‍රධාන නඩත්තු කටයුතුවල යෙදීම
- එක්සත් රාජධානි වානේ පාලම් ව්‍යාපෘතිවලට බේලි පාලම් සැපයීම
- පැරණි වානේ පාලම් කණු, බාල්ක ආදිය ඉවත් කිරීම මගින් ඒවා සඵල ලෙස නැවත පාවිච්චියට ගැනීමට හැකිවේ.

## 3.6 පර්යේෂණ හා සංවර්ධන අංශය

පර්යේෂණ හා සංවර්ධන අංශය ප්‍රධාන වශයෙන් තත්ත්ව පාලන කටයුතු සඳහා වගකීම දරයි. මෙම අංශය ප්‍රාදේශීය සේවා හා ව්‍යාපෘති අංශයකින්, මධ්‍යම රසායනාගාරයකින් හා විමර්ශන අංශයකින් සමන්විතය. එය නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු ප්‍රධානත්වය දරණ අතර අධ්‍යක්ෂවරයෙක් විසින් අධීක්ෂණය කෙරෙයි. මෙම අංශය තව දුරටත්, පළාත් රසායනාගාර හා ව්‍යාපෘති රසායනාගාරවලින්ද, කලින් කලට පිහිටුවන ක්ෂේත්‍ර ඒකකවලින්ද පරිපූර්ණ වේ.

**කාර්යයන් හා වගකීම්**

පර්යේෂණ හා සංවර්ධන අංශය වගකීම දරන්නේ :

- මාර්ග ඉදිකිරීම්, පුනරුත්ථාපනය කිරීමේ හා නඩත්තුව පිළිබඳ ගැටළු ගැන උපදෙස් දීම හා තත්ත්ව පාලන කටයුතු අධීක්ෂණය කිරීම
- මාර්ග ඉදිකිරීම්, පුනරුත්ථාපනය හා නඩත්තුවේදී යොදා ගන්නා ද්‍රව්‍ය හා අනුගමනය කරන ක්‍රම පිළිබඳ ප්‍රායෝගික පර්යේෂණ කිරීම
- මාර්ග ඉවුරු, මාර්ග ව්‍යුහ හා මාර්ග ඇතුරුම් (රථවාහන ව්‍යුහ) පිළිබඳ විමර්ශනය කර සැලසුම් කිරීම
- පාලම් සඳහා පදනම් විමර්ශන කිරීම
- ද්‍රව්‍ය හා මිශ්‍රණ සැලසුම් පිළිබඳ එදිනෙදා පරීක්ෂණ කිරීම
- මාර්ගවලට හානි වන නායයෑම් ගැන විමර්ශනය කිරීම, සැලසුම් කිරීම හා විසඳුම් ක්‍රියාත්මක කිරීම
- මාර්ග ඉදිකිරීම, පුනරුත්ථාපනය හා නඩත්තු තාක්ෂණ ක්‍රම පිළිබඳ කාර්මික පිරිස් පුහුණු කිරීම

## 3.7 ඉඩම් අත්පත් කර ගැනීම හා පුනරුත්ථාපන අංශය

අනෙකුත් සංවර්ධනය වන බොහෝ රටවල් තුල මෙන්ම ශ්‍රී ලංකාවේ යටිතල ව්‍යුහවල අවශ්‍යතාව හා පරිසරයට සිදුවන ඍණාත්මත බලපෑම යන ද්විත්ව පීඩනය පාලනය කර ගැනීමට නිර්මාණාත්මක හා කල් පවත්නා විසඳුම් ඉදිරිපත් කිරීම හදිසි අවශ්‍යතාවයක් වේ. තවද අවුරුදු 30 ක දීර්ඝ ත්‍රස්තවාදි ගැටුම අවසානයත් සමඟ රටට නව අපේක්ෂා හා විශ්වාසය ඇතිවීම නිසා මෙය ඉහළ නැංවිය. මෙහි බලපෑම නොයෙකුත් පෙරමුණුවල දක්නා ලදි.

එබැවින් ප්‍රධාන යටිතල ව්‍යුහ සැපයුම්කරු ලෙස මාර්ග සංවර්ධන අධිකාරියට ගැටුම් කාල සීමාවෙන් පසුව, මාර්ග සහ අදාළ ව්‍යුහයන් සංවර්ධනය කිරීමේ දැවැන්ත මෙහෙවරක් ඉටුකිරීමට ලැබුණි. මාර්ග සංවර්ධන අධිකාරියේ ඉඩම් අංශය ස්ථාපිත කරන ලද්දේ ඉඩම් අත්පත්කර ගැනීමේ පණතේ (460 වන පරිච්ඡේදය) යටතේ, සියලුම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවලට සම්බන්ධිත ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමේ පරමාර්ථයෙනි.

### අංශයේ කාර්යයන් හා වගකීම්

- පළාත්භාර අධ්‍යක්ෂවරුන්ගෙන් ලැබෙන ඉඩම් අත්පත්කර ගැනීමේ අයදුම්පත් හදිසි හා සාමාන්‍ය පිළිවෙත යටතේ, 1950 අංක 09 දරණ ඉඩම් අත්පත්කර ගැනීමේ පණත අනුව ක්‍රියා කිරීම සඳහා වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.
- ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය කරමින් ලේඛන සැකසීම සඳහා සහාය දීම
- මිනුම්දෝරු දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධිකරණය කරමින් මැනීම් පෙන්වා දීම හා අත්පත් කර ගැනීමේ මායිම් සලකුණු කිරීම
- ඉඩම් අත්පත්කර ගැනීමේ පණතේ 2, 5 සහ 7 වැනි වගන්ති යටතේ නිවේදන ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්ට ප්‍රලේඛන වෙනුවෙන් සහාය වීම
- තක්සේරු දෙපාර්තමේන්තුව තත්ත්ව වාර්තා පිළියෙල කිරීමේදි සහාය ලබාදීම හා ප්‍රාදේශීය ලේකම්වරුන් සහ තක්සේරු දෙපාර්තමේන්තුව සම්බන්ධිකරණය කිරීම.
- ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ බල ප්‍රදේශ තුළ සන්තකය ලබා ගැනීමට සහාය වීම හා පළාත්වල අදාළ ප්‍රධාන ඉංජිනේරුවරයා මගින් හිස් ඉඩම් සන්තකය ලබා ගැනීමට කටයුතු කිරීම
- වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය, අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ, ජාතික මහාමාර්ග වැඩි දියුණු / පුනරුත්ථාපනය / පුළුල් කිරීම සඳහා අත්පත්කර ගත් ඉඩම් සඳහා වන්දි / පොලි මුදල් ගෙවීම සම්බන්ධිකරණය.
- අනාගත අත්පත් කර ගැනීමේ වැඩ සටහන සඳහා ක්‍රියාකාර සැලැස්ම පිළියෙල කර එය අනුමැතිය සඳහා මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් මගින් අයවැය අධ්‍යක්ෂ වෙත යැවීමට සැලසුම් අංශයට සහාය වීම.

- ගොඩනැගිලි හිමියන් මාර්ග සංවර්ධන අධිකාරියට එරෙහිව නඩු පවරා ඇති අවස්ථාවලදී ඉඩම් නඩු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට සහාය දීම හා ඉඩම් අංශය වෙත නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගැනීම
- මාර්ග සංවර්ධන කටයුතු සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අත්පත්කර ගන්නා ලද ඉඩම් පිළිබඳ වාර්තා පහසුවෙන් හැසිරවීම හා සංක්ෂිප්ත කිරීම සඳහා දත්ත ගබඩාව නඩත්තු කිරීම
- මාර්ග සංවර්ධන අධිකාරිය විසින් භුක්ති විඳින ඉඩම් පිළිබඳ වාර්තා පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම

## 3.8 පාරිසරික හා සාමාජීය සංවර්ධන අංශය

පාරිසරික හා සමාජීය සංවර්ධන අංශය 2006 ජූලි මස පවත්නා ඉඩම් අත්පත් කර ගැනීමේ හා ප්‍රතිස්ථාපන අංශයේ අධිකාරය යටතේ ස්ථාපිත කරන ලදි. 2011 වර්ෂයේදී අධ්‍යක්ෂවරයෙකු පත්කරන ලදුව දැනට පාරිසරික හා සමාජ සංවර්ධන අංශය මාර්ග සංවර්ධන අධිකාරියේ පාරිසරික හා සමාජීය ආරක්ෂණ අංශය ලෙස වෙනමම අංශයක් වශයෙන් ක්‍රියාත්මක වෙයි. ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් යටතේ තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතිය (අංක TA 4736 ශ්‍රී) මගින් ලැබුණ මූලික මාර්ගෝපදේශ යටතේ හොඳින් ස්ථාපිත කරන ලදුව, මාර්ග සංවර්ධන අධිකාරියේ සැලසුම් අංශය, මාර්ග සැලසුම් අංශය, ඉංජිනේරු සේවා අංශය හා ඇතුළු ප්‍රධාන අංශ විසින් මාර්ග සංවර්ධන ව්‍යාපෘති වලට සම්බන්ධ පාරිසරික හා සමාජීය ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කිරීමේදී අඛණ්ඩව සහාය ලබා දෙන ලදි. තවද පාරිසරික හා සමාජ සංවර්ධන අංශය මාර්ග සංවර්ධන අධිකාරියේ පිහිටුවා ඇති ව්‍යාපෘති කළමනාකරණ ඒකකවල පාරිසරික හා සමාජීය ආරක්ෂණ සැලසුම් ස්ථාපිත කිරීමටත් මෙකී සැලසුම් ක්‍රියාත්මක කිරීමට හා ආවේක්ෂණය කිරීමටත්, සහාය විය.

එසේම පාරිසරික හා සමාජ සංවර්ධන අංශයේ කාර්ය මණ්ඩලය, මධ්‍යම පරිසර අධිකාරිය, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී දෙපාර්තමේන්තුව සහ බලශක්ති අමාත්‍යාංශය ආදී විවිධ රාජ්‍ය ආයතන විසින් පිහිටුවන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවලට ක්‍රියාකාරී ලෙස සහභාගි විය.

**අංශයේ කාර්යයන් හා වගකීම්**

පාරිසරික හා සමාජ සංවර්ධන අංශයේ වගකීම් දෙවැදෑරුම් විය. උදා: ප්‍රලේඛන කොටස හා ආරක්ෂණ ආවේක්ෂණ කොටස වශයෙනි. 2011 වර්ෂය තුළ බාහිර ආයතන විසින් පිළියෙල කරන ලද, ඕනෑම පාරිසරික හා සමාජ ආරක්ෂණ ලේඛනයක් පාරිසරික හා සමාජ සංවර්ධන අංශය විසින්, සමාලෝචනය කර වැඩි දියුණු කරන ලද අතර, මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් එවැනි ලේඛන පිළියෙල කරන ලදි. (විශේෂයෙන්ම මාර්ග ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය යටතේ පිළියෙල කරන ලද වාර්තා) ආරක්ෂණ අනුකූලතා මට්ටම ආවේක්ෂණය කිරීම ප්‍රධාන ව්‍යාපෘති කරා ව්‍යාප්ත කරන ලද අතර දකුණු අධිවේගී මාර්ගය, පිටත වටරවුම් මාර්ගය, කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය හා ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය ඊට අඩංගු විය. මෙම ක්‍රියාකාරකම්වල සඵලත්වයට පාරිසරික හා සමාජ සංවර්ධන අංශය විසින් වර්ධනය කරන ලද කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) විශාල වශයෙන් සහාය වූ අතර ඊට රටේ ජෛව භූගෝලීය හා සමාජීය තොරතුරු අඩංගුය.

පහත දැක්වෙනුයේ මූලික පාරිසරික හා සමාජීය අනුකූලතා ලේඛන වන අතර ඒවා පිළියෙල කරන ලද්දේ හෝ සමාලෝචනය කරන ලද්දේ පාරිසරික හා සමාජ සංවර්ධන අංශය විසිනි.

**පාරිසරික ආරක්ෂණයන් :**

- මූලික තොරතුරු ප්‍රශ්නාවලිය
- සීග්‍ර පාරිසරික තක්සේරු පරීක්ෂා ලැයිස්තුව
- ව්‍යාපෘති පූර්ව ශක්‍යතා හා ශක්‍යතා වාර්තාවල පාරිසරික හා සමාජීය පරිච්ඡේද
- ආරම්භක පාරිසරික පරීක්ෂණ වාර්තාව හා පාරිසරික බලපෑම් තක්සේරු වාර්තා
- පාරිසරික බලපෑම් තක්සේරු වාර්තා
- කොන්ත්‍රාත් ලංසු ලේඛනවල පාරිසරික ක්‍රියාකාරී සැලසුම් වගන්ති
- පාරිසරික කළමනාකාරිත්ව හා පාරිසරික ආවේක්ෂණ සැලසුම්
- පාරිසරික ආරක්ෂණ අනුකූලතා පිළිබඳ මාසික හා කාර්තුමය ආවේක්ෂණ වාර්තා.

**සාමාජීය ආරක්ෂණයන් :**

- ආරම්භක දිළිඳුබව හා සාමාජීය තක්සේරුව
- අනිච්ඡානුගත ප්‍රතිස්ථාපන පරීක්ෂා ලැයිස්තුව
- ආදිවාසී මිනිසුන් පිළිබඳ සාරාංශ පරීක්ෂා ලැයිස්තුව
- ප්‍රතිස්ථාපන ක්‍රියාකාරී සැලැස්ම
- ප්‍රතිස්ථාපන ක්‍රියාකාර සැලැස්ම පිළිබඳ වාර්තා ආවේක්ෂණය

## 3.9 සැලසුම් අංශය

සැලසුම් අංශය මා.සං.අ. යේ ප්‍රධාන කාර්‍ය අංශවලින් එකක් වන අතර, කෙටිකාලීන, මැදකාලීන හා දිගුකාලීන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. වාර්ෂික වැඩ සටහන, පළාත්වලින් හා කොට්ඨාශවලින් රැස්කර ගන්නා තොරතුරු මත පදනම්ව සකස් කෙරෙන අතර, ක්‍රියාකාරී සැලැස්ම, අරමුදල් ප්‍රතිපාදන පැවතීම මත පදනම්ව පිළියෙල කෙරේ. මීට අමතරව, ව්‍යාපෘති හඳුනාගැනීම, ව්‍යාපෘති සූත්‍රකරණය, ව්‍යාපෘති යෝජනා, සංකල්ප යෝජනා, ව්‍යාපෘති සක්‍යතා වාර්තා පිළියෙල කිරීම, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මගින් ප්‍රදාන අරමුදල් ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා පිළියෙල කිරීම මෙම අංශය විසින් සිදුකරනු ලැබේ. වැඩි දුරටත් මා.සං.අ. යේ වැඩ සඳහා අවශ්‍ය කරන අත්පොත් හා මාර්ගෝපදේශ පිළියෙළ කිරීම, අත්පොත් හා මාර්ගෝපදේශ ප්‍රකාශයට පත්කිරීම හා සේවකයන් අතර විස්තර කිරීම මෙම අංශයේ වගකීම් යටතට ගැනේ. සැලසුම් අංශයේ සමස්ත කාර්යයන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් විසින් ප්‍රධානත්වය දරණු ලබන පහත දැක්වෙන ක්ෂේත්‍රයන් හතරකට බෙදා හැර තිබේ.

### සැලසුම්කරණය, සූත්‍රකරණය, වැඩ සටහන්කරණය, ප්‍රගති ආවේක්ෂණ හා භූ තො ප (GIS) ඒකකය

සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය විසින් වර්ධනය කරන ලද ආකෘතියට අනුව වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන මත පදනම් වු ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම, වාර්ෂික වාර්තා පිළියෙල කිරීම, සංයුක්ත සැලැස්ම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම් සැලැස්ම, පිළියෙල කිරීම, කෙටිකාලීන, මැදකාලින හා දිගුකාලීන වැඩ සටහන් පිළියෙල කිරීම මෙම ඒකකයේ කාර්යන් කිපයක් වෙයි. ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති සඳහා අනුමැතියට සංකල්ප පත්‍රිකා පිළියෙල කිරීම ප්‍රදානකරුවන් සඳහා ව්‍යාපෘති යෝජනා සහ ප්‍රදානකරු සහාය ඇතිව ව්‍යාපෘති සූත්‍රකරණය හා සම්බන්ධීකරණය මෙම අංශයෙන් ක්‍රියාත්මක කෙරේ.

### දත්ත රැස් කිරීමේ හා ඇගයීමේ ඒකකය

මෙම ඒකකය රථවාහන සමීක්ෂණ, ඇක්සල් බර සමීක්ෂණ, රළුමනු සමීක්ෂණ, ජාතික මහාමාර්ග දක්වා උසස් කිරීමට පළාත් මාර්ග පවරා ගැනීම සඳහා මෙම ඒකකය වගකීම් දරයි. HDM 4 සඳහා දත්ත ගබඩාව වර්ධනය කිරීම හා නඩත්තුව, රථවාහන දත්ත හා රළුබව පිළිබඳ දත්ත ගබඩාව නඩත්තු කිරීම, සන්ධි සංඥාකරණය සඳහා සන්ධි පිළිබඳ දත්ත නඩත්තුව, මහාමාර්ග තොරතුරු කළමනාකරණ පද්ධතිය හා (HIMS) වාර්තා පිළියෙල කිරීම පිළිබඳව මෙම ඒකකය වගකීම දරයි. HIMS පද්ධතිය යොදා ගනිමින්,

මාර්ග තොරතුරු පද්ධතියට (RIS) දත්ත ආනයනය හා මාර්ග තොරතුරු පද්ධතිය (RIS) සංවර්ධනය හා නඩත්තුව සඳහා දත්ත මාර්ග තොරතුරු පද්ධතියට දත්ත ආනයනය සඳහා මෙම ඒකකය විසින් හසුරුවනු ලබයි.

**රථවාහන කළමනාකරණ හා ආරක්ෂණ ඒකකය**

රථවාහන සංඥා හා මාර්ග සලකුණු සැලසුම් කිරීම, මාර්ග ආරක්ෂණ වැඩ දියුණු කිරීම්, වේගසීමා පිළිබඳ ගැසට් නිවේදන යාවත්කාලීන කිරීම, (වේග සීමාවලට සංශෝධන හා ගැසට් නිවේදනයන්) රථවාහන කළමනාකරණ ආදිය සඳහා මෙම ඒකකය වගකීම් දරයි.

**කළමනාකරණ තොරතුරු පද්ධති ඒකකය**

මෙම ඒකකය මා සං අ යේ ප්‍රධාන පරිගණක සර්වරය හා තැපැල් සර්වරය ස්ථාපනය හා නඩත්තු කිරීම, ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය ජාලය ස්ථාපනය, අන්තර් ජාල හා විද්‍යුත් තැපැල් පහසුකම් සැපයීම, මා සං අ යේ වෙබ් අඩවිය වර්ධනය කිරීම හා නඩත්තුව, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසන් සභාවට අයත් වෙබ් අඩවිය තුළ මා සං අ යේ වෙබ් පිටුව වර්ධනය හා පවත්වාගෙන යාම, මහාමාර්ග තොරතුරු කළමනාකරණ පද්ධතිය (HIMS) ස්ථාපනය හා නඩත්තුව, මා සං අ විසින් භාර ගන්නා ලද ව්‍යාපෘති ආවේක්ෂණ පද්ධතිය වර්ධනය හා නඩත්තුව ව්‍යාපෘති දත්ත ගබඩාව නඩත්තුව මගින් ඉටුකිරීම, මා සං අ යේ සේවය කරන කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ දැනුම වැඩි දියුණු කිරීම හා මාර්ග සංවර්ධන අධිකාරියේ අන්තර් ජාලය වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩ සටහන් පැවැත්වීම සඳහා මෙම ඒකකය වගකීම දරයි.

**ජාල පරිපාලනය**

- මාර්ග සංවර්ධන අධිකාරිය සතුව සෙත්සිරිපාය පරිශ්‍රය තුළ පරිගණක 250 කින් යුක්ත පරිගණක ජාලයක් හා තොරතුරු ගොනු සර්වරයක් හා ප්‍රොක්සි සර්වරයක් වේ. එම පරිගණක 250 න් අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් පහසුකම්වලින් යුත් පරිගණක 65කි. මෙම සියලු පරිගණක රැහැන් රහිත ප්‍රාදේශීය ජාලයට සම්බන්ධිතය (WLAN) කලින් කලට නව පරිගණක හා ග්‍රාහකයන් ජාල බල ප්‍රදේශයට එක් කිරීම හා ඉවත් කිරීම සිදු කරනු ලැබේ.

- ප්‍රධාන සර්වරය තුළ සෑම අංශයකටම අයත් පොදුවේ ගොනුවකට හවුල්වීමේ වරප්‍රසාදය ඇත. සෑම අංශයක ග්‍රාහකයකුටම ප්‍රධාන සර්වරයට විවිධ මට්ටමේ ඇතුළුවීමේ සංලක්ෂණ හා වරප්‍රසාද තිබේ.

- කළමනාකරණ තොරතුරු ඒකක කලින්කලට ජාලය තුළ ග්‍රාහක ලක්ෂණ හා ඔවුන්ගේ වරප්‍රසාද පිළිබඳව ආවේක්ෂණ කිරීම සිදුකළ යුතුය.
- සියලුම හා සෑම අංශයකටම අංශය තුළ ජාලගත කරනු ලැබූ හවුල් මුද්‍රණ යන්ත්‍ර ඇත.
- ප්‍රධාන කාර්යාලයේ තෝරාගත් කාර්ය මණ්ඩලයකට අන්තර්ජාල පහසුකම් ලබාදී ඇත.
- මාර්ග මාර්ග සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය නඩත්තුව හා තත්ත්වය නැංවීම.

## 3.10 අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශය

අධිවේගී මාර්ග කළමනාකරණ ඒකකය 2009 ජුලි මස ස්ථාපිත කරන ලද අතර, ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) සහයෝගය ඇතිව, ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග මෙහෙයුම, නඩත්තුව හා කළමනාකරණය සඳහා අධිවේගී පරිපාලන ව්‍යාපෘතියක් (අධ්‍යයන ව්‍යාපෘතියක්) (විශේෂයෙන්ම, දක්ෂිණ අධිවේගී මාර්ගය) සඳහා පිහිටුවන ලදි.

**අංශයේ වගකීම් :**

- අධිවේගී මාර්ගවල අයවැයකරණය, විගණනය සමඟ රථවාහන කටයුතු පිළිබඳ මූලික සැලසුම්කරණය, කළමනාකරණය හා මෙහෙයුම, ගාස්තු කටයුතු හා නඩත්තු කටයුතු.
- රථවාහන අධ්‍යයනයන්, නඩත්තු කටයුතු සම්බන්ධිත අධ්‍යයනයන් හා ගාස්තු කටයුතු සම්බන්ධ අධ්‍යයනයන් සිදු කිරීම.
- ගාස්තු එකතු කිරීම, රථවාහන නඩත්තුව, පරිපාලන හා මුදල් අංශය සඳහා නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා පුහුණු කිරීම.
- රථවාහන කළමනාකරණය, ගාස්තුකරණය හා නඩත්තු කටයුතු සඳහා පිරිවිතර ස්ථාපිත කිරීම.
- රාජ්‍ය ආයතන හා වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණය.
- ගාස්තු එකතු කිරීම සඳහා මූලික සැලසුම් කිරීම.
- රථවාහන මෙහෙයුම සඳහා මූලික සැලසුම්කරණය.
- රථවාහන, ගාස්තුකරණය හා නඩත්තු කටයුතු වලට සම්බන්ධ අත්පොත් පිළියෙල කිරීම.

## 3.11 වත්කම් කළමනාකරණ හා ආදායම් අංශය

වත්කම් කළමනාකරණ හා ආදායම් අංශය (PM&R) 2004 අගෝස්තු මාසයේ පිහිටුවන ලද්දේ මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා එයට අයත් මූලාශ්‍රවලින් ආදායම් ඉපයීම සඳහාය. මෙසේ උපයන ආදායම් ශ්‍රී ලංකාවේ ජාතික මහාමාර්ග ජාලය නැංවීමේ නඩත්තු කිරීමේ හා ඉදිකිරීමේ, මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් හා ගොඩනැගිලි නඩත්තු කිරීමේ හා සේවක සුභසාධනය නැංවීම් වැනි මෙහෙවර සඳහා වාර්ෂිකව භාණ්ඩාගාරය වෙතින් ලැබෙන අරමුදල්වලට පරිපූරක ආදායමක් වෙයි.

වත්කම් කළමනාකරණ හා ආදායම් අංශය ප්‍රචාර පුවරු / මිල ගණන් පුවරු / ප්‍රචාරක තොරන්, කැන්ටිලිවර්, දුරකථන කුටි / බස් නැවතුම් / ලොතරැයි කුටි වටරවුම් ආදිය සඳහා ගාස්තු එකතු කිරීමෙන් මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා ආදායම් උපදවනු ලබයි. වැඩිපුර ආදායම් ඉපයීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය කිරීමට සැලකිල්ලට ගෙන ඇත. මාර්ග රක්ෂිතය පාවිච්චි කරන ප්‍රයෝජ්‍ය සේවා වලින් ගාස්තු අයකිරීමේ හැකියාව සොයා බැලීමටද පියවර ගෙන තිබේ.

වත්කම් කළමනාකරණ හා ආදායම් අංශය මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන් යොදා ගනිමින්, මාර්ග දූපත්වල, වටරවුම්වල හා වැදගත් ස්ථානවල මාර්ග රක්ෂිතයේ අලංකරණ කටයුතු හසුරුවනු ලබන අතර, ඒ සඳහා උනන්දුවක් දක්වන පෞද්ගලික පාර්ශවයන්ට සිය නිෂ්පාදන සඳහා වෙළඳ ප්‍රචාරණ මාර්ගයක් වශයෙන් මාර්ග අලංකරණ කටයුතු සඳහා අනුග්‍රාහකත්වය සඳහා යොදාගනු ලැබේ.

### අංශයේ කාර්යයන් හා වගකීම්

- ඉඩම් හා ගොඩනැගිලි ඇතුළුව (මාර්ග සංවර්ධන අධිකාරියේ සංචාරක නිවාස හැර) සියලුම වත්කම් කළමනාකරණය කිරීම.
- පුද්ගලික පාර්ශ්වයන් විසින්, ප්‍රචාරණ පුවරු, මිල ගණන් පුවරු, ප්‍රචාරක තොරන්, කැන්ටි ලිවර්, දුරකථන කුටි, බස් නැවතුම්, නියෝග පුවරු ස්ථාපිත කිරීම හා නඩත්තුව වෙනුවෙන් ප්‍රතිපත්ති, පරිපාටි සම්පාදනය කිරීම හා ගාස්තු යෝජනා කර මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතියට ඉදිරිපත් කිරීම.
- ප්‍රචාරක පුවරු, මිල ගණන් පුවරු, ප්‍රචාරක තොරන්, කැන්ටිලිවර්, දුරකථන කුටි, බස් නැවතුම් හා නියෝග පුවරු ස්ථාපිත කිරීම හා නඩත්තුව සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී මාර්ග සංවර්ධන අධිකාරියේ පළාත් කාර්ය මණ්ඩලය ආවේක්ෂණය කිරීම හා ඔවුන්ට සහාය දීම.
- ජාතික මහාමාර්ගවල මාර්ග දෙපස විවේක ප්‍රදේශ ඇති කිරීම ප්‍රවර්ධනය

- උමං මාර්ගවල ඉදිකර ඇති සාප්පු ඒකක හා වෙනත් පහසුකම් වෙනුවෙන් ගාස්තු අයකිරීම.
- ආදායම් ඉපදවීම සඳහා වෙනත් උචිත පියවරයන් සොයා බැලීම.
- ඉහත සඳහන් කාර්යයන්ට අමතරව, මාර්ග අලංකරණය කිරීමේ කටයුතුද වත්කම් කළමනාකරණ හා ආදායම් අංශයේ විෂය පථයට ඇතුළත් කර ඇත.
- මාර්ග අලංකරණ කටයුතු සඳහා අවශ්‍ය ශාක වර්ග සැපයීමට පැල තවාන් පවත්වාගෙන යාම.

## 3.12 යාන්ත්‍රික අංශය

යාන්ත්‍රික අංශය මාර්ග සංවර්ධන අධිකාරියේ පවත්නා සම්පත් ප්‍රයෝජනයට ගනිමින් පහසු ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය කෙරෙන වාහන, ඉදිකිරීම් යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදන යන්ත්‍රාගාර, ලෝන්ච් සහ පාරු සේවා හා සම්බන්ධ සේවා සැපයීම පිළිබඳව වගකීම් දරයි. යාන්ත්‍රික අංශය ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන අංශයකින්ද, ප්‍රවාහන අංශයෙන්ද අඟුලාන පිහිටි නඩත්තු කම්හලකින්ද සමන්විතය. යාන්ත්‍රික අංශය විවිධ ස්ථානවල ස්ථාපිත කර ඇති පෙරමුසු යන්ත්‍රාගාරවලද නඩත්තුව මෙහෙයවනු ලබයි. මෙම අංශය අධ්‍යක්ෂවරයෙකු විසින් අඟුලාන කම්හලේ ස්ථානගතව සිටින නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු, යාන්ත්‍රික ඉංජිනේරුවරුන් හය දෙනෙකු යන්ත්‍රාගාර ඉංජිනේරුවන් දෙදෙනෙකු, යාන්ත්‍රික අධිකාරීන් හා සහාය කාර්ය මණ්ඩලයේ සහාය සහිතව පාලනය කරනු ලබයි. තවද යාන්ත්‍රික අංශය අඟුලාන පිහිටි යාන්ත්‍රික කම්හල, සේවා ස්ථානය හා පෑලියගොඩ යෝජිත ඒකක යාන්ත්‍රික කම්හල පාලනය කරනු ලබයි. එය අඟුලාන පිහිටි ග්‍රාමීය පාලම් පුනරුත්ථාපන කම්හලේ ප්‍රධාන යන්ත්‍ර අළුත්වැඩියාවන් සඳහා අවශ්‍ය සහාය සහ උපදේශනය ලබාදෙන අතර, මගනැගුම ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ (පෞ) සමාගමෙන් පවරාගන්නා ලද යන්ත්‍ර අළුත්වැඩියා කරයි. 2011 වර්ෂය තුළ රජය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් විවිධ වර්ගවල චීන මාර්ග ඉදිකිරීම් යන්ත්‍ර සූත්‍ර හා යන්ත්‍රාගාර සපයන ලදි.

**අංශයේ කාර්යයන් හා වගකීම්.**

**යාන්ත්‍රික අංශයේ ප්‍රාථමික වගකීම් වනුයේ :**

- මාර්ග සංවර්ධන අධිකාරියට අයත් යන්ත්‍ර සූත්‍ර පිරියත හා වාහන අඟුලාන කම්හල හා මාර්ග සංවර්ධන අධිකාරියේ ලියා පදිංචි පෞද්ගලික ගරාජයන්ගේ සහයෝගය ඇතිව මෙහෙයවීම, ආවේක්ෂණය, නඩත්තුව හා කළමනාකරණය

- ආ.සං.බැ., ජ.ජා.ස.බැ.ආදි විදේශ අරමුදල් හා රජයේ ඒකාබද්ධ අරමුදල මගින්. යන්ත්‍ර සූත්‍ර හා වාහන ප්‍රසම්පාදනය සඳහා කටයුතු කිරීම
- පවත්නා යන්ත්‍රසූත්‍ර, උපකරණ හා වාහන සඳහා අමතර කොටස් මිලදී ගැනීමට කටයුතු සම්පාදනය
- සමස්ත යන්ත්‍ර සංචිතය කුලියට දීම කළමනාකරණය කිරීම හා පරිගණකගත කරන ලද පරිසරයක ගාස්තු හා අළුත්වැඩියා වාර්තා පිළිබඳ දත්ත ගබඩාව පවත්වාගෙන යාම
- අවශ්‍ය වූ විට යන්ත්‍රෝපකරණ වාහන හා සේවා බදු ගැනීම, කළමනාකරණය හා බාහිර සම්පත්හරණය හා අදාල කටයුතු කළමනාකරණය (පිරිවැයකරණය හා ගෙවීම සඳහා අදාළ වාර්තා පවත්වාගෙන යාම)
- මාර්ග සම්බන්ධතා නොමැති ගංගා සහ කලපු හරහා පාරු සේවය සැපයීම යාපනය ප්‍රධාන ඉංජිනේරුවරයාගේ සහාය ඇතිව, (යාපනයේ කයිට්ස්වල පාරු සේවය හා යාපනය කුරිකට්ටුවාන් - ඩෙල්ෆ් අතර ලෝන්ච් සේවය) සැපයීම.
- මාර්ග සංවර්ධනයට අයත් වාහන සංචිතය හා ආදායම් බලපත්‍ර හා රක්ෂණ ආවරණ ලබා ගැනීම හා හදිසි අනතුරක් / සොරකමක් සිදුවූ අවස්ථාවල ඒ සඳහා පියවර ගැනීම.
- මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වාණිජමය වාහන සඳහා යෝග්‍යතා සහතික නිකුත් කිරීම.
- ආර්ථිකමය නොවන වාහන හා යන්ත්‍ර සමීක්ෂණයකින් පසුව ඉවතලෑමේ ක්‍රියා මාර්ගය සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සහ කටයුතු පිළියෙල කිරීම.
- යාන්ත්‍රික පිරිස් පුහුණු කිරීම.
- ප්‍රවාහන අංශයේ සේවාවන් කළමනාකරණය හා ආවේක්ෂණය කිරීම.

## 3.13 පුහුණු අංශය

දැනුම යනු මානව සම්පත සංවර්ධනය වන තාක්ෂණික ලෝකය තුළ, එහි ගතික කාර්යයන්, මෙහෙයුම් වගකීම් හා ආයෝජනයක් වශයෙන් අතිශයින්ම අවශ්‍ය කෙරෙන්නාවූ වැදගත්ම සම්පතක් ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය විශ්වාස කරයි. මෙම සම්පත වෙනස්වන්නාවූ තාක්ෂණික හා විද්‍යාත්මක ලෝක පරිසරයට ගැලපෙන පරිදි හා පුහුණුවට සම්බන්ධිත කටයුතු මගින්, නිරන්තරව යාවත්කාලීන කළ යුතුය. තමන් වෙත පැවරෙන කාර්යයන් ඉටුකිරීමට හැකියාවක් ඇති කාර්යක්ෂම මහාමාර්ග ආයතනයක් සංවර්ධනය කිරීම සඳහා කුසලතාවයෙන් යුක්ත තෘප්තිමත් සේවා බලකායක් සිටීම අත්‍යාවශ්‍ය වේ. පුහුණු අංශයට ආයතනයේ පුහුණු කටයුතු ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇත.

පුහුණු අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ, මාර්ග සංවර්ධන අධිකාරියේ සියලුම ශ්‍රේණිවලට අයත් සේවකයන් වෙත, ඔවුන්ගේ දැනුම හා කුසලතාවයන් නැංවීම සඳහා ලෝකයේ විශිෂ්ඨතම

භාවිතයන් සහ තාක්ෂණයන් භාවිත කරවීම, උසස් කාර්ය සාධනය හා ආයතනික ධාරිතාව වර්ධනය කිරීමට හැකිවන පරිදි ඔවුන්ගේ වැඩවල කාර්යක්ෂමතාව හා සඵලතාවය සඳහා උචිත ආකල්ප සංවර්ධනය කිරීම වේ. පුහුණු වැඩ සටහන්, දැනුම් ක්ෂේත්‍රයන් පරිපූර්ණ කිරීම සඳහා සැලකිල්ලෙන් හඳුනාගනු ලබන අතර, සම්පත් දායක ධාරිතාවන්, සේවකයන්ගේ අභිප්‍රායයන් පූර්ණ කෙරෙමින්, ආයතනයේ පරමාර්ථය හා අරමුණු සාධනය කිරීමට අවශ්‍ය කෙරේ. පුහුණු වැඩ සටහන සාමාන්‍ය පරිදි නේවාසිකව සංවිධානය කළ දේශණ, සම්මන්ත්‍රණ, වැඩමුළු, ක්ෂේත්‍ර නිරූපණයන් සහ බාහිර ආයතන විසින් පවත්වන පුහුණු පාඨමාලා ප්‍රයෝජනයට ගනිමින් අවශ්‍ය කෙරෙන අවස්ථාවලදී පරිපූරණය කරනු ලබයි.

**කාර්යයන් හා වගකීම්**

පුහුණු අංශය පහත සඳහන් පුහුණු වැඩ සටහන් හා ක්‍රියාකාරකම් පවත්නා පුහුණු අවස්ථාවලට අනුව වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබයි.

- නිතිපතා නේවාසික පුහුණු වැඩ සටහන් සංවිධානය කිරීම හා පැවැත්වීම : ඒවා අතර,
  - දේශණ
  - සම්මන්ත්‍රණ
  - නිරූපණ
  - පරිගණක භාවිතයන් හා
  - ක්ෂේත්‍ර චාරිකාද වෙයි.

- නවක පත්වීම්ලාභින් සඳහා නිලාරම්භක පාඨමාලා පැවැත්වීම.
- අභ්‍යන්තර උසස්වීම්ලාභි කාර්ය මණ්ඩලය සඳහා පාඨමාලා පැවැත්වීම.
- ඉංග්‍රීසි භාෂා සන්නිවේදන පුහුණු පාඨමාලා පැවැත්වීම.
- ඇගයීම හා උසස්වීම් සඳහා විභාග පැවැත්වීම.
- ඉංජිනේරුවන්ට පූර්ණ වෘත්තිය සුදුසුකම් ලබා ගැනිමට මහාමාර්ග හා පාලම් පිළිබඳ එක් අවුරුදු සැලසුම් පුහුණුව සඳහා නම් කිරීම.
- වාර්ෂික තාක්ෂණික සහයෝගිතා වැඩ සටහනක් පදනම් කර ගනිමින්, වාර්ෂික විදේශ පුහුණු අවශ්‍යතා පිළියෙල කිරීම.
- ඉහත සඳහන් වැඩ සටහන පාදක කර ගනිමින් විදේශ පුහුණු පාඨමාලා සඳහා සේවකයන් නම් කිරීම.
- මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන් වෙනත් දේශිය ආයතනවල පාඨමාලා සඳහා නම් කිරීම.
- සේවකයන් ඩිප්ලෝමා / පශ්චාත් උපාධි ඩිප්ලෝමා / ශාස්ත්‍රපති වැනි පාඨමාලා දේශීය විශ්ව විද්‍යාල / ආයතන වලදී හැදෑරීම සඳහා නම් කිරීම.

- වෙනත් ආයතනවල උපාධි අපේක්ෂකයන් හා ආධුනිකයින් සඳහා පුහුණු අවස්ථා සැපයීම.
- සියලුම ගණයේ සේවකයන් සඳහා පුහුණු අවශ්‍යතා සමීක්ෂණ පැවැත්වීම හා පුහුණු වැඩ සටහන් සංවර්ධනය කිරීම.

## 3.14 නීති අංශය

මාර්ග සංවර්ධන අධිකාරිය විශාල සංඛ්‍යාවක් සේවකයින් සහිත ආයතනයක් වශයෙන්, දිවයින පුරා ඇති වත්කම් ආරක්ෂා කිරීම මාර්ග අයිතිය හා මාර්ග රක්ෂිතය රැකීම ඇතුළු සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කිරීම, දිවයින පුරා මාර්ග වැඩි දියුණු කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේදී එයට හා සේවකයන්ට එරෙහි නීතිකෘත්‍යයන්ට මුහුණ දීමට සිදුවේ. තවද මාර්ග සංවර්ධන අධිකාරිය එහි සේවකයන් විසින් කම්කරු විනිශ්චය සභාවල පවරනු ලබන නඩු පිළිබඳවද කටයුතු කිරීමට සිදුවේ. නීති අංශය මාර්ග සංවර්ධන අධිකාරිය සම්බන්ධ කෙරෙමින් පැවැත්වෙන නඩු පැවරීම් පිළිබඳ නීති කටයුතු පිළිබඳවද ක්‍රියා කිරීමට සිදුවේ.

**මෙම අංශයේ සාමාන්‍ය කාර්යයන් වනුයේ :**

- පැමිණිලි, පිළිතුරු හා විරෝධතා ගොනු කිරීම, නිරීක්ෂණ හා ගිවිසුම් පිළියෙල කිරීම හා දිස්ත්‍රික් උසාවිය හමුවේ මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පෙනී සිටීම හා නඩු වලට සම්බන්ධ සියලු පියවර ගැනීම.
- මහේස්ත්‍රාත් අධිකරණයේ මංමාවත් ආඥා පණත යටතේ ඇති නඩුවලදී ප්‍රති විරෝධතා ගොනු කිරීම හා පෙනී සිටීම.
- කම්කරු විනිශ්චය සභා තුළ නිරීක්ෂණ පිළියෙල කිරීම හා පිළිතුරු ගොනු කිරීම.
- මාර්ග සංවර්ධන අධිකාරිය සම්බන්ධ නඩුවලදී නීතිපති සමඟ සම්බන්ධීකරණය කිරීම හා සාකච්ඡාවලට සහභාගි වීම.
- උපදේශක නීතිඥයන් වශයෙන්, අභියාචනාධිකරණය හා ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පෙනී සිටීම හා මාර්ග සංවර්ධන අධිකාරිය සම්බන්ධ නඩු වලදී නීතිපති දෙපාර්තමේන්තුවට සහාය වීම.
- මාර්ග සංවර්ධන අධිකාරියේ විවිධ අංශයන් විසින් යොමු කරනු ලබන නීතිමය කරුණු පිළිබඳ මතය ප්‍රකාශ කිරීම.
- කළමනාකාරීත්වය කොන්ත්‍රාත්කරුවන් සමඟ පවත්වන සාකච්ඡා වලදී පෙනී සිටීම හා නීතිමය කරුණු පිළිබඳව උපදෙස් දීම.
- ජාතික මහාමාර්ග පනත පිළිබඳ සම්මන්ත්‍රණ / සාකච්ඡාවලට සහභාගි වීම හා ඉහත කී පනත කෙටුම්පත් කිරීමේදී සහාය වීම.
- මාර්ග සංවර්ධන අධිකාරිය හා ව්‍යාපෘති වෙනුවෙන්, ගිවිසුම් හා ඔප්පු කෙටුම්පත් කිරීම.

## 3.15 ප්‍රසම්පාදන අංශය

මෙම අංශය වෙත බලතල පැවරී ඇත්තේ, ශ්‍රී ලංකා රජයේ අරමුදල් යටතේ, මාර්ග හා පාලම් වැඩි දියුණු කිරීම පිළිබඳ ප්‍රසම්පාදන කටයුතු හා මාර්ග සංවර්ධන අධිකාරියේ භාණ්ඩ හා කාර්යාල ලිපිද්‍රව්‍ය තොග වශයෙන් මිලදී ගැනීම පිළිබඳ ප්‍රසම්පාදන කටයුතු මෙහෙයවීමටය. ආයතනයේ සැපයුම් දාමයට සහාය දෙන අතරම, ප්‍රධාන කාර්යයන් වලට ලංසු කැඳවීම, සංවර්ධන කටයුතු සඳහා කොන්ත්‍රාත් ඇගයීම හා ප්‍රදානය කිරීම අයත් වේ.

## 3.16 පරිපාලන අංශය

පරිපාලන අංශය, මාර්ග සංවර්ධන අධිකාරියේ සමස්ත මානව සම්පත් කළමනාකරණය හා බඳවා ගැනීම්, සංවර්ධනය, උසස්කිරීම්, විනය කටයුතු, සේවක පැමිණීම් හා නිවාඩු වැනි පරිපාලන කාර්යයන් පිළිබඳව වගකීම දරයි.

***අංශයේ කාර්යයන් හා වගකීම් :***

පරිපාලන අංශය වගකීම දරනුයේ :

- අධිකාරියේ මානව සම්පත් / පිරිස් හා පරිපාලනමය කාර්යයන් වලට සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.
- අධිකාරියේ කාර්යයන් විධිමත් කිරීම සඳහා නීතිරීති හා පරිපාටින් සැකසීම හා ක්‍රියාවට නැගීම.
- අධිකාරියට පිරිස් සේවා සැපයීම.
- මාර්ග සංවර්ධන අධිකාරියේ මෙහෙයුම්වලට අවශ්‍ය කාර්යාල සේවා හා වෙනත්, සහායක සේවා සැපයීම සඳහාය.

පරිපාලන අංශය ඉටුකරන කාර්යයන් තුන් වැදෑරුම් වන අතර ඒවා පිරිස්, සාමාන්‍ය හා ආයතන සේවා වෙති.

- **මානව සම්පත් / පිරිස් සම්බන්ධ කටයුතු :**

✓ සේවකයන් බඳවා ගැනීම

✓ සේවකයින් අනුස්ථාපනය

✓ සේවකයින් පුහුණු කිරීම හා සංවර්ධනය කිරීම

✓ සේවකයින් උසස් කිරීම

- ✓ සේවක වැටුප් හා දීමනා වලට සම්බන්ධ කටයුතු
- ✓ කාර්මික සම්බන්ධතා
- ✓ දුක් ගැනවිලි නිරාකරණය
- ✓ විනය කටයුතු
- ✓ සේවක පැමිණීම හා නිවාඩු කළමනාකරණය

- **සාමාන්‍ය පරිපාලන කටයුතු**
  - ✓ කාර්යාල ඉඩකඩ හා නඩත්තුවට සම්බන්ධ කටයුතු
  - ✓ දුරකථන, කාර්යාල උපකරණ හා ලිබඩු වැනි සහාය සේවා සැපයීම

- **ආයතන කටයුතු**
  - ✓ පිරිස් හා කාර්යාල කළමනාකරණයට සම්බන්ධ ප්‍රතිපත්ති, නීතිරීති, අත්පොත් හා උපදෙස් සම්පාදනය
  - ✓ නීතිරීති හා පරිපාටීන් පනවමින් චක්‍රලේඛ නිකුත් කිරීම
  - ✓ චක්‍රලේඛ ක්‍රියාත්මක කිරීම ආවේක්ෂණය
  - ✓ සුභසාධන කටයුතු

## 3.17 මුදල් අංශය

මුදල් අංශයට මාර්ග සංවර්ධන අධිකාරියේ සමස්ත මූල්‍ය කළමනාකරණය පිළිබඳ වගකීම පවරා ඇත. එය මාර්ග ඉදිකිරීම හා නඩත්තුව සඳහා අමාත්‍යාංශය වෙතින් ලැබෙන අරමුදල් හා ප්‍රයෝජ්‍ය සේවා ප්‍රතිස්ථාපනය කිරීමේදී මාර්ගවලට සිදුවන හානි හේතුවෙන්, රාජ්‍ය / පෞද්ගලික ආයතන හා පුද්ගලයන් වෙතින් ලැබෙන අරමුදල් කළමනාකරණය කරයි. අධ්‍යක්ෂ මුදල් මෙම අංශයේ ප්‍රධානියා වන අතර, නියෝජ්‍ය අධ්‍යක්ෂවරු දෙදෙනෙකු හා ගණකාධිකාරීන් කණ්ඩායමක් හා සහායක කාර්ය මණ්ඩලයේ සහයෝගය ඔහුට ලැබේ. පළාත් ගණකාධිකාරීන් 10 දෙනෙකු හා අදාළ කාර්ය මණ්ඩලය ප්‍රාදේශීයව සිටින අතර, ඔවුන් පළාත්භාර අධ්‍යක්ෂවරයා යටතේ පාලනය වෙයි. වැටුප් ගෙවීම්, ප්‍රාදේශීය ගිණුම්, අයවැය හා බදු, වෛද්‍ය රක්ෂණය, අවසාන ගිණුම්, ආදායම, වත්කම් හා ගබඩා ව්‍යාපෘති හා ප්‍රාදේශීය ගිණුම් ඒකක හා පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලයට අනුයුක්ත ප්‍රාදේශීය ඒකක, මාර්ග සංවර්ධන අධිකාරියේ ගිණුම් පද්ධතිය ක්‍රියාත්මක කරයි. ග්‍රාමීය පාලම් ඉදිකිරීම් ඒකකය, ඇස්පල්ට් තාර යන්ත්‍රාගාර ඒකකය, අධිවේගී මෙහෙයුම් නඩත්තු අංශය පරිපාලනමය වශයෙන්, අදාළ ඒකකවල අධ්‍යක්ෂවරයා යටතට අයත් වේ. මීට අමතරව 2011 වර්ෂයේදී සිවිල් කටයුතු පොදු කාර්ය වියදම් සඳහා සීමිත දීමනා ගෙවීමට මුදල් අංශය මුදාහැර ඇති අරමුදල්වලින් බැංකු ගිණුම් පවත්වාගෙන යාමට ප්‍රධාන ඉංජිනේරුවරුන්ට බලය පවරන ලදි.

**කාර්යයන් හා වගකීම්**

- මුදල් අංශය, ප්‍රචාරණ පුවරු ආදායම්, පරීක්ෂණ ගාස්තු වැනි අනෙකුත් සියලු ආදායම් රැස්කරන අතර, මහා භාණ්ඩාගාර කළමනාකාරීත්වය හා ආයෝජන මගින් ලැබීම් උපරිමායනය කරනු ලබයි.
- ප්‍රාග්ධන වියදම් කාර්යයන් මුදල් අංශය විසින් පාලනය කරයි.
- වර්ෂය සඳහා පොදු කාර්ය වියදම් අයවැය පිළියෙල කරන අතර, එම සීමාවන් තුළ පාලනය කරයි. එය නිසි මූල්‍ය වාර්තා පවත්වාගෙන යනු ලබන අතර, වඩා හොඳ මූල්‍ය විනයක් සඳහා පද්ධති හා පාලන හඳුන්වාදී මාසික / වාර්ෂික මූල්‍ය වාර්තා නඩත්තු කරමින් සියලු බදු කටයුතු මෙහෙයවනු ලබයි.
- මුදල් අංශය මා සං අ යේ වත්කම් / වත්කම් ලේඛන වාර්තා පවත්වාගෙන යාමට වගකිය යුතු අතර, ඒවායේ ආරක්ෂණය සඳහා පාලන පියවරයන් ක්‍රියාත්මක කරනු ලබයි.
- අංශය විසින් මා.සං.අ.යේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය හා සේවක වෛද්‍ය රක්ෂණ ක්‍රමය මෙහෙයවන අතර, අදාළ ගිණුම් වාර්තා පවත්වාගෙන යනු ලබයි.

## 3.18 අභ්‍යන්තර විගණන අංශය

අධිකාරිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩ සටහනට අනුව අභ්‍යන්තර විගණන කටයුතු සිදුකරන ලදි. මෙම වැඩ සටහන ආයතන ව්‍යුහය, ගිණුම් පද්ධතිය, ශ්‍රම, පාලන හා අනුගමනය කරන ලද පරිපාටීන්, දිවයින පුරා මාර්ග සංවර්ධන අධිකාරියේ මෙහෙයුම් හා මූල්‍ය කටයුතු ආවරණය වන පරිදි සිදුකරන ගණුදෙනුවල පරිමාව සැලකිල්ලට ගෙන සැලසුම් කර ඇත.

***අංශයේ කාර්යයන් :***

- විගණන සැලසුම හා වැඩ සටහන පිළියෙල කිරීමේදී අවදානම් කළාප හඳුනා ගැනීම.
- විගණන සැලසුම හා වැඩ සටහනට අනුව සියලුම නිල ලේඛන හා ගිණුම් වාර්තා හා ලැබීම් ඇතුළු වාර්තා, ප්‍රකාශන පරීක්ෂා කිරීම.
- නීති රීති, පද්ධති හා පරිපාටිවලට අනුකූලතාවය පරීක්ෂා කිරීම.
- මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රතිපත්ති, සඵලදායි ලෙස යොදාගනු ලබන බවට හා අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා සඵලදායි අයුරින් යොදාගැනීම සඳහා ඉහළ කළමනාකාරීත්වයට සහාය වීම.
- විගණන අංශයේ කටයුතු සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම මෙන්ම, ආයතනයේ සමස්ත අරමුණු කාර්යක්ෂම හා ලාභදායි ලෙස මුදුන් පමුණුවන බවට සහතික කිරීම.

- අභ්‍යන්තර පාලන මෙහෙයුම් ස්වාධීනව ඇගයීම් කිරීම හා දෝෂ හා වංචා වැළැක්වීම සහ අනාවරණය කර ගැනීම සඳහා අභ්‍යන්තර පරීක්ෂාවල යෝග්‍යතාවය හා ප්‍රමාණාත්මක භාවය නිර්ණය කිරීම.
- ආයතනය තුළ පද්ධති, පාලන හා පරිපාටීන් සමාලෝචනය කිරීම හා පද්ධති සඵලදායි ලෙස මෙහෙයවීම සහතික කිරීම.
- දුබලතා හා ඌනතා හඳුනාගැනීම හා පද්ධති, පාලන හා පරිපාටි සඳහා අනුකූලතාවයන් / වැඩි දියුණු කිරීම් නිර්දේශ කිරීම.
- වත්කම් හා ලේඛනගත භාණ්ඩවල මනා පාලනය සහතික කිරීම.
- සංවර්ධන සැලසුම්වල සඳහන් කර ඇති විගණන වැඩ සටහන් ඇතුළුව අවශ්‍ය කෙරෙන ක්ෂේත්‍රයන්වල විගණන අරමුණු හා විගණන තාක්ෂණ ක්‍රම වර්ධනය කිරීම හා මෙකී විගණන අරමුණු හා තාක්ෂණ ක්‍රම මත පදනම්ව විස්තරාත්මක විගණන වැඩ සටහන් පිළියෙල කිරීම.
- මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පවත්වාගෙන යන ලේඛනවල නිරවද්‍යතාවය හා සම්පූර්ණභාවය තහවුරු කිරීම හා මුදල් අංශය සම්පාදනය කරන තොරතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම.
- කාර්ය මණ්ඩලයේ ගුණාත්මක කාර්ය සාධනය ඇගයීම හා ඔවුන් වෙත පවරන වගකීම් ඉටුකරන බවට සහතික කිරීම.
- සිදුකරන ලද සෑම විගණන පරීක්ෂණයක්ම පිළිබඳ වාර්තා සභාපතිවරයාට ඉදිරිපත් කිරීම හා මාර්ග සංවර්ධන අධිකාරියේ අරමුණු ඉටුකිරීමේදී අභ්‍යන්තර විගණන අංශය සඵලදායි කළමනාකරණ උපකරණයක් ලෙස භාවිතය සහතික කිරීම.
- ව්‍යාපෘති / නඩත්තු කටයුතු, කම්කරු උපයෝජනය, භාණ්ඩ ලේඛන පාලනය ආදිය පරීක්ෂා කිරීම.
- මාර්ග, පාලම් හා බෝක්කු ඉදිකිරීම හා නඩත්තුව, අනවසර ඉදිකිරීම්, ප්‍රචාරණ පුවරු ආදිය පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකිරීම හා කළමනාකාරිත්වයට හඳුනාගත් දුබලතා හා නිර්දේශ සහිතව උපදෙස් ලබාදීම.
- වංචා හා නාස්තිය වැළැක්වීමට සහාය දීම හා දක්නට ලැබුණු නාස්ති හා වංචා වාර්තා කිරීම.
- කළමනාකාරිත්වය විසින් පවරණ ලද කරුණු පිළිබඳ විශේෂ පරීක්ෂාවක් සිදු කිරීම.
- රජයේ විගණන අධිකාරී මගින් විගණකාධිපතිවරයා සමඟ සම්බන්ධීකරණය වීම.
- මාර්ග සංවර්ධන අධිකාරියේ වත්කම් කෙතරම් දුරට අලාභවීම්වලින් සුරක්ෂිතදැයි නිර්ණය කිරීම
- මාර්ග සංවර්ධන අධිකාරියේ පරිපාලන හා මූල්‍ය නිති හා කලින් කලට රජය නිකුත් කරන අතිරේක උපදේශයන් අනුගමනය කරන්නේ දැයි නිර්ණය කිරීම.
- අභ්‍යන්තර විගණන අංශයේ වෘත්තිමය තත්ත්වය හා ස්වාධීනත්වය පවත්වාගෙන යාම.
- මාර්ග සංවර්ධන අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටුවට සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය.



# කාර්ය සාධනය 2011

# 4 වැනි පරිච්ඡේදය
# 2011 වර්ෂයේ කාර්ය සාධනය

## 4.1 මාර්ග නඩත්තුව ක්‍රියාත්මක කිරීම

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ බොහොමයක් නඩත්තු කටයුතු ක්‍රියාත්මක කරන ලද්දේ සෘජු කම්කරුවන් මගින් හා ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කරමින් ඉක්ටාඩ් (ICTAD) ආයතනයේ ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන් මගිනි. මාර්ග සංවර්ධන අධිකාරිය වාරික නඩත්තුව සඳහා රු:මි.852 ක්ද දෛනික නඩත්තුව සඳහා රු:මිලියන 2142 ක්ද 2011 වර්ෂය තුළ වැයකර ඇත. 2011 වර්ෂය තුළ පළාත් මට්ටමින් ප්‍රතිසංස්කරණ පෘෂ්ඨ යළි සැකසීම් හා වැලි මුද්‍රිත තාර ආලේපන කටයුතුවල ප්‍රගතිය පහත දැක්වේ.

***වගු අංක 5: මාර්ග නඩත්තු භාර අරමුදලේ ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණ, මාර්ග යථාවත් කිරීම පෘෂ්ඨ යළි සැකසීම හා වැලි මුද්‍රිත තාර ආලේපන කටයුතු :***

| ***පළාත*** | ***වැලි මුද්‍රිත තාර ආලේපනය (කි.මී.)*** | ***ප්‍රතිසංස්කරණය හා පෘෂ්ඨ යළි සැකසීම (කි.මී.)*** |
|---|---:|---:|
| බස්නාහිර පළාත | 155.08 | 139.97 |
| මධ්‍යම පළාත | 51.50 | - |
| දකුණු පළාත | 35.31 | - |
| උතුරු පළාත | 160.14 | 2.85 |
| නැගෙනහිර පළාත | 115.01 | 130.01 |
| වයඹ පළාත | 121.27 | 145.62 |
| උතුරුමැද පළාත | 183.45 | - |
| ඌව පළාත | 199.00 | 201.00 |
| සබරගමුව පළාත | 170.62 | - |
| ***එකතුව*** | ***1191.38*** | ***619.54*** |

*වගු අංක 6: 2011 දෙසැම්බර් අවසානය දක්වා ප්‍රාග්ධන වියදම්වල ප්‍රගතිය*

| ***විස්තරය*** | ***2011 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු:මි)*** | ***2011 දෙසැම්බර් වන විට වියදම (රු:මි)*** |
|---|---|---|
| ව්‍යපෘති අංක 01 - දෛනික, පුනරාවර්තන නඩත්තුව, මාර්ග නඩත්තුව, විදේශ අරමුදල් යටතේ (කුවේට්, ජජාසබැ, ආසංබැ, ආසංසඅ) | 2160.50 | 2, 141.90 |
| ව්‍යාපෘති අංක 02 - වැඩ අඛණ්ඩව කරගෙන යාම | 700.00 | 568.03 |
| ව්‍යාපෘති අංක 03 - වාරික නඩත්තුව (පෘෂ්ඨය ඇතිරීම / සුළු වැඩි දියුණු කිරීම) | 1050.00 | 1,023.85 |
| නාවක්කුලි-කාරතිව්-මන්නාරම මාර්ගයේ සුළු වැඩි දියුණු කිරීම් යටතේ | 180.00 | 169.70 |
| ව්‍යාපෘති අංක 04 - ව්‍යුහ වැඩි දියුණු කිරීම (පාලම්, බෝක්කු, කාණු) | 175.00 | 164.68 |
| ව්‍යාපෘති අංක 05 - ආලෝක, ආලෝක සංඥා, මාර්ග සලකුණු කිරීම්, නඩත්තුව හා මාර්ග භාණ්ඩ ස්ථාපනය) | 430.00 | 402.50 |
| ව්‍යාපෘති අංක 06 - හදිසි කටයුතු / ආපදා කටයුතු | 2660.00 | 2,631.66 |
| ව්‍යාපෘති අංක 07 - පාරු මෙහෙයුම හා නඩත්තුව | 15.00 | 10.46 |
| ව්‍යාපෘති අංක 08 - ඇස්පල්ට් පෙරමුසු යන්ත්‍රාගාරය | 920.61 | 687.58 |
| ***එකතුව*** | ***8,291.11*** | ***7800.36*** |

2011 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු:මි. 5000
පරිපූරක අංක 574 යටතේ 2011.09.20 දිනට ලැබුනු අතිරේක ප්‍රතිපාදන රු:මි. 1000
පරිපූරක අංක 860 යටතේ 2011.12.30 දිනට ලැබුනු අතිරේක ප්‍රතිපාදන රු:මි. 1000
මුදල් රෙගුලාසි 66 යටතේ 2011.12.30 දිනට මාරුකල අරමුදල රු:මි. 1291.11

## 4.2 දේශීය අරමුදල් යටතේ මහාමාර්ග සංවර්ධනය

රටපුරා දේශීය අරමුදල් පාවිච්චි කරමින් සුළු පරිමාණ පුළුල් කිරීමේ හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති ආරම්භ කරන ලදි. 2011 වර්ෂය තුළ පුළුල් කිරීමේ හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති 361 ක් ප්‍රදානය කරන ලද අතර, ව්‍යාපෘති 115 ක් නිමකර 2011.12.31 දින වන විට ව්‍යාපෘති 246 ක් ක්‍රියාත්මක කෙරෙමින් පැවතිණ. 2011 වර්ෂය තුළ සෑම දිස්ත්‍රික්කයක් සඳහාම වෙන් කරන ලද අරමුදල් හා ඒවායේ භාවිතය වගු අංක 7 දක්වා ඇත.

***වගු අංක 7: පුළුල් කිරීමේ හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා වාර්ෂික ප්‍රතිපාදන හා වියදම****

| ***පළාත හා දිස්ත්‍රික්කය*** | ***2011 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු:)*** | ***2011 දෙසැම්බර් 31 දිනට වියදම (රු:)*** |
|---|---|---|
| ***බස්නාහිර පළාත*** | | |
| කොළඹ දිස්ත්‍රික්කය | 1,156,000,000 | 1,026,892,403 |
| ගම්පහ දිස්ත්‍රික්කය | 2,668,327,000 | 2,359,641,302 |
| කළුතර දිස්ත්‍රික්කය | 500,000,000 | 446,822,051 |
| ***මධ්‍යම පළාත*** | | |
| මහනුවර දිස්ත්‍රික්කය | 737,000,000 | 625,667,901 |
| මාතලේ දිස්ත්‍රික්කය | 147,000,000 | 146,159,291 |
| නුවරඑළිය දිස්ත්‍රික්කය | 66,233,000 | 66,232,767 |
| ***දකුණු පළාත*** | | |
| මාතර දිස්ත්‍රික්කය | 350,000,000 | 222,101,651 |
| ගාල්ල දිස්ත්‍රික්කය | 597,873,000 | 597,872,220 |
| හම්බන්තොට දිස්ත්‍රික්කය | 841,985,000 | 841,984,901 |
| ***උතුරු පළාත*** | | |
| වවුනියා දිස්ත්‍රික්කය | 234,347,000 | 234,346,503 |
| මන්නාරම් දිස්ත්‍රික්කය | 611,925,000 | 611,924,815 |
| යාපනය දිස්ත්‍රික්කය | 252,266,000 | 252,265,798 |
| මුලතිව් දිස්ත්‍රික්කය | 200,000,000 | 74,357,723 |
| කිලිනොච්චි දිස්ත්‍රික්කය | 200,000,000 | 30,818,274 |
| ***නැගෙනහිර පළාත*** | | |
| මඩකලපුව දිස්ත්‍රික්කය | 40,000,000 | 40,000,000 |
| අම්පාර දිස්ත්‍රික්කය | 100,293,000 | 100,279,745 |
| ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය | 247,120,000 | 247,116,799 |
| ***වයඹ පළාත*** | | |
| කුරුණෑගල දිස්ත්‍රික්කය | 535,240,000 | 535,238,172 |
| පුත්තලම දිස්ත්‍රික්කය | 169,120,000 | 169,118,386 |
| ***උතුරුමැද පළාත*** | | |
| අනුරාධපුර දිස්ත්‍රික්කය | 413,342,000 | 413,341,553 |
| පොළොන්නරුව දිස්ත්‍රික්කය | 249,390,000 | 249,388,542 |
| ***ඌව පළාත*** | | |
| බදුල්ල දිස්ත්‍රික්කය | 175,199,000 | 175,198,751 |
| මොණරාගල දිස්ත්‍රික්කය | 118,304,000 | 118,303,122 |
| ***සබරගමුව පළාත*** | | |
| රත්නපුර දිස්ත්‍රික්කය | 307,763,000 | 307,762,188 |
| කෑගල්ල දිස්ත්‍රික්කය | 374,030,000 | 374,029,634 |
| උප එකතුව | 11,292,757,000 | 10,266,864,490 |
| එ අ බද්ධ (Vat) | 1,349,465,000 | 1,349,464,570 |
| ***මුළු එකතුව*** | ***12,642,222,000*** | ***11,616,329,060*** |

* මෙයට විදේශාධාර අරමුදල් ව්‍යාපෘති යටතේ සිදුකරන ලද වැඩ අඩංගු නොවේ.

වෙනත් දේශිය අරමුදල් සමහරක් පිළිබඳ විස්තර සංක්ෂිප්තව පහත දක්වා ඇත.

***වගු අංක 8: විවිධ ව්‍යාපෘති යටතේ ඉටුකළ අනු ව්‍යාපෘති පිළිබඳ විස්තර හා 2011 වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය සාධනය***

| ***ව්‍යාපෘතියේ නම*** | ***ව්‍යාපෘති සංඛ්‍යාව*** | | | ***2011 සඳහා ප්‍රතිපාදන (රු:- මිලියන)*** | ***2011 වර්ෂය තුළ වියදම (රු: මිලියන)*** |
|---|---|---|---|---|---|
| | ***වර්ෂය තුළ ප්‍රදානය කළා*** | ***වර්ෂය තුළ නිමකලා*** | ***2011.12.31 දිනට ක්‍රියාත්මක කෙරෙමින් පවතින*** | | |
| හම්බන්තොට කේන්ද්‍රිය සංවර්ධන ව්‍යාපෘතිය | 19 | 01 | 18 | 4268 | 3161 |
| දැයට කිරුළ | 72 | - | 72 | 3500 | 3278 |
| නිට්ටඹුව කඩවත මාර්ගය | 6 | - | 6 | 150 | 135 |
| රණවිරු ගම්මානය | 23 | 06 | 20 | | |

## 4.3 පාලම් ඉදිකිරීම

### 4.3.1 ජාතික මහාමාර්ගවල හානිවූ / දුර්වල පාලම් ප්‍රතිනිර්මාණය කිරීම

මෙම වැඩ සටහන යටතේ ; කාර්ය ගිණුම මගින්, දුබල පාලම් වැඩිදියුණු කිරීම, ඉක්ටාඩ් (ICTAD) ආයතනයේ ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් සිදුකරන ලදි. 2010 සිට අඛන්ඩව කරගෙන ආ වැඩද ඇතුළුව මෙම වැඩ සටහන යටතේ, පාලම් 76 ක වැඩවල යෙදෙන ලදි. 2011 වර්ෂය තුළ පාලම් 76 න් 33 ක් නිමකෙරිණි.

*වගු අංක 9: 2011 වර්ෂය තුළ දුබල පාලම් වැඩි දියුණු කිරීම*

| පළාත | සිදු කෙරමින් පවතින | නිමකළ | වියදම |
|---|---|---|---|
| බස්නාහිර පළාත | 5 | 13 | 71.50 |
| මධ්‍යම පළාත | 4 | 4 | 2.70 |
| දකුණු පළාත | 2 | 2 | 4.40 |
| උතුරු පළාත | 1 | 0 | 0.00 |
| නැගෙනහිර (මඩකලපුව) පළාත | 3 | 2 | 27.40 |
| නැගෙනහිර (අක්කරෙයිපත්තුව) පළාත | 3 | 1 | 0.00 |
| වයඹ පළාත | 6 | 6 | 43.80 |
| උතුරුමැද පළාත | 1 | 0 | 0.00 |
| ඌව පළාත | 8 | 2 | 36.80 |
| සබරගමුව පළාත | 10 | 3 | 49.20 |
| **එකතුව** | **43** | **33** | **235.80** |

## 4.3.2 ග්‍රාමීය පාලම් ඉදිකිරීම

2011 වර්ෂයේ මාර්ග සංවර්ධන අධිකාරියේ ග්‍රාමීය පාලම් ඒකකයට පැරණි පාලම් කොටස් යොදා ග්‍රාමීය පාලම් ඉදිකිරීමට රු:මි: 50 ක් හා පාලම් නඩත්තු කිරීමට රු:මි. 11ක් ලැබුණි. වර්ෂය තුළ ක්‍රියාත්මක කළ ග්‍රාමීය පාලම් ව්‍යාපෘති පිළිබඳ විස්තර හා ඒවායේ ප්‍රගතිය වගු අංක 10 හා 11 දැක්වේ.

*වගු අංක 10 - පාලම් ඉදිකිරීමේ ප්‍රගතිය*

| ව්‍යාපෘති විස්තරය | නිමකිරීමට අපේක්ෂිත දිනය | කොන්ත්‍රාත් මුදල (වැට් බදුඅ සමඟ (රු.මි) | 2011.12.31 දිනට සමුච්චිත වියදම | 2011 අවසානයේ ප්‍රගතිය | සටහන් |
|---|---|---|---|---|---|
| මායින්නොලුව පාලම වරකාපොල. | 2011 මාර්තු 31 | 6.0 | 6.7 | 100% | වැඩ නිමකරන ලදි |
| තෙල්දෙනිය-කොටගඟ හරහා පාලම. | 2011 මාර්තු 31 | 4.2 | 2.6 | 100% | වැඩ නිමකරන ලදි |
| අවිස්සාවේල්ල-අස්වතුඇල පාලම ඉදිකිරීම. | 2011 අප්‍රේල් 30 | 5.2 | 4.0 | 100% | වැඩ නිමකරන ලදි |
| කතරගම පාලම සෙල්ල කතරගම-ගාමිණිපුර මාර්ගය | 2011 මැයි 31 | 11.2 | 6.5 | 100% | උප ව්‍යුහ කටයුතු සිදු කෙරෙමින් පවති |
| ඕලුවිල පාලම ඉදිකිරීම කුරුපෙත්ත | 2011 මැයි 31 | 6.7 | 3.4 | 100% | වැඩ නිමකරන ලදි |
| හල්ලොලුව පාලම ඉදිකිරීම ගල්ගමුව - රුවන්වැල්ල මාර්ගය. . | 2011 අගෝස්තු 30 | 4.1 | 2.8 | 100% | වැඩ නිමකරන ලදි |
| අඹේපුස්ස කුඩුමේරිය පාලම ඉදිකිරීම. | 2011 මැයි 31 | 4.5 | 2.1 | 100% | වැඩ නිමකරන ලදි |
| කටුලැස්ස ඇල හරහා අල්ගොඩ පාලම ඉදිකිරීම රුවන්වැල්ල | 2012 අප්‍රේල් 30 | 6.7 | 0.0 | 60% | වැඩ නිමකරන ලදි |
| ගිරිබාව, පහල ගිරිබාව කාප්ප පාලම ඉදිකිරීම | 2011 මැයි 21 | 4.0 | 0.1 | 100% | වැඩ නිමකරන ලදි |
| දිඹුලාපි මාර්ගයේ අංක 3/3 පාලමේ මී.24 ක සැහැල්ලු ගේඩර සහිත ස්ථිඩන පාලමක් දියත්කිරීම | 2011 මැයි 01 | 4.0 | | 100% | උප ව්‍යුහ වැඩ ඇරඹීමට ඇත |
| පහල කැන්දාව මාළුස්සා ඇල හරහා පාලම ඉදිකිරීම | 2012 ජුනි 30 | 6.5 | 0.00 | 5% | වැඩ කෙරෙමින් පවති |

| ව්‍යාපෘති විස්තරය | නිමකිරීමට අපේක්ෂිත දිනය | කොන්ත්‍රාත් මුදල (වැට් බදු සමඟ) (රු.මි) | 2011.12.31 දිනට සමුච්චිත වියදම | 2011 අවසානයේ ප්‍රගතිය | සටහන් |
|---|---|---|---|---|---|
| ගම්පහ කඳාන විමලරතනාරාමය වැව හරහා පදික පාලම ඉදිකිරීම. | 2011 මැයි 21 | 3.2 | 0.00 | 100% | වැඩ නිමකරන ලදි |
| උරුපලව්ව රැහැන් මත රැඳවුම් පාලම ඉදිකිරීම | 2012 මැයි 30 | 8.0 | 0.00 | 5% | වැඩ කෙරෙමින් පවතී |
| ත්‍රිකුණාමල වානේ කාප්ප පාලම ඉදිකිරීම | 2012 දෙසැ.31 | 5.0 | 0.00 | 10% | පැරණි කාප්පය මහියංගනයට ප්‍රවාහනය කරන ලදි. උපව්‍යුහ නිමවී නැත. අධ්‍යක්ෂ ඉංජිනේරු සේවා විසින් සැලසුම් සම්පාදනය කරමින් සිටී. |
| අනුරාධපුර ආසිරිගම පාලම ඉදිකිරීම | 2012 පෙබ.28 | 7.0 | 0.00 | 10% | වැඩ කෙරෙමින් පවතී |
| කො.ගා.හ.වැ. මාර්ගය දිගරොල්ල පාලමේ පදික තිරුව අළුත්වැඩියා කිරීම (දිග මී 200 කි) | 2011 ඔක්.30 | 1.0 | 0.30 | 100% | වැඩ නිමකරන ලදි |
| ගාල්ල දංගෙදර පාලම ඉදිකිරීම | 2011 දෙසැ.31 | 4.0 | 0.00 | 4% | වැඩ කෙරෙමින් පවතී |
| ගාල්ල පියරත්න මාවතේ පාලමේ තට්ටුව යලි ඉදිකිරීම | 2011 ඔක්.15 | 1.0 | 1.00 | 100% | වැඩ නිමකරන ලදි |
| කුරුණෑගල කටුගම්පොල පාලම ඉදිකිරීම | 2012 මාර්තු 31 | 6.9 | 0.15 | 5% | වැඩ කෙරෙමින් පවතී |

*වගු අංක 11 : බේලි පාලම් ඉදිකිරීමේ ප්‍රගතිය*

| *ව්‍යාපෘති විස්තරය* | *නිමකිරීමට අපේක්ෂිත දිනය* | *කොන්ත්‍රාත් මුදල (වැට් බදු සමඟ) (රු:මි)* | *2011.12.31 දිනට සමුච්චිත වියදම* | *2011 අවසානයේ ප්‍රගතිය* | *සටහන්* |
|---|---|---|---|---|---|
| බේලිපාලම් ගැලවීම / ඉදිකිරීම / දියත් කිරීම හා බේලිපාලම් කොටස් ප්‍රවාහනය. ඇල්පිටිය-අවිත්තාව මාර්ගයේ බේලිපාලම ගැලවීම (විධායක ඉංජිනේරු-අගලවත්ත) | 2011 ජනවාරි 31 | 0.15 | 0.0 | 100% | නිමකරන ලදි |
| කුරුණෑගල-මාතලේ මාර්ගයේ බේලිපාලම දියත් කිරීම (විධායක ඉංජිනේරු - කුරුණෑගල) | 2011 ජනවාරි 31 | 0.20 | 0.0 | 100% | නිමකරන ලදි |
| ත්‍රිකුණාමලය-පුල්මුඩේ මාර්ගයේ පාලම් දෙකක් දියත් කිරීම (විධායක ඉංජිනේරු - ත්‍රිකුණාමලය) | 2011 මාර්තු 31 | 0.50 | 0.0 | 100% | නිමකරන ලදි |
| හලාවත සහ නුවරඑළියේ සිට දැයට කිරුළ වැඩබිමට බේලිපාලම් කොටස් සැපයීම (විධායක ඉංජිනේරු - මොණරාගල) | 2011 ජනවාරි 31 | 0.20 | 0.0 | 100% | නිමකරන ලදි |
| යක්කලමුල්ල මාර්ග සංවර්ධන අධිකාරි නොවන මාර්ගයට බේලිපාලම සැපයීම හා ස්ථාපනය කිරීම (විධායක ඉංජිනේරු - හිනිදුම) | 2011 අප්‍රේල් 10 | 0.20 | 0.0 | 100% | නිමකරන ලදි |
| කුඹුක්කන-මාලිගාවිල මාර්ගයේ සිට දැයට කිරුළ වැඩබිමට බේලිපාලම ගලවා ප්‍රවාහනය කිරීම (විධායක ඉංජිනේරු - මොණරාගල) | 2011 ජනවාරි 31 | 0.20 | 0.0 | 100% | නිමකරන ලදි |
| මන්නාරම පැරණි බේලිපාලම ගැලවීම හා එහි කොටස් රත්මලානට ප්‍රවාහනය කිරීම | 2011 ජුනි 15 | 3.0 | 0.0 | 100% | නිමකරන ලදි |
| බේලිපාලම් කොටස් (C 200 EW 27) පො.ම.PBC මාර්ගයේ අංක 283/6 පාලම් වැඩබිමට (මඩකලපුව) ප්‍රවාහනය කිරීම | 2011 අප්‍රේල් 21 | 1.0 | 0.2 | 100% | නිමකරන ලදි |
| කල්මුනේ මාකට් පාරේ බේලිපාලම ඉදිකිරීම | | | | 30% | බේලි කොටස් වැඩබිමට ප්‍රවාහනය කෙරිණි. පාදම් වැඩ නිමකෙරී ඇත. |

| ව්‍යාපෘති විස්තරය | නිමකිරීමට අපේක්ෂිත දිනය | කොන්ත්‍රාත් මුදල (වැට් බදු සමඟ) (රු:මි) | 2011.12.31 දිනට සමුච්චිත වියදම | 2011 අවසානයේ ප්‍රගතිය | සටහන් |
|---|---|---|---|---|---|
| තංගල්ල සිට ඔරුගොඩවත්ත අංගනයට මී. 15 කොන්ක්‍රීට් පාලම් දෙකක් ප්‍රවාහනය කිරීම | | | | 100% | නිමකරන ලදි |
| බුත්තල සිට ඔරුගොඩවත්ත අංගනයට මංතිරු 2 පාලම් දෙකක් ප්‍රවාහනය කිරීම | | | | 100% | නිමකරන ලදි |
| එක්සත් රාජධානි වගීයේ අංක 5/3 දරණ වානේ පාලම මුලතිව් සිට රත්මලානට ප්‍රවාහනය කිරීම | | | | 100% | නිමකරන ලදි |
| ඔරුගොඩවත්තේදි බේලිපාලම ගැලවීම (බේස් 8 C – 200) | | | | 100% | නිමකරන ලදි |
| තිරුවානාකැටිය-අගලවත්ත මාර්ගයේ අංක 5/1 පාලම ඉදිකිරීම (බේස් 8 C – 200) | | | | 30% | |
| වඳුරඹ-ඇතුමලේ-යක්කටුව මාර්ගයේ අංක 24/3 බේලිපාලම ඉදිකිරීම | | | | 30% | |

## 4.4 මාර්ග හා පාලම් සැලසුම් කිරීම

### 4.4.1 මාර්ග සැලසුම් කිරීම

දේශීය අරමුදල් ව්‍යාපෘති සඳහා 2011 වර්ෂය තුළ පහත දැක්වෙන මාර්ග සැලසුම් කටයුතු ඉටුකරන ලදි.

- **හම්බන්තොට කේන්ද්‍රීය සංවර්ධන ව්‍යාපෘතිය**

හම්බන්තොට-ගන්නොරුව-මිගහජඳුර මාර්ගයේ කි.මී.10.3 ක් සඳහා විස්තරාත්මක සැලසුම් නිමකරන ලද අතර, වර්ෂය අවසානයේ පහත දැක්වෙන මාර්ග සැලසුම් සූදානම් කෙරෙමින් පැවතිනි.

***වගු අංක 12 : හම්බන්තොට කේන්ද්‍රීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සම්පාදනය කෙරෙමින් පවතින ව්‍යාපෘති***

| *මාර්ගය* | *දිග (කි.මී.)* | *2011 වර්ෂය අවසානයේ ප්‍රගතිය* |
|---|---|---|
| හම්බන්තොට පිටත වටරවුම් හා මිගහජඳුර මාර්ගයේ අන්තර් ඡේදනය | 0.40 | 33% |
| ලුණුගම්වෙහෙර-කතරගම මාර්ගයේ 1 හා 11 පියවර (මිනුම් සැලසුම් දෝෂ හේතුවෙන් සැලසුම් සංශෝධනය කිරීම) | 9.49 | 61% |
| ලුණුගම්වෙහෙර-කතරගම මාර්ගය - පියවර III | 8.00 | 60% |
| අන්දරවැව සිට නැබොඩගස්වැව යෝජිත නව මාර්ගය (මත්තල-ගුවන් තොටුපල මාර්ගය) | 7.73 | 36% |

- **දක්ෂිණ අධිවේගී මාර්ගය දිගු කිරීම - මාතර සිට හම්බන්තොට දක්වා**

දක්ෂිණ අධිවේගී මාර්ගය (මාතර සිට හම්බන්තොට දක්වා) දිගුව වෙනුවෙන් ආලෝක සෙවුම් හා පරාස සමීක්ෂණය (LIDAR) සඳහා පිරිවිතර නිමකල අතර, මිල ගණන් කැඳවීම සඳහා ලංසු ලේඛන නිමකරන ලදි.

***වගු අංක 13: 2011 වර්ෂය තුළ දක්ෂිණ අධිවේගී මාර්ගයේ දිගුව සඳහා සිදුකරන ලද සැලසුම් කටයුතු පිළිබඳ විස්තර***

| *මාර්ගය* | *දිග (කි මී)* | *2011 වර්ෂය අවසානයේ ප්‍රගතිය* |
|---|---|---|
| වලවේ ගඟ සිට හම්බන්තොට කෙළවර දක්වා මාර්ග කොටස (කි.මී. 59 සිට 73 දක්වා) | 14.0 | 56% |
| මාතර-ගොඩගම සිට මැද්දවත්ත යටියන දක්වා මාර්ග කොටස | 11.5 | 39% |
| ගොඩගම සිට දෙවිනුවර දක්වා සංකල්පමය තිරස් එකෙල්ල කිරීම | 11.5 | 3% |

- **වෙනත් මාර්ග ව්‍යාපෘති**

2011 වර්ෂය තුළ පහත දැක්වෙන වර්ෂවල විස්තරාත්මක සැලසුම් සම්පාදනය කරන ලදි.

***වගු අංක 14: වර්ෂය තුළ සිදුකරන ලද වෙනත් මාර්ග ව්‍යාපෘති සඳහා කරන ලද සැලසුම් කටයුතු පිළිබඳ විස්තර.***

| ***මාර්ගය*** | ***මාර්ග අංකය*** | ***කොටසේ දුර (කි.මී.)*** | ***2010 අවසානයේ ප්‍රගතිය*** |
|---|---|---|---|
| අඹේපුස්ස-කුරුණෑගල-ත්‍රිකුණාමල මාර්ගය | A006 | 43.00 | 100% |
| අවිස්සාවේල්ල-හැටන්-නුවරඑළිය මාර්ගය | A007 | 10.00 | 100% |
| කෑගල්ල අතුරු මාර්ගය 11 අදියර සංශෝධිත සැලසුම් | | 2.00 | 100% |
| වැලිමඩ අතුරු මාර්ගය | | 0.50 | 100% |
| අකුරේගොඩ මාර්ගය | | 1.20 | 60% |
| අකුරැස්ස-කඹුරුපිටිය මාර්ගය | B003 | 8.00 | 75% |
| අවිස්සාවේල්ල අතුරු මාර්ගය | | 1.90 | 43% |
| බේස්ලයින් මාර්ගයේ කැලණිතිස්ස හංදිය සිට ඔරුගොඩවත්ත කොටස (මංතීරු 8 සැලසුම) | | 0.80 | 32% |
| බුලත්සිංහල නගර සංවර්ධනය | | 1.60 | 70% |
| ගාල්ල-බද්දේගම මාර්ගය | B128 | 20.00 | 50% |
| ගොඩගම-අවිස්සාවේල්ල මාර්ගය | A004 | 30.00 | 10% |
| හෝකන්දර මාර්ගය | | 2.50 | 27% |
| හොරණ-අඟුරුවාතොට-අළුත්ගම මාර්ගය | B157 | 2.90 | 28% |
| කඩවත-මාවරමණ්ඩිය මාර්ගය | | 3.50 | 30% |
| කෑගල්ල-බුලත්කොහුපිටිය-කරවනැල්ල මාර්ගය (24 කි.මී.සිට 27 කි.මී.දක්වා) | A021 | 3.00 | 63% |
| කෑගල්ල අතරු මාර්ගය - III වන අදියර | | | 88% |
| කැලණිය-මුදුන්ගොඩ මාර්ගය (0 කි.මී.කණුව සිට 6 කි.මී. කණුව දක්වා කොටස) | B217 | 6.00 | 67% |
| කොච්චිකඩේ-හල්පේ මාර්ගය | B225 | 9.00 | 57% |
| මහරගම-පමුණුව-තලපත්පිටිය මාර්ගය (කි.මී.0 – 2.4) | B504 | 2.40 | 23% |
| මහරගම-පිළියන්දල මාර්ගය | | 1.40 | 20% |
| මිගහජඳුර-බණ්ඩාරගිරිය මාර්ග කොටස (මත්තල ගුවන් තොටුපල මාර්ගය) | | 19.40 | 50% |
| නිට්ටඹුව-වේයන්ගොඩ මාර්ගය (B445) | B445 | 4.16 | 20% |
| නුගේගොඩ සුපිරි වෙළඳසැල මාර්ගය | | 0.20 | 99% |
| පස්සර-මොණරාගල මාර්ගය | A022 | 20.0 | 92% |

| මාර්ගය | මාර්ග අංකය | කොටසේ දුර (කි.මී.) | 2010 අවසානයේ ප්‍රගතිය |
|---|---|---|---|
| පේරාදෙණිය-හල්ලොලුව මාර්ගය | | 0.60 | 37% |
| පොළොන්නරුව අතුරු මාර්ගය | | 1.20 | 32% |
| පදවිකේගම සිට අන්දරවැව යෝජිත මාර්ගය<br>(කි.මී. 8+720 – 13+360 )<br>(මත්තල ගුවන් තොටුපල මාර්ගය) | | 5.64 | 67% |
| පුත්තලම-ත්‍රිකුණාමලය මාර්ගය | A012 | 2.50 | 67% |
| තලවතුගොඩ-පන්නිපිටිය මාර්ගය | | 3.70 | 99% |
| තැන්නෙකුඹුර-රාගල මාර්ගය | B413 | 78.00 | 93% |

මාර්ග ව්‍යාපෘති සැකසුම් පහසුව වෙනුවෙන් විදේශ අරමුදල් ව්‍යාපෘති සඳහා වර්ෂය තුළ පහත දැක්වෙන සැලසුම් කටයුතු ඉටුකරන ලදි.

***වගු අංක 15 : මා.ව්‍යා.සැ.ප. (RPPF) සැලසුම් කටයුතු පිළිබඳ විස්තර***

| මාර්ගය | මාර්ග අංකය | කොටසේ දුර (කි.මී.) | 2010 අවසානයේ ප්‍රගතිය |
|---|---|---|---|
| මාර්ග ව්‍යාපෘති සැකසුම් පහසුව - ප්‍රදාන 1 | | | |
| උඩවලව-තණමල්විල මාර්ගය | B427 | 41.0 | 100% |
| ජාඇල-ඒකල-ගම්පහ-යක්කල මාර්ගය | A033 | 12.0 | 100% |
| තැන්නෙකුඹුර-රිකිල්ලගස්කඩ මාර්ගය | B413 | 52.0 | 100% |
| මාර්ග ව්‍යාපෘති සැකසුම් පහසුව - ප්‍රදාන **III** | | | |
| මාතර-අකුරැස්ස මාර්ගය | A024 | 16.3 | 100% |
| බියන්විල-ගනේමුල්ල මාර්ගය | B226 | 2.8 | 100% |
| අම්පාර-උහන-මහඔය මාර්ගය | A027 | 57.8 | 100% |
| ඇල්පිටිය-අවිත්තාව-ලෙව්වන්දූව මාර්ගය | B114 | 17.8 | 100% |

2011 වර්ෂය තුළ අන්තර්ජේදන සැලසුම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු වගු අංක 16 න් දක්වා ඇත.

***වගු අංක 16: අන්තර්ඡේදන සැලසුම් පිළිබඳ විස්තර***

| ***අන්තර්ඡේදනයේ නම*** | ***දිග (කි.මී.)*** | ***2011 අවසානයේ ප්‍රගතිය*** |
|---|---|---|
| ***සංඥාපිත නොවන*** | | |
| නුගේගොඩ ගුවන් පාලම සඳහා එකෙල්ල කිරීම, පැතිපෙනුම සැලසුම, අත්පත්කර ගැනීමේ යෝජනා (සැදිල්ල වෙන්කල අන්තර් ජේදනය) | | 100% |
| බඩල්කුඹුර හංදිය (A022) | 0.50 | 100% |
| අකුරැස්ස නගරයේ අන්තර්ජේදනය (A017) | 0.85 | 100% |
| කෑගල්ල අතුරු මාර්ගයේ අන්තර්ජේදනය (අදියර II) | 0.60 | 100% |
| තඹුත්තේගම වටරවුම (A028) | 1.00 | 100% |
| තිරිවානාකැටිය අන්තර්ජේදනය (A004)<br>(කො.ර.වැ.ම. හා තිරුවානාකැටිය-අගලවත්ත මාර්ගයේ අන්තර්ජේදනය) | 0.20 | 100% |
| ගුවන්තොටුපල හංදිය | 0.50 | 50% |
| අඹගස්දූව හංදිය | | 75% |
| ආමි හංදිය - පුත්තලම | 0.50 | 34% |
| ඇවරිවත්ත හංදිය | 0.60 | 50% |
| බඩල්කුඹුර හංදිය | 0.48 | 90% |
| බණ්ඩාරවත්ත හංදිය | 2.00 | 37% |
| කො.ර.වැ.ම. - හෝමාගම අන්තර්ජේදනය | 0.20 | 50% |
| කො.ර.වැ.ම. - ද. 12+170 අන්තර්ජේදනය | 0.06 | 50% |
| කො.ර.වැ.ම. - මහල්වරාව අන්තර්ජේනය (ද.10+380) | 0.10 | 50% |
| කො.ර.වැ.ම. - මොරකැටිය අන්තර්ජේනය (ද.9+820) | 0.10 | 50% |
| කො.ර.වැ.ම. - රෝහල අන්තර්ජේනය (ද.14+680) | 0.10 | 50% |
| කො.ර.වැ.ම. - කොට්ටාව අන්තර්ජේනය (ද. 11+180) | 0.30 | 50% |
| ගංසබා අන්තර්ජේදනය | 0.20 | 50% |
| ගුඩ්ෂෙඩ් හංදිය, පුත්තලම | 0.20 | 33% |
| කෑගල්ල අතුරු මාර්ගයේ අන්තර්ජේදනය - අදියර I | 0.45 | 91% |
| පුත්තලම-ත්‍රිකුණාමල මාර්ගයේ අන්තර්ජේදනය (AA012), කටුගස්තොට-කුරුණෑගල-පුත්තලම මාර්ගය (AA010) හා පුත්තලම නගර මාර්ගය (B395) තැපැල් කාර්යාල හංදිය | 1.00 | 67% |
| | | |

| ***අන්තර්ජේදනයේ නම*** | ***දිග (කි.මී.)*** | ***2011 අවසානයේ ප්‍රගතිය*** |
|---|---|---|
| ***සංඥාපිත නොවන*** | | |
| මුලතිව්-පුලියන්කුලම මාර්ගය හා මුලතිව්-කෝකිලායි මාර්ගයේ අන්තර්ජේදනය | 0.30 | 24% |
| මුලතිව්-පුලියන්කුලම මාර්ගය හා මුලතිව්-කෝකිලායි මාර්ගයේ අන්තර්ජේදනය | 0.30 | 30% |
| පළාත් මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගවල අන්තර්ජේදනය | | 30% |
| විල්ලු මාර්ගය (B448) හා කටුගස්තොට-කුරුණෑගල-පුත්තලම් මාර්ගයේ (AA010) පුත්තලම අන්තර්ජේදන | 0.75 | 67% |
| ජාවත්ත හංදිය | 0.50 | 67% |
| කැලණිතිස්ස හංදිය | 0.30 | 33% |
| කොස්වත්ත අන්තර්ජේදනය | 0.80 | 50% |
| මහඔය අන්තර්ජේදනය | 0.60 | 93% |
| මාලබේ-ගලවිල මාර්ගය, මාලබේ-බාලිකා නිවාස මාර්ගය, මාලබේ-විද්‍යාල හංදිය හා මාලබේ-හයිලෙවල් මාර්ගය | 1.00 | 53% |
| මීරා පාර අන්තර්ජේදනය | 0.16 | 30% |
| මුලටියන හංදිය | 0.60 | 33% |
| නානුඔය අන්තර්ජේදනය (කෙටිමග අන්තය) | 0.60 | 86% |
| නානුඔය අන්තර්ජේදනය (කෙටිමග අන්තය) | 0.60 | 31% |
| නාවින්න අන්තර්ජේදනය | 0.20 | 50% |
| පරණ හයිලෙවල් පාර, පරණ පන්නිපිටිය පාර, පරණ බාලිකා නිවාස පාර, පරණ හෝකන්දර පාර | 1.00 | 63% |
| ඔරුගොඩවත්ත හංදිය | 0.40 | 33% |
| පැලියගොඩ අන්තර්ජේදනය | 0.30 | 48% |
| රදැල්ල අන්තර්පජේදනය (කෙටිමග ඇරඹුම) | 0.60 | 86% |
| තඹුත්තේගම වටරවුම | 1.00 | 63% |
| තිසාවැව හංදිය | 0.50 | 38% |
| වත්තේගෙදර අන්තර්ජේදනය | 0.15 | 48% |
| විජේරාම අන්තර්ජේදනය | 0.20 | 50% |
| ***සංඥාපිත*** | | |
| බණ්ඩාරවත්ත හංදිය | 1.0 | 100% |
| පානදුර ඔරලෝසු කණුව හංදිය (A002) | 0.60 | 100% |
| | | |

| අන්තර්ජේදනයේ නම | දිග (කි.මී.) | 2011 අවසානයේ ප්‍රගතිය |
|---|---|---|
| **සංඥාපිත** | | |
| හුණුපිටිය පාර හංදිය, කිරිබත්ගොඩ | 0.50 | 100% |
| මාන්කුලම්-මුලතිව් මාර්ගය (AA034) හා මුලතිව්-කෝකිලායි මාර්ගය (B297) වැඩිදියුණු කිරීම මුලතිව් අන්තර්ජේදනය | | 100% |
| මඩකලපුව නගර අන්තර්ජේදනය | 0.50 | 100% |
| ගාලු පාරේ ඩී.එස්. සේනානායක මාවතේ පානදුර අන්තර්ජේදනය (A002) | 0.50 | 100% |
| යාපනය වින්සන්ට් තියටර් හංදිය අන්තර්ජේදනය | 0.60 | 100% |
| කිරුලපන ස්ටැපර්ඩ් ඇවනියු හංදිය අන්තර්ජේදනය (A004) | 0.80 | 100% |
| ජාඇල අන්තර්ජේදනය (A003) | 0.80 | 100% |
| කොහුවල හංදිය | | 100% |
| නල්ලච්චිය හංදිය (A028) | 1.00 | 100% |
| පස්යාල අන්තර්ජේදනය | 0.60 | 100% |
| බිබිල අන්තර්ජේදනය | 0.30 | 80% |
| කොළඹ-හොරණ මාර්ගයේ බොරලැස්ගමුව සංඥා සැලසුම | 0.40 | 90% |
| අවිස්සාවේල්ල රෝහල හංදිය | 0.50 | 18% |
| මාදිවෙල ව්‍යාපෘති මාර්ගය හා සුනිල් මාවත අන්තර්ජේදනය | 1.00 | 93% |
| යාපනය-කන්කසන්තුරේ මාර්ගය හා රෝහල මාර්ගය අන්තර්ජේදනය | 0.60 | 90% |
| කිරිබත්ගොඩ බස් නැවතුම්පළ හංදිය | 0.75 | 69% |
| කොළඹ-හොරණ මාර්ගයේ කොහුවල සංඥා සැලසුම (B084), ඇතුල්කෝට්ටේ-මිරිහාන-කොහුවල මාර්ගය (B120) හා කොහුවල-දෙහිවල මාර්ගයේ (B229) කොහුවල | 0.40 | 60% |
| කොස්වත්ත අන්තර්ජේදනය | 0.80 | 99% |
| කොළඹ-හොරණ මාර්ගයේ පාමංකඩ සංඥා සැලසුම | 0.40 | 60% |
| කොළඹ-හොරණ මාර්ගයේ පැපිලියාන සංඥා සැලසුම | 0.40 | 60% |
| කොළඹ-හොරණ මාර්ගයේ රත්තනපිටිය සංඥා සැලසුම | 0.30 | 79% |
| තලවතුගොඩ අන්තර්ජේදනය | 1.00 | 81% |
| තිරුවන්වේලි හංදිය-යාපනය | 0.80 | 30% |

තවද මාර්ග සංවර්ධන අධිකාරිය වෙනත් ආයතනවල ඉල්ලීම මත සැලසුම් සකස්කර දෙනු ලැබේ. 2011 වර්ෂය තුළ නාගරික සංවර්ධන අධිකාරිය සඳහා ඇතැම් සැලසුම් වැඩ ඉටුකරන ලද අතර, ඒවායේ විස්තර පහත වගුවේ දැක්වේ.

***වගු අංක 17: නාගරික සංවර්ධන අධිකාරිය සඳහා කරන ලද සැලසුම් කටයුතු***

| *මාර්ගයේ නම* | *දිග (කි.මී.)* | *2011 අවසානයේ ප්‍රගතිය* |
|---|---|---|
| කොට්ටාව-බොරැල්ල මාර්ගය (පරණ කොට්ටාව පාර) | 4.3 | 67% |
| අකුරේගොඩ මාර්ගය (පළාත් මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය) | 1.30 | 26% |
| හෝකන්දර මාර්ගය (පළාත් මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය) | 2.50 | 26% |

2011 වර්ෂය තුළ මාර්ග සැලසුම් අංශය දැයට කිරුළ සඳහා සැලසුම් කටයුතු සිදුකරන ලදි.

***වගු අංක 18: දැයට කිරුළ සඳහා සිදුකරන ලද සැලසුම් කටයුතු විස්තර***

| *මාර්ගයේ නම* | *දිග (කි.මී.)* | *2011 අවසානයේ ප්‍රගතිය* |
|---|---|---|
| ඇලයාපත්තුව අන්තර්ජේදනය | 0.4 | 44% |
| රජයේ නිලනිවාස | 0.4 | 44% |
| අනුරාධපුර-ඉසුරුමුනිය ඔරලෝසුකණු හංදිය | 0.6 | 75% |
| ඉසුරුමුනිය අන්තර්ජේදනය | 0.40 | 85% |
| අනුරාධපුර-කුරුණෑගල හංදියේ - ජ්‍යාමිතික සැලසුම් 2 | 0.3 | 32% |
| ලෝලුගස්වැව හංදිය | 0.40 | 50% |
| මානින්ගමුව අන්තර්ජේදනය | 0.40 | 75% |
| ඔයාමඩුව අන්තර්ජේදනය | 0.3 | 67% |
| පොකුණුතුන හංදිය | 1.0 | 50% |
| තිසාවැව අන්තර්ජේදනය (පලුගස්වැව) | | 45% |

2011 වර්ෂය තුළ මාර්ග සැලසුම් අංශය විසින් සිදුකළ වෙනත් කටයුතු පිළිබඳ විස්තරාත්මක තොරතුරු පහත දැක්වේ.

***වගු අංක 19 : වෙනත් කටයුතු පිළිබඳ විස්තර***

| *කාර්යය* | *මාර්ග අංකය* | *දිග (කි.මී.)* | *2011 අවසානයේ ප්‍රගතිය* |
|---|---|---|---|
| ශ්‍රී මහා බෝධිය අසල රියගාල | | | 100% |

| කාර්යය | මාර්ග අංකය | දිග (කි.මී.) | 2011 අවසානයේ ප්‍රගතිය |
|---|---|---|---|
| තිඹිරිගස්යාය පාරේ දේවාස්ථානය ඉදිරිපිට එකෙල්ල කිරීම | | | 100% |
| LiDAR උපකරණය ගුවන්ගත වේදිකාවක් මගින් ස්ථානගත කර හදිසි මාර්ග ව්‍යාපෘතිය සඳහා භූ ලක්ෂණ සමීක්ෂණයට අවශ්‍ය තොරතුරු හා දත්ත රැස්කිරීම හා අධ්‍යයන වාර්තාව පිළියෙල කිරීම | | | 100% |
| තිඹිරිගස්යාය පාරේ කාණු සැලසුම් කිරීම | | 1.20 | 100% |
| කොළඹ-මහනුවර මාර්ගයේ කඩවත බෝක්කු අංක 15/1 හා 15/2 සඳහා කාණු සැලසුම | | | 100% |
| ගාලුපාරේ කළුතර සිරිකුරුස හංදියේ මට්ටම් නිමකිරීම | A002 | 3.00 | 100% |
| විවිධ විදේශාධාර ව්‍යාපෘතියේ ඉල්ලීම මත සැලසුම් වැඩි දියුණු කිරීම සඳහා උපදේශකයන් සමඟ ඒකාබද්ධ පුනරීක්ෂණ කටයුතු (දින 10) | | | 100% |
| පිළියන්දල හංදියේ පිරිසැලැස්ම අඩුකර නවීකරණය කිරීම | | | 100% |
| තිඹිරිගස්යාය පාරේ නිම් මට්ටම් නවීකරණය | AC008 | | 100% |
| තිඹිරිගස්යාය පාරේ නිම් මට්ටම් නවීකරණය | | | 100% |
| කැලණිය-මුදුන්ගොඩ මාර්ගය නවීකරණය | A001 | 2.00 | 100% |
| කොහුවල-පැපිලියාන-පාමංකඩ-රත්තනපිටිය-බොරලැස්ගමුව-මිරිස්වත්ත හා කැස්බෑව අත්පත්කර ගැනීමේ ඇඳිම් නවීකරණය | AB004 | | 100% |
| කඩුවෙල හංදියේ සංඥා සැලසුම නවීකරණය | AB004 | | 100% |
| කොහුවල හංදිය ජ්‍යාමිතික සැලසුම කොන්දේසිවලට අනුව නවීකරණය | B084 | 0.40 | 100% |
| කොළඹ-හොරණ මාර්ගයේ (B084) පාමංකඩ සංඥා සැලසුම | B084 | 0.40 | 100% |
| කොළඹ-හොරණ මාර්ගයේ පැපිලියාන සංඥා සැලසුම | B084 | 0.40 | 100% |
| කො.ර.වැ.ම. මාර්ගය සඳහා සංශෝධිත සැලසුම පිළියෙල කිරීම | | | 100% |
| ස්වයංක්‍රිය මට්ටම් උපකරණ ප්‍රසම්පාදනය සඳහා ලංසු ලේඛන පිළියෙල කිරීම | | | 100% |
| බොරලැස්ගමුව හංදිය සඳහා ප්‍රමාණ බිල්පත් පිළියෙල කිරීම | | | 100% |
| කොළඹ-නුවර මාර්ගය සඳහා ප්‍රමාණ බිල්පත් පිළියෙල කිරීම (කි.මී. 17.0-39 දක්වා) | B084 | 0.40 | 100% |

| කාර්යය | මාර්ග අංකය | දිග (කි.මී.) | 2011 අවසානයේ ප්‍රගතිය |
|---|---|---|---|
| අධ්‍යයන කණ්ඩායම මගින් LiDAR සමීක්ෂණයට කැමැත්ත පළකල පසුව කෙටුම්පත් ලංසු ලේඛන හා පිරිවිතර පිළියෙල කිරීම. | | | 100% |
| අකුරේගොඩ පාර සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීම | | 13.0 | 100% |
| දක්ෂිණ අධිවේගී මාර්ගයේ ආරම්භක හා අවසාන දිගු කොටස් සඳහා භූ ලක්ෂණ සමීක්ෂණය ප්‍රසම්පාදනය කිරීමට අවශ්‍ය ලේඛන පිළියෙල කිරීම. කොටස් දෙක වන්නේ මාතර-ගොඩගම-මැද්දවත්ත-යටියන මාර්ගය (කි.මී.1.5) හා වලවේ ගඟ සිට හම්බන්තොට-මිගහජඳුර මාර්ගය (කි.මී.14.5) | | | 100% |
| කඩුවෙල හංදියේ සලකුණු කිරීමේ සැලැස්ම පිළියෙල කිරීම | | 0.40 | 100% |
| කොහුවල හංදියේ සලකුණු කිරීමේ සැලැස්ම පිළියෙල කිරීම | B084 | 0.40 | 100% |
| පිළියන්දල හංදියේ සලකුණු කිරීමේ සැලැස්ම පිළියෙල කිරීම | B084 | 0.40 | 100% |
| අදියර තුනේ ක්‍රමය අනුව මිනුම් පිරිවිතර පිළියෙල කිරීම (දෙවන කොටසේ මූලික අනු රේඛනය පිළියෙල කිරීමට ප්‍රථම සැලැස්ම මැනීම, මට්ටම් මැනීම සැලසුම් මධ්‍ය රේඛාව ලකුණු කිරීම සහ අත්පත් කර ගැනීමේ මායිම් සළකුණු කිරීම) | | | 100% |
| හම්බන්තොට කේන්ද්‍රීය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා “අන්හුයි ගෘෘජ්” විසින් ඉදිරිපත් කරන ලද ප්‍රමාණ බිල්පත්වල අනුපාත සංසන්දනය කිරීම (කි.මී. 128) | | | 100% |
| උ.මා.සං.ව්‍යා. (NRCP) යටතේ ඇති මාර්ග සමාලෝචනය හා ඒකාබද්ධ පරීක්ෂාව සඳහා එක් ඉංජිනේරුවරයෙකු මුදාහැරීම (මුදාහරින ලද දින ගණන සති දෙකකි) | | | 100% |
| තැන්නෙකුඹුර-රිකිල්ලගස්කඩ-රාගල මාර්ගය සඳහා උපකරණ හා මිනිස් ශ්‍රමයෙන් පවත්නා මිනුම් සැලසුම්වල සැලසුම් කල මධ්‍ය රේඛාව සලකුණු කිරීම (ඉංජිනේරු වරුන් 03යි සති 06 යි) | | | 100% |
| ප්‍රධාන මහාමාර්ග ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩර් ඇගයීම මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස මෙන්ම, උපදේශයන් තෝරාගැනීම ඇගයීම් සඳහා කටයුතු කිරීම | | | 100% |
| ඇල්විටිගල මාවතේ තිරස් එකෙල්ල සැලසුම | AC008 | | 100% |

| කාර්යය | මාර්ග අංකය | දිග (කි.ම.) | 2011 අවසානයේ ප්‍රගතිය |
|---|---|---|---|
| මතුපිට ඇතිරීම සඳහා කොළඹ-නුවර මාර්ගයේ මට්ටම සැලසුම | A001 | 3.00 | 80% |
| ගොලුමඩම ජ්‍යාමිතික සැලසුම | | | 90% |
| මිල්ලගහවත්ත ප්‍රතිස්ථාපන ස්ථානයේ මාර්ග | | | 5% |
| පාලම්තුන හංදියේ ජ්‍යාමිතික සැලසුම නවීකරණය | B084 | 0.40 | 70% |
| කොළඹ-හොරණ මාර්ගයේ පාමංකඩ අත්පත්කර ගැනීමේ සැලසුම | B084 | 0.30 | 89% |
| කොහුවල හංදිය පිළිබඳ ප්‍රමාණ බිල්පත් සැකසීම | B084 | | 90% |
| ගම්සභා හංදිය ප්‍රමාණ පිරිසැලැස්ම පිළියෙල කිරීම | B084 | 0.40 | 80% |
| සියලුම පළාත් සඳහා සම්මත ලේඛනයක් වෙනුවෙන් විශේෂ මිල අනුපාත උප ලේඛනයක් පිළියෙල කිරීම | | | 80% |
| තැන්නෙකුඹුර-රිකිල්ලගස්කඩ-රාගල මාර්ගයේ(කි.මී.20-75) මධ්‍ය රේඛාව, අත්පත් කර ගැනීමේ මායිම්, සලකුණු කිරීම | B413 | 55.0 | 45% |
| තිස්සමහාරාමය පූජා ප්‍රදේශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | | 3.00 | 87% |

පහත දැක්වෙන මාර්ග සැලසුම් මාර්ග සැලසුම් අංශය විසින් සමාලෝචනයට භාජනය කරන ලදි.

***වගු අංක 20: 2011 වර්ෂය තුළදී සමාලෝචනය කරන ලද සැලසුම් විස්තර***

| මාර්ගය | මාර්ග අංකය | දිග (කි.ම.) | 2011 අවසානයේ ප්‍රගතිය |
|---|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකු ණය 2080 SRI (SF): මාර්ග ව්‍යාපෘති සැකසීම් පහසුව - කොන්ත්‍රාත් ප්‍රදාන අංක RDA/HNIP/PRP2/5. අවිස්සාවේල්ල-හැටන්-නුවර එළිය මාර්ගය වැඩි දියුණුව හා පුළුල් කිරීම (කි.මී.27+000 to 115+58 දක්වා) | A007 | 44.0 | 2% |
| ආසියානු සංවර්ධන බැංකු ණය 2630/ශ්‍රී උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය (NRCP) තෝනිගල සිට ගල්කුලම දක්වා A009 මාර්ග කොටස පුනරුත්ථාපනය /වැඩි දියුණු කිරීම (කි.මී. 98+000 සිට 122+170) කොන්ත්‍රාත් ප්‍රදානය: RDANRCP/ICB/ADB/CP – 2: | A009 | 24.17 | 16% |

| | | | |
|---|---|---|---|
| ජලාපවහන ව්‍යුහ සැලසුම සමාලෝචනය | | | |
| ආසියානු සංවර්ධන බැංකු ණය 2639 – ශ්‍රී උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය (NRCP) මාන්කුලම්-මුලතිවු මාර්ගය A034 මාර්ග කොටස (කි.මී.0+000 සිට 49+100) දක්වා පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීම කොන්ත්‍රාත් ප්‍රදාන අංක RDA/NRCP/ICB/CP-7-10 | A034 | 49.10 | 13% |
| බිරිඉබ්බන්ආර බෝපැලේ හංදිය (කි.මී. 0+000 සිට 6+000) | | 6.00 | 50% |
| චීන සංවර්ධන බැංකු අරමුදල් ප්‍රමුඛ මාර්ග ව්‍යාපෘති 2 කොන්ත්‍රාත් ප්‍රදාන අංක RDA/RNIP/PRP2/පැකේජ්/C/5A මහියංගනය-දිඹුලාගල-දලුක්කන මාර්ගය වැඩි දියුණුව හා පුළුල් කිරීම – AB044 (කි.මී.0 to 24.10) | AB044 | 24.00 | 17% |
| චීන සංවර්ධන බැංකු අරමුදල් ප්‍රමුඛ මාර්ග ව්‍යාපෘති – 2 කොන්ත්‍රාත් ප්‍රදාන අංක RDA/RNIP/PRP2/පැකේජ් C/5 අගලවත්ත-තිරුවානාකැටිය මාර්ගය වැඩි දියුණු කිරීම හා පුළුල් කිරීම (කි.මී.16+000 to 20+000) තිරස් එකෙල්ල කිරීම - කොටසක් | B420 | 4.00 | 35% |
| චීන සංවර්ධන බැංකු අරමුදල් ප්‍රමුඛ මාර්ග ව්‍යාපෘති – 2 කොන්ත්‍රාත් ප්‍රදාන අංක RDA/RNIP/PRP2/පැකේජ් C/C48, හොරණ-අගුරුවාතොට-අළුත්ගම මාර්ගය වැඩි දියුණු කිරීම හා පුළුල් කිරීම කොටසක් තිරස් එකෙල්ල කිරීම (කි.මී.5+000 සිට 32+000) . | B157 | 27.00 | 17% |

| මාර්ගය | මාර්ග අංකය | දිග (කි.මී.) | 2011 අවසානයේ ප්‍රගතිය |
|---|---|---|---|
| චීන සංවර්ධන බැංකු අරමුදල් ප්‍රමුඛ මාර්ග ව්‍යාපෘති – 2 කොන්ත්‍රාත් ප්‍රදාන අංක RDA/RNIP/PRP2/පැකේජ් C/C4, හොරවල-පැලවත්ත-පිටිගල මාර්ගය වැඩි දියුණු කිරීම හා පුළුල් කිරීම (කි.මී.0+000 සිට 25+740) කොටසක් තිරස් එකෙල්ල කිරීම | B158 | 25.74 | 17% |
| චීන සංවර්ධන බැංකු අරමුදල් ප්‍රමුඛ මාර්ග ව්‍යාපෘති – 2 කොන්ත්‍රාත් ප්‍රදාන අංක RDA/RNIP/PRP2/පැකේජ් C/C48, උස්වැටකෙයියාව -එප්පාමුල්ල-පමුණුව මාර්ගය වැඩි දියුණු කිරීම හා පුළුල් කිරීම කොටසක් තිරස් එකෙල්ල කිරීම | PRDA | 3.00 | 17% |
| චීන සංවර්ධන බැංකු අරමුදල් ප්‍රමුඛ මාර්ග ව්‍යාපෘති – 2 කොන්ත්‍රාත් ප්‍රදාන අංක RDA/RNIP/PRP2/පැකේජ් C/5 : හක්මන-බෙලිඅත්ත-තංගල්ල– B141 මාර්ගය වැඩිදියුණු කිරීම හා පුළුල් කිරීම කොටසක් එකෙල්ල කිරීම ( කි.මී.11+800 සිට 19+300) | B141 | 7.50 | 50% |
| චීන සංවර්ධන බැංකු අරමුදල් ප්‍රමුඛ මාර්ග ව්‍යාපෘති – 2 කොන්ත්‍රාත් ප්‍රදාන අංක RDA/RNIP/PRP2/පැකේජ් C/5 : අගලවත්ත-තිරුවානාකැටිය මාර්ගය (කි.මී.12+000 සිට 16+000) වැඩි දියුණු කිරීම හා පුළුල් කිරීම කොටසක් එකෙල්ල කිරීම | B421 | 4.00 | 50% |

***වගු අංක 21: 2011 වර්ෂයේ සැලසුම් කටයුතු සාරාංශය***

| **විස්තරය** | ***100% නිමකල*** | | ***ඉටුකෙරෙමින් පවතින කටයුතු*** | |
|---|---|---|---|---|
| | ***අන්තර්ඡේදන ගණන*** | ***මාර්ග දිග (කි.මී.)*** | ***අන්තර්ඡේදන ගණන*** | ***මාර්ග දිග (කි.මී.)*** |
| වෙනත් වැඩ | 4 | 18.70 | - | 114.50 |
| සැලසුම් සමාලෝචනය | - | - | - | 218.51 |
| දැයට කිරුළ මාර්ග | - | - | 10 | - |
| දකුණු අධිවේගි මාර්ගය මාතර සිට හම්බන්තොට දක්වා දික් කිරීම | - | - | - | 37.00 |
| හම්බන්තොට කේන්ද්‍රිය සංවර්ධනය | - | 10.30 | - | 37.12 |
| අන්තර්ඡේදන - සංඥාපිත නොවන | 5 | - | 38 | - |
| අන්තර්ඡේදන - සංඥාපිත | 12 | - | 13 | - |
| ව්‍යාපෘති කළමනාකරණ ඒකක කටයුතු (ලෝක බැංකු/උතුරු මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය/ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය/කොළඹ-කටුනායක අධිවේගි මාර්ගය/මාර්ග ව්‍යාපෘති සැකසුම් පහසුව) | - | 199.70 | - | 11.50 |
| මාර්ග | - | 55.50 | - | 255.50 |
| නාගරික සංවර්ධන අධිකාරියේ මාර්ග | - | - | 1 | 8.10 |
| ***එකතුව*** | ***21*** | ***284.2*** | ***62*** | ***682.23*** |

## 4.4.2 පාලම් සැලසුම් කිරීම

2011 වර්ෂය තුළ, නිමකරන ලද සැලසුම් කටයුතු තනි පරායනයේ මීටර් 7.0 දිගැති පෙරසවි කොන්ක්‍රීට් පාලම්වල සිට මීටර් 45 පරායනය දක්වා සමස්ත දිග මීටර් 250 දක්වා පරායනයෙන් යුක්ත විය. මීට අමතර වර්ග කිහිපයක පාලම් සැලසුම් කරන ලදි.

මෙම වර්ෂය තුළ මෙහෙයවන ලද සමස්ත පාලම් සැලසුම් ව්‍යාපෘති ගණන පසුගිය වර්ෂයේ සිට අඛණ්ඩව කරගෙන ආ 19 ක්ද 2012 දක්වා කරගෙන යන ලද 10 ක්ද ඇතුළුව 117 කි. පාලම් පහක් තාවකාලිකව අත්හිටුවන ලදි. මෙහෙයවන ලද ව්‍යාපෘති වූයේ රාජ්‍ය ආයෝජන වැඩ සටහන යටතේ පුනරුත්ථාපනය සඳහා හඳුනාගත් පාලම් හා ආ.සං.බැ, ලෝක බැංකුව, එ.රා.වා.පා.ව්‍යා., මා.ව්‍යා.සැ.ප., පි.ව.මා.ව්‍යා., ජා.ම.ආ.ව්‍යා. හා වි.වි.ආ.ව්‍යා. වැනි ව්‍යාපෘති කළමනාකරණ ඒකකවල ඉල්ලීම මත භාරගන්නා ලද පාලම්ය.

පාලම් 56 ක් සඳහා ව්‍යාපෘති සැලසුම්, සියලුම අංගයන් හා වැඩ ඇඳීම්, ප්‍රමාණ බිල්පත් හා ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීම නිමකෙරිණි. සියල්ල එකතුව පාලම් 101 ක් නිමකල අතර,

ආසන්න වශයෙන් සමස්ත ඇස්තමේන්තු පිරිවැය රු.මි. 2288.3 කි. 2011 වර්ෂයේදි සැලසුම් කටයුතු නිමකල පාලම් පිළිබඳ විස්තර වගු අංක 22 දැක්වේ.

විවිධ වූ පැහැදිලි පරායනයන් හා පැහැදිලි උස සහිත ආදර්ශ පෙට්ටි බෝක්කු සැලසුම් කරන අතර, ඇදීම් පිළියෙල කරන ලදි. පෙර පදම් පෙර සවි (පසුවැරගැන්වූ) මීටර් 35, 40 හා 45 දිගු බාල්ක සැලසුම් කරන ලදි. ඒ සඳහා සම්මත වර්ගයේ ඇඳීම් පිළියෙල කරන ලදි.

පහත දැක්වෙන පාලම් ස්ථාන සඳහා ජා.ජ.හා ජ.ම. විසින් ජලනල එලීමට ඉදිරිපත් කරන ලද ඇඳීම් හා විස්තර, හොඳින් පරීක්ෂාකර අනුමත කරන ලදි.

- මීගමුව ජල සැපයුම් උපරිමායන ව්‍යාපෘතිය
- බණ්ඩාරගම-පිළියන්දල මාර්ගයේ අංක 20/3 පාලම

ලංකා විදුලිබල මණ්ඩලය විසින් පිටකොටුව මහව්දියේ පාලම් දිගට සේවා රැහැන් එලීම සඳහා ඉදිරිපත් කරන ලද ඇඳීම් හා විස්තර හොඳින් පරීක්ෂාකර අනුමත කරන ලදි.

පාලම් සැලසුම් කාර්යාලය විසින්, ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්ගේ ඉල්ලීම මත ව්‍යාපෘති කළමනාකරණ ඒකක සඳහා පහත දැක්වෙන සේවා සපයන ලදි.

- ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ ඉල්ලීම මත පුලියන්කුලම-මුලතිව් මාර්ගයේ පාලම් 4 ක (අංක 4/2, 5/1 හා 5/2) විස්තරාත්මක සැලසුම්, වැඩ ඇදීම්, ප්‍රමාණ බිල්පත් හා ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීම නිම කෙරිණි.

- ව්‍යාපෘති අධ්‍යක්ෂ මා.ව්‍යා.සැ.ප.කේ ඉල්ලීම මත කටුකුරුන්ද-නැබඩ මාර්ගයේ (B207) පාලම්, 0+000 සිට 2+720, දක්වා කොටස, හික්කඩුව-දක්ෂිණ අධිවේගී මාර්ගයේ (B153) 0+000 සිට 14+340, කොටස, මාතර-අකුරැස්ස මාර්ගයේ (A024) 0+100 සිට 3+500 කොටස කිරුළපන-ගොඩගම මාර්ගයේ (A004) 0+130 සිට 1+260 හා 15+500 සිට 19+700 කොටස, කොළඹ-හොරණ මාර්ගයේ (B084) 0+500 සිට 28+180 සඳහා සැලසුම් සමාලෝචනය කරන ලදි.

- එක්සත් රාජධානි වානේ පාලම් ව්‍යාපෘති අංශයේ අධ්‍යක්ෂගේ ඉල්ලීම මත පාලම් 19 ක් සඳහා උප ව්‍යුහ සැලසුම් කිරීම, ඇදීම් පිළියෙල කිරීම.

- කොළඹ-කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘති අධ්‍යක්ෂගේ ඉල්ලීම මත ව්‍යාපෘති කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද කොළඹ-කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ පාලම් සඳහා සැලසුම් වාර්තා හා ඇදීම් පරීක්ෂා කිරීම.

- ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘති අධ්‍යක්ෂගේ ඉල්ලීම මත පාලම් 8 ක් සඳහා සැලසුම් කිරීම, ඇදීම හා ප්‍රමාණ බිල්පත් පිළියෙල කිරීම.

- ඉදිකිරීම් දුෂ්කරතා ජය ගැනීමට වැඩබිම් තත්ත්වය වෙනස් කිරීම සඳහා අඹේපුස්ස-කුරුණෑගල-ත්‍රිකුණාමල මාර්ගයේ අංක 92/4 පාලම හා තවත් පාලම් 19 න් පදනම් තත්ත්වය මුල් සැලසුම් වලට අවශ්‍යවන පරිදි සංශෝධනය කරන ලදි.

ඉහත සඳහන් කාර්යයන්ට අමතරව, කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද සැලසුම් ගණනයන් හා මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශිය කාර්යාලවල ගණනයන් පාලම් සැලසුම් අංශය විසින් පරික්ෂා කරන ලදි. වර්ෂය තුළ ඉදිකිරීම් දුෂ්කරතා හා විසඳීමට මූලික විමර්ශන 16 ක් ඇතුළු වැඩබිම් පරීක්ෂාවන් 92 ක් විස්තරාත්මක ඉංජිනේරු සමීක්ෂණයන් 16 ක් හා පාලම් ඉදිකිරීම් වැඩබිම් සංචාර 15 ක් සිදුකරන ලදි. සූරියවැව පිහිටි ඉංජිනියරින් ඇන් ලැබෝරටරි සර්විස් පුද්. සමාගමේ බාල්ක පාදම් අංගනය, වාත්තු පත්ල හා ගිල්වීම් පද්ධතිය පරීක්ෂාකර, ඇතැම් කොන්දේසි සහිතව මීටර් 13.5 දිග පෙරසවි කොන්ක්‍රීට් බාල්ක සඳහා අනුමැතිය ලබාදුනි. එම බාල්ක සැලසුම් බර පරීක්ෂාකර මා.සං.අ.යේ පාලම් සඳහා භාවිතා කිරීමට අනුමැතිය ලබාදෙන ලදි. යෝජිත විදේශාධාර පාලම් ව්‍යාපෘතිවල ප්‍රාථමික හා විස්තරාත්මක අධ්‍යයනයන්හි විදේශිය දූත කණ්ඩායම් සමඟ ප්‍රතිමුඛ හෝ සහායක ඉංජිනේරුවන් ලෙස කටයුතු කිරීම. එකී පාලම්වල විස්තරාත්මක සැලසුම් තුළදී එවැනිම සහායක් ලබාදෙනු ලැබිය. ඊට අමතරව පාලම් සැලසුම් අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ හා ජ්‍යෙෂ්ඨ සැලසුම් ඉංජිනේරුවන්, තා.ඇ.ක. 18 ක කමිටු සාමාජිකයන් ලෙස සේවයේ යෙදුනි.

***වගු අංක 22: 2011 වර්ෂයේ නිමකල පාලම් සැලසුම් කටයුතු***

| ***අංකය*** | ***විස්තරය*** | ***සමස්ත ඇස්තමේන්තුගත පිරිවැය (රු:මි.)*** |
|---|---|---|
| ***හදිසි පාලම් ව්‍යාපෘති හා දුබල පාලම් ලැයිස්තුවෙන් හඳුනාගත් පාලම්*** | | |
| 01 | ගංගොඩවිල-බොරලැස්ගමුව මාර්ගයේ (පිංගාරා ක්ලබ් අසල) පාලම් අංක 4/1 | 32.8 |
| 02 | ගාල්ල-දෙනියාය-මාදම්පේ මාර්ගයේ පාලම් අංක 51/1 | 28.2 |
| 03 | හක්මන-මීඇල්ල-තලහගන්දූව මාර්ගයේ පාලම් අංක 4/1 | 35.5 |
| 04 | පැල්මඩුල්ල-මාදම්පේ-නෝනාගම මාර්ගයේ කි.මී. 73 හා 74 අතර වැටිය හංදිය අසල වලවේ ගඟ හරහා පාලම (මංතීරු 4 ධාරිතාව -මා.සං.අ. නොවන) | 297.0 |
| 05 | කෑගල්ල අතුරු මාර්ගය (පුළුල් කිරීම) | 58.9 |
| 06 | වේයන්ගොඩ-රුවන්වැල්ල මාර්ගයේ අංක 28/7 පාලම (ප්‍රතිනිර්මාණය) | 86.5 |
| 07 | නාරාහේන්පිට-නාවල-නුගේගොඩ මාර්ගයේ අංක 2/1 පාලම (පුළුල් කිරීම-විකල්ප සැලසුම) | 107.5 |
| 08 | කොල්ලුපිටිය-ශ්‍රී ජයවර්ධනපුර මාර්ගයේ (දියවන්නා ඔය හරහා) අංක 6/2 පාලම (දිගු කිරීම) (විකල්ප සැලසුම) | 105.3 |
| 09 | කො.ගා.හ.වැ.මාර්ගයේ අංක 25/4 පාලම | 40.6 |
| 10 | කො.ගා.හ.වැ.මාර්ගයේ පානදුර අංක 1/2 පාලම | |
| 11 | මිරිස්වත්ත-වතුරුගම මාර්ගයේ අංක 3/3 පාලම (පුළුල් කිරීම හා නැවත තට්ටුව යෙදීම) | 4.2 |
| 12 | මිරිස්වත්ත-වතුරුගම මාර්ගයේ අංක 8/2 පාලම (පුළුල් කිරීම) | 7.0 |
| 13 | මිරිස්වත්ත-වතුරුගම මාර්ගයේ අංක 8/1 පාලම (පුළුල් කිරීම) | 1.2 |

| අංකය | විස්තරය | සමස්ත ඇස්තමේන්තුගත පිරිවැය (රු:මි.) |
|---|---|---|
| 14 | මිරිස්වත්ත-වතුරුගම මාර්ගයේ අංක 10/2 පාලම (ප්‍රතිනිර්මාණය) | 3.6 |
| 15 | මිරිස්වත්ත-වතුරුගම මාර්ගයේ අංක 10/4 පාලම පුළුල් කිරීම හා නැවත තට්ටුව යෙදීම | 5.1 |
| 16 | මට්ටක්කුලිය-උස්වැටකෙයියාව-පින්වත්ත මාර්ගයේ අංක 4/4, 5/2, 5/3 & 5/4 පාලම් | 7.2 |
| 17 | යාපනයේ කච්චේරිය-වෙරළකොටුව මාර්ගයේ අංක 4/2 පාලම | 4.0 |
| 18 | මන්නාරම-පුත්තලම මාර්ගයේ අංක 5/1 පාලම | 11.5 |
| 19 | කටුකුරුන්ද-නැබොඩ මාර්ගයේ අංක 12/3 (තෙබුවන පාලම පුළුල් කිරීම හා නැවත තට්ටුව යෙදීම) | 14.0 |
| 20 | කො.ගා.හ.වැ.මාර්ගයේ අංක 117/3 පාලම පුළුල් කිරීම | 28.2 |
| 21 | බත්තරමුල්ල-පන්නිපිටිය මාර්ගයේ ද. 3+560 පාලම විකල්ප සැලසුම | 10.8 |
| 22 | පැලතොප්පූර්-සේරුවිල මාර්ගයේ අංක 3/2 පාලම (යළි ඉදිකිරීම) | 7.1 |
| 23 | ගාල්ල-බද්දේගම මාර්ගයේ අංක 5/4 පාලම (යළි ඉදිකිරීම) | 7.1 |
| 24 | ගලිගමුව-රුවන්වැල්ල මාර්ගයේ අංක 22/1 පාලම (යළි ඉදිකිරීම) | 19.9 |
| 25 | වස්කඩුව-බණ්ඩාරගම මාර්ගයේ 15/2 පාලම (යළි ඉදිකිරීම) | 7.1 |
| 26 | සියඹලාණ්ඩුව-දමන-අම්පාර මාර්ගයේ 39/4 පාලම (යළි ඉදිකිරීම) | 30.0 |
| 27 | කෑගල්ල-බුලත්කොහුපිටිය-කරවනැල්ල මාර්ගයේ 1/5 පාලම (යළි ඉදිකිරීම) | 58.9 |
| 28 | කැලණිය-මුදුන්ගොඩ මාර්ගයේ 2/3 පාලම (යළි ඉදිකිරීම) | 6.8 |
| ***දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය*** | | |
| 29 | සිහිවටන ව්‍යුහය - වානේ කුරුල්ලා | 11.5 |
| 30 | සිහිවටන ව්‍යුහය - වානේ ආරුක්කුව | 5.0 |
| 31 | සිහිවටන ව්‍යුහය - කොන්ක්‍රීට් කුළුන | 3.1 |
| ***ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය යටතේ පාලම්*** | | |
| 32 | පුත්තලම-ත්‍රිකුණාමල මාර්ගයේ අංක 16/2 පාලම (තට්ටුව යළි යෙදීම) | 3.6 |
| 33 | පුත්තලම-ත්‍රිකුණාමල මාර්ගයේ 16/4 පාලම (යළි ඉදිකිරීම) | 6.7 |
| 34 | පුත්තලම-ත්‍රිකුණාමල මාර්ගයේ 49/1 පාලම (යළි ඉදිකිරීම) | 15.0 |
| 35 | පුත්තලම-ත්‍රිකුණාමල මාර්ගයේ 11/2 පාලම (රැඳවුම් තාප්ප කොටස) | 5.0 |
| 36 | පුත්තලම-ත්‍රිකුණාමල මාර්ගයේ 63/3 පාලම (යළි ඉදිකිරීම) | 24.2 |
| 37 | අනුරාධපුර ජයන්ති මාවතේ ද. 76+707 අංක 1/1 දරණ පාලම (පුළුල් කිරීම) | 16.7 |
| 38 | පුත්තලම-ත්‍රිකුණාමල මාර්ගයේ (ද. 70+790) අංක 72/1 පාලම (යළි ඉදිකිරීම) | 27.0 |

| අංකය | විස්තරය | සමස්ත ඇස්තමේන්තුගත පිරිවැය (රු:මි.) |
|---|---|---|
| 39 | නාගොඩ-කලවැල්ලාව-බැල්ලපිටිය මාර්ගයේ 14/7 පාලම (යළි ඉදිකිරීම) | 45.0 |
| ***එක්සත් රාජධානි වානේ පාලම් ව්‍යාපෘතිය*** | | |
| 40 | තිරුවානකැටිය-අගලවත්ත මාර්ගයේ අංක 14/1 පාලම | 91.0 |
| 41 | තිරුවානකැටිය-අගලවත්ත මාර්ගයේ අංක 33/2 පාලම | 73.4 |
| 42 | තිරුවානකැටිය-අගලවත්ත මාර්ගයේ අංක 21/3 පාලම | 60.2 |
| 43 | මාදම්පේ-තොඩුවාව මාර්ගයේ ලුණුඔය පාරු පාලම් ස්ථානයේ පාලම (මාර්ග සංවර්ධන අධිකාරි නොවන) | 155.2 |
| 44 | ගාල්ල-දෙනියාය-මාදම්පේ මාර්ගයේ 46/1 පාලම | 56.9 |
| 45 | ගාල්ල-දෙනියාය-මාදම්පේ මාර්ගයේ 9/6 දරණ පාලම | 51.9 |
| 46 | අම්පිලන්තුරෙයි-වීරමුනි මාර්ගයේ අංක 10/2 (තාවකාලික පාලම) | 7.0 |
| 47 | හිනිදුම-ඕපාත-පිටබැද්දර මාර්ගයේ අංක 27/4 පාලම | 25.8 |
| 48 | කොළනිය-කට්ටපලම් මාර්ගයේ 33 අසල නවගිරිය ඇල හරහා පාලම | 7.6 |
| 49 | දෙහිඕවිට-දැරණියගල-නූරි මාර්ගයේ අංක 3/8 පාලම (සංශෝධනයකි) | 3.0 |
| 50 | කලුඅග්ගල-ලබුගම මාර්ගයේ අංක 2/3 දරණ පාලම (යළි ඉදිකිරීම) | 20 |
| 51 | ජේ.බ.වෙ. මාර්ගයේ අංක 283/8 (වෙන්කලඩි හෝ කලුපාලම) (තාවකාලික පාලම) | 8.0 |
| 52 | කෙත්තාරාම ක්‍රීඩාංගනය ව්‍යාපෘතිය සඳහා පාලම් අංක 1 පංසල අසල | 0.0 |
| 53 | කෙත්තාරාම ක්‍රීඩාංගනය ව්‍යාපෘතිය සඳහා පාලම් අංක 2 සි ගේට්ටුව අසල | 0.0 |
| 54 | කාල්මුනෙයිකුඩි අස්රප් සමරු රෝහල අසල පාලම (මා.ස.අ.නොවන) | 7.0 |
| 55 | කිලිනොච්චිය වි.හ. නිල නිවාසවලට යන මාර්ගයේ පාලම | 6.0 |
| 56 | කොල්ලුපිටිය-ශ්‍රී ජයවර්ධනපුර මාර්ගයේ දියවන්නා ඔය හරහා තාවකාලික පාලම (පාර්ලිමේන්තු හංදිය අසල) | 20.0 |
| ***ආසියානු සංවර්ධන බැංකුව*** | | |
| 57 | අල්ලෙ-කන්තලේ මාර්ගයේ මහවැලි ගඟ හරහා පාලම් අංක 23/3 | 125.0 |
| 58 | පුලියන්කුලම-මුලතිව් මාර්ගයේ අංක 4/2 පාලම | 12.5 |
| 59 | පුලියන්කුලම-මුලතිව් මාර්ගයේ අංක 5/2 පාලම | 11.0 |
| 60 | පුලියන්කුලම-මුලතිව් මාර්ගයේ (දු. 4+600) අංක 5/1 පාලම | 30.0 |
| ***මාර්ග සංවර්ධන අධිකාරි නොවන පාලම්*** | | |
| 61 | කැගල්ල-ඉද්දමල්පලාන සංගිලි පාලම | 44.2 |
| 62 | හර්තාල් පාලම (කොළඹ වරාය දිගු කිරීමේ ව්‍යාපෘතිය) | 195.3 |
| 63 | ඉහල පාලම්පිටිය පාලම | 21.0 |

| අංකය | විස්තරය | සමස්ත ඇස්තමේන්තුගත පිරිවැය (රු:මි.) |
|---|---|---|
| 64 | වේළුවන විද්‍යාලය අසල පදික පාලම | 1.3 |
| 65 | කන්දගහවිල පැරණි බෝගස අසල පදික පාලම | 3.9 |
| 66 | පානදුර මැතිවරණ කොට්ඨාශයේ කදුරුදූව පයිප්ප බෝක්කුව | 7.3 |
| 67 | බණ්ඩාරගම මැතිවරණ කොට්ඨාශයේ කුරගොඩ පාලම | 3.9 |
| 68 | කල්මුණේ අල් අෂ්රොෆ් ජාතික පාසල ඉදිකිරීම (උස් පදික මාරුව) | 10.0 |
| 69 | කටුගම්පොල මැතිවරණ කොට්ඨාශයේ කන්දෙපොල පදික මාරුව | 6.9 |
| 70 | අත්තනගල්ල-මාදුරුපිටිය මාර්ගයේ මාදුරුපිටිය පාලම | 34.2 |
| සමස්ත ඇස්තමේන්තුගත පිරිවැය | | **2288.3** |

## 4.5 මාර්ග හා පාලම් වැඩවල තත්ත්ව පාලනය

2011 වර්ෂය තුළ පර්යේෂණ හා සංවර්ධන අංශය පළාත් ක්ෂේත්‍ර රසායනාගාර මගින් හා ක්ෂේත්‍ර රසායනාගාර මගින් හා මන්නාරම්-පුනරීන් (A32) මාර්ග ව්‍යාපෘතියේ පිහිටි රසයනාගාරයද මගින්, මාර්ග ඉදිකිරීමේදි හා නඩත්තු කිරීමේදි වැඩවල තත්ත්ව පාලනය සඳහා අඛණ්ඩ උපදෙස් හා සහාය ලබාදෙන ලදි.

**නායයෑම් ආවේක්ෂණය :**

වර්ෂය තුළ පහත සඳහන් ස්ථානවල සිදුවූ නායයෑම් විමර්ෂණ හා විසඳුම් පියවර ක්‍රියාත්මක කරන ලදි.

- කො.ර.වැ.ම.මාර්ගය, ජේ.බ.වෙ.මාර්ග හා ඌව පළාතේ බෙරගල-හාලිඇල මාර්ගය.
- මධ්‍යම පළාතේ පුස්සැල්ලෑව හා නාවලපිටිය නායයෑම්.

**පදනම් විමර්ෂණ**

- 2011 වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරියේ අයවැය ප්‍රතිපාදන යොදා ගනිමින් ගැඹුරු විදුම් ඒකක යොදවා පාලම් 23 ක් හා එක් රැඳවුම් තාප්පයක් සඳහා පදනම් විමර්ශන සිදු කරන ලදි.
    - ගාල්ල-දෙනියාය-මාදම්පේ මාර්ගයේ අංක 46/1 පාලම පිළිබඳ පිහිටි මිහිවිදුම් විමර්ශන 4කි.
    - අඹේපුස්ස-කුරුණෑගල-ත්‍රිකුණාමල මාර්ගයේ අංක 34/2 පාලමේ පිහිටි මිහිවිදුම් විමර්ශන 2කි.
    - කලුඅග්ගල-ලබුගම මාර්ගයේ අංක 2/3 පාලමේ පිහිටි මිහිවිදුම් විමර්ශන 2 කි.
    - කෑගල්ල-බුලත්කොහුපිටිය-කරවනැල්ල මාර්ගයේ අංක 1/5 දරණ පාලමේ මිහිවිදුම් විමර්ශණ 2යි.
    - වස්කඩුව-බණ්ඩාරගම-කැස්බෑව මාර්ගයේ අංක 15/2 පාලමේ මිහිවිදුම් විමර්ශන 4 යි.
    - පැල්මඩුල්ල-ඇඹිලිපිටිය-නෝනාගම මාර්ගයේ අංක 74/2 පාලමේ මිහිවිදුම් විමර්ශන 2 යි.
    - තුඩැල්ල-පමුණුගම-තලාහේන-මීගමුව මාර්ගයේ අංක 3/2 පාලමේ මිහිවිදුම් විමර්ශන 3 යි.
    - පේරාදෙණිය-බදුල්ල-චෙන්කලඩි මාර්ගයේ අංක 283/8 පාලමේ මිහිවිදුම් විමර්ශන 1 යි.
    - කොළඹ-රත්නපුර-වැල්ලවාය-මඩකලපුර මාර්ගයේ අංක 53/1 පාලමේ මිහිවිදුම් විමර්ශන 4යි.
    - කොළඹ-ගාල්ල-හම්බන්තොට-වැල්ලවාය මාර්ගයේ අංක:117/3 පාලමේ මිහිවිදුම් විමර්ශන 2 යි.
    - අත්තනගල්ල-මාදුරුපිටිය මාර්ගයේ (මාසංඅ නොවන) මාදුරුපිටිය පාලමේ මිහිවිදුම් විමර්ශන 3 යි.
    - පොල්වත්ත-දෙණිපිටිය මාර්ගයේ පොල්වත්ත පාලමේ මිහිවිදුම් විමර්ශන 9 යි.
    - හොරණ-අඟුරුවාතොට-අලුත්ගම මාර්ගයේ අංක 23/1 පාලමේ මිහිවිදුම් විමර්ශන 3 යි.
    - හොරණ-අඟුරුවාතොට-අලුත්ගම මාර්ගයේ අංක 23/2 පාලමේ මිහිවිදුම් විමර්ශන 4 යි.
    - නාගොඩ-කලවැල්ලාව-බැල්ලපිටිය මාර්ගයේ අංක 14/7 පාලමේ මිහිවිදුම් විමර්ශන 2 යි.
    - කිරිමැටිය-යාල මාර්ගයේ අංක 9/1 පාලමේ මිහිවිදුම් විමර්ශන 4 යි.
    - කිරිමැටිය-යාල මාර්ගයේ 10 වැනි කි.මී.යේ රැඳවුම් තාප්පය සඳහා මිහිවිදුම් විමර්ශන 2 යි.
    - ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සාමවච්චිතියු මියුනයිච්චයනාල් මාර්ගයේ (මාසංඅ නොවන) යෝජිත පාලම සඳහා මිහිවිදුම් විමර්ශන 4 යි.
    - අල්ල-කන්තලේ මාර්ගයේ අංක 3/2 පාලමේ මිහිවිදුම් විමර්ශන 4 යි.
    - වඳුරඹ-ඇතුමලේ-යක්කටුව මාර්ගයේ 33/1 පාලමේ මිහිවිදුම් විමර්ශන 4 යි.
    - වඳුරඹ-ඇතුමලේ-යක්කටුව මාර්ගයේ 24/3 පාලමේ මිහිවිදුම් විමර්ශන 4 යි.
    - දික්වැල්ල බතිගම රෝහලේ ප්‍රවේශ මාර්ගයේ (මාසංඅ නොවන) යෝජිත පාලම සඳහා මිහිවිදුම් විමර්ශන 2 යි.
    - අවිස්සාවේල්ල-හැටන්-නුවරඑළිය මාර්ගයේ කොටගල දුම්රිය උමං මාර්ගය සඳහා මිහිවිදුම් විමර්ශන 2 යි.
    - කින්නියා-පුවරසන්තිවු යෝජිත පාලම සඳහා මිහිවිදුම් විමර්ශන 1 යි. (මාසංඅ නොවන)

➢ 2011 වර්ෂය තුළ සේවාදායක හා ව්‍යාපෘති අරමුදල් මගින් විදුම් ඒකක පාවිච්චි කර පාලම් 06 ක් හා එක් ව්‍යාපෘති වැඩබිමක් සඳහා පදනම් විමර්ශන සිදුකරන ලදි.

- පන්නල-කුලියාපිටිය මාර්ගයේ පාලම් අංක 1/2 සඳහා මිහිවිදමන් සමීක්ෂණ 2 ක් සඳහා ඇස්තමේන්තු මුදල වූ රු: 215, 413.00 ක මුදල වයඹ පළාත්භාර අධ්‍යක්ෂ විසින් ඉල්ලා සිටින ලදි.
- පන්නල-කුලියාපිටිය මාර්ගයේ පාලම් අංක 3/4 සඳහා මිහිවිදමන් සමීක්ෂණ 2 ක් සඳහා ඇස්තමේන්තු මුදල වූ රු: 193, 104.00 ක මුදල වයඹ පළාත්භාර අධ්‍යක්ෂ විසින් ඉල්ලා සිටින ලදි.
- පන්නල-කුලියාපිටිය මාර්ගයේ පාලම් අංක 5/4 සඳහා මිහිවිදමන් සමීක්ෂණ 2 ක් සඳහා ඇස්තමේන්තු මුදල වූ රු:.178, 575.00 ක මුදල වයඹ පළාත්භාර අධ්‍යක්ෂ විසින් ඉල්ලා සිටින ලදි.
- පන්නල-කුලියාපිටිය මාර්ගයේ පාලම් අංක 5/5 පාලමේ මිහිවිදුම් විමර්ශණ සඳහා ඇස්තමේන්තු වියදම වන රු.241, 052.00 ක් වයඹ පළාත්භාර අධ්‍යක්ෂ විසින් ඉල්ලා සිටින ලදි.
- කොස්වත්ත-කඩිගමුව මාර්ගයේ කඩිගමුව පාලමේ මිහිවිදුම් විමර්ශන 2 සඳහා ඇස්තමේන්තු වියදම වන රු: 309,528.00 වයඹ පළාත් අධ්‍යක්ෂ විසින් ඉල්ලා සිටින ලදි.
- තලගොඩපිටිය-යටවත්ත මාර්ගයේ අංක 11/4 පාලමේ මිහිවිදුම් විමර්ශන 4 සඳහා ඇස්තමේන්තු වියදම වන රු: 450, 236.00 වයඹ පළාත් අධ්‍යක්ෂ විසින් ඉල්ලා සිටින ලදි.
- කොළඹ-මහනුවර අධිවේගී මාර්ගයේ කඩවත-අඹේපුස්ස කොටස මිහිවිදුම් විමර්ශන 05 ක් ව්‍යාපෘති අධ්‍යක්ෂ (කොළඹ-නුවර විකල්ප මාර්ගය) විසින් ඉල්ලා සිටින ලදි.

**දෛනික ද්‍රව්‍ය පරීක්ෂණ**

පස්, කලුගල්, ගංගාවැලි, තාර ද්‍රව්‍ය, සිමෙන්ති මිශ්‍රණ ඝණයන්, ගැටි බැම්, මාෂල් ආදර්ශ, ඇස්පල්ට් මිශ්‍රණ ගර්භ සාම්පල හා වානේ පර්යේෂණ හා සංවර්ධන අංශයේ ප්‍රධාන රසායනාගාරය විසින් පරීක්ෂණයට ලක්කර වාර්තා කරන ලදි. එමෙන්ම ක්‍රියාත්මක ව්‍යාපෘති හා බාහිර ආයතන සඳහා ඇස්පල්ට් තාර මිශ්‍රණ සැලසුම් ක්‍රියාත්මක කරන ලදි. පුද්ගලික ආයතන හා මාර්ග සංවර්ධන අධිකාරි ව්‍යාපෘති සඳහා සිදුකරන ලද රසායනාගාර පරීක්ෂණ මගින් උපයන ලද මුළු ආදායම රු: 27, 020, 979.47 ක් වන අතර එය වගු අංක 23 දැක්වේ.

***වගු අංක 23: 2011 වර්ෂය තුළ රසායනාගාරය තුළ සිදුකළ මාර්ග ඉදිකිරීම් ද්‍රව්‍ය පරීක්ෂණ හා මිශ්‍ර සැලසුම්වලින් උපයන ලද ආදායමේ සාරාංශය***

| මාසය | කොන්ක්‍රීට් රසායනාගාරය (රු:) | පස් රසායනාගාරය (රු:) | තාර රසායනාගාරය (රු:) |
|---|---|---|---|
| ජනවාරි | 971, 153.61 | 128, 592.16 | 564, 903.29 |
| පෙබරවාරි | 731, 194.38 | 521, 562.06 | 452, 814.19 |
| මාර්තු | 798, 916.50 | 409, 032.58 | 765, 292.61 |
| අප්‍රේල් | 663, 434.10 | 337, 827.63 | 412, 883.29 |
| මැයි | 726, 331.11 | 347, 938.78 | 600, 622.86 |
| ජුනි | 718, 473.86 | 661, 573.04 | 472, 059.99 |
| ජූලි | 662, 214.02 | 309, 419.86 | 625, 780.67 |
| අගෝස්තු | 1, 474, 325.63 | 406, 800.39 | 1, 139, 471.73 |
| සැප්තැම්බර් | 2, 037, 520.76 | 533, 828.31 | 676, 047.03 |
| ඔක්තෝම්බර් | 1, 843, 398.57 | 718, 903.00 | 490, 355.60 |
| නොවැම්බර් | 1, 302, 055.88 | 400, 514.36 | 1, 017, 344.10 |
| දෙසැම්බර් | 1, 707, 279.12 | 342, 525.81 | 1, 048, 588.59 |
| **එකතුව** | **13, 636, 297.54** | **5, 118, 517.98** | **8, 266, 163.95** |
| ***එකතුව*** | ***27, 020, 979.47*** | | |

**ඇතුරුම් විමර්ශන හා මතු ඇතිරීම් සැලසුම්**

පහත විස්තර වන පරිදි බෙන්කල්මන් බීම් ඩිප්ලෙක්ෂන් බීම් විශ්ලේෂණ පරීක්ෂණ, ගතික කේතු විනිවිදුම් (DCP) පරීක්ෂණ ආදර්ශනවල පරීක්ෂණ හා පස් පරීක්ෂණ ඇතුළු ඇතුරුම් පරීක්ෂණ වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලදි.

**ඇතුරුම් විමර්ශන හා සැලසුම්.**

- තැන්නකුඹුර-රාගල මාර්ගය ඇතුරුම් විමර්ශනය
- අවිස්සාවේල්ල-හැටන්-නුවරඑළිය මාර්ගයේ (98+500 සිට 108+500 දක්වා) ඇතුරුම් විමර්ශනය

- කො.ර.වැ.ම. මාර්ගයේ ගොඩගම සිට අවිස්සාවේල්ල දක්වා ඇතුරුම් විමර්ශනය
- ඉයන්කච්චි-චුන්ඩිකුලම් මාර්ගයේ ඇතුරුම් විමර්ශන
- තිඹිරුගස්යාය මාර්ගයේ 1.3 කි.මී. ඇතුරුම් විමර්ශනය
- කෑගල්ල අතුරු මාර්ගයේ ඇතුරුම් විමර්ශනය
- පැලවත්ත-අකුරේගොඩ මාර්ගයේ බත්තරමුල්ල ඇතුරුම් විමර්ශනය
- මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය යටතේ ඉටුකරන ලද වැඩ
  - අඹේපුස්ස-කුරුණෑගල-ත්‍රිකුණාමල මාර්ගයේ බෙ.බි.වෙ. සමීක්ෂණ හා ග.කේ.වි. පරීක්ෂණය ඇස්තමේන්තු වියදම රු: 3, 279,127.83 කි.
  - නිට්ටඹුව-මහනුවර මාර්ගයේ ලිහිසි ප්‍රතිරෝධ පරීක්ෂණය ඇස්තමේන්තු වියදම රුපියල් 256, 737.70 කි.
- ශ්‍රී ලංකා ගුවන් තොටුපල ගුවන් ගමන් යටතේ ඉටුකරන ලද වැඩ.
  - කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල ධාවන පථයේ විමර්ශනය ඇස්තමේන්තුගත වියදම රු: 195,445.71 කි.
- විවිධ විදේශාධාර ව්‍යාපෘතිය යටතේ ඉටුකරන ලද වැඩ.
  - අනුරාධපුර-පාදෙනිය මාර්ගයේ ඇතුරුම් විමර්ශනය ඇස්තමේන්තු වියදම රු:158,087.08 කි.
- දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉටුකරන ලද වැඩ.
  - දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ බණ්ඩාරගම-දොඩංගොඩ මාර්ග කොටස ඇස්තමේන්තු ගත වියදම රු: 78, 571.51 කි.
- ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය යටතේ ඉටුකරන ලද වැඩ
  - කො.ර.වැ.ම. මාර්ගයේ විලාසිතා නිවස හංදිය සිට ගොඩගම හංදිය දක්වා ඇතුරුම් විමර්ශන ඇස්තමේන්තුගත වියදම රු: 880, 000.00 කි.
- මගනැගුම යටතේ ඉටුකරන ලද වැඩ
  - හිඟුරක්ගොඩ-සිරිකෙත මාර්ගයේ ඇතුරුම් විමර්ශනය සඳහා ඇස්තමේන්තුගත වියදම රු: 114,000.00 කි.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ඉටුකරන ලද වැඩ.
  - ඇස්තමේන්තුගත වියදම රු: 58,310.00 ක් මත විල්පත්තු ජාතික උද්‍යානයේ මාර්ගවල ඇතුරුම් විමර්ශනය
- මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය යටතේ ඉටුකරන ලද වැඩ.
  - අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආඥාගල හංදියේ සිට බුල්නෑව නගරය දක්වා බෙන්කල්මන් බිම් සමීක්ෂණ සඳහා ඇස්තමේන්තුගත වියදම රු: 477, 902.15 කි.

**තාක්ෂණික කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩ සටහන**

ඉදිකිරීම් ද්‍රව්‍ය රසායනාගාර පරීක්ෂණ හා ඝණක ඇතුරුම් තාක්ෂණය පිළිබඳව ප්‍රාදේශිය සභා නිලධාරීන්ට, විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්ට හා මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුවන්ට, කාර්මික නිලධාරීන්ට, පර්යේෂණ සහකාරවරුන්ට හා වැඩ පරිපාලකවරුන්ට දේශන හා නිරූපන ඉදිරිපත් කරන ලදි. මාසංඅ යේ කාර්මික කාර්ය මණ්ඩලය සඳහා ඉදිකිරීම්, පුනරුත්ථාපන හා නඩත්තු තාක්ෂණය පිළිබඳව ක්ෂේත්‍ර නිරූපණ ලබාදුනි.

**පර්යේෂණ ව්‍යාපෘති**

2011 වර්ෂය තුළ රසායනාගාර සම්බන්ධිත පර්යේෂණ ව්‍යාපෘති නිමකරන ලදි.

- වානේ තට්ටු පාලම්වල ලිහිසි ප්‍රතිරෝධය වැඩි දියුණු කිරීම.
- නවෝධා (පුද්) සමාගම සමඟ සහයෝගීව පයිරෝලයිසිස් කලු කාබන් (PCB) පාවිච්චි කර ඇස්පල්ට් තාර මිශ්‍රණය පර්යේෂණ ව්‍යාපෘතිය.

## 4.6 ඉඩම් අත්පත් කර ගැනීම හා ප්‍රතිස්ථාපනය

2011 වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ මාර්ග හා පාලම් ව්‍යාපෘති සඳහා ප්‍රාදේශිය ලේකම්වරුන් ඉඩම් අත්පත් කර ගැනීම් මාර්ග සංවර්ධන අධිකාරියේ ඉඩම් අත්පත් කර ගැනීම් හා පුනරුත්ථාපන අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදි. වර්ෂය තුළ සිදුකරන ලද ඉඩම් අත්පත් කර ගැනීම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු පහත වගුවේ දක්වා ඇත.

***වගු අංක 24: සෑම ව්‍යාපෘතියක් යටතේම ඉඩම් අත්පත් කර ගැනීමේ හා වන්දි ගෙවීමේ විස්තර ;***

| *ව්‍යාපෘතිය* | *මාර්ග කොටස* | *2 වන වගන්තිය යටතේ නිවේදනය පළ කිරීම (කොටස්)* | *38(a) වගන්තිය යටතේ නිවේදනය පළ කිරීම (කොටස්)* | *නිමකල අත්පත් කර ගැනීම් කොටස් (2011 තුල)* | *වන්දි මගයෙන් ගෙවන ලද මුදල (රු:)* |
|---|---|---|---|---|---|
| අඹේපුස්ස-දඹුල්ල මාර්ගය | | 11 | | | |
| අඹේපුස්ස-කුරුණෑගල මාර්ගය | | | | 2 | 895, 088.88 |
| කැලණිසිරි පාලමේ ප්‍රවේශ මාර්ගය | | 19 | 19 | | |
| බදුල්ල-මහනුවර මාර්ගය | 1+570 – 7+000 | 202 | 202 | | |
| බදුල්ල-කරමැටිය මාර්ගය | | | | | 3, 838, 740.86 |
| බේස්ලයින් මාර්ගය | | 731 | 731 | 640 | 4,773,796.66 |
| බත්තරමුල්ල-පන්නිපිටිය මාර්ගය | | | | 433 | 23, 515, 876.00 |
| කොළඹ-ගාල්ල-හම්බන්තොට මාර්ගය | | | | 577 | 11, 174, 556.27 |
| කොළඹ-හොරණ මාර්ගය | පාලම් අංක .6/1 | | 29 | 22 | 1,930,854.57 |
| කොළඹ-මහනුවර මාර්ගය | 17 – 21 | 682 | 682 | | 129288,531.95 |
| දෙහිවල-කටුඩාන-අත්තිඩිය මාර්ගය | | | | | 47,002,623.19 |
| දෙහිවල-මහරගම මාර්ගය | | | | 51 | 1, 608, 545.00 |

| ***ව්‍යාපෘතිය*** | ***මාර්ග කොටස*** | ***2 වන වගන්තිය යටතේ නිවේදනය පළ කිරීම (කොටස්)*** | ***38(a) වගන්තිය යටතේ නිවේදනය පළ කිරීම (කොටස්)*** | ***නිමකල අත්පත් කර ගැනීම් කොටස් (2011 තුල)*** | ***වන්දි මගයෙන් ගෙවන ලද මුදල (රු:)*** |
|---|---|---|---|---|---|
| දියතලාව-බණ්ඩාරවෙල මාර්ගය | | | | | 2, 622, 650.00 |
| ආචාර්ය ඇන්.ඇම්.පෙරේරා මාවත | | 168 | 168 | 134 | 17,654,616,.54 |
| ඒකල-ගම්පහ මාර්ගය | | | | 42 | 5, 174, 928.00 |
| ගලගෙදර-රඹුක්කන | | | | | 2, 802, 375.00 |
| ගම්පහ මේරිබිෂොප් | | | | 18 | 324, 857.00 |
| ගම්පහ ගුවන් පාලම | | | | 39 | 10, 507, 078.12 |
| ගම්පහ-ඔරුතොට මාර්ගය | | | | 39 | 41, 911, 998.00 |
| ගම්පහ නගර සංවර්ධනය | | | | 36 | 4, 347, 339.00 |
| ගනේමුල්ල-කිරිඳිවිට මාර්ගය | | | | 46 | 5, 796, 528.00 |
| හම්බන්තොට-මිගහජඳුර මාර්ගය | 0+550 – 14+970, 14+970 – 25+110 | 1096 | | | |
| හොරණ-අඟුරුවාතොට මාර්ගය | | | | | 492,175,000.00 |
| හුලංදූව-ක්‍රෙකර් මාර්ගය | 220 m | 10 | 10 | | |
| නුවර ගඟවට කෝරළේ | | | | | 533, 858.31 |
| මහනුවර-මාතලේ | | | | | 931, 978.27 |
| කැලණිය-මුදුන්ගොඩ මාර්ගය | 0+000 – 2+400 | 525 | 164 | 33 | 2,001,344 |
| කැස්බෑව-බණ්ඩාරගම | | | | 105 | 884, 759.00 |
| කිරිඳිවැල නගර සංවර්ධනය | | | | 47 | 262, 820.00 |
| කිරුළපන-ගොඩගම මාර්ගය (මහරගම නගරය) | මහරගම නගරය | | 229 | 31 | 38,915,185.00 |
| කුරුණෑගල-කොළඹ මාර්ගය | | | | 59 | |
| කුරුණෑගල-පාදෙනිය | | | | 10 | 4, 123, 363.56 |
| කුරුණෑගල-පුත්තලම | | | | 25 | 1, 101, 291.52 |
| මහරගම-දෙහිවල | | | | 23 | 734, 250.00 |
| මාකොල-උඩුපිල | | | | | 22, 969, 194.00 |
| මාකොල-උඩුපිල මාර්ගය | | 310 | | 22 | 42,838,261.53 |
| මාලබේ-කඩුවෙල මාර්ගය | | 600 | 600 | 519 | 1,990,550.95 |
| මැරයින් ඩ්‍රයිව් | | 235 | 235 | 199 | 53,166,845.58 |
| මාතර-හක්මන | 2වන කි.මී.කණුව | 267 | | | |
| මට්ටක්කුලිය මාර්ගය | 320m | 53 | 53 | 49 | 32,687,679.49 |
| මට්ටක්කුලිය මාර්ගය | 400m | 61 | 61 | | |
| මත්තල ගුවන් තොටුපල මාර්ගය | 0+000 – 8+750, 8+750 – 13+320 | 124 | 58 | | |
| මාවනැල්ල අතුරු මාර්ගය | | | | 1 | |
| මීරිගම-ගිරිඋල්ල | | | | | 1, 715, 750.00 |
| මිරිහාන-රත්මලාන | | | | 162 | 443, 556.00 |
| මීරිජ්ජවිල-සූරියවැව | 0+000 – 12+000 | 488 | 488 | | |
| මිරිස්වත්ත හංදිය | | | | 54 | 39, 503, 778.23 |
| මුල්ලේරියාව කොස්වත්ත මාර්ගය | 0+000 - 0+220 | 10 | 10 | | |
| නිට්ටඹුව නගර සංවර්ධනය | | | | 09 | 25, 791, 900.00 |
| නුගේගොඩ ගුවන් පාලම | නුගේගොඩ නගරය | | 143 | 141 | 118,157,118.60 |
| නුගේගොඩ ගුවන් පාලම-අත්තිඩිය | | | | | 31, 148, 525.58 |
| ඔරුගොඩවත්ත-අඹතලේ මාර්ගය | 12+000 – 11+880, 6+840 –7+620 | 917 | | | |
| පලාවි-කල්පිටිය | 6 – 14 | 193 | 193 | | |
| පලාවි-කල්පිටිය | 14 – 18 | 335 | පළකිරීම සඳහා | | |

| ව්‍යාපෘතිය | මාර්ග කොටස | 2 වන වගන්තිය යටතේ නිවේදනය පළ කිරීම (කොටස්) | 38(a) වගන්තිය යටතේ නිවේදනය පළ කිරීම (කොටස්) | නිමකළ අත්පත් කර ගැනීම් කොටස් (2011 තුළ) | වන්දි මගයෙන් ගෙවන ලද මුදල (රු:) |
|---|---|---|---|---|---|
| පෑලියගොඩ-පුත්තලම මාර්ගය | | | | 253 | 3, 520, 411.31 |
| පේරාදෙණිය-බදුල්ල | 130+700 – 279+600 | 3, 264 | | | |
| පේරාදෙණිය-ගම්පොළ | | | | | 1, 501, 773.97 |
| පේරාදෙණිය-ගම්පොළ | | | | | 415, 950.44 |
| පිටකෝට්ටේ-තලවතුගොඩ | | | | 25 | 155, 000.00 |
| තල්දූව-මීවිටිගම්මන මාර්ගය | | | | 52 | 9, 592, 752.62 |
| තවලතැන්න-තලවකැලේ | | | | | 1, 476, 000.00 |
| තිහාරිය-වරපලාන | | | | 14 | 741, 881.00 |
| ඩබ්.ඒ. සිල්වා මාවත | | 114 | 114 | 86 | 5, 199, 500.00 |

තවද මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකක විසින් ක්‍රියාත්මක කරන ලද විවිධ ව්‍යාපෘතිවලට සම්බන්ධ ප්‍රතිස්ථාපන ක්‍රියාකාරී සැලසුම්වලට අවශ්‍ය උපදෙස් ලබාදී ආවේක්ෂණය කරන ලදි. මාර්ග සංවර්ධන අධිකාරියට අවශ්‍ය සියලුම ඉඩම් සඳහා මධ්‍යම දත්ත ගබඩාව හා අන්‍ය ඉඩම් අත්පත් කර ගැනීමේ තොරතුරු පද්ධතිය (LAIS) පිහිටුවීමෙන් ව්‍යා. සැ. තො. ප. හා ඒකාබද්ධ කිරීම වැලකිණි.

## 4.7 පාරිසරික හා සමාජ ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කිරීම.

2011 වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරියේ පාරිසරික හා සමාජීය ආරක්ෂණ අංශය (ESD) පහත දැක්වෙන පරිදි විවිධ මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා පාරිසරික හා සමාජීය ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කිරීම සඳහා අඛණ්ඩව සහාය දෙන ලදි.

***පාරිසරික මානයන්***

- ආසියානු සංවර්ධන බැංකුව පාරිසරික ප්‍රතිපත්තිය හා ජාතික පාරිසරික පනත යටතේ අවශ්‍ය කෙරෙන පාරිසරික හා සමාජීය ආරක්ෂන අවශ්‍යතා ලඟාකර ගැනීමට ජාතික ආංගික ව්‍යාපෘතියට (NHSP) අවශ්‍ය සහාය ලබාදුනි.
- ජාතික පාරිසරික පනත යටතේ අවශ්‍ය කෙරෙන පාරිසරික ආරක්ෂණ අවශ්‍යතා ලඟාකර ගැනීමට පාරිසරික හා සමාජ සංවර්ධන අංශය, පිටත වටරවුම් ව්‍යාපෘතියට අඛණ්ඩව සහාය දෙන ලදි.
- ජාතික පාරිසරික පනත යටතේ අවශ්‍ය කෙරෙන පාරිසරික ආරක්ෂණ අවශ්‍යතා ලඟාකර ගැනීමට පාරිසරික හා සමාජ සංවර්ධන අංශය, උතුරු මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට අඛණ්ඩව සහාය දෙන ලදි.

- පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතියේ කෙරවලපිටිය අන්තර්තර්මාරුව වෙනස් කිරීම සඳහා පරිපූර්ණ පාරිසරික බලපෑම් ඇගයීම පිළියෙල කර, 2011 දෙසැම්බර් මාසයේදී මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලදි. නිරූපණය ඇතුළුව විෂය ප්‍රචාරණ රැස්වීමක් මධ්‍යම පරිසර අධිකාරියේදී පවත්වන ලද අතර, ව්‍යාපෘතිය සඳහා අනුමැතිය දෙන ලදි.
- පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතියේ කෙරවලපිටය-කඩවත කොටස සඳහා ශක්‍යතා අධ්‍යයන අවධියේදී පාරිසරික බලපෑම් තක්සේරුව යාවත්කාලීන කල අතර ජල තත්ත්වය, වායු තත්ත්වය හා ශබ්දය පිළිබඳ මූලික මිණුම් සිදුකර, ජ.ජා.ස.ආ. වෙත ඉදිරිපත් කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට ලබාදුනි.
- මාර්ග ව්‍යාපෘති සැකසීම් පහසුව යටතේ උපදේශකයන් විසින් පිළියෙල කරන ලද හොරණ-අගුරුවාතොට-අලුත්ගම මාර්ගයේ (B157) ඒකාබද්ධ පාරිසරික තක්සේරුව හා මූ.තෝ.ප. සමාලෝචනය කරන ලදි.
- යෝජිත නුවර-බදුල්ල නව මාර්ගය සඳහා මූ.ක.වි. පිළියෙල කර විෂය ප්‍රමාණ රැස්වීමෙන් පසුව මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලදුව, මධ්‍යම පරිසර අධිකාරිය විසින් ජා.ව.ත.සඳහා යොමු කිරීමේ අනුදේශ නිකුත් කරන ලදි.
- යෝජිත වේයන්ගොඩ ගුවන් පාලම සඳහා සීඝ්‍ර පාරිසරික හා සාමාජීය බලපෑම් තක්සේරුව පිළියෙළ කරන ලදි.
- තැන්නෙකුඹුර-රිකිල්ලගස්කඩ-රාගල මාර්ගය (B413) සඳහා මූ.තෝ.ප. පිළියෙල කරන ලද අතර, මධ්‍යම පරිසර අධිකාරිය සමඟ පවත්වන ලද විෂය ප්‍රමාණ රැස්වීමෙන් පසුව, මධ්‍යම පරිසර අධිකාරිය සඳහා යොමු කිරීමේ අනුදේශ නිකුත් කෙරිණි.
- එක්සත් රාජධානි වානේ පාලම් ව්‍යාපෘතිය යටතේ. පාලම් ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා මූ.තෝ.ප්‍ර./පාරිසරික වාර්තාව පිළියෙල කිරීමේදී ව්‍යාපෘතියට / කොන්ත්‍රාත්කරුට සහාය දෙනු ලැබීය.
- මහව ඇස්පල්ට් තාර මිශ්‍රණ යන්ත්‍රාගාරය (යාන්ත්‍රික අංශය) පවත්වාගෙන යාම සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට අයදුම්පත පළාත්භාර අධ්‍යක්ෂ විසින් පිළියෙල කල අතර, යන්ත්‍රාගාරයේ පාරිසරික හා සාමාජික අනුකූලතාවය ආවේක්ෂණය කිරීමේදී පාරිසරික හා සාමාජීය අංශයට වැඩ කොටසක් භාරගනු ලැබීය.

***සමාජීය මානයන්***

- දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ කාර්ය සාධන කළමනාකරණ පද්ධති වාර්තාව කාර්තුමය වශයෙන් ආසියානු සංවර්ධන බැංකුව වෙත යැවීම අඛණ්ඩව සිදුකරන ලදි.
- පාරිසරික හා සමාජීය අංශය පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතිය කෙරවලපිටිය-කඩවත කොටස පිළිබඳ ප්‍රතිස්ථාපන සැලැස්ම පිළියෙල කර ජ.ජා.සා.අ. වෙත ඉදිරිපත් කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකක වෙත යවනු ලැබීය.

- මාර්ග ව්‍යාපෘති සැකසීම් පහසුව යටතේ ව්‍යාපෘති 6 ක් සඳහා උපදේශකයන් විසින් පිලියෙළ කල ප්‍රතිස්ථාපන සැලසුම් සමාලෝචනය කෙරිණි.
- ආසියානු සංවර්ධන බැංකුවේ ආරක්ෂණ ප්‍රතිපත්තිය හා ජාතික ප්‍රතිපත්ති යටතේ අවශ්‍ය වූ සාමාජීය ආරක්ෂණ අනුකූලතාවන් ලඟාකර ගැනීම සඳහා උතුරු මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට සහාය දීම අරඹනු ලැබීය.
- හම්බන්තොට කේන්ද්‍රීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ බලපෑමට ලක්වූ ප්‍රජාවන් පිළිබඳ සාමාජීය බලපෑම් තක්සේරුව පිළියෙල කෙරිණි.
- පාරිසරික හා සාමාජීය අංශය විසින් ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතියට අයත් යාවත්කාලීන කරන ලද ප්‍ර.සැලසුම් සමාලෝචනය කරන ලදි.

***කළමනාකරණ තොරතුරු පද්ධතිය***

- පෙර වර්ෂයේ මෙන් මෙම වර්ෂයේද පාරිසරික හා සමාජීය අංශයේ කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) විසින් පාරිසරික හා සමාජීය ආරක්ෂණ ලේඛන හා දත්ත ගබඩාව සඳහා අවශ්‍ය ජෛව-භූ හා සාමාජීය තොරතුරු දත්ත එකතු කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබීය.
- මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කරගත් ඉඩම් පිළිබඳ තොරතුරු ගබඩා කර තැබීම සඳහා දත්ත ගබඩාවක් පිළියෙල කරනු ලැබීය. තවද පාරිසරික හා සමාජීය අංශය විසින් දත්ත ගබඩාවට දත්ත ඇතුළු කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්ය මණ්ඩලයට පුහුණුව සපයන ලදි.

## 4.8 සැලසුම්කරණය හා වාර්තාකරණය

මාගී සංවර්ධන අධිකාරියේ සැලසුම් අංශය වර්ෂය තුළ පහත දැක්වෙන වාර්තා පිළියෙල කර ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබීය.

- 2011 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම අයවැය ප්‍රතිපාදන මත පදනම්ව පිළියෙල කරනු ලැබුනි.
- 2010 වර්ෂය සඳහා මාගී සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව
- සියලුම ප්‍රගති වාර්තා (මාසික හා කාර්තුමය) අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබීය.
- මාගී සංවර්ධන අධිකාරියේ කාර්ය සාධන වාර්තාව මහ බැංකුව වෙත ඉදිරිපත් කරන ලදි.
- අවශ්‍ය කරන අවස්ථාවලදි, ඉටුකෙරෙමින් පවතින හා එකඟ වූ ව්‍යාපෘති පිළිබඳ ලැයිස්තුව භූ.තො.ප. සිතියම්ද සමඟ පිළියෙල කර කළමනාකාරිත්වයට ඉදිරිපත් කරනු ලැබීය.
- ඉටුකෙරෙමින් පවතින හා එකඟ වූ ව්‍යාපෘති ද සහිතව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම පිළියෙල කර ඉදිරිපත් කරන ලදි.

වර්ෂයේ අයවැය ප්‍රතිපාදන ප්‍රශස්ත ලෙස උපයෝජනය සහතික කිරීම සඳහා මූල්‍ය රෙගුලාසි (FR 66) ට අනුව මාරු කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය භාණ්ඩාගාරය වෙතින් ලබාගනු ලැබීය.

**පාරිසරික නිශ්කාෂණය ලබා ගැනීම**

සැලසුම් අංශය 2011 වර්ෂය තුළ, විස්තරාත්මක සැලසුම් සම්පාදනය සඳහා පාරිසරික නිශ්කාෂණය ලබා ගැනීමට තැන්නෙකුඹුර-රිකිල්ලගස්කඩ-රාගල මාගීයේ (B413) පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමට සම්බන්ධීකරණයේ යෙදුනි.

**ව්‍යාපෘති යෝජනා පිළියෙල කිරීම**

පහත දැක්වෙන විවිධ අරමුදල් නියෝජිතායතන යටතේ වන ව්‍යාපෘති සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට අවශ්‍ය වූ පරිදි අරමුදල් ප්‍රදාන සඳහා ව්‍යාපෘති යෝජනා හා අයදුම්පත් පිළියෙල කිරීම.

**ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය**

***මූල්‍ය සහාය***

- ශ්‍රී ලංකාවේ ජාතික මහාමාගී කි.මී. 174.56 ක් පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම (කොළඹ-රත්නපුර-වැල්ලවාය-මඩකලපුව මාගීයේ ගොඩගම-රත්නපුර කොටස හා බෙරගල-වැල්ලවාය කොටස (A004) සහ දෙණියාය-මාදම්පේ මාගීය (A017))

***තාක්ෂණික සහාය***

- නාගරික ප්‍රවාහන සැලසුම්කරණය සඳහා දිගුකාලීන විශේෂඥ සහාය
- පාලම් කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම

**ආසියානු සංවර්ධන බැංකු සහාය**

- උතුරු මහාමාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය යටතේ මාර්ග කි.මී.135.55 ක් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම
- මහකොළඹ අගනුවර ප්‍රදේශයේ රථවාහන තදබදය ඉවත් කිරීමේ අවශ්‍යතාවය තක්සේරු කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනය
- උතුරු හා නැගෙනහිර පළාත්වල කි.මී. 300 ක් සම්බන්ධතා මාර්ග පුනරුත්ථාපනය/ඉදිකිරීම
- මාර්ග යටිතල ව්‍යුහ මත කාලගුණ වෙනස්වීම ප්‍රත්‍යස්ථික ඉදිකිරීම

**කුවේට් සහාය**

- ශ්‍රී ලංකාවේ ජාතික මහාමාර්ග ජාලයේ දුබල පාලම් 25 ක් යළි ඉදිකිරීම.

**සවුදි සහාය**

- ශ්‍රී ලංකාවේ ජාතික මහාමාර්ග කි.මී.330 ක් පුනරුත්ථාපනය වැඩි දියුණු කිරීම

**ප්‍රංශ සහාය**

- ජාතික මහාමාර්ග ජාලයට අයත් පාලම් පුළුල් කිරීම හා යළි ඉදිකිරීම

**චීන සහාය**

- ජාතික මහාමාර්ග කි.මී. 752.31 ක් සහ පළාත් මාර්ග කි.මී. 226.61 පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම.

**ආ.සං.ස.අ. සහාය**

- පුත්තලම-ත්‍රිකුණාමලය (A012) මාර්ගයේ අනුරාධපුරය සිට ත්‍රිකුණාමලය දක්වා වැඩි දියුණු කිරීම
- හොරණ-අඟුරුවාතොට-අළුත්ගම මාර්ගයේ (B157) හොරණ සිට මතුගම දක්වා වැඩි දියුණු කිරීම
- පේරාදෙණිය-බදුල්ල-චෙංකලඩි මාර්ගය (A005) බදුල්ල සිට චෙංකලඩි දක්වා වැඩි දියුණු කිරීම

**විදේශ අරමුදල් ප්‍රදාන සඳහා සංකල්ප පත්‍රිකා පිළියෙල කිරීම**

මාර්ග සංවර්ධන අධිකාරිය පහත සඳහන් ව්‍යාපෘති සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවට සංකල්ප පත්‍රිකා ඉදිරිපත් කරන ලදි.

- පෑලියගොඩ-පුත්තලම මාර්ගයේ (A003) කොච්චිකඩේ පාලම (පාලම් අංක 38/3) යළි ඉදිකිරීම.
- ජාතික මහාමාර්ග ජාලයට අයත් දුබල පාලම් 20 ක් යළි ඉදිකිරීම / වැඩි දියුණු කිරීම.
- මහකොළඹ නාගරික ප්‍රදේශයේ රථවාහන තදබදය ඉවත් කිරීමේ අවශ්‍යතාවය තක්සේරු කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනය
- පාලම් කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සහාය.
- මාර්ග කි.මී. 312.32 පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම.
- ශ්‍රී ලංකා ප්‍රාදේශීය පාලම් ව්‍යාපෘතිය - අදියර II
- ජාතික මහාමාර්ගවල කි.මී. 97.85 ක් පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම.
- කො.ගා.හ.වැ.මාර්ගයේ (A2) පාලම් අංක 20/1 දිගරොල්ල පාලම යළි ඉදිකිරීම
- කඩුවෙල-බියගම (AB004) මාර්ගයේ 1/1 පාලමට සමාන්තර පාලමක් ඉදිකිරීම
- කොල්ලුපිටිය-ශ්‍රී ජයවර්ධනපුර (A000) මාර්ගයේ අංක 6/2 පොල්දූව හංදිය අසල පාලම යළි ඉදිකිරීම
- කොළඹ-මහනුවර මාර්ගයේ (A001) දෙවැනි නව කැලණි පාලම ශක්‍යතා අධ්‍යයනය හා විස්තරාත්මක සැලසුම
- බිබිලේ-පිටකුඹුර-නාමල්ඔය-ඉඟිනියාගල (B527) මාර්ගය පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම
- මනම්පිටිය-අරලගන්විල-මාදුරුඔය මාර්ගයේ (B502) කි.මී. 3+000 සිට 32+087 දක්වා පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම.
- නැගෙනහිර පළාතේ ජාතික මහාමාර්ග කි.මී. 23.69 පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම.
- අම්පාර-උහන-මහඔය මාර්ගය (A027) පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම.

**ශක්‍යතා අධ්‍යයනයන්.**

2011 වර්ෂය තුළ පහත දැක්වෙන ශක්‍යතා අධ්‍යනයන් සිදු කරන ලදි.

- සවුදි අරමුදලේ හා ජා.ස.බ.අ. OFID ආයතනයේ සම මූල්‍ය දායකත්වය යටතේ ජාතික මහාමාර්ග කි.මී. 202 ක් වැඩි දියුණු කිරීම පහත දැක්වේ.
  - සවුදි අරමුදල් යොදන මාර්ග ලැයිස්තුව
    - ✓ තම්පලකාමම්-කින්නියා මාර්ගය (B541) – කි.මී. 8.50
    - ✓ කටුගස්තොට-කුරුණෑගල-පුත්තලම් මාර්ගය (A010) – කි.මී. 25.60
    - ✓ කොළඹ-මහනුවර මාර්ගය (A001) – කි.මී. 7.24
    - ✓ දෙහිඕවිට-දැරණියගල-නූරි මාර්ගය (B093) – කි.මී. 14.00
    - ✓ නුවර-යාපනය මාර්ගයේ (A009) කටුගස්තොට-අලවතුගොඩ කොටස කි.මී. 10.97
    - ✓ නුවර-යාපනය මාර්ගයේ(A009) අලවතුගොඩ-පලාපත්වල කොටස කි.මී. 16.97
    - ✓ නුවර-යාපනය මාර්ගයේ (A009) පලාවත්වල-නාවුල කොටස කි.මී. 21.64
    - ✓ නුවර-යාපනය මාර්ගයේ (A009) නාවුල-දඹුල්ල කොටස කි.මී. 18.82
    - ✓ වේයන්ගොඩ-රුවන්වැල්ල මාර්ගයේ (B445) කි.මී.14.65
  - ඔපෙක් අරමුදල් සැපයුම සඳහා මාර්ග ලැයිස්තුව
    - ✓ පේරාදෙණිය-බදුල්ල-චෙන්කලඩි මාර්ගයේ (A005) කි.මී. 2.78
    - ✓ පොල්ගහවෙල-කෑගල්ල මාර්ගයේ (A019) කි.මී. 11.70
    - ✓ පාලම් අංක 3/2 නැවත ඉදිකිරීම (A019) – කි.මී. 0.12
    - ✓ බෙංගමුව-මොලොක්ගමුව-ගල්දොල මාර්ගයේ (B607) කි.මී. 9.50
    - ✓ නාරාහේන්පිට-නාවල-නුගේගොඩ මාර්ගයේ (B307) කි.මී. 3.22
    - ✓ ඇතුල්කෝට්-මිරිහාන-කොහුවල මාර්ගයේ (B120) කි.මී. 5.95
    - ✓ ඇහැළියගොඩ-දෙහිඕවිට මාර්ගයේ (B110) කි.මී. 16.69
    - ✓ ගාල්ල-දෙනියාය-මාදම්පේ මාර්ගයේ (A017) කි.මී. 13.93
- මුලතිව්-ඉයක්කච්චි මාර්ගයේ සහ උතුරු නැගෙනහිර වෙරළබඩ තීරයේ ප්‍රධාන පාලම් 08ක් ඉදිකිරීම.
- අරාබි ආර්ථික සංවර්ධනය වෙනුවෙන් කුවේට් අරමුදල යටතේ, ජාතික මහාමාර්ගවල පහත දැක්වෙන පාලම් 25 නැවත ඉදිකිරීම.
  - ✓ කොළඹ-ගාල්ල-හම්බන්තොට-වැල්ලවාය මාර්ගයේ (AA002) පාලම් අංක 20/1
  - ✓ කොළඹ-ගාල්ල-හම්බන්තොට-වැල්ලවාය මාර්ගයේ (AA002) පාලම් අංක 52/1
  - ✓ කොළඹ-ගාල්ල-හම්බන්තොට-වැල්ලවාය මාර්ගයේ (AA002) පාලම් අංක 53/1
  - ✓ කොළඹ-ගාල්ල-හම්බන්තොට-වැල්ලවාය මාර්ගයේ (AA002) පාලම් අංක 133/2
  - ✓ කොළඹ-ගාල්ල-හම්බන්තොට-වැල්ලවාය මාර්ගයේ (AA002) පාලම් අංක 148/1

- ✓ කටුගස්තොට-කුරුණෑගල-පුත්තලම මාර්ගයේ (AA010) පාලම් අංක 75/1
- ✓ කටුගස්තොට-කුරුණෑගල-පුත්තලම මාර්ගයේ (AA010) පාලම් අංක 76/1
- ✓ කෑගල්ල-බුලත්කොහුපිටිය-කරවනැල්ල මාර්ගයේ (AA021) පාලම් අංක 11/4
- ✓ කඩුවෙල-බියගම මාර්ගයේ (AB004) පාලම් අංක. 1/1
- ✓ යාපනය-පොන්නලායි-පේදුරුතුඩුව මාර්ගයේ (AB021) පාලම් අංක 8/2
- ✓ අම්පිලාන්තුරෙයි-වීරමුනෙයි මාර්ගයේ (B018) පාලම් අංක 10/2
- ✓ ආනමඩුව-උස්වැව-ගල්ගමුව මාර්ගයේ (B019) පාලම් අංක 10/3
- ✓ දික්වැල්ල-බෙලිඅත්ත මාර්ගයේ (B101) පාලම් අංක 11/1
- ✓ ගලගෙදර-හොරණ මාර්ගයේ (B123) පාලම් අංක 14/3
- ✓ ගලගෙදර-හොරණ මාර්ගයේ (B123) පාලම් අංක 14/8
- ✓ කලුඅග්ගල-ලබුගම මාර්ගයේ (B188) පාලම් අංක. 4/2
- ✓ කලුඅග්ගල-ලබුගම මාර්ගයේ (B188) පාලම් අංක. 12/8
- ✓ මාරවිල-උඩුබද්දාව මාර්ගයේ (B272) පාලම් අංක. 15/2
- ✓ මාවනැල්ල-හෙම්මාතගම-සිංහපිටිය මාර්ගයේ (B279) පාලම් අංක. 17/1
- ✓ තුඩැල්ල-පමුණුගම-තලාහේන-මීගමුව මාර්ගයේ (B425) පාලම් අංක. 2/2
- ✓ වේයන්ගොඩ-රුවන්වැල්ල මාර්ගයේ (B445) පාලම් අංක. 32/1
- ✓ ඇඹිලිපිටිය-මිද්දෙනිය මාර්ගයේ (B486) පාලම් අංක. 4/3
- ✓ බත්තුලුඔය-උඩප්පුව-ආඬිමුනායි මාර්ගයේ (B614) පාලම් අංක. 3/6
- ✓ නාවක්කුලි-කාරතිව්-මන්නාරම මාර්ගයේ (AA032) පාලම් අංක. 59+610
- ✓ නාවක්කුලි-කාරතිව්-මන්නාරම මාර්ගයේ (AA032) පාලම් අංක. 33+540

**අධිප්‍රමාණ / අධිබර වාහන සඳහා විශේෂ බලපත්‍ර නිකුත් කිරීම**

- අධි ප්‍රමාණික බඩු ප්‍රවාහනය සඳහා අයදුම්පත් ඇගයීම් කර, අවසර ලිපි 5 ක් නිකුත් කරන ලදි.
- අධි ප්‍රමාණික වාහන පනස් පහක් ලියා පදිංචිය සඳහා නිර්දේශ නිකුත් කරන ලදි.
- වර්ෂය තුළ අවශ්‍ය අවස්ථාවල ජාතික මහාමාර්ගවල ධාවනය කිරීමට ජංගම දොඹකර අටක් සඳහා අනුමැතීන් පහක් නිකුත් කරන ලදි.

**විදේශ දූත කණ්ඩායම් සමඟ ව්‍යාපෘති සැකසුම් කටයුතු සම්බන්ධීකරණය කිරීම.**

මාර්ග සංවර්ධන අධිකාරිය පහත සඳහන් යෝජිත ව්‍යාපෘතිවල ව්‍යාපෘති සැකසීමේ කටයුතු සඳහා විදේශ දූත කණ්ඩායම්වලට අවශ්‍ය සහාය ලබාදුන් අතර, ඔවුන්ගේ කටයුතු සාර්ථකව නිම කිරීමට සමීප සම්බන්ධීකරණයන් පවත්වාගෙන යනු ලැබීය.

- ජාතික මහාමාර්ග කි.මී. 330 ක් පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම සඳහා සවුදි දූත කණ්ඩායමට
- නැගෙනහිර පළාතේ පාලම් සම්බන්ධව ජ.ජා.ස.නි.යට.

- නැගෙනහිර පළාතේ මන්මුනායි මඩකලපු කලපුව හරහා පාලමක් ඉදිකිරීම සඳහා ජ.ජා.ස.නි.යට.
- පාලම් නඩත්තු ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ මූලික අධ්‍යයනය සඳහා ජ.ජා.ස.නි.යට.
- කොළඹ නාගරික ප්‍රදේශය හා තදාසන්න ප්‍රදේශයේ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය ජ.ජා.ස.නි. විසින් පිළියෙල කිරීමේ මෙහෙවරට සම්බන්ධ කටයුතු.

.

**බාහිර ආයතන විසින් සිදුකරන ලද වැඩ සම්බන්ධ අධ්‍යයන හා පර්යේෂණ**

මා.සං.අ.යේ සැලසුම් අංශය විසින් බාහිර සම්පත්කරණය කරන ලද අධ්‍යයන හා පර්යේෂණ කටයුතු පිළිබඳව පහත දැක්වෙන කාර්යයන් සිදුකරන ලදි.

- පේරාදෙණිය විශ්ව විද්‍යාලය සමඟ සහයෝගිව මොරටුව විශ්ව විද්‍යාලය වෙත පවරනු ලැබූ මහනුවර නගර ප්‍රවාහනය පිළිබඳ අධ්‍යයනය, ශක්‍යතා අධ්‍යයන වැඩ වලට සම්බන්ධව, වැඩබිම් චාරිකා ඇගයීම් ආදි රැස්වීම්වලට සම්බන්ධවීම.
- මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය වෙත පවරන ලද මහනුවර-මහියංගන මාර්ගයේ රථවාහන හැරවීම සඳහා උමං මාර්ගයට සම්බන්ධ කටයුතු.
- මොරටුව විශ්ව විද්‍යාලයට පවරණ ලද කොළඹ නාගරික ප්‍රදේශය සඳහා ප්‍රවාහන දත්ත ගබඩාව සහ විශ්ලේෂණය ස්ථාපිත කිරීමට සම්බන්ධ කටයුතු.
- මොරටුව විශ්ව විද්‍යාලයට පවරණ ලද, යෝජිත අධිවේගී මාර්ග ජාලයට පාදෙණිය සම්බන්ධ කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයට සම්බන්ධ රැස්වීම්, වැඩබිම් චාරිකා, ඇගයීම් ආදි කටයුතු.

**භූ තොරතුරු පද්ධති සිතියම් පිළියෙල කිරීම.**

2011 වර්ෂය තුල ව්‍යාපෘති යෝජනා, අරමුදල් අයදුම්පත්, වාර්ෂික වාර්තා, සඳහා ස්ථානීය සිතියම් 200 ක් හා විස්තරාත්මක සිතියම්ද සැලසුම් අංශයේ ජාතික මාර්ග ජාල මෙන්ම වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකක හා මාර්ග සංවර්ධන අධිකාරිය වෙනත් අංශ හා බාහිර ආයතනවලට අදාළ වාර්තාද භූ.තො.ප. ඒකකය විසින් පිළියෙල කරන ලදි. ඉහත සඳහන් කටයුතුවලට අමතරව භූ.තො.ප.ඒකකය විසින් නව මාර්ග හා පාලම් සැලසුම් කිරීම සඳහා භූ.ස්.වි. හා ගූගල් දසුන් යොදා ගනිමින් නව ස්ථානීය සිතියම් පිළියෙල කරන ලදි.

**වෙනත් වැඩ කටයුතු**

– ජ.ජා.ස.නි. සමඟ සහයෝගිව පාලම් ඇගයීම පිළිබඳ "මා.සං.අ. ඉංජිනේරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය" පිළිබඳ සම්මන්ත්‍රණයක් පවත්වනු ලැබීය.

– දක්ෂිණ අධිවේගී මාර්ගයේ මෙහෙයුම් ඇරඹීමට පෙර ආරක්ෂාව හා රථවාහන කළමනාකරණය පිළිබඳව සාකච්ඡා කිරීමට මහජනයා දැනුවත් කිරීමේ වැඩ සටහන් අරඹන ලදි.

- ප්‍රවාහනයට සම්බන්ධ ඉන්ධන පරිභෝජනය නිර්ණය කර ගැනීම සඳහා විධායක ඉංජිනේරුවරුන්ගේ සහාය ඇතිව දිවයින පුරා ඉන්ධන පරිභෝජනය පිළිබඳ සමීක්ෂණයක් පැවැත්විනි.
- අකුරේගොඩ සංවර්ධනය සඳහා මාර්ග තෝරා ගැනීම හා සැලසුම් කිරීමේදි (ආරක්ෂක මූලස්ථානය මෙම ස්ථානයේ ප්‍රතිස්ථානගත කිරීම හේතුවෙන්)
- හම්බන්තොට ජාත්‍යන්තර කේන්ද්‍රීය සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතුවලට සම්බන්ධිත කටයුතු.
- මහනුවර සැලසුම් කාර්යාලය සමඟ සහයෝගීව හම්බන්තොට කේන්ද්‍ර සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ විඩියෝව නිෂ්පාදනය.
- දක්ෂිණ අධිවේගි මාර්ගයේ භාවිත ගාස්තු අනුපාත නියම කිරීමේදි භාවිත ගාස්තු එකතු කිරීම සඳහා සුදුසු ක්‍රමයක් තේරීමට තාක්ෂණික සහාය ලබාදිම.
- දක්ෂිණ අධිවේගි මාර්ගය පිළිබඳව රූපවාහිනිය, ගුවන් විදුලිය, පුවත්පත්, පුස්තිකා මගින් දැනුවත් කිරීමේ වැඩ සටහන් සූදානම් කිරීම.

## 4.9 ශ්‍රී ලංකාව තුළ පුනරුත්ථාපන මාදිලියන් සංවර්ධනය කිරීම හා භාවිතයේ යෙදිම.

මාර්ග සංවර්ධන අධිකාරියයේ සැලසුම් අංශය විසින්, ජ.ජා.ස.නි. තාක්ෂණික සහාවෙන් ජාතික මහාමාර්ග ජාලයේ අනාගත රථවාහන ඉල්ලුම පුරෝකථනය කිරීම සඳහා මාදිලියක් වර්ධනය කිරීමට මූලිකත්වය ගන්නා ලදි. මෙම ඉල්ලුම පුරෝකථනදාමය මගින් ශ්‍රී ලංකාවේ A හා B පන්තියේ මාර්ග සහ අධිවේගි මාර්ග සම්පූර්ණයෙන් ආවරණය වේ.

මෙම පද්ධතියේ ප්‍රධාන ලක්ෂණ පහත සාරාංශයෙන් දැක්වේ.

| | |
|---|---|
| අ) වර්තමාන මාර්ග ජාලය: | ශ්‍රී ලංකාව පුරා ඒ, ඒ හා බී හා බී පංතියේ ජාතික මහමාර්ග ජාලය (ආසන්නතම සම්බන්ධතා 2300 කි) |
| ආ) කලාප : | කලාප 314 කි (ප්‍රා.ලේ.කො. මායිම්) |
| ඇ) වාහන වර්ගය : | සියලුම වර්ගවල වාහන එක් වර්ගයක් ලෙස දිස්වේ. (ම.කා.ඒ. පදනම මත) |
| ඈ) වර්තමාන මු.ග. දිස්ත්‍රික්ක | 2007 ප්‍රධාන සැලැස්මේ විස්තර වන පරිදි දිස්ත්‍රික් පදනම මෙහෙයුම් (මු.ග.) මූලික ගමන් ස්ථානය මු.ග. භාවිතා කරමින් තක්සේරු කරන ලද අතර, නියැඳි මු.ග. සම්මුඛ පරික්ෂණ සමීක්ෂණය 2010 ජනවාරියේදි ක්‍රියාත්මක කරන ලදි. |
| ඉ) පැවරුම් ක්‍රමය : | භාවිතකරු තුලිත පැවරුම් ක්‍රමය |
| ඊ) ප්‍රක්ෂේපනය කරන ලද වර්ෂය : | 2012, 2017, 2022, 2027 හා 2032 |

## 4.10 දත්ත රැස්කිරීම හා ඇගයීම

**(i) මහාමාර්ග සංවර්ධන හා කළමනාකරණ (HDM – 4) හා මාර්ග තොරතුරු පද්ධතිය (RIS) යටතේ ඉටුකරන ලද වැඩ කටයුතු.**

- ✓ පළාත් කාර්යාල විසින්, කි.මී. 8, 874.70 ක වාර්ෂික මාර්ග තත්ත්ව දත්ත රැස්කරන ලද අතර බහු කාර්ය ජාල සමීක්ෂණ වාහනය භාවිතා කරමින් කි.මී. 2,739.38 ක දත්ත රැස්කරනු ලැබීය.
- ✓ මධ්‍ය ජාලය මෙන්ම මා.ආ.ස.ව්‍යා.-1 සඳහා දත්ත රැස්කිරීම හා ආවේක්ෂණ ඇගයීම් / නිමි නිමැවුම් 2010 පිළිබඳ වාර්තාව ලෝක බැංකුව වෙත ඉදිරිපත් කරන ලදි.

පහත දැක්වෙන ශක්‍යතා අධ්‍යයනයන් සඳහා මා.සං.අ. (HDM4) භාවිතා කරමින් ආර්ථික විශ්ලේෂණ සිදුකරන ලදි.

අ) අඹේපුස්ස-කුරුණෑගල-ත්‍රිකුණාමලය (A006) මාර්ගය
- ✓ අඹේපුස්ස සිට දඹුල්ල කොටස
- ✓ කන්තලේ සිට ත්‍රිකුණාමලය කොටස

ආ) සවුදි අරමුදල් සභාය යටතේ ව්‍යාපෘති
- ✓ බේස්ලයින් ව්‍යාපෘතිය
- ✓ නාරාහේන්පිට-නාවල-නුගේගොඩ (B307) මාර්ගය

මා.සං.ක.4 (HDM 4) ට සම්බන්ධ අනෙකුත් වැඩ

අ) නඩත්තු වැඩ සටහන පිළියෙල කිරීමට අධ්‍යක්ෂ නඩත්තුට සභාය දෙන ලදි.

ආ) වත්කම් කළමනාකරණ උපදේශක (දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය) සමඟ වැඩ කිරීමට අගෝස්තු මස සිට මාස 06 ක කාලයක් සඳහා ඉංජිනේරුවන් 02 කු තාවකාලිකව ස්ථාන මාරු කරන ලදි.

**(ii) බ.කා.ජා.ස.රා. MFNSV සහ ප.බ.උ.මා. FWD සමීක්ෂණය කිරීම**

ලෝක බැංකු අරමුදල් යොදා මා.සං.අ. ව්‍යාපෘතිය (RSAP) යටතේ බහුකාර්ය ජාල සමීක්ෂණ රථය (MFNSV) හා පතිත බර උත්ක්‍රමණ මාපකය (FWD) යන යන්ත්‍ර 2 සැලසුම් අංගය විසින් ලබාගෙන ජාල මට්ටමින් හා ව්‍යාපෘති මට්ටමින් දත්ත රැස් කිරීම සඳහා භාවිතා කෙරිණි.

*වගු අංක 25: සමීක්ෂණ යන්ත්‍ර මගින් ඉටුකරන ලද ප්‍රගතිය*

| | බ.කා.ජා.ස.ර. (MFNSV) සමීක්ෂණය / ජාලය (කි.මී.) | ප.බ.උ.මා. (FWD) සමීක්ෂණය / ජාලය (කි.මී.) |
|---|---|---|
| ජාතික මාර්ග | 2, 739.38 | 1, 063.60 |
| ව්‍යාපෘති ඉල්ලීම් | 1, 193.40 | 388.60 |

**(iii) බ.කා.ජා.ස.රා. MFNSV සහ ප.බ.උ.මා. FWD දත්ත සැකසීම හා විශ්ලේෂණය**

බ.කා.ජා.ස.ර. (MFNSV) විසින් රැස්කරන ලද දත්ත අදාළ ජාල තත්ත්ව පරාස මානයන් ලබා ගැනීම සඳහා පරෙස්සමින් විශ්ලේෂණයට භාජනය කරන ලදි. සැලසුම් අංශය තුළ රැස්කල දත්ත සැකසීම, ගබඩා කිරීම හා කළමනාකරණය සඳහා වෙනම ඒකකයක් පිහිටුවීම අවශ්‍යවී ඇත.

පවත්නා සීමිත සම්පත් සමඟ, සැලසුම් අංශයේ පහත දැක්වෙන කටයුතු භාර ගන්නා ලදි.

1- ශක්‍යතා අධ්‍යයන මට්ටමේ ව්‍යාපෘති සඳහා දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය
2- සැලසම් මට්ටම සඳහා දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය
3- ඉදිකිරීම් ලේඛනවල විස්තර සඳහන් පිරිවිතර සමීක්ෂණ සඳහා දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය
4- වත්කම් කළමනාකරණ මට්ටම සඳහා දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය

පහත දැක්වෙන මාර්ග ව්‍යාපෘති සඳහා ප.බ.උ. (FWD) දත්ත විශලේෂණ වාර්තා පිළියෙල කරන ලදි.

- අඹේපුස්ස-කුරුණෑගල-ත්‍රිකුණාමලය (A006) කන්තලේ-ත්‍රිකුණාමලය-අඹේපුස්ස-දඹුල්ල හා දඹුල්ල-හබරණ මාර්ග කොටස්
- අනුරාධපුර-පාදෙනිය මාර්ගය (A028)
- යාපනය-ජේදුරුතුඩුව මාර්ගය ( AB020)

පහත දැක්වෙන මාර්ග සඳහා බ.කා.ජා.ස.ර.(MFNSV) දත්ත විශලේෂණ වාර්තා පිළියෙල කරන ලදි.

- අවිස්සාවේල්ල-හැටන්-නුවරඑළිය මාර්ගය (A007)
- කොළඹ-රත්නපුර-වැල්ලවාය-මඩකලපුම මාර්ගයේ (A004) කි.මී. 29 සිට 101 දක්වා
- උඩවලව-තණමල්විල මාර්ගය (B427)
- අඹේපුස්ස-කුරුණෑගල-ත්‍රිකුණාමලය මාර්ගය (A006)
- බේස්ලයින් මාර්ගය
- නාරාහේන්පිට-නාවල-නුගේගොඩ මාර්ගය (B307)
- අඹේපුස්ස-කුරුණෑගල-ත්‍රිකුණාමලය මාර්ගය (A006)

(සම්පූර්ණ මාර්ගවල දසුන් උපුටා ගැනීම, ඉන්ධනහල්, රෝහල්, පොලිස් ස්ථාන උපුටා ගැනීම ගෝ.ඒ.ප. GPS ඛණ්ඩාංක මගිනි)

### (iv) දක්ෂිණ මහාමාර්ගය පිළිබඳ සමීක්ෂණය

ව්‍යාපෘති අධ්‍යක්ෂ (ද.ප්‍ර.සං.ව්‍යා.) වරයාගේ ඉල්ලීම මත පිරිවිතර පරීක්ෂාව සඳහා බ.කා.ජා.ස.ර. හා ප.බ.උ. සමීක්ෂණ පහත දැක්වෙන දිනවලදී පවත්වන ලදි.

***වගු අංක 26:*** බ.කා.ජා.ස.ර. සමීක්ෂණය

| **සමීක්ෂණ දිනය** | **සමීක්ෂණය කළ කොටස** | | **සමීක්ෂණයේ දිග ප්‍රමාණය (මංතීරු කි.මී.)** |
|---|---|---|---|
| | **සිට** | **දක්වා** | |
| 06-07-2011 | දොඩංගොඩ | කුරුඳුගහහැතැක්ම | 64 |
| 06-07-2011 | කුරුඳුගහහැතැක්ම | පින්නදූව | 116 |
| 07-08-2011 | මාකුඹුර | දොඩංගොඩ | 132 |
| 22-09-2011 | මාකුඹුර | කලුගඟ පාලම | 96 |
| 25-10-2011 | ගාල්ල වරාය පිවිසුම් මාර්ගය | | 12 |
| 06-11-2011 | දොඩංගොඩ | කුරුඳුගහහැතැක්ම | 132 |
| **සම්පූර්ණ දිග** | | | **552** |




ද.ප්‍ර.සං.ව්‍යා. -බ.කා.ජා.ස.ර. සමීක්ෂණය

***<u>වත්කම් කළමනාකරණය සඳහා සිදුකරන ලද සමීක්ෂණ</u>***

අ) මාර්ග සංඥා හා මාර්ග සලකුණු භාණ්ඩ ලේඛනගත කිරීම සඳහා ද.ප්‍ර.සං.ව්‍යා.යේ සම්පූර්ණ දුර දෙදිසාවම සඳහා මංතීරු කි.මී. 190 වෙනම බ.කා.ජා.ස.ර. සමීක්ෂණයක් සිදුකරන ලදි.

ආ) පිටත මංතීරුවල දෙදිසාවටම මී 100 ක් පාසාම ප.බ.උ FWD සමීක්ෂණයක් පවත්වන ලදි.

ඉහත සමීක්ෂණ දෙකම ද.ප්‍ර.සං.ව්‍යා. වත්කම් කළමනාකරණ උපදේශක (ද.ප්‍ර.සං.ව්‍යා.) ව්‍යාපෘති අධ්‍යක්ෂ (ද.ප්‍ර.සං.ව්‍යා.)මගින් කරන ලද ඉල්ලීම අනුව සිදු කෙරිණි.



ද.ප්‍ර.සං.වයා. ප.බ.උ. FWD සමීක්ෂණය

**(v) පළමු වර්ෂයේ වගකීම් කාලසීමාවට පසුව බ.කා.ජා.ස.රා. (MFNSV) හා ප.බ.උ. (FWD) අංකශෝධක අළුත්වැඩියා සහ නඩත්තු වැඩ සටහන.**

කොන්ත්‍රාත් ගිවිසුම අනුව මා.සං.අ. එකඟවූ පරිදි සැපයුම්කරු විසින් යන්ත්‍රය නඩත්තුව හා අළුත්වැඩියාව සිදුකළ යුතුය. ඒ අනුව පහත සඳහන් වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරන ලදි.

සමාගම් දෙකෙන් විශේෂඥයන් ලංකාවට පැමිණ අපගේ කාර්ය මණ්ඩලය සමඟ යන්ත්‍ර දෙකේ අංකශෝධනය නඩත්තු හා අළුත්වැඩියා කටයුතු සිදුකරනු ලැබිය.

*වගු අංක 27:* **බ.කා.ජා.ස.රා. (MFNSV) සමීක්ෂණය**

| යන්ත්‍රයේ නම | විශේෂඥයාගේ නම | සමාගමේ නම | සංචාරයේ කාල සීමාව | |
|---|---|---|---|---|
| | | | සිට | දක්වා |
| **බ.කා.ජා.ස.ර. (MFNSV)** | වියෙට් පම් මහතා | සි/ස. ARRB ගෲප් සමාගම, ඕස්ට්‍රේලියාව | 2011 නොවැ. 21 | 2011 නොවැ. 25 |
| **ප.බ.උ. (FWD)** | ආචාර්ය ඔලේ තෝලන් | KUAB සමාගම, ස්විඩනය | 2011 මාර්තු 21 | 2011 මාර්තු 25 |
| | අඤසින් ලොටිෆී මහතා | KUAB සමාගම, ස්විඩනය | 2011 අගෝ. 03 | 2011 අගෝස්ත 11 |
| | ආචාර්ය ඔලේ තෝලන් | KUAB සමාගම, ස්විඩනය | 2011 දෙසැ. 20 | 2011 දෙසැ. 22 |

## 4.11 රථවාහන දත්ත රැස් කිරීම.

සැලසුම් අංශයේ දත්ත රැස් කිරීමේ හා ඇගයීමේ අංශය විසින් 2011 වර්ෂය තුළ පහත දැක්වෙන කටයුතු ඉටුකරන ලදි.

### i. රථවාහන සමීක්ෂණ :

ඒකකයේ දෛනික කටයුත්තක් වශයෙන් ජාතික මහාමාර්ග ජාලයේ තෝරාගත් ස්ථානවල වාරික රථවාහන සංගණනය හා හැරවුම් චලන සමීක්ෂණ පවත්වනු ලැබිය. මෙයට අමතරව, සැලසුම් සඳහා රථවාහන දත්ත ඉල්ලා සිටි වෙනත් ස්ථානවලද රථවාහන සමීක්ෂණ පැවැත්විණි.

#### අ) වාරික රථවාහන සංගණන වැඩ සටහන :

- ස්ථාන 101 ක ප්‍රමාණ ගණනයන් (ADT)
- ස්ථාන 87 කදි මනු වර්ගීකරණ ගණනයන්
- සෑම මසකම පෑලියගොඩ-පුත්තලම මාර්ගයේ (AA003) 27 වැනි කි.මී.යේ වාර්ෂික සාමාන්‍ය දෛනික රථවාහන සමීක්ෂණය පැවැත්වූ අතර, රථවාහන විචලයයන් ආවේක්ෂණය කරන ලදි. (AADT)

#### ආ) හැරවුම් චලන සමීක්ෂණය

රථවාහන චලිතයන් අධ්‍යයනය හා සැලසුම් සඳහා බස්නාහිර, උතුරු හා නැගෙනහිර පළාත්වල අන්තර් ඡේදන ස්ථාන 10 ක හැරවුම් චලන සමීක්ෂණ පවත්වනු ලැබිය.

### ii. ඇක්සල් බර සමීක්ෂණ හා රළුකම් මනු සමීක්ෂණ.

ඇක්සල් බර සමීක්ෂණය යම් මාර්ගයක රථවාහන පිළිබඳව සම්මත ඇක්සල් බර දත්ත පිළිබඳ තක්සේරුවක් සපයන අතර, එය මාර්ග ඇතුරුම් ව්‍යුහ සැලසුම සඳහා අත්‍යාවශ්‍ය යෙදුමක් බවට පත්වේ. 2011 වර්ෂය තුළ වාහන හා උපකරණවල සංරෝධක හේතු කොට ගෙන ස්ථාන 7 ක් පමණක් ඇක්සල් බර සමීක්ෂණ පවත්වනු ලැබිණි.

*වගු අංක 28: ඇක්සල් බර සමීක්ෂණ ස්ථාන*

| ***මාර්ගයේ නම*** | ***ස්ථානය*** | ***කාලසීමාව*** |
|---|---|---|
| හොරණ-අඟුරුවාතොට-අලුත්ගම මාර්ගය | 36 වැනි කි.මී. | පැය 12 |
| මහනුවර-යාපනය මාර්ගය | 201 වැනි කි.මී. | පැය 12 |
| මහනුවර-යාපනය මාර්ගය | 106 වැනි කි.මී. | පැය 24 |
| කැලණිය-මුදුන්ගොඩ මාර්ගය | 09 වැනි කි.මී. | පැය 12 |
| මාන්කුලම්-මුලතිව් මාර්ගය | ඔඩ්ඩිසුඩාන් | පැය 12 |
| නාවක්කුලි-කාරතිව්-මන්නාරම මාර්ගය | පූනරීන් | පැය 12 |
| පැලියගොඩ-පුත්තලම මාර්ගය | 36 වැනි කි.මී. | පැය 12 |

**iii. රළුකම් මනු සමීක්ෂණ-**

රළුකම් මැනීම සඳහා සැලසුම් කල මාර්ග කි.මී. 4310 න් 1563.14 ක මිනුම් සිදුකරන ලදි. ස්ථාන 12 ක මර්ලින් අංක ශෝධන පරීක්ෂණ සිදුකරනු ලැබිය.

## 4.12 ජාතික මහාමාර්ග තත්ත්වයට නැංවීම සඳහා මාර්ග පවරා ගැනීම

කි.මී. 95.275 කින් යුක්ත අළුතෙන් ඉදිකරන ලද දක්ෂිණ අධිවේගි මාර්ගය 2011 දි ජාතික මහාමාර්ගයක් ලෙස ප්‍රකාශයට පත්කර අධිවේගි මාර්ගයක් වශයෙන් ගැසට් ගත කරන ලදි.

## 4.13 මාර්ග ආරක්ෂාව හා රථවාහන කළමනාකරණය

**රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම් සැලසුම් කිරීම**

වර්ෂය තුළ පහත දැක්වෙන මාර්ග කොටස්වල රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම් සංශෝධනය කරන ලදි.

- ද.ප්‍ර.සං.ව්‍යා.යේ සලකුණු කිරීම් සමාලෝචනය
- ද.ප්‍ර.සං.ව්‍යා.යේ රථවාහන සංඥා සමාලෝචනය
- අන්තර්මාරුවල රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම් සමාලෝචනය
- පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතියේ රථවාහන සංඥා සමාලෝචනය
- මඩකලපුව-තිරිකොන්ඩියාමඩු-ත්‍රිකුණාමලය මාර්ගයේ (කි.මී. 91+040 සිට 107+380 දක්වා) මාර්ග සලකුණු කිරීම්
- සියඹලාණ්ඩුව-අම්පාර මාර්ගයේ (කි.මී.0 – 57 දක්වා)
- අල්ලෙයි-කන්තලේ මාර්ගය (කි.මී.0+000 සිට 2+330 දක්වා)
- ද.ප්‍ර.සං.ව්‍යා.යේ හැරවුම් මාර්ගයේ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම් සමාලෝචනය

- පේරාදෙණිය-බදුල්ල-චෙන්කලඩි මාර්ගය (කි.මී. 75 සිට 89 දක්වා)
- මහනුවර-මහියංගනය මාර්ගය (කි.මී.45+000 සිට 50+000 දක්වා)
- අල්ලෙයි කන්තලේ මාර්ගය (කි.මී. 0+000 සිට 41+600 දක්වා)
- තිරිකොන්ඩියාමඩු-මන්නාරම මාර්ගය (කි.මී.36+800 සිට 111+000 දක්වා)
- ලංකාපටුන මාර්ගය (කි.මී.12)
- ත්‍රිකුණාමලය නව අතුරු මාර්ගය (කි.මී.10)
- කො.ක.අ. මාර්ග ව්‍යාපෘතියේ මාර්ග සලකුණු සමාලෝචනය
- පුත්තලම-ත්‍රිකුණාමල මාර්ගයේ නොච්චියාගම (කි.මී.50+200 සිට 52+000 දක්වා)
- මඩකලපුව-තිරිකොන්ඩියාමඩු-ත්‍රිකුණාමලය මාර්ගයේ අලව්ව හංදිය (කි.මී.90+610 සිට 91+140 දක්වා)

වර්ෂය තුළ පහත සඳහන් මාර්ග, පාලම් හා සන්ධි සඳහා රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම් ඇඳීම් භාරගන්නා ලදි.

- පුලුගුපිටිය හංදිය
- කනත්ත හංදිය
- කොළඹ-පුත්තලම් මාර්ගයේ වැලිගම්පිටිය
- උත්තරානන්ද මාවත
- රත්නපුර නගරය වැඩි දියුණු කිරීම
- පානදුර ඔරලෝසුකණුව වැඩි දියුණු කිරීම
- පානදුර ශ්‍රීලංගම හංදිය වැඩි දියුණු කිරීම
- වැලිකඩ හංදිය වැඩි දියුණු කිරීම
- ගාල්ල නාවික හමුදා හංදිය වැඩි දියුණු කිරීම
- කො.ගා.හ.වැ.මාර්ගයේ හා මාතර-හක්මන මාර්ගයේ මාතර හංදිය (බෝධිය හංදිය) අන්තර්ජේදනය වැඩි දියුණු කිරීම
- කො.ගා.හ.වැ.මාර්ගයේ හා මාතර-අකුරැස්ස මාර්ගයේ මාතර (නුපේ හංදිය) අන්තර්ජේදනය වැඩි දියුණු කිරීම
- පුත්තලම-ත්‍රිකුණාමලය මාර්ගයේ 38+450 කි.මී.යේ රාජාංගන හංදිය වැඩි දියුණු කිරීම
- කොළඹ-හොරණ මාර්ගයේ, ඇතුල්කෝට්ටේ-මිරිහාන-කොහුවල මාර්ගයේ හා කොහුවල-දෙහිවල මාර්ගයේ කොහුවල හංදිය අන්තර් ජේදනය වැඩි දියුණු කිරීම
- කොළඹ-හොරණ මාර්ගයේ, මොරටුව-පිළියන්දල මාර්ගයේ හා පිළියන්දල-මහරගම මාර්ගයේ පිළියන්දල හංදිය අන්තර්ජේදනය
- ගොලුමඩම හංදියේ පදික මාරුව වැඩි දියුණු කිරීම
- කඩවත නගරය වැඩි දියුණු කිරීම
- කොළඹ-මහනුවර මාර්ගය, පස්යාල-ගිරිඋල්ල මාර්ගය, පස්යාල-අත්තනගල්ල මාර්ගයේ පස්යාල අන්තර්ජේදනය වැඩි දියුණු කිරීම

* නුවර-යාපනය මාර්ගයේ හා කටුගස්තොට-කුරුණෑගල-පුත්තලම මාර්ගයේ කටුගස්තොට අන්තර්ජේදනය
* කොළඹ-නුවර මාර්ගයේ, ගම්පහ-වතුරේගම මාර්ගයේ මිරිස්වත්ත අන්තර්ජේදනය වැඩි දියුණු කිරීම (කි.මී.0+160 සිට 0+340 දක්වා)
* පේදුරුතුඩුව මාර්ග කොටස කි.මී.20+700 සිට 26+960 දක්වා (කි.මී.6.2 km)
* පේදුරුතුඩුව මාර්ග කොටස කි.මී. 9+000 සිට 13+820 දක්වා (කි.මී.4.8Km)
* උඩවලව-තණමල්විල මාර්ගය පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම (කි.මී.0+000 සිට 40+540 දක්වා)
* කුඹුක්කන-ඔක්කම්පිටිය-මාලිගාවිල මාර්ගය (කි.මී.15)
* බුත්තල-ඔක්කම්පිටිය මාර්ගය (කි.මී.9)
* බඩල්කුඹුර-බුත්තල-සෙල්ලකතරගම මාර්ගය (කි.මී.57)
* ගුවන් තොටුපල ප්‍රවේශ මාර්ගය වැඩි දියුණු කිරීම (කි.මී. 0+000 සිට 2+000 දක්වා)
* අත්තිඩිය-මිහිඳුසෙත්පුර අභ්‍යන්තර මාර්ගය වැඩි දියුණු කිරීම
* ඉනාමලුම-සීගිරිය මාර්ගයේ (B162) කි.මී. 0+000 සිට 8+869 දක්වා වැඩි දියුණු කිරීම
* කඩවත උමං මාර්ගය (මී.460 )
* නුගේගොඩ නව සුපිරි වෙළඳසැල ගොඩනැගිල්ලට ප්‍රවේශ මාර්ගය (මී.150)
* ඉනාමලුව-සීගිරිය මාර්ගයේ (B162) කි.මී. 0+000 සිට 8+869 දක්වා මාර්ග කොටස වැඩිදියුණු කිරීම
* මඩකලපුව-තිරිකොන්ඩියාමඩු-ත්‍රිකුණාමලය මාර්ගයේ ( කි.මී.36+000 සිට 108+000 දක්වා) වැඩි දියුණු කිරීම

**ආදර්ශ සැලසුම් හා භූමි අලංකරණය**

* අනතුරුදායක ස්ථානය සඳහා ප්‍රතිදිප්ත මුණ්ඩක
* ඉදිරි දිශාව සඳහා ප්‍රතිදිප්ත මුණ්ඩක
* පදික ප්‍රදේශය, මාර්ග මධ්‍යයනය හා පදික මග සඳහා මං පෙන්වන ප්‍රතිදිප්ත යෂ්ටි
* ආරක්ෂිත මුරපොල හා මධ්‍යනය ආරම්භය සඳහා මග පෙන්නුම් කුළුණු
* මධ්‍යනයේ ආරම්භය හා අවසානය සඳහා ආරක්ෂණ පියවර
* තොරතුරු සංඥා පුවරු සඳහා විස්තර නියම කිරීම
* අනුරාධපුර හංදිය සඳහා ඉදිරි දිශා පුවරු
* කි.මී.කණුව සඳහා අධිවේගි මාර්ගය දක්වන කණුව
* පදිකාරක්ෂක පිල්ල (වැට)
* ජාඇල-ඒකල-ගම්පහ-යක්කල මාර්ගයේ පදිකයන්ගේ ප්‍රදේශයට ප්‍රතිදිප්ත මග පෙන්වීම් යෂ්ටි
* ආදර්ශ සැලසුම් නිවැරදි කිරීම

- පැලියගොඩ-පුත්තලම් මාර්ගයේ මධ්‍යනය සඳහා ප්‍රතිදිප්ත මග පෙන්නුම් යෂ්ටි හා ආරක්ෂන කුළුණු
- දක්ෂිණ අධිවේගී මාර්ගය විවෘත කිරීමේ උළෙල සඳහා රථවාහන කළමනාකරණ සැලැස්ම
- පැලියගොඩ-පුත්තලම් මාර්ගයේ මධ්‍යනය සඳහා ප්‍රතිදිප්ත මග පෙන්නුම් යෂ්ටි හා ආරක්ෂණ කුළුණු (2 වන කොටස) සඳහා ආදර්ශ සැලසුම් පිළියෙල කරන ලදි. ද.18+500 කි.මී.සිට ද.23+912 කි.මී.දක්වා
- ද.ප්‍ර.සං.ව්‍යා. යේ තාවකාලික පිටවීම සඳහා වංගු සංඥාව

සඳහා ආදර්ශ සැලසුම් පිළියෙල කරන ලදි.

**දෝෂ ස්ථාන හා උවදුරු ඇති ස්ථාන වැඩි දියුණු කිරීම**

වර්ෂය තුළදි පහත සඳහන් දෝෂ ස්ථාන හා උවදුරු ස්ථාන ප්‍රතිකර්ම යෙදිම සඳහා හඳුනාගන්නා ලදි.

- රිජ්වේ ආර්යා රෝහල ඉදිරිපිට පදික පහසුකම් වැඩි දියුණු කිරීම
- ගොලුමඩම හංදිය වැඩි දියුණු කිරීම
- පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය ඉදිරිපිට ආරක්ෂිත පියවරයන්
- ශාන්ත ජෝන් විද්‍යාලය ඉදිරිපිට ආරක්ෂණ පියවරයන්
- ජාඇල-ඒකල-ගම්පහ-යක්කල මාර්ගයේ ආරක්ෂණ විධි විධාන වැඩි දියුණු කිරීම (කි.මී 0+700 සිට 2+597 දක්වා මාර්ගය දිගට කි.මී. 150)
- අම්පාර උස් පදික මාර්ගය වැඩි දියුණු කිරීම.
- පැලියගොඩ-පුත්තලම මාර්ගයේ ආරක්ෂණ විධි විධාන වැඩි දියුණු කිරීම (කි.මී 2+824 සිට18+206.95 දක්වා)
- වෙන්නප්පුව වයික්කාල හංදිය වැඩි දියුණු කිරීම
- කාසල් රෝහල ඉදිරිපිට ආරක්ෂණ පියවරයන්
- අධිවේගී මාර්ගයේ කොට්ටාව අන්තර්මාරුවේ ආරක්ෂණය වැඩි දියුණු කිරීම
- තුඩැල්ල නිමල මරියා කාන්තා විද්‍යාලය ඉදිරිපිට ආරක්ෂණය වැඩි දියුණු කිරීම

**රථවාහන කළමනාකරණය**

2011 වර්ෂය තුළ පහත සඳහන් මාර්ග හා සන්ධි සඳහා රථවාහන කළමනාකරණ අධ්‍යයනයන් සිදු කෙරෙමින් පැවතිණි.

- ✓ ඇහැළියගොඩ නගරය සඳහා අතුරු මාර්ගය
- ✓ ඉමදූව සඳහා අතුරු මාර්ගය
- ✓ කොස්ගම සඳහා අතුරු මාර්ගය
- ✓ හික්කඩුව සඳහා අතුරු මාර්ගය
- ✓ දෙමටගොඩ සිට රාජගිරියට විකල්ප මාර්ගය
- ✓ කොහුවල හංදිය

- ✓ පානදුර හා ශ්‍රීලංගම හා ඔරලෝසුකණුව හංදිය
- ✓ කඩුවෙල හංදිය
- ✓ බොරලැස්ගමුව

**සන්ධි සංඥාකරණය**

සන්ධිවල සංඥාවලි පද්ධති ස්ථාපනය කිරීම හා නඩත්තුව පිළිබඳව පහත දැක්වෙන කටයුතු සිදුකරන ලදි.

- සංඥා සැලසුම හා කාලගණනය
  - ✓ කටුගස්තොට – නිමකෙරිණි
  - ✓ කොහුවල හංදිය – නිමවෙමින් පවති
  - ✓ මාතර බෝධිය හංදිය – නිමකෙරිණි
  - ✓ මාතර නූපේ හංදිය – නිමකෙරිණි
  - ✓ පානදුර ඔරලෝසුකණුව – නිමවෙමින් පවති
  - ✓ පානදුර ශ්‍රීලංගම – නිමවෙමින් පවති
  - ✓ පිළියන්දල හංදිය (සංශෝධිත) – නිමවෙමින් පවති

- සංඥා පද්ධති ස්ථාපනය කිරීම
  - ✓ කටුගස්තොට – නිමකෙරිණි
  - ✓ කොහුවල – නිමවෙමින් පවති
  - ✓ කොට්ටාව අධිවේගී මාර්ගය අවසානය – නිමකෙරිණි
  - ✓ මාතර බෝධිය හංදිය – නිමකෙරිණි
  - ✓ නූපේ හංදිය – නිමකෙරිණි
  - ✓ පිළියන්දල හංදිය – නිමවෙමින් පවති

- කනත්ත හා සිදූව සඳහා සංඥා ප්‍රතිස්ථාපනය / වෙනස් කිරීම නිමකල අතර, වැලිකඩ කටුගස්තොට හංදිවල නිමකෙරෙමින් පවති.

- හදිසි අනතුරු නිසා පහත සඳහා සංඥා ආලෝක පද්ධති වලට සිදුවූ හානි ප්‍රතිසංස්කරණය කරන ලදි.
  - ✓ බත්තරමුල්ල – නිමකෙරිණි
  - ✓ බෙල්ලන්තර – නිමකෙරිණි
  - ✓ දෙමටගොඩ හංදිය – නිමකෙරිණි
  - ✓ කිරිබත්ගොඩ හංදිය – නිමකෙරිණි
  - ✓ ඔරුගොඩවත්ත – නිමකෙරිණි
  - ✓ පෙරියමුල්ල හංදිය – නිමකෙරිණි
  - ✓ තෙල්වත්ත හංදිය (දෙවරකි) – නිමකෙරිණි

| | | | |
|---|---|---|---|
| ✓ | ටෙක්නිකල් හංදිය (දෙවරකි) | – | නිමකෙරිණි |
| ✓ | ටෙම්පලර්ස් හංදිය | – | නිමකෙරිණි |
| ✓ | විලියම් හංදිය | – | නිමකෙරිණි |

- පහත සඳහන් සන්ධිවල කාලය යාවත්කාලීන කිරීම

| | | | |
|---|---|---|---|
| ✓ | බොරැල්ල | – | නිමකෙරිණි |
| ✓ | ගොලුමඩම | – | නිමකෙරිණි |
| ✓ | කනත්ත | – | නිමකෙරිණි |
| ✓ | කටුගස්තොට හංදිය | – | නිමවෙමින් පවති |
| ✓ | කටුබැද්ද | – | නිමකෙරිණි |
| ✓ | කැලණිතිස්ස හංදිය | – | නිමකෙරිණි |
| ✓ | නුගේගොඩ | – | නිමකෙරිණි |
| ✓ | විලියම් | – | නිමකෙරිණි |
| ✓ | සෝන්ඩර්ස් පෙදෙස ඕල්කට් මාවත | – | නිමකෙරිණි |

ඉහත සඳහන් කටයුතුවලට අමතරව, මහජන ඉල්ලීම් 32 ක නියුතු වූ අතර, රථවාහන සංඥා හා සලකුණු කිරීම සඳහා ඇස්තමේන්තු 8 ක් පිළියෙල කරනු ලැබිණි. තව දුරටත් ර.තො.ඇ. (TIA) වාර්තා 16 ක් අධ්‍යයනය කරන ලද අතර, දැයට කිරුළ ප්‍රදර්ශන කටයුතු නිමකරනු ලැබිය.

## 4.14 කළමනාකරණ තොරතුරු පද්ධතිය නඩත්තුව

2011 වර්ෂය තුළදී මාර්ග සංවර්ධන අධිකාරියේ කළමනාකරණ තොරතුරු ඒකකය (MIS) විසින්, පහත සඳහන් කාර්යයන් භාර ගන්නා ලදි.

- විද්‍යුත් තැපැල් පහසුකම හා තැපැල් සර්වරය සැපයීමට අඛන්ඩව කටයුතු කරන ලදි. දැනට ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශිය කාර්ය මණ්ඩලය සඳහා විද්‍යුත් ලිපිනයන් 230 ක් පමණ සර්වරය විසින් පවත්වාගෙන යනු ලැබේ. මෑතකදී සැලසුම් අංශය විසින් ව්‍යාජ විද්‍යුත් තැපැල් පිරිපහදු කිරීම හා පද්ධතියට අනවසර ප්‍රවේශකයන් අවහිර කිරීමට ව්‍යාජ විද්‍යුත් පණිවුඩ පිරිපහදු මෘදුකාංගයක් ස්ථාපනය කරන ලදි.

- ප්‍රාදේශිය කාර්යය මණ්ඩලයට විද්‍යුත් තැපැල් පහසුකම් සැපයීම අඛන්ඩව සිදුකරන ලදි. මාර්ග සංවර්ධන අධිකාරියේ විද්‍යුත් තැපැල් සර්වරය සෑම පළාතකම සිටින කාර්ය මණ්ඩලයට වෙනම විද්‍යුත් තැපැල් ගිණුම් පවත්වාගෙන යනු ලබයි. ඔවුන් බොහෝ දෙනෙකුට විද්‍යුත් තැපැල් පණිවුඩ පරීක්ෂා කිරීම සඳහා බ්‍රෝඩ්බෑන්ඩ් සම්බන්ධතා ඇත.

- මාර්ග සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය අබන්ධව නඩත්තු කරගෙන යන ලදි.
  මාර්ග සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය නව සැලසුමකින් යුතුව ඉදිරිපත් කර ඇති අතර ක.තො.ප. (MIS) ඒකකය විසින් ඒ අනුව වෙබ් අඩවිය කලින් කලට යාවත්කාලීන කරනු ලබයි. ප්‍රධාන යාවත්කාලීන කිරීම් ප්‍රසම්පාදන විස්තර හා ව්‍යාපෘති වලට අදාළ ලේඛන පදනම් කරගෙන සිදු කෙරේ.

- අනු පිටපත් නඩත්තු කිරීම හා වැදගත් දත්ත සංරක්ෂණය කිරීම අබන්ධව සිදු කරන ලදි.

- වයිරස් ප්‍රහාර වැළැක්වීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දෙනු ලැබිණි.
  පරිගණක ජාලය තුළ වයිරස් ප්‍රහාර වැළැක්වීම වශයෙන් ක.තො.ප. විසින් ජාලය තුල තෝරාගත් පරිගණක 150 ක් සඳහා බලපත්‍රලත් සේවාදායක සර්වර් වර්ගයේ ප්‍රති වෛරස් මෘදුකාංගවලි සපයනු ලැබීය. ඕනෑම ජාල ප්‍රහාරයකට හෝ අනවසර ඇතුළුවීමකට ඉඩකඩ ඇති බැවින්, අන්තර් ජාල හා විද්‍යුත් තැපැල් පහසුකම් ඇති ග්‍රාහකයන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

- මා.සං.අ.මෙහෙයුම් අංශවලට තො.තා. වැඩි දියුණු කිරීම සඳහා සහාය ලබාදෙන ලදි.

- ටෙන්ඩර් ලේඛන / ප්‍රසම්පාදන පිළියෙල කිරීම හා ඇගයීම භාර ගන්නා ලදි.

- ව්‍යාපෘති ජායාරූප එකතු කිරීම හා ලේඛනගත කිරීමෙහි යෙදුණි.

- මුදල් අංශයට අවශ්‍ය සහයෝගය සඳහා මූල්‍ය සංචිත මෘදුකාංගවලියක් සපයන ලදි.
  දැනට මුදල් අංශයේ පරිගණක ජාල සංලක්ෂණ පදනම් වී ඇත්තේ සේවාදායක පරිගණක 55 ක් හා නවතම ස්ර්වරයක් සහිත බලප්‍රදේශ සර්වර ව්‍යුහයක් පදනම් කර ගෙනයි. එසේම දැනට මුදල් අංශයේ දෛනික මූල්‍ය ක්‍රියාවලින් සඳහා ප්‍රධාන භාවිත මෘදුකාංගාවලි 2 ක් භාවිතා කරනු ලබයි. ප්‍රධාන මෘදුකාංගාවලිය වනුයේ වැටුප් මෘදුකාංගාවලියි. එය සජීවි ලෙස ක්‍රියාත්මක වන අතර අනෙක් මෘදුකාංගාවලිය පවත්නා පද්ධතියට සමාන්තර ලෙස ක්‍රියාත්මක වන අතර, නුදුරේදීම සජීවි ලෙස ක්‍රියාත්මක වනු ඇත.

- දෘඩාංග හා මෘදුකාංග අර්බුද විසඳීමේ කටයුතුවල අබන්ධව යෙදුණි.

- මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩ සටහන් පවත්වන ලදි.

- ඇඟිලි සලකුණු මුද්‍රණ පැමිණීමේ පද්ධතියක් හඳුන්වාදුනි.
  දැනට මාර්ග සංවර්ධන අධිකාරියේ සැලසුම් අංශයේ ක.තො.ප.ඒකක සර්වරය විසින් පැමිණීමේ දත්ත ලබාගෙන සැකසුම් කරන අතර, අළුතින් හඳුන්වාදුන් ඇඟිලි සලකුණු පැමිණීමේ පද්ධතිය සඳහා අවශ්‍ය ජාලමය සහාය ලබා දෙයි. මේ වන විට මා.සං.අ.යේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ඇඟිලි සලකුණු පැමිණීමේ ලේඛන 10 ක් වෙයි.

## 4.15 අධිවේගි මාර්ග කළමනාකරණය

අධිවේගි මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ අංශය 2011 වර්ෂය තුළ පහත දැක්වෙන වැඩ සටහන්වල නිරත විය.

- රථවාහන හා කළමනාකරණයට සම්බන්ධ අත්පොත් කෙටුම්පත් කිරීම නිමකරන ලදි.
- රථවාහන සේවක මණ්ඩලය, අයකැමි සේවක මණ්ඩලය, නඩත්තු සේවක මණ්ඩලය හා පරිපාලන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම නිමකෙරිණි.
- පොලිස් නිලධාරි නවාතැන් සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිනි. (කුලී නිවාස අළුත්වැඩියාවද සිදු කෙරිණි)
- පින්නදූව හා කුරුඳුගහහැතැක්ම අන්තර් මාරුවල පොලිස් නිලධාරි නවාතැන් ගොඩනැගිලි නිමකරන ලදි.
- ආදායම් රැස්කිරීම / රථවාහන ප්‍රමාණය සඳහා දත්ත ගබඩාව පිළියෙල කිරීම.
- රථවාහන විශ්ලේෂණය සඳහා මෘදුකාංග වර්ධනය කිරීම.
- හදිසි අනතුරු විශ්ලේෂණය සඳහා මෘදුකාංග වර්ධනය කිරීම.
- දක්ෂිණ අධිවේගි මාර්ගයේ භාවිතකරු ගාස්තු එකතු කිරීම සඳහා අදාළ ලේඛන පිළියෙල කිරීම හා නිමකිරීම.
- ගාස්තු කාර්ය මණ්ඩලය, රථවාහන සේවක කණ්ඩායම, පොලිසිය, පරිපාලන කාර්ය මණ්ඩලය හා මුදල් අංශය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම.
- දක්ෂිණ අධිවේගි මාර්ගය විවෘත කිරීමේ උත්සවය සඳහා කටයුතු කරනු ලැබීය.
- බණ්ඩාරගම නව කාර්යාල ගොඩනැගිල්ල නවීකරණය කිරීම සිදු කෙරිණි.
- බැවුම්, පාලම්, මාර්ග හා මාර්ග භාණ්ඩ පිළිබඳ දත්ත ගබඩාව පිළියෙල කිරීම සිදු කෙරෙමින් පවතී.
- අධිවේගි මාර්ගය 2011 නොවැ. 27 දින විවෘත කිරීමෙන් පසුව එහි වාහන 282 079 ධාවනය කර ඇති අතර 2011 වර්ෂය තුල රු: මිලියන 82.35 ක් උපයාගනු ලැබිනි.
- "අධිවේගි මාර්ග කළමනාකරණ ඒකකය" යන අංශයේ නම "*අධිවේගි මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශය*" යනුවෙන් වෙනස් කරනු ලැබිනි.

## 4.16 වත්කම් කළමනාකරණය හා ආදායම් රැස්කිරීම.

වත්කම්, කළමනාකරණ හා ආදායම් අංශය 2011 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද කටයුතුවල කාර්ය සාධනය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් පහත දක්වා ඇත.

*දැන්වීම් පුවරු / ප්‍රචාරණ පුවරු / ප්‍රචාරණ තොරන් / කැන්ටිලිවර්*

- මාර්ග දෙපස දැන්වීම් පුවරු / ප්‍රචාරණ පුවරු / ප්‍රචාරණ තොරන් / කැන්ටිලිවර් හා ප්‍රචාරණය කරන දෑ සඳහා බලපත්‍ර නිකුත් කිරීම. 2011 දෙසැ. 31 දින දක්වා අඛන්ඩව සිදු කරන ලදි.
- කැන්ටිලිවර් /ප්‍රචාරණ පුවරු / දැන්වීම් පුවරු / දැන්වීම් පුවරු ස්ථාපනය කිරීම හා මාර්ග රක්ෂිතයේ වටරවුම් නඩත්තුව සඳහා නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුව අනුමැතිය ලබාදීම සඳහා අනුමත කරන ලද ප්‍රචාරණ පුවරු පිළිබඳ වාර්තා විධායක ඉංජිනේරුවන්ට හා අදාළ අංශ වෙත යවන ලදි. ඊට අමතරව අනුමත ප්‍රචාරණ පුවරු පිළිබඳ සාරාංශ වාරිකව යැවීම.
- වත්කම් කළමනාකරණ හා ආදායම් අංශය වර්ෂය තුළ නියමිත කුලී අයකර ගැනීමෙන් පසුව ප්‍රචාරණ ධජ 1915 ක් සඳහාද ප්‍රචාරණ පුවරු 703 ක් සඳහාද අනුමැතිය ලබාදුනි. මෙපරිද්දෙන් ප්‍රචාරණ ධජ ප්‍රදර්ශනය කිරීම සඳහා ගිවිසුම් 82 ක්ද ප්‍රචාරණ පුවරු ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් ගිවිසුම් 92 ක්ද අත්සන් කරන ලදි..

*වානිජ පරමාර්ථ සඳහා මාර්ග රක්ෂිතය බදුදීම*

2011 උත්සව කාලය තුළ නුවරඑළියේ මාර්ග රක්ෂිත කිපයක් බදුදීම සඳහා ටෙන්ඩර් කැඳවන ලදි. මෙහි ආදායම වැඩි කිරීම සඳහා අවම ලංසු අගය තිරණය කර හඳුන්වාදෙනු ලැබීය. ඒ අනුව නුවරඑළිය මාර්ග රක්ෂිත මසක කාලයක් බදුදීම තුළින් මෙම වසරේ ආදායම රුː 1, 692, 116.57 ක් දක්වා ඉහල ගියේය.

*ජාතික මහාමාර්ගවල විවේක ස්ථාන පිහිටුවීම*

ගාලුපාරේ ගොයියාපාන නව විවේක උද්‍යානයක් පිහිටුවන ලදි. පේරාදෙනිය-බදුල්ල-වෙන්කලඩි මාර්ගයේ අංක.38/8 බෝක්කුව අසල විවේක ස්ථානය ඉදිකිරීම නිම කෙරිණි. මෙම විවේක උද්‍යානය ඉදිකරන ලද්දේ ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන ආයතනය වන අතර 2012 අප්‍රේල් අවසානයේදී විවෘත කිරීමට නියමිතය. අඹේපුස්ස-කුරුණෑගල-ත්‍රිකුණාමලය මාර්ගයේ යකා වංගුවේද, පේරාදෙණිය-බදුල්ල-වෙංකලඩි මාර්ගයේ බෝක්කු අංක 38/3 අසලද විවේක ස්ථාන ඉදිකරගෙන යනු ලබයි.

*ආදායම් රැස්කිරීම*

මාර්ග සංවර්ධන අධිකාරියේ වත්කම් කළමනාකරණය කරමින් 2011 වර්ෂය තුළ විවිධ මූලාශ්‍රයන්ගෙන් රැස්කරන ලද ආදායම රුː.90, 313, 474.40 කි.

***වගු අංක 29: 2009 සිට 2011 දක්වා වත්කම් කළමනාකරණ හා ආදායම් අංශය විසින් රැස්කරන ලද ආදායම් විස්තර වර්ගීකරණය***

| ***විෂයාංග විස්තරය*** | ***ආදායම (රු)*** | | |
|---|---|---|---|
| | ***2009*** | ***2010*** | ***2011*** |
| ප්‍රචාරණ ධජ ආදායම | 2, 182, 529.51 | 5, 224, 140.87 | 1, 346, 304.25 |
| බොරැල්ල සාප්පු සංකීර්ණයේ කුලී | 763, 038.29 | 638, 226.80 | 3, 583, 122.6 |
| බස් නැවතුම්වල ආදායම | | 831, 340.06 | 7, 357, 189.73 |
| රූපවාහිනී රැහැන් කණු ආදායම | 236, 170.10 | 1, 075, 023.26 | 25, 127, 823.57 |
| ප්‍රචාරණ තොරන් / කැන්ටිලිවර් ආදායම | 28, 497, 053.30 | 29, 177, 860.62 | 20, 955, 621.91 |
| ප්‍රචාරණ පුවරු ආදායම | 34, 893, 814.97 | 61, 018, 022.41 | 28, 535, 524.79 |
| වෙළඳ හා ලොතරැයි කුටි ආදායම | 1, 387, 628.91 | 1, 111, 473.98 | 151, 014.46 |
| වටරවුම්වල ආදායම | 145, 638.43 | 171, 734.38 | 910, 272.01 |
| අනවසර ප්‍රචාරණ පුවරු ඉවත්කිරීමේ ආදායම | 15, 122.43 | | |
| විවේක උද්‍යාන | | 121, 546.38 | 124, 639.14 |
| නුවරඑළිය උත්සව සමයේ වෙළඳකුටි ආදායම | 1, 069, 200.00 | 1, 777, 628.84 | 1, 672, 114.57 |
| දුරකථන කුටි ආදායම | | | 549, 847.37 |
| ***එකතුව*** | ***69, 190, 195.94*** | ***101, 756, 727.04*** | ***90, 313, 474.40*** |

***මාර්ග අලංකරණ කටයුතු***

මාර්ග අලංකරණ ව්‍යාපෘතිය ඉලක්ක වී ඇත්තේ වැදගත් ස්ථානවල පිහිටා ඇති මැද දූපත්, වටරවුම් හා මාර්ග රක්ෂිත අලංකාර කිරීම හා නඩත්තු කිරීමයි. මෙම කටයුතු සඳහා පුද්ගලික පාර්ශවවලින් අනුග්‍රහය ලබා ගැනීමට තීරණය කෙරිණි. මෙම කටයුතු 2010 වර්ෂයේදී අනුමත කළ අතර, මෙම වර්ෂය තුළ මාර්ග දූපත් 35 ක් මා සං අ නීතිවලට යටත්ව, අලංකරණ හා නඩත්තුව සඳහා පුද්ගලික පාර්ශවයන්ට භාරදෙන ලදි. මෙම කාර්යය මා සං අ යේ අනුමත අනුපාත යටතේ විවිධ ස්ථානවල කුඩා ප්‍රචාරණ පුවරු ප්‍රදර්ශනය කිරීමට අනුග්‍රාහකයන්ට ඉඩ දෙන මා.සං.අ.යේ ආදායම් මාර්ගයක් ලෙස හඳුනාගෙන ඇත. අලංකරණ කටයුතු සඳහා අනුග්‍රාහකයන් ආකර්ශනය කර ගැනීමට ගාස්තු අනුපාත හා අදාළ නීති රීතිද සංශෝධනය කර ඇත. මෙයට අමතරව වත්කම් කළමනාකරණ හා ආදායම් අංශය සියලු වටරවුම් හා මධ්‍ය දූපත් දේවි බාලිකා හංදිය සිට පොල්දූව හංදිය දක්වාද, පොල්දූව සිට සෙත්සිරිපාය කොටස හා පරණ කැස්බෑව පාරේ කට්ටිය හංදිය සිට නුගේගොඩ දුම්රිය ගේට්ටුව කොටස දක්වාද අලංකරණය හා නඩත්තු කිරීමේ යෙදී සිටියි.

***මාර්ග අලංකරණ කටයුතු සඳහා පැල තවාන ස්ථාපිත කිරීම***

වින්සා, එක්සෝරා වැනි විදේශ පැළෑටි වගා කිරීම සඳහා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙතින් අවශ්‍ය සහාය ලබා ගන්නා ලදි. වත්කම් කළමනාකරණ හා ආදායම් අංශය මෙහෙයවන අලංකරණ කටයුතු සඳහා මෙම පැළෑටි වර්ග අවශ්‍යතාව සැපයීමේ හිඟකම නිසා මල්පැල තවාන් ස්ථාපනය කිරීමට මා සං අ විසින් තීරණය කරනු ලැබිය. ආරම්භයේදි මෙම වර්ෂය තුළ කඩුවෙල හා හෝමාගම ඩිපෝවල මල්පැල වගාකරන ලදි. පසුව කඩුවෙල පැල තවාන හෝමාගම ඩිපෝවට ගෙන යන ලදි. පැල තවාන් ස්ථාපනය කිරීම සඳහා ස්ථාන 2 ක් හඳුනාගෙන ඇති අතර ඉන් එකක් නාරාහේන්පිට දාබරේ මාවතේද අනෙක අත්තිඩිය බඩෝවිට පිහිටා ඇත. 2011 වර්ෂය තුළ මෙම මල්පැල තවාන් මගින් පැල 7000 ක් අලංකරණ කටයුතු සඳහා නිෂ්පාදනය කර ඇත. එමෙන්ම වත්කම් නඩත්තු හා ආදායම් අංශය විසින් පහත දැක්වෙන අලංකරණ ව්‍යාපෘති සඳහා සහාය ලබාදෙනු ලැබිය.

- කොල්ලුපිටිය-ශ්‍රී ජයවර්ධනපුර ආයුර්වේද හංදියේ සිට පොල්දූව දක්වා පුළුල් කිරීමේ ව්‍යාපෘතිය හා නුගේගොඩ පරණ කැස්බෑව මාර්ගයේ නුගේගොඩ අන්තය කොටස.
- කොළඹ-නුවර මාර්ගයේ කිරිබත්ගොඩ සිට කඩවත කොටස වැඩි දියුණු කිරීම : ගස් සිටුවීම හා තණ සිටුවීම.
- බදුල්ල-නුවරඑළිය-වෙන්කලඩි මාර්ගයේ හග්ගල වෙළඳසැල් ඉදිකිරීම සඳහා මූලික කටයුතු, ආසියානු සංවර්ධන බැංකු ජාතික මහාමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය.
- මධ්‍යම පරිසර අධිකාරිය විසින් ආවේක්ෂණය කරන ලද දෘෂ්‍ය පරිසර දූෂණය වැළැක්වීමේ ජාතික මාර්ගෝපදේශ කමිටුව වෙත මා සං අ නියෝජනය.
- අලංකරණ හා ප්‍රචාරණවලට අදාළ කටයුතු සඳහා කොළඹ මහ නගර සභාවට හා නාගරික සංවර්ධන අධිකාරියට සහාය දීම.

## 4.17 යාන්ත්‍රික සේවා

මාර්ග සංවර්ධන අධිකාරියේ යාන්ත්‍රික අංශය 2011 වර්ෂය තුළ මා සං අ යේ වැඩ සටහනට පහසුකම් සැපයීම සඳහා පහත දැක්වෙන සේවාවන් ඉටුකරන ලදි.

- පහත දැක්වෙන යන්ත්‍ර ප්‍රසම්පාදනය සඳහා පිරිවිතර හා ලංසු ලේඛන පිළියෙල කර මණ්ඩලීය අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබිය.
  - ✓ මාර්ග පිසින සවිකල ට්‍රක් 01
  - ✓ ලෝ-බෙඩ් ටේලර් 01
  - ✓ මාර්ග සලකුණු යන්ත්‍ර සවි කිරීමට භාණ්ඩ ප්‍රවාහන ට්‍රක් 03
  - ✓ ස්කිඩ් ස්ටියර් ලෝඩර් 15
- පහත දැක්වෙන යන්ත්‍ර ප්‍රසම්පාදනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ලංසු කැඳවීම මගින් මගින් ප්‍රසම්පාදනය ආරම්භ කර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය පසුව ප්‍රදානය කරන ලදි.

✓ මාර්ග පිසින සවිකල ට්‍රක් 01

✓ ලෝ-බෙඩ් ට්‍රේලර් 01

✓ මාර්ග සලකුණු යන්ත්‍ර සවි කිරීමට භාණ්ඩ ප්‍රවාහන ට්‍රක් 03

මූල්‍ය සංරෝධන නිසා ස්ටියර් ලෝඩර් 15 ක් මිලදී ගැනීම 2012 වර්ෂයට කල් තබන ලදි.

- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙතින් චීන ඉදිකිරීම් යන්ත්‍ර හා යන්ත්‍රාගාර ගණනාවක් ලැබුනු අතර ඒවා අඟුලාන යාන්ත්‍රික කම්හල මගින් දිවයින පුරා ස්ථානගත කරන ලදි.

***වගු අංක 30: චීන ඉදිකිරීම් යන්ත්‍ර***

| අංකය | යන්ත්‍රයේ වර්ගය | ප්‍රමාණය |
|---|---|---|
| 1 | ඇස්පල්ට් පේවර් (වීල් ටයිප්) | 11 |
| 2 | අස්පල්ට් පේවර් (කෝලර් වර්ගය) | 06 |
| 3 | නියුමැටික් ටයර් රෝලර් | 23 |
| 4 | ස්ටැටික් රෝලර් | 17 |
| 5 | වීල් ලෝඩර් 1.7C.M | 12 |
| 6 | වීල් ලෝඩර් 2.7C.M | 03 |
| 7 | 10 T ක්‍රේන් ට්‍රක් | 02 |
| 8 | ප්‍රයිම් මුවර් | 01 |
| 9 | ලික්විඩ් ඇස්පෝල්ට් ටැන්කර් | 20 |
| 10 | හැන්ඩ් ඉමල්ෂන් ස්ප්‍රේයර් | 17 |
| 11 | හයිඩ්‍රොලික් එක්ස්කැවේටර් බ්‍රේකර් සහිත ක්‍රෝලර් වර්ගය | 01 |
| 12 | මෝටර් ග්‍රේඩර් | 02 |
| 13 | එන්ජින් ඩ්‍රිවන් වෙල්ඩර්ස් MG20/500D | 09 |
| 14 | ස්කිඩ් ස්ටියර් ලෝඩර් | 17 |
| 15 | ඇස්පෝල්ට් ප්‍රිමික්ස් ප්ලාන්ට් (CL-1000) | 06 |
| 16 | ක්‍රෂිං ඇන්ඩ් ස්ක්‍රිනින් ප්ලාන්ට් 150 Tph | 03 |
| 17 | ජෙනරේටර් | 09 |
| 18 | කම්පෙෂර් 600cfm | 03 |
| 19 | ඞීකනින් ප්ලාන්ට් - 80Ton | 03 |
| 20 | වේ බ්‍රිජ් 7.5 M | 06 |
| 21 | මිකැනිකල් බ්‍රැම් ඇටැච්මන්ට් 72" | 17 |
| **එකතුව** | | **188** |

- පැලියගොඩ අංගනයේ හා කුණ්ඩසාලේ කම්හලේ තිබුණ ගර්හිත යන්ත්‍ර, උපකරණ, වාහන හා සුන්බුන් ද්‍රව්‍ය ආදිය බැහැරලන ලදි. පැලියගොඩ අංගනයේ තිබුනු තොග 34 ක භාණ්ඩ හා කුන්ඩසාලේ යාන්ත්‍රික කම්හල් පරිශ්‍රයේ තිබුනු තොග 17 කට අයත් භාණ්ඩ ලංසු කැඳවීමේ පරිපාටිය තුළින් ඉවතලන අතර පිළිවෙලින් රු: 7,840,827.34 (වැට් හැර) හා රු: 4, 024, 046.40 (වැට් හැර) ආදායම් උපයනු ලැබිය.

- උපදේශකයන්ගේ හා වෙනත් කාර්යාලවල පාවිච්චිය සඳහා වාහන ගණනාවක් පිටතින් කුලියට ලබාගන්නා ලදි.
- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් යාන්ත්‍රික ඉංජිනේරුවරු 08 දෙනෙකුට චීනයේදි යන්ත්‍ර හා යන්ත්‍රාගාර පිළිබඳ පුහුණුව ලැබුණි.

## 4.18 මිනිස්බල සංවර්ධනය

මාර්ග සංවර්ධන අධිකාරිය 2011 වර්ෂය තුළ සියලුම වර්ගවල සේවකයන් වැඩවලදී කාර්යක්ෂමතාවය හා සඵලතාවය වැඩි දියුණු කිරීමට ඔවුන්ගේ කුසලතා ඉහල නැංවීම හා උචිත ආකල්ප වර්ධනය සඳහා අඛන්ඩව පහසුකම් සලසන ලදි. 2011 වර්ෂය තුළ පුහුණු කටයුතු පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් වගු අංක 31 දක්වා ඇත.

***වගු අංක 31: නේවාසික පුහුණුව***

| අංකය | පුහුණු විස්තර | සහභාගි වූ සංඛ්‍යාව | දින ගණන |
|---|---|---|---|
| 1 | ලිපිකරු කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද සංනිවේදන ඉංග්‍රිසි (කණ්ඩායම් 2) | 74 | 12 |
| 2 | සි/ස. කුසලතා සංවර්ධන අරමුදල විසින් සියලු කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද සංනිවේදන ඉංග්‍රිසි (කණ්ඩායම් 2) (පැය 76) | 70 | 20 |
| 3 | ඉංජිනේරුවන් සඳහා පවත්වන ලද ප.ආ.ඇ.(AutoCAD)පරිගණක පුහුණුව (කණ්ඩායම් 1) | 9 | 3 |
| 4 | කාර්මික නිලධාරීන් සඳහා පවත්වන ලද පරිගණක පුහුණුව (AutoCAD) (කණ්ඩායම් 4) (දින 8) | 35 | 23 |
| 5 | කාර්මික සහකාරවරුන් සඳහා පවත්වන ලද පරගණක පුහුණුව (AutoCAD) (කණ්ඩායම් 4) (දින 8) | 44 | 24 |
| 6 | පෞද්ගලික පරිගණක දෝෂ නඩත්තුව හා කුඩා අළුත්වැඩියාවන් (කණ්ඩායම් 4කි. 1 ක් පැවැත්වේ) (දින 6 කි) | 80 | 18 |
| 7 | වර්ඩ් එක්සෙල් පිළිබඳ පුහුණු වැඩ සටහන (කණ්ඩායම් 6) (දින 8) | 70 | 25 |
| 8 | ලිපිකරු කාර්ය මණ්ඩලය සඳහා සෙනසුරාදා පවත්වන ලද පරිගණක වැඩ සටහන (MS වර්ඩ් / එක්සෙල් / පවර්පොයින්ට් / එක්සෙස්) (කණ්ඩායම් 2) (දින 10) | 20 | 13 |
| 9 | අලුතෙන් බඳවාගත් ඉංජිනේරුවන්ට නිලාරම්භක පාඨමාලාව (කණ්ඩායම් 4 - 3 ක් පැවැත්වේ) | 173 | 10 |
| 10 | කාර්මික නිලධාරීන් සඳහා පවත්වන ලද මාර්ග හා පාලම් නඩත්තුව-ඇස්තමේන්තු පිළියෙල කිරීම පිළිබඳ (කණ්ඩායම් 2) (දින 1) | 70 | 2 |
| 11 | කාර්මික සහකාරවරුන් සඳහා පවත්වන ලද මාර්ග හා පාලම් නඩත්තුව-ඇස්තමේන්තු පිළියෙල කිරීම පිළිබඳ (කණ්ඩායම් 2) (දින 1) | 30 | 1 |
| 12 | ඉංජිනේරුවන් සඳහා එස් එස් ප්‍රොජෙක්ට් 2010 ප්‍රිම්වේරා පිළිබඳ වැඩ සටහන (කන්ඩායම් 2) (දින 13) | 16 | 5 |
| 13 | ජාතික මහාමාර්ග හා පාලම්වල මනා නඩත්තුව පිළිබඳ විධායක ඉංජිනේරුගේ ක්‍රියා කලාපය (කණ්ඩායම් 2) | 53 | 2 |
| 14 | විධායක ඉංජිනේරුවන්ගේ ක්‍රියා කලාපය (කණ්ඩායම් 1) | 18 | 2 |
| 15 | ජාතික මහාමාර්ග හා පාලම්වල මනා නඩත්තුව පිළිබඳ ප්‍රධාන ඉංජිනේරුගේ ක්‍රියා කලාපය | 24 | 1 |
| 16 | කාර්මික සහකාරවරුන් කාර්මික නිලධාරි තනතුරුවලට උසස් කිරීමට පැවැත්වෙන විභාගය සඳහා පුහුණු වැඩ සටහන (කණ්ඩායම් 3, 2 ක් සිංහල මාධ්‍ය 1 ක් දෙමළ මාධ්‍ය) | 114 | 17 |
| 17 | ඉංජිනේරුවන් සඳහා මාර්ග පාලම් නඩත්තුව හා ඇස්තමේන්තු පිලියෙල කිරීම (කණ්ඩායම් 1) | 30 | 1 |

| අංකය | පුහුණු විස්තර | සහභාගි වූ සංඛ්‍යාව | දින ගණන |
|---|---|---|---|
| 18 | ඉංජිනේරුවන් සඳහා ලංසුලේඛන පිළියෙල කිරීම හා ලංසු ඇගයීම (කණ්ඩායම් 2) | 87 | 2 |
| 19 | අලුතින් බඳවාගත් කළමනාකරණ සහකාරවරුන් හා අභ්‍යන්තරව උසස්වූ කළමනාකරණ සහකාරවරුන් සඳහා නිලාරම්භක පාඨමාලා (කණ්ඩායම් 2) | 200 | 10 |
| 20 | අභ්‍යන්තරිකව ගණකාධිකාරී හා ගිණුම් සහකාර තනතුරු සඳහා උසස්වූ නිලධාරීන් සඳහා පුහුණු වැඩ සටහන (කණ්ඩාය 9 1 : පාඨමාලා පැවැත්වේ) | 40 | 1 |

### ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන වෘත්තිය පුනරීක්ෂණය සඳහා ඉංජිනේරුවන් පුහුණු කිරීම

සැලසුම් කාර්යාල පුහුණුව සඳහා ඉංජිනේරුවන් ප්‍රමුඛතා ලැයිස්තුව යටතේ, නම් කිරීම පුහුණු අංශය යටතේ හොඳින් සිදු කෙරෙමින් පවතී. 2011 වර්ෂය තුළ පහත සඳහන් සැලසුම් කාර්යාලවල පුහුණුව සඳහා ඉංජිනේරුවන් 23 ක් නම් කරන ලදි.

*වගු අංක 32: සැලසුම් පුහුණුව සඳහා නම් කරන ලද ඉංජිනේරුවන්*

| සැලසුම් කාර්යාලයේ නම | නම් කල ඉංජිනේරුවවන් සංඛ්‍යාව |
|---|---|
| මාර්ග සැලසුම් කාර්යාලය | 05 |
| පාලම් සැලසුම් කාර්යාලය | 11 |
| මහනුවර සැලසුම් කාර්යාලය | 03 |
| රත්නපුර සැලසුම් කාර්යාලය | 01 |
| කුරුණෑගල සැලසුම් කාර්යාලය | 03 |
| **එකතුව** | **23** |

### බාහිර ආයතනවල දේශිය පුහුණුව

පුහුණු අංශය විසින් ඉහත විස්තර කරන ලද නේවාසික පුහුණු කටයුතුවලට අමතරව, මා සං අ යේ නිලධාරීන් 610 ක් බාහිර ආයතනවල පවත්වන ලද අදාළ පුහුණු පාඨමාලා හා සම්මන්ත්‍රණ සඳහා නම් කරන ලදි.

*වගු අංක 33: බාහිර ආයතනවල පුහුණුව*

| අංකය | ආයතනයේ නම | පුහුණු විස්තර | පුහුණු වූ නිලධාරී සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය (ICTAD) | කොන්ත්‍රාත් කළමනාකරණ හා ප්‍රසම්පාදන කළමනාකරණ 2 පිළිබඳ පුහුණුව | 4 |
| | | ඵලදායි කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ සම්මන්ත්‍රණය | 22 |
| | | "ආරක්ෂාව හා විද්‍යාත්මකව වාහන පාවිච්චිය පිළිබඳ වැඩමුළුව" | 3 |
| | | පොදු පිලි ඩීසල් ඉන්ධන පද්ධතිය හා එංජින්/ විමෝචන පෙට්‍රෝල් ඉන්ධන පද්ධතිය පිළිබඳ වැඩමුළුව | 1 |
| | | සිද්ධි අධ්‍යයනය හා ලංසු මිල කිරීම් මගින් ලංසු ඇගයීම් වල ප්‍රායෝගික පැතිවලට මග පෙන්වීම පිළිබඳ වැඩමුළුව | 29 |

| අංකය | ආයතනයේ නම | පුහුණු විස්තර | පුහුණු වූ නිලධාරී සංඛ්‍යාව |
|---|---|---|---|
| | | ලංසු ඇගයීම පිළිබඳ ප්‍රායෝගික පැති පිළිබඳව වැඩමුළුව | 13 |
| | | "ගැටුම් නිරාකරණය විකල්ප යාන්ත්‍රණය" පිළිබඳ එක්දින සම්මන්ත්‍රණය | 7 |
| 2 | සි/ස. කුසලතා සංවර්ධන අරමුදල (SDFL) | මා සං අ නිලධාරීන්ට කුන්ඩසාලේ හා මාතරදී දෙමළ භාෂා පුහුණුව | 70 |
| | | මා සං අ නිලධාරීන්ට මඩකලපුව හා යාපනයේදී සිංහල භාෂා පුහුණුව | 70 |
| | | ආයතනමය කාර්යභාරය සඳහා උපායාත්මක සැලසුම්කරණය පිළිබඳ සම්මන්ත්‍රණය | 5 |
| | | "ඵලදායි අභ්‍යන්තර විගණනය" පිළිබඳ සම්මන්ත්‍රණය | 3 |
| | | සුළු සේවකයන් සඳහා පුහුණු වැඩ සටහන | 11 |
| | | "සාධනීය ආකල්ප හා පෞරුෂ වර්ධනය" පිළිබඳ සම්මන්ත්‍රණය | 13 |
| 3 | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) | ඉංජිනේරුවන්ගේ කළමනාකාරිත්වය වර්ධනය කිරීම පිළිබඳ වෘත්තීය සංවර්ධන වැඩ සටහන අඛණ්ඩව කරගෙන යාම | 7 |
| | | අන්තර් ජාතික තාක්ෂණික සම්මන්ත්‍රණය | 12 |
| | | "කොන්ත්‍රාත් පරිපාලනය" පිළිබඳ පාඨමාලාව | 3 |
| 4 | පේරාදෙණිය විශ්ව විද්‍යාලය | ඉදිකිරීම් කළමනාකරණය පිළිබඳ කෙටි පාඨමාලාව | 4 |
| | | භූ.තො.ප. හා භාවිතයන් | 5 |
| | | "ශුද්ධ පාලම් ව්‍යුහ විශ්ලේෂණය" පිළිබඳ පූර්ව සම්මේලන වැඩ මුළුව | 13 |
| | | "ඉදිකිරීම් කර්මාන්තය තුළ බේරුම්කරණය" පිළිබඳ වැඩමුළුව | 6 |
| | | "ඉදිකිරීම් කළමනාකරණය පිළිබඳ" පස් දින කෙටි පාඨමාලාව | 4 |
| 5 | මොරටුව විශ්ව විද්‍යාලය | ඇස්පල්ට් ඇතුරුම් ඉදිකිරීම් ගැන යහපත් භාවිතය පිළිබඳ පුහුණු වැඩ සටහන | 45 |
| | | රථවාහන කළමනාකරණය හා ආරක්ෂණය | 19 |
| | | 2011 ප්‍රවාහන සම්මන්ත්‍රණ තතිකාව හා මහාමාර්ග ඉංජිනේරු විද්‍යාව හා ප්‍රවාහන පද්ධතිය නැගීම පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය | 32 |
| | | "මාර්ග ආරක්ෂණය හා යටිතල ව්‍යුහ සැලසුම" පිළිබඳ පුහුණු වැඩ සටහන | 29 |
| | | "ඔබේ ජීවිත කාලය සඳහා මාර්ග" පුහුණු වැඩ සටහන | 6 |
| | | "ව්‍යාපෘති කළමනාකරණ භාවිතයන්" පුහුණු වැඩ සටහන | 4 |
| | | "ඉංජිනේරු සමීක්ෂණ සඳහා ටෝටල් ස්ටේෂන් හා ඔටෝ කැඩ්" පිළිබඳ පුහුණු වැඩ සටහන | 6 |
| | | "දියුණු කොන්ක්‍රීට් තාක්ෂණය " පිළිබඳ පුහුණු වැඩ සටහන | 8 |
| 6 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) | අරමුණුගත ව්‍යාපෘති සැලසුම්කරණය | 7 |
| | | ඵලදායිතා හා තත්ත්ව කළමනාකරණ තාක්ෂණයන් | 7 |
| 7 | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය | වීඩියෝ සම්මන්ත්‍රණ ක්‍රමය මගින් රාජ්‍ය නිලධාරීන් සඳහා "යථා තත්ත්වයට පැමිණීම" | 1 |
| 8 | ශ්‍රී ලංකා බදුකරණ ආයතනය | බදුකරණය පිළිබඳ සම්මන්ත්‍රණය | 26 |

| අංකය | ආයතනයේ නම | පුහුණු විස්තර | පුහුණු වූ නිලධාරී සංඛ්‍යාව |
|---|---|---|---|
| 9 | ඕපන් සිස්ටම් (පුද්) සමාගම | සැලසුම් ඉංජිනේරුවන්ට "ස්ටාඩ් ප්‍රෝ" පුහුණුව | 11 |
| 10 | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය (JICA) | "කොන්ත්‍රාත් පරිපාලනය" පිළිබඳ සම්මන්ත්‍රණය | 22 |
| 11 | ශ්‍රී ලංකාවේ පාරිසරික වෘත්තිකයන් පිළිබඳ ආයතනය (IEPSL) | "පාරිසරික බලපෑම් තත්ත්වය" පිළිබඳ පුහුණු වැඩ සටහන | 4 |
| 12 | එෆ් ඔබි නිකොල් ඉන්ටර්නැෂනල් පුද් සමාගම | "බෑවුම් ස්ථාවරත්වය හා මෘදු භූමි ගැටළු සඳහා තමන්සා පියෝගිඩ් විසඳුම්" පිළිබඳ සම්මන්ත්‍රණය | 3 |
| 13 | මුදල් හා සැලසුම් අමාත්‍යාංශයේ මූල්‍ය අධ්‍යයන ආයතනය | "රාජ්‍ය ප්‍රසම්පාදන කළමනාකරණය" පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන | 22 |
| 14 | ශ්‍රී ලංකා පදනම් ආයතනය | "සේවා විශිෂ්ඨත්වය තුළින් යහ පාලනය" | 1 |
| 15 | ශ්‍රී ලංකා සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය | "මිලදී ගැනීම්" පිළිබඳ පදනම් පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යය 2/2011 | 7 |
| 16 | ශ්‍රී ලංකා පදනම් ආයතනය | "ඵලදායි සංයුක්ත සැලසුම්කරණය" පිළිබඳ වැඩමුළුව | 6 |
| 17 | වාණිජ නීතිය හා භාවිතය පිළිබඳ ආයතනය | "ඉදිකිරීම් කර්මාන්තය තුළ තීරණයන් මගින් ඉදිරිගමන" පිළිබඳ සම්මන්ත්‍රණය | 11 |
| 18 | මනා ගබඩාකරණය හා ප්‍රවාහනය පිළිබඳ වරලත් ආයතනය | "ගෝලීය වාණිජ්‍ය තුල මනා ගබඩා සැපයුම්වල සාර්ථකත්වය" | 16 |
| 19 | ශ්‍රී ලංකා නීතිඥ සංගමය | වාර්ෂික ජාතික නීති සම්මන්ත්‍රණය - 2011 | 3 |
| 20 | ඩිජිටබල් ඉන්කෝපර්ස් එ.රා. එ.රා.ඉන්කෝපර්ස් යුඑස්ඒ, හා බෙන්ට්ලි සිස්ටම්ස් යුඑස්ඒ. | පෘථිවිතලය ගැණ තුන්වැනි මානය පිළිබඳ වැඩමුළුව / නිරූපණය / ඉදිරිපත් කිරීම. | 9 |
| ***එකතුව*** | | | ***610*** |

### *විශ්ව විද්‍යාලවල / ආයතනවල දිගු කාලීන පාඨමාලා හැදෑරීමට අවස්ථාවන්*

මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන්ට ඔවුන්ගේ විෂය දැනුම නැංවීම හා යාවත්කාලීන කිරීම සඳහා දේශීය විශ්ව විද්‍යාලවල / ආයතනවල පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීමට අවස්ථාව සපයන ලදි. මා සං අ යේ 19 දෙනෙකු ඉංජිනේරුපති / විද්‍යාපති / පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැනි දිගුකාලීන පාඨමාලා දේශීය විශ්ව විද්‍යාලවල / ආයතනවල හැදෑරීම සඳහා නම් කරනු ලැබීය.

***වගු අංක 34: දේශීය විශ්ව විද්‍යාල / ආයතන වල දිගුකාලීන පාඨමාලා සඳහා පුහුණු වීමේ අවස්ථා***

| අංකය | ආයතනය | පුහුණු විස්තර | නම් කල නිලධාරීන් ගණන |
|---|---|---|---|
| 1 | මොරටුව විශ්ව විද්‍යාලය | මාර්ග හා රථවාහන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා විද්‍යාපති උපාධිය 2011/2012 | 2 |
| | | ව්‍යුහාත්මක ඉංජිනේරු සැලසුම් පිළිබඳ ප.උ.ඩිප්ලෝමා / ඉංජිනේරුපති උපාධි පාඨමාලාව -2011/2012 | 3 |

| | | | |
|---|---|---|---|
| 2 | රුහුණු විශ්ව විද්‍යාලය | ව්‍යුහාත්මක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ සැලසුම් පශ්චාත් උපාධි ඩිප්ලෝමාව / විද්‍යාපති උපාධිය 2012/2013 | 1 |
| 3 | ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය | මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව | 3 |
| | | මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (සිංහල මාධ්‍යය) | 2 |
| | | මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (සිංහල මාධ්‍යය) | 5 |
| 4 | මුදල් හා සැලසුම් අමාත්‍යාංශයේ මූල්‍ය අධ්‍යයන පිළිබඳව අධ්‍යයන ආයතනය | රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමාව 2011/ 2012 | 3 |
| ***එකතුව*** | | | ***19*** |

***උපාධි අපේක්ෂකයන් හා ආධුනිකයන් සඳහා පුහුණු අවස්ථා.***

විශ්ව විද්‍යාලවල උපාධි අපේක්ෂයන්ට කාර්මික විද්‍යාලවල හා ආයතනවල ආධුනිකයන්ටද ඔවුන්ගේ යන්ත්‍රාගාර පුහුණුව ලබා ගැනීම සඳහා පුහුණු අංශය, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය හා (NAITA) සමඟ සහයෝගීව පුහුණු අවස්ථා ලබාදෙන ලදි.

***වගු අංක 35: විශ්ව විද්‍යාලවල / ආයතනවල උපාධි අපේක්ෂකයන් හා ආධුනිකයන් සඳහා පුහුණු අවස්ථා :***

| ***අංකය*** | ***දේශීය විශ්ව විද්‍යාල හා ආයතන*** | ***ශිෂ්‍ය සංඛ්‍යාව*** |
|---|---|---|
| 1 | තාක්ෂණික අධ්‍යනාංශය, කුරුණෑගල | 01 |
| 2 | ඉංජිනේරු අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය | 12 |
| 3 | ඉංජිනේරු තාක්ෂණ ආයතනය, කටුනායක | 28 |
| 4 | උසස් තාක්ෂණ ආයතනය, මහනුවර | 01 |
| 5 | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය (NAITA), රත්නපුර | 01 |
| ***එකතුව*** | | ***43*** |

**පුහුණු අංශය සංවිධානය කරන ලද වැඩබිම් චාරිකා**

මාර්ග සංවර්ධන අධිකාරියේ පුහුණු අංශය විසින් පහත සඳහන් පරිදි නිලධාරීන් සඳහා ඉදිකිරීම් වැඩබිම් වලට චාරිකා කිපයක් සංවිධානය කරන ලදි.

***වගු අංක 36: පුහුණු අංශය විසින් සංවිධානය කල චාරිකා.***

| ***අංකය*** | ***වැඩබිම් චාරිකා*** | ***සහභාගිවූ නිලධාරීන් ගණන*** |
|---|---|---|
| 1 | දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියට වැඩබිම් චාරිකා | 46 |
| 2 | කොළඹ-කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතියට වැඩබිම් චාරිකා | 44 |
| 3 | කම්හල් සැකසුම් ක්‍රියාවලිය පරීක්ෂා කිරීම හා වානේ වැරගැන්වීම් නිෂ්පාදන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන සඳහා ලංකා වානේ සංස්ථාවට වැඩබිම් චාරිකාව | 22 |
| ***එකතුව*** | | ***112*** |

**පුහුණු අංශය විසින් සංවිධානය කරන ලද වැඩමුළු හා සම්මන්ත්‍රණ**

මාර්ග සංවර්ධන අධිකාරියේ පුහුණු අංශය විසින් වර්ෂය තුළ සම්මන්ත්‍රණ ගණනාවක් සංවිධානය කරන ලදි.

***වගු අංක 37: පුහුණු අංශය විසින් සංවිධානය කරන ලද වැඩමුළු හා සම්මන්ත්‍රණ***

| *අංකය* | *විස්තරය* | *සහභාගිවන්නන් ගණන* |
|---|---|---|
| 1 | මාබේ හා ජොන්සන් (පුද්) සමාගමේ සහාය ඇතිව එක්සත් රාජධානි ආධාරයෙන් ප්‍රාදේශීය ව්‍යාපෘතිය යටතේ, ඉදිකරන ලද වානේ පාලම් හා ගුවන් පාලම් පිළිබඳ පුහුණු පාඨමාලාව | 177 |
| 2 | මා සං අ යේ අධිවේගී මාර්ග පරිපාලන ව්‍යාපෘතියට අළුතින් බඳවාගන්නා ලද නිලධාරීන්ට ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයන්ගේ සහාය ඇතිව ගාස්තු අයකිරීම, රථවාහන කළමනාකරණය හා වාහන මෙහෙයුම පිළිබඳ පුහුණු වැඩ සටහන | 300 |
| *එකතුව* | | *477* |

**විදේශ පුහුණුව**

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්ෂික තාක්ෂණික සහාය වැඩ සටහන පදනම් කරගෙන ආයතනයේ වාර්ෂික විදේශ පුහුණු අවශ්‍යතා පිළියෙල කර වි.සං.දෙ.ට ඉදිරිපත් කිරීම 2011 වර්ෂය තුළ විදේශ පුහුණු පාඨමාලා වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා නිලධාරීන් 25 දෙනෙකු නම්කර යවන ලදි.

***වගු අංක 38: විදේශ පුහුණුව පිළිබඳ විස්තර***

| **අංකය** | **රට** | **පුහුණුව පිළිබඳ විස්තර** | **සහභාගිවූ නිලධාරීන් ගණන** |
|---|---|---|---|
| 1 | තායිලන්තය | තිරසර මාර්ග සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩ සටහන 2011 ඔක්තොම්බර් 03 සිට 21 දක්වා | 2 |
| | | ජාතික ක්‍රියාකාරි කම්කරු අයිතීන් සඳහා ක්‍රියාකාරි වැඩ සටහන් 11 අනුව ITCU-AP උපායාත්මක සැලසුම් වැඩමුළුව 2011 අගෝස්තු 23 සිට 25 දක්වා | 1 |
| 2 | සිංගප්පූරුව | සිංගප්පූරු සහයෝගිතා වැඩ සටහන් පුහුණු ප්‍රදාන - නාගරික රථවාහන හා ආකීර්ණතා කළමනාකරණය 2011 පෙබරවාරි 22 සිට මාර්තු 04 දක්වා | 1 |
| | | වානේ කම්බි පිළිබඳ පරීක්ෂණය නැරඹීම 2011 මාර්තු 14 සිට 19 දක්වා | 1 |
| | | රාජ්‍ය අංශයේ විශිෂ්ඨත්වය සඳහා ප්‍රතිඵල කළමනාකරණය පිළිබඳව පුහුණු වැඩ සටහන 2011 මාර්තු 16 සිට 19 දක්වා | 1 |
| | | ආසියාවේ උමං සැලසුම් හා ඉදිකිරීම 2011 ජුනි 22 සිට 23 දක්වා | 1 |
| 3 | ජපානය | "ජපන් වි සං ආ ණය ව්‍යාපෘතිය සඳහා පාරිසරික හා සාමාජීය සැලසුම් ක්‍රියාවලිය" පිළිබඳ වැඩමුළුව 2011 ජුනි 19 සිට ජූලි 02 දක්වා | 1 |

| අංකය | රට | පුහුණුව පිළිබඳ විස්තර | සහභාගිවූ නිලධාරීන් ගණන |
|---|---|---|---|
| | | ආසියානු රටවල් සඳහා රාජ්‍ය වැඩ ව්‍යාපෘතිවල මහජන සහභාගිත්වය මතය ගොඩ නැගීම හා ප්‍රතිස්ථාපනය 2011 අගෝස්තු 28 සිට සැප්තැම්බර් 29 දක්වා | 2 |
| | | ආපදා පාලන පියවරයන් හා හානිවූ යටිතල ව්‍යුහයන් ප්‍රතිසංස්කරණ වැයම පිළිබඳ සම්මන්ත්‍රණය 2011 දෙසැම්බර් 4 සිට 10 දක්වා | 1 |
| 4 | ඉන්දියාව | ලෝක බැංකු අරමුදල් ව්‍යාපෘති සඳහා ලෝක බැංකු ප්‍රසම්පාදන පරිපාටිය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩ සටහන් 2011 සැප්තැම්බර් 19 සිට 30 දක්වා | 2 |
| | | ඇස්පල්ට් මිශ්‍රණ කාර්ය පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව බැංගලෝර් හා නව දිල්ලිය 2011 මාර්තු 2 සිට 4 දක්වා | 5 |
| | | කාර්මික හා යටිතල ව්‍යුහ ව්‍යාපෘති පිළියෙල කිරීම හා ඇගයීම පිළිබඳ පුහුණු වැඩ සටහන 2011 පෙබ. 21 සිට මාර්තු 31 දක්වා | 1 |
| 5 | හොංකොං | ආසියාවේ පාලම් 2011 සම්මන්ත්‍රණය 2011 පෙබ. 22 සිට 24 දක්වා | 2 |
| 6 | චීනය | චීන එක්සිම් බැංකු හා චීන සංවර්ධන බැංකු අරමුදල් යෙදූ ව්‍යාපෘති: මාර්ග ඉදිකිරීම් වැඩබිම් වලට චාරිකා 2011 නොවැ. 28 සිට දෙසැ. 08 දක්වා | 3 |
| 7 | කොරියාව | KEC ජාත්‍යන්තර පුහුණු වැඩ සටහන 2011 ඔක්. 11 සිට 21 දක්වා | 1 |
| **එකතුව** | | | **25** |

## 4.19 නීති සේවා

මාර්ග සංවර්ධන අධිකාරියේ නීති අංශය 2008 අංක 40 දරණ නව මංමාවත් පනතේ 42(1) හා 50(3) වගන්ති යටතේ, නඩු ගොනු කිරීම පිළිබඳ වගකීම දරයි. නීති අංශය විවිධ පළාත්වල මහේස්ත්‍රාත් නඩු 199 ක් ගොනුකර මාර්ග සංවර්ධන අධිකාරියට වාසිදායක ලෙස නියෝග ලබා ගැනීමට හැකිවිය. මෙය මා සං අ ට අනාගත සංවර්ධනය සඳහා මාර්ග රක්ෂිතය නිදහස් කර ගැනීමටත්, ගොඩනැගිලි සීමාව නිදහස් කර ගැනීමටත් උපකාරී වේ.
තවද නීති අංශය මා සං අ ට අයත් දේපළවලට හානි සිදුකල පුද්ගලයන්ගෙන්, 2011 වර්ෂය තුළ රුපියල් හාරලක්ෂ හැට හත් දහස් හාරසිය හැත්තෑ අටක (රු.467, 478.00) මුදලක් එකතු කර ගන්නා ලදි.

2011 වර්ෂය තුළ මා සං අ ට එරෙහිව හා මා සං අ විසින් ගොනු කරනු ලැබූ නඩු පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

***වගු අංක 39: 2011 වර්ෂය තුළ පවරන ලද නඩු***

| **විස්තරය** | **31.12.2010 දක්වා සමුච්චිත ගණන** | **2011 දී මා.සං.අ.ට එරෙහිව ගොනු කල නඩු** | **2011 මා.සං.අ.බාහිර පාර්ශවයන්ට එරෙහිව පැවරූ නඩු** | **2011 නිමකල නඩු** | **2011 අවසානයේ එකතුව** |
|---|---|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 02 | 03 | | 02 | 03 |
| අභියාචනාධිකරණය | 13 | 14 | | 09 | 18 |
| දිස්ත්‍රික් අධිකරණය | 93 | 26 | | 28 | 91 |
| මහාධිකරණය | 11 | 14 | 01 | 11 | 15 |
| කම්කරු විනිශ්චය සභාව | 06 | | | 05 | 01 |
| මානව හිමිකම් කොමිෂම | 02 | 06 | | 06 | 02 |
| මහේස්ත්‍රාත් අධිකරණය | 73 | | 211 | 138 | 146 |
| **එකතුව** | **200** | **63** | **212** | **199** | **276** |

## 4.20 ප්‍රසම්පාදන සේවා

මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන අංශය 2011 වර්ෂය තුළ වගු අංක 39 දැක්වෙන පරිදි රු:මි. 234 ක් වටිනා මාර්ග හා පාලම් කොන්ත්‍රාත් 6 ක් සඳහා ටෙන්ඩර් ලේඛන පිළියෙල කිරීම හා සැලසුම් කිරීම සඳහා සහාය විය. මා සං අ සඳහා රු: මි. 23 ක පාරිභෝගික හා ලිපිද්‍රව්‍ය මිලදී ගන්නා ලදි. මා සං අ යේ ආදායමට හා කාරක ප්‍රාග්ධනය සඳහා රු: 1, 445, 080.00 මුදල් එකතුවක් දායක විය.

***වගු අංක 40: මාර්ග හා පාලම් ඉදිකිරීම - තක්සේරු වර්ෂය 2011***

| **විස්තර** | **කොන්ත්‍රාත් අගය (රු:)** | **ප්‍රදානය කල දිනය** |
|---|---|---|
| දෙනිකිතව-අඹන්පොල මාර්ගය වැඩි දියුණු කිරීම (කි.මි.5+000 – 9+000 දක්වා) | 35, 912, 372.50 | 2011 ජනවාරි 07 |
| සමන්තුරේ-මල්කම්පිටි-දිඝවාපි මාර්ගය පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම (කි.මි 9+000 – 10+000 දක්වා) | 16, 110, 360.28 | 2011 පෙබරවාරි 07 |
| රිදීගම-ලිහිනිවෙහෙර මාර්ගය පාලම් අංක 2/3 යළි ඉදිකිරීම | 48, 962, 650.36 | 2011 පෙබරවාරි 18 |
| රඹුක්කන-කටුපිටිය මාර්ගය පාලම් අංක 2/3 යළි ඉදිකිරීම | 48, 346, 050.40 | 2011 පෙබරවාරි 28 |
| කහටගස්දිගිලිය-රත්මල්ගහවැව-කිවුලේකඩ මාර්ගය (කි.මි.0+000 – 13+000 දක්වා) DBST කිරීම | 59, 690, 244.29 | 2011 මාර්තු 22 |

| විස්තර | කොන්ත්‍රාත් අගය (රු:) | ප්‍රදානය කල දිනය |
|---|---|---|
| වවලකඩේ-වඩයන්තලාව මාගීය (කි.මී. 6+000 – 7+830 දක්වා) පුළුල් කිරිම | 25, 094, 081.25 | 2011 මාර්තු 22 |
| **මුළු එකතුව** | **234, 115, 759.08** | |

## 4.21 පිරිස් කළමනාකරණය

මාගී සංවර්ධන අධිකාරියේ පරිපාලන අංශය විසින්, ප්‍රධාන කාර්යාලිය මට්ටමින් පිරිස් පාලන කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි. වර්ෂය ආරම්භයේදි බඳවා ගැනිම් පරිපාටියේ හා සේවක සංඛ්‍යා දර්ශක අවශ්‍යතා අනුව බඳවා ගැනිම හා උසස්විම් පිළිබඳව වාර්ෂික වැඩ සටහන තිරණය කරනු ලැබේ.

2011 වර්ෂය තුළ ක්‍රියාත්මක කල කටයුතු පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

- වර්ෂය තුළ සේවකයන් 870 ක් බඳවා ගනු ලැබිය.
- නිලධාරින් / සේවකයන් 314 ක් සඳහා අභ්‍යන්තර උසස්විම් ප්‍රදානය කරන ලදි.
- සේවක සංඛ්‍යා දර්ශක අනුපාතය අනුව නිලධාරින් / සේවකයන් 111 ක් සඳහා ශ්‍රේණි උසස්විම් ලබාදිමට සම්මුඛ පරික්ෂණ පවත්වන ලදි.
- ශ්‍රේණි උසස්විම් සඳහා ඉංජිනේරුවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබිය.
- දක්ෂිණ අධිවේගි මාගීය විවෘත කිරිමේ 2011.11.27 දින උත්සවය සංවිධානය කරන ලදි.
- කෙටුම්පත් බඳවා ගැනිමේ පරිපාටිය 95% ක් නිමකරන ලදි.
- වාර්ෂික ස්ථානමාරු අයදුම්පත් කැඳවා ස්ථානමාරු මණ්ඩලය පත්කර මණ්ඩලය විසින් ස්ථාන මාරු නිර්දේශ කරන ලදි.
- විදේශ ශිෂ්‍යත්ව / පුහුණු වැඩමුළු ප්‍රදානය කරන ලද නිලධාරින් 59 ක් සඳහා අතිගරු ජනාධිපතිතුමා, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා ගරු අමාත්‍යතුමන් වෙතින් අනුමැතිය ලබාගනු ලැබිය.
- පරිපාලන අංශයේ අධ්‍යක්ෂ (පාලන) ගේ ප්‍රධානත්වයෙන් කාර්ය මණ්ඩල රැස්විම් 8ක් පවත්වනු ලැබිණි.
- වර්ෂය තුළ පවත්වන ලද ප්‍රදර්ශන 2 ක් සඳහා මා සං අ වෙනුවෙන් ප්‍රදර්ශන කුටි ඉදිකිරිමේ යෙදුණි.
- අංශයේ සියලුම කාර්ය මණ්ඩලය සඳහා කුසලතා වර්ධන වැඩ සටහන් සංවිධානය කරනු ලැබිය.
- නිලධාරින් / සේවකයන් 21 කට රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු අනුමත කරන ලදි.
- සේවකයන් 73 ක් සඳහා ස්වයං ජිවිත රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ රු: 9,903,140.35 ක ප්‍රතිලාභ ගෙවනු ලැබිය

- සේවකයන් 70 ක් සඳහා සේවක අර්ථසාදක අරමුදල් හා සේවකයන් 98 ක් සඳහා සේවක භාරකාර අරමුදල් ප්‍රතිලාභ ගෙවීමට සහාය විය.
- නිලධාරීන් / සේවකයන් 43 ක් විශ්‍රාම ගැන්වීම පිළිබඳව පියවර ගනු ලැබිය.
- නිලධාරීන් / සේවකයන් 21 ට සේවය හැරයාමේ නිවේදන නිකුත් කරන ලදි.
- නිලධාරීන් / සේවකයන් 26 දෙනෙකු තනතුරු වලින් ඉල්ලා අස්විය.
- පරිපාලන චක්‍රලේඛ 11 ක් සහ පරිපාලන චක්‍රලේඛ ලිපි 71 කුත් නිකුත් කෙරිණි.
- වෙළඳ තිරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත තිරුබදු රහිත වාහන අයදුම්පත් 300 ක් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබිය.
- විනය පරීක්ෂණ 13 ක් නිමකළ අතර 17 ක් ආරම්භ කරන ලදි.
- සේවකයන් 63 දෙනෙකුට රුː.22, 256, 314.44.00 පාරිතෝෂික මුදල් ගෙවනු ලැබිය.
- භාෂා දිමනාව සේවකයන් 75 දෙනෙකුටද අතිරේක වැටුප් වර්ධක දිමනාව සේවකයන් 41 දෙනෙකුටද ගෙවන ලදි.
- සේවකයන් වෙත පහත දැක්වෙන ණය මුදල් ප්‍රදානය කරන ලදි.
  - සේවකයන් 473 දෙනෙකුට ආපදා ණය මුදල් සඳහා රුː.77, 491, 815.00
  - සේවකයන් 32 දෙනෙකුට පාපැදි ණය සඳහා රුː 320, 000.00
  - සේවකයන් 324 දෙනෙකුට ගංවතුර ආධාර ණය මුදල් සඳහා රුː21, 595, 470.00

***වගු අංක 41: පසුගිය අවුරුදු 5 තුළ බඳවාගත් සේවක සංඛ්‍යාව***

| වර්ෂය | සේවක සංඛ්‍යාව |
|---|---|
| 2007 | 337 |
| 2008 | 127 |
| 2009 | 286 |
| 2010 | 441 |
| 2011 | 870 |

වැඩ සටහන් ගත කරන ලද කටයුතු බොහොමයක් ඉටුකරන ලදි. 2011 වර්ෂය තුළ බඳවාගත් සේවකයන් පහත වගු අංක 42 න් දැක්වේ.

***වගු අංක 42:*** **2011 වර්ෂය තුල බඳවාගත් සේවකයන් පිළිබඳ විස්තර.**

| තනතුර | සේවක සංඛ්‍යාව |
|---|---|
| සිවිල් ඉංජිනේරු | 80 |
| කාර්යාල සේවක | 58 |
| කාර්යාල කම්කරු | 10 |
| සහායක | 04 |
| ගබඩාකරු | 01 |

| තනතුර | සේවක සංඛ්‍යාව |
|---|---|
| ස්ක්‍රිඩමන් | 15 |
| කළමනාකරණ සහකාර (උපාධිධාරී) | 05 |
| සැහැල්ලු වාහන රියැදුරු | 83 |
| පාලන මැදිරි ක්‍රියාකරු | 13 |
| මුර සංචාරක | 36 |
| අයකැමි | 240 |
| ප්‍රධාන අයකැමි | 24 |
| සහකාර අයකැමි අධිකාරී | 13 |
| අයකැමි අධිකාරී | 04 |
| සහායකයන් | 29 |
| විදුලි කාර්මික | 03 |
| කළමනාකරණ සහකාර | 101 |
| පරිගණක තාක්ෂණ ශිල්පී | 02 |
| කාර්මික | 03 |
| පර්යේෂණ සහකාර | 03 |
| සංචාරක නිවාස භාරකරු | 01 |
| සැලසුම් ශිල්පී | 01 |
| මුරකරු | 25 |
| වැඩ පරිපාලක | 63 |
| පින්තාරුකරු | 01 |
| සැහැල්ලු උපකරණ ක්‍රියාකරු | 34 |
| යාන්ත්‍රික අධිකාරී | 01 |
| රසායනාගාර සහායක | 03 |
| රථවාහන සංගණන ශිල්පී | 02 |
| කාර්මික නිලධාරී | 12 |
| **එකතුව** | **870** |

## 4.22 මූල්‍ය කළමනාකරණය

මාර්ග සංවර්ධන අධිකාරියේ මුදල් අංශය 2011 වර්ෂය තුළ ආදායම් රැස් කිරීම හා ගෙවීම් කටයුතු සතුටුදායක ලෙස ඉටුකරන ලද අතර, මාර්ග සංවර්ධන අධිකාරියේ ගිණුම් වාර්තා නිතිපතා යාවත්කාලීන කරන ලදි, වියදම් ප්‍රකාශනයන් හා වාර්තා නියමිත වේලාවට අමාත්‍යාංශය හා භාණ්ඩාගාරය වෙත යවනු ලැබීය. සේ.අ.අ., සේ.භා.අ. හා බදු ගෙවීම් නියමිත දිනට හෝ ඊට පෙර සිදුකල අතර, වාර්තාද යවන ලදි.

විමසුමට භාජනය වූ වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරියේ වැඩ හා සාමාන්‍ය නඩත්තු වියදම් (පොදු කාර්ය වියදම්) පිළිබඳ සමස්ත මූල්‍ය සාධනය පහත දැක්වේ.

***වගු අංක 43: 2011 වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරියේ සමස්ත මූල්‍ය සාධනය***

| ***වර්ගය*** | ***ප්‍රතිපාදන (රු:) මිලියන*** | ***ලැබුනු අරමුදල් හා වියදම (රු) මිලියන*** | ***සාධනයේ ප්‍රතිශතය (%)*** |
|---|---|---|---|
| මාර්ග වැඩ | 29, 646.70 | 26, 734.60 | 90.5 |
| මා.සං.අ. යේ පොදු නඩත්තුව | 3, 343.40 | 3, 343.40 | 100.0 |
| **එකතුව** | **32, 990.10** | **30, 078.00** | **91.2** |

***වගු අංක 44: මාර්ග සංවර්ධන අධිකාරියේ 31.12.2011 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ සාරාංශය***

| | ***(රු:) මිලියන*** | |
|---|---|---|
| | ***2010*** | ***2011*** |
| ***වත්කම්*** | | |
| ජංගම නොවන වත්කම් | 2, 018.50 | 1, 777.60 |
| ජංගම වත්කම් | 8, 417.80 | 12, 583.50 |
| **සමස්ත වත්කම්** | **10, 436.30** | **14, 361.10** |
| ***ස්කන්ධ හා වගකීම්*** | | |
| ප්‍රාග්ධනය හා ආදායම | (4, 029.10) | (4, 425.90) |
| ජංගම නොවන වගකීම් | 1, 711.20 | 1, 754.10 |
| ජංගම වගකීම් | 12, 754.20 | 17, 032.90 |
| **සමස්ත ස්කන්ධ හා වගකීම්** | **10, 436.30** | **14, 361.10** |

- මුදල් අංශයේ ආදායම් ඒකකය විසින් රු: මිලියන 594.20 ක ආදායමක් උපයා ගැනීමට සමත්වූ අතර, සේවා සැපයීමෙන් හා යන්ත්‍ර කුලී වලින් උපයන ලද රු:මිලියන 494.00 ද ඇතුලත් විය. ආදායම වෙන්කිරීම මුදල් අංශයේ ආදායම් ඒකකය මගින් සිදුකරන ලද අතර, ඒකකය විසින්, අරමුදල් කළමනාකරණයද මෙහෙයවන ලදි. මෙම ඒකකය වර්ෂය තුළ රු: මිලියන 55 ක පොලියක් අරමුදල් කළමනාකරණ කටයුතුවලින් උපයාගන්නා ලදි. තවද 2011.11.27 (විවෘත කල දිනය) සිට 2011.12.31 දක්වා දක්ෂිණ අධිවේගි මාර්ගයේ ගාස්තු ආදායම රු: මිලියන 74.90 ක් විය.
- එමෙන්ම, මුදල් අංශයේ වැටුප් ඒකකය සේවකයන් 4900 ක් සඳහා වැටුප් පිළියෙල කල අතර, සේ.අ.අ. හා සේ.භා.අ. වාර්තා පවත්වාගෙන යෑම සිදුකරනු ලැබීය. මෙම ඒකකය සේවක ණය ගෙවීම හා අයකර ගැනීමේ ක්‍රියාවලියේද යෙදුණි.
- මුදල් අංශයේ වත්කම් හා ගබඩා අංශය විසින්, ප්‍රධාන කාර්යාලයේ අංශවලට හා ඇතැම් විට ප්‍රාදේශිය කාර්යාලවලටද උපකරණ හා ලිපිද්‍රව්‍ය සැපයීමේ යෙදුණි, තවද මෙම ඒකකය තොග පාලනය කටයුතු ඉටුකල අතර, ලිබඩු, යන්ත්‍ර, ඉඩම් හා ගොඩනැගිලි ඇතුළු සියලු වත්කම් ලේඛන පවත්වාගෙන යන ලදි. දිවයින පුරා ස්ථාවර වත්කම් සමීක්ෂණය වාර්ෂිකව පවත්වනු ලැබීය. 2011 භාණ්ඩ සමීක්ෂණය 2011 ඔක්තෝම්බර් මස ආරම්භ කර නියමිත පරිදි නිමකෙරිණි. තොග හා ලේඛන ගත භාණ්ඩවල භෞතික සමීක්ෂණයද වර්ෂ අවසානයේ ආරම්භ කර නිමකරන ලදි.
- මුදල් අංශයේ අවසාන ගිණුම් ඒකකය මා.සං.අ. සඳහා අවසාන ගිණුම් පවත්වාගෙන යාමෙන් කළමනාකාරිත්වයට මූල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමටත් කටයුතු කරන ලදි. මෙම ඒකකයට මුදල් අංශයේ ප්‍රාදේශිය ගිණුම් ඒකකය හරහා පළාත් කාර්යාලවල ආදායම් හා ගෙවීම් විස්තර ප්‍රධාන කාර්යාලයේ ආදායම් හා ගෙවීම් දත්ත ගිණුම් ගත කිරීම සඳහා ලැබේ. අංශයේ ගිණුම් පිළියෙල කිරීම සඳහා ගිණුම් මෘදුකාංගාවලිය පාවිච්චි කරන ලදි.
- ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශිය ගිණුම් ඒකකයේ වැඩ සඳහා මුදල් අග්‍රිමය පොදු කාර්යය පිරිවැය නිදහස් කිරීමෙන් ඔවුන්ගේ ලැබීම් ලබා ගැනීමෙන් සියලුම ප්‍රාදේශිය ගණකාධිකාරින් සම්බන්ධිකරණය කරන ලදි. ඒවා ප්‍රාදේශිය ගිණුම් ඒකක විසින් පවත්වා ගෙන යන ගිණුම් වාර්තා සමඟ සැසඳුම් කර ගිණුම් ගත කිරීම සඳහා අවසාන ගිණුම් ඒකකයට ඉදිරිපත් කෙරිණි.
- මුදල් අංශයේ ව්‍යාපෘති ඒකකය මා.සං.අ.වැඩ අංශය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවලට අදාල කොන්ත්‍රාත්කරුවන්ගේ ඉන්වොයිස් / බිල්පත් නිරවුල් කිරීමේ කටයුතුවල යෙදුනි. විමසුමට භාජනය වූ වර්ෂය තුළ ආසන්න වශයෙන් ව්‍යාපෘති / කොන්ත්‍රාත් 1024 කට අදාල රු:බිලියන 14.9 ක බිල්පත් නිරවුල් කරන ලදි.
- මුදල් අංශයේ ගෙවීම් ඒකකය ප්‍රධාන කාර්යාලයේ අංශයට අදාළ සියලුම ගෙවීම් නිරවුල් කිරීම සිදුකරන ලදි. (මාර්ග සංවර්ධන අධිකාරියේ වැඩ අංශයට අයත් බිල්පත් ගෙවීම් කටයුතුවල යෙදෙන්නේ ව්‍යාපෘති ඒකකයයි) මෙම ගෙවීම්වලට සිවිල් වැඩ සඳහා ගෙවීම්, ඉන්ධන, උපකරණ, වාහන, බදුකුලී, කාර්යාල අවශ්‍යතා, කාර්ය මණ්ඩල වැටුප්, ණය ආදිය ඇතුළු පොදු කාර්ය වියදම් අයත් වේ.

- මුදල් අංශයේ, අයවැය හා බදු ඒකකයට මා සං අ යේ පොදු කාර්ය වියදම් අයවැය හා වැටි, ජා.තො.බ. හා ආදායම් බද්ද ඇතුළු මා සං අ යේ බදු කටයුතු පවරා ඇත.
- මුදල් අංශයේ පරිපාලන ඒකකය අංශය තුළ සේවකයන් 84 කට සම්බන්ධ පරිපාලන කටයුතුවල යෙදීමෙන් මුදල් අංශයට සහාය ලබා දෙන ලදි. පෞද්ගලික ලිපිගොනු, නිවාඩු වාර්තා පවත්වාගෙන යාම, වාර්ෂික වැටුප් වර්ධක ලබාදිම යන හා එන ලිපි පිළිබඳ කටයුතු කිරීම පරිපාලන ඒකකයේ කාර්යයන් සමහරක් විය.
- 2011 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදි.

## 4.23 අභ්‍යන්තර විගණන කාර්ය සාධනය

මාර්ග සංවර්ධන අධිකාරියේ විගණන අංශය, විමසුමට භාජනය වූ වර්ෂය තුළ කළමනාකාරිත්වය විසින් අනුමත කරන ලද විගණන වැඩ සටහන් ප්‍රධාන කොටස ක්‍රියාත්මක කරන ලද අතර, ව්‍යාපෘතිවල කටයුතු, සෘජු කම්කරු වෙක්රෝල්පත් වැඩ ඒකක මෙන්ම, ඇස්තමේන්තු, කොන්ත්‍රාත්, විචල්‍ය නියෝග, චක්‍රලේඛ, පිරිස් ලේඛන හා බැංකු සැසඳුම් ප්‍රකාශන වැනි ලේඛන පරීක්ෂා කරන ලදි.

අභ්‍යන්තර විගණන අංශය වෙත සභාපති හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යොමුකරන ලද විවිධ පෙත්සම්, පැමිණිලි හා වෙනත් කරුණු පිළිබඳව විමර්ශන පවත්වන ලද අතර, නිගමන හා සුදුසු පියවර ගැනීම සඳහා නිර්දේශ සහිතව වාර්තා ඉදිරිපත් කරන ලදි.

සියලුම ව්‍යාපෘති කළමනාකරණ ඒකක පිළිබඳව විගණනයද අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරන ලදි. මෙය ඉදිකිරීම් කාලසීමාව තුල හා ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව එහෙත් වගකීම් කාලය තුළ මාර්ග පරීක්ෂාවන් ආවරණය විය. විමර්ශනයන් ඇතුළු මෙහෙයුම් හා මූල්‍ය විගණනයන් ස්වාධීන වෘත්තිමය අයුරින් සිදුකරන ලදි. අභ්‍යන්තර විගණන ප්‍රගති වාර්තාව වගු අංක 45 යටතේ දක්වා ඇත.

***වගු අංක 45: 2011 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන ප්‍රගති වාර්තාව පිළිබඳ සාරාංශය***

| | ***වැඩ සටහන*** | ***නිමකළ*** | ***ඉටුකරන ලද ප්‍රතිශතය*** |
|---|---|---|---|
| මූල්‍ය හා කළමනාකරණ විගණනය | | | |
| පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලය | 10 | 10 | |
| ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය | 14 | 13 | |
| විධායක ඉංජිනේරු කාර්යාලය | 26 | 26 | |
| යන්ත්‍රාගාර | 04 | 04 | |
| එකතුව | 54 | 53 | 98 |
| ක්ෂේත්‍ර විගණනයන් | | | |
| ප්‍රධාන ඉංජිනේරු දිස්ත්‍රික්ක | 24 | 22 | 92 |
| අංශ හා ඒකක | | | |
| මා.සං.අ.යේ අංශ සහ ඒකක | 15 | 15 | 100 |
| ව්‍යාපෘති කළමනාකරණ ඒකක | | | |
| මාර්ග ව්‍යාපෘති | 08 | 07 | |
| පාලම් | 06 | 06 | |
| කාර්යාල | 12 | 12 | |
| එකතුව | 26 | 25 | 96 |
| **සම්පූර්ණ වැඩ සටහන් ගණන** | **119** | **115** | **97** |
| අතිරේකව ඉටුකරන ලද වැඩ | | | |
| විමර්ශන | 0 | 29 | |



# ප්‍රගතියට බාධාවන්

# 5 වැනි පරිච්ඡේදය
# ප්‍රගතියට බාධාවන්

## 5.1 මාර්ග හා පාලම් කටයුතු ක්‍රියාත්මක කිරීම

මාර්ග හා පාලම් වැඩ ඉටුකිරීමේදී පහත දැක්වෙන බාධාවන්ට මුහුණ දීමට සිදුවිය.

- එක් ප්‍රධාන බාධාවක් වන්නේ, භාණ්ඩාගාරය විසින් මුදල් අග්‍රිමය නිදහස් කිරීමේ ප්‍රමාදයන් සිදු වීමයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මා.සං.අ. ට කොන්ත්‍රාත්කරුවන්ගේ මාසික වැඩ බිල් නියමිත වේලාවට නිරවුල් කළ නොහැකි විය. මෙය ව්‍යාපෘති වැඩවල ප්‍රගතියට අහිතකර ලෙස බලපෑ අතර, කොන්ත්‍රාත් මිල පිරිවැය අධික විය.
- ඉඩම් අත්පත් කර ගැනීමේදී ගතවූ අමතර කාලය නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අනවශ්‍ය ප්‍රමාදයක් සිදු විය.
- ප්‍රයෝජ්‍ය සේවා ප්‍රතිස්ථානගත කිරීමේදී සිදුවූ ප්‍රමාදයන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයට බලපෑවේය.
- ප්‍රදේශයේ වෙනත් සංවර්ධන වැඩ වලට ඉඩ ලබාදී කටයුතු කිරීමෙන් ව්‍යාපෘති වැඩ විෂය වෙනස් වීම බාධාවක් බවට පත්විය.
- වැඩ බිම්වල බලාපොරොත්තු නොවූ භූමි තත්ත්වයන් වැඩවල ප්‍රගතියට අහිතකර ලෙස බලපෑවේය.
- අහිතකර කාලගුණික තත්ත්වයන්ද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට බලපානු ලැබීය.
- ග්‍රාමීය පාලම් ඉදිකිරීමේදී පහත දැක්වෙන බාධාකාරී තත්ත්වයන්ට මුහුණදීමට සිදුවිය.
  - අ) ග්‍රාමීය පාලම් ඉදිකිරීම සඳහා පළාත්වල සෘජු ශ්‍රමය හා අධීක්ෂණ / කාර්මික කාර්ය මණ්ඩලයේ හිඟය.
  - ආ) පාලම් වැඩබිම් කරා ද්‍රව්‍ය හා උපකරණ ප්‍රවාහනය කිරීමේ දුෂ්කරතාවය (පටු මාර්ග)
  - ඇ) පාරු හා ටැබ් බැස්සීමේ උපකරණ වැනි ඉදිකිරීම් උපකරණවල හිඟය.
  - ඈ) අඟුලාන කාර්යාලයේ වැඩ කිරීමේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම.
  - ඉ) පරිගණක වැනි කාර්යාල උපකරණ ප්‍රමාණවත් නොවීම
  - ඊ) ග්‍රාමීය ප්‍රදේශවල අධීක්ෂණ වැඩ සඳහා පාවිච්චිය හොඳ තත්ත්වයේ වාහන නොමැතිවීම.

***අනුගමනය කරන ලද හා යෝජනා කරන ලද ප්‍රතිකර්ම පියවරයන්***

- කොන්ත්‍රාත් ගිවිසුම් කොන්දේසි පදනම් කරගෙන මා.සං.අ.විසින් කොන්ත්‍රාත්කරුවන්ගේ කාලය දීර්ඝ කිරීමක් සිදුකර, ප්‍රමාද වූ ගෙවීම් සඳහා පොලී මුදලක් ගෙවනු ලැබීය.
- ග්‍රාමීය පාලම් ඒකකයේ කාර්යාල අවකාශය පුළුල් කිරීම.
- අවශ්‍ය යන්ත්‍ර මිලදී ගැනීම.

## 5.2 සැලසුම්කරණය හා වාර්තාකරණය

දත්ත රැස් කිරීමේදි හා ඇගයීම් කටයුතුවලදි පහත දැක්වෙන බාධාවන්ට මුහුණ දීමට සිදුවිය.

- තද වැසි වැනි හදිසි කාලගුණික වෙනස්වීම්
- බලාපොරොත්තු නොවූ වාහන බිඳ වැටීම්
- රථවාහන ගණන උපකරණවල අනපේක්ෂිත දෝෂ ඇතිවීම
- සාමාන්‍ය පරිදි සැලසුම් කළ පරික්ෂණවලට අමතරව හදිසි දත්ත රැස් කිරීමේ සමීක්ෂණ පැවැත්වීම.

තවද අංශයෙන් උපරිම නිමැවුමක් ලබා ගැනීමට හා ඉටුකරන කාර්යයන් වල ගුණාත්මක භාවය නැංවීම සඳහා සැලසුම් අංශය ශක්තිමත් කිරීම අවශ්‍ය වේ. ඒකක 04 තුළ පුහුණු කාර්ය මණ්ඩලය හිඟ බැවින්, පොදුවේ අංශයේ දෛනික කටයුතුවලට හා විශේෂයෙන් මනා ක්‍රියාකාරීත්වයට සහ සෑම ඒකකයටම පැවරුනු කාර්යයන් අඛන්ඩව ඉටු කිරීමේදි අහිතකර ලෙස බලපානු ලබයි.

දත්ත රැස් කිරීමේ හා ඇගයීමේ කටයුතුවලදි පහත දැක්වෙන බාධාවන්ට මුහුණ දීමට සිදුවිය.

**(අ) සමීක්ෂණ කටයුතුවලට අදාළ ගැටළු**

- වර්ෂයේ බොහොමයක් මාසවල තද වැසි පැවතුනි.
- ඈත ප්‍රදේශවලදි කාර්ය මණ්ඩලයට නවාතැන් පහසුකම් ලබා ගැනීමේ දුෂ්කරතාවය
- බ.කා.ජා.ස. (MFNSV) ව්‍යාපෘතියට සුදුසු සහාය වාහනයක් නොමැති වීම.
- වාහන හා උපකරණ බිඳවැටීම් නිසා
- කාර්ය මණ්ඩලය හිඟගම

**(ආ) දත්ත කළමනාකරණයට අදාළ ගැටළු**

- සුදුසු දත්ත ගබඩා පද්ධතියක් නොමැති වීම
- දත්ත විශ්ලේශනය සඳහා කාර්ය මණ්ඩලය නොමැති වීම
- පරිගණක පහසුකම් නොමැති වීම. වර්ෂය අවසානයේ ලෝක බැංකු ආධාර ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය යටතේ පරිගණක 09 ක් ලැබුනි. පරිගණක 09න් 04 ක්ම ද්විත්ව මොනිටර්වලින් යුතු MFNSV වාහනයේ දසුන් විශ්ලේශනය සඳහාය.

**(ඇ) වෙනත් ගැටළු**

- පිටත වටරවුම් ව්‍යාපෘතිය විසින් යෝජිත ගොඩනැගිල්ල ඉදිකිරීම ප්‍රමාද වීම හේතුකොට ගෙන, සමීක්ෂණ වාහන සඳහා සුදුසු වාහන නැවතුම් අවකාශයක් නොමැතිකම.
- සුදුසු ස්ථානයක කාර්යාල ලිබඩු හා වෙනත් පහසුකම් සහිත කාර්යාලයක් ස්ථාපිත කිරීම

***අනුගමනය කරන ලද හා යෝජිත ප්‍රතිකර්ම පියවරයන්***

- හැරවුම් චලන සමීක්ෂණ, ඇක්සල් බර සමීක්ෂණ වැනි ඇතැම් සමීක්ෂණයන් සඳහා හදිසි සමීක්ෂණ පැවැත්වීමට අවශ්‍ය අවස්ථාවලදි තාවකාලික කාර්ය මණ්ඩලයක් ලබා ගන්නා ලදි. මෙම පිළිවෙත අනාගතයේදි ද අනුමගමනය කල හැකි වේ.
- දත්ත රැස්කිරීමේ හා ඇගයීම් ඒකකයේ බොහෝ වාහන පැරණි ඒවා බැවින්, දත්ත රැස් කිරීම බාධාවකින් තොරව කරගෙන යාම සඳහා ඒවා ප්‍රතිසම්පාදනය කිරීම අවශ්‍ය කෙරේ.

## 5.3 කළමනාකරණ තොරතුරු පද්ධතිය නඩත්තු කිරීම

- ජාල හා දෘඪ උපාංග (උදා: රැහැන් රහිත ප්‍රවේශ ලක්ෂ හා ඇඩප්ටර ආදිය) හෝ පරිගණක දෘඪාංග කොටස් (උදා: රැහැන් රහිත ජාල කාඩ්, දෘඪ තැටි ආදිය) ප්‍රතිසම්පාදනයේ දුෂ්කරතාවය. මෙය පරිගණක ජාලයට අනුපිටපත් දෘඪ උපාංග නොමැති කම හේතු කොට ගෙන සිදුවේ.
- අංශවල තොරතුරු තාක්ෂණය සම්බන්ධ ගැටළු කෙරෙහි ග්‍රාහකයන්ගේ කැපවීම නොමැතිකම.
- සෙත්සිරිපාය පරිශ්‍රය තුළ නිසි ප්‍රධාන (AC) බලය සැපයුමක් නොමැතිවීම.

***අනුගමනය කරන ලද හා යෝජනා කරන ලද ප්‍රතිකර්ම පියවරයන්.***

සුදුසු පුහුණු කිරීමක් සමඟ දැනුවත් කිරීමේ වැඩ සටහනක් යෝජනා කරන ලදි.

## 5.4 යාන්ත්‍රික සේවා

- මාර්ග නඩත්තු කටයුතු සඳහා නව උපකරණ මිලදී ගැනීමට ප්‍රමාණවත් නොවන ප්‍රතිපාදන.
- වාහන හා යන්ත්‍ර අළුත්වැඩියාව හා නඩත්තුව සඳහා ගෙවීම්වල ප්‍රමාදය.
- ඒකක 1000 කට අධික වාහන හා යන්ත්‍ර අළුත්වැඩියාව හා නඩත්තුව සඳහා ඇති ඉල්ලුම සපුරාලීම සඳහා පහත දැක්වෙන පහසුකම් ප්‍රමාණවත් නොවීම.
  - උස් දොඹකර, හයිඩ්‍රොලික් ඔසවන ආදි විශේෂිත උපකරණ.
  - කාර්යාල තුළ ගබඩා පහසුකම්
  - යාන්ත්‍රික ඉංජිනේරුවන්, යාන්ත්‍රික අධිකාරීවරුන්, යාන්ත්‍රිකයන් හා ක්‍රියාකරුවන් විදුලි කාර්මිකයන් වැනි තාක්ෂණ කාර්ය මණ්ඩලය
- කම්හල තුළ පහසුකම් හා මානව සම්පත් හිඟය නිසා වාහන අළුත්වැඩියාව හා නඩත්තුව සඳහා බාහිර සම්පත්කරණය මත රැඳීම.
- ප්‍රවාහන අංශය සඳහා සුළු අළුත්වැඩියා හා දෛනික නඩත්තුව මෙහෙයවීමට යාන්ත්‍රික අධිකාරීවරයෙකු අවශ්‍ය කෙරේ.

- ප්‍රාදේශීය පදික තලනයන් හා තහඩු පිඩකයන් වැනි සැහැල්ලු යන්ත්‍ර නුපුහුණු ක්‍රියාකරුවන් විසින් ක්‍රියාකරවන බැවින්, මෙය ඌන උපයෝජනයට හා අතිරේක අළුත්වැඩියාවන්ට හේතු වේ.
- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබුනු ඇතැම් යන්ත්‍ර ක්‍රියාකරුවන් නොමැතිකම නිසා සේවයේ යොදවා නැත.

***අනුගමනය කරන ලද හා යෝජනා කරන ලද ප්‍රතිකර්ම පියවරයන්.***

- යාන්ත්‍රික අංශය, යාන්ත්‍රික කම්හල හා ප්‍රවාහන අංශය ශක්තිමත් කිරීමට පහත සඳහන් කාර්ය මණ්ඩලය පත්වීම් සිදුකල යුතු වේ.
    - උපාධිධාරී යාන්ත්‍රික ඉංජිනේරුවන් 04 දෙනයි.
    - යන්ත්‍රාගාර වැඩබිම් සඳහා යන්ත්‍රාගාර ඉංජිනේරුවන් 02 යි.
    - අධ්‍යක්ෂ කාර්යාලය, කම්හල හා ප්‍රවාහන අංශ හා යන්ත්‍රාගාර වැඩබිම් සඳහා යාන්ත්‍රික අධිකාරීන් 03 යි.
    - යාන්ත්‍රික වැඩපල සඳහා කාර්මිකයන් 06 යි.
    - යාන්ත්‍රික වැඩපල සඳහා පැස්සුම්කරුවන් 2 යි.
    - වැඩපල සඳහා විදුලි කාර්මිකයන් 02 යි.
    - වැඩපල සඳහා යන්ත්‍ර ක්‍රියාකරුවන් 20 යි.
    - යාන්ත්‍රික අංශය හා අඟුලාන කම්හල සඳහා කළමනාකරණ සහකාරවරුන් 05 යි.
    - වැඩපල සඳහා ඉංග්‍රීසි යතුරුලේඛක / පරිගණක ක්‍රියාකරුවන් 2 යි.
    - ගිණුම් සහකාරවරුන් 01 යි.
    - වැඩපල සඳහා ගබඩා භාරකරු 01 යි.
    - වැඩපල සඳහා ගබඩාකරු 02 යි.

- පුහුණු ක්‍රියාකරුවන් පත්කිරීම හෝ අංශවල ඇති සැහැල්ලු උපකරණ ක්‍රියාකරවන්නන්ට, ක්‍රියාකරවීම හා දෛනික නඩත්තුව පිළිබඳ සම්පූර්ණ පුහුණු පාඨමාලාවන් සූදානම් කිරීම යෝජනා කරනු ලැබේ.
- සෑම පළාතකම සෑම අළුත්වැඩියාවක් සිදුකිරීම හා පළාත්වල ඇති වාහන හා යන්ත්‍ර වලට සම්බන්ධ අළුත්වැඩියාවන් හා වෙනත් කරුණු සම්බන්ධව, යාන්ත්‍රික අංශය හා වැඩපල සම්බන්ධීකරණය කිරීමට සෑම පළාතකටම යාන්ත්‍රික අධිකාරීවරයෙකු බැගින් පත් කිරීමට යෝජනා කෙරේ.

## 5.5 මිනිස්බල සංවර්ධනය

පුහුණු අංශයට පහත දැක්වෙන බාධාවන්ට මුහුණ දීමට සිදුවිය.

- පුහුණු වැඩ සටහන් පැවැත්වීම සඳහා දේශන ශාලාවේ ප්‍රමාණවත් නොවන අවකාශය හා පරිගණක කාමරයේ හා දේශන ශාලාවේ පහසුකම් නොමැතිකම.
- කල් ඉකුත් වූ කාර්යාල උපකරණ
- සහභාගිවන්නන්ගේ දුර්වල පැමිණීම නිසා ඇතැම් පුහුණු වැඩ සටහන් අවලංගු කිරීමට සිදුවීම.
- සම්පත් දායකයන් නොමැතිකම නිසා ඇතැම් පුහුණු පාඨමාලා සංවිධානය කිරීමේ දුෂ්කරතාවය.

***අනුගමනය කරන ලද හා යෝජනා කරන ලද ප්‍රතිකර්ම පියවරයන්***

නූතන බහු මාධ්‍ය ප්‍රක්ශේපනයක් හා බහුකාර්ය ජායා පිටපත් යන්ත්‍රයක් පුහුණු අංශයට මිලදී ගැනීමට පියවර ගෙන තිබේ.

## 5.6 ප්‍රසම්පාදන සේවා

පුහුණු මානව සම්පත් හා කැපවීමක් නොමැතිකම ප්‍රගතියට අහිතකර ලෙස බලපා තිබේ.

***අනුගමනය කරන ලද හා යෝජනා කරන ලද ප්‍රතිකර්ම පියවරයන්***

අවශ්‍ය සේවක සංඛ්‍යාව බඳවා ගැනීමට හා ප්‍රසම්පාදන කටයුතුවල පුහුණුවක් ලබාදීම යෝජනා කෙරේ.

## 5.7 අභ්‍යන්තර විගණන කාර්යයන්

ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් නොමැතිකම නිසා නිශ්චිත බාධාවන් මතුවී ඇති අතර, එම ගැටළු විසඳීමට පියවර ගෙන ඇත.



# විදේශ අරමුදල් ව්‍යාපෘති

# 6 වැනි පරිච්ඡේදය
# විදේශ අරමුදල් ව්‍යාපෘති

## 6.1 දක්ෂිණ අධිවේගී මාර්ගය

දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ව්‍යාපෘති කොටස් කීපයකින් සමන්විත වන අතර ඒවාට මූල්‍යාධාර සපයනුයේ ආ.සං.බැ. ජ.ජා.ස.බැ., ජා.සං.අ., ඒ.ජා.සං.නි. හා ශ්‍රී ලංකා රජයයි. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ කර්මාන්ත, සංචාරණය, ධීවර කර්මාන්තය හා කෘෂිකර්මයේ වර්ධනය දිරි ගන්වමින් දකුණු පළාතේ ආර්ථික සංවර්ධනයට සහාය වීමයි. ව්‍යාපෘතියේ ප්‍රධානතම නිෂ්පාදනය වන්නේ, දකුණු පළාතේ අගනුවර වන ගාල්ලට ප්‍රවේශ මාර්ගය සහිතව කොළඹට තදාසන්න නගරයක් වන කොට්ටාව සිට දකුනු පළාතේ මාතර දක්වා ප්‍රවේශය සීමා කෙරුණු මාර්ගයකි. අධිවේගී මාර්ගයට පිවිසිය හැකි වන්නේ අධිවේගී මාර්ගය ප්‍රධාන මාර්ග / මහාමාර්ග හරහා යන ස්ථානවල පිහිටුවා ඇති අන්තර්මාරු එකොළහ මගින් පමණි. මෙය පිරිවැය හා වැඩ පරිමාව අනුව දැවැන්ත ව්‍යාපෘතියක් වන බැවින්, මූල්‍ය සැපයුම් අරමුණු සඳහා එය කොටස් දෙකකට බෙදනු ලැබිය. දක්ෂිණ අධිවේගී මාර්ගයේ කොට්ටාව-පින්නදූව කොටස 2011 නොවැම්බර් 27 දින මහජනයා සඳහා විවෘත කරන ලද අතර,සාර්ථකව මෙහෙයුම් සිදුකරන ලදි.

***වගුඅංක 46: ව්‍යාපෘති විස්තර***

| *විස්තර* | *ජ.ජා.ස.ආ. ප්‍රදාන 1 කොට්ටාව සිට දොඩන්ගොඩ* | *ජ.ජා.ස.ආ. ප්‍රදාන 2 දොඩන්ගොඩ සිට කුරුඳුගහ හැතැක්ම* | *ආ.සං.බැ.කොටස කුරුඳුගහහැතැක්ම සිට පින්නදූව* | *දකුණු කොටස පින්නදූව සිට මාතර හා ගාලු වරාය සීමාව* |
|---|---|---|---|---|
| ප්‍රදානකරු | ජ.ජා..ස.ආ. | ජ.ජා..ස.ආ. | ආ.සං.බැ. | චීන එක්සිම් බැංකුව |
| දිග | කි.මී. 34.4 | කි.මී. 31.6 | කි.මී. 29.3 | කි.මී. 35.8 |
| මංතීරු ගණන | 4 | 4 | 4 | 4 |
| කොන්ත්‍රාත්කරු | චයිනා හාබර් සමාගම | ටායිසේ සමාගම | කුමගායි ගුමි | CNTIC (චීන ජාතික තාක්ෂණික ආනයන හා අධිවේගී මාර්ග සමාගම) |
| අධීක්ෂණ උපදේශක | OC ජපානය | OC ජපානය | රවුටන් සමාගම එක්සත් රාජධානිය | RDC/ECL/MG බද්ධ සමාගම් උපදේශකයෝ |
| කොන්ත්‍රාත් ආරම්භය | 2005 සැප්.19 | 2006 මාර්තු 24 | 2003 අප්‍රේල් 24 | ප්‍රදාන 1, 2 –2011 අප්‍රේල් 23<br>ගා.ව.ප්‍ර.මා. – 2011 ජනවාරි 20 |
| කොන්ත්‍රාත්තුව නිමකිරීම (මුල්) | 2009 සැප්. 18 | 2010 මාර්තු 23 | 2006 අප්‍රේල් 25 | ප්‍රදාන 1, 2 –2013 අප්‍රේල් 22<br>ගා.ව.ප්‍ර.මා. – 2011 ජූනි 30 |
| කොන්ත්‍රාත්තුව නිම කිරීම (කා දිගුව) | 2011 ජන. 22 | 2011 මැයි 07 | 2010 මාර්තු 16 | අදාල නොවේ |
| කොන්ත්‍රාත් මිල (රු:බි.) | 9.6 | 8.3 | 8.7 | 18.7 |
| සංශෝධිත කොන්ත්‍රාත් මිල (ශ්‍රී ලංකා රු:මි.) | 20.00 | 15.4 | 24.1 | අදාල නොවේ |
| ප්‍රතිව්‍යුහගත කරන ලද කොන්ත්‍රාත්තුව පදනම් වූ වර්තමාන ප්‍රගතිය | 100% (සංශෝධිත වැඩ සටහන) | 100% (සංශෝධිත වැඩ සටහන) | 100% | ප්‍රදාන 1 – 2.81%<br>ප්‍රදාන 2 – 6.20 %<br>ගා.ව.ප්‍ර.මා. – 100% |




***රූ සටහන 6: දක්ෂිණ අධිවේගි මාර්ගයේ ව්‍යාපෘති ස්ථාන සිතියම***

මෙම ව්‍යාපෘතිය ජාතික මට්ටමෙන් මාර්ග ආරක්ෂණය වැඩි දියුණු කිරීම හා දක්ෂිණ අධිවේගි මාර්ගයේ ආරක්ෂණය සහතික කිරීම යන කොටස් දෙකකින් සමන්විත වේ. (මෙයින් මතු අධිවේගි මාර්ගය ලෙස සඳහන් කරනු ලැබේ) ව්‍යාපෘති කටයුතු 2003 ජනවාරි මස ආරම්භ කරන ලද අතර, 2013 අවසානයේ අධිවේගි මාර්ගය පූර්ණ මෙහෙයුම් ඇරඹීමට නියමිතය.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන හා කටයුතු.

- ප්‍රදාන නියෝජිත ආයතන සමඟ ව්‍යාපෘති ණය හා ප්‍රදාන වලට සම්බන්ධ කටයුතු.
- උපදේශක හා සිවිල් වැඩ කොන්ත්‍රාත්වලට සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කරන ලද කාර්යයන් නියමිත කාලය තුළ නිමකිරීම සහතික කිරීම සඳහා ඇගයීම් කටයුතු හා ටෙන්ඩර් මණ්ඩලවල කාර්යයන්ට පහසුකම් සැලසීම හා කටයුතුවල ප්‍රගතිය ප්‍රසම්පාදන සැලසුම සමඟ ආවේක්ෂණය කිරීම.
- ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව හා වෙනත් සම්බන්ධීකරණ කමිටු කොටස්කරුවන් සමඟ කැඳවීම, කාර්ය සටහන් වාර්තා කිරීම හා සටහන් පිළියෙල කිරීම හා බෙදා හැරීම.

- විවිධ ව්‍යාපෘති කර්තව්‍යයන් හා කටයුතු වැඩ සැලැස්ම පිළියෙල කිරිමට පහසුකම් සැලසීම හා ව්‍යාපෘති මූලිකාංගයන් ක්‍රියාත්මක කිරිම සඳහා අවශ්‍ය සම්පත් හඳුනා ගැනීම.
- ඉහළ නිලධාරින්ගේ අදහස් විමසා කඩිනම් නිවැරදි කිරීම් සිදුකළ හැකි වන පරිදි යථා වර්ධනයන් හා ප්‍රක්ෂේපනයන් සමඟ ප්‍රධාන ව්‍යාපෘති අංග ආවේක්ෂණය හා විචලනයන් වලට හේතු නිර්ණය කිරීම.
- ව්‍යාපෘතියක වෙනස්කම් හා පිරිවැය, ප්‍රතිලාභ හා තාක්ෂණික සාධනය මත එහි බලපෑම පාලනය කිරිමේ පරිපාටි සූත්‍රකරණය කිරිම ව්‍යාපෘතියේ වෙනස්කම්, ක්‍රියාත්මක කිරිමේ සැලැස්ම ගැණ ව්‍යාපෘති පිරිවැය හා වෙනත් ව්‍යාපෘති අංග මත එවැනි වෙනස්කම්වල බලපෑම පිළිබඳ විමසිල්ලෙන් සිටිම හා ඉහල අධිකාරින්ගේ අවධානය යොමු කිරීම.
- තොරතුරු පද්ධතියන් හා ආවේක්ෂණ උපකරණ පදනමෙන් සේවයේ යොදවා ගැනිමට හැකිවන පරිදි වෙනත් අදාළ ආයතනවලින් ව්‍යාපෘති වාර්තා රැස්කිරිම හා නිතිපතා යාවත්කාලින කිරිම සහිත ඒකාබද්ධ දත්ත බැංකුවක් ස්ථාපිත කිරීම.
- කොන්ත්‍රාත්මය සැපයිමට අනුකුලතා සම්පූර්ණ කරන්නේ දැයි නිර්ණය කිරිම සඳහා ව්‍යාපෘතිවල නිරත උපදේශකයින්ගේ කාර්ය සාධනය ආවේක්ෂණය කිරීම.
- එක් එක් ව්‍යාපෘතිවල අතපසුවීම් ප්‍රශ්න හඳුනාගැනිම පිළිබඳ වාර්ෂිකව ප්‍රගති සමාලෝචනය හා ඉහල අධිකාරින් විසඳුම් සඳහා පහසුකම් සැපයිම.
- ව්‍යාපෘතියේ වෙනත් කොටස්කරුවන් - මුදල් අමාත්‍යාංශය සමඟ අන්තර් ක්‍රියාවන් හා සම්බන්ධිකරණය සඳහා පරිපාටි ස්ථාපිත කිරීම.
- ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය - සිදුවූ වියදම, ආධාර ප්‍රදානයේ සිට ගෙවීම් පිරිවැය ඉක්මවායෑම පිළිබඳ නොකඩවා ආවේක්ෂණය කිරිම හා අවශ්‍ය අවස්ථාවලදී ඉහල අධිකාරියේ කටයුතු කිරිම සඳහා යොමු කිරීම.
- නියමිත කලට අනුකුලවීම් සිදුවන්නේ දැයි තිරණය කිරිම සඳහා ණය ගිවිසුමේ සඳහන් කටයුතු ලැයිස්තුව ආවේක්ෂණය කිරීම.
- ව්‍යාපෘති තත්ත්වය පැතිකඩ, ප්‍රසම්පාදනය, සිවිල් කටයුතු හා වෙනත් අදාළ කරුණු පිළිබඳ නිතිපතා යාවත්කාලින වන නාලිකාව හරහා තොරතුරු සපයන වෙබ් අඩවියක් නිර්මාණය කිරීම.
- අනුමත මාර්ගෝපදේශ මත ප්‍රතිස්ථාපන ක්‍රියාකාරි සැලැස්ම ක්‍රියාත්මක කිරිම ඇතුළුව ව්‍යාපෘතිය මගින් ඉඩම් අත්පත් කර ගැනිම හා බලපෑමට ලක්වූ පුද්ගලයන්ට වන්දි ගෙවීම් කටයුතු ක්‍රියාත්මක කිරිම හා ආවේක්ෂණය කිරීම.
- නායයෑම්, පාංශු ඛාදනය, භූගත ජලය හා මතුපිට ජලය ඇතුළු ව්‍යාපෘතියේ පාරිසරික බලපෑම පාලනය කිරිම සඳහා පියවරයන් ආවේක්ෂණය කිරීම.
- සි/ස.කුමගායි ගුමි (ජපන්) සමාගම මාර්ග කොටස් වෙත අධිකාරියට එරෙහිව ප්‍රදාන වශයෙන් නගන ලද කාලය දිගුවීමේ පිරිවැය, භූමි වැඩ ක්‍රියාත්මක කිරිමේදි ඵලදායිතාව නැතිවිම, ව්‍යුහය සඳහා වැඩි කරන ලද අතිරේක පිරිවැය, වෙනස්වීම් හා ගිවිසුම උල්ලංඝනය වැනි ආරවුල් පිළිබඳ ජාත්‍යන්තර වානිජ අධිකරණයේ අංක.16628/CYK දරණ බේරුම්කරන නඩුවට සහභාගි වීම. බේරුම්කරණ විභාගයේදි මාර්ග සංවර්ධන

අධිකාරිය ආරක්ෂණය වෙනුවෙන් ප්‍රකාශයක් හා පිළිතුරක් මගින් ප්‍රතිචාර දක්වන ලදි. බේරුම්කරණ මණ්ඩලය වැඩබිම් චාරිකා පරීක්ෂණයක් සිදුකර, 2010 සැප්තැම්බර් මාසයේදී මූලික විභාගයක් පවත්වන ලදි.

- ගාස්තු කුටි හා කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ ආවේක්ෂණය හා මෙහෙයුම් හා නඩත්තු වාහන ප්‍රසම්පාදනය කිරීම.
- ස්ථිර හා තාවකාලික ගාස්තු ක්‍රමයක් ඉදිකිරීම හා දෘෂ්‍ය ද්‍රව්‍ය රැහැන් ස්ථාපනය ආවේක්ෂණය කිරීම
- ස්ථිර කිරුම් පාලම් 05 ක් හා ජංගම කිරුම් පාලම් 10 ක් හා විදුලි ජනක 8 ක් ප්‍රසම්පාදනය කිරීම.
- අධිවේගි මාර්ගය කාර්ය සාධනය පදනම් කරගත් මාර්ග නඩත්තුව සඳහා කොන්ත්‍රාත්කරුවන් ප්‍රසම්පාදනය.
- විවේක ස්ථාන සංවර්ධනය හා අන්තර්මාරු ස්ථානවල භූමි අලංකරණය.
- දක්ෂිණ අධිවේගි මාර්ගය දිගට දෘශ්‍ය කෙඳි රැහැන් එලීම සඳහා ප්‍රසම්පාදනය.

## 2011 වර්ෂය තුළ කටයුතුවල ප්‍රගතිය

*වගු අංක 47: කොට්ටාව-දොඩන්ගොඩ කොටසේ ප්‍රගතිය-ජ.ජා.ස.ඒ.-ප්‍රදාන 1*

| *විස්තරය* | *ප්‍රගතිය* | |
|---|---|---|
| | *සැලසුම් කළ(%)* | *තථ්‍ය (%)* |
| පොදු | 100 | 100 |
| භූමි වැඩ | 100 | 100 |
| ජලාපවහන | 100 | 100 |
| මාර්ග වැඩ | 100 | 100 |
| ව්‍යුහයන් | 100 | 100 |
| පහසුකම් | 100 | 100 |



ගුවන් දර්ශනය 1+ ප්‍රදේශය



කහතුඩුව අන්තර්මාරුව ගුවන් දර්ශනය



ගැලනිගම අන්තර්මාරුවේ ගුවන් දර්ශනය




ගැලනිගම අන්තර්මාරුව



පොලිස් වාහන නැවතුම් ප්‍රදේශයේ හා
උස්මාරු පාලමේ ගුවන් දර්ශනය



කළුගග පාලමේ ගුවන් දර්ශනය



කැපුම් ප්‍රදේශයේ ගුවන් දර්ශනය 29+



දොඩංගොඩ අන්තර්මාරුව ගුවන් දර්ශනය

**වගු අංක 48 දොඩංගොඩ-කුරුඳුගහ හැතැක්ම කොටසේ ප්‍රගතිය ජ.ජා.ස..ආ. ප්‍රදාන - 2**

| විස්තරය | ප්‍රගතිය | |
|---|---|---|
| | සැලැස්ම (%) | තථ්‍ය (%) |
| සාමාන්‍ය | 99.90 | 73.20 |
| භූමි වැඩ | 86.00 | 81.41 |
| මෘදු භූමි සැකසුම | 100.00 | 99.81 |
| ජලාපවහන ව්‍යුහයන් | 67.19 | 71.09 |
| ව්‍යුහයන් | 97.85 | 97.91 |
| දිගු පරායන පාලම් | 100.00 | 99.87 |
| මාර්ග වැඩ | 54.26 | 49.85 |



දොඩංගොඩ අන්තර්මාරුව



සේවා ප්‍රදේශය



දොඩංගොඩ අන්තර්මාරුවේ දකුණුපස දර්ශනය



වැලිපැන්න අන්තර් මාරුව



ද.37+500 සිට උතුරු දිශාව දර්ශනය



වැලිපැන්න අන්තර්මාරුව



ද 47+000 සිට උතුරු දිශාව දර්ශනය




පොලිස් වාහන නැවතුම් ප්‍රදේශයේ මාර්ග සලකුණු කිරීම



බෙන්තොට පාලම



ද. 62+400 ස්ථානයේ ජල පොකුණු ඉදිකිරීම නිමයි



ද 55+600 සිට උතුරු දිශා දර්ශනය



UB 3 හැරවුම් මාර්ගයේ ඇස්පල්ට් මිශ්‍රණ ඇතිරි

*වගු අංක 49: කුරුඳුගහ හැතැක්ම-පින්නදූව කොටසේ ප්‍රගතිය - ආ.ස.බැ.*

| විස්තරය | ප්‍රගතිය | |
|---|---|---|
| | සැලසුම් කළ (%) | සත්‍ය (%) |
| සාමාන්‍ය | 100 | 100 |
| භූමි වැඩ | 100 | 100 |
| පාදම් සැකසුම | 100 | 100 |
| ඇතුරුම | 100 | 100 |
| සුළු ව්‍යුහයන් | 100 | 100 |
| මාර්ග හා ගංගා පාලම් | 100 | 100 |
| ලෝහමය උමං මාර්ග | 100 | 100 |
| කොන්ක්‍රීට් උමං මාර්ග | 100 | 100 |
| අවස්ථානුකූල ඉදිකිරීම් | 100 | 100 |



*ද 1+600 දකුණු දෙසට මුහුණලා*



*ද. 18+500 දකුණු දෙසට මුහුණලා*



*කුරුඳුගහ හැතැක්ම අන්තර්මාරුව*



*පින්නදූව අන්තර්මාරුව*




*මධ්‍යයනය WRSB ස්ථාපනය*




*රූ සටහන් 7: දකුණු අධිවේගී මාර්ගයේ ඉදිවෙමින් තිබෙන කොටස් ව්‍යාපෘතිය*

*වගු අංක 50: පින්නදූව-කෝදාගොඩ කොටසේ ප්‍රගතිය - ප්‍රදාන-1*

| විස්තරය | ප්‍රගතිය | |
|---|---|---|
| | සැලසුම් කල (%) | තථ්‍ය (%) |
| භූමි වැඩ | 17.40 | 3.20 |
| ව්‍යුහයන් | 22.60 | 8.90 |
| අවස්ථානුරූපින් | 7.00 | 0.00 |

*වගු අංක 51: කෝදාගොඩ-ගොඩගම කොටසේ ප්‍රගතිය ප්‍රදාන-2*

| විස්තරය | ප්‍රගතිය | |
|---|---|---|
| | සැලසුම් කල (%) | තථ්‍ය (%) |
| භූමි වැඩ | 11.90 | 11.20 |
| ව්‍යුහයන් | 32.20 | 21.60 |
| අවස්ථානුරූපින් | 1.00 | 0.40 |



*කොන්ක්‍රීට් තාප්පය පදම් කිරීම RCBU දක්වා ද 31+007*



*ද. 32+400~32+520 හි පැතිබැම් පිළියෙල කිරීම*



*ජලාපවහන අන්තය ඉදිකිරීම ද32 +754*



*ද. 35+090 දිගුව සවි ගැන්වීම*




ද 43+700 – 43+ 850 පැති බෑම පිරවීම



ද 45+340 දිගුවට වැද්දුම් යෂ්ටි සවි කිරීම



ද 44+112 අසල මෘදු භූමි සැකසීම



ද 52+775 – 52+850 දක්වා පැති බෑම පිරවීම




ද. 50+800 – 50+860 අතර නුසුදුසු පස් කැණීම



ඉංජිනේරු නවාතැන් පහසුකම් ඉදිකිරීම
ද 54+200



ද 50+650 – 50+780 පැති බෑම් පිරවීම



ද. 54+320 – 54+780
උප පාදමේ 1 වැනි ස්ථරය ඇතිරීම

***ප්‍රගතියට බාධාවන්***

- කුරුඳුගහ හැතැක්ම සිට පින්නදූව ආ.සං:බැ: කොටස
  - අ) ලෝහමය උමං මගක් බිඳ වැටීම
  - ආ) පාලම් කුළුණු හිස් පිපිරීම
  - ඇ) කුළුණු පාදවල හා ටැම් හිස්වල පිපිරීම්
  - ඈ) ලෝහ ව්‍යුහයන් මළ බැඳීම
  - ඉ) බැවුම් කැපීමේ අසාර්ථකවීම්

- ජ.ජා.ස.ආ. ප්‍රදාන 1 කොට්ටාව සිට දොඩංගොඩ දක්වා
  - අ) සමහර ස්ථානවල ඇස්පල්ට් මාර්ග පෘෂ්ඨවල තත්ත්වය තාක්ෂණික පිරිවිතර වලට අනුකූල නොවීම.
  - ආ) ඉදිකිරීම් නිම කිරීමෙන් පසුව ඇතැම් ව්‍යුහයන් ස්ථාවර විය.
  - ඇ) පහත දැක්වෙන වාතාවරණයන් යටතේ, ක්‍රියාත්මක කිරීමේ කාල සටහන දීර්ඝ වීමට මහජන විරෝධතා දායක විය.
    - මහජනයාට බලපෑ ගල් පිපිරවීමේ කටයුතු
    - ඉදිකිරීම් කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් ඝර්ෂණය නිසා නිවසකට හානි වීම සමථයට පත්කිරීම
    - මහජන ජීවිතයට බලපෑම් කරන ජලාපවහන ගැටළු

- ජ.ජා.ස.ඒ. ප්‍රදාන 2 – දොඩංගොඩ සිට කුරුඳුගහ හැතැක්ම
  - අ) ප්‍රමාණ බිල්පත්වල කළුගල් ප්‍රමාණය 260% කින් වැඩිවිය
  - ආ) ගල් පිපිරවීම, ඉදිකිරීම් කටයුතු හේතුවෙන් සිදුවූ ඝර්ෂණය නිසා නිවාස වලට හානි වීම ජන ජීවිතයට බලපෑ ජලාපවහන ගැටළුවල ප්‍රතිඵලයක් වශයෙන් මහජන විරෝධතා පැන නැගීම.

- දකුණු කොටස හා ගාලු වරාය ප්‍රවේශ මාර්ගය පින්නදූව සිට ගොඩගම දක්වා.

  ප්‍රධාන අනුරේඛනයට අනුව 2011 අප්‍රේල් මාසයේදී කොන්ත්‍රාත්කරු වැඩ ආරම්භ කළ නමුත්, පත්කරන ලද උපකොන්ත්‍රාත්කරු සම්පත් හා මිනිස් සම්පත් භූමි වැඩ හා කළුගල් වැඩ සඳහා සම්පත් මෙහෙයවීම ප්‍රමාද කල බැවින් අවශ්‍ය තරම් මිනිස් බලය ඇතුළු සම්පත් මෙහෙයවීම ප්‍රමාදවිය.

**අනුගමනය කරන ලද හා යෝජනා කරන ලද ප්‍රතිකර්ම පියවරයන්**

- ආ සං බැ කොටස කුරුඳුගහ හැතැක්ම සිට පින්නදූව
  - අ) ලෝහමය උමං මාර්ගය බිඳ වැටීම - කොන්ක්‍රීට් ව්‍යුහයන් යොදා ව්‍යුහය ප්‍රතිසම්පාදනය කරන ලදි.
  - ආ) පාලමේ කුළුණු හිස්වල ඉරිතැලීම් - කුළුණු හිස්වල ඉරිතැලීම් යථා තත්ත්වයට පත්කරන ලදි.

ඇ) කුළුණු පාදවල හා හිස්වල ඉරිතැලීම් - කුළුණු හිස්වල ඉරිතැලීම් යථා තත්ත්වයට පත්කිරීමට කොන්ත්‍රාත් කරු ඉදිරිපත් කල යෝජනා පිළිගත් අතර, හානි වු පාලම් කුළුණු හිස් යථා තත්ත්වයට පත්කරන ලදි.

ඈ) ලෝහ ව්‍යුහයන් මළ බැඳීම - ලෝහමය ව්‍යුහය මත කොන්ක්‍රීට් වැස්මක් යෙදීම සඳහා ප්‍රතිකර්ම යෝජනාව පිළිගත් අතර, කොන්ත්‍රාත්කරු විසින් ව්‍යුහාත්මක අභ්‍යන්තර කොන්ක්‍රීට් වැස්මක් යොදා ලෝහමය ව්‍යුහය යථා තත්ත්වයට පත්කරනු ලැබිය.

ඉ) බැවුම් කැපීමේ අසාර්ථකත්වයන් - ප්‍රතිකර්ම පියවරයන් අනුගමනය කරන ලදි.

- ජ.ජා.ස.ආ. ප්‍රදාන 1 කොට්ටාව සිට දොඩංගොඩ දක්වා.
  - අ) ඇතැම් ස්ථානවල ඇස්පල්ට් ඇතුරු මාර්ග පෘෂ්ඨය තත්ත්වය තාක්ෂණික පිරිවිතර වලට අනුව නොවිය. ඇස්පල්ට් තාර ස්ථරය ඉවත් කිරීමට හා යළි ඇතිරීමට කොන්ත්‍රාත්කරුට උපදෙස් දෙනු ලැබිය.
  - ආ) ඉදිකිරීම් නිම කිරීමෙන් පසුව ඇතැම් ව්‍යුහයන් ස්ථාවර විය. ව්‍යුහයන් ස්ථාවර වීම සඳහා අධ්‍යයනයන් සිදුකරන ලදි. ව්‍යුහයන් කිපයක් යළි ඉදිකරනු ලැබිය.
  - ඇ) මහජන විරෝධතා, ක්‍රියාත්මක කිරීමේ කාල සටහන දිගු කිරීමට දායකවිය. ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතිද්දි ප්‍රතිකර්ම පියවර ගන්නා ලදි.

- ජ.ජා.ස.බැ. ප්‍රදාන-2 දොඩංගොඩ සිට කුරුඳුගහ හැතැක්ම දක්වා
  - අ) ප්‍රමාණපත්‍රවල කළුගල් ප්‍රමාණයන් 260% කින් වැඩිවිය. මෙය කොන්ත්‍රාත්තුව 2011 අප්‍රේල් 12 දක්වා කාලය දිගු කිරීමට හේතු විය.
  - ආ) කළුගල් පිපිරවීම මහජන විරෝධතාවලට හේතුවිය. මේවා ඉංජිනේරුවරයා, කොන්ත්‍රාත්කරු හා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හසුරුවන ලදි. උසාවි නඩු වලටද සහභාගි විය.

- දකුණු කොටස හා ගාලු වරාය ප්‍රවේශ මාර්ගය පින්නදුව සිට ගොඩගම දක්වා
  - අ) පත්කරන ලද උප කොන්ත්‍රාත්කරු භූමි වැඩ හා කළුගල් වැඩ මෙන්ම ගොඩනැගිලි වැඩ සඳහා සම්පත් හා මිනිස් බලය මෙහෙයවීමට ප්‍රමාද විය. යෝජිත උප කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට සේවයයා එකඟ වු අතර, කොන්ත්‍රාත්කරු ඍජු වැඩ මගින් හා වෙනත් උප කොන්ත්‍රාත්කරුවෙකු මගින් වැඩ කඩිනම් කරන ලදි.
  - ආ) කලුගල්පර හා කැබලි ගල් හිඟ වීම - සේවයයා කොන්ත්‍රාත්කරුට කැබලි ගල් සැපයීම වැඩි කරන ලෙස කැබලිගල් සැපයුම්කරුවන්ට අවධාරණය කරනු ලැබිය.
  - ඇ) කොන්ත්‍රාත්කරුට පළපුරුදු පිරිස් නොමැති වීම - එබැවින් පළපුරුද්ද සහිත අතිරේක දේශිය කාර්ය මණ්ඩලයක් කොන්ත්‍රාත්කරු විසින් බඳවාගනු ලැබිය.

## 6.2 කොළඹ-කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය

කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය කි.මී.26 ක දිගකින් සමන්විත වන අතර, එය කොළඹ හා කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ යා කරමින් මංතීරු 6/4 ක් සහිත ද්විත්ව රථ මාර්ග පහසුකම්වලින් යුතුව ඉදිකරනු ලබයි.

මෙම ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් දරණ අතර ඔහුට නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් 3 දෙනෙකු, ඉංජිනේරුවන් 4 දෙනෙකු හා එක් කාර්මික නිලධාරියෙකුගේ හා කාර්ය මණ්ඩලයේ සහාය ලැබේ.




*රූ සටහන් 8: කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය*

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ප්‍රධාන කටයුතු වන්නේ :

- ඉඩම් අත්පත් කර ගැනීම හා ප්‍රතිස්ථාපනය
- වන්දි හා ප්‍රතිස්ථාපන දීමනා ගෙවීම
- වෙනත් අදාළ ආයතන අතර සම්බන්ධීකරණය
- කොන්ත්‍රාත්කරු හා උපදේශක අතර සම්බන්ධීකරණය
- මධ්‍යම පරිසර අධිකාරියේ අවශ්‍යතා අනුව පාරිසරික ගැටළු පාලනය කිරීමේ පියවරයන් ආවේක්ෂණය කිරීම.
- ව්‍යාපෘතියේ යෙදෙනා අදාළ පාර්ශවයන්ට කරන ගෙවීම් කළමනාකරණය.

**2011 වර්ෂය තුළ කාර්යයන්වල ප්‍රගතිය**

- ඉඩම් අත්පත් කර ගැනීමේ හා ප්‍රතිස්ථාපන කටයුතු සිදු කෙරෙමින් පවතින අතර 2011 වර්ෂය තුළ රු.මි. 2,768 ක වටිනාකමක් සඳහා එහි සමුච්චිත ප්‍රගතිය 97.5% කි.

- ප්‍රයෝජ්‍ය සේවා ප්‍රතිස්ථානගත කිරීම සිදු කෙරෙමින් පවතී.

- කොන්ත්‍රාත්කරු වන චීන මෙටලජිකල් ග්‍රෲප් කෝපරේෂන් (MCC) සමාගම සැලකිය යුතු ප්‍රමාණයක් සැලසුම් නිමකර උපදේශකයන්ගේ අනුමැතියට ඉදිරිපත් කර තිබේ. බොහෝ සැලසුම් සඳහා උපදේශක විසින් එකඟතාවය ලබාදී ඇත.

- 2011 වර්ෂය තුළ වැඩබිම් පිළියෙල කිරීම, සේවා මාර්ග ඉදිකිරීම හා පතුලේ වැලි තට්ටුව ඇතිරීම නිම කෙරිණි. පාලම් ප්‍රවේශය සඳහා හතරැස් ටැබ් බැස්සවීම, සැකසූ තිරස් කණු බැස්සවීම, මෘදු පාංශු සැකසීම් කරන අතර සංයුක්ත වැලි යෙදූ හා ඇඹරූ ගල් යෙදූ ඉදිකිරීම නිම කෙරිණි. පෙට්ටි බෝක්කු ඉදිකිරීම, පාලම්වල පැති බැම් කුළුණු හා හැරූ වැටි ඉදිකිරීම සිදු කෙරෙමින් පවතී. ඉවුරු පිරවීම, කලපු පිරවීම හා හුණුපිටිය හා කටුනායක ටැම් මග ඉදිකිරීම සිදු කෙරෙමින් පවතී. කොන්ත්‍රාත්කරු විසින් පාදම් ඉදිකිරීම හා ඉවුරු බෑවුම් වල තණ පිඩලි ඇල්ලීම ආරම්භ කරන ලදි.

- ව්‍යාපෘතිය 2011 අවසානයේ මූල්‍ය වැය රු: මිලියන 20,700.4 කට 53% ක ප්‍රගතිය පෙන්වා ඇත.

- කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් පරිදි උපදේශකයන් වන ඕස්ට්‍රේලියාවේ ස්මෙක් (SMEC) ඉන්ටර්නැෂනල් සමාගම සැලසුම් සමාලෝචනය, ඉදිකිරීම් අධීක්ෂණය හා වෙනත් වැඩ ඉටුකරමින් තිබිණි.

***වගු අංක 52: කොළඹ-කටුනායක අධිවේගී මාර්ගයේ ව්‍යාපෘති විස්තර***

| මාර්ගයේ නම | දිග (කි.මී.) | කා.දි.පි. (රු.මි.) | ආරම්භක දිනය | නිමකිරීමට අපේක්ෂිත දිනය | 2010 දක්වා ප්‍රගතිය (%) | 2010 දක්වා වියදම (රු.මි.) | 2011 අවසානයේ ප්‍රගතිය (%) | 2011 වර්ෂය තුල වියදම (රු.මි.) |
|---|---|---|---|---|---|---|---|---|
| කොළඹ කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය | 25.80 | 42, 550 | 18.08.2009 | 23.11.2012 | 27.8 | 16, 697.50 | 53 | 7, 963.50 |

**සිදු කෙරෙමින් පවතින ඉදිකිරීම් කටයුතු දැක්වෙන ඡායාරූප**




පෑලියගොඩ අන්තර්මාරු පාලම




පාලම් තට්ටුවට කොන්ක්‍රීට් යෙදීම




ඉවුරු බොරළුවලින් පිරවීම




වැර ගැන්වූ බිම් රැඳවුම් තාප්පය




ඉවුරු මුහුදු වැලිවලින් පිරවීම




හුණුපිටිය ටැට් මත මාර්ගය




ඉවුරු බෑවුම් සැකසීම




කලපු තුළ ගල් පිරවීම




ගල්කැට මිශ්‍රණයෙන් පාදම ඉදිකිරීම

## 6.3 පිටත වටරවුම් මාගී ව්‍යාපෘතිය

පිටත වටරවුම් මාගීය අදියර 3 කට බෙදා තිබේ. ව්‍යාපෘති අධ්‍යක්ෂවරු දෙදෙනෙකුගේ ප්‍රධානත්වයෙන් අදියර 1 අදියර 11 හා අදියර 111 වශයෙනි. අදියර 1 හා අදියර 111 ව්‍යාපෘති අධ්‍යක්ෂ අදියර 1 ගේ හා අදියර 11 හා අදියර 111 ව්‍යාපෘති අධ්‍යක්ෂ අදියර 11 ගේ විෂය පථය යටතට පවරා ඇති අතර එය 2011 දී ස්ථාපිත කරන ලදි.

පිටත වටරවුම් මාගී ව්‍යාපෘතිය කි.මී. 29.1 කින්ද උපරිම මංතීරු 6 කින් සමන්විත දළ වශයෙන් කොළඹ සිට කි.මී. 20 කින් ඈතින් කොළඹින් පිටත සියලුම අධිවේගි මාගී කොළඹ නගරය වටා ‘A’ පන්තියේ මාගී යා කරයි.

අධිවේගි මාගීය පහත දැක්වෙන පරිදි අදියර 3 කින් ක්‍රියාත්මක කරනු ලැබේ.

| | | |
|---|---|---|
| අදියර – 1 | කොට්ටාව සිට කඩුවෙල දක්වා කොටස | කි.මී. 11.0 |
| අදියර – 2 | කඩුවෙල සිට කඩවත දක්වා කොටස | කි.මී.8.9 |
| අදියර – 3 | කඩවත සිට කෙරවලපිටිය දක්වා කොටස | කි.මී. 9.2 |

***රූ සටහන් 9: පිටත වටරවුම් මාගීය***



## 6.3.1 අදියර 1 හා අදියර 3

පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ප්‍රධානත්වය ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් දරණ අතර, පූර්ව ඉදිකිරීම් හා ඉදිකිරීම් අදියරයන් තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් ඉටුකිරීමේ වගකීම දරයි.

ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීමේදි, පූර්ව ඉදිකිරීම් අවධිය වැදගත් අදියරක් වෙයි. මෙම අදියර තුළ පහත දැක්වෙන කටයුතු හා කාර්යයන් කැපවීමෙන් ඉටුකරන ලදි.

- භූමි සමීක්ෂණ සඳහා එකඟතාවය ඉල්ලීමට ප්‍රදේශයේ බලපෑමට ලක්වූ පදිංචිකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්නා ලදි.
- විස්තරාත්මක සැලසුම් අධ්‍යයනය සඳහා භූමි සමීක්ෂණ පැවැත්වීම.
- විස්තරාත්මක සැලසුම් සිදුකිරීම.
- පරිසර අධිකාරියෙන් හා අවශ්‍ය වන පරිදි වෙනත් අදාල අධිකාරීන් වෙතින් අවශ්‍ය අනුමැතිය ලබාගැනීම සඳහා පරිපූර්ණ පා.බ.ත. (EIA) වාර්තා පිළියෙල කිරීම.
- පාරිසරික ආවේක්ෂණ සැලැස්ම (EMP) පිළියෙල කිරීම.
- ව්‍යාපෘතිය සඳහා ප්‍රතිස්ථාපන ක්‍රියාත්මක සැලැස්ම (RIP) පිළියෙල කිරීම.
- බලපෑමට ලක්වූ නිවාසස්ථාන ප්‍රතිස්ථානගත කිරීමට ප්‍රතිස්ථාපනය සඳහා විකල්ප ඉඩම් අත්පත් කර ගැනීම් ක්‍රියාත්මක කිරීම.
- මාර්ග අයිතිය සඳහා ඉඩම් අත්පත්කර ගැනීම් ක්‍රියාත්මක කිරීම
- අධීක්ෂණ උපලේඛනයන් ප්‍රසම්පාදනය කිරීම
- සැලසුම් සමාලෝචනය කිරීම
- කොන්ත්‍රාත්කරුවන් ප්‍රසම්පාදනය කිරීම
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම පිළියෙල කිරීම.
- ව්‍යාපෘතියේ පහසු ක්‍රියාත්මක කිරීම සඳහා සියලු ව්‍යාපෘති සහභාගිකරුවන්, සැලසුම් උපදේශකයන් හා තාක්ෂණික උපදේශකයන් ඒකාබද්ධ කිරීම.
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ විවිධ කටයුතු කළමනාකරණය
- තාක්ෂණික කාර්ය සාධන වාර්තාකරණ පරිපාටිය ක්‍රියාත්මක කිරීම.
- ව්‍යාපෘති මූල්‍ය සැලසුම හා කළමනාකරණය පිළියෙල කිරීම

**ඉදිකිරීම් අදියරේදී ප්‍රධාන ඉදිකිරීම් කටයුතු**

- මෘදු භූමි සැකසීම
- ඉවුරු පිරවීම (භූමි වැඩ)
- උප පාදම් හා පාදම් සැකසුම
- ඇතුරුම ඉදිකිරීම
- ව්‍යුහය ඉදිකිරීම
- ජලාපවහන ඉදිකිරීම
- අවස්ථානුකූල ඉදිකිරීම්
- පහසුකම්
- ප්‍රයෝජ්‍යයන් ප්‍රතිස්ථානගත කිරිම

**ඉදිකිරීම් අදියර තුල**

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු කළමනාකරණය මෙහෙයවනු ලබයි. (සේවයයා) මෙයට අධීක්ෂණ උපදේශකයන්ගේ කොන්ත්‍රාත් කළමනාකරණ කටයුතු ආවේක්ෂණය, ප්‍රගති සමාලෝචනයන්හිදි ක්‍රියාකාරී ලෙස සහභාගි වීම, ව්‍යාපෘති කාල හා පිරිවැය පාලනය, කොන්ත්‍රාත්කරුට හා උපදේශකයන්ට ගෙවීම්, බාහිර ආයතන සමඟ සම්බන්ධීකරණය හා ඉදිකිරීම් වලට සම්බන්ධ කරුණු වලදි සාමාන්‍ය මහ ජනතාව සමඟ කටයුතු කිරිම.

සැලසුම් ගැටළු හා තත්ත්ව පාලන කරුණු වැනි තාක්ෂණික පැති අවශ්‍ය සැලසුම් හා ඉදිකිරීම් යන දෙකෙහිදීම අවශ්‍ය ගුණාත්මක මට්ටම් සපුරා ගැනීමේ අදහසින් ව්‍යා.ක.ඒ. විසින් සමීපව ආවේක්ෂණය කරනු ලබයි. උපදේශකයින්ගේ කටයුතු යාන්ත්‍රික වැඩවල තත්ත්වය හෝ ප්‍රගතියට බලපෑම් ඇතිවන අවස්ථාවලදී ව්‍යා.ක.ඒ. ඊට වැදගත් වේ. ප්‍රගතියට බලපාන තීරණාත්මක කරුණු ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී සාකච්ඡාවට ගනු ලබන අතර, එවැනි ප්‍රශ්න විසඳීම උපදේශක හා කොන්ත්‍රාත්කරුවන් විසින් තීරණය කරනු ලැබේ. ප්‍රමාණය, ප්‍රමාණ වෙනස්වීම්, විචල්‍ය නියෝග, හිමිකම් හා තාවකාලික ගෙවීම් කෙරෙහි අවධානය යොමුව තිබීමෙන් ව්‍යාපෘති පිරිවැය ආවේක්ෂණය කෙරෙයි. සියලුම විචල්‍ය නියෝග ඉහල කළමනාකාරිත්වයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට පෙර, ව්‍යා.ක.ඒ. විසින් දැඩිව පරීක්ෂාවට ලක් කෙරේ. ව්‍යාපෘති පිරිවැය හා කාල මානයන් අඛණ්ඩව ආවේක්ෂණය කරන අතර, විචල්‍යයන් අවම කිරීමට උත්සාහයක් දරනු ලබයි.

කොන්ත්‍රාත්කරුවන්ගේ ගෙවීම් සහතික හා උපදේශකයන්ගේ ඉන්වොයිසි අරමුදල් ආයතනවලට ඉදිරිපත් කිරීමට පෙර පරීක්ෂාවට භාජනය කෙරෙයි. ප්‍රයෝජ්‍ය සේවා ප්‍රතිස්ථානගත කිරීම පිළිබඳව, ප්‍රයෝජ්‍ය සේවා ආයතන සමඟ සමීප සම්බන්ධීකරණයක් සිදුකරනු ලැබේ. කොන්ත්‍රාත්කරුවන්ගේ අනුමැති අවශ්‍යතාවන් පාරිසරික හා පළාත්පාලන අධිකාරියේ ආගමන විගමන රේගුව වැනි නියාමක අධිකාරීන් සමඟ සම්බන්ධීකරණයෙන් පහසුකම් සලසනු ලබයි.

ව්‍යා.ක.ඒ. යට මහජන පැමිණිලි දුක් ගැනිවිලි ලැබෙන අතර මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රතිපත්ති රාමුව තුළ ඒවා විසඳීමට කටයුතු කරනු ලැබේ. විශේෂයෙන් නියමිත කාලය තුළ අරමුදල් බෙදා හැරීම හා අයවැයකරණය සඳහා අරමුදල් ආයතන සමඟ සම්බන්ධීකරණය කරනු ලැබේ.

*වගු අංක 53: ඉලක්කගත නිමවන දිනය සමඟ ව්‍යාපෘතියේ වැඩ සටහන.*

| *දකුණු කොටස* | |
|---|---|
| ඉඩම් අත්පත්කර ගැනීම | නිමකෙරිණි |
| ප්‍රසම්පාදනය | නිමකෙරිණි |
| සිවිල් වැඩ | 2013 මැයි |
| ***උතුරු කොටස - II*** | |
| ඉඩම් අත්පත් කර ගැනීම | සිදුකෙරෙමින් පවතී |
| විස්තරාත්මක සැලසුම් | සිදුකෙරෙමින් පවතී |

**වැඩ කටයුතුවල ප්‍රගතිය**

**අදියර 1 – කොට්ටාව සිට කඩුවෙල දක්වා (දකුණු කොටස-පි.ව.මා.ද.කො.)**

මාර්ග අයිතිය තුළ ඉඩම් සැලසුම් කළ පරිදි කොන්ත්‍රාත්කරුට භාරදෙන ලදි.

*වගු අංක 54: ප්‍රමුඛ ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය*

| *විෂයාංකය* | *විස්තරය* | *2011 දෙසැම්බර් අවසානයේ සමුච්චිත ප්‍රගතිය (%)* | |
|---|---|---|---|
| | | *සැලසුම් කල* | *තථ්‍ය* |
| 1. | මෘදු භූමි සැකසුම<br>- ආරම්භක ස්තරය<br>- බොරළු තට්ටුව<br>- පටි කාණු | <br>100.00<br>100.00<br>100.00 | <br>99.00<br>99.23<br>99.72 |
| 2. | ඉවුරු පිරවීම (භූමි වැඩ) | 71.47 | 48.73 |
| 3. | උප පාදම හා පාදම් සැකසුම | 22.73 | 6.83 |
| 4. | ඇතුරුම් | 22.41 | 4.45 |
| 5. | ව්‍යුහයන් | 80.62 | 49.74 |
| 6. | කාණු | 33.39 | 7.98 |
| 7. | අවස්ථානුරූපීන් හා පහසුකම් | 25.19 | 4.30 |
| 8. | ප්‍රයෝජ්‍ය සේවා ප්‍රතිස්ථානගත කිරීම (A4 IC)<br>- ශ්‍රී ලංකා ටෙලිකොම්<br>- ලංකා විදුලිබල මණ්ඩලය<br>- ජලසම්පාදන | <br>100.00<br>100.00<br>100.00 | <br>55.00<br>80.00<br>55.00 |
| **සමස්ත එකතුව** | | **63.44** | **35.43** |

***වියදම***

1. ඉඩම් අත්පත්කර ගැනීම - රු: මි. 1,600.48
2. උපදේශක සේවා හා සිවිල් වැඩ - රු: මි. 13,350.36

**අදියර 3 – කඩවත සිට කෙරවලපිටිය දක්වා (උතුරු කොටස – II / පි.ව.මා. උ.කො. – II)**

- මූලික සැලසුම් ඇඳීම් මත සම්පූර්ණ කොටස සඳහා ඉඩම් අත්පත්කර ගැනීම. (63.6% නිමකෙරිණි)
- දැනට කොළඹ-කටුනායක අධිවේගී මාර්ගයේ ඉදිකිරීම්වල යෙදී සිටින චීන මෙටලර්ජිකල් කෝපරේෂන් සමාගම විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට අනුව පි.ව.මා. උ.කො.11 ඉදිකිරීම් කටයුතු කරගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණි. ව්‍යාපෘතිය ත්‍රිකෝණ කිරීම සඳහා මෙ.කො. සමාගම සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරනු ලැබිය.
- ලංසු ලේඛන හා වෙනත් ලේඛන සමාලෝචනය සඳහා විදේශ උපදේශකයෙකු පත් කිරීමට අනුමැතිය ලැබුණි.

***වියදම***

1. ඉඩම් අත්පත්කර ගැනීම - රු: මි. 349.71

### 6.3.2 අදියර 2

පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතියේ 11 වැනි අදියර 2011 දී ස්ථාපිත කරන ලද අතර එහි ප්‍රමුඛත්වය දරන්නේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසිනි. ව්‍යාපෘති ඒකක අදියර 2 පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ කඩවත (කි.මී..8+648 ද.) සිට කඩුවෙල (කි.මී..17+500 ද.) දක්වා කොටස ඉදිකිරීමේ වගකීම දරයි. කඩවත සිට කඩුවෙල දක්වා කි.මී. 8.9 වන මංතීරු 4 ක් හා ඉදිරියේදී මංතීරු 6 දක්වා පුළුල් කිරීමේ ඉඩකඩ සහිත ගාස්තු අයකරන මාර්ගය ඉදිකිරීමට අමතරව, මෙම ඒකකය, කඩවත හා කඩුවෙල අන්තර් මාරු 2 ක් ඉදිකිරීමේ වගකීම දරයි. එය පාලම් 7 කින්ද ගුවන් පාලම් 5 කින්ද සමන්විතය. මෙම ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය රු:බි. 44.88 ක් වන අතර, ඊට අරමුදල් සපයනු ලබන්නේ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයයි (JICA).

පිටත වටරවුම් මාර්ගයේ අදියර 11 ඉදිකිරීම්ද 2011 නොවැම්බර් මාසයේදී ජපන් තායිසෙයි කෝපරේෂන් සමාගමට ප්‍රදානය කරන ලදි. එබැවින්, මෙම ව්‍යාපෘති ඒකකය අධිවේගී මාර්ගයේ මෙම කොටස 2012 ජනවාරි මස ආරම්භ කර, තක්සේරු කරන ලද සමස්ත පිරිවැය තුළ, දෙන ලද පිරිවිතර අනුව, ජපන් ඔරියන්ටල් කන්සල්ටන්ට් උපදේශකයන්ගේ සහාය ඇතිව අවුරුදු 3ක් තුළ නිම කිරීමේ වගකීම දරයි.

ව්‍යාපෘති ඒකකයේ අධ්‍යක්ෂ හා කාර්ය මණ්ඩලය මාර්ග අයිතිය තුළ පිහිටි සියලු ඉඩම් කොන්ත්‍රාත්තුවේ සඳහන් කල රාමුව තුළ අත්පත්කර ගැනීමට වගකීම දරයි. ඉඩම් වලට

නිත්‍යානුකූල ඔප්පු නොමැති ව්‍යාපෘතිය නිසා අවතැන් වූ මිනිසුන් නැවත පදිංචි කිරීමද අවශ්‍ය වේ. මේ සඳහා අවතැන්වූ මිනිසුන්ට නැවත ජන ජීවිතය ගොඩ නගා ගැනීම සඳහා අංශය විසින්, ප්‍රතිස්ථාපන බිම් ස්ථාපිත කිරීම අවශ්‍ය වේ.

***වගු අංක 55: පිටත වටරවුම් මාර්ගය අදියර II අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ විස්තර***

| *මාර්ගයේ නම* | *දිග (කි.මි)* | *ස.ඇ.පි. (රු: මි:)* | *2011 තුළ වියදම (රු:මි:)* |
|---|---|---|---|
| පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතිය II වැනි අදියර | 8.90 | 44, 880 | 1, 524 ( ඉඩම් අත්පත්කර ගැනීම සඳහා) |

## 6.4 කොළඹ-මහනුවර විකල්ප මාර්ගය (උතුරු නැගෙනහිර අධිවේගී මාර්ගය)

කොළඹ-මහනුවර විකල්ප මාර්ගය (උතුරු නැගෙනහිර අධිවේගී මාර්ගය) ව්‍යාපෘතියෙන් අදහස් කරන ලද්දේ කොළඹ-කටුනායක අතර විකල්ප මහාමාර්ගය ඉදිකිරීම හා උතුරු නැගෙනහිරට ජංගමතාවය වැඩි දියුණු කිරීමටයි. මෙම අංශය 2000 වර්ෂයේදි සූත්‍රකරණය කරන ලද අතර, ස්විඩන සංවර්ධන ආයතනයේ (SIDA) ප්‍රදාන ආධාර මත ශක්‍යතා අධ්‍යයනය ආරම්භ කරන ලදි.

මෙම ව්‍යාපෘතියේ ප්‍රමුඛ අරමුණ වන්නේ කොළඹ-මහනුවර අධිවේගී මාර්ගය ඉක්මනින්ම දියත් කිරීමයි. මෙම මාර්ගය සාර්ථක කර ගැනීම සඳහා මෙම ව්‍යාපෘතියේ සේවයයා හෝ ක්‍රියාත්මක කරන ආයතන වශයෙන්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ඇතැම් වගකීම්වලට උරදිය යුතුව ඇත.

මෙම ව්‍යාපෘතිය තවමත් පූර්ව ඉදිකිරීම් අදියරේ පවතින බැවින්, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදි වර්තමාන වගකීම් ප්‍රධාන වශයෙන් යොමුවී ඇත්තේ සියලුම ප්‍රාථමික වැඩ හා ක්‍රියාකාරකම්ය. ඒවා අතර, ව්‍යාපෘති ඒකකය විසින් ඉටුකළ යුතු තාක්ෂණික (ඉංජිනේරුමය) මූල්‍ය සමාජීය හා පාරිසරික බැඳීම් වේ. භූමි සමීක්ෂණ, ජල විද්‍යාව පිළිබඳ හැදෑරීම, තාක්ෂණික විමර්ශන සිදුකිරීම සැලසුම් සඳහා සම්පූර්ණ කළ යුතු අංගයන් වේ. ජ්‍යාමිතික හා විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් පිළියෙල කිරීම ප්‍රධාන තාක්ෂණික ක්‍රියාකාරකම් දෙකකි.

වගන්ති 11 අනුව සමීක්ෂණ කිරීම, ප්‍රතිස්ථාපන සමීක්ෂණ සිදුකිරීම හා ප්‍රතිස්ථාපන ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම තක්සේරු කිරීම හා ඉඩම් අත්පත්කර ගැනීම්, ප්‍රතිස්ථාපනය, බලපෑමට ලක්වූ පාර්ශවවල ජන ජීවිතය යථා තත්ත්වයට පත්කිරීම, සමාජීය මානයන් විෂය පථයට ගැනෙන ප්‍රධාන ක්‍රියාකාරකම් වෙයි. අධිවේගී මාර්ගය ක්‍රියාත්මක කිරීමත් සමඟ පරිසරය ආරක්ෂා කිරීමද වගකීමකි. ශක්‍යතා අධ්‍යයන, පාරිසරික බලපෑම් තක්සේරුව (EIA) ආදිය පාරිසරික මාන

යටතට වැටෙන ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. ව්‍යාපෘතියේ පාරිසරික නිශ්කාශනය සඳහා සම්පාදනය කරන ලද මාර්ගෝපදේශවලට අනුව සියලුම ඉදිකිරීම් හා මෙහෙයුම් කටයුතු සිදුකල යුතු වේ.

**2011 වර්ෂය සඳහා ප්‍රගතිය**

පූර්ව ඉදිකිරීම් කටයුතු පමණක් සිදු කරමින් පැවතිණි.

***වගු අංක 56: කොළඹ-මහනුවර විකල්ප මහාමාර්ග ව්‍යාපෘතියේ ව්‍යාපෘති විස්තර***

| ක්‍රියාකාරකම් | 2010 දක්වා ප්‍රගතිය | 2010 දක්වා වියදම | 2011 අවසානයේ ප්‍රගතිය | 2011 තුළ වියදම |
|---|---|---|---|---|
| පා.බ.ත. නිෂ්කාශනය - දිර්ඝ කිරීම | - | - | 100% | 0.20 |
| රා..හ. PPP ක්‍රියාවලිය | 74% | 3.242 | 74% | |
| භූමි සමීක්ෂණය ද. 0+000 – 98+900 | 96% | 86.54 | 99% | 7.323 |
| ප්‍රතිස්ථාපන ක්‍රියාකාරි සැලැස්ම - අදියර I ද 0+000 – 48+200 | 95% | 7.55 | 100% | - |
| ජ්‍යාමිතික සැලසුම්/ව්‍යුහාත්මකසැලසුම් ද. 0+000 – 98+900 | 15% | 4.50 | 25% | 1.05 |
| මිහිවිද්‍යාත්මක විමර්ශනය ද 0+000 – 48+200 | 10% | 2.65 | 35% | 12.56 |
| ජලවිද්‍යා අධ්‍යයනය ද 0+000 – 48+200 | 80% | 6.86 | 96% | 0.57 |
| වගන්ති II සමීක්ෂණය ද 0+000 – 48+200 | 45% | 16.59 | 70% | 2.44 |

## 6.5 ජපන් ආධාර ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාව 1980 විදේශ ආයෝජනවලට විවෘත කිරීමෙන් පසුව ජපානය ශ්‍රී ලංකාවේ මහාමාර්ග අංශයේ සංවිධානයේ ප්‍රධාන ප්‍රදානකරුවෙකු හා ක්‍රියාකාරි හවුල්කරුවෙකු ද විය. මෙම ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ජපානය අරමුදල් ව්‍යාපෘති පමණක් ක්‍රියාත්මක කිරීමට ස්ථාපිත කරන ලදි. 2011 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදි පහත දැක්වෙන කටයුතු අයත් විය.

- අයවැය ඇස්තමේන්තු, ඉංජිනේරු ඇස්තමේන්තු මාසික ප්‍රගති වාර්තා හා අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම.
- ව්‍යාපෘතිවල උපදේශක සේවා කළමනාකරණය හා ආවේක්ෂණය.
- ව්‍යාපෘතිවල සිවිල් වැඩ, කොන්ත්‍රාත් කළමනාකරණය, ආවේක්ෂණය හා ගෙවීම් සහතික කිරීම.
- උපදේශක සේවා කොන්ත්‍රාත් ඇගයීම, සංශෝධනය හා දිර්ඝ කිරීම.
- සිවිල් වැඩ කොන්ත්‍රාත්වල පිරිවැය විචලයයන් හා අදාල කාල දිගු කිරීම් අනුමත කිරීම.

- ප්‍රදාන ආයතන, අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා ප්‍රයෝජ්‍ය සේවා ආයතන සමඟ මාසික මෙහෙයුම් කමිටු රැස්වීම් හා වෙනත් සම්බන්ධිකරණ රැස්වීම් සංවිධානය කිරීම.

- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් මෙහෙයවන ව්‍යාපෘතිය පිළිබඳ නීති කටයුතු හා මානව හිමිකම් නඩු වලට සහභාගි වීම.

දුගින් සඳහා නැගෙනහිර යටිතල ව්‍යුහ සංවර්ධන ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුව රු:මි: 6250ක් වූ අතර, ඊට කොළඹ-රත්නපුර-වැල්ලවාය-මඩකලපුව මාර්ගයේ අක්කරෙයිපත්තුව සිට මඩකලපුව කොටස වැඩි දියුණු කිරීම, මඩකලපුව-තිරිකොණ්ඩියාමඩු-ත්‍රිකුණාමල මාර්ගයේ මඩකලපුව සිට තිරිකොණ්ඩියාමඩු කොටස පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම හා කොළඹ-රත්නපුර-වැල්ලවාය-මඩකලපුව මාර්ගයේ අංක 427/1 දරණ නව කල්ලඩි පාලම ඉදිකිරීම ඇතුළත් විය.

**2011 වර්ෂය තුළ නිමකල ව්‍යාපෘති**

අ) මන්නාරම මාර්ගය ඉදිකිරීම හා වේලි මග වැඩි දියුණු කිරීම

ආ) දුගින් සඳහා යටිතල ව්‍යුහ සංවර්ධන ව්‍යාපෘතිය

- කොළඹ-රත්නපුර-වැල්ලවාය-මඩකලපුව මාර්ගයේ (A004) අක්කරෙයිපත්තුව සිට මඩකලපුව දක්වා පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම
- මඩකලපුව-තිරුකොණ්ඩියාමඩු-ත්‍රිකුණාමල මාර්ගයේ (A015) මඩකලපුවේ සිට තිරුකොණ්ඩියාමඩු දක්වා පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම.

***වගු අංක 57: දුගින් සඳහා නැගෙනහිර යටිතල ව්‍යුහ සංවර්ධන ව්‍යාපෘතියේ නිම කරන ලද ව්‍යාපෘති විස්තර.***

| ***මාර්ගයේ නම*** | ***දිග කි.මී.*** | ***ආරම්භක දිනය*** | ***නිමකල දිනය*** | ***2010 දක්වා ප්‍රගතිය (%)*** | ***2011 අවසානයේ ප්‍රගතිය (%)*** | ***2011 වර්ෂය තුළ වියදම (රු:මි:)*** |
|---|---|---|---|---|---|---|
| AA004 මාර්ගය අක්කරෙයිපත්තුව සිට මඩකලපුව දක්වා | 64 | 2007 දෙසැම්බර් | 2010 දෙසැම්බර් | 100 | 2010 දෙසැම්බර් නිම කෙරිණි | 421 |
| AA015 මාර්ගයේ මඩකලපුව සිට තිරිකොණ්ඩියාමඩු දක්වා බෝක්කු | 36 | 2007 දෙසැම්බර් | 2010 දෙසැම්බර් | 100 | 2010 දෙසැම්බර් නිම කෙරිණි | |

**2011 වර්ෂයේ ඉදිකරමින් පවතින මාර්ග හා පාලම්**

ආ) දූගින් සඳහා යටිතල ව්‍යුහ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කොළඹ-රත්නපුර-වැල්ලවාය-මඩකලපුව මාර්ගයේ (A004) අංක 427/1 දරණ නව කල්ලඩි පාලම ඉදි කිරීම.

- 2011 දෙසැම්බර් 31 දින පහත දැක්වෙන ටැම් බැස්සවීමේ වැඩ නිමකරන ලදි.
  - P3 කුළුණ - ටැම් 5 ක් නිමකෙරිණි
  - P4 කුළුණ - ටැම් 7 ක් නිමකෙරිණි
  - P5 කුළුණ - ටැම් 2 ක් නිමකෙරිණි
  - A2 යාබැම්ම - ටැම් 7 ක් නිමකෙරිණි
- 7ක් සඳහා බාල්ක පදම් කිරීම නිමකෙරිණි. 3ක් සඳහා පෙරසවි ගැන්වීම නිමකෙරිණි.
- P1 හා P2 කුළුණු ඉදිකිරීම නිමකෙරිණි.

***වගු අංක 58: දූගින් සඳහා ඉදිකෙරෙමින් පවතින නැගෙනහිර යටිතල ව්‍යුහ සංවර්ධන ව්‍යාපෘති විස්තර***

| *මාර්ගයේ නම* | *දිග කි.මි.* | *ආරම්භක දිනය* | *නිමකිරීමට අපේක්ෂිත දිනය* | *2010 දක්වා ප්‍රගතිය (%)* | *2011 අවසානයේ ප්‍රගතිය (%)* | *2011 වර්ෂය තුළ වියදම (රු:මි:)* |
|---|---|---|---|---|---|---|
| *අංක 427/1 කල්ලඩි පාලම (දූගින් සඳහා නැගෙනහිර යටිතල ව්‍යුහ සංවර්ධන ව්‍යාපෘතිය)* | - | 2010 අප්‍රේල් | 2012 අප්‍රේල් | 7.73 | 27.68 | 230 |

**කල්ලඩි පාලම ඉදිකිරීම දැක්වෙන ඡායාරූප**



ටැම් බැස්සීමේ කටයුතු



බාල්ක සඳහා අභ්‍යන්තර හැඩයම සවිකිරීම



බාල්ක සඳහා කොන්ක්‍රීට් යෙදීමේ වැඩ



නිමකරන ලද බාල්කය

අ) බේස්ලයින් මාර්ගයේ දකුණු දිගුව ඉදිකිරීම අදියර III

1 වැනි කිලෝමීටරය සඳහා ඉඩම් අත්පත්කර ගැනීම් සිදු කෙරෙමින් පවතී.

ආ) ජ.ජා.ස.ආ. ප්‍රදාන යටතේ නැගෙනහිර පළාතේ පාලම් 05 ක් යළි ඉදිකිරීම.

- පේරාදෙණිය-බදුල්ල-වෙන්කලඩි මාර්ගයේ (A005) පාලම් අංක.1 – 240/4
- පේරාදෙණිය-බදුල්ල-වෙන්කලඩි මාර්ගයේ (A005) පාලම් අංක..2 – 241/42, 241/3, 241/4
- පේරාදෙණිය-බදුල්ල-වෙන්කලඩි මාර්ගයේ (A005) පාලම් අංක 3 – 247/2
- පේරාදෙණිය-බදුල්ල-වෙන්කලඩි මාර්ගයේ (A005) පාලම් අංක.4 – 283/7
- මඩකලපුව-ත්‍රිකොණ්ඩියාමඩු-ත්‍රිකුණාමලය මාර්ගයේ (A015) පාලම් අංක.5 – 59/1

**නැගෙනහිර පළාතේ පාලම් 05 ක් යළි ඉදිකිරීම පෙන්වන ඡායාරූප**




කොන්ක්‍රීට් යෙදීම පාලම් අංක 1 කුළුණු ඉදිකිරීම



**පාලම් අංක 3 හැරවුම් මාර්ගය ඉදිකිරීම නිම කෙරිණි.**



**පාලම් අංක 5 හැරවුම් මාර්ගය ඉදිකිරීම නිම කෙරිණි.**

*වගු අංක 59: නැගෙනහිර පළාතේ යළි ඉදිකරමින් පවතින පාලම් 5 ව්‍යාපෘති විස්තර*

| *මාර්ගයේ නම* | *කා.දි. පිරිවැය (රු:මි:)* | *ආරම්භක දිනය* | *නිමකිරීමට අපේක්ෂිත දිනය* | *2010 දක්වා ප්‍රගතිය (%)* | *2010 දක්වා වියදම (රු:මි:)* | *2011 අවසානයේ ප්‍රගතිය (%)* | *2011 තුල වියදම (රු:මි:)* | *ක්‍රියාකාරකම්වල ප්‍රගතිය* |
|---|---|---|---|---|---|---|---|---|
| A005 මාර්ගයේ අංක 1 – 240/4 පාලම (මහඔය අතුගහ පාලම) | 1, 930 | 2011 ජූනි | 2013 අප්‍රේල් | ව්‍යාපෘති වැඩ 2011 දි ආරම්භ කරන ලදි | 0.13 | 10.5 | 536.33 | හැරවුම් මාර්ගයේ වැඩ නිමකෙරිණි. පැරණි පාලම කඩා ඉවත් කිරීම නිම කෙරිණි. පාදම් වැඩ කෙරෙමින් පවති |
| A005 මාර්ගයේ අංක .2 – 241/42, 241/3, 241/4 (මුන්දෙනි පාලම) | | 2011 ජූනි | 2013 අප්‍රේල් | | | | | ආරම්භ කර නොමැත |
| A005 මාර්ගයේ අංක.3 – 247/2 (පුලවඩි පාලම) | | 2011 ජූනි | 2013 අප්‍රේල් | | | | | හැරවුම් මාර්ගයේ වැඩ නිමකෙරිණි. පාදම් වැඩ කෙරෙමින් පවති |
| A005 මාර්ගයේ අංක 4 – 283/7 (වෙන්කලඩි පාලම) | | 2011 ජූනි | 2013 අප්‍රේල් | | | | | ආරම්භ කර නොමැත |
| A015 මාර්ගයේ අංක 5 – 59/1 (පනිච්චන්කර්නි පාලම) | | 2011 ජූනි | 2013 අප්‍රේල් | | | | | හැරවුම් මාර්ගයේ වැඩ කෙරෙමින් පවති. පැරණි පාලම කඩා ඉවත් කිරීම සිදු කෙරෙමින් පවති |

## 6.6 විවිධ විදේශාධාර ව්‍යාපෘතිය (MFAP)

විවිධ විදේශාධාර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය 2000 වර්ෂයේ පිහිටුවන ලද්දේ ප්‍රධාන වශයෙන් ද්විපාර්ශික ආයතනවලින් ලැබෙන විදේශාධාර ව්‍යාපෘති මෙහෙයවීම සඳහාය. ආරම්භයේදි අරමුදල් ආයතනය වූයේ කුවේට් අරමුදලයි. දැනට කුවේට්, සවුදි අරාබියාව, කොරියානු හා ඕස්ට්‍රියානු අරමුදල් යෙදූ සංවර්ධන ව්‍යාපෘති ඒකකය විසින් මෙහෙයවනු ලබයි. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු මෙම ඒකකයේ ප්‍රධානත්වය දරණ අතර පොදුවේ සෑම අරමුදලකටම වෙනම නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු සිටි. මෙම ඒකකය කොරියානු ආ.සං.ස.අ.අරමුදල් යෙදූ ව්‍යාපෘති හැර අනෙකුත් සියලුම අරමුදල් ව්‍යාපෘතිවල කොන්ත්‍රාත් අධීක්ෂණය සිදුකරනු ලබයි. හැටන්-නුවරඑළිය මාර්ග ව්‍යාපෘතිය හැර ව්‍යාපෘති සඳහා අවශ්‍ය ඉඩම් අත්පත්කර ගැනීම් මෙම ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සෘජුවම මෙහෙයවනු ලබයි.

කොරියානු ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල විසින් අරමුදල් සපයන පාදෙණිය-අනුරාධපුර මාර්ගය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය හා හැටන්-නුවරඑළිය මාර්ගය වැඩ දියුණු කිරීමේ ව්‍යාපෘතිය දැනට ඉදිකෙරෙමින් පවතී.

***වගු අංක 60: ඉදිකෙරෙමින් පවතින විවිධ විදේශාධාර ව්‍යාපෘතියේ විස්තර***

| මාර්ගයේ නම | | දිග කි.මී. | කා.දි.පි. (රු:මි:) | ආරම්භක දිනය | නිමකිරීමට අපේක්ෂිත දිනය | 2010 දක්වා ප්‍රගතිය (%) | 2010 දක්වා වියදම (රු:මි:) | 2011 අවසානයේ ප්‍රගතිය (%) | 2011 තුල වියදම (රු:මි:) |
|---|---|---|---|---|---|---|---|---|---|
| පාදෙනිය-අනුරාධපුර මාර්ගය වැඩි දියුණු කිරිම | සිවිල් වැඩ | 81 | 8, 591 | 2009.07.01 | 2012.11.30 | 27.82 | 2536.42 | 53 | 2779.27 |
| | ඉඩම් අත්පත්කර ගැනීම | | | | | 49 | 49.38 | 70 | 13.73 |
| හැටන් නුවරඑලිය මාර්ගය වැඩි දියුනු කිරිම | සිවිල් වැඩ | 46.75 | 5, 685 | 2011.12.01 | 2014.05.31 | 0 | - | - | 251.52 |
| | ඉඩම් අත්පත්කර ගැනීම | | | | | **0** | 2.48 | 0.1 | 4.67 |

පහත සඳහන් ව්‍යාපෘති දැනටමත් නිමකර ඇති අතර අවශ්‍ය ඉඩම් සඳහා වන්දි ගෙවීම් පමණක් සිදුකෙරෙමින් පවති.

- කොළඹ-රත්නපුර-වැල්ලවාය-මඩකලපුව මාර්ගයේ රත්නපුර-බලංගොඩ කොටස පුනරුත්ථාපනය
- කොළඹ-රත්නපුර-වැල්ලවාය-මඩකලපුව මාර්ගයේ බලංගොඩ-බණ්ඩාරවෙල කොටස පුනරුත්ථාපනය
- කුවේට් අරමුදල් යෙදූ පාලම් (පුනරුත්ථාපනය / නැවත ඉදිකිරීමේ ව්‍යාපෘති)
- කින්නියා පාලම් 7 වැඩි දියුණු කිරීම – සවුදි සංවර්ධන අරමුදල යටතේ තඹලගමුව-කින්නියා මාර්ගය වැඩි දියුණු කිරීම
- ඕස්ට්‍රියානු සහයෝගිතාවය ඇතිව, වානේ පාලම් පහක කේවල ඉදිකිරීම.

### වගු අංක 61: විවිධ විදේශාධාර ව්‍යාපෘතියේ නිමකරන ලද ව්‍යාපෘති විස්තර

| මාර්ගයේ නම | | දිග (කි.මී.) | කා.දි.පි. (රු: මි: ) | ආරම්භක දිනය | නිමකල දිනය | 2010 දක්වා ප්‍රගතිය (%) සිවිල් වැඩ | 2010 දක්වා වියදම (රු:මි:) | 2011 අවසානයේ ප්‍රගතිය (%) | 2011 වර්ෂය තුළ වියදම (රු:මි:) |
|---|---|---|---|---|---|---|---|---|---|
| රත්නපුර-බලංගොඩ මාර්ගයේ පුනරුත්ථාපනය | සිවිල් වැඩ | 43 | 3, 745 | 2000.09.14 | 2003.09.30 | 100 | 1748.83 | 100 | - |
| | ඉඩම් අත්පත් කර ගැනීම | | | | | | 1871.48 | 96 | 5.07 |
| රත්නපුර-බලංගොඩ මාර්ගයේ පුනරුත්ථාපනය | සිවිල් වැඩ | 55 | 5, 251 | 2005.02.01 | 2008.05.31 | 100 | 4894.81 | 100 | - |
| | ඉඩම් අත්පත් කර ගැනීම | | | | | | 183.57 | 38.5 | 12.72 |
| කුවේට් අරමුදල් යෙදූ පාලම් (පුනරුත්ථාපන/ප්‍රතිනිර්මාණ ව්‍යාපෘතිය) | සිවිල් වැඩ | පාලම් 32 ක් හා කි.මී.2.2 එක් අතුරු මාර්ගයකි | 3, 432 | 1995 අප්‍රේල් | 2011.03.31 | 100 | 2533.18 | 100 | 13.52 |
| | ඉඩම් අත්පත් කර ගැනීම | | | | | | 531.08 | 99 | 33.98 |
| කින්නියා පාලම් 7 ඉදිකිරීම සංවර්ධනය සඳහා සවුදි අරමුදල යටතේ තඹලගමුව-කින්නියා මාර්ගය වැඩි දියුණු කිරීම | සිවිල් වැඩ | මී 396 හා මී 20 (පාලම් 2) කි.මී.,6.6 ක (මාර්ගය) | 1, 692 | 2006.02.16 | 2009.10.31 | 100 | 1254.39 | 100 | 53.47 |
| | ඉඩම් අත්පත් කර ගැනීම | | | | | | 25.75 | 39.5 | 22.56 |
| ඕස්ට්‍රියානු සභාය යටතේ වානේ පාලම් පහක් කේවල ඉදිකිරීම | සිවිල් වැඩ | පාලම් 5කි. (මී 125/ 110 / 70/ 35/ 25) සහ ප්‍රවේශ මාර්ගය (කි.මී.3.4 ) | 2, 546 | 2007.03.31 | 2009.09.30 | 100 | 2412.3 | 100 | - |
| | ඉඩම් අත්පත් කර ගැනීම | | | | | | 0.36 | 99 | 4.03 |

**ප්‍රගතියට බාධාවන්**

මුදල් අග්‍රිමය නොමැතිකම හා ඉඩම් අත්පත් කර ගැනිමේ පරිපාටිය ක්‍රියාත්මක කිරිමේ ප්‍රමාදය ව්‍යාපෘතියට ඇතිවූ ප්‍රධාන බාධාවන් විය.

2010 පසු භාගයේ පැවති අසතුටුදායක කාලගුණික තත්ත්වය හේතු කොට ගෙන මාර්ග පෘෂ්ඨයට සිදුවූ හානි නිසා අනුරාධපුර-පාදෙනිය මාර්ග ව්‍යාපෘතිය නිමකිරිම දිග්ගැසුනි. මෙයට විසඳුමක් වශයෙන් කොරියානු, ආ.සං.ස.අරමුදලෙන් රු:බිලියන 1.3 ක අතිරේක ණය මුදලක් ඉල්ලා ඇත.

**යෝජනා කරන ලද ප්‍රතිකර්ම පියවරයන්.**

- වර්තමාන සංවර්ධන ඉලක්ක හා කටයුතු සැලකිල්ලට ගනිමින් නව ඉඩම් අත්පත් කර ගැනිමේ පනතක් පිළියෙල කිරිම සුදුසු වේ.

## 6.7 ලෝක බැංකු අරමුදල් යෙදූ මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය

ජාතික මහාමාර්ග ජාලය වැඩි දියුණු කිරිම වෙනුවෙන් ලෝක බැංකුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජය වෙත එ.ජ.ඩො.මිලියන 198.10 ක මුල්‍යාධාරයක් සපයන ලදි.

මෙම ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය යටතේ කි.මි.620.90 ක මාර්ග කොටස් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරිම පරිපාලනය සඳහා පිහිටුවන ලදි. දෙවැනි අතිරේක මුල්‍යාධාරය යටතේ අඹේපුස්ස-කුරුණෑගල-ත්‍රිකුණාමලය මාර්ගයේ කි.මි.135 ක කොටසක්, 2011 වර්ෂයේදි පුනරුත්ථාපනය කර වැඩි දියුණු කරන ලදි.

- අදියර 1 – කන්තලේ-ත්‍රිකුණාමලය මාර්ග කොටස A006 කි.මි. 45.00
  - ✓ කොන්ත්‍රාත් 1 – ක ත්‍රි 01, කන්තලේ-ගංතලාව (කි.මි.157+000 – 167+280 දක්වා) හා කන්තලේ-පෙරාතුවැලි (B196) මාර්ගය
  - ✓ කොන්ත්‍රාත් 2 – ක ත්‍රි 02, ගංතලාව-තඹුලගමුව (කි.මි 167+280 – 178+000 දක්වා)
  - ✓ කොන්ත්‍රාත් 3 – ක ත්‍රි 03, තඹුලගමුව-සර්ධාපුර (කි.මි 178+000 - 190+000 දක්වා)
  - ✓ කොන්ත්‍රාත් 4 – ක ත්‍රි 04, සර්ධාපුර-ත්‍රිකුණාමලය (කි.මි 190+000 – 199+300 දක්වා)

- අදියර 2 – අඹේපුස්ස-කුරුණෑගල-දඹුල්ල කොටස කි.මිළ 90.06
  - ✓ කොන්ත්‍රාත් 1 – අ ද 01, අඹේපුස්ස-පොතුහැර (කි.මි.0+000 – 23+000 දක්වා)
  - ✓ කොන්ත්‍රාත් 2 – අ ද 02, පොතුහැර-ඉබ්බාගමුව (කි.මි.23+000 – 47+000 දක්වා)
  - ✓ කොන්ත්‍රාත් 3 – අ ද 03, ඉබ්බාගමුව-ඔමරගල්ල (කි.මි.47+000 – 69+000 දක්වා)
  - ✓ කොන්ත්‍රාත් 4 – අ ද 04, ඔමරගල්ල-දඹුල්ල (කි.මි.69+000 – 90+060 දක්වා)

අදියර 1 යටතේ සියලුම කොන්ත්‍රාත් ප්‍රදානයන් 2011.07.11 දින ආරම්භ කල අතර, අදියර 11 සැලසුම් කටයුතු සිදු කෙරෙමින් පවති.

***වගු අංක 62: අඹේපුස්ස-කුරුණෑගල-ත්‍රිකුණාමල මාර්ගයේ (A006) කන්තලේ සිට ත්‍රිකුණාමලය මාර්ග කොටස පිළිබඳ ව්‍යාපෘති විස්තර:***

| ***කොන්ත්‍රාත් ප්‍රදාන*** | ***ව්‍යාපෘතියේ නම*** | ***දිග කි.මී.*** | ***ආරම්භ කල දිනය*** | ***නිමකිරීමට අපේක්ෂිත දිනය*** | ***2011 අවසානයේ ප්‍රගතිය (%)*** | ***2011 වර්ෂය තුළ වියදම*** |
|---|---|---|---|---|---|---|
| කේ.ටී. 01 | කන්තලේ සිට ගංතලාව | 10.28 | 2011.07.11 | 2012.10.10 | 4.55 | 156.041 |
| | කන්තලේ සිට පෙරාතුවැලි මාර්ගය (B196) | 3.10 | | | | |
| කේ.ටී 02 | ගංතලාව සිට තඹලගමුව දක්වා | 10.72 | 2011.07.11 | 2012.10.10 | 2.25 | 125.116 |
| කේ.ටී 03 | තඹලගමුව සිට සර්ධාපුර දක්වා | 12.0 | 2011.07.11 | 2012.10.10 | 3.52 | 117.511 |
| කේ.ටී 04 | සර්ධාපුර සිට ත්‍රිකුණාමලය දක්වා | 9.3 | 2011.07.11 | 2012.10.10 | 4.00 | 153.002 |

**ප්‍රදාන 1 කොන්ත්‍රාත් කටයුතු පිළිබඳ ජායාරූප**




**බෝක්කු ඉදිකිරීම**




**තාප්ප සඳහා කැණීම් සිදුකිරීම**

## 6.8 ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය

ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ පළමුවැනි ආංශික ණය ප්‍රදානයන් මත වූ ව්‍යාපෘතියකි. ජා.ම.ආ.ව්‍යා. අරමුණ වන්නේ රටේ මහාමාර්ග ජාලය විසින් ඉටුකරන ලද ක්‍රියා කලාපය නැංවීමෙන්, ආර්ථික හා සමාජීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමයි.

**1. ජාතික මහාමාර්ග තත්ත්වය නැංවීමේ හා නඩත්තු කිරීමේ සහභාගය**

කි.මී. 236.40 ක් සම්පූර්ණ දිග සහිත පහත දැක්වෙන මාර්ග කොටස් පවත්නා සීමිත අරමුදල් සලකා අරමුදල් සහභාගය යටතට පවරා ගන්නා ලදි

- A005 නුවරඑළිය-බදුල්ල කි.මී. 54.9
- A006 හබරණ-කන්තලේ කි.මී. 43.6
- A012 පුත්තලම-අනුරාධපුර කි.මී. 83.0
- A026 උඩතැන්න-මහියංගනය කි.මී. 40.8
- A004 නුගේගොඩ-හෝමාගම කි.මී. 14.1

2. **කාර්ය සාධනය පදනම් කරගත් නඩත්තුව**

පහත දැක්වෙන අවිස්සාවේල්ල, රත්නපුර හා හැටන් විධායක ඉංජිනේරු කොට්ඨාශවලට අයත් වූ මාර්ග කොටස් දෙක, කාර්ය සාධනය පදනම් කරගත්, නඩත්තු නියාමක ව්‍යාපෘතිය යටතට ගන්නා ලදි. යෝජිත මාර්ග කොටස්,

- අවිස්සාවේල්ල-රත්නපුර මාර්ගය කි.මී. 60 සිට 96 දක්වා– කි.මී. 36
- අවිස්සාවේල්ල-හැටන් මාර්ගය කි.මී. 0 සිට 72 දක්වා – කි.මී.72

3. **ආයතනමය හා ප්‍රතිපත්තිමය සහාය සහභාගය**

අ) **මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල**

ආසියානු සංවර්ධන බැංකුවේ ආයතන සවිගැන්වීමේ ණය සහභාගය යටතේ, මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ණය සහභාගයෙන් කොටසක් වෙන්කරන ලදි. ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්තුව 2010.08.17 දින දේශීය කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කළ අතර ඉදිකිරීම සිදුවෙමින් පවතී. පළමුවැනි අදියර සඳහා සම්පූර්ණ පිරිවැය රු:මි:.671.22 වන අතර 2011 සඳහා වියදම රු:මි: 471.00 කි.

ආ) **මාර්ග සංවර්ධන අධිකාරියේ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය**

මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදනය සිදුවෙමින් පවතී.

**ප්‍රදානායතනය**

ආසියානු සංවර්ධන බැංකුව

**ණය ගිවිසුම:**

| | |
|---|---|
| ණය මුදල | – එ.ජා.ඩො.මිලියන 150 |
| ණය මුදල ක්‍රියාත්මක දිනය | – 2007.02.20 |
| ණය මුදල අවසන් වන දිනය-මුල් | – 2010.12.31 |
| සංශෝධිත | – 2012.12.31 |

**ඉදිකිරීම් කටයුතුවල ඡායාරූප**

*පුත්තලම-නොච්චියාගම මාර්ගය*



කි.මී.39+308 හි සම්පූර්ණ කළ මාර්ග කොටස



කි.මී. 58+580 සම්පූර්ණ කළ මාර්ග කොටස

## උඩතැන්න-මහියංගනය මාර්ගය



ඝර්ෂණ බාධකය කි.මී. 40+700



7 වැනි කොණ්ඩාකටු වංගුව නිමකරන ලද බයින්ඩර් ආලේපය කි.මී. 58+580

## නුවරඑළිය-බදුල්ල මාර්ගය



නිමකල මාර්ග පෘෂ්ඨය කි.මී.88+550



ඉවුරු බැවුමේ තණපිඩැලි ඇල්ලීම කි.මී. 92+700 වම්පස

## හබරණ-කන්තලේ මාර්ගය



නිමකල 119/2 පාලම



6 වැනි කි.මී. යේ මාර්ග සලකුනු කිරීමේ නිමකල කොටස

### නුගේගොඩ-හෝමාගම මාර්ගය



මාර්ග කොටස කි.මී. 12+500

### මහාමාර්ග ලේකම් ගොඩනැගිල්ල




ව්‍යුහාත්මක වැඩ අදියර 7- 8

### කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව



අවිස්සාවේල්ල-හැටන්-නුවරඑළිය මාර්ගයේ කි.මී. 47+700, අසල වම්පස රේඛීය කාණු පිරිසිදු කිරීම.

2011 වර්ෂය තුළ ව්‍යාපෘතිවල ප්‍රගතිය පහත වගුවේ දැක්වේ.

***වගු අංක 63: ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතියේ විස්තර***

| ***මාර්ගයේ නම*** | ***දිග** කි.ම.* | ***කා.දි.පි.*** | ***ආරම්භක දිනය*** | ***නිමකිරීමට අපේක්ෂිත දිනය*** | ***2010 දක්වා ප්‍රගතිය (%)*** | ***2010 දක්වා වියදම (රු:මි:)*** | ***2011 අවසානයේ ප්‍රගතිය (%)*** | ***2011 අවසානයේ වියදම (රු:මි:)*** | ***කටයුතුවල ප්‍රගතිය*** |
|---|---|---|---|---|---|---|---|---|---|
| A012 : පුත්තලම-අනුරාධපුරය | 83.0 | 5, 043 | 2009.06.01 | 2012.03.31 | 82.0 * | 1, 852.269 | 80.8 * | 3, 318.696 | මාර්ග ඇතිරීම බයින්ඩර් හා දැරීම් ස්ථරය |
| A026 : උඩතතැන්න-මහියංගනය | 40.8 | 5, 412 | 2008.11.01 | 2012.03.31 | 45.0 | 2, 603.095 | 95.4 | 4, 309.226 | මාර්ග ඇතිරීම බයින්ඩර් හා දැරීම් ස්ථරය |
| A005 : නුවරඑළිය-බදුල්ල | | 6, 116 | 2008.12.01 | 2012.06.30 | 48.0 | 2, 447.706 | 73.7 | 3, 865.537 | මාර්ග ඇතිරීම බයින්ඩර් හා දැරීම් ස්ථරය |
| A006 : හබරණ-කන්තලේ | 43.6 | 2, 769 | 2008.07.11 | 2010.08.28 | 100.0 | 2, 516.476 | 100.0 | 2, 705.274 | |
| A004 : නුගේගොඩ-හෝමාගම | 14.1 | 1, 260 | 2011.06.01 | 2012.08.23 | 0.0 | 0.000 | 42.5 | 708.082 | මාර්ග ඇතිරීම බයින්ඩර් හා දැරීම් ස්ථරය |
| මහාමාර්ග ලේකම් කාර්යාලය | - | 1, 307 | 2010.11.04 | 2012. 11.30 | 7.0 | 141.720 | 37.0 | 470.785 | ගොඩනැගිලි ව්‍යුහාත්මක හා පිරියම් වැඩ |
| කාර්ය සාධනය පදනම්වූ නඩත්තුව | 108.6 | 330 | 2011.03.02 | 2012.09.01 | 0.0 | 0.000 | 92.0 | 218.691 | |

*වැඩ සටහන සංශෝධනය කරන ලදි. 2010 මාර්ග දිග කි.මී. 50 ක් පමණි.

## 6.9 මාර්ග ජාල වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

මාර්ග ජාල වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (RNIP) 2011 වර්ෂය තුළ පහත දැක්වෙන විදේශාධාර ව්‍යාපෘති දෙක ක්‍රියාත්මක කිරීමේ නිරතව සිටියි. ඊට අමතරව මෙම ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විින අරමුදල් යෙදූ ප්‍රමුඛ මාර්ග ව්‍යාපෘති හා උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘති මූල්‍ය කළමනාකරණය පිළිබඳව වගකියනු ලබයි.

1) සුනාමි හානි ප්‍රදේශ පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රංශ සංවර්ධන ආයතනය අරමුදල් යෙදූ ත්‍රිකුණාමල ඒකාබද්ධ යටිතල ව්‍යුහ ව්‍යාපෘතිය (ත්‍රි.ඒ.ය.ව්‍යු.)

   මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රංශ සංවර්ධන ආයතනය විසින් අරමුදල් සපයනු ලබයි. මෙම ව්‍යාපෘතිය බහුවිධ අංශ සංවර්ධන කටයුතුවලින් සමන්විතය. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ප්‍රතිනිර්මාණ හා ප්‍රතිසංවර්ධනය සඳහා පුළුල් සහායක් දෙනු ලබයි.

   ත්‍රි.ඒ.ය.ව්‍යාපෘතිය 2006 දි ආරම්භ වු අතර නිමවීමට ආසන්නව පවති. 2011 දි ප්‍රධාන පාලම් පහක් මහජනයා සඳහා විවෘත කරන ලදි.

   - ප්‍රදානකරු - ප්‍රංශ සංවර්ධන ආයතනය
   - ණය පහසුකම් ප්‍රමාණය - යුරෝ මිලියන 53.26
   - ශ්‍රී ලං ආ දායකත්වය - යුරෝ මිලියන 18

**ඉදිකිරීම් කටයුතුවල ඡායාරූප**



රාල්කුලි පාලම – 2011 ඔක්. 19



ගංගෙයි පාලම – 2011 ඔක්. 29



කායන්කර්ණි පාලම



වෙරුගල් පාලම



උප්පාරු පාලම



A15 මාර්ගයේ අලිඹලුව හංදිය

## වගු අංක 64: සු.හා.ප්‍ර.පු.ව්‍යාපෘතිය - සු.හා.ප්‍ර.න.ව්‍යාපෘති සාරාංශය

| මාර්ගයේ නම | දිග කි.මී. | තා.දි.පි. | ආරම්භක දිනය | නිමකිරීමට අපේක්ෂිත දිනය | 2010 දක්වා ප්‍රගතිය (%) | 2010 දක්වා වියදම (රු:මි:) | 2011 අවසානයේ ප්‍රගතිය (%) | 2011 අවසානයේ වියදම (රු:මි:) | කටයුතුවල ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|---|
| මඩකලපුම-ත්‍රිකුණාමල මාර්ගයේ (A015) තිරිකොණ්ඩියාමඩු සිට ත්‍රිකුණාමලය දක්වා | 99 | | | | | | | | ඩබ්එස්ට් පළමු ස්ථරය කි.මී. 35.80 ක් නිමකෙරිණි. ඩබ්එස්ට් දෙවන ස්ථරය කි.මී. 38.00 ක් නිමකෙරිණි. |
| AA015 මාර්ගයේ කායන්කර්නි, වෙරුගල්, රාල්කුලි, ගංගෙයි හා උප්පාරු යන පාරු ස්ථානවල පාලම් පහක් ඉදිකිරීම | | 11, 217.00 | 2008.08.08 | 2011.09.23 | 67.3 | 7, 375.40 | 96.5 | 1, 886.80 | නිමකෙරිණි. |
| අල්ල-කන්තලේ මාර්ගය (B010) | 42 | | | | | | | | ඩබ්එස්ට් පළමු ස්ථරය කි.මී. 28.52 ක් නිමකෙරිණි. ඩබ්එස්ට් පළමු ස්ථරය කි.මී. 27.00 ක් නිමකෙරිණි. |
| මාවච්චේනයි සිට කඩ්ඩපරිච්චාන් දක්වා වෙරළබඩ මාර්ගය | 12 | | | | | | | | ඩබ්එස්ට් පළමු ස්ථරය කි.මී. 1.30 ක් නිමකෙරිණි. . |
| *එකතුව* | *153* | *11, 217.00* | | | | *7, 375.40* | | *1, 886.80* | |
| උපදේශක සේවා | | 548.72 | | | | 379.00 | | 135.00 | |
| වැඩවීම් පිරිවැය | | | | | | 30.20 | | 55.20 | |
| **සම්පූර්ණ එකතුව** | | **11, 765.72** | | | | **7, 784.60** | | **2, 077.00** | |

2- සුනාමි හානි ප්‍රදේශ නැවත ගොඩ නැංවීමේ ස්පාඤ්ඤ ව්‍යාපෘතිය යටතේ ස්පාඤ්ඤ පාලම් ව්‍යාපෘතිය.

සුනාමි හානි ප්‍රදේශ නැවත ගොඩ නැංවීමේ ව්‍යාපෘතිය යටතේ ත්‍රිකුණාමල හා මඩකලපු දිස්ත්‍රික්කයේ පහත සඳහන් පාලම් හතර ඉදිකිරීම සඳහා ස්පාඤ්ඤ ආධාර සපයන ලදි. මෙම පාලම් 2010 දි නිමකෙරිණි. ව්‍යාපෘති ණය මුදලේ ඉතිරි කිරීම් මගින්, අතිරේක පාලම් 4 ක් ව්‍යාපෘතියට එකතු කරනු ලැබීය.

පාලම් හතරෙන් තෝපුර් හා තම්බලාගාමම් පාලම් නිමකර 2010 දි මහජනයා සඳහා විවෘත කරන ලද අතර, තොණ්ඩමනාරු හා සලපයාරු පාලම් පිළවෙලින් 2012 හා 2013 දි නිමකිරීමට අපේක්ෂිතය.

- ප්‍රදානකරු - ස්පාඤ්ඤ රජය
- ණය පහසුකම් මුදල - යුරෝ මිලියන 21.627

**වගු අංක 65: ස්පාඤ්ඤ -සුනාමි හානි ප්‍රදේශ නැවත ගොඩනැංවීමේ ව්‍යාපෘති සාරාංශය**

| මාර්ගයේ නම | දිග .ම. | කා.දි.පි. | ආරම්භක දිනය | නිමකිරීමට අපේක්ෂිත දිනය | 2010 දක්වා ප්‍රගතිය (%) | 2010 දක්වා වියදම (රු:මි:) | 2011 අවසානයේ ප්‍රගතිය (%) | 2011 වර්ෂය තුල වියදම (රු:මි:) |
|---|---|---|---|---|---|---|---|---|
| ත්‍රිකුණාමලය-මඩකලපු මාර්ගයේ ඔඩ්ඩමාවඩි පාලම යළි ඉදිකිරීම | මී. 250 | 3, 660 | 2007 ජූලි | 2010.03.31 | 100 | 3, 567.80 | 100 | 40.60 |
| ඉරක්කණ්ඩි පාලම යළි ඉදිකිරීම | මී. 300 | | | | | | | |
| පුදුවයික්කට්ටු පාලම යළි ඉදිකිරීම | මී. 300 | | | | | | | |
| ත්‍රිකුණාමලය-පුල්මුඩේ මාර්ගයේ යාන්ඔය පාලම යළි ඉදිකිරීම | මී. 150 | | | | | | | |
| තෝපූර් පාලම | මී. 22.5 | | | 2012 අගෝස්තු | | | | |
| තොණ්ඩමනාරු පාලම | මී. 129 | | | | | | | |
| තම්බලාගාමම් පාලම | මී. 23.5 | | | 2013 ජනවාරි | | | | |
| සලපියාරු පාලම | මී. 95 | | | | | | | |

## 6.10 උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය

උතුරු පළාත් නිදහස් කරගත් වහාම ශ්‍රී ලංකා රජය විසින්, පළාතේ වේගවත් සංවර්ධනයක් ඇති කිරීම සඳහා පුළුල් වැඩ සටහන් දියත් කරන ලදි. මෙම වැඩ සටහනේ වැදගත් ආංශික කොටසක් වූයේ ආර්ථික සංවර්ධනය හා සමාජ සංවර්ධනයට හැකිවන වාතාවරණයක් සැපයීම සඳහා ප්‍රදේශය පුරා උපායාත්මක මාර්ග සම්බන්ධතා පුනරුථාපනය කිරීමේ මෙම වැඩ සටහනය.

මෙම ආරම්භකත්වයට සහාය පිණිස උතුරු මාර්ග පුනරුථාපනය ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් මාර්ග වැඩි දියුණු කිරීම හා පුනරුත්ථාපනය සඳහා චීන එක්සිම් බැංකුව විසින් එ.ජා.ඩොලර් මිලියන 423.88 ක් සපයන ලදි. මෙම ව්‍යාපෘතිය යටතේ සිවිල් වැඩ කොන්ත්‍රාත් හයක් ප්‍රදානය කරන ලද අතර, මෙම කොන්ත්‍රාත් 2011 දී ආරම්භ කර, දැනට ක්‍රියාත්මක මෙයින් පවතී. මෙම ව්‍යාපෘතියේ වැඩ වලට උතුරු පළාතේ, මාර්ග කි.මී. 512 ක් පුනරුථාපනය හා වැඩි දියුණු කිරීම අඩංගු වේ.

- ප්‍රදානකරු - චීන එක්සිම් බැංකුව
- ණය පහසුකම් මුදල - එ.ජ. ඩොලර් මිලියන 423.9
- ශ්‍රී ලංකා ආණ්ඩුවේ දායකත්වය - රු: මි: .6, 730.01

**ඉදිකිරීම් කටයුතු පිළිබඳ ඡායාරූප**




මහනුවර-යාපනය මාර්ගය කි.මී. 263 + 600 ද.



මහනුවර-යාපනය මාර්ගය කි.මී.209 + 700 ද.



මහනුවර-යාපනය මාර්ගය කි.මී. 279 + ද 400



යාපනය-පේදුරුතුඩුව මාර්ගය AB02 කි.මී. 23+ ද 750




මුලතිවු-පුල්මුඩේ-කෝකිලායි මාර්ගය කි.මී. 2+ ද 740 කි.මී. 3+ ද 040




ඇස්පල්ට් යන්ත්‍රාගාරය– A9 (කැටික් ඉංජිනියරින්)



ඇස්පල්ට් යන්ත්‍රාගාරය-මාගා ඉංජිනියරින්



ඇස්පල්ට් යන්ත්‍රාගාරය අයි.සී.සී.සමාගම



නාවක්කුලි-කාරතිවු-මන්නාරම මාර්ගය

කි.මී. 70 + ද 645



මහනුවර-යාපනය මාර්ගය

(ගල්කුලම සිට 230 කි.මී. කණුව)

කි.මී. 122 + ද 800

## *වගු අංක 66: උ.මා.පු. ව්‍යාපෘතියේ සාරාංශය*

<table>
<tr><th>ව්‍යාපෘතිය අංකය</th><th>මාර්ගයේ නම</th><th>දිග (කි.මී)</th><th>තා.දි.පි. (රු:මි:)</th><th>ආරම්භක දිනය</th><th>නිමකිරීමට අපේක්ෂිත දිනය</th><th>2010 දක්වා වියදම (රු:මි)</th><th>2011 අවසානයේ ප්‍රගතිය (%)</th><th>2011 තුළ වියදම (රු:මි)</th><th>කටයුතුවල ප්‍රගතිය</th></tr>
<tr><td>1</td><td>මහනුවර-යාපනය මාර්ගයේ (ගල්කුලම කි:මී: 230)</td><td>63.0</td><td>9, 592.08</td><td>2011.02.07</td><td>2013.08.06</td><td>1, 014.67</td><td>22.53</td><td>3, 870.34</td><td>ඉවුරු ඉදිකිරීම කි:මී:18.40 , ගල්කුඩු මිශ්‍රණය- 12.80, බෝක්කු – 61 , ඇස්පල්ට් මිශ්‍රණය ඇතිරීම කි:මී: 11.35</td></tr>
<tr><td>2</td><td>මහනුවර-යාපනය මාර්ගයේ ( පානය කි:මී: 230 සිට)</td><td>90.0</td><td>9, 532.92</td><td>2011.02.22</td><td>2013.08.21</td><td>350.00</td><td>24.78</td><td>3, 563.33</td><td>ඉවුරු ඉදිකිරීම කි:මී: 38.10 , උප පාදකය කි:මී: 37.60 , ඇස්පල්ට් මිශ්‍රණය ඇතිරීම කි:මී 13.70 , ගල්කුඩු මිශ්‍රණය කි:මී: 17.40 , බෝක්කු – 60 .</td></tr>
<tr><td>3</td><td>නාවක්කුලි-කාරතිවු-මන්නාරම මාර්ගය</td><td>67.0</td><td>6, 532.50</td><td>2011.11.10</td><td>2014.05.09</td><td>-</td><td>-</td><td>979.87</td><td>කොන්ත්‍රාත්කරු සම්පත් මෙහෙයවන ලදි. වැඩ සිදුකෙරෙමින් පවතී. බෝක්කු 2 යි.</td></tr>
<tr><td rowspan="4">4</td><td>යාපනය-පේදුරුතුඩුව</td><td rowspan="4">84.0</td><td rowspan="4">10, 185.00</td><td rowspan="4">2011.06.09</td><td rowspan="4">2013.12.08</td><td rowspan="4">722.86</td><td rowspan="4">12.42</td><td rowspan="4">2, 875.69</td><td>මාර්ග පථය කැනීම කි:මී:11.00 , බෝක්කු – 09, ඇස්පල්ට් මිශ්‍රණය ඇතිරීම කි:මී: 5.70</td></tr>
<tr><td>පුත්තූර්-මීසාලේ</td><td>මාර්ග පථය කැනීම කි:මී:4.10 බෝක්කු – 15 , උප පාදක කි:මී: 1.50</td></tr>
<tr><td>යාපනය-කන්කසන්තුරය</td><td>මාර්ගය පුළුල් කිරීම කි:මී: 6.3 , උප පාදක කි:මී: 4.6 , ගල්කුඩු මිශ්‍රණය කි:මී: – 2.5, බෝක්කු – 9 , පාදම් කිරීම 0.5</td></tr>
<tr><td>යාපනය-පලෙයි</td><td>මාර්ගය පුළුල් කිරීම කි:මී: – 9.50 , උප පාදක කි:මී: 5.25, ගල්කුඩු මිශ්‍රණය කි:මී: 2.30, බෝක්කු – 1 .</td></tr>
<tr><td>5</td><td>මුලතිවු-කෝකිලායි-පුල්මුඩේ</td><td>42.4</td><td>5, 777.45</td><td>2011.02.14</td><td>2013.08.13</td><td>519.97</td><td>20.25</td><td>1, 778.37</td><td>මාර්ග පථය කැනීම කි:මී:– 15.90, ගල්කුඩු මිශ්‍රණය කි:මී: – 3.4 , ඉවුරු ඉදිකිරීම කි:මී: 15, ඇස්පල්ට් මිශ්‍රණය ඇතිරීම කි:මී: 1.4, බෝක්කු – 30 .</td></tr>
<tr><td rowspan="2">6</td><td>ඔඩ්ඩුසුඩාන්-නැදුන්කර්නි</td><td rowspan="2">52.6</td><td rowspan="2">5, 741.30</td><td rowspan="2">2011.08.15</td><td rowspan="2">2014.02.14</td><td rowspan="2">150.00</td><td rowspan="2">18.67</td><td rowspan="2">1, 497.55</td><td>මාර්ග පථය තැනීම කි:මී:– 7.5 , ගල්කුඩු මිශ්‍රණය කි:මී: 2.2 , ඉවුරු ඉදිකිරීම කි:මී: – 6.2 ,</td></tr>
<tr><td>මුලතිවු-පුලියන්කුලම</td><td>මාර්ග පථය තැනීම කි:මී:– 9.3 , ගල්කුඩු මිශ්‍රණය කි:මී: – 1.75 , බෝක්කු – 46 , ඉවුරු ඉදිකිරීම කි:මී: 8.9 ,</td></tr>
<tr><td>7</td><td>පුත්තලම-මරිච්චිකඩේ-මන්නාරම</td><td>113.0</td><td>9, 887.50</td><td>-</td><td>-</td><td>-</td><td>-</td><td>-</td><td>ආරම්භකර නොමැත.</td></tr>
<tr><td></td><td>එකතුව</td><td>512.0</td><td>57, 248.75</td><td></td><td></td><td>2, 757.50</td><td></td><td>14, 565.15</td><td></td></tr>
<tr><td></td><td>උපදේශකත්වය</td><td></td><td></td><td></td><td></td><td>25.00</td><td></td><td>454.62</td><td></td></tr>
<tr><td></td><td>වැඩිවූ පිරිවැය</td><td></td><td></td><td></td><td></td><td>1.80</td><td></td><td>33.79</td><td></td></tr>
<tr><td></td><td>මුළු එකතුව</td><td></td><td>57, 248.75</td><td></td><td></td><td>2, 784.30</td><td></td><td>15, 053.56</td><td></td></tr>
</table>

## 6.11 ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය

### 6.11.1 ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය I වැනි අදියර

සීමාසහිත චීන සංවර්ධන බැංකු සමාගම විසින් 2010 වර්ෂයේදී ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය යටතේ පාලම් වැඩි දියුණු කිරීම හා පුනරුත්ථාපනය සඳහා හඳුනාගන්නා ලද මාර්ග වෙනුවෙන් එ.ජ. ඩොලර් මිලියන 152.8 ක් සපයන ලදි. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, ඌව, නැගෙනහිර, සබරගමුව, බස්නාහිර, දකුණ හා උතුරු පළාත්වල මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ප්‍රමුඛතා පදනම මත හඳුනාගන්නා ලද මාර්ග කි:මී: 179 ක තත්ත්වය වැඩි දියුණු කිරීමයි. මෙහි සිවිල් වැඩ කොන්ත්‍රාත් හයක් යටතේ ඉටුකරනු ලබන අතර දැනට ඒවයේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

- ප්‍රදානකරු - චීන සංවර්ධන බැංකුව
- ණය පහසුකම් මුදල - එ.ජ.ඩොලර් මිලියන 152.8
- ශ්‍රීලංකා ආණ්ඩුවේ දායකත්වය - එ.ජ.ඩොලර් මිලියන 17.0

**ඉදිකිරීම් කටයුතු පිළිබඳ ඡායාරූප**



බෙලිඅත්ත-තංගල්ල මාර්ගය
කි:මී:. 2+150 – 2+ ද 400



බෙලිඅත්ත-තංගල්ල මාර්ගය
කි:මී:. 5+520 – 5+ ද 580

## සිරිබෝපුර මංසන්දියේ ගුවන් පාලම ඉදිකිරීම












පැලවත්ත-කංකොටියාවත්ත-තිනියාවල-

මොරවක මාර්ගය කි:මි: 1+ ද 130



පැලවත්ත-කංකොටියාවත්ත-

තිනියාවල-– මොරවක මාර්ගය කි:මි: 2+ ද 500



මහනුවර-මහියංගනය-පදියතලාව මාර්ගය

කි:මි: 74+000 – 74+ ද 500




තිරිවානාකැටිය-අගලවත්ත මාර්ගය

කි:මි: 2+ ද 100

## වගු අංක 67: ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - අදියර 1

| විෂයාංකය | මාර්ගයේ නම | දිග (කි:මී:) | කා.දි.පි. (රු:මි:) | ආරම්භක දිනය | නිමකිරීමට අපේක්ෂිත දිනය | 2011 අවසානයේ ප්‍රගතිය (%) | 2011 තුළ වියදම (රු:මි:) | කටයුතුවල ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | බෙලිඅත්ත-තංගල්ල මාර්ගය | 7.47 | 1, 350 | 2011.07.01 | 2012.12.31 | 35.00 | 585.78 | ඉවුරු ඉදිකිරීම කි:මී: 17.50 , ගල්කුඩු මිශ්‍රණය කි:මී: 8.00 , ඇස්පොල්ට් ඇතිරීම කි:මී: 8.00 |
| | කිරිඉබ්බන්ආර-උඩමාදුර මාර්ගයේ බෝපැලේ හංදිය | 8.50 | | | | 28.00 | | |
| | සිරිබෝපුර හංදියේ ගුවන් පාලම ඉදිකිරීම | | 2, 675 | 2011.07.01 | 2012.06.30 | 18.00 | 1, 055.87 | ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතී |
| 2 | පැලවත්ත-කංකොටියාවත්ත-තිනියාවල-–මොරවක මාර්ගය | 47.00 | 3, 900 | 2011.07.01 | 2013.06.30 | 15.00 | 1, 430.49 | ඉවුරු ඉදිකිරීම කි:මී: 8.00 , ගල්කුඩු මිශ්‍රණය කි:මී: 0.60 km |
| 3 | තිරුවානාකැටිය-අගලවත්ත මාර්ගය | 33.45 | 2, 800 | 2011.07.01 | 2014.06.30 | 17.00 | 973.69 | ඉවුරු ඉදිකිරීම කි:මී: 3.00 , ගල්කුඩු මිශ්‍රණය කි:මී: 1.10 km |
| 4 | මහනුවර-මහියංගනය-පදියතලාව මාර්ගය | 20.50 | 1, 550 | 2011.07.01 | 2012.12.31 | 9.00 | 535.42 | ඉවුරු පුළුල් කිරීම කි:මී: – 4.00 , ගල්කුඩු මිශ්‍රණය කි:මී: 2.50 , ඇස්පොල්ට් ඇතිරීම කි:මී: 1.60 |
| 5 | කල්කුඩා මාර්ගය | 5.63 | 700 | 2011.07.01 | 2012.06.30 | 27.00 | 306.89 | ඉවුරු පුළුල් කිරීම කි:මී: – 6.00, ගල්කුඩු මිශ්‍රණය කි:මී: 4.00 |
| | කල්කුඩා-වාලච්චේන මාර්ගය | 4.42 | | | | | | |
| 6 | පරන්තන්-මුලතිවු මාර්ගය | 52.00 | 5, 700 | 2011.06.22 | 2013.12.21 | 9.64 | 2, 070.46 | මාර්ග පථය කැනීම කි:මී: – 15.00, ගල්කුඩු මිශ්‍රණය කි:මී: 0.50 , ඉවුරු ඉදිකිරීම කි:මී: – 15.00 , උප පාදම කි:මී:6.40 , බෝක්කු – 39 |
| | එකතුව | 178.97 | 18, 675 | | | | 6, 958.60 | |
| | වැඩිවූ පිරිවැය | | | | | | 124.74 | |
| | **මුළු එකතුව** | | **18, 675** | | | | **7, 083.34** | |

## 6.11.2 ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 2 වැනි අදියර

සිමා සහිත චීන සංවර්ධන බැංකු සමාගම ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - අදියර 2 යටතේ හඳුනාගන්නා ලද අතිරේක මාර්ග වැඩි දියුණු කිරීම හා පුනරුත්ථාපනය සඳහා 2011 දී එ.ජ. ඩොලර් මිලියන 500 ක අතිරේක ණය මුදලක්ද ප්‍රදානය කරන ලදි. මෙම ව්‍යාපෘතිය යටතේ දකුණ, බස්නාහිර, සබරගමුව, ඌව, උතුරුමැද හා මධ්‍යම පළාත්වල කි:මි: 589.91 ක්ද පුනරුත්ථාපනයටද හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගුවන් පාලම් දෙකක් ඉදිකිරීමද සිදුකරනු ලැබේ.

| පාපැදි | 215,120.00 | (14,235.00) | 59,350.00 | 260,235.00 | 177,396.92 | (14,231.00) | 21,571.91 | | 184,737.83 | 75,497.17 | 37,723 |
| යතුරුපැදි | 22,755,724.28 | - | - | 22,755,724.28 | 16,243,905.58 | - | 3,255,874.86 | | 19,499,780.44 | 3,255,943.84 | 6,511,819 |
| පර්යේෂණ හා සංවර්ධන උපකරණ | 92,678,459.06 | - | 546,800.00 | 93,225,259.06 | 89,293,369.81 | - | 3,420,448.58 | | 92,713,818.39 | 511,440.67 | 3,385,089 |
| පාරු බෝට්ටු | 19,188,000.00 | - | - | 19,188,000.00 | 19,187,996.00 | - | - | | 19,187,996.00 | 4.00 | 4 |
| පුහුණු උපකරණ | 6,676,479.12 | - | - | 6,676,479.12 | 6,676,455.11 | - | - | | 6,676,455.11 | 24.01 | 24 |
| රසායනාගාර උපකරණ | 9,510,140.78 | - | - | 9,510,140.78 | 9,510,140.78 | - | - | | 9,510,140.78 | - | - |
| ඉදිකිරීම් උපකරණ | 64,236,000.00 | - | - | 64,236,000.00 | 64,236,000.00 | - | - | | 64,236,000.00 | - | - |
| වෛද්‍ය උපකරණ | - | - | 1,469,100.00 | 1,469,100.00 | | - | - | | | 1,469,100.00 | - |
| මෝටර් ලොන්ච් යාත්‍රාව | - | - | 95,242,616.51 | 95,242,616.51 | | - | - | | | 95,242,616.51 | - |
| එකතුව | 6,380,523,421.00 | (8,518,688.43) | 263,522,233.28 | 6,635,526,965.85 | 4,481,738,264.83 | (8,463,095.32) | 609,811,228.72 | - | 5,083,086,398.22 | 1,552,440,567.63 | 1,898,785,156 |

මාර්ග සංවර්ධන අධිකාරිය
2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයට සටහන්

| | | 2011 (රු:) | 2010 (රු:) |
|---|---|---|---|
| **සටහන 02 ස්කන්ධ ආයෝජන (පිරිවැය අනුව)** | | | |
| 12001 | මා.නි.සහ සං.සමාගමේ ආයෝජන (සටහන් 2.1) | - | 72,158,715 |
| 12002 | නි.සං.මූල්‍ය සංස්ථාව | 200,000.00 | 200,000 |
| 12003 | මගනැගුම දියතාර නිෂ්පාදන සමාගම | 1,000,000.00 | 1,000,000 |
| 12005 | මගනැගුම උපදේශක හා ව්‍යාපෘති කළමනාකරණ සේවා (පුද්) සමාගම | 1,000,000.00 | 1,000,000 |
| | | 2,200,000.00 | 74,358,715 |

| | | 2011 (රු:) | 2010 (රු:) |
|---|---|---|---|
| **සටහන 02.1 මාර්ග නිර්මාණ සහ සංවර්ධන (පුද්) සමාගමේ ආයෝජන** | | | |
| 12001 | ආයෝජන ගෙන ආ ප්‍රමාණය | - | 83,466,708 |
| අඩුකලා | | | |
| 22430 | අවසන් ව්‍යාප්තිය සඳහා විය හැකි පාඩුව සඳහා ප්‍රතිපාදන | - | 11,307,993 |
| | | - | 72,158,715 |

| | | 2011 (රු:) | 2010 (රු:) |
|---|---|---|---|
| **සටහන 03 2011 දෙසැම්බර් 31 දිනට තොග** | | | |
| 13100 | වත්කම් තොග | 270,992.69 | 104,599 |
| 13101 | ඔර්සිවජ් අමතර කොටස් පාලන ගිණුම | 32,248,398.53 | 32,679,742 |
| 1310116 | වෙනත් | 37,344,668.12 | 41,310,055 |
| 1310117 | සෘජු ද්‍රව්‍ය | 245,995,246.49 | 222,448,940 |
| 13101181 | ග්‍රාමීය පාලම් ඉදිකිරීම් ද්‍රව්‍ය | 4,948,642.79 | 4,457,869 |
| 131012/A | ලිපිද්‍රව්‍ය | 15,223,778.68 | 13,969,662 |
| 131013/A/B | භාණ්ඩ ලේඛන තොග | 237,410.54 | 83,415 |
| 131014 | තිස් ද්‍රව්‍ය | 5,663,085.94 | 7,347,282 |
| 131015 | අමතර කොටස් | 6,007,465.57 | 9,338,936 |
| 13101601 | නිල ඇඳුම් තොග | 1,058,567.84 | 1,807,007 |
| 13101602 | සපත්තු හා සෙරෙප්පු තොග | 1,340,249.00 | 101,400 |
| 131017 | ටයර් | 5,980,267.08 | 1,792,261 |
| 131018 | මා.නි.සහ සං.සමාගමෙන් අත්කර ගත් තොග | 146,263.00 | 146,263 |
| 131019 | ද්‍රව්‍ය තොග - වාත්තු අංගනය | 2,360,539.70 | 3,171,251 |
| 131020 | ලිහිසි තෙල් තොග | 2,158,148.98 | 860,236 |
| 131021 | ද්‍රව්‍ය තොග - ඇස්පල්ට් යන්ත්‍රාගාරය | 55,327,515.01 | 12,370,440 |
| 131021D | ද්‍රව්‍ය තොග - අන්තර් බැඳි කොන්ක්‍රීට් | 9,350,799.66 | 11,826,832 |
| 131201 | නිමි භාණ්ඩ - වාත්තු අංගනය | 4,805,591.29 | 5,904,775 |
| 131201D | නිමි නිෂ්පාදන - අන්තර් බැඳි ඝනක | 21,847,785.68 | 9,474,345 |
| | | 452,315,416.59 | 379,195,309 |

| | | 2011 | 2010 |
|---|---|---|---|
| **සටහන් 04** | **ණයගැතියෝ** | | |
| 133031 | කුලි ගාස්තු සඳහා ණයගැතියෝ | - | 516,499 |
| 133032 | කුලි ගාස්තු හා වෙනත් ණයගැතියෝ | - | 6,915,634 |
| 13304101 | වෙනත් ලැබීම් | 11,937,464.57 | 34,288,200 |
| 13304201 | භාණ්ඩාගාර බිල්පත් පොලි ලැබීම් | 1,625,947.80 | 1,305,243 |
| 133043 | ලැබිය යුතු රක්ෂණ සංස්ථා හිමිකම් | - | 1,407,081 |
| 133044 | ලැබිය යුතු නිවාස කුලි | 3,759,519.65 | 1,961,811 |
| 13305 | මා.න.කො. තොග සඳහා ණයගැතියෝ | 168,830.54 | 3,987,209 |
| 13306101 | යටිතල ව්‍යුහ සංවර්ධන අමාත්‍යාංශය (ප්‍රතිපූර්ණ වැටුප්) | - | 134,518 |
| 13306103 | මුදල් අමාත්‍යාංශය | 115,015.71 | 52,177 |
| 13306104 | ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශය | 70,480.72 | 217,406 |
| 13306107 | ප්‍රතිපත්ති සැලසුම් අමාත්‍යාංශය | 69,316.66 | - |
| 13306108 | ඉහල කොත්මලේ ජලවිදුලි ව්‍යාපෘතිය | 101,785.27 | 348,115 |
| 13306109 | අපනයන සංවර්ධන අමාත්‍යාංශය | - | 447,596 |
| 13306110 | නාගරික සංවර්ධන අමාත්‍යාංශය | - | 1,007,500 |
| 13306111 | ජල සම්පත් මණ්ඩලය | 323,029.53 | 829,914 |
| 13306112 | ප්‍රතිස්ථාපන හා ආපදා සහන සේවා | 80,131.10 | 103,599 |
| 13306113 | ප්‍රවාහන හා සමුපකාර අමාත්‍යාංශය | 177,382.95 | 52,073 |
| 13306114 | අධ්‍යාපන අමාත්‍යාංශය | - | 47,886 |
| 13306115 | පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | 202,053.82 | 49,269 |
| 13306116 | පළාත්පාලන හා පළාත්සභා අමාත්‍යාංශය | 378,896.22 | - |
| 13306117 | වාරිමාර්ග හා ජල සම්පත් අමාත්‍යාංශය | 136,733.43 | 18,919 |
| 13306118 | සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය | 49,000.32 | 8,706 |
| 13306119 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 1,998.00 | - |
| 133071/72 | පොදු කාර්ය පිරිවැය පාලන ගිණුම - ආසියානු සංවර්ධන බැංකුව | 15,826,703.33 | 7,586,630 |
| 133071/72 | පොදු කාර්ය පිරිවැය පාලන ගිණුම - විවිධ විදේශාධාර ව්‍යාපෘතිය | 3,706,563.22 | 2,306,951 |
| 133071/72 | පොදු කාර්ය පිරිවැය පාලන ගිණුම - ජපන් ආධාර ව්‍යාපෘතිය | 2,098,229.21 | 1,193,902 |
| 133071/72 | පොදු කාර්ය පිරිවැය පාලන ගිණුම - දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය | 7,456,046.43 | 5,292,488 |
| 133071/72 | පොදු කාර්ය පිරිවැය පාලන ගිණුම - මාර්ග ආංශික සහායක ව්‍යාපෘතිය | - | 49,392 |
| 133071/72 | පොදු කාර්ය පිරිවැය පාලන ගිණුව - පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතිය | 10,971,399.03 | 8,268,213 |
| 133071/72 | පොදු කාර්ය පිරිවැය පාලන ගිණුම - කොළඹ-මහනුවර විකල්ප මාර්ගය | 983,682.27 | 1,408,119 |
| 133071/72 | පොදු කාර්ය පිරිවැය පාලන ගිණුම - ලෝක බැංකු ව්‍යාපෘතිය | 4,702,192.35 | 3,695,561 |
| 133071/72 | පොදු කාර්ය පිරිවැය පාලන ගිණුම - කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය | 2,747,264.03 | 3,732,287 |
| 133071/72 | පොදු කාර්ය පිරිවැය පාලන ගිණුම - මාර්ග ව්‍යාපෘති සැකසුම් පහසුව | 2,225,617.46 | 2,200,423 |
| 133071/72 | පොදු කාර්ය පිරිවැය පාලන ගිණුම - ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය | 2,639,899.92 | 22,318 |
| 133071/72 | පොදු කාර්ය පිරිවැය පාලන ගිණුම - වානේ පාලම් ව්‍යාපෘතිය | 1,169,811.83 | 1,159,078 |
| 133071/72 | පොදු කාර්ය පිරිවැය පාලන ගිණුම - උතුරු මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 1,243,452.02 | 306,080 |
| 133071/72 | පොදු කාර්ය පිරිවැය පාලන ගිණුම - චීන සංවර්ධන බැංකුව | 224,055.30 | - |
| 133071/72 | පොදු කාර්ය පිරිවැය පාලන ගිණුම - ගැටුම් හානි ප්‍රදේශවල හදිසි ව්‍යාපෘතිය | 222,051.46 | |
| 133071/72 | පොදු කාර්ය පිරිවැය පාලන ගිණුම - පිටත වටරවුම් මාර්ගය II | 301,104.91 | |
| 133082 | පළාත්භාර අධ්‍යක්ෂගෙන් ලැබිය යුතු මුදල | 4,047,783.45 | - |
| 133091 | වෙනත් ණයගැතියෝ - ලං.බ.සං. | 127,976.79 | 5,568,207 |
| 133091A | වෙනත් ණයගැතියෝ - ලං.බ.සං-ප.මා.සං.අ. | 2,175,404.00 | - |
| 133093 | ඉඩම් ප්‍රතිස්ථාපනය සඳහා ණයගැතියෝ | 8,033,985.40 | 8,577,857 |
| 133094 | තාර සඳහා අත්තිකාරම් | 61,768,916.46 | 132,707,017 |
| 133121 | දේශිය ආදායම් කොමසාරිස් - ර.බ.පොලිය | 547,848.90 | 466,675 |
| 133122 | දේශිය ආදායම් කොමසාරිස් - ර.බ.ආදායම | 1,928,672.46 | 1,928,672 |
| 133124 | දේශිය ආදායම් කොමසාරිස් - ජාතික අයබදු ණය | 28,304,908.62 | 18,714,986 |
| 133127 | දේශිය ආදායම් කොමසාරිස් - ආ.සේ.බද්ද | 354,635,097.00 | 291,165,478 |
| 13313 | මැතිවරණ කොමසාරිස් | 70,400.35 | - |
| 13314 | ලංකා බැංකුවෙන් ලැබිය යුතු ණය බද්ද | - | 2,120,135 |
| 133151 | වාත්තු අංගනයේ ණයගැතියෝ (සටහන්- 04.1) | 424,735.99 | - |
| 13316 | නොගෙවන ලද අ.එ. බද්ද | 420,327,873.02 | 298,821,474 |
| 13317 | ඇස්පල්ට් යන්ත්‍රාගාර ණයගැතියෝ (සටහන්- 04.2) | 1,962,787.22 | - |
| 13319 | අන්තර් බැඳි කොන්ක්‍රීට් ඝනක ණයගැතියෝ | - | 1,681,491 |
| 221CD | සේවාදායක වැඩ - ණයගැතියෝ | 2,390,823.45 | - |
| 223302 | දේශිය ආදායම් කොමසාරිස් අ.එ.බ. | 83,715,040.95 | 104,156,565 |
| | | 1,046,177,913.12 | 956,829,353 |

| | | 2011 | 2010 |
|---|---|---|---|
| **සටහන 04.1** | **ණයගැතියෝ-වාත්තු අංගනය** | | |
| 133151/2 | ණයගැතියෝ - වාත්තු අංගනය | 424,735.99 | - |
| අඩුකලා | | | |
| 22419 | වාත්තු අංගනයේ ණයහිමියෝ පාලනය | - | - |
| | | 424,735.99 | - |
| **සටහන 04.2** | **ණයහිමියෝ - ඇස්පල්ට් යන්ත්‍රාගාරය** | | |
| 133171 | ණයගැතියෝ - ඇස්පල්ට් යන්ත්‍රාගාරය - බාහිර | 1,962,787.22 | |
| 133172 | ණයගැතියෝ - ඇස්පල්ට් යන්ත්‍රාගාරය - අභ්‍යන්තර | 1,003,464,836.95 | 711,843,994 |
| | | 1,005,427,624.17 | 711,843,994 |
| අඩුකලා | | | |
| 22420 | ණයහිමියෝ පාලනය - ඇස්පල්ට් යන්ත්‍රාගාරය | 1,003,464,836.95 | 711,843,994 |
| | | 1,962,787.22 | - |
| **සටහන් 05** | **වෙනත් ආයෝජන** | | |
| 1342 | භාණ්ඩාගාර බිල්පත් ප්‍රති මිලදී ගැණුම් ගිවිසුම | 1,148,500,000.00 | 814,000,000 |
| 1343 | භාණ්ඩාගාරයේ පාලන ණය ගිණුම | 14,167,985.06 | 14,167,985 |
| 1344 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 18,550,998.98 | 31,251,524 |
| | | 1,181,218,984.04 | 859,419,509 |
| **සටහන 06** | **තැන්පතු හා අත්තිකාරම්** | | |
| 1350111 | මිලදී ගැණුම් අත්තිකාරම් පොදු කාර්ය | 981,643.27 | 5,985,026 |
| 13501151 | මිලදී ගැණුම් හා වෙනත් අත්තිකාරම් - ග්‍රාමීය පාලම් අංශය | 262,710.90 | 660,370 |
| 1350116 | මිලදී ගැණුම් අත්තිකාරම් - ඇස්පල්ට් යන්ත්‍රාගාරය | 34,265,235.55 | 598,887 |
| 1350117 | මිලදී ගැණුම් අත්තිකාරම් - නඩත්තු | 10,165,947.93 | - |
| 135012 | මිලදී ගැණුම් අත්තිකාරම් - ප්‍රාදේශීය | 1,329,216.82 | 4,660,625 |
| 135012A | මිලදී ගැණුම් හා වෙනත් වෙනත් අත්තිකාරම් - ප්‍රධාන ඉංජිනේරු කාර්යාල ප්‍රදේශ | 585,766.03 | - |
| 135013 | මිලදී ගැණුම් අත්තිකාරම් - වාත්තු අංගනය | 1,700,943.76 | 257,664 |
| 13502112 | කොන්ත්‍රාත් අත්තිකාරම් ගෙවීම් ඒකකය - ප්‍රධාන කාර්යාලය | 346,058.11 | 6,825,426 |
| 13502114 | කොන්ත්‍රාත් අත්තිකාරම් - ග්‍රාමීය පාලම් | - | 344,395 |
| 13502115 | කොන්ත්‍රාත් අත්තිකාරම් - ව්‍යාපෘති ඒකකය - ප්‍රධාන කාර්යාලය | 5,825,000.00 | 4,780,000 |
| 1350212 | කොන්ත්‍රාත් අත්තිකාරම් - ව්‍යාපෘති | 18,391,000.00 | 43,991,020 |
| 135022 | කොන්ත්‍රාත් අත්තිකාරම් - ප්‍රාදේශීය | 68,244,503.35 | 110,517,924 |
| 135022A | කොන්ත්‍රාත් අත්තිකාරම් - ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය - ප්‍රාදේශීය | 276,682.20 | - |
| 135023 | කොන්ත්‍රාත් අත්තිකාරම් - සේවාදායක | 6,651,624.39 | 6,917,500 |
| 1350511 | මිණුම් අත්තිකාරම් | 3,458,502.72 | 3,570,637 |
| 13506012 | සම්පත් මෙහෙයවීම් අත්තිකාරම් - මාර්ග පුළුල් කිරීම් හා වැඩි දියුණු කිරීම් | 733,533,405.54 | 730,426,596 |
| 13506013 | සම්පත් මෙහෙයුම් අත්තිකාරම් - දේශීය බැංකු ණය යටතේ මාර්ග වැඩි දියුනු කටයුතු | 274,054,448.42 | - |
| 1350606 | සම්පත් මෙහෙයුම් අත්තිකාරම් - වරාය සංවර්ධනය | 580,048,315.36 | 861,387,529 |
| 1350607 | සම්පත් මෙහෙයුම් අත්තිකාරම් - දැයට කිරුළ | 1,004,983,835.84 | 812,430,139 |
| 1350608 | සම්පත් මෙහෙයුම් අත්තිකාරම් - ජ.ජාස.ආ. ව්‍යාපෘතිය | 14,383,825.30 | - |
| 13506A | සම්පත් මෙහෙයුම් අත්තිකාරම් - ප්‍රාදේශීය | 130,663,688.94 | 123,406,684 |
| 13506B | සම්පත් මෙහෙයුම් අත්තිකාරම් - සේවාදායක | - | 234,277 |
| 13506C | සම්පත් මෙහෙයුම් අත්තිකාරම් - සේවාදායක ප්‍රාදේශීය | 622,297,112.44 | 49,248,638 |
| 13506D | සම්පත් මෙහෙයුම් අත්තිකාරම් - ඇස්පල්ට් යන්ත්‍රාගාරය | 3,135,355.27 | 11,551,421 |
| 13506F | සම්පත් මෙහෙයුම් අත්තිකාරම් ඒකකය - ප්‍රධාන කාර්යාලය | 62,276,178.00 | - |
| 13507 | ණයවර ලිපි සීමාව සඳහා අත්තිකාරම් | 9,771,154.53 | - |
| 13509 | බැංකුවේ ආයෝජනය කර ඇති මාර්ග නඩත්තු කොන්ත්‍රාත් තැන්පතු | 730,000.00 | 695,000 |
| 1351011 | ඉන්ධන තැන්පතු ප්‍රධාන කාර්යාලය | 1,025,000.00 | 1,025,000 |
| 135102 | සේවා තැන්පතු | 1,050,430.00 | 737,930 |
| 135103 | නිවාස කුලී තැන්පතු | 10,550,500.00 | 7,114,000 |
| 135105 | වෙනත් ප්‍රාදේශීය තැන්පතු | 300,000.00 | 300,000 |
| 135106 | ඇස්පල්ට් යන්ත්‍රාගාර තැන්පතු | 404,000.00 | 504,000 |
| 135111 | පූර්ව ගෙවීම් | 2,382,156.08 | 1,550,163 |
| 13512 | වැඩ ආරම්භක ගෙවීම් - ව්‍යාපෘති | 273,997,755.73 | 65,369,444 |
| 13513 | ද්‍රව්‍ය අත්තිකාරම් - ව්‍යාපෘති | - | 4,504,464 |
| 13514 | වැඩ ආරම්භක ගෙවීම් - ජ.ජා.ස.ආ. | 14,636,949.36 | - |
| | | 3,892,708,945.84 | 2,859,594,759 |

| | | 2011 | 2010 |
|---|---|---|---|
| **සටහන් 07** | **වෙනත් ජංගම වත්කම්** | | |
| 1361 | කාර්ය මණ්ඩල ණය | 361,920,882.60 | 349,817,821 |
| 136201 | වැටුප් අත්තිකාරම් | 1,131,716.66 | 694,204 |
| 136204 | උත්සව අත්තිකාරම් | 11,307,718.60 | 8,666,652 |
| 136207 | පොත් අත්තිකාරම් | 1,603,547.11 | 706,918 |
| 136208 | වෙනත් අත්තිකාරම් | 69,000.00 | - |
| 136209 | ප්‍රාදේශීය කාර්ය මණ්ඩල අත්තිකාරම් | 7,969,307.00 | 1,437,006 |
| 136211 | මාස 03 ගංවතුර සහන අත්තිකාරම් | 7,604,026.21 | - |
| 1364 | කාර්ය මණ්ඩල ණයගැතියෝ | 1,774,484.39 | 2,128,376 |
| 1365 | පාරිභෝගික භාණ්ඩ තොග හිගය | 3,446,727.89 | 3,049,721 |
| 22371 | නොගෙවූ වැටුප් | 76,122.30 | 208,245 |
| 224012 | ප්‍රාදේශීය කාර්ය මණ්ඩලයෙන් වෙනත් විවිධ අඩුකිරීම් | 169,404.33 | - |
| | | 397,072,937.09 | 366,708,942 |

| | | 2011 | 2010 |
|---|---|---|---|
| **සටහන් 08** | **ජංගම ගිණුම - සී/ස.මගනැගුම ඉමල්ෂන් නිෂ්පාදන (පුද්) සමාගම** | | |
| 14106 | යන්ත්‍රාගාර හා යන්ත්‍ර කුලී | - | 14,841,105 |
| 14107 | වැඩ ආරම්භක ගෙවීම් | - | 53,518,293 |
| 141074 | වැඩ ආරම්භක ලංකා තෙල් සංස්ථා සැපයුම් | - | 68,151,307 |
| 14109 | සම්පත් මෙහෙයවීමේ අත්තිකාරම් | - | 1,700,000 |
| | | - | 138,210,705 |

| | | 2011 | 2010 |
|---|---|---|---|
| **සටහන 09** | **ජංගම ගිණුම - මගනැගුම මාර්ග ඉදිකිරීම් හා උපකරණ (පුද්) සමාගම** | | |
| 14204 | වත්කම් හා පාරිභෝගික මාරුකිරීම් - ණයකරුවෝ | 63,276,544.87 | 63,276,545 |
| 14206 | යන්ත්‍රාගාර හා යන්ත්‍ර කුලී | 655,037,481.59 | 647,022,429 |
| 142072 | වැඩ ආරම්භක ගෙවීම් | - | 180,281,634 |
| 142073 | වැඩ බිල්පත් | 68,285,103.68 | 42,703,520 |
| 142074 | වැඩ ආරම්භක ලංකා තෙල් සංස්ථා සැපයුම් | - | 78,290,914 |
| 14209 | සම්පත් මෙහෙයවීම් අත්තිකාරම් | 910,275,850.21 | 321,580,408 |
| | | 1,696,874,980.35 | 1,333,155,450 |

| | | 2011 | 2010 |
|---|---|---|---|
| **සටහන 10** | **ජංගම ගිණුම - මගනැගුම උපදේශක හා ව්‍යාපෘති කළමනාකරණ සේවා (පුද්) සමාගම** | | |
| 14301 | අත්තිකාරම් | - | 5,000,000 |
| 143022 | වැඩ ආරම්භක ගෙවීම් | - | 5,084,400 |
| 14306 | යන්ත්‍රාගාර හා යන්ත්‍ර කුලී | 76,101.82 | - |
| 14309 | සම්පත් මෙහෙයවීම් අත්තිකාරම් | 16,369,732.02 | 23,838,732 |
| | | 16,445,833.84 | 33,923,132 |

| | | 2011 | 2010 |
|---|---|---|---|
| **සටහන් 11** | **මුදල් හා බැංකු ශේෂය** | | |
| 139101 | ලංකා බැංකු ආයතන ශාඛාව - පොදු | 6,601,251.57 | 3,504,840 |
| 139102 | ලංකා බැංකු ආයතන ශාඛාව - සේවාදායක | 90,569,871.60 | 476,228 |
| 139103 | ලංකා බැංකු ආයතන ශාඛාව - අමාත්‍යාංශය | 7,547,820.77 | 1,590,685 |
| 139104 | ලංකා බැංකු ආයතන ශාඛාව - භාණ්ඩාගාරය | 1,964,028.55 | 10,402,387 |
| 139105 | ලංකා බැංකු ආයතන ශාඛාව - පුනරාවර්තන | 17,402,863.43 | 47,967,984 |
| 139106 | ලංකා බැංකු ආයතන ශාඛාව - මාර්ග වැඩි දියුණු කිරීම් හා පුළුල් කිරීම් | 325,541.36 | 604,238 |
| 139108 | ලංකා බැංකු ආයතන ශාඛාව - වෛද්‍ය රක්ෂණය | 139,357.93 | 7,265,809 |
| 139110 | ලංකා බැංකු ආයතන ශාඛාව - ප්‍රවාරණ පුවරු | 8,223,845.62 | 4,942,426 |
| 139111 | ලංකා බැංකු ආයතන ශාඛාව - ණය | 173,753.83 | 2,443 |
| 1392 | බැංකුවේ ඇති මුදල් - ප්‍රාදේශීය | 42,147,047.84 | 81,603,066 |
| 1392A | බැංකුවේ ඇති මුදල් - වාත්තු අංගනය | 9,528,638.24 | 13,600,013 |
| 1392B | බැංකුවේ ඇති මුදල් - ඇස්පල්ට් යන්ත්‍රාගාරය | 2,412,211.31 | 4,528,997 |
| 1392C | බැංකුවේ ඇති මුදල් - ග්‍රාමීය පාලම් | 316,655.80 | - |
| 1392D | බැංකුවේ ඇති මුදල් - වෛද්‍ය රක්ෂණය | 449,216.00 | - |
| 1394 | අන්තරාල මුදල් - ප්‍රාදේශීය | 65,068,197.18 | 24,267,149 |
| 1396 | සුළු මුදල් අග්‍රිමය | 688,673.40 | 200,022 |
| 1397 | වෛද්‍ය මුදල් අග්‍රිමය | - | 500,000 |
| 171/2 | ඉන්ධන මුදල් අග්‍රිමය | 364,368.40 | 1,317,167 |
| | | 253,923,342.83 | 202,773,454 |

| | | 2011 | 2010 |
|---|---|---|---|
| **සටහන් 12 ප්‍රාග්ධන සංචිත** | | | |
| 3511 | ප්‍රතිසම්පාදන අරමුදල | 984,142,807.46 | 984,142,807 |
| 3512 | වත්කම් ප්‍රත්‍යාගණන ගිණුම | 4,940,666.51 | 4,940,667 |
| 3513 | පොදු සංචිත | 691,064.97 | 691,065 |
| 3514 | ගොඩනැගිලි අරමුදල | 20,434,782.61 | 20,434,783 |
| | | 1,010,209,321.55 | 1,010,209,322 |

**සටහන 13 මාර්ග පුළුල් කිරීම් හා වැඩි දියුණු කිරීම් ව්‍යාපෘති සඳහා දේශීය බැංකු ණය**

| | 2011 | 2010 |
|---|---|---|
| අඹේපුස්ස-කුරුණෑගල-ත්‍රිකුණාමල මාර්ගය සඳහා කොමර්ෂල් බැංකුවෙන් දිගුකාලීන ණය | 431,201,850.00 | - |
| | 431,201,850.00 | - |

| | | 2011 | 2010 |
|---|---|---|---|
| **සටහන් 14 ගෙවිය යුතු රඳවා ගැනීම් හා තැන්පතු** | | | |
| 221CD | සේවාදායක තැන්පතු | 1,520,337,699.96 | 1,401,792,182 |
| 221SD | ආරක්ෂක තැන්පතු | 2,362,418.34 | 2,287,500 |
| 221RD | ආපසු ගෙවන තැන්පතු | 94,275,122.10 | 112,819,259 |
| 221RM101 | රඳවාගත් මුදල් - කො.ක.අ. | - | 2,455,235 |
| 221RM102 | රඳවාගත් මුදල් ප්‍රදාන - II | - | 1,487,434 |
| 221RM103 | රඳවාගත් මුදල් - මාර්ග පුළුල් හා වැඩි දියුණු කිරීම් | 906,001,443.52 | 678,894,847 |
| 221RM103A | රඳවාගත් මුදල් - මාර්ග පුළුල් හා වැඩි දියුනු කිරීම් ණය | 16,433,995.64 | - |
| 221RM104 | රඳවාගත් මුදල් - මගනැගුම මා.උ.හා ව්‍යා.ක.සේ.සමාගම | - | 549,807 |
| 221RM107 | රඳවාගත් මුදල් - රණවිරු | 14,374,254.50 | 18,487,948 |
| 221RM109 | රඳවාගත් මුදල් - වරාය සංවර්ධන | 329,258,816.48 | 100,277,217 |
| 221RM110 | රඳවාගත් මුදල් - දැයට කිරුළ | 179,648,405.65 | 7,268,529 |
| 221RM111 | රඳවාගත් මුදල් - ජ.ජා.ස.ආ. | 1,239,755.11 | - |
| 221RM3 | රඳවාගත් මුදල් - ප්‍රාදේශීය | 378,377,977.32 | 336,861,238 |
| 221RM4 | රඳවාගත් මුදල් - ගෙවීම් | 14,294,516.69 | 15,421,349 |
| 221RM5 | රඳවාගත් මුදල් - මගනැගුම සමාගම් | 369,297,875.41 | 138,863,059 |
| 221RM6 | රඳවාගත් මුදල් - ග්‍රාමීය පාලම් | 1,457,970.46 | 1,017,840 |
| 221RM7 | රඳවාගත් මුදල් - ඇස්පල්ට් යන්ත්‍රාගාරය | 536,515.44 | - |
| 221DDF | තැන්පතු - බේස්ලයින් මාර්ග අවතැන් මුදල් | 4,033,360.00 | 4,033,360 |
| 221DLD | තැන්පතු - ඇවර හානි | 400,608,597.95 | 374,020,566 |
| 221PSD | කාර්ය සාධන ආරක්ෂණ තැන්පතු | 350,326.50 | 94,000 |
| | | 4,232,889,051.07 | 3,196,631,371 |

| | | 2011 | 2010 |
|---|---|---|---|
| **සටහන් 15 වැඩ සඳහා භාවිතා කල යුතු අරමුදල්** | | | |
| 221RW | මාර්ග පුළුල් කිරීම් හා විශේෂ අරමුදල් | 3,525,359,436.06 | 2,527,442,290 |
| 221MF | අමාත්‍යාංශ සඳහා විශේෂ අරමුදල් | 727,722,339.75 | 516,851,980 |
| 221TF | භාර අරමුදල් විශේෂ අරමුදල | - | 443,907,131 |
| 221JI | ජ.ජා.ස.ආ.විශේෂ අරමුදල | 32,602,448.12 | - |
| | | 4,285,684,223.93 | 3,488,201,401 |

| | | 2011 | 2010 |
|---|---|---|---|
| **සටහන් 16 මාර්ග නිර්මාණ සහ සංවර්ධන (පුද්) සමාගම ඇවර කිරීම** | | | |
| 2209A | ඇවරකරුවෝ - මාර්ග නිර්මාණ සහ සංවර්ධන (පුද්) සමාගම | - | 72,158,715 |
| | | - | 72,158,715 |
| | ගෙවිය යුතු ශුද්ධ මුදල | - | 72,158,715 |

| | | 2011 | 2010 |
|---|---|---|---|
| **සටහන 17 මගනැගුම ඉමල්ෂන් නිෂ්පාදන (පුද්) සමාගමට ගෙවිය යුතු** | | | |
| 141072 | උපචිත බිල් | 27,484,511.25 | |
| | | 27,484,511.25 | - |

| | | 2011 | 2010 |
|---|---|---|---|
| **සටහන්18 මගනැගුම මාර්ග ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ (පුද්) සමාගමට ගෙවිය යුතු** | | | |
| 142072 | උපචිත බිල් | 20,695,712.00 | |
| | | 20,695,712.00 | - |

## මාර්ග සංවර්ධන අධිකාරිය
## 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයට සටහන්

| | | 2011 | 2010 |
|---|---|---|---|
| **සටහන් 19 මගනැගුම උපදේශක හා ව්‍යාපෘති කළමනාකරණ සේවා (පුද්) සමාගමට ගෙවිය යුතු** | | | |
| 143022 | උපචිත බිල් | 95,366,320.90 | |
| 143023 | උපචිත බිල් - වැඩ | 11,542,517.11 | |
| | | 106,908,838.01 | - |
| **සටහන් 20 කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම්** | | | |
| 2221 | ව්‍යාපෘති කොන්ත්‍රාත්කරුවෝ | 4,080,996,738.08 | 2,424,330,987 |
| 2222 | වෙනත් කොන්ත්‍රාත්කරුවෝ | 1,442,538,002.49 | 674,858,232 |
| | | 5,523,534,740.57 | 3,099,189,218 |
| **සටහන් 21 උපචිත වියදම්** | | | |
| 2231 | පරිපාලන පොදු කාර්ය පිරිවැය | 63,605,027.32 | 73,342,463 |
| 223301 | දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් - ආදායම් බද්ද | - | 34,091 |
| 223303 | දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් - ආ.සේ.බ. | 60,000,000.00 | 60,000,000 |
| 223304 | දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් - ආදායක | 163.65 | 3,838 |
| 223305 | දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් - ර.බ. 1/3 එ.අ.බ. | - | 6,898,137 |
| 223306 | දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් - ර.බ. | - | 7,379,850 |
| 223307 | කල්දැමූ නිමවුම් බද්ද | 78,710,961.07 | 84,073,037 |
| 2233512 | දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් - ජා.ගො.බ. | 86,298,075.00 | 65,019,972 |
| 2233507 | ප්‍රාදේශිය කොමසාරිස් - පිරිවැටුම් බද්ද මත රඳවාගැනීමේ බද්ද | - | 3,730 |
| 2233511 | දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් - ඉ.ආ.අ.බ. | 130,851.07 | 442,002 |
| 2233510 | දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් - මුද්දර ගාස්තු | 229,470.00 | 3,862 |
| 2234 | සේවක අර්ථසාධක අරමුදල 8% | 19,518,401.22 | 15,849,637 |
| 2235 | සේවක අර්ථසාධක අරමුදල 12% | 29,287,896.73 | 23,722,380 |
| 2236 | සේවක භාරකාර අරමුදල 3% | 7,298,003.86 | 5,920,429 |
| 22374 | දිරිදීමනා | 2,624,062.50 | 4,038,461 |
| 22375 | ගෙවිය යුතු වෛද්‍ය නිවාඩු දීමනා | 125,982,902.56 | 96,618,900 |
| 22410 | විගණන ගාස්තු | 3,781,344.00 | 4,365,325 |
| 22371 | නොගෙවූ වැටුප් | - | 104,077 |
| | | 477,467,158.98 | 447,820,191 |
| **සටහන් 22 ණයකරුවෝ සහ වෙනත් අය** | | | |
| 223201/02 | ද්‍රව්‍ය සැපයුම් ණයහිමියෝ | 344,546,799.05 | 502,512,984 |
| 223203 | ඇස්පල්ට් යන්ත්‍රාගාර ද්‍රව්‍ය සැපයුම් ණයහිමියෝ | 219,937,849.00 | 477,724,434 |
| 223203A | ඇස්පල්ට් යන්ත්‍රාගාර සඳහා වෙනත් සැපයුම් ණයහිමියෝ | 97,525,702.27 | - |
| 223204 | අන්තර් බැඳීම් භාණ්ඩ සඳහා සැපයුම් ණයහිමියෝ | 862,285.64 | 730,752 |
| 224011 | කාර්ය මණ්ඩලයේ වෙනත් විවිධ අඩුකිරීම් - ප්‍රධාන කාර්යාලය | 4,046,584.76 | 2,471,794 |
| 224012 | කාර්ය මණ්ඩලයේ වෙනත් විවිධ අඩුකිරීම් - ප්‍රාදේශිය | 80,554.49 | 80,747 |
| 22403 | වැටුප් පාලක ගිණුම | 76,268.37 | 93,439 |
| 22404 | සෘජු කම්කරු වැටුප් පාලක ගිණුම | 15,484.02 | 59,566 |
| 2240702 | නිවාස කුලී අත්තිකාරම් | 11,103,024.30 | 11,855,750 |
| 2240701 | විශේෂ වෛද්‍ය අරමුදල | - | 400,000 |
| 2240703 | වෙනත් ප්‍රාදේශිය ණයහිමියෝ | 3,374,467.79 | 3,374,468 |
| 2240704 | වෙනත් ණයහිමියෝ ව්‍යාපෘති | 28,628,883.40 | 90,439,027 |
| 2240705 | වෙනත් ණයහිමියෝ - ල.තෙ.ස. | 96,184,883.00 | 40,043,822 |
| 2240706 | ආවර්ත ණය අරමුදල | - | 214,500 |
| 2240707 | මාර්ග නඩත්තු කොන්ත්‍රාත් අවිනිශ්චිත ගිණුම්වල පොලිය | 3,838,316.33 | - |
| 224081 | වෙනත් ගෙවිය යුතු මුදල් - ප්‍රධාන කාර්යාලය | 57,142.86 | 57,143 |
| 224082 | වෙනත් ගෙවිය යුතු මුදල් - ප්‍රාදේශිය | 184,267.98 | 1,341,042 |
| 22412 | සාමුහික වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | 42,447,289.31 | 33,006,365 |
| 22413 | සෘජු කම්කරු වැඩ සඳහා ණයකරුවෝ | 14,951,183.79 | 15,611,828 |
| 22416 | අවලංගු කළ චෙක්පත් | 332,470.38 | - |
| 22418 | සැපයුම්කරු පාලක ගිණුම | 136,627.42 | 2,494,246 |
| 22421 | අන්තර් බැඳීම් කොන්ක්‍රීට් ඝණක පාලක ණයහිමියෝ | 4,264,043.08 | 625,000 |
| 133071/72 | පොදු කාර්ය පාලක ගිණුම - මාර්ග ආංශික සංවර්ධන ව්‍යාපෘතිය | 482,121.66 | |
| 136207 | කාර්ය මණ්ඩල ණයහිමියෝ | 8,269.60 | - |
| | | 873,084,518.50 | 1,183,136,905 |

## මාර්ග සංවර්ධන අධිකාරිය
## 2011 දෙසැම්බර් 31 දිනට ආදායම් ප්‍රකාශයට සටහන්

| | | 2011 (රු:) | 2010 (රු:) |
|---|---|---|---|
| **සටහන් 23** | **ඉටුකල වැඩවල අගය** | | |
| 411 | ඉටුකල වැඩවල අගය - අමාත්‍යාංශ අරමුදල | 7,236,332,978.77 | 1,502,349,967 |
| 415 | ඉටුකල වැඩවල අගය - භාර අරමුදල | 7,824,849,648.06 | 5,645,483,853 |
| 413 | ඉටුකල වැඩවල අගය - මාර්ග පුළුල් කිරීම් | 11,638,091,123.49 | 7,671,950,006 |
| 4134 | ඉටුකල වැඩවල අගය - ජ.ජා.ස.ආ. | 12,397,551.14 | - |
| | | 26,711,671,301.46 | 14,819,783,826 |
| **සටහන් 24** | **සංවර්ධන හා නඩත්තු වියදම** | | |
| 61 | සංවර්ධන වියදම - අමාත්‍යාංශ අරමුදල | 7,236,332,978.77 | 1,502,349,967 |
| 65 | සංවර්ධන වියදම - භාර අරමුදල | 7,824,849,648.06 | 5,645,483,853 |
| 63 | සංවර්ධන වියදම - මාර්ග පුළුල් කිරීම | 11,638,091,123.49 | 7,671,950,006 |
| 634 | සංවර්ධන වියදම - ජ.ජා.සආ. | 12,397,551.14 | - |
| | | 26,711,671,301.46 | 14,819,783,826 |
| **සටහන් 24 A** | **දේශිය බැංකු අරමුදල් යටතේ ඉටුකල වැඩවල වටිනාකම** | | |
| 4133 | ඉටුකල වැඩවල වටිනාකම - මාර්ග පුළුල් හා වැඩිදියුණු වැඩ | 179,710,663.70 | - |
| 633 | සංවර්ධන වියදම - මාර්ග පුළුල් හා වැඩි දියුණු වැඩ | 179,710,663.70 | - |
| | | - | - |
| **සටහන් 25** | **සේවාදායක වැඩ** | | |
| 412 | ඉටුකල වැඩවල වටිනාකම - සේවා දායකයෝ | 1,098,380,233.04 | 519,887,954 |
| 62 | සංවර්ධන හා නඩත්තු වියදම් - සේවා දායකයෝ | 965,900,934.50 | 496,340,875 |
| 69 | පොදු කාර්ය පිරිවැය - සේවා දායකයෝ | 41,991,141.28 | 40,184,081 |
| | සේවා දායක වැඩවලින් අතිරික්තය | 90,488,157.26 | (16,637,001) |
| **සටහන් 26** | **පොදු කාර්ය පිරිවැය අඩුකර ගැනීම** | | |
| 421 | පොදු කාර්ය පිරිවැය අඩුකර ගැනීම - වි.ආ.ව්‍යාපෘති | 15,935,520.94 | 15,255,092 |
| 422 | පොදු කාර්ය පිරිවැය අඩුකර ගැනීම - වැටුප් | 1,211.50 | 4,464 |
| 426 | 25% භාර භාවිතය පොදු කාර්ය පිරිවැය අඩුකර ගැනීම | 693,053.87 | 86,518,789 |
| | | 16,629,786.31 | 101,778,345 |
| **සටහන් 27** | **සේවාවන් සඳහා ගාස්තු** | | |
| 4301 | පස් පරීක්ෂණ සඳහා ගාස්තු | 86,351,964.39 | 43,330,535 |
| 4302 | උපදේශක ගාස්තු | 3,528,539.16 | 3,720,718 |
| 4303 | අධීක්ෂණය සඳහා ගාස්තු | 45,449,233.30 | 24,557,938 |
| 4305 | මාර්ග ප්‍රතිස්ථාපන ගාස්තු | 57,345,861.60 | 42,588,223 |
| 4306 | විවිධ සේවා | 170,762.51 | 579,409 |
| | | 192,846,360.96 | 114,776,823 |
| **සටහන් 28** | **පොලිය** | | |
| 44011/44012 | තාවකාලික අතිරික්ත මුදල් මත පොලිය | 95,899,226.92 | 55,100,061 |
| 44014 | වෙනත් දැවල පොලිය | 811,740.73 | 1,183,691 |
| | | 96,710,967.65 | 56,283,751 |
| අඩුකලා | | | |
| 55 | ආදායම් බද්ද හා සමාජ ආරක්ෂණ බද්ද | 11,612,374.00 | 18,985,644 |
| | | 85,098,593.65 | 37,298,107 |
| 4402 | කාර්ය මණ්ඩල ණය පොලිය | 15,163,404.71 | 15,420,344 |
| | | 100,261,998.36 | 52,718,451 |
| **සටහන් 29** | **කුලී ගාස්තු හා නිවාස කුලී** | | |
| 45011 | යන්ත්‍රාගාර හා යන්ත්‍ර කුලී | 74,864,016.57 | 84,434,953 |
| 45013 | වෙනත් කුලී ගාස්තු | 1,543,238.41 | 7,366,854 |
| 4503 | ප්‍රචාරණ පුවරු ගාස්තු | 44,562,102.55 | 70,436,099 |
| 4504 | නිලනිවාස කුලී | 8,595,127.59 | 8,559,288 |
| 4505 | සංචාරක නිවාස | 1,159,546.65 | 1,001,432 |
| 4506 | ඉඩම් කල්බදු කුලී | 2,483,928.57 | 3,790,179 |

**මාර්ග සංවර්ධන අධිකාරිය**

**2011 දෙසැම්බර් 31 දිනට ආදායම් ප්‍රකාශයට සටහන්**

| | | 2011 | 2010 |
|---|---|---|---|
| | | (රු:) | (රු:) |
| 4509 | ලොතරැයි කුටි ගාස්තු | 151,014.46 | 1,038,850 |
| 4510 | ප්‍රචාරණ තොරණ් කුලී ගාස්තු | 20,956,846.40 | 21,391,066 |
| 4512 | රූපවාහිනී රැහැන් ජාල කුලී | 25,127,823.57 | 16,972,730 |
| 4513 | දුරකථන කුටි කුලී | 549,847.37 | 320,244 |
| 4514 | උමං මාර්ග කුලී | 3,583,123.31 | 1,773,567 |
| 4515 | ප්‍රචාරණ ධජ ගාස්තු | 1,346,304.25 | 1,915,760 |
| | | 184,922,919.70 | 219,001,022 |
| **සටහන් 30** | **වෙනත් ආදායම්** | | |
| 4801 | ලේඛන විකිණීම | 2,830,155.81 | 2,275,720 |
| 4802 | ගර්භිත ද්‍රව්‍ය විකිණීම | 20,637,672.10 | 1,128,291 |
| 4803 | ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු | 10,972,565.12 | 4,604,967 |
| 4806 | හානි සඳහා අයකිරීම් | 7,351,250.09 | 4,702,738 |
| 4807 | ලැබුණු ත්‍යාග | 214,500.00 | - |
| 4808 | වත්කම් ඉවතලෑමෙන් ලාභ ( සටහන් 30 A ) | 9,017,314.25 | 597,122 |
| 4810/05 | දඩ | 232,743.89 | 103,926 |
| 4811 | හිස් තාර බැරල් විකිණීම | 762,654.17 | 913,703 |
| 4812 | විවිධ ආදායම් | 23,653,438.15 | 2,154,087 |
| 4814 | ආපසු ලියන ලද තැන්පතු | 52,126.94 | |
| 4817 | වානේ විකිණීම | 416,567.00 | 10,644,994 |
| 4818 | ගොඩනැගිලි සීමාව සඳහා බලපත්‍ර ගාස්තු | 732,274.41 | 134,645 |
| 4820 | කාර්ය සාධන බැඳුම්කර වලින් අයකර ගැනීම | 450,978.80 | - |
| | | 77,324,240.73 | 27,260,193 |
| **සටහන් 30 A** | **වත්කම් ඉවතලෑම් මත ආදායම** | | |
| | විකුණුම් කිරීම | 9,108,135.12 | 713,628 |
| අඩුකලා : | වැඩියෙන් ගිණුම් කල ලාභවල අඩුකල අගය 2010/2009 | (35,227.76) | (112,100) |
| | | (55,593.11) | (4,406) |
| | | 9,017,314.25 | 597,122 |
| **සටහන් 31** | **අධිවේගී මාර්ග ආදායම** | | |
| 4901 | භාවිතකරු ආදායම (එ.ආ.බ.ශුද්ධ) අඩුකලා | 74,940,383.94 | - |
| 6141151 | අධිවේගී මාර්ගයේ වියදම් | 40,924,734.39 | - |
| | | 34,015,649.55 | - |
| **සටහන් 32** | **වාත්තු අංගනයේ ආදායම** | | |
| | විකුණුම් | 5,495,328.59 | 642,212 |
| | අඩුකලා | | |
| | විකුණුම් පිරිවැය | 4,579,440.49 | 535,176 |
| | | 915,888.10 | 107,035 |
| **සටහන් 33** | **ඇස්පල්ට් යන්ත්‍රාගාර ආදායම** | | |
| | ඇස්පල්ට් යන්ත්‍රාගාරවලින් ලාභ | 264,400.54 | - |
| | | - | - |
| | | 264,400.54 | - |
| | පෙරමුසු විකුණුම් බාහිර | 1,752,488.59 | - |
| | අඩුකලා | | |
| | විකුණුම් වටිනාකම | 1,488,088.05 | - |
| | | 264,400.54 | - |

** **ඇස්පල්ට් පෙරමුසු යන්ත්‍රාගාර කාර් සාධනය සඳහා කරුණාකර අතිරේක උපලේඛන බලන්න.**

**මාර්ග සංවර්ධන අධිකාරිය**
**2011 දෙසැම්බර් 31 දිනට ආදායම් ප්‍රකාශයට සටහන්**

| | | 2011 (රු:) | 2010 (රු:) |
|---|---|---|---|
| **සටහන් 34** | **අන්තර් බැඳුම් කොන්ක්‍රීට් ඝනක ආදායම** | | |
| | විකුණුම් | 64,221,771.58 | 16,713,867 |
| | පරීක්ෂණ ගාස්තු | 143,928.01 | - |
| අඩුකලා | | | |
| | විකුණුම් වටිනාකම | 77,346,780.71 | 12,173,360 |
| | | (12,981,081.12) | 4,540,506 |

| | | | |
|---|---|---|---|
| **සටහන් 35** | **පරිපාලන හා පොදු වියදම්** | | |
| 5101 | වැටුප් හා වේතන | 1,477,728,929.06 | 1,230,221,228 |
| 51021/22 | සේ.අ.අ. හා සේ.භා.භා. අරමුදල් | 189,721,104.80 | 163,721,968 |
| 51023 | පාරිතෝෂික | 175,109,054.77 | 80,406,288 |
| 51025 | වන්දි | 3,053,610.90 | 69,423 |
| 5103 | අතිකාල හා නිවාඩු දින දීමනා | 128,347,406.66 | 105,693,695 |
| 5104/05 | දිරිදීමනා හා වෛද්‍ය නිවාඩු දීමනා | 139,063,192.09 | 127,725,562 |
| 51052 | වෛද්‍ය රක්ෂණය | 9,767,428.67 | 6,025,518 |
| 5106 | ගමන් හා ප්‍රවාහන | 99,854,499.11 | 82,858,398 |
| 5107/8 | මානව සම්පත් සංවර්ධනය | 7,600,974.90 | 4,819,318 |
| 511 | ගාස්තු හා වෙනත් දීමනා | 6,432,762.69 | 5,430,538 |
| 512 | ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 49,433,257.25 | 30,205,585 |
| 515 | සන්නිවේදනය | 20,708,743.96 | 19,948,603 |
| 516 | නිවාස කුලී අනුපාත හා බදු | 94,705,275.38 | 91,898,321 |
| 517 | ප්‍රයෝජනයන් හා වෙනත් | 64,622,144.95 | 48,218,120 |
| 5185 | මගී වාහන හා නඩත්තුව ( සටහන් 35 A) | 165,609,798.08 | 118,915,954 |
| 5181-88* | වෙනත් අලුත්වැඩියා ගාස්තු | 15,996,586.37 | 11,450,522 |
| 519 | විගණන ගාස්තු | 1,530,176.00 | 1,888,343 |
| | | 2,649,284,945.64 | 2,129,497,384 |

| | | | |
|---|---|---|---|
| **සටහන් 35 A** | **ඉන්ධන අලුත්වැඩියා හා නඩත්තු (වාහන හා යන්ත්‍ර)** | | |
| 513 | ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය | 77,192,448.67 | 54,920,192 |
| 514 | වාහන බලපත්‍ර හා රක්ෂණ | 20,941,046.48 | 10,914,908 |
| 5185 | මගී වාහන අලුත්වැඩියාව හා නඩත්තුව | 67,169,645.93 | 53,080,853 |
| 51853 | මගී වාහන අලුත්වැඩියාව හා නඩත්තුව -ප්‍රධාන අළුත්වැඩියාවන් | 306,657.00 | - |
| | | 165,609,798.08 | 118,915,954 |

| | | | |
|---|---|---|---|
| **සටහන් 36** | **වෙනත් වියදම්** | | |
| 521 | බැංකු ගාස්තු | 1,748,501.32 | 2,235,833 |
| 5232 | වැට් බදු ගැලපුම් | 89,090.10 | 316,822 |
| 5235 | මුද්දර ගාස්තු | - | 150 |
| 5236 | ණය බද්ද | 8,358,144.28 | 8,475,362 |
| 5237 | ආ.සේ.බ. කපා හැරියා | 45,018,007.00 | 60,676,964 |
| 5238 | ජාතිය ගොඩනැගීමේ බද්ද | 175,770,033.00 | 171,903,318 |
| 5241 | උත්සව ගාස්තු | 6,875.00 | - |
| 52622 | වෙනත් ණයගැතියෝ කපා හැරියා | 3,767,743.31 | - |
| 5263 | ස්කන්ධ ආයෝජනවල අපේක්ෂිත පාඩුව | - | 11,307,993 |
| | | 234,758,394.01 | 254,916,442 |

| | | | |
|---|---|---|---|
| **සටහන් 37** | | | |
| 3522 | සමුච්චිත අගය ඉදිරියට ගෙන ගියා | (5,042,964,083.01) | (4,888,076,891) |
| | | (5,042,964,083.01) | (4,888,076,891) |

**මාගී සංවර්ධන අධිකාරිය**

**2011 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය**

| | 2011 | |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවලට අනුව ආදායම් බදුවලට පෙර මෙහෙයුම් හිගය | (396,816,488) | |
| ***ගැලපුම්*** | | |
| ප්‍රමාදකල ආදායම මාරුකලා | (567,126,190) | |
| ක්ෂය කිරීම | 609,811,229 | |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 218,048,873 | |
| ආ.සේ.බ.කපා හැරියා | 45,018,007 | |
| වෙනත් ණයගැතියෝ කපා හැරියා | 3,767,743 | |
| තැන්පතු ආපසු කපා හැරියා | (52,127) | |
| වත්කම්, පිරියත හා උපකරණ ඉවතලෑමේ ලාභය | (9,052,542) | |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය | (96,401,495) | |
| තොගවල වැඩිවීම | (73,120,107) | |
| ණයගැතියෝ වැඩිවීම | (137,652,189) | |
| තැන්පතු හා අත්තිකාරම් වැඩිවීම | (1,033,114,187) | |
| වෙනත් ජංගම වත්කම් වැඩිවීම | (30,363,995) | |
| භාණ්ඩාගාරය වෙතින් ලැබිය යුතු මුදල වැඩිවීම | (2,358,747,599) | |
| වෙනත් ආයෝජන අඩුවීම | 12,700,525 | |
| ජංගම ගිණුම අඩුවීම - මගනැගුම දියතාර නිෂ්පාදන සමාගම | 165,695,216 | |
| ජංගම ගිණුම වැඩිවීම - මගනැගුම මාගී ඉදිකිරීම් හා උපදේශක සේවා සමාගම | (343,023,818) | |
| ජංගම ගිණුම අඩුවීම - මගනැගුම ව්‍යා.උ.ක.පු.ස. | 124,386,136 | |
| ගෙවිය යුතු තැන්පතු හා රඳවාගත් මුදල් ගිණුම වැඩිවීම | 1,036,309,807 | |
| මා.නි.සහ සං.(පුද්) සමාගමේ ඇවරකරුගේ ගිණුම් ශේෂය අඩුවීම | (72,158,715) | |
| කොන්ත්‍රාත්කරුව ගෙවම් වැඩිවීම | 2,424,345,523 | |
| වැඩ සඳහා භාවිතා කල යුතු අරමුදල් වැඩිවීම | 797,482,823 | |
| උපචිත වියදම් වැඩිවීම | 29,646,968 | |
| ණයහිමියෝ හා වෙනත් අය අඩුවීම | (310,534,508) | |
| මෙහෙයුම් කටයුතුවලින් උපයාගත් ශුද්ධ මුදල | | 135,450,385 |
| ***ආයෝජන කටයුතු*** | | |
| මාගී සංවර්ධන අධිකාරියේ අරමුදල්වලින් මිලදී ගත් වත්කම් පිරියත හා උපකරණ | (89,087,886) | |
| දේශීය අරමුදල්වලින් මිලදිගත් වත්කම් පිරියත හා උපකරණ | (25,813,553) | |
| ව්‍යාපෘතිවලින් මාරුකළ වත්කම් පිරියත හා උපකරණ | (148,441,368) | |
| මා.සං.අ.ප්‍රදාන වලින් මිලදීගත් වත්කම් පිරියත හා උපකරණ පැවරුම | (179,426) | |
| මාගී සංවර්ධන අධිකාරියේ වත්කම් පිරියත හා උපකරණ විකුණුම් කිරීම | 9,108,135 | |
| ස්කන්ධ ආයෝජන අඩුවීම | 72,158,715 | |
| සිදු කෙරෙමින් පවතින වැඩ ප්‍රගතිය අඩුවීම | 2,087,468 | |
| ලෝක බැංකු ණයවලින් කරන වැඩවල අගය වැඩවීම | (179,710,664) | |
| ආයෝජන කටයුතුවල යොදනු ලැබ ශුද්ධ මුදල | | (359,878,579) |
| ***4 මුදල් ගෙවීම් කටයුතු*** | | |
| ප්‍රමාදකල ආදායම වැඩිවීම - දේශීය අරමුදල | 25,813,553 | |
| ප්‍රමාද කල ආදායම වැඩිවීම - ව්‍යාපෘති | 148,441,368 | |
| ප්‍රමාද කල ආදායම වැඩිවීම - ප්‍රාග්ධන වත්කම් | 179,426 | |
| ප්‍රමාද කල ආදායම වැඩිවීම - ප්‍රාග්ධන ප්‍රදාන | 2,820,152 | |
| සේවකයන්ට පැවරූ බයිසිකල්වල අඩු කිරීම් වැඩි කිරීම | 1,621,735 | |
| පුළුල් කිරීම් සඳහා දේශීය බැංකු ණය වැඩිවීම | 431,201,850 | |
| මූල්‍ය යෙදුම් කටයුතු මගින් සැපයූ ශුද්ධ මුදල | | 610,078,084 |
| මුදල් හා කළු මුදල් වැඩිවීම හා මුදල් ස්ථාන ශුද්ධ | | 385,649,889 |
| අවුරුද්ද අවසානයේ මුදල් හා කළු මුදල් | | 1,016,773,454 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් ස්ථාන | | 1,402,423,343 |

**උපලේඛන - 01**

| ඇස්පල්ට් පෙරමුසු යන්ත්‍රාගාරය<br>2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ප්‍රකාශය | | | | | | |
|---|---|---|---|---|---|---|
| විස්තරය | සටහන | යන්ත්‍රාගාර - 01<br>ඉංගිරිය<br>(රු:) | යන්ත්‍රාගාර- 02<br>කොටදෙනියාව<br>(රු:) | යන්ත්‍රාගාර - 03<br>කෑරගල<br>(රු:) | යන්ත්‍රාගාර - 04<br>කරමැටිය<br>(රු:) | එකතුව<br><br>(රු:) |
| විකුණුම් | | 860,486,451 | 497,117,120 | 673,318,394 | 529,126,433 | 2,560,048,398 |
| **අඩුකලා-සෘජු පිරිවැය** | | | | | | |
| කළුගල් | | 116,914,655 | 108,371,690 | 126,883,824 | 93,178,753 | 445,348,921 |
| තාර | | 325,447,753 | 225,673,391 | 277,677,315 | 234,522,772 | 1,063,321,231 |
| ඉන්ධන | | 49,297,987 | 34,050,499 | 37,471,443 | 27,137,371 | 147,957,300 |
| වෙනත් ද්‍රව්‍ය | | 202,812 | 79,092 | 159,686 | 415,206 | 856,796 |
| ශ්‍රමය | 1 | 3,207,901 | 1,617,488 | 1,910,011 | 2,826,011 | 9,561,411 |
| ද්‍රව්‍ය ප්‍රවාහනය | | 52,373,624 | 45,870,015 | 44,513,439 | 9,297,602 | 152,054,681 |
| **සමස්ත සෘජු පිරිවැය** | | **547,444,732** | **415,662,176** | **488,615,717** | **367,377,715** | **1,819,100,340** |
| **දායකත්වය** | | **313,041,719** | **81,454,944** | **184,702,677** | **161,748,718** | **740,948,058** |
| **අඩුකලා-වෙනත් වියදම්** | | | | | | |
| කර්මාන්ත ශාලා පොදු කා.වි. | 2 | 32,063,010 | 23,898,842 | 39,366,703 | 26,472,984 | 121,801,539 |
| ක්ෂය කිරීම් | 3 | 30,356,029 | 24,574,544 | 24,846,421 | 26,527,367 | 106,304,361 |
| ප්‍රධාන කාර්යාල ගාස්තු | 4 | 1,305,319 | 1,305,319 | 1,305,319 | 1,305,319 | 5,221,276 |
| | | 63,724,358 | 49,778,705 | 65,518,443 | 54,305,670 | 233,327,175 |
| **ශුද්ධ ලාභය** | | **249,317,362** | **31,676,239** | **119,184,234** | **107,443,049** | **507,620,883** |

## මාගී සංවර්ධන අධිකාරිය

**පරිපූරක උපලේඛන අඛණ්ඩ** **අතිරේක උපලේඛන** **උපලේඛන - 02**

**2011.12.31 දිනට ඇස්පල්ට් පෙරමුසු යන්ත්‍රාගාර ආදායම් හා වියදම් ගිණුමට සටහන්**

| | යන්ත්‍රාගාර - 1 ඉංගිරිය | යන්ත්‍රාගාර - 2 කොටදෙනියාව | යන්ත්‍රාගාර - 3 කැරගල | යන්ත්‍රාගාර - 4 කරමැටිය | එකතුව |
|---|---|---|---|---|---|
| **1.ශ්‍රම පිරිවැය** | රු: | රු: | රු:. | රු: | රු: |
| වේතන | 2,972,420 | 1,593,021 | 1,910,011 | 2,826,011 | 9,301,462 |
| අතිකාල | 235,481 | 24,468 | - | - | 259,949 |
| | 3,207,901 | 1,617,488 | 1,910,011 | 2,826,011 | 9,561,411 |
| **2.කර්මාන්තශාලා පොදු කාර්ය වියදම්** | | | | | |
| වැටුප් හා වේතන | 3,537,370 | 3,435,913 | 4,698,779 | 2,715,461 | 14,387,523 |
| අතිකාල හා නිවාඩු දින දීමනා | 2,380,418 | 1,589,794 | 3,413,235 | 1,554,624 | 8,938,070 |
| සේ.අ.අ. හා සේ.නි.භා.අ. | 437,266 | 404,223 | 605,204 | 311,746 | 1,758,440 |
| අවදානම් දීමනාව | 4,846,202 | 987,107 | 2,456,563 | 3,515,194 | 11,805,066 |
| වෛද්‍ය | 388,948 | 392,721 | 467,378 | 303,301 | 1,552,348 |
| ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය | 3,354,752 | 2,003,808 | 10,383,118 | 2,402,622 | 18,144,300 |
| විදුලිය | 6,551,555 | 3,530,186 | 3,356,729 | 3,400,797 | 16,839,268 |
| ජලය | - | 466,071 | - | - | 466,071 |
| නිවාස කුලී | 59,500 | 56,500 | 32,500 | 50,000 | 198,500 |
| ආරක්ෂණ සේවා | 545,051 | 870,590 | 868,224 | 901,843 | 3,185,708 |
| දුරකථන | 138,136 | 91,231 | 33,484 | 57,443 | 320,294 |
| ලිපිද්‍රව්‍ය | 87,448 | 86,236 | 74,951 | 77,896 | 326,533 |
| ගමන් වියදම් | 187,615 | 148,771 | 246,903 | 167,533 | 750,822 |
| කුලී ගාස්තු | 1,821,718 | 1,748,400 | 922,075 | 1,355,801 | 5,847,994 |
| යන්ත්‍ර අලුත්වැඩියා | 6,568,482 | 7,168,991 | 10,282,695 | 7,483,635 | 31,503,803 |
| වාහන අලුත්වැඩියා ගාස්තු | 140,111 | 210,503 | 404,482 | 224,926 | 980,020 |
| වෙනත් අලුත්වැඩියා ගාස්තු | 10,679 | 15,500 | 2,518 | 2,290 | 30,987 |
| වෙනත් | 1,007,757 | 692,297 | 1,117,865 | 1,947,871 | 4,765,790 |
| | 32,063,010 | 23,898,842 | 39,366,703 | 26,472,984 | 121,801,539 |
| **2.ක්ෂය කලා** | | | | | |
| යන්ත්‍රාගාර යන්ත්‍ර හා ආයුධ | 30,120,715 | 24,494,249 | 24,643,674 | 26,442,504 | 105,701,142 |
| ලිබඩු | 22,474 | 16,286 | 5,457 | 38,859 | 83,076 |
| පරිගණක | 62,575 | 38,019 | 33,753 | 38,919 | 173,266 |
| ගොඩනැගිලි | 150,265 | 25,299 | 155,747 | 7,085 | 338,395 |
| වාහන | - | - | 7,100 | - | 7,100 |
| සන්නිවේදන කුටි | - | 691 | 691 | - | 1,382 |
| | 30,356,029 | 24,574,544 | 24,846,421 | 26,527,367 | 106,304,361 |
| **4.ප්‍රධාන කාර්යාල ගාස්තු** | | | | | |
| වැටුප් හා වේතන | 925,646 | 925,646 | 925,646 | 925,646 | 3,702,583 |
| අතිකාල හා නිවාඩු දින දීමනා | 24,248 | 24,248 | 24,248 | 24,248 | 96,994 |
| සේ.අ.අ. හා සේ.නි.භා.අ. | 105,714 | 105,714 | 105,714 | 105,714 | 422,856 |
| දිරිදීමනා | 14,469 | 14,469 | 14,469 | 14,469 | 57,875 |
| ලිපිද්‍රව්‍ය | 750 | 750 | 750 | 750 | 3,000 |
| ගමන් වියදම් | 2,491 | 2,491 | 2,491 | 2,491 | 9,963 |
| කුලී ගාස්තු | 192,666 | 192,666 | 192,666 | 192,666 | 770,665 |
| බැංකු ගාස්තු | 7,215 | 7,215 | 7,215 | 7,215 | 28,860 |
| වාහන අලුත්වැඩියා ගාස්තු | 22,785 | 22,785 | 22,785 | 22,785 | 91,140 |
| වෙනත් | 9,335 | 9,335 | 9,335 | 9,335 | 37,340 |
| | 1,305,319 | 1,305,319 | 1,305,319 | 1,305,319 | 5,221,276 |

**අතිරේක උපලේඛන අඛන්ඩව**

**උපලේඛන - 03**

| 2011 වර්ෂය සඳහා<br>ඇස්පල්ට් පෙරමුසු යන්ත්‍රාගාරවල කාර්ය සාධන ප්‍රකාශය | | | | | |
|---|---|---|---|---|---|
| විස්තරය | යන්ත්‍රාගාර - 1<br>ඉංගිරිය | යන්ත්‍රාගාර - 2<br>කොටදෙනියාව | යන්ත්‍රාගාර - 3<br>කෑරගල | යන්ත්‍රාගාර - 4<br>කරමැටිය | එකතුව |
| නිෂ්පාදන ධාරිතාව (ප්‍රමාණය මෙ.ටොන්) | 108,000 | 108,000 | 108,000 | 108,000 | 432,000 |
| නිෂ්පාදිත හා විකුණුම් (ප්‍රමාණය මෙ.ටොන්) | 78,829 | 54,653 | 66,428 | 57,914 | 257,823 |
| ධාරිතා පාවිච්චිය (%) | 72.99 | 50.60 | 61.51 | 53.62 | 59.68 |
| විකුණුම් (රු:මි.) | 860,486 | 497,117 | 673,318 | 529,126 | 2,560,048 |
| සාමාන්‍ය විකුණුම් මිල (මෙ.ටොන් 1 ක් රු:) | 10,915.88 | 9,095.95 | 10,135.99 | 9,136.48 | 9,929.46 |
| සම්පූර්ණ නිෂ්පාදිත පිරිවැය (මෙ.ටොන් 1 ට රු:) | 7,753.11 | 8,516.36 | 8,341.82 | 7,281.25 | 7,960.59 |
| ටොන් එකකට ලාභය (රු) | 3,162.77 | 579.59 | 1,794.17 | 1,855.23 | 1,968.87 |
| සම්පූර්ණ ලාභය (රු:මි.) | 249,317 | 31,676 | 119,184 | 107,443 | 507,621 |
| මගනැගුමෙන් මිලදී ගැනීම් සාමාන්‍ය මිල (ටොන් 1ට රු:) | 11,167.71 | 11,167.71 | 11,167.71 | 11,167.71 | 11,167.71 |
| පිරිවැය ඉතිරිකිරීම් (ටොන් 1 ට රු) | 3,414.59 | 2,651.35 | 2,825.89 | 3,886.46 | 3,207.11 |
| සම්පූර්ණ ඉතිරිකිරීම් (රු:මිලියන) | 269,169 | 144,903 | 187,719 | 225,079 | 826,870 |
| % විකුණුම් සඳහා සෘජු පිරිවැය -කළුගල් | 13.59 | 21.80 | 18.84 | 17.61 | 17.40 |
| තාර | 37.82 | 45.40 | 41.24 | 44.32 | 41.54 |
| ඉන්ධන | 5.73 | 6.85 | 5.57 | 5.13 | 5.78 |
| ශ්‍රමය | 0.37 | 0.33 | 0.28 | 0.53 | 0.37 |
| නිෂ්පාදන ප්‍රවාහනය | 6.09 | 9.23 | 6.61 | 1.76 | 5.94 |
| වෙනත් | 0.02 | 0.02 | 0.02 | 0.08 | 0.03 |
| එකතුව | 63.62 | 83.61 | 72.57 | 69.43 | 71.06 |
| % දායකත්වයේ ප්‍රතිශතය | 36.38 | 16.39 | 27.43 | 30.57 | 28.94 |
| දායකත්වය මෙ.ටොන් 1 ට (රු:) | 3,971.16 | 1,490.41 | 2,780.48 | 2,792.93 | 2,873.86 |
| ප්‍රමාණය-විභජනය (මෙ.ටොන්) | 16,047 | 33,399 | 23,564 | 19,444 | 81,190 |
| ආරක්ෂණ සීමාව (ප්‍රමාණය මෙ.ටොන්) | 62,782 | 21,253 | 42,865 | 38,470 | 176,634 |
| % ආරක්ෂණ සීමා ප්‍රතිශතය | 79.64 | 38.89 | 64.53 | 66.43 | 68.51 |

සටහන්

1. නිෂ්පාදන ධාරිතාව පැයකට මෙ.ටොන් 60 ක් ලෙස දිනකට පැය 5 බැගින් යන්ත්‍රාගාරය ධාවනය වන දින 30 ක් සඳහා ගණනය කරනු ලැබේ.
2. දායකත්වය-විකුණුම් මිල-නිෂ්පාදිත පිරිවැය
3. ආරක්ෂණ සීමාව : සම්පූර්ණ විකුණුම් අගය / ප්‍රමාණය - ප්‍රමාණය - විභජනය

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல / My No. ආර්ටී/ඩී/ආර්ඩීඒ/එෆ්එස්/2011

ඔබේ අංකය / உமது இல / No.

දිනය / திகதி / Date 2013 ජනවාරි 15 දින

1880

සභාපති,

මාර්ග සංවර්ධන අධිකාරිය.

මාර්ග සංවර්ධන අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

සමාංක හා මාගේ 2012 නොවැම්බර් 30 දිනැති ලිපිය හා බැඳේ.

02. ඉහත සඳහන් ලිපිය සමඟ ඉංග්‍රීසි අනුවාදය එවන ලද මාගේ වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති

පිටපත්:- 1.ලේකම්, වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය
2.ලේකම්, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka
දුරකථනය / தொலைபேசி / Telephone. 2887220
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887221
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No. : ආර්ඩී/ඩී/ආර්ඩීඒ/එෆ්ඒ/2011

ඔබේ අංකය / உமது இல / No. :

දිනය / திகதி / Date : 2012 නොවැම්බර් 30 දින

සභාපති

මාර්ග සංවර්ධන අධිකාරිය.

**මාර්ග සංවර්ධන අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) ( සි ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

මාර්ග සංවර්ධන අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරි පනතේ 16(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සි) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2012 ජූලි 31 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887220
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887221
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

1.3 **විගණකගේ වගකීම.**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 **තත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 **තත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම්

### 2.2.1 ගිණුම්කරන අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහා භාණ්ඩාගාරය, 2011 වර්ෂය තුළදී අධිවේගි මාර්ග හා මහා මාර්ග සංවර්ධනය මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම, පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීම සහ ආයතනික සහයෝගිතාවය යනාදි වියදම් දැරීමට අධිකාරිය වෙත රු.මිලියන 26,734.4 ක මුදලක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, අධිකාරිය රජයේ අරමුදල් වෙන් කිරීමේ හේතුව සහ ඒවායේ උපයෝජනය, සාධාරණ ලෙස දැක්වෙන පරිදි සහ වෙන් කළ අරමුදල් මත මූල්‍ය පාලනය වැඩි දියුණු කිරීමට හැකිවන පරිදි මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව, සියළු මාර්ග නඩත්තු , පුළුල් කිරීම් හා වැඩි දියුණු කිරීමේ පිරිවැය අදාල වර්ෂයේ ආදායමට එරෙහිව ලියා හරිනු ලැබේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී වාණිජ බැංකුවකින් ලබා ගත් රු.මිලියන 431 ක ණය මුදලින් වැයකර තිබුණු රු.මිලියන 179.7 ක් වූ මාර්ග වැඩි දියුණු කිරීමේ පිරිවැය, ශේෂ පත්‍රයේ ජංගම නොවන වියදම් යටතේ දක්වා තිබුණි.

(ඇ) මධ්‍යම, උතුරු මැද සහ නැගෙනහිර පළාත් වල මාර්ග 16 ක පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට ශ්‍රී ලංකා රජය සහ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය සමඟ එළඹි හදිසි ස්වභාවික ආපදා පුනරුත්ථාපන ව්‍යාපෘතිය සඳහා වූ එස්එල්-පී 103 ණය ගිවිසුම යටතේ අධිකාරිය වෙත රු.මිලියන 12.397 ක මුදලක් ලැබී තිබුණි. කෙසේ වෙතත්, විදේශ ආධාර ගිණුම් තැබීම පිළිබඳ පිළිගත් ප්‍රතිපත්ති වලට පටහැනිව, ලැබී තිබුණු ආධාර හා ඒ මත වූ වියදම් අධිකාරියේ ගිණුම් වලට ගෙන තිබුණි. මෙම විදේශ ආධාර ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වෙනම මූල්‍ය ප්‍රකාශන මහා භාණ්ඩාගාරය විසින් පිළියෙළ කර ඉදිරිපත් කළ යුතු බව නිරීක්ෂණය විය.

(ඈ) 2006 සිට 2010 වර්ෂය දක්වා විවිධ මාර්ග නඩත්තු වැඩ සඳහා බාහිර පුද්ගලයින්ගෙන්/ ආයතන විසින් තැන්පත් කර තිබුණු එකතුව රු.මිලියන 23.033 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරියේ ආදායමට මාරු කර තිබුණි. සිරිතක් වශයෙන් අධිකාරිය විසින් මෙම කටයුතු විශේෂ කාර්ය පැවරුම් වශයෙන් හඳුනා නොගන්නා අතර කාලීන නඩත්තු වැඩ සටහන් යටතේ ඉටු කරනු ලබයි. ඒ අනුව, එම සේවා දායකයින් කරන ලද තැන්පතු යටතේ කරනු ලැබූ වැඩ වටිනාකම තීරණය කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ආදායමට එරෙහිව ලියා හැර තිබුණි.

(ඉ) අධිකාරියට අයත් ඉඩම් වල අගය මූල්‍ය ප්‍රකාශනවල පෙන්වීම සඳහා නියමිත ගිණුම්කරණ පරිචයන් අනුගමනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය. විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පහත විස්තර කෙරේ.

(i) 2009 වර්ෂයේදී බාහිර පාර්ශවයන් වෙත අයිතිකාරත්වය මාරු කර තිබුණු නමුත්, නාරාහේන්පිට ඉඩමේ වටිනාකම වූ රු.මිලියන 28.839 ක මුදල, 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ තිබුණි.

(ii) ඉහත සඳහන් නාරාහේන්පිට පිහිටි ඉඩම, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි වෙනත් ඉඩමකට හුවමාරු කිරීමට 2009 හා 2010 වර්ෂවල ගෙවූ රු මිලියන 60.052 මුදලක් ශේෂ පත්‍රයේ කෙරීගෙන යන වැඩ යටතේ පෙන්වා තිබුණි.

(iii) රු.මිලියන 25.978 ක් වූ පෑලියගොඩ පිහිටි ඉඩමක වටිනාකම ශේෂ පත්‍රයේ පෙන්වා තිබුණු නමුත් ඉඩමේ නීතිමය අයිතිය අධිකාරිය වෙත මාරු කර නොතිබුණි.

(iv) 2002 ජුනි 05 දින රු.මිලියන 56 පිරිවැයකට අත්පත් කරගෙන තිබුණු කඩුවෙල ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයේ උඩුමුල්ලේ පිහිටි හෙක්ටයාර 1.1304 ක් වූ ඉඩමක් 2011 දෙසැම්බර් 31 දින වන තෙක් අධිකාරියේ ගිණුම් වලට ගෙන නොතිබුණි.

(v) බේස්ලයින් මාර්ගයේ සිදු කරන ලද සංවර්ධන වැඩ හේතුවෙන් අවතැන්වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම සඳහා 1999 වර්ෂයේදී රු.මිලියන 123 කට ප්‍රසම්පාදනය කර තිබුණු අක්කර 11 රූඩ් 02 හා පර්චස් 38.3 ක අත්තිඩියේ පිහිටි වෙනත් ඉඩමක් අදාල කාර්යය සඳහා පාවිච්චි කිරීමට හෝ අධිකාරියේ ගිණුම් වලට ගැනීමට 2011 දෙසැම්බර් 31 දින වන තෙක් කටයුතු කර නොතිබුණි.

(ඊ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අංක 150 දරන චක්‍රලේඛය මගින් ලබාදුන් උපදෙස් අනුව, සමාලෝචිත වර්ෂය තුලදී අධිකාරිය රු.මිලියන 72.050 ක් වටිනා වාහන 13 ක් කුලී බදු පදනම මත අත්කරගෙන තිබුණි. කෙසේ වෙතත්, ශේෂ පත්‍රයේ එම වත්කම් වල අගය නිරූපනය වන පරිදි ලෙජර් ගිණුම් වල මේ සම්බන්ධ ගිණුම් සටහන් යොදා නොතිබුණි.

(උ) වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් රු.මිලියන 7.269 ක් වටිනා අන්තර් සවි ගල් ඇතිරුම් යන්ත්‍ර 54 ක් 2010 වර්ෂයේදී අධිකාරිය වෙත භාරදී තිබුණි. වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වරයා, 2010 දෙසැම්බර් 24 දිනැති සිය ලිපිය මගින් උපදෙස් දී තිබුණු පරිදි එවැනි එක් යන්ත්‍රයක ජීවිත කාලය වර්ෂ 10 ක් වන අතර ඒ අනුව ක්ෂය වීම් කලයුතු වේ. කෙසේ වෙතත්,

අධිකාර්ය, යන්ත්‍රයක ජීවිත කාලය වර්ෂ හතරක් පමණක් සේ සලකා තිබුණු අතර ඒ අනුව ක්ෂය වීම් ප්‍රතිපාදනය කර තිබුණි.

(ඞ) අධිවේගී මාර්ග කළමනාකරණ ඒකකයේ පර්ශ්‍රයන් තුළ වර්ෂ අවසානයට පැවති ඉන්වෙන්ට්‍රි හා අනෙකුත් තොග විෂයයන් සත්‍යාපනය කර ගිණුම් වලට ගෙන නොතිබුණි.

### 2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබී තිබුණු තොරතුරු වලට අනුව , අධිකාර්ය විසින් ක්‍රියාත්මක කරනු ලබන විදේශ ආධාර ව්‍යාපෘතිවල පොදු කාර්ය පිරිවැය, අදාල ව්‍යාපෘති කළමනාකරණ ඒකක වලින් අධිකාර්ය අය කරගනු ලබයි. කෙසේ වෙතත්, 2011 දෙසැම්බර් 31 දිනට අය කර ගත යුතු රු.මිලියන 8.679 ක මුළු මුදලින් රු.මිලියන 4.002 ක මුදලක් වර්ෂ හතරකට වැඩි කාලයක් හිඟව පැවතුණි. තවද, 2011 දෙසැම්බර් 31 දිනට එවැනි ව්‍යාපෘති කළමනාකරණ ඒකක වලින් අය විය යුතු රු.මිලියන 7.879 ක් වූ වෙනත් ලැබිය යුතු දෑ අතුරින් රු.මිලියන 3.202 ක් වර්ෂ හතරකට වඩා වැඩි කාලයක් අය නොකර පැවතුණි. ඉන් දැක්වෙන්නේ අධිකාර්ය හිඟ මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර කාලීනව ගෙන නොතිබුණු බවය.

(ආ) මහාමාර්ග දෙපස දැන්වීම් පුවරු, බැනර් හා කටවුට් යනාදියෙන් ආදායම් අය කර ගැනීමට, අධිකාර්යේ දේපළ හා කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂවරයාගේ 2007 මාර්තු 14 දිනැති ආර්ඩීඒ/ පීඑම් සහ ආර් /අයිඑන් එෆ්/01 දරණ චක්‍රලේඛය මගින් දැක්වෙන ක්‍රියාමාර්ග නිසි පරිදි යොදා ගැනීමට අධිකාර්යේ ප්‍රාදේශීය කාර්යාල කටයුතු කර නොතිබුණි. විගණනය විසින් මහනුවර හා ගම්පහ ප්‍රදේශ වල නියැදි පදනමක් මත සිදු කරන ලද පරීක්ෂණ වලින් අනාවරණය වූයේ අධිකාර්යට කිසිදු ගෙවීමක් නොකර අනවසරයෙන් ඉදි කර තිබුණු දැන්වීම් පුවරු ප්‍රදර්ශනය වෙමින් තිබුණු බවය.

(ඇ) මහා මාර්ග පුළුල් කිරීමේ හා වැඩි දියුණු කිරීම් සඳහා අධිකාර්යේ විවිධ ප්‍රාදේශීය කාර්යාල වලින් ලබා දී තිබුණු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකර ගැනීමට අධිකාර්ය ඵලදායි පියවර ගෙන නොතිබුණි. බස්නාහිර , මධ්‍යම , දකුණු හා උතුරු පළාත් වල පිහිටි ප්‍රාදේශීය කාර්යාල විසින් ප්‍රදානය කර තිබුණු 2011 දෙසැම්බර් 31 දිනට හිඟව පැවති රු.467.273 ක් වූ මුළු හිඟ අත්තිකාරම් අතුරින් රු.මිලියන 32.698 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වර්ෂ දෙකකට වැඩි කාලයක් අය නොකර පැවතුණි.

(ඉ) බොරැල්ල හා මහනුවර පිහිටි මගී උමං මාර්ග වල සාප්පු හිමියන්ගෙන් අය කර ගත යුතු එකතුව රු. මිලියන 2.702 ක් වූ බදු කුලි පිළිවෙලින් වර්ෂ හතරකට හා දෙකකට වැඩි කාලයක් හිඟව පැවතුණි. ඒ අනුව, එම ගෙවීම් පැහැර හරින ලද සාප්පු හිමියන්ගෙන් හිඟ මුදල් අය කර ගැනිමට අධිකාරිය කාලීනව පියවර ගෙන නොතිබුණු බව අනාවරණය විය.

(ඊ) 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ පෙන්වා තිබුණු මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා ප්‍රදානය කළ කොන්ත්‍රාත් මත රඳවාගත් රු.මිලියන 1,269 ක් වූ ගෙවිය යුතු මුළු මුදල අතුරින් රු.මිලියන 719.971 ක මුදලක් වර්ෂ දෙකකට වැඩි කාලයක් හිඟව පැවතිමෙන් පෙනී යන්නේ අදාල ශේෂ නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට අධිකාරිය පියවර ගෙන නොතිබුණු බවය.

### 2.2.3 නීතිරීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීතිරීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ)1971 අංක 38 දරන මුදල් පනත<br>(i) 8 (1) වගන්තිය | 2010 ඔක්තෝබර් 30 දිනට පෙර අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කළ යුතු 2011 වර්ෂය සඳහා වූ අධිකාරියේ අයවැය ලේඛනය අනුමත කර තිබුනේ 2011 අගෝස්තු 08 දින දිය. |
| (ii) 14 (1) වගන්තිය | අදාල අමාත්‍යාංශයට හා විගණකාධිපතිවරයාටද පිටපත් ඉදිරිපත් කළ හැකිවන පරිදි මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් තුල පිළියෙල කළ යුතු කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2012 ජුනි 30 වන තෙක් පිළියෙල කර නොතිබුණි. |
| (iii) 14 (4) වගන්තිය | 2010 වර්ෂය සඳහා අධිකාරියේ වාර්ෂික වාර්තාව 2012 ජුනි 30 දින වන තෙක් මුද්‍රණය කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. |

(ආ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2003 ජූනි 02 දිනැති
අංක පීඊඩී /12 චක්‍රලේඛය හා 2004 ජනවාරි 08 දිනැති
අංක: පීඊඩී/21 දරන චක්‍රලේඛය

| | |
|---|---|
| (i) 4.2.1ඡේදය | අධිකාරියේ අරමුණු හා ඉලක්ක සපුරාගැනීම නිශ්චය කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය ලේඛනය සමාලෝචනය කිරීමට අදාල ඇගයීම් සිදු කළ යුතුය. අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල විසින් සමාලෝචිත වර්ෂය තුලදී සත්‍ය වශයෙන් ඉටු කරන ලද මාර්ග නඩත්තු , පුළුල් කිරීම් හා වැඩිදියුණු කිරීම් රාශියක්, අධිකාරියේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් නොවූ බව නිරීක්ෂණය විය. ඒ අනුව එවැනි ඇගයීමක් කිරීමට අධිකාරිය කටයුතු නොකළ බව තහවුරු වේ. |
| (ii) 4.2.2 ඡේදය | සත්‍ය කාර්ය සාධනය සමග සංයුක්ත සැලැස්ම හා අයවැය ලේඛනය, කාලීනව සමාලෝචනය කිරීමට කළමනාකරණය පියවර ගත යුතු වුවද, අධිකාරියේ අයවැය ලේඛනයේ ඇතුලත් වූ වෙන් කිරීම් වලට එරෙහි වූ විචලනයන් ගෙන් දැක්වූයේ එවැනි සමාලෝචනයක් සිදු නොකළ බවය. |
| (iii) 4.2.5 ඡේදය | ඵලදායී කාරක ප්‍රාග්ධන කළමනාකරණය සඳහා පාලන පද්ධතීන් පිහිටුවීම හා ඒවා මාසික පදනමක් මත සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. කෙසේ වෙතත්, අධිකාරිය පාලන පද්ධතීන් වැඩි දියුණු කිරීම සඳහා නිසි අවධානයක් යොමු නොකර ඍණාත්මක ශුද්ධ වත්කම් අනුපාතයක නරක අත්දැකීමක් නිරන්තරයෙන් ලබයි. |
| (ඇ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2005 ජනවාරි 31 දිනැති අංක පීඊඩී 28 දරන චක්‍රලේඛය | අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුළ කුලියට ලබාගෙන තිබුණු වාහන 75 ක් සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ -2006 2.5,2.6,8.9.1, හා 8.9.3 වගන්ති | ප්‍රසම්පාදන කමිටුව හෝ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් වාහන කුලියට ලබා ගැනීම සඳහා වූ පුවත්පත් දැන්වීම්, ඒවා ප්‍රසිද්ධ කිරීමට පෙර අනුමත කර නොතිබුණු අතර එම සේවා සපයන්නන් සමග වාහන කුලියට ගැනීම සඳහා වූ ගිවිසුම් අත්සන් කර නොතිබුණි. |
| (ඉ) මාර්ග සංවර්ධන අධිකාරියේ 2011 ඔක්තෝබර් 28 දිනැති අංක 324 දරණ මුදල් චක්‍රලේඛය | 2011 වර්ෂය අවසානයට අධිකාරියේ ගිණුම් වැසීමට හැකි වන පරිදි සියළුම සුළු මුදල් හෝ වෙනත් අග්‍රිම හා අත්තිකාරම් යනාදිය බැංකු වල තැන්පත් කිරීමට උපදෙස් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, බස්නාහිර, උතුර, සබරගමුව හා ඌව පළාත් කාර්යාල එම උපදෙස් අනුගමනය කර නොතිබුණු අතර නියමිත දිනයන්හිදී සුළු මුදල් අග්‍රිම හා ඉන්ධන අත්තිකාරම් යනාදිය තැන්පත් කර නොතිබුණි. |

2.2.4 <u>නොසැසඳූ ශේෂ</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පහත විස්තර කර තිබෙන පරිදි, නොසැසඳූ ශේෂ හේතුවෙන් අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල කිහිපයක් විසින් බැංකු සැසඳුම් ප්‍රකාශ ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගි කර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(i) උතුර, බස්නාහිර,දකුණු පළාත් වල පිහිටි පළාත් අධ්‍යක්ෂ කාර්යාල සහ කොළඹ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය විසින් පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශ වල පෙන්වා තිබුණු රු.මිලියන 21.642 ක් වූ බැංකුවේ මුදල් ශේෂ , රු.මිලියන 21.052 ක් වූ ශේෂ පත්‍රයේ පෙන්වා තිබුණු මුළු මුදල සමග එකඟ නොවිය. තවද, මහනුවර පිහිටි පෙර නිමි අංගනය විසින් පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශයේ දැක්වුණු රු.මිලියන 9.529 ක ශේෂය , ශේෂ පත්‍රයේ දැක්වූ රු. මිලියන 9.331 ශේෂය සමග එකඟ නොවිය. ඒ අනුව ප්‍රාදේශීය කාර්යාල විසින් පිළියෙල කළ බැංකු සැසඳුම් ප්‍රකාශ වල නිරවද්‍යතාවය, ප්‍රශ්ණකාරීව පැවතුණි.

(ii) ප්‍රාදේශීය කාර්යාල විසින් පවත්වනු ලැබූ බැංකු ගිණුම් පහක පැවති රු.170,087 ක් වූ ශේෂ සඳහා 2011දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ ඵලදායි මුදල් කළමනාකරණ කාර්යයන් සඳහා කාලීනව පිළියෙල කර නොතිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට වූ ඉහත සඳහන් බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර විගණන කාර්යයන් සඳහා ඉදිරිපත් කර තිබුණේ 2012 අගෝස්තු මාසයේදීය.

(iii) වයඹ, සබරගමුව හා බස්නාහිර පළාත් වල පිහිටි පළාත් අධ්‍යක්ෂ කාර්යාල , පොළොන්නරුව ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය හා මහියංගණය හා ඇඹිලිපිටියේ පිහිටි විධායක ඉංජිනේරු කාර්යාල විසින් 2011 දෙසැම්බර් 31 දිනට සාවද්‍ය බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර තිබුණි.

(ආ) බස්නාහිර, දකුණු, වයඹ, හා ඌව පළාත් වල පිහිටි ප්‍රාදේශිය කාර්යාල වල වාර්ෂික තොග සමික්ෂණ වාර්තා සමඟ එම කාර්යාලවල පැවති පාරිභෝගික තොග ශේෂයන්හි විශාල වෙනස්කම් නිරීක්ෂණය වු අතර එයින් පෙනි යන්නේ එම ශේෂ, ගිණුම් වලට ගැනිමට පෙර වාර්ෂික තොග සමික්ෂණ වාර්තා සමග සැසඳිමට එලදායි පියවර ගෙන නොතිබු බවයි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවිම

පහත විස්තර කරන පරිදි සාක්ෂි නොවිම හේතුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ පෙන්වා තිබුණු ශේෂ කිහිපයක් විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(අ) රු.මිලියන 614.566 ක් වු වැඩආරම්භ කිරීමේ අත්තිකාරම් ඇතුලත්ව ප්‍රාදේශිය කාර්යාල කිහිපයක වු රු.මිලියන 630.654 ක කොන්ත්‍රාත් හා වෙනත් අත්තිකාරම් පිළිබඳ විස්තරාත්මක උපලේඛන.

(ආ) එකතුව රු.මිලියන 8.041 ක් වු රඳවාගත් මුදල් ශේෂ සහ එකතුව රු.මිලියන 509.462 ක් වු කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු වෙනත් දෑ සම්බන්ධ විස්තරාත්මක උපලේඛන විගණනයේදි ලබා ගත නොහැකි විය. ඒ අනුව, අධිකාරයේ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීම සම්බන්ධ මුල්‍ය පාලනය සතුටුදායක නොවු බව තහවුරු වේ.

(ඇ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අධික්ෂණය යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සිදු කළ මාර්ග වැඩි දියුණු කිරීමේ කටයුතුවල නිරත ශ්‍රී ලංකා යුධ හමුදාවේ නිලධාරින් වෙත ගම්පහ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය විසින් කුලියට ගෙන සපයා තිබුණු වාහන හතරක ගෙවිම් සහතික කිරීම සඳහා ධාවන සටහන් යනාදි මුලාශ්‍ර ලියවිලි. මේ සඳහා කුලි හා ධාවන ගාස්තු ලෙස රු.මිලියන 6.789 ක මුදල් වැය කර තිබුණි.

(ඇ) ඉහත කරුණට අමතරව, 2011 වර්ෂය තුළ දරන ලද මාර්ග වැඩි දියුණු කිරීමේ / නඩත්තු පිළිබඳ විස්තර 2012 මාර්තු 02 දින විධායක ඉංජිනේරු කාර්යාල වලින් විගණනය විසින් කෙලින්ම ඉල්ලා තිබුණි. කෙසේ වෙතත් කොළඹ , බදුල්ල, නෝර්වුඩ්, සහ පුත්තලම පිහිටි විධායක ඉංජිනේරු කාර්යාල, 2012 ජුලි අවසානය වන විටත් අදාල තොරතුරු ලබා දිමට පියවර ගෙන නොතිබුණි.

2.2.6 <u>අධිකාර්ය විසින් පෞද්ගලික සමාගම් සමග කළ ගණුදෙනු</u>

අධිකාර්යේ අධ්‍යක්ෂ මණ්ඩලය හා ප්‍රධාන විධායක නිලධාරී විසින් ගෙන තිබුණු පහත සඳහන් තීරණ පදනම් කරගෙන සීමාසහිත මග නැගුම මාර්ග ඉදිකිරීම් හා උපකරණ සමාගම , සීමාසහිත මගනැගුම උපදේශිත හා ව්‍යාපෘති කළමනාකරණ සේවා සමාගම සහ සීමාසහිත මගනැගුම ඉමල්ෂන් නිෂ්පාදන සමාගම යන සමාගම් සමග අධිකාර්ය කැපීපෙනෙන ගණුදෙනු ප්‍රමාණයක් සිදු කර තිබුණු බව නිරීක්ෂණය විය.

(අ) 2008 අගෝස්තු 14 දින පැවැත්වූ අධිකාර්යේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සීමාසහිත මගනැගුම මාර්ග ඉදිකිරීම් හා උපකරණ සමාගම හා සීමාසහිත මගනැගුම උපදේශක හා ව්‍යාපෘති කළමනාකරණ සේවා සමාගම වෙත මහාමාර්ග උපලේඛන අනුපාතයට 28% ක පොදු කාර්ය සහ ලාභ තිරුවක් එකතු කර මාර්ග වැඩ පැවරීමට තීරණය කර තිබුණි. තවද, 2008 මැයි 22 දිනැති අංක ආර්ඩීඒ / සීඑච්/එම්එම්සී/02/09 දරණ චක්‍රලේඛයෙන් අධිකාර්යේ ඩිපෝ විසින් නිෂ්පාදනය කර මාර්ග වල පැලීම් සඳහා යොදනු ලබන ප්‍රිමික්ස් ද්‍රව්‍ය වෙනුවට එම ද්‍රව්‍ය මාර්ග ඉදිකිරීම් හා උපකරණ සමාගම වෙතින් මිලදී ගැනිමට අධිකාර්යේ සභාපතිවරයා උපදෙස් ලබා දී තිබුණි.

(ආ) අධිකාර්යේ අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් නිකුත් කළ 2006 මැයි 26 දිනැති ආර්ඩීඒ/ජීඑම්/එම්එම්සී /02/03 දරන චක්‍රලේඛය අනුව ප්‍රිමික්ස් සහ ඉමල්ෂන් නිෂ්පාදන මහනැගුම ඉමල්ෂන් නිෂ්පාදන සමාගමෙන් මිලට ගත යුතුය.

ඉහත තීරණ පදනම් කර ගෙන සමාලෝචිත වර්ෂය තුළදී කරනු ලැබූ වැදගත් සම්බන්ධිත පාර්ශව ගණුදෙනු පහත දැක්වේ.

(අ) අධිකාර්යේ වත්කම් හා යන්ත්‍ර කුලියට ගැනිම මත මගනැගුම මාර්ග ඉදිකිරීම් හා උපකරණ සමාගමෙන් ලැබිය යුතු එකතුව රු.මිලියන 60 ක මුදල, සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රිමික්ස් ද්‍රව්‍ය සැපයිම වෙනුවෙන් ගෙවිය යුතු ශේෂයට එරෙහිව හිලව් කර තිබුණි.

(ආ) මගනැගුම සමාගම් විසින් කුලියට ගනු ලැබූ පිරියත හා යන්ත්‍ර සඳහා වූ අගය එකතු කළ බදු මුදල විලම්භිත ප්‍රතිදාන බදු වශයෙන් වාර්තාකර තිබුණු අතර රු.මිලියන 78.710 ක මුළු මුදලක් 2011 දෙසැම්බර් 31 වන විට නිරවුල් නොකර පැවතුණි. කෙසේ වෙතත්, ඉහත සඳහන් හිලවු කළ රු.මිලියන 60 අදාල අගය එකතු කළ බදු කොටස තීරණය කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශන වල ඒ මත ප්‍රතිපාදනයන් සිදු කර නොතිබුණි.

(ඇ) අධිකාරිය, කුලී ගාස්තු ගණනය කර තිබුනේ මගනැගුම මාර්ග ඉදිකිරීම් හා උපකරණ සමාගමෙන් ලබා දුන් තොරතුරු පමණක් පදනම් කර ගනිමිනි. අදාල පිරියත හා යන්ත්‍ර භාවිතය තහවුරු කර ගැනිමට හා ඒ අනුව කුලී ගාස්තු ගණනය කිරීමට ප්‍රමාණවත් ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි. තවද, අධිකාරිය විසින් මහනැගුම සමාගම් වලට නිදහස් කළ ස්ථාවර වත්කම්, 2006 වර්ෂයේ සිට සත්‍යාපනය කර නොතිබුණි. කුලී ගාස්තු සඳහා වූ අනුප්‍රමාණ වර්ෂ පහකට වැඩි කාලයක් ප්‍රතිශෝධනය වී නොතිබුණු අතර ඒවා වර්තමානයේ පවත්නා වෙළඳපළ අනුප්‍රමාණ වලට වඩා බෙහෙවින් පහළ මට්ටමක පැවතුණි.

(ඈ) ප්‍රාදේශිය වශයෙන් සිදු කරනු ලබන මාර්ග පුළුල් කිරීම් හා වැඩි දියුණු කිරීමේ කාර්යයන් සඳහා මහ නැගුම සමාගම් සමග ගිවිසුම් වලට එළඹීමට අධිකාරියේ ප්‍රාදේශිය කළමනාකරුවන්ට බලය ලබා දී තිබුණි. කෙසේ වෙතත්, මහ නැගුම සමාගම් වලට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සම්බන්ධ මූල්‍ය පාලනය සතුටුදායක නොවිය. නිරීක්ෂණය වූ අවස්ථා පහත දැක්වේ.

(i) මහ නැගුම සමාගම් වෙත ප්‍රදානය කළ කොන්ත්‍රාත් පිළිබඳ විස්තර වෙනම ලබා දෙන ලෙස ප්‍රාදේශිය කළමනාකරුවන්ට උපදෙස් දී නොතිබුණු අතර ඒ හේතුවෙන් එම සමාගම් වලට ලබා දුන් මුළු කොන්ත්‍රාත් පිළිබඳ වටිනාකම මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයෙන් එක් වරම ලබා ගත නොහැකි විය.

(ii) මහනැගුම සමාගම් වෙත එක් ප්‍රාදේශිය කාර්යාලයකට ලබා දිය හැකි අත්තිකාරම් වල උපරිම අගය කල් තබා තිරණය කර නොතිබුණි.

(iii) සිරිතක් වශයෙන්, අධිකාරිය මගනැගුම ඉමල්ෂන් සමාගමට බිටුමින් සැපයිම වෙනුවෙන් ලංකා ඛනිජ තෙල් නිතිගත සංස්ථාව වෙත කෙලින්ම මුදල් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, සමාගම එම බිටුමින් අධිකාරියේ ඉමල්ෂන් නිෂ්පාදන අවශ්‍යතාවයන් සැපිරීම සඳහාම පාවිච්චි කරනු ලබන බවට තහවුරු නොවිය.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය කාර්ය සාධනය

මහාමාර්ග ඉංජිනේරු ක්ෂේත්‍රයේ විවිධ හැකියාවන් සහිත අද්විතිය ආයතනයක් තත්ත්වයට අධිකාරිය පත් කිරීම සහ සමස්ථ සාන්දික ප්‍රජාවගේ අභිලාෂයන් මුදුන්පත් වන පරිදි ජාතික මහාමාර්ග පද්ධති ජාලය වැඩි දියුණු කිරීම අධිකාරියේ දැක්ම වේ. ජාතියේ ආර්ථික සංවර්ධනය උදෙසා භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය සඳහා පිළිගත් මට්ටමක පරිසර හිතකාමී, සුවපහසු, ආරක්ෂිත හා කාර්යක්ෂම ජාතික මහාමාර්ග පද්ධතියක් පවත්වා ගැනිමට හා මහාමාර්ග ක්ෂේත්‍රය තුළ ප්‍රමුඛ ජාතික ආයතනය බවට පත්වීමේ මෙහෙවර සාක්ෂාත් කිරීමට පාලම් 4,200 ක් ඇතුලත්ව මුළු දුර කිලෝමීටර් 12,020 ක් වූ ජාතික මහාමාර්ග පද්ධතිය පුනරුත්ථාපනය හා සංවර්ධනය කිරීම අධිකාරියේ කාර්ය භාරය වේ. අධිකාරියේ මෙහෙවර සහ 1981 අංක 73 දරණ මාර්ග සංවර්ධන අධිකාරි පනතේ 9(1) ඡේදය යටතේ සඳහන් අරමුණු ඉටු කර ගැනීම සඳහා අධිකාරිය, වාර්ෂිකව රජය විසර්ජනය කරන අරමුදල් හා වෙනත් ආයතන වලින් සපයනු ලබන අරමුදල් වලින් මාර්ග නඩත්තු , පුළුල් කිරීම් , වැඩි දියුණු කිරීමේ කටයුතු සහ වාණිජමය කටයුතු කිහිපයක් කරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන අනුව, ඉකුත් වර්ෂයේ ශුද්ධ ඌනතාවය වූ රු.මිලියන 154.89 සමග සැසදීමේදී අධිකාරියේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 396.82 ක ශුද්ධ ඌනතාවයක් වූ අතර ඉන් පෙනී යන්නේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 241.93 කින් තවදුරටත් පිරිහුණු බවය. විස්තර පහත දැක්වේ.

විස්තරය

| | 2011<br>රු.මිලියන | 2010<br>රු.මිලියන |
|---|---|---|
| **වාණිජමය නොවන කාර්යයන්** | | |
| මාර්ග පුළුල් කිරීමේ හා වැඩි දියුණු කිරීමේ හා නඩත්තු කටයුතු සඳහා රජයේ හා වෙනත් ප්‍රදාන සහ සේවාදායකයන් විසින් මාර්ග නඩත්තු කටයුතු වෙනුවෙන් කළ තැන්පත් වලින් මාරු කළ අරමුදල් | 31,153.45 | 18,459.67 |
| අඩුකළා :- | | |
| ඒ මත වූ පිරිවැය | 29,217.74 | 16,723.86 |

| | | |
|---|---|---|
| වාණිජමය නොවන කාර්යයන් වලින් අතිරික්තය / (ඌනතාවය) | 1,935.71 | 1,735.81 |
| වාණිජමය කාර්යයන් වලින් අතිරික්තය / (ඌනතාවය) | 22.21 | 4.65 |
| ශුද්ධ මෙහෙයුම් අතිරික්තය | 1,957.92 | 1,740.46 |
| වෙනත් ආදායම් | | |
| - පොලී ආදායම | 100.26 | 52.72 |
| - කුලී ගාස්තු හා බදු කුලී | 184.92 | 219.00 |
| - වෙනත් | 286.80 | 243.82 |
| අඩුකළා | | |
| - පරිපාලන වියදම් | 2,649.28 | 2,129.50 |
| - වෙනත් වියදම් | 234.75 | 254.92 |
| ක්ෂය | 609.81 | 577.16 |
| ශුද්ධ අතිරික්තය/ (ඌනතාවය) | (963.94) | (705.58) |
| විලම්භිත ආදායම් මාරු කිරීම් | 567.12 | 550.69 |
| වර්ෂය සඳහා ශුද්ධ ඌනතාවය | (396.82) | (154.89) |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අධිකාරිය පසුගිය වර්ෂ දෙක තුළ වාණිජමය නොවන හා වාණිජමය කටයුතු වලින් අතිරික්තයන් ලබා තිබුණද, එය එම වර්ෂ වල පරිපාලන හා වෙනත් වියදම් ආවරණය කර ගැනිමට ප්‍රමාණවත් වී නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය අඛණ්ඩව පිරිහීමේ නැඹුරුවක් තිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ සමහර වැදගත් ශේෂ ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|
| | **2011** | **2010** |
| | රු,මිලියන | රු,මිලියන |
| ශුද්ධ ජංගම වත්කම් | (4,449.42) | (4,336.41) |
| ජංගම නොවන වගකීම් අඩුකළ මුළු වත්කම් | (2,671.81) | (2,317.94) |
| ප්‍රාග්ධනය හා සංචිත ඉක්ම වූ සමුච්චිත ඌනතාවය | (4,425.98) | (4,029. 16) |

එම නිසා ශේෂ පත්‍ර විෂයයන්ගේ ප්‍රාග්ධන සෝදායාමක් දැක්වුණු අතර මූල්‍ය ප්‍රකාශනයන්ගෙන් සාධාරණ ඉදිරිපත් කිරීමක් කළ හැකි වන පරිදි මූල්‍ය වාර්තාකරණ පද්ධතිය ප්‍රතිව්‍යුහකරණය කිරීම අත්‍යාවශ්‍ය වේ.

## 3.2 භෞතික කාර්ය සාධනය

### 3.2.1 වාණිජමය නොවන කටයුතු මෙහෙයුම්

(අ) මාර්ග පුළුල් කිරීම් හා වැඩි දියුණු කිරීම්

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාර සැලැස්ම අනුව, ඉහත සඳහන් පරමාර්ථය ඉටු කිරීමට පළාත් නවය තුළ ජාතික හා ප්‍රවේශ මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය , ජාතික මහා මාර්ග වල බිඳිගිය පාලම් ප්‍රතිසංස්කරණය, නව විකල්ප මාර්ග ඉදිකිරීම් සහ අනෙකුත් විශේෂ ව්‍යාපෘතීන් සඳහා රු.මිලියන 20,547 ක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, ඉහත කටයුතු සඳහා රු.මිලියන 13,197 ක මුදලක් පමණක් වැය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් තවදුරටත් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ .

(i) ප්‍රගති වාර්තා අනුව, දිස්ත්‍රික් 15 ක පිහිටි ප්‍රාදේශීය කාර්යාල විසින් මහා මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා වූ වාර්ෂික වෙන් කිරීම ඉක්මවා රු.මිලියන 1410.11 ක මුදලක් වැය කර තිබුණු අතර වෙනත් දිස්ත්‍රික් හතක පිහිටි ප්‍රාදේශීය කාර්යාල විසින් එම කාර්යයන් සඳහා වෙන් කළ ප්‍රතිපාදනයන්ගෙන් රු.මිලියන 6,995.95 ක මුදලක් අඩුවෙන් උපයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී කිලිනොච්චිය , මුලතිව් හා පුත්තලම් දිස්ත්‍රික්ක වල කටයුතු සඳහා වෙන් කර තිබුණු රු.මිලියන 300 ක මුළු ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම උපයෝජනය කර නොතිබුණු බව සඳහන් කිරීමට තරම් වැදගත් වේ.

(ii) 2011 වර්ෂය සඳහා වූ වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම යටතේ මාර්ග පුළුල් කිරීම් හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතීන් 667 ක් සිදු කිරීමට හඳුනාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ක්‍රියාකාර සැලැස්මේ ඇතුළත් නොවූ ව්‍යාපෘතීන් 200 ක වැඩ ආරම්භ කර රු.මිලියන 3,327 ක මුදලක් දරමින් අඛණ්ඩව සිදු කර තිබුණි.

(iii) මාර්ග පුළුල් කිරීම් හා වැඩි දියුණු කිරීම් කටයුතු යටතේ සිදු කළ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන වැඩ පිළිබඳ තොරතුරු විගණනයට ලැබී නොතිබුණි.

(iv) තවද, 2011 වර්ෂය සඳහා වූ වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම යටතේ පළාත් 10 ක පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීම් සඳහා වූ ව්‍යාපෘති 68 ක් හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්,

ක්‍රියාකාර සැලැස්මේ ඇතුලත් නොවුණු ව්‍යාපෘති 28 ක වැඩ ඉටුකර තිබුණු අතර ක්‍රියාකාර සැලැස්මේ ඇතුලත් වූ ව්‍යාපෘති 30 ක වැඩ, 2011 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

ඉහත කරුණු සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ කරුණු පැහැදිලි කිරීම් පහත දක්වා ඇත.

"වාර්ෂික ක්‍රියාකාර සැලැස්මේ ඇතුලත් නොවුණු සමහර පළාත්වල මාර්ග සංවර්ධන වැඩ සමහරක් හදිසි අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන ප්‍රමුඛතා පදනම මත භාරගෙන තිබුණු අතර එම පළාත්වල මුලික වෙන් කිරීම් මුදල ඉක්මවා ගොස් තිබුණි. කෙසේ වෙතත්, වර්ෂය අවසානයේදී එම වෙන් කිරීම් ගලපමින් එම පළාත් අතර ප්‍රති වෙන් කිරීම් සිදු කෙරිණි."

(ආ) <u>මාර්ග නඩත්තු කටයුතු</u>

මාර්ග නඩත්තු කටයුතු සඳහා රජයෙන් හා වෙනත් නියෝජිත ආයතන වලින් ලැබුණු අරමුදල් යටතේ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන කාර්යයන් ඉටු කිරීම තුළින් අධිකාරියේ වාර්ෂික ක්‍රියාකාර සැලැස්මෙහි දැක්වුණු ඉලක්ක වලින් බැහැර වීම සාමාන්‍ය ලක්ෂණයක් විය. අධිකාරියෙන් ලබා ගත් තොරතුරු හා 2011 වාර්ෂික ප්‍රගති වාර්තාව අනුව, සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 5,000 ක් වෙන් කර තිබුණු නමුත් මාර්ග සංවර්ධන වැඩ සඳහා වැය කර තිබුණු රු.මිලියන 6,942 ක් වූ මුළු වියදම තුළ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවූ වැඩ ඇතුලත්ව හදිසි වැඩ සඳහා වැයකළ රු.මිලියන 2,631 ක මුදලක්ද ඇතුලත්ව තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් වැඩිදුර නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රගති වාර්තා අනුව, පළාත් අටක පිහිටි ප්‍රාදේශීය කාර්යාල විසින් නිරන්තර මාර්ග නඩත්තු වැඩ සටහන් සඳහා වූ වාර්ෂික වෙන් කිරීම් ඉක්මවා රු.මිලියන 580.82 ක මුදලක් වැයකර තිබුණු අතර බස්නාහිර පළාතේ ප්‍රාදේශීය කාර්යාල එම කාර්යය සඳහා වෙන්කර තිබුණු මුදලින් රු.මිලියන 50.40 ක මුදලක් ඉතිරි කර තිබුණි.

(ii) මාර්ග නඩත්තු වැඩ සටහන යටතේ අඛණ්ඩ වැඩ සඳහා වූ වාර්ෂික ක්‍රියාකාර සැලැස්මෙහි දක්වා තිබුණු ඉලක්ක සපුරා නොතිබුණු අතර ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 121.97 ක මුදලක් උපයෝජනය නොකර පැවතුණි.

(iii) මාර්ග නඩත්තු වැඩ සටහන යටතේ කාලීන නඩත්තු වැඩ සටහන සඳහා වාර්ෂික ක්‍රියාකාර සැලැස්මේ දක්වා තිබුණු ඉලක්ක සපුරා නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 456.16 ක මුදලක් උපයෝජනය නොකර පැවතුණි. කෙසේ වෙතත්, උතුරු පළාතේ ප්‍රාදේශීය කාර්යාල වෙත සමාලෝචිත වර්ෂය සඳහා වූ වෙන් කිරීම් රු.මිලියන 74.19 කින් ඉක්මවා තිබුණි.

(iv) වාර්ෂික ක්‍රියාකාර සැලැස්මේ දක්වා තිබුණු මාර්ග නඩත්තු වැඩ සටහන යටතේ ජලාපවාහන හා ව්‍යුහයන් වැඩිදියුණු කිරීම් වැඩ සඳහා වූ ඉලක්කද සපුරා නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 164.68 ක මුදලක් උපයෝජනය නොකර පැවතුණි. කෙසේ වෙතත්, උතුරු පළාතේ ප්‍රාදේශීය කාර්යාල සඳහා වෙන්කර තිබුණු රු.මිලියන 31 ක මුදල වෙන් කිරීම් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය නොකර පැවතුණි.

උක්ත නිරීක්ෂණ සම්බන්ධයෙන් අධිකාරියේ සභාපතිවරයා විසින් කරන ලද පැහැදිලි කිරීම පහත දැක්වේ.

*" මාර්ග නඩත්තු වියදම් කාලගුණික හා වෙනත් කරුණු මත ඉහළ යයි. ඉහත සඳහන් පළාත් අටෙහි පැවති කාලගුණික තත්ත්වයන් යටතේ මාර්ගවල තත්ත්වය පිරිහීම හේතුවෙන් නිරන්තර හා කාලීන මාර්ග නඩත්තු කටයුතු හා ජලාපවාහන හා ව්‍යුහයන් වැඩි දියුණු කිරීමේ වියදම් ඉහළ ගොස් තිබුණි. බස්නාහිර පළාතේ මාර්ග වැඩි ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කර තිබෙන නිසා මාර්ග නඩත්තු වියදම පහළ ගොස් තිබුණි. අමුද්‍රව්‍ය නොමැති වීම හා අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් වැඩ සැලැස්මේ ඇතුලත් වූ සමහර අඛණ්ඩ නඩත්තු වැඩ භාර ගැනීමට හෝ සම්පූර්ණ කිරීමට නොහැකි විය. "*

(ඇ) <u>සේවාදායක වැඩ</u>

සිරිතක් වශයෙන් ජල සැපයුම , විදුලිය වැනි උපයෝගිතා සේවාවන් වලදී සිදුවන වැඩි දියුණු කිරීම් හේතුවෙන් සිදු වන හානි නිවැරදි කිරීම සඳහා මාර්ග සංවර්ධන වැඩ සිදු කිරීමට විවිධ බාහිර ආයතන අධිකාරිය වෙත මුදල් තැන්පත් කරනු ලැබේ. මෙම තැන්පතු සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වන නමුත් නිසි ලේඛන නොමැති වීම හේතුවෙන් තැන්පතුව සිදු කිරීමට හේතුව, ඇස්තමේන්තු ගත වැඩ වල ස්වභාවය හා පිරිවැය , තැන්පතුව සිදු කළ දිනය හා වැඩ සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය යනාදි විස්තර වහාම ලබා ගැනීමට නොහැකි විය. තවද, අදාල කාර්යයන් කාලීනව සම්පූර්ණ කිරීමට වූ බැඳීම් පිළිබඳ නොසලකා අධිකාරිය විසින් එම තැන්පත් මුදල් වෙනත් කාර්යයන් සඳහා යෙදවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

විස්තර පහත දැක්වේ.

(i) සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා පහකදී සේවා දායක වැඩ තැන්පත් මුදල් වලින් රු.මිලියන 1.402 ක මුදලක් අධිකාරයේ නිලධාරීන් විසින් විදේශ ගමන් සඳහා වැය කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) ඉන්ධන අග්‍රිම නිරවුල් කිරීම සඳහා උතුරු පළාත් අධ්‍යක්ෂ වරයා වෙත රු.මිලියන 5 ක් නිදහස් කර තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළදී තැන්පත් මුදල් වලින් රු.මිලියන 829.2 ක් ප්‍රති මිලදී ගැණුම් වෙළඳ පළ තුළ ආයෝජනය කර තිබුණු අතර ඉන් රු.මිලියන 611.2 ක මුදලක් වර්ෂය අවසානය වන තෙක් ආයෝජන වශයෙන් පැවතුණි.

(iv) තවද, අදාල සේවා දායක වැඩ වලට සම්බන්ධ නොවූ මාර්ග පුළුල් කිරීම් හා වැඩි දියුණු කිරීම් කටයුතු සඳහා රු.මිලියන 117 ක මුදලක් වැය කර තිබුණි.

### 3.2.2 වාණිජමය කටයුතු මෙහෙයුම්

අධිකාරය, ජාතික මාර්ග වල ඉදිකිරීම් හා නඩත්තු සම්බන්ධ වාණිජමය කටයුතු කිහිපයක් සිදු කර තිබුණි. අධිකාරයේ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළදී එම වාණිජමය කටයුතු වල මෙහෙයුම් ප්‍රතිඵල පහත දැක්වේ.

| විස්තරය | අන්තර්සරි කොන්ක්‍රීට් ගල් නිෂ්පාදනය රු.000 | ඇස්පෝල්ට් නිෂ්පාදනය රු.000 | පෙර සවි අංගනයේ මෙහෙයුම් රු.000 | දක්ෂිණ අධිවේගී මාර්ගයේ මෙහෙයුම් රු.000 |
|---|---|---|---|---|
| ආදායම මෙහෙයුම් | 64,364 | 1,752 | 5,495 | 74,940 |
| වියදම් මෙහෙයුම් | 77,346 | 1,488 | 4,579 | 40,924 |
| ලාභය/ (පාඩුව) | (12,982) | 264 | 916 | 34,016 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරිය සමාලෝචිත වර්ෂය තුළ ඇස්පෝල්ට් නිෂ්පාදන පිරියත හතරක් ක්‍රියාත්මක කර තිබුණු අතර විගණනය විසින් සමහර පිරියතවල කර තිබුණු පරීක්ෂාවන් සම්බන්ධ නිරීක්ෂණ සමහරක් පහත දැක්වේ.

(i) ඇස්පෝල්ට් නිෂ්පාදන ක්‍රියාවලිය තුළ ආදාන / ප්‍රතිදාන අනුපාත සඳහා තාක්ෂණික ප්‍රමිතීන් හෝ ආදාන මත සිදුවන සාමාන්‍ය පාඩුව කල් තබා නිශ්චය කර නොතිබුණි. ඒ අනුව, නිෂ්පාදන ක්‍රියාවලියේදී සිදුවන අසාමාන්‍ය අපතය / වැඩිපුර පාවිච්චි කිරීම් විගණනයේදී තීරණය කළ නොහැකි විය. උපයෝජනය කළ ද්‍රව්‍ය සඳහා තාක්ෂණික ප්‍රමිතීන් නොවීම හේතුවෙන් කැරගල පිහිටි පිරියත භෞතික සත්‍යාපනයේදී නිරීක්ෂණය වූ ශේෂය සමඟ රු.2,829,120 ක් වූ පරිශ්‍රයේ තොග පොත් ශේෂය අතර විචලනය සඳහා හේතු නිශ්චය කළ නොහැකි විය. අධිකාරියේ සභාපති වරයාගේ පැහැදිලි කිරීම අනුව නිෂ්පාදන ක්‍රියාවලියේදී ආදාන මත 5% ක පමණ සාමාන්‍ය අපතයන් සිදු වන බව සැලකිය හැකිය. අමුද්‍රව්‍ය ආදාන මැනීමේදී මෙට්‍රික් ටොන් වෙනුවට කියුබික් මීටර යොදා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස කැරගල පිරියතෙහි ද්‍රව්‍යවල වෙනසක් පෙන්වා තිබුණි.

(ii) 2011 ජනවාරි හා පෙබරවාරි මාස වල ඉංගිරිය පිරියතෙහි ලබා ගත් නියැදි මත සිදු කළ තත්ත්ව පරීක්ෂණ මත, ගුණාත්මක තත්ත්වයන්ගේ පිරිහීම් කිහිපයක් වාර්තා වී තිබුණි. කෙසේ වෙතත්, ගුණාත්මක තත්ත්වය පිරිහීම සම්බන්ධ හේතු හඳුනාගෙන නිවැරදි කිරීමේ කාර්යයන් සඳහා පියවර ගෙන නොතිබුණි. පරීක්ෂණ වාර්තා අනුව, පොදුවේ පිළිගත් ප්‍රමිතීන් මත බැඳුම් ස්තරය නිෂ්පාදනයේදී පෙනෙර ප්‍රමාණය හා පෙරමුසු නිෂ්පාදනයේ අපේක්ෂිත ප්‍රමාණයන් එකඟ වී නොතිබුණි.

(iii) ඉංගිරියේ පිහිටි ඇස්පෝල්ට් නිෂ්පාදන අංගනයේ සිදු කළ හදිසි පරීක්ෂාවකදී, මෙට්‍රික් ටොන් 9,353 ක ඇස්පෝල්ට්, ලිඛිත ඉල්ලීම් නොමැතිව විධායක ඉංජිනේරු කාර්යාල වෙත නිකුත් කර තිබුණු බව අනාවරණය විය.

(ආ) වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය 2011 වර්ෂයේදී අන්තර් බද්ධ කොන්ක්‍රීට් ගල් ඇතිරීම සම්බන්ධ ව්‍යාපෘතියක් දියත් කර තිබුණු අතර අන්තර් බද්ධ කොන්ක්‍රීට් ගල් නිෂ්පාදනය ආරම්භ කිරීම සඳහා මහනැගුම ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන යටතේ අධිකාරියේ පළාත් අධ්‍යක්ෂකවරු වෙත කොන්ක්‍රීට් ගල් නිෂ්පාදන යන්ත්‍ර 54 ක් මිලදී ගැනීමට එකතුව රු.මිලියන 57 ක් වූ එකතු අග්‍රිම මුදලක් ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයෙන් ලබා ගත් තොරතුරු අනුව, විධායක ඉංජිනේරු කාර්යාලවල තිබෙන යන්ත්‍ර 54 ක් අතුරින් යන්ත්‍ර 17 ක් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු කොන්ක්‍රිට් ගලක් නිෂ්පාදනය කර නොතිබුණි. අධිකාරියේ සභාපතිවරයා විසින් කළ පැහැදිලි කිරීම් අනුව ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් වැඩ කරනු ලබන විවිධ දේශීය සංවිධාන වලින් ලැබෙන ඉල්ලීම් මත ඇතිරුම් ගල් නිෂ්පාදනය කරනු ලැබේ. එම සංවිධාන වලින් ඉල්ලීම් සිදු නොකිරීම නිසා අදාල යන්ත්‍ර මගින් නිෂ්පාදන කටයුතු සිදු කර නොතිබුණි.

(ii) වෙනත් යන්ත්‍ර 24 ක දෛනික නිෂ්පාදනය කොන්ක්‍රිට් ගල් 400 කට වඩා අඩුවෙන් පැවතුණ බව නිරීක්ෂණය විය. තවද, නිට්ටඹුව හා බණ්ඩාරවෙල පිහිටි විධායක ඉංජිනේරු කාර්යාලවල තිබුණු යන්ත්‍ර දීර්ඝ කාලයක් තුළ අළුත් වැඩියා කිරීමට පියවර නොගෙන අබලි වශයෙන් පැවතුණි. අමුද්‍රව්‍ය හා ශ්‍රමය හිඟතාවයක් හේතුවෙන් තංගල්ල හා ඇඹිලිපිටිය පිහිටි විධායක ඉංජිනේරු කාර්යාලවල පැවති වෙනත් යන්ත්‍ර කිහිපයක් නිශ්කාර්යව හෝ අඩු උපයෝජනයක් සහිතව පැවතුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළදී ගල් 1,418,557 ක් නිෂ්පාදනය කර තිබුණු නමුත් උතුරු පළාත් අධ්‍යක්ෂ කාර්යාලය විසින් කොන්ක්‍රිට් ගල් විකිණීම සම්බන්ධ තොරතුරු අධිකාරියේ ප්‍රධාන කාර්යාලය වෙත එවා නොතිබුණි. තවද, කොළඹ පිහිටි පළාත් අධ්‍යක්ෂ කාර්යාලය සමාලෝචිත වර්ෂය තුළදී නිපදවා තිබුණු කොන්ක්‍රිට් ගල් 61,161 ක් අතුරින් කොන්ක්‍රිට් ගල් 9,500 ක් විකුණා තිබුණි. තවද, මීගමුවේ පිහිටි විධායක ඉංජිනේරු කාර්යාලය සමාලෝචිත වර්ෂය තුළ ගල් 76,593 ක් නිපදවා ඉන් ගල් 44,000 ක් විකුණා තිබුණි. ලැබී තිබුණු තොරතුරු අනුව ග්‍රාමීය මාර්ගවල ගල් ඇතිරීම සඳහා කොන්ත්‍රාත් භාරගත් බොහෝ ග්‍රාම සංවර්ධන සමිති හා ගොවි සමිතිවල මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් සමහර පළාත්වල කොන්ක්‍රිට් ගල් නිෂ්පාදනය හා විකිණීම පිළිබඳ කාර්ය සාධනය අසතුටුදායක මට්ටමක පැවතුණි.

(ඇ) දක්ෂිණ අධිවේගී මාර්ගයේ මෙහෙයුම් 2011 නොවැම්බර් 26 දින ආරම්භ කරන ලද අතර 2011 දෙසැම්බර් 31 දින වන තෙක් දක්ෂිණ අධිවේගී මාර්ගය භාවිතා කරන්නන්ගෙන් රු.මිලියන 74,940 ක මුදලක් එකතු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) දක්ෂිණ අධිවේගී මාර්ගය විවෘත කිරීම වෙනුවෙන් බාහිර පාර්ශවයන්ගෙන් ලැබී තිබුණු රු.මිලියන 7.4 ක් වූ ත්‍යාග මුදල් හා ඒ මත වැය කරන ලද රු.මිලියන 10.171 මුදල, වාණිජ කටයුතු වලින් වූ අතිරික්තයට ඇතුළත් විය.

(ii) දක්ෂිණ අධිවේගී මාර්ගයේ අන්තර් හුවමාරු මධ්‍යස්ථාන වල සේවා නියුක්ත නිලධාරීන් සඳහා මෙහෙයුම් අත්පොත පිළියෙළ කර බෙදා හැර නොතිබුණි. ඒ අනුව, ඔවුන්ගේ රාජකාරි, වගකීම් හා අධිවේගී මාර්ගය භාවිතා කරන්නන් සඳහා වූ ක්‍රියාමාර්ගයක් නිසි පරිදි තීරණය කර නොතිබුණි. අධිවේගී මාර්ගය පාවිච්චි කරන්නන්ගෙන් ගාස්තු අය කිරීම

වාහන වර්ගය අනුව තීරණය කරන අතර අධිවේගි මාර්ගයට ඇතුළුවන වාහන අන්තර් හුවමාරු මධ්‍යස්ථාන වලදී පද්ධතිය තුලින්ම හදුනාගැනීම වෙනුවට මිනිස් ඇසින් හදුනා ගනු ලැබේ. ඒ අනුව, වාහන වර්ගය සාවද්‍ය ලෙස හදුනා ගැනීම මගින් ආදායම් වංචා කිරීම පිළිබඳ මෙහෙයුම් අවදානමක් පවතී. අධිකාරියේ සභාපති වරයාට අනුව, ඇතුළු වීමේ ටිකට් පත වාහන වර්ගය සමඟ සසදන ලෙස පිටවීමේ දොරටුවල සේවා නියුක්ත නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති අතර යම් සාවද්‍ය හදුනාගැනීමක් හෙළිදරව් වූ විට එය ආසන්න පද්ධති කැමරා මගින් හදුනා ගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත වාර්තා කළ යුතුවේ.

### 3.2.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පාලම් ඉදිකිරීමේ නවතම සංකල්පයක් යටතේ සැලසුම් කළ පුස්සැල්ලාව - උලපනේ මාර්ගයේ පිහිටි ආරුක්කු පාලමේ ඉදිකිරීම් රු.මිලියන 42 ඇස්තමේන්තුගත පිරිවැයකට 1999 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. කෙසේ වෙතත්, රු.මිලියන 34.085 ක පිරිවැයක් දැරීමෙන් අනතුරුව මාර්ග ඉදිකිරීම් හා සංවර්ධන සමාගම නමින් වූ අධිකාරියේ උප සමාගම විසින් කරනු ලැබූ ඉදිකිරීමේ කටයුතු 2003 වර්ෂයේදී අතරමග නවතා තිබුණි. පසුව, රු.මිලියන 75.007 ක් වටිනා ඉතිරි වැඩ කොටස් සම්පූර්ණ කිරීමේ කොන්ත්‍රාත්තුව රාජ්‍ය සංවර්ධන සහ ඉදිකිරීමේ සංස්ථාවට ප්‍රදානය කර තිබුණු අතර 2009 ජුනි 18 දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු විය. කෙසේ වෙතත්, රු.මිලියන 54.967 ක මුදලක් ඒ සඳහා වැය කර තිබුණු නමුත් 2011 දෙසැම්බර් 31 දින වනතුරුත් වැඩ සම්පූර්ණ කර නොතිබුණි. තවද, ඉදිකිරීම් පරිශ්‍රයේ තාවකාලිකව ගොඩ නඟා තිබුණු බේලි පාලම සඳහා වියදම් දැරීමට කොන්ත්‍රාත්කරුවන් එකඟ වී තිබුණද 2011 දෙසැම්බර් 31 දින වන තෙක් ඒ සඳහා රු.මිලියන 1.324 ක මුදලක් අධිකාරිය විසින් දරා තිබුණි. ඊට අමතරව, බේලි පාලම සඳහා වානේ බාර් මිලදී ගැනීම සඳහා රු.මිලියන 2.058 ක මුදලක් අධිකාරිය විසින් වැය කර තිබුණි.

(ආ) අඹේපුස්ස - ත්‍රිකුණාමලය මාර්ගයේ දඹුල්ල සිට හබරණ දක්වා වූ කොටස (කි.මී.21.5) ප්‍රතිසංස්කරණ හා වැඩි දියුණු කිරීම් කොන්ත්‍රාත්තුව, මෙම මාර්ගයේ කන්තලේ සිට ත්‍රිකුණාමලය හා අඹේපුස්ස සිට දඹුල්ල කොටස්වල ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව භාරගෙන තිබුණු කොන්ත්‍රාත්කරු වෙත ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීමෙන් තොරව ප්‍රදානය කර තිබුණි.

(ඇ) විශේෂ වැඩ පැවරුමක් වශයෙන් මධ්‍යම පළාත් අධ්‍යක්ෂ කාර්යාලයේ අධීක්ෂණය යටතේ දළදා මාළිගාව පරිශ්‍රය තුළ කොන්ක්‍රීට් ගල් ඇතිරීමේ කාර්යය සමාලෝචිත වර්ෂයේදී සිදු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අදාල කොන්ත්‍රාත්තුව රු.මිලියන 36.83 ක පිරිවැයකට පෞද්ගලික සමාගමකට ප්‍රදානය කර තිබුණු අතර පසුව, විචලතා නියෝග දෙකක් යටතේ මූලික ඇස්තමේන්තුවෙන් 36% ක නියෝජනය වූ රු.මිලියන 28.87 කින් ආරම්භක ඇස්තමේන්තුව ඉහළ දමා තිබුණි.

(ii) තවද, මෙම කාර්යය හදිසි වැඩ සේ සලකා තිබුණු අතර රජයේ ප්‍රසම්පාදන මහ පෙන්වීම් 2006 හි 3.8 ඡේදයට පටහැනිව කොන්ත්‍රාත්කරුවන්ට මිල ගණන් ඉදිරිපත් කිරීමට දින 12 ක කාලයක් පමණක් ලබාදී තිබුණි.

(iii) කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර මාසයක කාලයක් තුළ, 2011 ජූනි 13 දිනට පෙර, අදාළ වැඩ නිම කරන ලෙස කොන්ත්‍රාත්කරුට ආරම්භයේදී උපදෙස් දී තිබුණු නමුත් වැඩ නිම කිරීම සඳහා 2011 නොවැම්බර් 15 දින වන තෙක් මාස පහක් සඳහා කාලය දීර්ඝ කිරීමක් ලබා දී තිබුණි.

(iv) 2011 නොවැම්බර් මාසයේදී සිදු කළ භෞතික පරීක්ෂණයේදී කොන්ක්‍රීට් ගල් ඇතිරීමේ කාර්යයේ අඩුපාඩු නිරීක්ෂණය වී තිබුණු නමුත් අඩුපාඩු සම්බන්ධ වගකීම් කාලය තුළ ඒවා නිවැරදි කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.තවද, අධිකාරිය විසින් කරන ලද තත්ත්ව පරීක්ෂණ වලදී ගල් 50 කින් සමන්විත නියැදියකින් ගල් 10 ක් ගුණාත්මක තත්තත්වයේ නොවුණු බව අනාවරණය වී තිබුණු අතර ඉන් පෙනී යන්නේ කොන්ක්‍රීට් ගල් නිෂ්පාදනයේදී ගුණාත්මක තත්ත්වයෙන් බාල අමුද්‍රව්‍ය යොදා ගෙන තිබුණු බවය.

(ඈ) මධ්‍යම පළාත් අධ්‍යක්ෂ කාර්යාලය, මහනුවර නගරයේ මාර්ග තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා "සාක් සමුළු" වැඩසටහන නමින් මාර්ග සංවර්ධන ව්‍යාපාතියක් ක්‍රියාත්මක කර තිබුණි.

(i) ඉටු කරන ලද සත්‍ය වැඩ ප්‍රමාණය සමඟ සසඳන විට මාර්ග වැඩි දියුණු කිරීමේ වැඩ සඳහා අධි - ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි. 2.5% සිට 37% පරාසයක් තුළ විෂයයන්ගේ එවැනි විචලතාවයන් තිබීමෙන් පෙනියන්නේ ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී නිසි භෞතික මිනුම් ගෙන නොතිබුණු බවයි. අධිකාරියේ සභාපති වරයාගේ පැහැදිලි කිරීම අනුව, සාක් සමුළුවට අවශ්‍ය පහසුකම් සැපයීම අරමුණු කරගෙන මහනුවර නගර සංවර්ධන ව්‍යාපාතිය යටතේ නගරයේ සියළුම මාර්ග සඳහා ඇස්පෝල්ට් කොන්ක්‍රීට් ඇතිරීමට බලාපොරොත්තුවෙන් මූලික ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි. කෙසේවෙතත්, සමුළුව පැවැත්වීම පසුව කොළඹ නගරයට මාරු කරන ලද අතර වැඩවල විෂය පථය හා ස්වභාවය අඩු කරන ලදුව ජලපවාහන වැඩ හා අළුත්වැඩියා කටයුතු පමණක් ඉටුකර තිබුණි.

(ii) අධි ඇස්තමේන්තු මත ඇති වූ ඉතිරි කිරීම්, විචලතා නියෝග කිහිපයක් අනුමත කිරීම තුලින් කොන්ත්‍රාත්කරු ලවා කාර්යාල උපකරණ, පරිගණක යනාදිය ප්‍රසම්පාදනය කිරීමට හා කාර්ය මණ්ඩල නිල නිවාස අළුත් වැඩියා කිරීමට යොදා ගෙන තිබුණි.

(ඉ) අධිවේගී මාර්ග කළමනාකරණය ඒකකයේ පරිහරණය සඳහා ස්ථාවර වත්කම් ප්‍රසම්පාදනය කිරීමට අධිකාරිය සමාලෝචිත වර්ෂය තුළදී පියවර ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ආරම්භක අදියරේදී ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. ඒ අනුව මිලදී ගැනීමට අවශ්‍ය වූ විෂයයන් නිසි ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ii) ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා පත්කර තිබුණු ටෙන්ඩර් මණ්ඩලය, අධිවේගී මාර්ග කළමනාකරණ ඒකකයට අනුයුක්ත නිලධාරීන්ගෙන් පමණක් සමන්විත විය. තවද, රු.මිලියන 2.905 ක පිරිවැයකට මිලදී ගෙන තිබුණු වානේ සේප්පු 50 ක් සම්බන්ධ ටෙන්ඩර් ලියකියවිලි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(iii) සාප්පු ක්‍රමය හරහා අත්‍යාවශ්‍ය පදනම මත අන්තර් හුවමාරු මධ්‍යස්ථානවල මෙහෙයුම් සඳහා භාවිතා කිරීමට රු.මිලියන 6.577 පිරිවැයකට විවිධ විෂයයන් මිලදී ගෙන තිබුණි.කෙසේ වෙතත්, අදාල සැපයුම්කරුවන් එම වත්කම් සපයා තිබුනේ දින 20 සිට 166 දක්වා වූ කාල පරාසයක සැලකිය යුතු ප්‍රමාදයන් මතය.

(ඊ) ගම්පහ විධායක ඉංජිනේරු කාර්යාලය, එම කාර්යාලය සඳහා කම්කරුවන් 208 දෙනෙක් අනුයුක්ත කර තිබියදීත් මාර්ග සංවර්ධන කටයුතු සහ කැරගල පිහිටි ඇස්පෝල්ට් පිරියතෙහි වැඩ සඳහා අමතර කම්කරුවන් 15 දෙනෙකු පිටතින් ලබා ගැනීමේ පදනම මත සේවයේ යොදවා ගෙන තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව සඳහා මිළ ගණන් ඉදිරිපත් කළ සේවාසපයන්නන් තිදෙනා අතුරින් තෝරා ගත් සැපයුම්කරු ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෙකු වශයෙන් නොව ශ්‍රමිකයන් සපයන්නෙකු වශයෙන් ලියාපදිංචි වී තිබුණි. තවද, මහා මාර්ග ප්‍රමිත අනුප්‍රමාණ සමඟ සසඳන විට එක් කම්කරුවෙකු සඳහා ඉදිරිපත් කර තිබුණු අනුප්‍රමාණ නුපුහුණු ශ්‍රමිකයෙකු සඳහා 43% කින් හා පුහුණු ශ්‍රමිකයෙකු සඳහා 84% කින් වැඩියෙන් එකඟ වී තිබුණි.

(උ) සිරිතක් වශයෙන්, අධිකාරිය පිටස්තර පාර්ශවයන්ගෙන් වාහන කුලියට ලබාගනු ලබයි. අධිකාරියේ කටයුතු සඳහා පිටස්තර පාර්ශවයන්ගෙන් වාහන ලබාගැනීමේ ඵලදායිතාවය තීරණය කිරීම සම්බන්ධයෙන් වූ විගණනයේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) වාහන කුලියට ලබා ගැනිම පිළිබඳ ඉදිරිපත් කළ මිල ගණන් ඇගයීම සඳහා අධිකාරිය විසින් පත්කල තාක්ෂණික ඇගයීම් කමිටුව රියදුරු හා ඉන්ධන සැපයීමෙන් තොරව වාහන සපයන්නන් සඳහා මහා මාර්ග ප්‍රමිත අනුප්‍රමාණයන්ට 10% පොදු කාර්ය හා 20% ලාභ තිරුවක් එකතු කරමින් උපරිම මිළක් ගණනය කිරීම අනුමත කර තිබුණි. කෙසේ වෙතත්, වාහන කුලියට සැපයිම සම්බන්ධයෙන් උපරිම අනුප්‍රමාණ තීරණය කිරීමේදී එවැනි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ii) කොන්ත්‍රාත්කරු සපයන ලද වාහන වර්ගය වෙනස් කිරීම හා රියදුරු සහ ඉන්ධන සැපයීමේ පදනම හෝ රියදුරු හා ඉන්ධන නොමැතිව වාහන සැපයීමේ පදනම වෙනස් කිරීම හා ඒ මත ගාස්තු අය කළ අවස්ථා කිහිපයක් නිරීක්ෂණය විය.

### 3.2.4 <u>මතභේදයට තුඩුදුන් කරුණු</u>

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) එවකට මහා මාර්ග දෙපාර්තමේන්තුවෙන් මාරු කරන ලදුව, අධිකාරියට අයත්ව තිබූ නාරාහේන්පිට පිහිටි ඉඩමක් 2009 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරියට අයත්ව තිබුණු ඩෙන්සිල් කොබ්බැකඩුව මාවතේ පිහිටි ඉඩමකට බදු පදනම මත හුවමාරු කර තිබුණි. එමගින් අත් කර ගත් ඉඩම ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකාය ආරක්ෂක සභාව විසින් පරිහරණය කර තිබුණු අතර 2009 මාර්තු 25 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ලද අනුමැතිය යටතේ 2010 හා 2011 වර්ෂවල අවස්ථා තුනකදී රු.මිලියන 50 ක් එම සභාව වෙත ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ගණුදෙනුව සඳහා එළඹීමට පෙර ඉඩම් තක්සේරු නොකිරීම හේතුවෙන් එම ගෙවීම් තීරණය කිරීමේ පදනම විගණනයේදී නිශ්චය කළ නොහැකි විය.

(ආ) අඹේපුස්ස - ත්‍රිකුණාමලය මාර්ගයේ දඹුල්ල සිට හබරණ කොටසේ (කි.මී. 21.5 ) පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීම් සිදු කිරීම සඳහා 9 % වාර්ෂික ස්ථාවර පොලියකට රු.මිලියන 1,534 ක ණය පහසුකමක් වාණිජ බැංකුවකින් අධිකාරිය ලබා ගෙන තිබුණු අතර මේ සඳහා වර්ෂ දෙකක සහන කාල සීමාවකින් පසු ගෙවිය යුතු ණය වාරික හිලව් කිරීම සඳහා අධිකාරියේ මූල්‍ය තත්ත්වය හා අනාගත මූල්‍ය ප්‍රවාහයන් තක්සේරු කර නොතිබුණි. තවද, රු.මිලියන 1,534 ක්වූ මුළු ණය මුදලින්, වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල වූ රු.මිලියන 274 ක් ද ඇතුලත්ව 2011 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 453.7 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

3.2.5 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) පිළිවෙළින් මාර්ග හා පදික මං තිරු තත්ත්ව සමීක්ෂණය සඳහා මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය විසින් රු.මිලියන 92.689 ක් වටිනා බහු ක්‍රියාකාරී ජාලගත සමීක්ෂණ වාහනයක් හා රු.මිලියන 30.128 ක් වටිනා බර මිනුම් ඩිප්ලෙක්ටෝමීටරයක් ප්‍රසම්පාදනය කර අධිකාරිය වෙත 2010 වර්ෂයේදී භාර දී තිබුණි. ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය තුළදී කි.මී. 3932.7 ක් දුර මාර්ග හා කි.මී.1,452.20 ක් දුර පදික මං තිරු සමීක්ෂණය කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළදී සමීක්ෂණ කිරීමට බලාපොරොත්තු වූ මුළු දුර ප්‍රමාණයෙන් 54% ක් පමණක් සම්පූර්ණ කර තිබුණු බව අධිකාරියේ ප්‍රගති වාර්තාවල දක්වා තිබුණි.

(ආ) බේස්ලයින් මාවතේ සිදු කරන ලද සංවර්ධන වැඩ හේතුවෙන් අවතැන් වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම සඳහා 1999 වර්ෂයේදී අක්කර 11 රූඩ් 08 හා පර්චස් 38.3 කින් යුත් ඉඩමක් අත්තිඩිය ප්‍රදේශයෙන් අත්පත් කරගෙන තිබුණු අතර එය අදාල අරමුණ සඳහා උපයෝජනය කර ගෙන නොතිබුණි. අධිකාරිය අවස්ථා හතකදී රු.මිලියන 123 ක් ගෙවා තිබුණු අතර ඒ අතුරින් රු.මිලියන 28 ක් ජපන් ආධාර ව්‍යාපෘතියක් විසින් මූල්‍යනය කර තිබුණි. තවද, 2005 වර්ෂයේ සිට අක්කර 2 ක ප්‍රමාණයක් සුනාමියෙන් පීඩාවට පත් වූ පවුල් නැවත පදිංචි කිරීම සඳහා ඉඩ දී තිබුණු අතර, අක්කර 03 රූඩ් 01 පර්චස් 26.7 ක් වූ වෙනත් කොටසක් 2007 සැප්තැම්බර් 06 දින සිට පෞද්ගලික සමාගමකට කුලියට දී තිබුණි. තවද, සමාගම විසින් එදින සිට රු.150,000 ක මාසික කුලී මුදලක් පමණක් ගෙවා තිබුණු නමුත් 2008 වර්ෂයේදී මෙම මුළු ඉඩමේ කුලී වටිනාකම රු.500,000 ක් ලෙස තීරණය කර තිබුණි.

(ඇ) අදාල මාර්ගවල ධාවනය වන අධි බරැති ට්‍රක් රථවල බර මැනීමට තැන්නේකුඹුර ඩිපෝවේ රු.654,679 ක් වටිනා කිරුම් තරාදියක් ස්ථාපිත කර තිබුණි. කෙසේ වෙතත්, රියදුරන්ගේ විරෝධතාවයන් හේතුවෙන් එහි වැඩ ආරම්භ කළ 2011 මැයි 20 දින සිටම මිනුම් කටයුතු අඩාල වී තිබුණු අතර කිරුම් තරාදිය එදින සිට නිශ්කාර්යව පැවතුණි. අදාල කිරුම් තරාදිය පටු ස්ථානයක ස්ථාපිත කර තිබුණු බව නිරීක්ෂණය වූ අතර එම ස්ථානයේ නිසි ආරක්ෂාවන් නොවිය. 2010 හා 2011 වර්ෂ සඳහා කිරුම් තරාදිය වෙනුවෙන් බලපත්‍ර ලබා ගැනීම සඳහා රු.153,753 ක් වැය කර තිබුණි.

(ඇ) 2011 අගෝස්තු මාසයේදී රු.මිලියන 1.4 ක පිරිවැයකට මිලදී ගෙන තිබුණු කාසි ගණනය කිරීමේ යන්ත්‍ර 20 ක් අධිවේගී මාර්ග කළමනාකරණ ඒකකයේ ගබඩා පරිශ්‍රය තුළ මිලදී ගත් දින සිට නිශ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය. අධිවේගී මාර්ග කළමනාකරණ ඒකකයේ නිලධාරීන් විසින් කළ පැහැදිලි කිරීම් අනුව අධිවේගී මාර්ගය පරිහරණය කරන්නන් සඳහා අවම

ගාස්තුව රු.50 සිට තිරණය කරන ලද අතර එක් අන්තර් හුවමාරුවක් සඳහා ගාස්තුව රු.100 බැගින් වැඩි කර තිබුණි. ඒ හේතුවෙන් අධිවේගී මාර්ග මෙහෙයුම් සඳහා කාසි ගණනය කිරීමේ යන්ත්‍ර අවශ්‍ය නොවිය.

(ඉ) 2010 මාර්තු 23 දින චීන ආධාර ව්‍යාපෘතියක් වෙතින් ලැබී තිබුණු මාර්ගවල කුඩා ගල් ඇතිරීමේ යන්ත්‍ර 11 ක් අදාල කාර්යයන් සඳහා උපයෝජනය නොකර අධිකාරියේ මොරටුව අඟුලානේ පරිශ්‍රය තුළ තිබුණි.

(ඊ) යන්ත්‍ර ක්‍රියාකරුවන් බඳවා ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් 2010 දෙසැම්බර් 11 දින මහනැගුම සමාගම් වෙතින් ලැබී තිබුණු ලියවන පට්ටල් යන්ත්‍ර 12 ක් එදින සිට නිශ්කාර්යව පැවතුණි.

(උ) වාර්ෂිකව ඉතා සුළු තොග විෂයයන් ප්‍රමාණයක් නිකුත්වීම හේතුවෙන් ගබඩා පරිශ්‍රයේ තිබුණු රු.මිලියන 32.248 වටිනා තොග සෙමින් චලනය වන තොග වශයෙන් නිරීක්ෂණය විය. වංචාකාරී කටයුතු හේතුවෙන් අස්ථානගත වූ රු.329,964 ක් වටිනා තොග විෂයයන්ද ඊට ඇතුලත්ව තිබුණු අතර අදාල කරුණු පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

### 3.2.6 <u>මානව සම්පත් කළමනාකරණය</u>

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවක බලකාය බඳවා ගැනීම, අනුයුක්ත කිරීම, සංවර්ධනය හා වැටුප් ගෙවීම ඵලදායි ලෙස සිදු කිරීම සඳහා අධිකාරිය නිසි මානව සම්පත් සැලැස්මක් පිලියෙළ කර ක්‍රියාත්මක කර නොතිබුණි. 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරණ රාජ්‍ය ව්‍යවසායන්හි යහ පාලනය සඳහා වූ මහ පෙන්වීම් චක්‍රලේඛයේ 9.3.1 ඡේදය ප්‍රකාරව රාජ්‍ය ආයතනවල බඳවා ගැනීමේ හා උසස්කිරීමේ ක්‍රම වේදය, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ එකඟත්වය ඇතිව රේඛීය අමාත්‍යාංශය හා ආයතනයේ පාලක මණ්ඩලය විසින් අනුමත කළ යුතුය. කෙසේ වෙතත්, අධිකාරියේ බඳවා ගැනීම් හා උසස් කිරීමේ ක්‍රම වේදය සඳහා එකඟත්වය 2011 දෙසැම්බර් 31 වන විටත් ලබා ගෙන නොතිබුණි.

(ආ) අධිකාරියේ කාර්ය බලකාය, සේවකයින් 8000 ඉක්මවා තිබෙන අතර අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට එහි කාර්ය බලකායේ ශක්තිය විශාල පිටුබලයක් වී තිබෙන නමුත් මානව සම්පත් කලමනාකරණ කටයුතු සඳහා අධිකාරිය වෙනම අංශයක් පිහිටුවා නොතිබුණි. අධිකාරියේ සංවිධාන සටහන අනුව, අධිකාරියේ මානව සම්පත් සංවර්ධන කටයුතු පරිපාලන අධ්‍යක්ෂකගේ අධීක්ෂණය යටතේ පරිපාලන හා මුදල් අංශය යටතේ ඉටු කරනු ලැබේ.

(ඉ) අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - මුදල් හා පරිපාලන, වත්කම් කළමනාකරණය පිළිබඳ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් සහ කාර්ය සාධන විගණනය, ග්‍රාමීය පාලම් , පුහුණු , ප්‍රසම්පාදන යනාදි ක්ෂේත්‍රවල මධ්‍යම කළමනාකරණ මට්ටමේ වෙනත් නියෝජ්‍ය අධ්‍යක්ෂ යන ප්‍රධාන තනතුරු 2011 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ දෙකකට වැඩි කාලයක් පුරප්පාඩුව පැවතුණි.

(ඊ) රාජ්‍ය ව්‍යවසායන්හි යහ පාලනය සඳහා මහ පෙන්වීම් වල 8.3.9 ජේදයට අනුගතව නිකුත් කර තිබුණු 2003 ජුනි 02 දිනැති අංක පිඊඩී / 12 දරණ චක්‍රලේඛය හා 2004 ජනවාරි 08 දිනැති පිඊඩී 21 දරණ චක්‍රලේඛය අනුව, රාජ්‍ය ව්‍යවසායන්, තම සම්පත් රේඛීය අමාත්‍යාංශයට හෝ වෙනත් ආයතන වෙත පරිහරණය කිරීමට ඉඩ නොදිය යුතුය. කෙසේ වෙතත්, අධිකාරිය මෙම විධිවිධානයට අනුකූල වී නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ පහත දැක්වේ.

(i) ලැබී තිබුණු තොරතුරු අනුව, 2011 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ සේවකයින් 72 ක් රේඛීය අමාත්‍යාංශයට හා වෙනත් බාහිර ආයතන වෙත නිදහස් කර තිබුණි. ඒ අතුරින් සේවකයින් 45 දෙනෙකු සඳහා එකතුව රු.මිලියන 25.892 ක් වූ වැටුප් හා අතිකාල වියදම්, අදාල ආයතන වලින් ප්‍රතිපූර්ණය කර ගැනීමට පියවර නොගෙන අධිකාරියේ ආදායම එරෙහිව අය කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ වෙනත් සේවකයින් 27 දෙනෙකු වෙත ගෙවා තිබුණු එකතුව රු.මිලියන 3.618 ක අතිකාල වියදම් අය කිරීමට පියවර නොගෙන ඔවුන්ගේ වැටුප් පමණක් අය කරගෙන තිබුණි.

(ii) තවද, අධිකාරියේ කටයුතු වලට සෘජු සම්බන්ධයක් නොතිබුණු හා බාහිර ආයතන වෙත නිදහස් කළ සේවකයින් වෙත 2011 පෙබරවාරි 11 දිනැති අංක 2995 / සිවල්/ 14 දරණ මාර්ග සංවර්ධන අධිකාරියේ පරිපාලන චක්‍රලේඛය මගින් තීරණය කරන ලද අතිකාල වැඩ සඳහා උපරිම පැය ප්‍රමාණය ඉක්මවා රු.මිලියන 1.520 ක අතිකාල මුදලක් ගෙවා තිබුණි.

(iii) ඊට අමතරව, 2010 වර්ෂයේදී අධිකාරියේ මුරකරුවන් 10 ක් හා රියදුරකු එවකට මහජන සම්බන්ධතා සහ මහජන කටයුතු අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබුණි. තවද, ඔවුන් සඳහා වැටුප් හා අතිකාල වශයෙන් රු.මිලියන 2.879 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. කෙසේ වෙතත්, අදාල සේවකයින්ගේ වර්තමාන සේවා ස්ථානය අධිකාරිය විසින් දැනගෙන නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය කාර්යාල සමහරක් අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා පුද්ගලයින් සේවා නියුක්ත කර තිබෙන බව නිරීක්ෂණය විය. අධිකාරියේ ගම්පහ සහ මහනුවර දිස්ත්‍රික්ක වල පිහිටි කාර්යාල තුනක් විසින් පුද්ගලයින් 231 ක් සේවා නියුක්ත කර තිබුණු බව හදිසි පරීක්ෂණ වලදී හෙළි දරව් විය.

### 3.2.7 වාහන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) යාන්ත්‍රික අංශයේ වාර්තා අනුව, 2011 දෙසැම්බර් 31 දිනට වාහන 403 ක් අධිකාරිය සතුව පැවති අතර එම වාහන අධිකාරිය විවිධ ආයතන / ව්‍යාපෘති හා අධිකාරියේ විවිධ අංශ වලට අනුයුක්ත කර තිබුණි. කෙසේ වෙතත්, 2011 වර්ෂය සඳහා අධිකාරිය විසින් වාහන 895 ක් රක්ෂණය කර තිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට බාහිර පාර්ශවයන් වෙත වාහන 20 ක් භාරදී තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, යාන්ත්‍රික අංශයේ එම වාහන භාර දුන් දිනයන් පිළිබඳ විස්තර නොවිය. 2011 වර්ෂය සඳහා එම වාහන බලපත් අළුත් කිරීම හා රක්ෂණය සඳහා රු.719,501 ක් ගෙවා තිබුණි.

(ඇ) ඉහත සඳහන් කළ පරිදි බාහිර පාර්ශවයන් වෙත භාරදී තිබුණු වාහන පහක් අනතුරුවලට භාජනය වී තිබුණු බව නිරීක්ෂණය විය. ඒ පිළිබඳව වූ සමස්ත පාඩුව පිළිබඳ විස්තර පහත දැක්වේ.

(i) අනතුරුවලට වගකිවයුතු පාර්ශව පිළිබඳ තොරතුරු නොමැති වීම හේතුවෙන් වාහන හතරකට සිදු වූ හානි පිළිබඳ රක්ෂණ වන්දි අයදුම් කිරීමට නොහැකි වී තිබුණි.

(ii) 2008 අප්‍රේල් මාසයේදී ජනාධිපති ලේකම් කාර්යාලය වෙත භාර දී තිබුණු මෝටර් වාහනයක් 2008 අප්‍රේල් 20 දින මඩකලපුව ප්‍රදේශයේදී අනතුරකට භාජනය වී තිබුණි. කෙසේ වෙතත්, අළුත් වැඩියා කිරීමට හෝ වගකිව යුතු පාර්ශවයන්ගෙන් හානිය අය කර ගැනීමට 2011 දෙසැම්බර් 31 දින වනතුරුත් පියවර ගෙන නොතිබුණි.

(iii) මඩකලපුව පොලිස් ස්ථානය විසින් නිකුත් කළ 2010 පෙබරවාරි 03 දිනැති ලිපිය අනුව, 2008 අප්‍රේල් මාසයේදී ජනාධිපති ලේකම් කාර්යාලය වෙත භාරදී තිබුණු වෙනත් වාහනයක් අයථා පරිහරණය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවට පත් වී තිබුණි. එම වාහනය 2010 දෙසැම්බර් 17 දින සිට අඟුලාන පිහිටි වැඩ බිම පරිශ්‍රය තුළ ගාල් කර තිබෙන බව නිරීක්ෂණය විය. වාහනය අයථා පරිහරණයට යොදා ගත් පාර්ශවයන්ට එරෙහිව පියවර ගැනීමට හැකි වනු පිණිස ඔවුන් හඳුනා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඉ) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කළ 2011 සැප්තැම්බර් 09 දිනැති ලිපිය මඟින් උපදෙස් දී තිබුණු පරිදි මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ හා ව්‍යාපෘති කළමනාකරණ ඒකකවල සියළුම වාහන 2011 සැප්තැම්බර් 14 හා 15 දිනවල භෞතික සත්‍යාපනය සඳහා ඉදිරිපත් කළ යුතු විය. කෙසේ වෙතත්, වාහන 169 ක් භෞතික සත්‍යාපනය සඳහා ඉදිරිපත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව, සත්‍යාපන කාර්යයේ නිවැරදි බව හා සම්පූර්ණත්වය පිළිබඳව විගණනයේදී තහවුරු කිරීමට නොහැකි විය.

## 3.2.8 අයවැය ගත පාලනය

අධිකාරිය, ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තරාත්මක අයවැය ලේඛනයක් ඉදිරිපත් නොකළ බව නිරීක්ෂණය වූ අතර 2011 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන විෂයයන් සම්බන්ධව ශේෂපත්‍රයේ දැක්වූ රු.මිලියන 1,597 ක මුළු මුදල හා රු.මිලියන 1,504 ක් වූ අයවැය ගත වෙන් කිරීම් අතර වෙනස් වීම් සම්බන්ධ හේතු පරීක්ෂා කිරීමට නොහැකි විය. තවද, අයවැය ලේඛනයේ පෙන්වා තිබුණු පාංශු පරීක්ෂාව සඳහා ගාස්තු, අධීක්ෂණ ගාස්තු හා දඩ මුදල් යනාදි ආදායම් ප්‍රභවයන් සහ ප්‍රසාද හා දිරිගැන්වීම් දීමනා හා වාහන සැපයීම් යනාදි පරිපාලන වියදම් සහ සත්‍ය ශේෂයන් අතර විශාල වෙනස්වීම් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝජනය කර නොතිබුණි.

## 4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනයන්ගේ අඩුපාඩු මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය යටතේ නිකුත් කළ මගේ සවිස්තරාත්මක වාර්තාවෙන් අධිකාරියේ අවධානය පිණිස යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) මාර්ග නඩත්තු හා සේවා දායක වැඩ
(ආ) සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනු හෙළිදරව් කිරීම
(ඇ) ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණය
(ඈ) වාහන උපයෝජනය
(ඉ) වත්කම් කළමනාකරණය
(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති

# මාර්ග සංවර්ධන අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)-(සි) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

| | | | |
|---|---|---|---|
| **2.2** | | **මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම්** | |
| | **2.2.1** | **ගිණුම්කරන අඩුපාඩු** | |
| | | පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| | **(අ)** | මහා භාණ්ඩාගාරය , 2011 වර්ෂය තුලදි අධිවේගී මාර්ග හා මහා මාර්ග සංවර්ධනය මාර්ග පුළුල් කිරිම හා වැඩි දියුණු කිරිම, පාලම් හා ගුවන් පාලම් ඉදිකිරිම සහ ආයතනික සහයෝගිතාවය යනාදි වියදම් දැරීමට අධිකාරිය වෙත රු.මිලියන 26,734.4ක මුදලක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත් , අධිකාරිය රජයේ අරමුදල් වෙන් කිරීමේ හේතුව සහ ඒවායේ උපයෝජනය , සාධාරණ ලෙස දැක්වෙන පරිදි සහ වෙන් කළ අරමුදල් මත මූල්‍ය පාලනය වැඩි දියුණු කිරිමට හැකිවන පරිදි මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරිම් කර නොතිබුණි. | මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන අනාගතයේදි සටහනක් වශයෙන් ගිණුම්වල අනාවරණය කිරිමට පියවර ගනු ලැබේ. |
| | **(ආ)** | අධිකාරිය විසින් අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව , සියළු මාර්ග නඩත්තු , පුළුල් කිරිම් හා වැඩි දියුණු කිරිමේ පිරිවැය අදාල වර්ෂයේ ආදායමට එරෙහිව ලියා හරිනු ලැබේ. කෙසේ වෙතත් , සමාලෝචිත වර්ෂය තුලදි වාණිජ බැංකුවකින් ලබාගත් රු.මිලියන 431ක ණය මුදලින් වැයකර තිබුණු රු.මිලියන 179.7 ක් වු මාර්ග වැඩිදියුණු කිරිමේ පිරිවැය , ශේෂ පත්‍රයේ ජංගම නොවන වියදම් යටතේ දක්වා තිබුණි. | දේශිය බැකු මගින් ලබාගන්නා ලද ණය සදහා , දරන ලද මාර්ග වැඩි දියුණු කිරීමේ හා පුළුල් කිරීමේ වියදම්වලට අදාලව කරනලද වැඩ ප්‍රමාණයේ ආදායම (Value of Work Done) සටහන් අංක 24 A මගින් ආදායම් ප්‍රකාශනයේ පෙන්නුම් කර ඇත. මගහැරීමකින් එම අගයන් දෙක ආදායම් ප්‍රකාශනයේ වැඩ වල පිරිවැයට (Cost of Work Done) හා වැඩවල ආදායමට (Value of Work Done) එකතු කර නොමැත.<br>එලෙසම දේශිය බැංකු මගින් ලබාගන්නා ලද ණය වලින් කරන ලද මාර්ග වැඩිදියුණු කිරීමේ හා පුළුල් කිරීමේ වැඩවල අගය , ශේෂ පත්‍රයේ ජංගම නොවන වත්කම්හි පෙන්නුම් කරඇත. එය ශේෂ පත්‍රයේ මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු අගයක් ලෙස ජංගම වත්කම්හි ඇතුලත් කල යුතුබවද දන්වමි. මෙය නියමාකාරයෙන් අනාගතයේදි මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරන බව දන්වමි. |
| | **(ඇ)** | මධ්‍යම , උතුරු මැද සහ නැඟෙනහිර පළාත්වල මාර්ග 16ක පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීමට ශ්‍රී ලංකා රජය සහ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය සමග එළඹි හදිසි ස්වභාවික ආපදා පුනරුත්ථාපන ව්‍යාපෘතිය සඳහා වු එස්එල්-පි 103 ණය ගිවිසුම යටතේ අධිකාරිය වෙත රු.මිලියන 12.397ක මුදලක් ලැබී තිබුණි. කෙසේ වෙතත් , විදේශ ආධාර ගිණුම් තැබීම පිළිගත් ප්‍රතිපත්තිවලට පටහැනිව , ලැබී තිබුණු ආධාර හා ඒ මත වු වියදම් අධිකාරියේ ගිණුම්වලට ගෙන | මාර්ග සංවර්ධන අධිකාරියට වෙනමම වැඩ අයිතමයක් මෙම ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයෙන් ලැබෙන මුදල් සඳහා දි ඇත. එලෙසම අරමුදල් සෘජුවම මහා භාණ්ඩාගාරයෙන් මෙම වැඩ කර ගෙන යාම සඳහා ලැබේ. ඒනිසා දරන ලද වියදම් අධිකාරියේ ගිණුම්වල එකම ක්‍රමවේදයක් අනුව ගිණුම්ගත කිරීමට පියවර ගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| | | තිබුණි. මෙම විදේශ ආධාර ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වෙනම මූල්‍ය ප්‍රකාශන මහා භාණ්ඩාගාරය විසින් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුබව නිරීක්ෂණය විය. | |
| | **(ඈ)** | 2006 සිට 2010 වර්ෂය දක්වා විවිධ මාර්ග නඩත්තු වැඩ සඳහා බාහිර පුද්ගලයන් ගෙන්/ආයතන විසින් තැන්පත් කර තිබුණු එකතුව රු.මිලියන 23.033ක මුදලක් සමාලෝචිත වර්ෂය තුලදී අධිකාරියේ ආදායමට මාරුකර තිබුණි. සිරිතක් වශයෙන් අධිකාරිය විසින් මෙම කටයුතු විශේෂ කාර්ය පැවරුම් වශයෙන් හඳුනා නොගන්නා අතර කාලීන නඩත්තු වැඩසටහන් යටතේ ඉටුකරනු ලබයි. ඒ අනුව , එම සේවාදායකයින් කරන ලද තැන්පතු යටතේ කරනු ලැබූ වැඩ වටිනාකම තීරණය කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ආදායමට එරෙහිව ලියාහැර තිබුණි. | එම අගයන් සමන්විත වන්නේ සුළු මාර්ග පිළිසකර කිරීමේ ගාස්තු හා සුපරීක්ෂණ ගාස්තු සඳහා ලද මුදල් වලිනි. ඒවා වැරදීමකින් ගනුදෙනුකරුවන්ගේ තැන්පත් ගිණුමට බැර කර ඇත. මෙම වැඩ සඳහා සත්‍ය වශයෙන් දරන ලද වියදම ප්‍රමාණාත්මක නොවන බැවින් එය මාගී නඩත්තු වියදම් සඳහා අය කරන ලදී. මෙම වැඩ නිමකර ඇති අතර ඒ සඳහා දරන ලද වියදම වෙනමම හඳුනාගත නොහැකි නිසා අදාල ආදායම , මෙම වසරේ ආදායමක් ලෙස ගිණුම් නිවැරදි කිරීම සඳහා මාරු කරන ලදී. |
| | **(ඉ)** | අධිකාරියට අයත් ඉඩම්වල අගය මූල්‍ය ප්‍රකාශණවල පෙන්වීම සඳහා නියමිත ගිණුම්කරණ පරිචයන් අනුගමනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය.විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පහත විස්තර කෙරේ. | |
| | | **(i)** 2009 වර්ෂයේදී බාහිර පාර්ශවයන් වෙත අයිතිකාරත්වය මාරු කර තිබුණු නමුත් , නාරාහේන්පිට ඉඩමේ වටිනාකම වූ රු.මිලියන 28.839ක මුදල , 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ තිබුණි. | මෙම ඉඩම , මහා මාගී ලේකම් කාර්යාලයේ ගොඩනැගිල්ල සාදන ඉඩම වන ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි ඉඩම සමග මාරු කරන ලදී. එනිසා එම අගයද ගොඩනැගිලි නොනිමි වැඩ අගයන්ගේ ගිණුමට 2012 වසරේදී මාරු කිරීමට කටයුතු කරනු ලැබේ. |
| | | **(ii)** ඉහත සඳහන් නාරාහේන්පිට පිහිටි ඉඩම , ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි වෙනත් ඉඩමකට හුවමාරු කිරීමට 2009 හා 2010 වර්ෂවල ගෙවූ රු.මිලියන 60.052 මුදලක් ශේෂ පත්‍රයේ කෙරීගෙන යන වැඩ යටතේ පෙන්වා තිබුණි. | ගොඩනැගිලි නොනිමි වැඩ අගයන්ගේ ගිණුම සමන්විත වන්නේ ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ මහා ලේකම් කාර්යාල ගොඩනැගිල්ල සෑදීම සඳහා අදාල ඉඩම අත්පත් කරගැනීමට දරන ලද වියදම්ය. මෙම අගයන් පුනරාවර්ථන ස්වභාවයේ වියදම් ලෙස සැලකිය නොහැකි අතර ඒවා සෘජුවම ගොඩනැගිල්ල ඉදිකිරීමට දරනලද ගෙවීම් නිසා ආදායම් ප්‍රකාශනයට අයකල නොහැක. මෙම ගොඩනැගිල්ල භාවිතයට ගන්නා විට සුදුසු ගිණුම්කරණ ක්‍රමයක් භාවිතය මගින් මෙම අගයන් වියදම්වලට ගැනීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |
| | | **(iii)** රු.මිලියන 25.978ක් වූ පෑලියගොඩ පිහිටි ඉඩමක වටිනාකම ශේෂ පත්‍රයේ පෙන්වා තිබුණු නමුත් ඉඩමේ නීතිමය අයිතිය අධිකාරිය වෙත මාරුකර නොතිබුණි. | මෙම ඉඩමේ නෛතික අයිතිය ලබාගැනීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. ඉඩමේ සත්‍ය අගය ලෙස සඳහන් වන්නේ රු.25,604,180/= වන අතර රු.25,977,966 ක් නොවේ. මෙම අගය සමන්විත වන්නේ ඉඩමේ නෛතික අයිතිය අත්පත් කරගැනීමට නාගරික |

| | | | |
|---|---|---|---|
| | | | සංවර්ධන අධිකාරියට ගෙවන ලද මුදලයි. එනිසා මෙම ඉඩමේ නෛතික අයිතිය අප සතු නොවන අතර , ප්‍රතිලාභි අයිතිය පමණක් ඇති අතර, මෙම ඉඩම පසුගිය අවුරුදු 25 පුරාම අප විසින් භාවිතා කරමින් පවතී. එනිසා මූල්‍ය ගිණුම්කරණවල සඳහන් සත්‍ය වශයෙන් පැවැත්මක් ඇත යන සංකල්පය අනුව මෙම අගය වත්කමක් ලෙස සලකමින් එහි පැවැත්ම හා ආර්ථික සත්‍යතාව අනුව ශේෂ පත්‍රයේ පෙන්නුම් කරයි. |
| | | **(iv)** 2002 ජුනි 05 දින රු.මිලියන 56 පිරිවැයකට අත්පත් කරගෙන තිබුණු කඩුවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ උඩුමුල්ලේ පිහිටි හෙක්ටයාර 1.1304 ක් වූ ඉඩමක් 2011 දෙසැම්බර් 31 දින වන තෙක් අධිකාරියේ ගිණුම්වලට ගෙන නොතිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරියට නෛතික අයිතිය හෝ භාවිතා කිරීමේ අයිතිය මෙම ඉඩම සඳහා නොමැත. එලෙසම අධිකාරිය කිසිම ගෙවීමක් මෙම ඉඩම සඳහා සිදුකර නොමැත. එනිසා අපට වත්කමක් ලෙස අපගේ ගිණුම්වලට මෙය පෙන්නුම් කළ නොහැක. |
| | | **(v)** බේස්ලයින් මාර්ගයේ සිදුකරන ලද සංවර්ධන වැඩ හේතුවෙන් අවතැන්වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම සඳහා 1999 වර්ෂයේදී රු.මිලියන 123කට ප්‍රසම්පාදනය කර තිබුණු අක්කර 11 රූඩ් 02 හා පර්චස් 38.3 ක අත්තිඩියේ පිහිටි වෙනත් ඉඩමක් අදාල කාර්යය සඳහා පාවිච්චි කිරීමට හෝ අධිකාරියේ ගිණුම්වලට ගැනීමට 2011 දෙසැම්බර් 31 දින වන තෙක් කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩමේ අගය මාර්ග සංවර්ධන අධිකාරියේ ගිණුම් වලට 2012 වර්ෂයේ ගැනීමට අවශ්‍ය පියවර ගනුලැබේ. |
| | (ඊ) | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අංක 150 දරණ චක්‍රලේඛය මගින් ලබාදුන් උපදෙස් අනුව , සමාලෝචිත වර්ෂය තුලදී අධිකාරිය රු.මිලියන 72.050ක් වටිනා වාහන 13ක් කුලී බදු පදනම මත අත්කරගෙන තිබුණි. කෙසේ වෙතත් , ශේෂ පත්‍රයේ එම වත්කම් වල අගය නිරූපනය වන පරිදි ලෙජර් ගිණුම්වල මේ සම්බන්ධ ගිණුම් සටහන් යොදා නොතිබුණි. | මිලදී ගැනීමේ පිරිවැය , කල්බදු කොන්දේසි , කල්බදු කුලිය යනාදී තොරතුරු ගිණුම් තැබීම සඳහා මුදල් අංශයට අවශ්‍ය වන අතර 2012 වසරේදී ඒවා ලැබුණි. මෙම වත්කම් ගිණුම්වලට ගැනීමට පියවර ගනු ලබන අතර, අතපසු වූ ක්ෂයවීම් සඳහා අවශ්‍ය ගැලපීම් සිදුකිරීමටද කටයුතු කරනු ලැබේ. |
| | (උ) | වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය විසින් රු.මිලියන 7.269ක් වටිනා අන්තර් සච්ගල් ඇතිරුම් යන්ත්‍ර 54ක් 2010 වර්ෂයේදී අධිකාරිය වෙත භාරදී තිබුණි. වරාය හා මහා මාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා , 2010 දෙසැම්බර් 24 දිනැති සිය ලිපිය මගින් උපදෙස් දී තිබුණු පරිදි එවැනි එක් යන්ත්‍රයක ජීවිතකාලය වර්ෂ 10ක් වන අතර ඒ අනුව ක්ෂය වීම් කළයුතු වේ. කෙසේ වෙතත් , අධිකාරිය, යන්ත්‍රයක ජීවිත කාලය වර්ෂ හතරක් පමණක් සේ සලකා තිබුණු අතර ඒ අනුව ක්ෂය වීම් ප්‍රතිපාදනය කර තිබුණි. | ප්‍රතිපත්තියක් ලෙස යන්ත්‍ර හා පිරියත ක්ෂය කරනු ලබන්නේ වාර්ෂිකව 25% බැගින් සෘජු මාර්ග ක්‍රමයටය. කෙසේ වෙතත් වසර අවසානයේදී මෙම යන්ත්‍රවල ප්‍රයෝජ්‍ය කාලය සලකා ප්‍රත්‍යාගණනය කර ගිණුම්වල ගැනීමට සිදුකල හැක. |

| | | | |
|---|---|---|---|
| | (ඌ) | අධිවේගී මාර්ග කළමණාකරණ ඒකකයේ පරිශ්‍රයන් තුළ වර්ෂ අවසානයට පැවති ඉන්වෙන්ට්‍රි හා අනෙකුත් තොග විෂයයන් සත්‍යාපනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි. | අධිවේගී මාර්ග ව්‍යාපෘති අංශයට එදිනෙදා අවශ්‍යතා සඳහා අවශ්‍ය වන ලිපිද්‍රව්‍ය හා අනික් පරිභෝජ්‍ය තොග ප්‍රධාන කාර්යාලයේ ගබඩාව මගින් නිකුත් කරන අතර ඒවායේ පිරිවැය සෘජුවම වියදම්වලට අයකරනු ලැබේ. 2011.12 31 දිනට පැවති ලිපිද්‍රව්‍ය හා අනිකුත් පරිභෝජ්‍ය තොගයන්හි අගය ප්‍රමාණාත්මක නොවන අගයකි.<br>බහුතරයක් ස්ථාවර වත්කම් හා අනිකුත් තොග අයිතමන් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය මගින් මිලට ගෙන ඇත්තේ 2011 වසරේ සැප්තැම්බර් මස සිදුකරන ලද ස්ථාවර වත්කම් සමීක්ෂණයෙන් පසුවය. කෙසේ වෙතත් මෙම මිලට ගන්නා ලද වත්කම්වල අගය අපගේ ගිණුම්වල ගිණුම් ගත කර ඇත. මෙම අගයන් මෙම වසරේ ස්ථාවර වත්කම් ලේඛනයට යාවත්කාලීන කරනු ලබන අතර වත්කම් සමීක්ෂණයද මෙම වසරේ සිදුකරනු ලැබේ. |
| | 2.2.2 | **<u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>** | |
| | | පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| | (අ) | ලැබී තිබුණු තොරතුරුවලට අනුව , අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන විදේශ ආධාර ව්‍යාපෘතිවල පොදු කාර්ය පිරිවැය , අදාල ව්‍යාපෘති කළමනාකරණ ඒකක වලින් අධිකාරිය අයකරගනු ලබයි. කෙසේ වෙතත් , 2011 දෙසැම්බර් 31 දිනට අය කර ගත යුතු රු.මිලියන 8.679ක මුළු මුදලින් රු.මිලියන 4.002ක මුදලක් වර්ෂ 4කට වැඩි කාලයක් හිඟව පැවතුණි. තවද , 2011 දෙසැම්බර් 31 දිනට එවැනි ව්‍යාපෘති කළමනාකරණ ඒකක වලින් අයවිය යුතු රු.මිලියන 7.879ක් වූ වෙනත් ලැබියයුතු දෑ අතුරින් රු.මිලියන 3.202ක් වර්ෂ 4කට වඩා වැඩි කාලයක් අය නොකර පැවතුණි. ඉන් දැක්වෙන්නේ අධිකාරිය හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර කාලීනව ගෙන නොතිබුණු බවය. | අගය රු.4,002,329 න් මේ වන විට රු.3,317,252 ක අගයක් අයකරගෙන ඇත. ඉතිරි රු.685,077/= මෙම වසරේදී අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. අනිකුත් ලැබීම්හි අගය වන රු.3,202,089 ක මුදල සම්පූර්ණයෙන් අයකරගෙන ඇත. |
| | (ආ) | මහා මාර්ග දෙපස දැන්වීම් පුවරු, බැනර් හා කටවුට් යනාදියෙන් ආදායම් අය කර ගැනීමට , අධිකාරියේ දේපළ හා කළමණාකරණ අංශයේ අධ්‍යක්ෂකවරයාගේ 2007 මාර්තු 14 දිනැති ආර්ඩීඒ/පීඑම් සහ ආර්/අයිඑන් එෆ්/01 දරණ චක්‍රලේඛය මගින් දැක්වෙන ක්‍රියාමාර්ග නිසිපරිදි යොදා ගැනීමට අධිකාරියේ ප්‍රාදේශිය කාර්යාල කටයුතුකර නොතිබුණි. විගණනය විසින් මහනුවර හා ගම්පහ ප්‍රදේශවල නියැදි පදනමක් මත සිදුකරන ලද | අනවසර දැන්වීම් පුවරු , බැනර් හා කටවුට් ආදිය ඉවත් කිරීමට නුවර හා ගම්පහ නගරවල කටයුතු කර ඇති අතර, අනික් දිවයින පුරා දිස්ත්‍රික්කයන්හිද මෙම ඉවත් කිරීමේ කටයුතුවල ප්‍රගතියක් පවතී. |

| | | | |
|---|---|---|---|
| | | පරීක්ෂණ වලින් අනාවරණය වූයේ අධිකාරියට කිසිදු ගෙවීමක් නොකර අනවසරයෙන් ඉදිකර තිබුණු දැන්වීම් පුවරු ප්‍රදර්ශනය වෙමින් තිබුණු බවය. | |
| | **(ඇ)** | මහා මාර්ග පුළුල් කිරීමේ හා වැඩිදියුණු කිරීම් සඳහා අධිකාරියේ විවිධ ප්‍රාදේශීය කාර්යාලවලින් ලබාදී තිබුණු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකරගැනීමට අධිකාරිය ඵලදායී පියවර ගෙන නොතිබුණි. බස්නාහිර , මධ්‍යම , දකුණු හා උතුරු පළාත්වල පිහිටි ප්‍රාදේශීය කාර්යාල විසින් ප්‍රදානය කර තිබුණු 2011 දෙසැම්බර් 31 දිනට හිඟව පැවති රු.467.273ක් වූ මුළු හිඟ අත්තිකාරම් අතුරින් රු.මිලියන 32.698ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වර්ෂ දෙකකට වැඩි කාලයක් අය නොකර පැවතුණි. | මෙම වැඩ ආරම්භ කිරීමේ වියදම් අවුරුදු දෙකකට වඩා වැඩි කාලයක් නිරවුල් නොවී පවතී. මේවා කරගෙන යමින් පවතින ව්‍යාපෘති සඳහා අදාල වන අතර , අයකර ගැනීම් බිල් ඉදිරිපත් වන ආකාරයට සිදුකරයි. ශේෂව පැවති රු.467,273,137/= ක මුදලින් 2012 වසරේදී රු. 238,694,706 ක මුදලක් අයකර ගෙන ඇත. |
| | **(ඉ)** | බොරැල්ල හා මහනුවර පිහිටි මගී උමං මාර්ගවල සාප්පු හිමියන්ගෙන් අය කර ගතයුතු එකතුව රු.මිලියන 2.702ක් වූ බදු කුලී පිළිවෙලින් වර්ෂ හතරකට හා දෙකකට වැඩි කාලයක් හිඟව පැවතුනි. ඒ අනුව , එම ගෙවීම් පැහැර හරින ලද සාප්පු හිමියන්ගෙන් හිඟ මුදල් අයකර ගැනීමට අධිකාරිය කාලීනව පියවර ගෙන නොතිබුණු බව අනාවරණය විය. | මෙම අගයෙන් රු.200,000 ක මුදලක් අයකරගෙන ඇති අතර ඉතිරි මුදල අයකර ගැනීමට නීතිමය පියවර ගනිමින් පවතී. |
| | **(ඊ)** | 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ පෙන්වා තිබුණු මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා ප්‍රදානය කළ කොන්ත්‍රාත් මත රදවාගත් රු.මිලියන 1,269 ක්වූ ගෙවියයුතු මුළු මුදල අතුරින් රු.මිලියන 719.971 ක මුදලක් වර්ෂ දෙකකට වැඩි කාලයක් හිඟව පැවතීමෙන් පෙනී යන්නේ අදාල ශේෂ නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට අධිකාරිය පියවර ගෙන නොතිබුණු බවය. | මෙම රදවා ගැනීමේ මුදල් අවුරුදු 2 කට වඩා වැඩි කාලයක් නිරවුල් නොවී පවතී 75% ක පමණ ප්‍රමාණයක ව්‍යාපෘති මේ වන විට කරගෙන යමින් පවතින අතර රු.719,971,124.00 ක මුදලින් රු.119,125,556 ක මුදලක් 2012 වසරේදී නිදහස් කරඇත. ඉතිරි ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු රදවා ගැනීමේ බදු එම ව්‍යාපෘති සම්පූර්ණ කළ පසු අදාල කොන්ත්‍රාත්කරුවන්ගේ ඉල්ලීම් මත නිදහස් කිරීමටද නොගෙවන ලද රදවාගැනීමේ බද්දක් වේ නම් එය ආදායමට මාරුකිරීමටද කටයුතු කරනු ඇත. |
| | **2.2.3** | **නීතිරීති රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම්** | |
| | | විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ. | |
| | | **නීතිරීති රෙගුලාසි සහ කළමණාකරණ තීරණවලට යොමුව** **අනුකූල නොවීම** | |
| | | | |

| | | | |
|---|---|---|---|
| | **(අ)** | 1971 අංක 38 දරන මුදල් පනත<br>**(i)**8(1)වගන්තිය — 2010 ඔක්තෝම්බර් 30 දිනට පෙර අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කළ යුතු 2011වර්ෂය සඳහාවූ අධිකාරියේ අයවැය ලේඛනය අනුමත කර තිබුනේ 2011 අගෝස්තු 08 දිනදිය.<br><br>**(ii)** 14 (1) වගන්තිය — අදාල අමාත්‍යාංශයට හා විගණකාධිපතිවරයාටද පිටපත් ඉදිරිපත් කළ හැකිවන පරිදි මුල්‍ය වර්ෂය අවසාන වී දින 60ක් තුල පිලියෙල කළයුතු කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2012 ජුනි 30 වන තෙක් පිලියෙල කර නොතිබුණි.<br><br>**(iii)** 14 (4) වගන්තිය — 2010 වර්ෂය සඳහා අධිකාරියේ වාර්ෂික වාර්තාව 2012 ජුනි 30දින වන තෙක් මුද්‍රණය කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2011 වර්ෂය සඳහා වන අයවැය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට 2010 සැප්තැම්බර් මස ඉදිරිපත් කරන ලදි. නමුත් සමහර වෙනස් කිරීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයෙන් උපදෙස් ලබාදුන් අතර නැවත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කිරීමෙන් පසු අයවැය ලේඛනය අනුමත කර ඇත.<br><br>2011 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව අවසන් කර ඇති අතර එය පාර්ලිමේන්තුවට ඉදිරියේදී ඉදිරිපත් කරනු ලැබේ.<br><br>2010 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව මේ වන විට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. |
| | **(ආ)** | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 චක්‍රලේඛය හා 2004 ජනවාරි 08 දිනැති අංක: පීඊඩී/21 දරණ චක්‍රලේඛය<br><br>**(i)** 4.2.1 ඡේදය — අධිකාරියේ අරමුණු හා ඉලක්ක සපුරාගැනිම නිශ්චය කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සහ අයවැය ලේඛනය සමාලෝචනය කිරීමට අදාල ඇගයමී සිදු කළ යුතුය. අධිකාරියේ ප්‍රාදේශිය කාර්යාල විසින් සමාලෝචිත වර්ෂය තුලදී සත්‍ය වශයෙන් ඉටු කරන ලදමාර්ග නඩත්තු , පුළුල් කිරිමි හා වැඩිදියුණු කිරීම් රාශියක් , අධිකාරියේ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් නොවූ බව නිරික්ෂණය විය. ඒ අනුව එවැනි ඇගයිමක් කිරීමට අධිකාරිය කටයුතු නොකල බව තහවුරු වේ.<br><br>**(ii)**4.2.2 ඡේදය — සත්‍ය කාර්ය සාධනය සමග සංයුක්ත සැලැස්ම හා අය වැය ලේඛනය කාලිනව සමාලෝචනය කිරීමට කළමනාකරණය පියවර ගත යුතු වුවද, අධිකාරියේ අය වැය ලේඛනයේ ඇතුලත්වු වෙන් කිරීම් වලට එරෙහිවු විචලනයන් ගෙන් දැක්වුයේ එවැනි | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සෑම වසරකම ආරම්භයේදී පිළියෙල කරන අතර සාමාන්‍යයෙන් වැඩ කරගෙන යනු ලබන්නේ මෙම ක්‍රියාකාරි සැලැස්මට අනුවයි. කෙසේ වෙතත් හදිසි අවශ්‍යතාවයන් සඳහා මුලිකත්වය ලබාදිමක් සිදුකරයි. එලෙසම මෙවැනි හදිසි අවශ්‍යතාවයන් සඳහා ඉඩ ලබා ගැනීමට වාර්ෂික සැලසුම සංශෝධනයට අවශ්‍ය පියවර ගනු ලැබේ. ඉදිරියේදී ක්‍රියාකාරි සැලසුම් වාර්ෂිකව විමර්ශනයට පියවර ගනු ලැබේ.<br><br>සංයුක්ත සැලැස්ම අවුරුදු පහක් සඳහා වන වැඩ සඳහා පිළියෙල කරයි. මෙය වාර්ෂිකව විමර්ශනය කර වසරේ මෙන්ම ඉතිරි අවුරුදු හතරක කාලයේද විශේෂ අවශ්‍යතාවයන් සඳහා වෙන් කිරීමක් සිදුකරයි. වැඩවල ඵලදායිතාව හා වියදම කාලිනව විමර්ශනය |

| | | | |
|---|---|---|---|
| | | සමාලෝචනයක් සිදු නොකළ බවය. | කර වාර්ෂික ප්‍රතිපාදන ඇතුලත අදාල චක්‍රලේඛයන්ට අනුව අවශ්‍ය වෙනස් කිරීම් සිදුකරයි. ඊට අමතරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත්ව නොමැති හදිසි / විශේෂ වැඩ සඳහා දරන ලද වියදම් ප්‍රතිපූර්ණයට අවශ්‍ය අමතර ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමට අවශ්‍ය පියවර ගනී. තවමත් සාමාන්‍යයෙන් සත්‍ය අගයන් , ඇස්තමේන්තු අගයන්ට වඩා වැඩිවන අතර මෙම වෙනස සඳහා මාරු කරන අමතර ප්‍රතිපාදන අදාල හදිසි වැඩ සඳහා වන වියදම පියවීමට ප්‍රමාණවත් නොවන්නේ අවසාන ගිණුම්වල උපචිත කරනලද වියදම්ද ඇතුලත් නිසාය. |
| | | **(iii)**4.2.5 ඡේදය<br>ඵලදායි කාරක ප්‍රාග්ධන කළමනාකරණය සඳහා පාලන පද්ධතින් පිහිටුවීම හා ඒවා මාසික පදනමක් මත සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වග කිව යුතු වේ. කෙසේ වෙතත් , අධිකාරිය පාලන පද්ධතින් වැඩි දියුණු කිරීම සඳහා නිසි අවධානයක් යොමු නොකර සෘණාත්මක ශුද්ධ වත්කම් අනුපාතයක නරක අත්දැකීමක් නිරන්තරයෙන් ලබයි. | සෘණාත්මක කාරක ප්‍රාග්ධනයට මූලිකවම හේතුවන්නේ , උපචිත බිල්වලට අදාල කොන්ත්‍රාත්කරුවන් සඳහා කළ යුතු ගෙවීම් සහ සම්පූර්ණ කරන ලද කොන්ත්‍රාත් සඳහා ගෙවිය යුතු රඳවා ගැනීම් බදුද ජංගම වගකීම්වලට ඇතුලත් නිසාය. තොගවලට, රු.මිලියන 32ක OECF ප්‍රතිපාදන අමතරව ලැබී ඇති අතර මාර්ග සංවර්ධන අධිකාරියේ සෙමින් චලනය වන හෝ ප්‍රයෝජනයට නොගන්නා තොගද නොමැති බව දන්වමි.<br><br>සෘණාත්මක ශුද්ධ වත්කම් අගයවන රු.මිලියන 4426 ට හේතු වන්නේ සමුච්චිත ඌණතාව වන රු.මිලියන 5440 ට ඇතුලත් ක්ෂය සහ පාරිතෝෂික වෙන්කිරීම් අගයන්ද සහ හිමිකරු ප්‍රාග්ධනය හා සංචිතයන්ගේ එකතු වයි. |
| | **(ඇ)** | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2005 ජනවාරි 31 දිනැති අංක පීඊඩී 28 දරණ චක්‍රලේඛය<br>අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුළ කුලියට ලබාගෙන තිබුණු වාහන 75 ක් සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි . | පුවත්පත් දැන්වීම් සඳහා ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම මගහැරීමකින් සිදුකර නොමැත. කෙසේ වෙතත් සියළු තීරණ අදාල ප්‍රසම්පාදන කමිටුව මගින් ගෙන ඇත. එනිසා කුලී වාහන සඳහා ගිවිසුම් අත්සන් කර නොමැති අතර , අනාගතයේදී එවැනි සියළු වාහන සඳහා ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| | **(ඈ)** | රජයේ ප්‍රසම්පාදන මඟපෙන්වීම් -2006 2.5,2.6,8.9.1හා 8.9.3වගන්ති<br>ප්‍රසම්පාදන කමිටුව හෝ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් වාහන කුලියට ලබා ගැනීම සඳහා වු පුවත් පත් දැන්වීම් ඒවා ප්‍රසිද්ධ කිරීමට පෙර අනුමත කර නොතිබුණු අතර එම සේවා සපයන්නන් සමග වාහන කුලියට ගැනීම සඳහා වු ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | වාහන කුලියට ගෙන ඇත්තේ , නියමාකාර ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කරමින් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය සහිතවය. |

| | | | |
|---|---|---|---|
| | (ඉ) | මාර්ග සංවර්ධන අධිකාරියේ 2011 ඔක්තොම්බර් 28 දිනැති අංක 324 දරණ මුදල් චක්‍රලේඛය 2011 වර්ෂය අවසානයට අධිකාරියේ ගිණුම් වැසීමට හැකි වන පරිදි සියළුම සුළු මුදල් හෝ වෙනත් අග්‍රිම හා වෙනත් අග්‍රිම අත්තිකාරම් යනාදිය බැංකු වල තැන්පත් කිරීමට උපදෙස් ලබා දීතිබුණි. කෙසේ වෙතත් බස්නාහිර, උතුර, සබරගමුව හා ඌව පළාත් කාර්යාල එම උපදෙස් අනුගමනය කර නොතිබුණු අතර නියමිත දිනයන්හිදි සුළු මුදල් අග්‍රිම හා ඉන්ධන අත්තිකාරම් යනාදිය තැන්පත් කර නොතිබුණි. | බස්නාහිර , උතුර , සබරගමුව හා ඌව පළාත්භාර අධ්‍යක්ෂවරුන්ට චක්‍රලේඛ උපදෙස් තරයේ අනුගමනය කරන ලෙස උපදෙස් නිකුත් කර ඇත. |
| | 2.2.4 | **<u>නොසැසදූ ශේෂ</u>**<br><br>පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| | (අ) | පහත විස්තර කර තිබෙන පරිදි ,නොසැසදූ ශේෂ හේතුවෙන් අධිකාරියේ ප්‍රාදේශිය කාර්යාල කිහිපයක් විසින් බැංකු සැසඳුම් ප්‍රකාශ ඵලදායි කළමනාකරණ පාලන කාරකයන් වශයෙන් උපයෝගි කර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය | |
| | | (i) උතුර,බස්නාහිර,දකුණු පලාත් වල පිහිටි පළාත් අධ්‍යක්ෂ කාර්යාල සහ කොළඹ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය විසින් පිළියෙළ කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශ වල පෙන්වා තිබුණු රු. මිලියන 21.642 ක් වු බැංකුවේ මුදල් ශේෂ, රු. මිලියන 21.052 ක් වු ශේෂ පත්‍රයේ පෙන්වා තිබුණු මුළු මුදල සමග එකඟ නොවිය. තවද, මහනුවර පිහිටි පෙර නිමි අංගනය විසින් පිළියෙළ කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශයේ දැක්වුණු රු. මිලියන 9.529 ක ශේෂය , ශේෂ පත්‍රයේ දැක්වු රු.මිලියන 9.331 ශේෂය සමග එකඟ නොවිය. ඒ අනුව ප්‍රාදේශිය කාර්යාල විසින් පිළියෙළ කල බැංකු සැසඳුම් ප්‍රකාශ වල නිරවද්‍යතාවය, ප්‍රශ්ණකාරිව පැවතුණි. | සඳහන් කරන ලද සියළු දෝෂයන් නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. බැංකු සැසඳුම් ප්‍රකාශනයන් ඵලදයි උපකරණයක් ලෙස භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවති. එලෙසම මෙම අත්වැරදීම් සඳහා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය පියවර ගනු ලැබේ. |
| | | (ii) ප්‍රාදේශිය කාර්යාල විසින් පවත්වනු ලැබු බැංකු ගිණුම් පහක පැවති රු.170,087 ක් වු ශේෂ සඳහා 2011 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ ඵලදායි මුදල් කළමනාකරණ කාර්යයන් සඳහා කාලිනව පිළියෙළ කර නොතිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට වු ඉහත සඳහන් බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර විගණන කාර්යන් සඳහා ඉදිරිපත් කර තිබුනේ 2012 අගෝස්තු මාසයේදිය. | එම ශේෂ තහවුරු කිරීමේ ලිපි හා බැංකු සැසඳුම් ප්‍රකාශන මේ වන විට විගණන අංශයට ඉදිරිපත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | | **(iii)** වයඹ ,සබරගමු හා බස්නාහිර පළාත් වල පිහිටි පළාත් අධ්‍යක්ෂ කාර්යාල, පොළොන්නරුව ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය හා මහියංගණය හා ඇඹිලිපිටියේ පිහිටි විධායක ඉංජිනේරු කාර්යාලය විසින් 2011 දෙසැම්බර් 31 දිනට සාවද්‍ය බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර තිබුණි. | වගකිව යුතු නිලධාරින්ට එරෙහිව අවශ්‍ය පියවර ගෙන ඇත. |
| | **(ආ)** | බස්නාහිර,දකුණු ,වයඹ හා ඌව පළාත් වල පිහිටි ප්‍රාදේශිය කාර්යාල වල වාර්ෂික තොග සමීක්ෂණ වාර්තා සමඟ එම කාර්යාලවල පැවති පාරිභෝගික තොග ශේෂයන්හි විශාල වෙනස්කම් නිරීක්ෂණය වු අතර එයින් පෙනි යන්නේ එම ශේෂ, ගිණුම් වලට ගැනිමට පෙර වාර්ෂික තොග සමීක්ෂණ වාර්තා සමඟ සැසඳිමට ඵලදායි පියවර ගෙන නොතිබු බවයි. | බස්නාහිර , දකුණ හා වයඹ පළාත් කාර්යාල වල අමතර අමුද්‍රව්‍ය තොග තබාගෙන ඇත්තේ සමහර මාර්ග පුළුල් කිරිමේ හා වැඩිදියුණු කිරිමේ වැඩ මාර්ග සංවර්ධන අධිකාරියේ නඩත්තු කම්කරුවන් යොදා ගෙන සිදු කරන විට ප්‍රයෝජනයට ගැනිම සඳහාය. ඌව පළාත් කාර්යාලයේ අමතර තොග තබාගෙන ඇත්තේ හදිසි වැලි මුදිත තාර ආලේප කිරිමේ කටයුතු සිදුකිරිම සඳහාය. |
| | **2.2.5.** | **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>** | |
| | | පහත විස්තර කරන පරිදි සාක්ෂි නොවීම හේතුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ පෙන්වා තිබුණු ශේෂ කිහිපයක් විගණනයේදි සතුටුදාක ලෙස සන්නිරීක්ෂණය කිරිමට නොහැකි විය. | |
| | **(අ)** | රු.මිලියන 614.566 ක් වු වැඩ ආරම්භ කිරිමේ අත්තිකාරම් ඇතුලත්ව ප්‍රාදේශිය කාර්යාල කිහිපයක වු රු.මිලියන 630.654 ක කොන්ත්‍රාත් හා වෙනත් අත්තිකාරම් පිළිබඳ විස්තරාත්මක උපලේඛන. | එම උපලේඛන මේ වන විට විගණන අංශයට ඉදිරිපත් කර ඇත. |
| | **(ආ)** | එකතුව රු.මිලියන 8.041 ක් වු රඳවාගත් මුදල් ශේෂ සහ එකතුව රු.මිලියන 509.462 ක් වු කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු වෙනත් දෑ සම්බන්ධ විස්තරාත්මක උපලේඛන විගණනයේදි ලබා ගත නොහැකි විය. ඒ අනුව, අධිකාරියේ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදල් නිරවුල් කිරිම සම්බන්ධ මුල්‍ය පාලනය සතුටුදායක නොවු බව තහවුරු වේ. | අදාල උපලේඛන පිළියෙල කරමින් පවතින අතර සති දෙකක් ඇතුලත විගණන අංශයට ඉදිරිපත් කිරිමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | **(ඇ)** | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සිදු කළ මාර්ග වැඩි දියුණු කිරීමේ කටයුතුවල නිරත ශ්‍රී ලංකා යුධ හමුදාවේ නිලධාරීන් වෙත් ගම්පහ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය විසින් කුලියට ගෙන සපයා තිබුණු වාහන හතරක ගෙවීම් සහතික කිරීම් සඳහා ධාවන සටහන් යනාදී මුලාශ්‍ර ලියවිලි. මේ සඳහා කුලි හා ධාවන ගාස්තු ලෙස රු.මිලියන 6.789 ක මුදල් වැය කර තිබුණි. | කොළඹ පළාත්භාර අධ්‍යක්ෂක කාර්යාලයෙන් අදාල සියළුම ලියවිලි ලබා ගත හැක. වවුචරයේ පිටපත සමග ධාවන සටහන් පත්හි පිටපත්ද ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේ තබා ගැනීමට ඉදිරියේදී අවශ්‍ය පියවර ගනු ලැබේ. |
| | **(ඈ)** | ඉහත කරුණට අමතරව , 2011 වර්ෂය තුළ දරන ලද මාර්ග වැඩි දියුණු කිරීමේ/ නඩත්තු පිළිබඳ විස්තර 2012 මාර්තු 02 විධායක ඉංජිනේරු කාර්යාලය වලින් විගණනය විසින් කෙලින්ම ඉල්ලා තිබුණි. කෙසේ වෙතත් කොළඹ, බදුල්ල, නෝර්වුඩ්, සහ පුත්තලම පිහිටි විධායක ඉංජිනේරු කාර්යාල, 2012 ජූලි අවසානය වන විටත් අදාල තොරතුරු ලබා දීමට පියවර ගෙන නොතිබුණි. | අදාල තොරතුරු අප වෙත ඇති අතර ඒවා ඉදිරිපත් කිරීම සිදු කල හැක. |
| | **2.2.6.** | **<u>අධිකාරිය විසින් පෞද්ගලික සමාගම් සමග කළ ගණුදෙනු</u>** | |
| | | අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය හා ප්‍රධාන විධායක නිලධාරී විසින් ගෙන තිබුණු පහත සඳහන් තීරණ පදනම් කරගෙන සීමාසහිත මගනැගුම මාර්ග ඉදකිරීම් හා උපකරණ සමාගම , සීමාසහිත මගනැගුම උපදේශක හා ව්‍යාපෘති කළමණාකරණ සේවා සමාගම සහ සීමාසහිත මගනැගුම ඉමල්ෂන් නිෂ්පාදන සමාගම යන සමාගම් සමග අධිකාරිය කැපීපෙනෙන ගණුදෙනු ප්‍රමාණයක් සිදු කර තිබුණු බව නිරීක්ෂණය විය . | |
| | **(අ)** | 2008 අගෝස්තු 14 දින පැවැත්වූ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමෙදී සීමාසහිත මගනැගුම මාර්ග ඉදකිරීම් හා උපකරණ සමාගම හා සීමාසහිත මගනැගුම උපදේශක හා ව්‍යාපෘති කළමණාකරන සේවා සමාගම වෙත මහාමාර්ග උපලේඛන අනුපාතයට 28%ක පොදු කාර්ය සහ ලාභ තීරුවක් එකතු කර මාර්ග වැඩ පැවරීමට තීරණය කර තිබුණි. තවද , 2008 මැයි 22 දිනැති අංක ආර්ඩීඒ/සීඑච්/එම්එම්සී/02/09 දරණ චක්‍රලේඛයෙන් අධිකාරියේ ඩිපෝ විසින් නිෂ්පාදනය කර මාර්ග වල පැලීම් සඳහා යොදනු ලබන ප්‍රිමික්ස් ද්‍රව්‍ය වෙනුවට එම ද්‍රව්‍ය මාර්ග ඉදිකිරීම් හා උපකරණ සමාගම වෙතින් මිලදී ගැනීමට අධිකාරියේ සභාපතිවරයා උපදෙස් ලබා දී තිබුණි. | මේ වන විට මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රිමික්ස් අවශ්‍යතාවයෙන් 75%ක් පමණ නිපදවන්නේ අධිකාරියේ පෙරමුසු අංගන මගින් වන අතර, මගනැගුම ඉදිකිරීම් සමාගමෙන් මිලට ගනු ලබන ප්‍රිමික්ස් ප්‍රමාණය මේ වන විට ප්‍රබලව අඩුවී ඇත. මේ වනවිට ප්‍රිමික්ස් මිලදීගැනීම් අධිකාරියේ පෙරමුසු අංගන මගින් පමණක් සිදු කරන ලෙස චක්‍රලේඛ උපදෙස් නිකුත් කර ඇත. මගනැගුම ඉමල්ෂන් සමාගමෙන් මිලට ගන්නා ඉමල්ෂන් ලීටරයක ගාස්තුව සාමාන්‍ය වෙළඳපලින් මිලට ගන්නා අගයට වඩා රු. 3.00 හා 4.00 ක අඩු වීමක් ඇත. |
| | **(ආ)** | අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් නිකුත් කළ 2006 මැයි 26 දිනැති අර්ඩීඒ/පීඑම්/එම්එම්සී/02/03 දරණ චක්‍රලේඛය අනුව ප්‍රිමික්ස් සහ ඉමල්ෂන් නිෂ්පාදන මගනැගුම ඉමල්ෂන් නිෂ්පාදන සමාගමෙන් මිලට ගත යුතුය. | |

| | | | |
|---|---|---|---|
| | | ඉහත තිරණ පදනම් කර ගෙන සමාලෝචිත වර්ෂය තුලදි කරනු ලැබු වැදගත් සම්බන්ධිත පාර්ශව ගණුදෙනු පහත දැක්වේ. | |
| | | **(අ)** අධිකාරියේ වත්කම් හා යන්ත්‍ර කුලියට ගැනිම මත මගනැගුම මාර්ග ඉදකිරිම් හා උපකරණ සමාගමෙන් ලැබිය යුතු එකතුව රු.මිලියන 60ක මුදල සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රිමික්ස් ද්‍රව්‍ය සැපයිම වෙනුවෙන් ගෙවිය යුතු ශේෂයට එරෙහිව හිලව් කර තිබුණි. | එම අගය මාර්ග සංවර්ධන අධිකාරියට ලැබිය යුතු කුලි ගාස්තු වලට එරෙහිව , ඔවුන්ට ගෙවිය යුතු මුදලින් කරන ලද කපාහැරිමකි. |
| | | **(ආ)** මගනැගුම සමාගම් විසින් කුලියට ගනු ලැබු පිරියත හා යන්ත්‍ර සඳහා වු අගය එකතු කළ බදු මුදල විලම්භිත ප්‍රතිදාන බදු වශයෙන් වාර්තාකර තිබුණු අතර රු.මිලියන 78.710 ක මුළු මුදලක් 2011 දෙසැම්බර් 31 වන විට නිරවුල් නොකර පැවතුණි. කෙසේ වෙතත්, ඉහත සඳහන් හිලව් කල රු.මිලියන 60 අදාල අගය එකතු කළ බදු කොටස තිරණය කර නොතිබුණු අතර මුල්‍ය ප්‍රකාශන වල ඒ මත ප්‍රතිපාදනයන් සිදු කර නොතිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරිය එකතු කල අගය මත බදු ගෙවනු ලබන්නේ මුදල් පදනම මතය. එකතු කළ අගය මත බදු රු.78,710,961.07ක මුදල අදාල වන්නේ කුලි ගාස්තු හා අනෙකුත් ආදායම්හි එක් රැස් නොකරන ලද අගයටය. මෙම අගය දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වන්නේ ලැබිය යුතු එම කුලි ගාස්තු හා අනෙකුත් ආදායම් එකතු කල විටය. රු.මිලියන 60 ට අදාල එකතු කල අගය මත බදු අගය ගිණුම්ගත කරනු ලැබේ. |
| | **(ඇ)** | අධිකාරිය ,කුලි ගාස්තු ගණනය කර තිබුනේ මගනැගුම මාර්ග ඉදිකිරිම් හා උපකරණ සමාගමෙන් ලබා දුන් තොරතුරු පමණක් පදනම් කර ගනිමිනි. අදාල පිරියත හා යන්ත්‍ර භාවිතය තහවුරු කර ගැනිමට හා ඒ අනුව කුලි ගාස්තු ගණනය කිරිමට ප්‍රමාණවත් ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි.තවද, අධිකාරිය විසින් මගනැගුම සමාගම් වලට නිදහස් කල ස්ථාවර වත්කම්, 2006 වර්ෂයේ සිට සත්‍යාපනය කර නොතිබුණි.කුලි ගාස්තු සඳහා වු අනුප්‍රමාණ වර්ෂ පහකට වැඩි කාලයක් ප්‍රතිශෝධනය වි නොතිබුණු අතර ඒවා වර්තමානයේ පවත්නා වෙළඳපළ අනුප්‍රමාණ වලට වඩා බෙහෙවින් පහළ මට්ටමක පැවතුණි. | මග නැගුම සමාගම් වලින් එකතු කරනු ලබන කුලි ගාස්තු හා ඔවුන්ගේ භාවිතයන් පිලිබඳව එකඟතාවයකට එළඹිමට අවශ්‍ය පියවර ගනු ලැබේ. එලෙසම කුලි ගාස්තු ගණනය භාවිතා කරනු ලබන සියළුම උපකරණවලට මසකට අවම වශයෙන් දින 20ක් ලෙස හෝ යාන්ත්‍රණය කර පිළියෙල කිරිමට අවශ්‍ය පියවර ගනිමින් පවති. එලෙසම පවතින වෙළඳපල මිල ගණන් අනුව කුලි ගාස්තු මිල ගණන් සංශෝධනයටද අවශ්‍ය පියවර ගනු ලැබේ. |
| | **(ඈ)** | ප්‍රාදේශිය වශයෙන් සිදු කරනු ලබන මාර්ග පුළුල් කිරිම් හා වැඩි දියුණු කිරිමේ කාර්යයන් සඳහා මගනැගුම සමාගම් සමග ගිවිසුම් වලට එළඹිමට අධිකාරියේ ප්‍රාදේශිය කළමනාකරුවන්ට බලය ලබා දි තිබුණි. කෙසේ වෙතත්, මගනැගුම සමාගම් වලට කොන්ත්‍රාත් ප්‍රදානය කිරිම සම්බන්ධ මුල්‍ය පාලනය සතුටුදායක නොවිය. නිරික්ෂණය වු අවස්ථා පහත දැක්වේ.<br><br>**(i)** මගනැගුම සමාගම වෙත ප්‍රදානය කල කොන්ත්‍රාත් පිළිබඳ විස්තර වෙනම ලබා දෙන ලෙස ප්‍රාදේශිය කළමණාකරුවන්ට උපදෙස් දි නොතිබුණු අතර ඒ | <br><br><br><br><br><br><br>පළාත් කාර්යාලවලට නිසි අධිකාරිබලය සහිත සීමාවන් හා ක්‍රියාපටිපාටින් ඉක්මනින් නිකුත් කරනු ලැබේ. මගනැගුම සමාගම් සඳහා |

| | | | |
|---|---|---|---|
| | | හේතුවෙන් එම සමාගම් වලට ලබා දුන් මුළු කොන්ත්‍රාත් පිළිබඳ වටිනාකම මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයෙන් එක් වරම ලබා ගත නොහැකි විය.<br><br>**(ii)** මගනැගුම සමාගම් වෙත එක් ප්‍රාදේශීය කාර්යාලයකට ලබා දිය හැකි අත්තිකාරම් වල උපරිම අගය කල් තබා තිරණය කර නොතිබුණි.<br><br>**(iii)** සිරිතක් වශයෙන්,  අධිකාරිය මගනැගුම ඉමල්ෂන් සමාගමට බිටුමින් සැපයිම වෙනුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත කෙලින්ම මුදල් ගෙවා තිබුණි.<br>කෙසේ වෙතත් ,සමාගම එම බිටුමින් අධිකාරියේ ඉමල්ෂන් නිෂ්පාදන අවශ්‍යතාවයන් සැපිරීම සඳහාම පාවිච්චි කරනු ලබන බවට තහවුරු නොවිය. | නිකුත් කරන ලද වැඩ නියෝගයන්ට අදාල විස්තර සියළු පළාත් කාර්යාල වලින් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ගෙන්වා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට උපදෙස් ලබාදෙනු ලැබේ.<br><br>ඉතා ඉක්මනින් අදාල විස්තර ගෙන්වා ගැනීම ක්‍රියාත්මක කරනු ලැබේ.<br><br>මගනැගුම සමාගම් සදහා සාමාන්‍යයෙන් කරන ලද වැඩ වල වටිනාකමින් 20% ක් වැඩ ආරම්භ කිරීමේ වියදම් ලෙස ගෙවනු ලැබේ.<br><br>මගනැගුම ඉමල්ෂන් සමාගමට නිකුත් කරන ලද තාර ප්‍රමාණය හා ඔවුන් මාර්ග සංවර්ධන අධිකාරියට ලබාදෙන ලද ඉමල්ෂන් ප්‍රමාණය අතර සැසදීමක් සිදුකිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. කෙසේවෙතත් තාර සදහා වන පිරිවැය සාමාන්‍යයෙන් ඔවුන්ගේ ගෙවීම් වලින් අඩුකරනු ලැබේ. |
| **3** | | <u>**මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**</u> | |
| | **3.1** | **මුල්‍ය කාර්ය සාධනය** | |
| | | මහාමාර්ග ඉංජිනේරු ක්ෂේත්‍රයේ විවිධ හැකියාවන් සහිත අද්විතිය ආයතනයක් තත්ත්වයට අධිකාරිය පත් කිරීම සහ සමස්ථ සාන්දික ප්‍රජාවගේ අභිලාශයන් මුදුන්පත් වන පරිදි ජාතික මහා මාර්ග පද්ධති ජාලය වැඩි දියුණු කිරීම අධිකාරියේ දැක්ම වේ. ජාතියේ ආර්ථික සංවර්ධනය උදෙසා භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය සඳහා පිළිගත් මට්ටමක පරිසර හිතකාමී, සුවපහසු ,ආරක්ෂිත හා කාර්යක්ෂම ජාතික මහා මාර්ග පද්ධතියක් පවත්වා ගැනිමට හා මහා මාර්ග ක්ෂේත්‍රය තුළ ප්‍රමුඛ ජාතික ආයතනය බවට පත්වීමේ මෙහෙවර සාක්ෂාත් කිරීමට පාලම් 4,200 ක් ඇතුලත්ව මුළු දුර කිලෝමීටර් 12,020ක් වු ජාතික මහා මාර්ග පද්ධතිය පුනරුත්ථාපනය හා සංවර්ධය කිරිම අධිකාරියේ කාර්ය භාරය වේ. අධිකාරියේ මෙහෙවර සහ 1981 අංක 73 දරණ මාර්ග සංවර්ධන අධිකාරි පනතේ 9(1) ජේදය යටතේ සඳහන් අරමුණු ඉටු කර ගැනීම සඳහා අධිකාරිය, වාර්ෂිකව<br>රජය විසර්ජනය කරන අරමුදල් හා වෙනත් ආයතන වලින් සපයනු ලබන අරමුදල් වලින් මාර්ග නඩත්තු,<br>පුළුල් කිරීම් , වැඩි දියුණු කිරීමේ කටයුතු සහ වානිජමය කටයුතු කිහිපයක් කරනු ලබයි. | ශුද්ධ ඌනතාවය වන රු.මිලියන 397 න් රු.මිලියන 337ක් සෑදී ඇත්තේ ක්ෂය වෙන්කිරීම් සදහා රු.මිලියන 43 ක්ද, පාරිතෝෂික වෙන් කිරීම් සදහා රු.මිලියන 245 ක්ද ආර්ථික සේවා බදු ආදායම් බදුවලට එරෙහිව කපා හැරීම් සදහා රු.මිලියන 45ක්ද , වෙනත් ණය ගැතියන් කපාහැරීම සදහා රු.මිලියන 4ක්ද ලෙසය. ඉතිරිය වන රු.මිලියන 60 ට හේතුවන්නේ කාර්ය මණ්ඩලයේ වැටුප් වැඩිවීමය.<br><br>ශුද්ධ ජංගම වත්කම් අඩුවීමට (සෘණාත්මක කාරක ප්‍රාග්ධනය වන රු.මිලියන 4,449 ට) ප්‍රධානම හේතුව වී ඇත්තේ සම්පූර්ණ කරනලද කොන්ත්‍රාත් වෙනුවෙන් උපචිත කරන ලද බිල්පත් හා රදවා ගැනීම් බදු රු.මිලියන 7,736ක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමට තිබීම හේතුවෙනි මෙය ජංගම වත්කම් යටතේ ඇතුලත් කර ඇත. ඒ නිසා පසුගිය වසර සමග සැසදීමේදී මුළු වත්කම්වල අඩුවීමක් නොමැති අතර අනික් |

| | | | |
|---|---|---|---|
| | | මුල්‍ය ප්‍රකාශණ අනුව, ඉකුත් වර්ෂයේ ශුද්ධ ඌනතාවය වූ රු. මිලියන 154.89 සමග සැසඳීමේදී අධිකාරියේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු. මිලියන 396.82 ක ශුද්ධ ඌනතාවයක් වූ අතර ඉන් පෙනී යන්නේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 241.93 කින් තවදුරටත් පිරිහුණු බවය.<br><br>විස්තරය පහත දැක්වේ. | අතට මුළු වත්කම් වැඩිවීමක් පමණක් සිදුව ඇත. |

| <u>**විස්තරය**</u> | 2011<br><u>**රු.මිලියන**</u> | 2010<br><u>**රු.මිලියන**</u> |
|---|---|---|
| **වානිජමය නොවන කාර්යයන්** | | |
| මාර්ග පුළුල් කිරීමේ හා වැඩි දියුණු කිරීමේ හා නඩත්තු කටයුතු සඳහා රජයේ හා වෙනත් ප්‍රදාන සහ සේවාදායකයන් විසින් මාර්ග නඩත්තු කටයුතු වෙනුවෙන් කළ තැන්පත් වලින් මාරු කළ අරමුදල් | 31,153.45 | 18,459.67 |
| අඩු කළා :- | | |
| ඒ මත වූ පිරිවැය | 29,217.74 | 16,723.86 |
| වාණිජමය නොවන කාර්යයන් වලින් අතිරික්තය /(ඌනතාවය) | 1,935.71 | 1,735.81 |
| වාණිජමය කාර්යයන් වලින් අතිරික්තය /(ඌනතාවය) | 22.21 | 4.65 |
| ශුද්ධ මෙහෙයුම් අතිරික්තය | 1,957.92 | 1,740.46 |
| වෙනත් ආදායම් | | |
| - පොලී ආදායම | 100.26 | 52.72 |
| - කුලී ගාස්තු හා බදු කුලී | 184.92 | 219.00 |
| - වෙනත් | 286.80 | 243.82 |
| අඩුකළා | | |
| - පරිපාලන වියදම් | 2,649.28 | 2,129.50 |
| - වෙනත් වියදම් | 234.75 | 254.92 |
| ක්ෂය | 609.81 | 577.16 |
| ශුද්ධ අතිරික්තය/(ඌනතාවය) | (963.94) | (705.58) |
| විලම්භිත ආදායම් මාරු කිරීම් | 567.12 | 550.69 |
| වර්ෂය සඳහා ශුද්ධ ඌනතාවය | (369.82) | (154.89) |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අධිකාරිය පසුගිය වර්ෂ දෙක තුළ වාණිජමය නොවන හා වාණිජමය කටයුතු වලින් අතිරික්තයන් ලබා තිබුණද , එය එම වර්ෂ වල පරිපාලන හා වෙනත් වියදම් ආවරණය කර ගැනීමට ප්‍රමාණවත් වී නොතිබුණු අතර එහි

| | | | |
|---|---|---|---|
| | | ප්‍රතිඵලයක් වශයෙන් අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය අඛණ්ඩව පිරිහීමේ නැඹුරුවක් තිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ සමහර වැදගත් ශේෂ ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.<br><br>**<u>දෙසැම්බර් 31 දිනට</u>**<br>**<u>2011</u>**   **<u>2010</u>**<br>රු.මිලියන   රු.මිලියන<br>ශුද්ධ ජංගම වත්කම් (4,449.42) (4,336.41)<br>ජංගම නොවන වගකීම්<br>අඩුකළ මුළු වත්කම් (2,671.81) (2,317.94)<br>ප්‍රාග්ධනය හා සංචිත ඉක්මවූ<br>සමුච්චිත ඌනතාවය (4,425.98) (4,029.16)<br><br>එම නිසා ශේෂ පත්‍ර විෂයයන්ගේ ප්‍රාග්ධන සෝදායාමක් දැක්වුණු අතර මූල්‍ය ප්‍රකාශනයන්ගෙන් සාධාරණ ඉදිරිපත් කිරීමක් කළ හැකි වන පරිදි මූල්‍ය වාර්තාකරණ පද්ධතිය ප්‍රතිව්‍යුහගතකරණය කිරීම අත්‍යවශ්‍ය වේ. | |
| 3.2 | | **<u>භෞතික කාර්ය සාධනය</u>** | |
| | 3.2.1. | **වාණිජමය නොවන කටයුතු මෙහෙයුම්** | |
| | (අ) | **<u>මාර්ග පුළුල් කිරීම් හා වැඩිදියුණු කිරීම්</u>** | |
| | | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව , ඉහත සඳහන් පරමාර්ථය ඉටුකිරීමට පළාත් නවය තුළ ජාතික හා ප්‍රවේශ මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය , ජාතික මහා මාර්ගවල බිඳිගිය පාලම් ප්‍රතිසංස්කරණය , නව විකල්ප මාර්ග ඉදිකිරීම් සහ අනෙකුත් විශේෂ ව්‍යාපෘතීන් සඳහා රු.මිලියන 20,547ක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, ඉහත කටයුතු සඳහා රු.මිලියන 13,197ක මුදලක් පමණක් වැය කර තිබුණි. | |
| | | මේ සම්බන්ධයෙන් තවදුරටත් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| | | **(i)** ප්‍රගති වාර්තා අනුව, දිස්ත්‍රික් 15 ක පිහිටි ප්‍රාදේශීය කාර්යාල විසින් මහා මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා වූ වාර්ෂික වෙන් කිරීම ඉක්මවා රු.මිලියන 1410.11 හා මුදලක් වැයකර තිබුණු අතර වෙනත් දිස්ත්‍රික්ක 7ක පිහිටි ප්‍රාදේශීය කාර්යාල විසින් එම කාර්යයන් සඳහා වෙන්කළ ප්‍රතිපාදනයන්ගෙන් රු.මිලියන 6,995.95 ක මුදලක් අඩුවෙන් උපයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී කිළිනොච්චිය, මුලතිව් හා පුත්තලම් දිස්ත්‍රික්ක වල කටයුතු සඳහා වෙන්කර තිබුණු රු.මිලියන 300 ක මුළු ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් නොවන සමහර මාගී වැඩිදියුණු කිරීමේ වැඩ හදිසි අවශ්‍යතාවයන් අනුව ප්‍රමුඛත්වය ලබාදෙමින් සමහර පළාත් කාර්යාල මගින් සිදුකරන විට එම පළාත් කාර්යාල වල මූලික ප්‍රතිපාදන ඉක්මවා යාමක් සිදුවේ. කෙසේ වෙතත් වසර අවසානයේදී මෙම වෙනස්කම් සැලකිල්ලට ගනිමින් ප්‍රතිපාදන නැවත පළාත් කාර්යාල අතර බෙදා වෙන් කර දීම සිදුකරයි. සංශෝධිත ප්‍රතිපාදන හා සත්‍ය වියදම |

| | | | |
|---|---|---|---|
| | | උපයෝජනය කර නොතිබුණු බව සඳහන් කිරීමට තරම් වැදගත් වේ. | ඇමුණුම් අංක 1 මගින් ලබාදී ඇත. ක්‍රියාකාරී සැලැස්ම මෙම අයිතම සලකා බලමින් සංශෝධනය කරනු ලබයි. |
| | | **(ii)** 2011 වර්ෂය සඳහා වූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම යටතේ මාර්ග පුළුල් කිරීම් හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතින් 667 ක් සිදු කිරීමට හඳුනාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් නොවූ ව්‍යාපෘතින් 200ක වැඩ ආරම්භ කර රු.මිලියන 3,327 ක මුදලක් දරමින් අඛණ්ඩව සිදුකර තිබුණි. | මෙයටද ඉහත සඳහන් අයිතම 3.2.1 (අ) (i) හි සඳහන් කරන ලද හේතු අදාල වේ. |
| | | **(iii)** මාර්ග පුළුල් කිරීම් හා වැඩි දියුණු කිරීම් කටයුතු යටතේ සිදුකල මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන වැඩ පිළිබඳ තොරතුරු විගණනයට ලැබී නොතිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරියට අයිති නොවන වැඩ සඳහා අදාල විස්තර ඇමුණුම් අංක 2 මගින් ලබාදී ඇත. |
| | | **(iv)** තවද, 2011 වර්ෂය සඳහා වූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම යටතේ පළාත් 10 ක පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීම් සඳහා වූ ව්‍යාපෘති 68ක් හඳුනාගෙන තිබුණි. කෙසේවෙතත්, ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් නොවුනු ව්‍යාපෘති 28ක වැඩ ඉටුකර තිබුණු අතර ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් වූ ව්‍යාපෘති 30 ක වැඩ , 2011 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. | ඉහත අංක 3.2.1 (අ) (i) හි සඳහන් කරන ලද හේතු අදාල වේ. |
| | | ඉහත කරුණු සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් ඉදිරිපත් කල කරුණු පැහැදිලි කිරීම් පහත දක්වා ඇත. | |
| | | "වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් නොවුනු සමහර පළාත්වල මාර්ග සංවර්ධන වැඩ සමහරක් හදිසි අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන ප්‍රමුඛතා පදනම මත භාරගෙන තිබුණු අතර එම පළාත්වල මුලික වෙන් කිරීම් මුදල ඉක්මවා ගොස් තිබුණි. කෙසේ වෙතත්, වර්ෂ අවසානයේදී එම වෙන් කිරීම් ගලපමින් එම පළාත් අතර ප්‍රතිවෙන් කිරීම් සිදු කෙරිණි." | |
| | (ආ) | **<u>මාර්ග නඩත්තු කටයුතු</u>** | |
| | | මාර්ග නඩත්තු කටයුතු සඳහා රජයෙන් හා වෙනත් නියෝජිත ආයතන වලින් ලැබුණු අරමුදල් යටතේ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන කාර්යයන් ඉටුකිරීම තුලින් අධිකාරියේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි දැක්වුණු ඉලක්ක වලින් බැහැර වීම සාමාන්‍ය ලක්ෂණයක් විය. අධිකාරියෙන් ලබාගත් තොරතුරු හා 2011 වාර්ෂික ප්‍රගති වාර්තාව අනුව , සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 500ක් වෙන් කර තිබුණු නමුත් මාර්ග සංවර්ධන වැඩ සඳහා වැය කර තිබුණු රු.මිලියන 6,942ක් වූ මුළු වියදම තුළ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවූ වැඩ | |

| | | | |
|---|---|---|---|
| | | ඇතුලත්ව හදිසි වැඩ සඳහා වැයකළ රු.මිලියන 2,631 ක මුදලක්ද ඇතුලත්ව තිබුණි. | |
| | | මේ සම්බන්ධයෙන් පහත සඳහන් වැඩිදුර නිරික්ෂණ කරනු ලැබේ. | |
| | | **(i)** ප්‍රගති වාර්තා අනුව, පළාත් අටක පිහිටි ප්‍රාදේශිය කාර්යාල විසින් නිරන්තර මාර්ග නඩත්තු වැඩ සටහන් සඳහා වු වාර්ෂික වෙන් කිරිම් ඉක්මවා රු.මිලියන 580.82 ක මුදලක් වැයකර තිබුණු අතර බස්නාහිර පළාතේ ප්‍රාදේශිය කාර්යාල එම කාර්යය සඳහා වෙන්කර තිබුණු මුදලින් රු.මිලියන 50.40 ක මුදලක් ඉතිරි කර තිබුණි. | මාර්ග නඩත්තු වියදම් කාලගුණය හා අනිකුත් කරුණු හේතුවෙන් ඉහල යාමක් සිදුවේ. පළාත් අටෙහිම මාර්ග නඩත්තු කටයුතු වෙනුවෙන් සඳහන් කරන ලද වියදම් වැඩිවී ඇත්තේ අයහපත් කාලගුණය හේතුවෙන් මාර්ග පරිහානියට පත්වීම මගිනි. බස්නාහිර පළාතේ බොහොමයක් මාර්ග නඩත්තු වියදම් මගින් පුනරුත්ථාපනය කිරිම සෙමින් සිදුවේ. |
| | | **(ii)** මාර්ග නඩත්තු වැඩ සටහන යටතේ අඛණ්ඩ වැඩ සඳහා වු වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මෙහි දක්වා තිබුණු ඉලක්ක සපුරා නොතිබුණු අතර ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 121.97 ක මුදලක් උපයෝජනය නොකර පැවතුණි. | වැඩ සටහනට අනුව ගිවිසුම්ගත සමහර වැඩ සම්පූර්ණ කිරිමට හා කරගෙනයාමට නොහැකි වි ඇත්තේ අමුද්‍රව්‍ය හිඟකම හා අයහපත් කාලගුණ තත්වය හේතුවෙනි. නමුත් අනාගතයේදි ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගැනිමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ. |
| | | **(iii)** මාර්ග නඩත්තු වැඩ සටහන යටතේ කාලින නඩත්තු වැඩ සටහන් සඳහා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ දක්වා තිබුණු ඉලක්ක සපුරා නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 456.16ක මුදලක් උපයෝජනය නොකර පැවතුණි. කෙසේ වෙතත් , උතුරු පළාතේ ප්‍රාදේශිය කාර්යාල වෙත සමාලෝචිත වර්ෂය සඳහාවු වෙන් කිරිම් රු.මිලියන 74.19 කින් ඉක්මවා තිබුණි. | මෙයද ඉහත 3.2.1. (ආ) (i) හා (ii) හි සඳහන් කරන ලද කරුණු හේතුවේ. |
| | | **(iv)** වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ දක්වා තිබුණු මාර්ග නඩත්තු වැඩසටහන යටතේ ජලප්‍රවාහන හා ව්‍යුහයන් වැඩිදියුණු කිරිම් වැඩ සඳහා වු ඉලක්කද සපුරා නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 164.68 ක මුදලක් උපයෝජනය නොකර පැවතුණි. කෙසේ වෙතත් , උතුරු පළාතේ ප්‍රාදේශිය කාර්යාල සඳහා වෙන්කර තිබුණු රු.මිලියන 31 ක මුදල වෙන් කිරිම් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය නොකර පැවතුණි. | මෙයද ඉහත 3.2.1. (ආ) (i) හා (ii) හි සඳහන් කරන ලද කරුණු හේතුවේ. |
| | **(ඇ)** | **<u>සේවාදායක වැඩ</u>** | |
| | | සිරිතක් වශයෙන් ජල සැපයුම , විදුලිය වැනි උපයෝගිතා සේවාවන් වලදි සිදුවන වැඩි දියුණු කිරිම් හේතුවෙන් සිදුවන හානි නිවැරදි කිරිම සඳහා මාර්ග සංවර්ධන වැඩ සිදුකිරිමට විවිධ බාහිර ආයතන අධිකාරිය වෙත මුදල් තැන්පත් කරනු ලැබේ. මෙම තැන්පතු සඳහා වෙනම බැංකු ගිනුමක් පවත්වන නමුත් නිසිලේඛණ නොමැතිවිම හේතුවෙන් තැන්පතුව සිදුකිරිමට හේතුව, ඇස්තමේන්තුගත වැඩ වල ස්වභාවය හා පිරිවැය , තැන්පතුව සිදුකළ දිනය හා වැඩ සම්පූර්ණ කිරිමට | |

| | | | |
|---|---|---|---|
| | | අපේක්ෂිත දිනය යනාදි විස්තර වහාම ලබා ගැනීමට නොහැකි විය. තවද , අදාල කාර්යයන් කාලීනව සම්පූර්ණ කිරීමට වූ බැඳීම් පිළිබඳ නොසලකා අධිකාරිය විසින් එම තැන්පත් මුදල් වෙනත් කාර්යයන් සඳහා යෙදවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය. | |
| | | විස්තරය පහත දැක්වේ. | |
| | | **(i)** සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා පහකදී සේවා දායක වැඩ තැන්පත් මුදල් වලින් රු.මිලියන 1.402 ක මුදලක් අධිකාරියේ නිලධාරීන් විසින් විදේශ ගමන් සඳහා වැය කර තිබුණු බව නිරීක්ෂණය විය. | මෙය මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය මගින් නිලධාරීන් දෙදෙනෙකුගේ විදේශ පුහුණු වැඩසටහන් සඳහා වූ වියදම් ප්‍රතිපූර්ණයට ලබාදෙන මුදලකි. එය වැරදීමකින් සේවාදායක තැන්පතු ගිණුමට බැරකර ඇත. මෙය සේවාදායක තැන්පතු මුදලක් නොවන අතර එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| | | **(ii)** ඉන්ධන අග්‍රිම නිරවුල් කිරීම සඳහා උතුරු පළාත් අධ්‍යක්ෂ වරයා වෙත රු.මිලියන 5 ක් නිදහස් කර තිබුණි. | මෙම මුදල සේවාදායක තැන්පතු ගිණුමෙන් ගෙවීමේ හදිසි අවශ්‍යතාවය මත ලබාගන්නා ලදී. |
| | | **(iii)** සමාලෝචිත වර්ෂය තුලදී තැන්පත් මුදල් වලින් රු.මිලියන 829.2ක් ප්‍රති මිලදී ගැණුම් වෙළඳපල තුල ආයෝජනය කර තිබුන අතර ඉන් රු.මිලියන 611.2 ක මුදලක් වර්ෂය අවසාන වන තෙක් ආයෝජන වශයෙන් පැවතුණි. | රු.මිලියන 829.2ක මුදලින් , සේවාදායක තැන්පතු ගිණුමේ වසරට අදාල ගෙවීම් සඳහා රු.මිලියන 218ක මුදලක් පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාල වෙත යවන ලදී. ඉතිරි අගය වන රු.මිලියන 611.2ක මුදල වසර අවසානයේ ආයෝජනයන්හි ඉතිරිව ඇත. |
| | | **(iv)** තවද , අදාල සේවාදායක වැඩවලට සම්බන්ධ නොවූ මාර්ග පුළුල් කිරීම් හා වැඩිදියුණු කිරීම් කටයුතු සඳහා රු.මිලියන 117ක මුදලක් වැය කර තිබුණි. | රු.මිලියන 117ක මුදල ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් හඳුනාගත් ග්‍රාමීය මාර්ග වැඩි දියුණු කිරීම සඳහා සේවාදායක තැන්පතු කාර්යයක් වශයෙන් ලැබුණු ප්‍රතිපාදනයකි. මෙම මුදල වැඩ අංශයෙන් කරන ලද වැඩ සඳහා ගෙවීම් වෙනුවෙන් එම අංශයට මාරු කර ඇති අතර, ගෙවීම් සේවාදායක තැන්පත් ගිණුමට ගිණුම්ගත කර ඇත. |
| | **3.2.2.** | <u>වාණිමය කටයුතු මෙහෙයුම්</u> | |
| | | අධිකාරිය , ජාතික මාර්ගවල ඉදිකිරීම් හා නඩත්තු සම්බන්ධ වාණිජමය කටයුතු කිහිපයක් සිදුකර තිබුණි. අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව , සමාලෝචිත වර්ෂය තුලදී එම වාණිජමය කටයුතුවල මෙහෙයුම් ප්‍රතිඵල පහත දැක්වේ. | |
| | | | |

| විස්තරය | අන්තර්සව් කොන්ක්‍රීට් ගල් නිෂ්පාදනය රු.000 | ඇස්පෝල්ට් නිෂ්පාදනය රු.000 | පෙරසව් අංගනයේ මෙහෙයුම් රු.000 | දක්ෂිණ අධිවේගී මාර්ගයේ මෙහෙයුම් රු.000 |
|---|---|---|---|---|
| ආදායම මෙහෙයුම් | 64,364 | 1,752 | 5,495 | 74,940 |
| වියදම් මෙහෙයුම් | 77,346 | 1,488 | 4,579 | 40,924 |
| ලාභය / (පාඩුව) | (12,982) | 264 | 916 | 34,016 |

| | | | |
|---|---|---|---|
| | | මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| | **(අ)** | අධිකාරිය සමාලෝචිත වර්ෂය තුළ ඇස්පෝල්ට් නිෂ්පාදන පිරියත හතරක් ක්‍රියාත්මක කර තිබුණු අතර විගණනය විසින් සමහර පිරියතවල කර තිබුණු පරීක්ෂාවන් සම්බන්ධ නිරීක්ෂණ සමහරක් පහත දැක්වේ. | |
| | | **(i)** ඇස්පෝල්ට් නිෂ්පාදන ක්‍රියාවලිය තුල ආදාන/ප්‍රතිදාන අනුපාත සඳහා තාක්ෂණික ප්‍රමිතීන් හෝ ආදාන මත සිදුවන සාමාන්‍ය පාඩුව කල්තබා නිෂ්චය කර නොතිබුණි. ඒ අනුව , නිෂ්පාදන ක්‍රියාවලියේදී සිදුවන අසාමාන්‍ය අපතය / වැඩිපුර පාවිච්චි කිරීම් විගණනයේදී තීරණය කළ නොහැකි විය. උපයෝජනය කළ ද්‍රව්‍ය සඳහා තාක්ෂණික ප්‍රමිතීන් නොවීම හේතුවෙන් කැරගල පිහිටි පිරියත භෞතික සත්‍යාපනයේදී නිරීක්ෂණය වූ ශේෂය සමග රු.2,829,120 ක්වූ පරිශ්‍රයේ තොග පොත් ශේෂය අතර විචලනය සඳහා හේතු නිශ්චය කළ නොහැකි විය. අධිකාරියේ සභාපති වරයාගේ පැහැදිලි කිරීම අනුව නිෂ්පාදන ක්‍රියාවලියේදී ආදාන මත 5% ක පමණ සාමාන්‍ය අපතයන් සිදුවන බව සැලකිය හැකිය. අමුද්‍රව්‍ය ආදාන මැනීමේදී මෙට්‍රික් ටොන් වෙනුවට කියුබික් මීටර් යොදාගැනීමේ ප්‍රතිඵලයක් ලෙස කැරගල පිරියතෙහි ද්‍රව්‍යවල වෙනසක් පෙන්වා තිබුණි. | නිමැවුම් ක්‍රියාවලියේදී සාමාන්‍ය අලාභ ප්‍රතිශතය යෙදවුම් වලින් 5% ක් පමණ වේ. කිසිදු අසාමාන්‍ය අලාභයක් මෙම පෙරමුසු අංගන හතරේ නිෂ්පාදනයන්හිදී විමර්ශනය වී නොමැත. විගණන විමසුමේ දක්වන ලද වෙනසට හේතු වී ඇත්තේ අමුද්‍රව්‍ය යෙදවුම් ගණනයේදී මෙට්‍රික් ටොන් වෙනුවට කියුබික් මීටර් භාවිතයට ගැනීම හේතුවෙනි. |
| | | **(ii)** 2011 ජනවාරි හා පෙබරවාරි මාස වල ඉංගිරිය පිරියතෙහි ලබා ගත් නියැදි මත සිදුකළ තත්ත්ව පරීක්ෂණ මත, ගුණාත්මක තත්ත්වයන්ගේ පිරිහීම් කිහිපයක් වාර්තාවී තිබුණි. කෙසේ වෙතත් , ගුණාත්මක තත්ත්වය පිරිහීම සම්බන්ධ හේතු හඳුනාගෙන නිවැරදි කිරීමේ කාර්යයන් සඳහා පියවර ගෙන නොතිබුණි. පරීක්ෂණ වාර්තා අනුව පොදුවේ පිළිගත් ප්‍රමිතීන් මත බැදුම් ස්තරය නිෂ්පාදනයේදී පෙනෙර ප්‍රමාණය හා පෙරමුසු නිෂ්පාදනයේ අපේක්ෂිත ප්‍රමාණයන් එකඟවී නොතිබුණි. | මිශ්‍රණයේ ගුණාත්වය මේ වන විට නිවැරදි කර ඇත. |
| | | **(iii)** ඉංගිරියේ පිහිටි ඇස්පෝල්ට් නිෂ්පාදන අංගනයේ සිදුකල හදිසි පරීක්ෂාවකදී , මෙට්‍රික් ටොන් 9,353 ක ඇස්පෝල්ට් , ලිඛිත ඉල්ලීම් නොමැතිව විධායක ඉංජිනේරු කාර්යාල වෙත නිකුත්කර තිබුණු බව අනාවරණය විය. | ඉදිරියේදී ලිඛිත ඉල්ලීමක් නොමැතිව පෙරමුසු නිකුත් නොකරන ලෙසට උපදෙස් ලබාදී ඇත. |

| | | | |
|---|---|---|---|
| | | | |
| | **(ආ)** | වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය 2011 වර්ෂයේදී අන්තර් බද්ධ කොන්ක්‍රීට් ගල් ඇතිරීම සම්බන්ධ ව්‍යාපෘතියක් දියත් කර තිබුණු අතර අන්තර් බද්ධ කොන්ක්‍රීට් ගල් නිෂ්පාදනය ආරම්භ කිරීම සඳහා මග නැගුම ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ අධිකාරියේ පළාත් අධ්‍යක්ෂකවරු වෙත කොන්ක්‍රීට් ගල් නිෂ්පාදන යන්ත්‍ර 54 ක් මිලදී ගැනීමට එකතුව රු.මිලියන 57ක් වූ එකතු අග්‍රිම මුදලක් ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| | | **(i)** වරාය හා මහා මාර්ග අමාත්‍යාංශයෙන් ලබාගත් තොරතුරු අනුව , විධායක ඉංජිනේරු කාර්යාල වල තිබෙන යන්ත්‍ර 54ක් අතුරින් යන්ත්‍ර 17ක් සමාලෝචිත වර්ෂය තුලදී කිසිදු කොන්ක්‍රීට් ගලක් නිෂ්පාදනය කර නොතිබුණි. අධිකාරියේ සභාපතිවරයා විසින් කළ පැහැදිලි කිරීම් අනුව ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් වැඩ කරනු ලබන විවිධ දේශිය සංවිධාන වලින් ලැබෙන ඉල්ලීම් මත ඇතිරුම් ගල් නිෂ්පාදනය කරනු ලැබේ. එම සංවිධාන වලින් ඉල්ලීම් සිදු නොකිරීම නිසා අදාල යන්ත්‍ර මගින් නිෂ්පාදන කටයුතු සිදුකර නොතිබුණි. | විවිධ ප්‍රාදේශිය සංවිධාන (ග්‍රාමීය සමිති) මගින් කරගෙන යනු ලබන ඉදිකිරීම් කටයුතු වලට අවශ්‍ය වන ඇණවුම් සඳහා පමණක් මූලික වම අන්තර් බද්ධ කොන්ක්‍රීට් ගල් අතුරණ ලද කොටස් (Paving Blocks) නිපදවීම සිදු කරයි. මෙම සංවිධාන මගින් කිසිදු ඇණවුමක් නොකරන ලද සමහර කොට්ඨාශවලදී කිසිදු නිපදවීමක් කර නොමැත. දැනට සියළුම යන්ත්‍ර මගින් මෙහෙයුම් කටයුතු සිදුකරන අතර මෙම අන්තර් බද්ධ කොන්ක්‍රීට් ගල් අතුරණ ලද කොටස් (Paving Blocks) නිපදවීමද සිදු කරයි. |
| | | **(ii)** වෙනත් යන්ත්‍ර 24 ක දෛනික නිෂ්පාදනය කොන්ක්‍රීට් ගල් 400 කට වඩා අඩුවෙන් පැවතුණ බව නිරීක්ෂණය විය. තවද, නිට්ටඹුව හා බණ්ඩාරවෙල පිහිටි විධායක ඉංජිනේරු කාර්යාල වල තිබුණු යන්ත්‍ර දිර්ඝ කාලයක් තුල අළුත්වැඩියා කිරීමට පියවර නොගෙන අබලි වශයෙන් පැවතුණි. අමුද්‍රව්‍ය හා ශ්‍රමය හිඟතාවයක් හේතුවෙන් තංගල්ල හා ඇඹිලිපිටිය පිහිටි විධායක ඉංජිනේරු කාර්යාලවල පැවති වෙනත් යන්ත්‍ර කිහිපයක් නිශ්කාර්යව හෝ අඩු උපයෝජනයක් සහිතව පැවතුණි. | පිළිගත හැකි මට්ටමකට කොන්ක්‍රීට් ගල් නිපදවීමට අවශ්‍ය සියළුම පියවරයන් ගෙන ඇත. මෙම යන්ත්‍රවලට අදාල නඩත්තු කටයුතු සිදුකර ඇති අතර මේ වන විට ඒවා ක්‍රියාත්මක තත්වයේ පවතී. අමුද්‍රව්‍ය ඌණතාවයට හේතුව මේ වන විට අනාවරණය කරගෙන ඇත. |
| | | **(iii)** සමාලෝචිත වර්ෂය තුලදී ගල් 1,418,557 ක් නිෂ්පාදනය කර තිබුණු නමුත් උතුරු පළාත් අධ්‍යක්ෂක කාර්යාලය විසින් කොන්ක්‍රීට් ගල් විකිණීම සම්බන්ධ තොරතුරු අධිකාරියේ ප්‍රධාන කාර්යාලය වෙත එවා නොතිබුණි. තවද, කොළඹ පිහිටි පළාත් අධ්‍යක්ෂ කාර්යාලය සමාලෝචිත වර්ෂය තුලදී නිපදවා තිබුණු කොන්ක්‍රීට් ගල් 61,161 ක් අතුරින් කොන්ක්‍රීට් ගල් 9,500 ක් විකුණා තිබුණි. තවද, මීගමුවේ පිහිටි විධායක ඉංජිනේරු කාර්යාලය සමාලෝචිත වර්ෂය තුළ ගල් 76,593 ක් නිපදවා ඉන් ගල් 44,000 ක් විකුණා තිබුණි. ලැබී තිබුණු තොරතුරු අනුව ග්‍රාමීය මාර්ගවල ගල් ඇතිරීම සඳහා කොන්ත්‍රාත් භාරගත් බොහෝ ග්‍රාම සංවර්ධන සමිති හා ගොවි සමිතිවල මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් සමහර පළාත්වල කොන්ක්‍රීට් ගල් නිෂ්පාදනය හා විකිණීම පිළිබඳ කාර්ය සාධනය අසතුටුදායක මට්ටමක පැවතුණි. | කොන්ක්‍රීට් ගල් වලට අදාල විකුණුම් ආදායම ප්‍රධාන කාර්යාලයේ ගිණුම්වල වාර්තාකර ඇත. නිපදවන ලද ප්‍රමාණයන් , නිමවුම් පිරිවැය, විකුණන ලද ප්‍රමාණය , ඉතිරි තොග යනාදී විස්තර අදාල පළාත් කාර්යාල වල තිබේ. |

| | | | |
|---|---|---|---|
| | | | |
| | **(ඇ)** | දක්ෂිණ අධිවේගී මාර්ගයේ මෙහෙයුම් 2011 නොවැම්බර් 26 දින ආරම්භ කරන ලද අතර 2011 දෙසැම්බර් 31 දින වන තෙක් දක්ෂිණ අධිවේගී මාර්ගය භාවිතා කරන්නන්ගෙන් රු.මිලියන 74,940 ක මුදලක් එකතු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | |
| | | **(i)** දක්ෂිණ අධිවේගී මාර්ගය විවෘත කිරීම වෙනුවෙන් බාහිර පාර්ශවයන්ගෙන් ලැබී තිබුණු රු.මිලියන 7,4 ක්වූ ත්‍යාග මුදල් හා ඒ මත වැය කරන ලද රු.මිලියන 10.171 මුදල , වාණිජ කටයුතු වලින් වූ අතිරික්තයට ඇතුලත් විය. | එකඟ වේ. |
| | | **(ii)** දක්ෂිණ අධිවේගී මාර්ගයේ අන්තර් හුවමාරු මධ්‍යස්ථාන වල සේවා නියුක්ත නිලධාරීන් සඳහා මෙහෙයුම් අත්පොත පිළියෙළ කර බෙදාහැර නොතිබුණි. ඒ අනුව , ඔවුන්ගේ රාජකාරි , වගකීම් හා අධිවේගී මාර්ගය භාවිතා කරන්නන් සඳහා වූ ක්‍රියාමාර්ගයක් නිසිපරිදි තීරණය කර නොතිබුණි. අධිවේගී මාර්ගය පාවිච්චි කරන්නන්ගෙන් ගාස්තු අය කිරීම වාහන වර්ගය අනුව තීරණය කරන අතර අධිවේගී මාර්ගයට ඇතුළු වන වාහන අන්තර් හුවමාරු මධ්‍යස්ථාන වලදී පද්ධතිය තුලින්ම හඳුනාගැනීම වෙනුවට මිනිස් ඇසින් හඳුනා ගනු ලැබේ. ඒ අනුව , වාහන වර්ගය සාවද්‍ය ලෙස හඳුනාගැනීම මගින් ආදායම්<br><br>වංචා කිරීම පිළිබඳ මෙහෙයුම් අවධානමක් පවතී. අධිකාරියේ සභාපතිවරයාට අනුව , ඇතුළුවීමේ ටිකට්පත වාහන වර්ගය සමග සසඳන ලෙස පිටවීමේ දොරටුවල සේවා නියුක්ත නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇති අතර යම් සාවද්‍ය හඳුනාගැනීමක් හෙළිදරව් වූ විට එය ආසන්න පද්ධති කැමරා මගින් හඳුනාගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත වාර්තා කළ යුතු වේ. | මේ වන විට අත්පොතක් සකස්කර ඇති අතර , අත් පත්‍රිකා නිලධාරීන් (tellers) අතර බෙදාදීම කෙරෙමින් පවතී. වාහන හඳුනාගැනීමේදී වන විෂමාචාරයන් වැලැක්වීමට මේ වන විට පහත පියවර ගෙන ඇත.<br>❖ පිටවීම් දොරටුවේ සිටින නිලධාරියා (teller) විසින් ඇතුල්වීමේ දොරටුවෙන් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍රය සමඟ වාහන වර්ගය පරීක්ෂා කර වැරදි හඳුනා ගැනීමක් වේ නම් එය හඳුනාගෙන ප්‍රධාන නිලධාරි (Head teller) වෙත දැනුම් දීම සිදු කරයි.<br>❖ ප්‍රධාන නිලධාරි විසින් CCTV කැමරා නිරීක්ෂණය මගින් තීරණයක් ගෙන එය පිටවීම් දොරටුවේ සිටින නිලධාරි වෙත දැනුම් දෙයි.<br>❖ පිටවීම් දොරටුවේ සිටින නිලධාරියා විසින් සංශෝධිත ප්‍රවේශ පත්‍රයක් වාහන වර්ගය සඳහා නිකුත් කර අවශ්‍ය නම් මුදල් ලබාගෙන ලොග් සටහනක් මගින් මෙම කාර්යය සටහන් කරයි. |
| | **3.2.3.** | **<u>කොන්ත්‍රාත් පරිපාලනය</u>** | |
| | | පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | |

| | | | |
|---|---|---|---|
| | **(අ)** | පාලම් ඉදිකිරීමේ නවතම සංකල්පයක් යටතේ සැලසුම් කළ පුස්සැල්ලාව - උලපනේ මාර්ගයේ පිහිටි ආරුක්කු පාලමේ ඉදිකිරීම් රු.මිලියන 42 ඇස්තමේන්තුගත පිරිවැයකට 1999 වර්ෂයේදී ආරම්භකර තිබුණි. කෙසේ වෙතත්, රු.මිලියන 34.085 ක පිරිවැයක් දැරීමෙන් අනතුරුව මාර්ග ඉදිකිරීම් හා සංවර්ධන සමාගම නමින් වූ අධිකාරියේ උප සමාගම විසින් කරනු ලැබූ ඉදිකිරීමේ කටයුතු 2003 වර්ෂයේදී අතරමග නවතා තිබුණි. පසුව, රු.මිලියන 75.007 ක් වටිනා ඉතිරි වැඩ කොටස් සම්පූර්ණ කිරීමේ කොන්ත්‍රාත්තුව රාජ්‍ය සංවර්ධන සහ ඉදිකිරීමේ සංස්ථාවට ප්‍රධානය කර තිබුණු අතර 2009 ජුනි 18 දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු විය. කෙසේ වෙතත් , රු.මිලියන 54.967 ක මුදලක් ඒ සඳහා වැයකර තිබුණු නමුත් 2011 දෙසැම්බර් 31 දින වන තුරුත් වැඩ සම්පූර්ණ කර නොතිබුණි. තවද , ඉදිකිරීම් පරිශ්‍රයේ තාවකාලිකව ගොඩනගා තිබුණු බේලි පාලම සඳහා වියදම් දැරීමට කොන්ත්‍රාත්කරුවන් එකගවී තිබුණද 2011 දෙසැම්බර් 31 දින වන තෙක් ඒ සඳහා රු.මිලියන 1.324 ක මුදලක් අධිකාරිය විසින් දරා තිබුණි. ඊට අමතරව , බේලි පාලම සඳහා වානේ බාර් මිලදී ගැනීම සඳහා රු.මිලියන 2.058ක මුදලක් අධිකාරිය විසින් වැයකර තිබුණි. | මාර්ග ඉදිකිරීම් හා නිර්මාණ සමාගමේ ඈවර කිරීමේ කටයුතු සැලසුම් කල අයුරින් නිම කිරීමට නොහැකි විය. මෙම සමාගම 2003 වසරේ ඈවර කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. රාජ්‍ය නිර්මාණ හා සංවර්ධන සංස්ථාව වෙත 2004 වසරේදී මෙම කොන්ත්‍රාත්තුව පිරිනමන ලද අතර ඉදිකිරීම් කටයුතු 2004 වසරේ දෙසැම්බර් මාසයේදී ආරම්භ කරන ලදී. ඉදිකිරීම් ක්‍රියාවලිය අතරතුරදී මාර්ග සංවර්ධන අධිකාරිය මගින් නිමකල යුතු දිනය කොන්ත්‍රාත්කරුගේ පාලනයෙන් බැහැරව පැවති විවිධ හේතු මත දීර්ඝ කරන ලදී.<br>වැඩයේ ප්‍රගතිය ප්‍රමාදවීම හේතුවෙන් අවවාද කිරීමේ ලිපි කිහිපයක් නිකුත් කරන ලද අතර අවසානයේදී මෙම කොන්ත්‍රාත්තුව නිම කරන ලදී. මෙම කොන්ත්‍රාත්තුව නැවත ප්‍රදානයට අවශ්‍ය පියවර ගන්නා ලදී. කොන්ත්‍රාත් ගිවිසුම අනුව ප්‍රමාණ පත්‍රයේ බේලි පාලම් Baily Bridges නඩත්තුවේදී රු.132,382.00 ක් යකඩ තට්ටු ප්‍රතිස්ථාපනයට යකඩ දඬු සඳහා රු.2,057,742 ක්ද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වියදම් කර ඇත. මේවා නඩත්තු වියදම් නොවන අතර , මෙම වියදම් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් දැරිය යුතු අතර එම කටයුතු පාලමේ කොටස් ප්‍රතිස්ථාපනය සඳහා අදාලවේ. |
| | **(ආ)** | අඹේපුස්ස - ත්‍රිකුණාමලය මාර්ගයේ දඹුල්ල සිට හබරණ දක්වා වූ කොටස (කි.මී.21.5) ප්‍රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව , මෙම මාර්ගයේ කන්තලේ සිට ත්‍රිකුණාමලය හා අඹේපුස්ස සිට දඹුල්ල කොටස්වල ප්‍රතිසංස්කරණය හා වැඩි දියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව භාරගෙන තිබුණු කොන්ත්‍රාත් කරු වෙත ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීමෙන් තොරව ප්‍රදානය කර තිබුණි. | 2011 වසරේ අයවැය යෝජනා මගින් දේශීය වාණිජ බැංකු මගින් ණය ලබා ගැනීමට රජය තීරණය කරන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ මාර්ග සංවර්ධන අධිකාරියට දේශීය බැංකු මගින් ණය ලබා ගැනීමට බලය පවරා දී ඇත. කැබිනට් මණ්ඩල අනුමැතියද මේ සඳහා ඉල්ලා ඇත. මෙම යෝජනා ක්‍රමය යටතේ කොන්ත්‍රාත්කරු විසින් මෙම මාර්ගයේ මාර්ග කොටසක් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමට කොමර්ෂල් බැංකුවේ මූල්‍ය ආධාර ඇතුව ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. එම යෝජනාව ඇගයීමෙන් පසු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන කොන්ත්‍රාත්තුව පිරිනැමීම සිදු කරයි. |
| | **(ඇ)** | විශේෂ වැඩ පැවරුමක් වශයෙන් මධ්‍යම පළාත් අධ්‍යක්ෂ කාර්යාලයේ අධීක්ෂණය යටතේ දළදා මාළිගාව පරිශ්‍රය තුල කොන්ක්‍රීට් ගල් ඇතිරීමේ කාර්යය සමාලෝචිත වර්ෂයේදී සිදුකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. | |
| | | | |

| | | | |
|---|---|---|---|
| | | **(i)** අදාල කොන්ත්‍රාත්තුව රු.මිලියන 36.83 ක පිරිවැයකට පෞද්ගලික සමාගමකට ප්‍රදානය කර තිබුණු අතර පසුව, විචලතා නියෝග දෙකක් යටතේ මූලික ඇස්තමේන්තුවෙන් 36% ක නියෝජනය වූ රු.මිලියන 28.87 කින් ආරම්භක ඇස්තමේන්තුව ඉහල දමා තිබුණි. | එම ඇස්තමේන්තුව අධ්‍යක්‍ෂ වැඩ විසින් නිර්දේශ කර අධ්‍යක්‍ෂ ජනරාල් විසින් අනුමත කර ඇත. |
| | | **(ii)** තවද, මෙම කාර්යය හදිසි වැඩ සේ සලකා තිබුණු අතර රජයේ ප්‍රසම්පාදන මග පෙන්වීම් 2006 හි 3.8 ජේදයට පටහැනිව කොන්ත්‍රාත්කරුවන්ට මිළ ගණන් ඉදිරිපත් කිරීමට දින 12 ක කාලයක් පමණක් ලබාදී තිබුණි. | දළදා මාලිගා පිවිසුම් මාර්ගයේ කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීමට මූලික කොන්ත්‍රාත්තුව පිරිනමන ලදී. නුවර නගර අලංකරණය කිරීමේ වැඩසටහන යටතේ දළදා මාවතේ පදික වේදිකාව ඉදිකිරීමටද තිරණය කරන ලදී. මෙම වැඩද එම කොන්ත්‍රාත්තුව යටතේ සිදු කරන ලද අතර එම වෙනස්වන අගයන් කොන්ත්‍රාත්තුවේ අගය වැඩිකිරීමෙන් ලබා දෙන ලදී. |
| | | **(iii)** කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර මාසයක කාලයක් තුල , 2011 ජුනි 13 දිනට පෙර , අදාල වැඩ නිම කරන ලෙස කොන්ත්‍රාත්කරුට ආරම්භයේ දි උපදෙස් දි තිබුණු නමුත් වැඩ නිම කිරීම සදහා 2011 නොවැම්බර් 15 දින වන තෙක් මාස පහක් සදහා කාලය දිර්ඝ කිරීමක් ලබාදී තිබුණි. | මෙම වැඩය ඉතා ඉක්මනින් නිමකල යුතු වුවක් නිසා කොන්ත්‍රාත්කරු ද ඉතා ඉක්මනින් තෝරා ගන්නා ලදි. එනිසා මිල කැඳවුම් ලබා දීමටද දෙන ලද්දේ දින 12ක් පමණි. එනිසා අපේක්‍ෂිත ආකාරයෙන් වැඩය නිම කිරීමට නොහැකි වූයේ<br><br>❖ අමතර වැඩ හේතුවෙන් විෂය පථය වැඩිවීම ඉහත (ඇ) (ii) විස්තර කල ආකාරයට.<br>❖ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබා ගැනීමට ප්‍රමාද වීම.<br>❖ දළදා විදිය ඔස්සේ යකඩ වැට වෙනත් කොන්ත්‍රාත්කරුවකු විසින් ඉදිකිරීම හේතුවෙන් අවහිරතා සිදුවීම.<br>❖ වැසි සුළං සහිත කාළගුණ තත්වය හා වෙනත් පාරිසරික සාධක හේතුවෙන් |
| | | **(iv)** 2011 නොවැම්බර් මාසයේදි සිදුකල භෞතික පරික්ෂණයේදි කොන්ක්‍රීට් ගල් ඇතිරීමේ කාර්යයයේ අඩුපාඩු නිරික්ෂණය වී තිබුණු නමුත් අඩුපාඩු සම්බන්ධ වගකීම් කාලය තුල ඒවා නිවැරදි කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. තවද , අධිකාරිය විසින් කරන ලද තත්ව පරික්ෂණ වලදී ගල් 50 කින් සමන්විත නියැදියකින් ගල් 10 ක් ගුණාත්මක තත්වයේ නොවුනු බව අනාවරණය වී තිබුණු අතර ඉන් පෙනියන්නේ කොන්ක්‍රීට් | කොන්ත්‍රාත්කරු සොයා ගැනීමෙන් පසු පදික වේදිකාව සඳහා උප ප්‍රමාණික කොන්ක්‍රීට් කුට්ටි (Grade 15) ඉදිරිපත් කරන ලද මිල ගණන් වෙනුවට (Grade 30) භාවිතා කරන ලදි. එනිසා වර්ග මීටරයකට ඉදිරිපත් කරන ලද මිල වන රු. 1,537.50 ක මුදල රු. 1,514.50 දක්වා අඩුකරන ලදි. සොයා ගන්නා ලද වැරදිද ප්‍රතිශෝධනය කරන ලදි. |

| | | | |
|---|---|---|---|
| | | ගල් නිෂ්පාදනයේදි ගුණාත්මක තත්වයෙන් බාල අමුද්‍රව්‍ය යොදාගෙන තිබුණු බවය. | |
| | (ඇ) | මධ්‍යම පළාත් අධ්‍යක්ෂ කාර්යාලය මහනුවර නගරයේ මාර්ග තත්වය වැඩිදියුණු කිරීම සඳහා "සාක් සමුළු" වැඩ සටහන නමින් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. | |
| | | **(i)** ඉටුකරන ලද සත්‍ය වැඩ ප්‍රමාණය සමග සසදන විට මාර්ග වැඩි දියුණු කිරීමේ වැඩ සඳහා අධි-ඇස්තමේන්තුවක් පිලියෙල කර තිබුණි. 2.5% සිට 37% පරාසයක් තුළ විෂයයන්ගේ එවැනි විචලතාවයන් තිබීමෙන් පෙනී යන්නේ ඇස්තමේන්තු පිළියෙල කිරීමේදි නිසි භෞතික මිනුම් ගෙන නොතිබුණු බවයි. අධිකාරියේ සභාපතිවරයාගේ පැහැදිලි කිරීම අනුව , සාක් සමුළුවට අවශ්‍ය පහසුකම් සැපයීම අරමුණු කරගෙන මහනුවර නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ නගරයේ සියළුම මාර්ග සඳහා ඇස්පෝල්ට් කොන්ක්‍රිට් ඇතිරීමට බලාපොරොත්තුවෙන් මූලික ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි. කෙසේවෙතත්, සමුළුව පැවැත්වීම පසුව කොළඹ නගරයට මාරු කරන ලද අතර වැඩවල විෂයය පථය හා ස්වභාවය අඩුකරන ලදුව ජලපවාහන වැඩ හා අළුත්වැඩියා කටයුතු පමණක් ඉටුකර තිබුණි. | මෙම කොන්ත්‍රාත්තුව මූලිකවම ප්‍රධානය කරන ලද්දේ සාක් සමුළු ව්‍යාපෘතිය යටතේ නුවර නගර සංවර්ධන ව්‍යාපෘතිය ඉලක්ක කරගෙනය. මෙම සාක් සමුළුව නුවර නගරයේ පැවැත් විමට කලින් තිරණය කර තිබුනි. මූලික ඇස්තමේන්තුව නගරයේ සියළුම මාර්ග වලට පෙරමුසු කොන්ක්‍රිට් (Asphalt Concrete) ඇතිරීම ඉලක්ක කරගෙන සකස් කරන ලදි. නුවර නගරයේ සමුළුව නොපැවැත් වූ නිසා වැඩයේ විෂය පථය මෙන්ම ස්වභාවයද අඩු කරන ලදි. එනිසා ජලවහන පද්ධති හා නඩත්තු කටයුතු පමණක් සිදුකරන ලදි. කොන්ත්‍රාත්කරු සමඟ එකඟතාවයෙන් පසු කොන්ත්‍රාත් අගය නැවත ඇස්තමේන්තු කරන ලද අතර කොන්ත්‍රාත් අගයද අඩු කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස මූලික ඇස්තමේන්තුවේ ඉතිරියක් පවති. |
| | | **(ii)** අධි ඇස්තමේන්තු මත ඇතිවූ ඉතිරි කිරීම්, විචලතා නියෝග කිහිපයක් අනුමත කිරීම තුලින් කොන්ත්‍රාත්කරු ලවා කාර්යාල උපකරණ , පරිගණක යනාදිය ප්‍රසම්පාදනය කිරීමට හා කාර්ය මණ්ඩල නිවාස අළුත්වැඩියා කිරීමට යොදා ගෙන තිබුණි. | මෙම කොන්ත්‍රාත්තුව පැකේජයක් වශයෙන් සහ වැඩ කටයුතු ගණනාවක් ලෙස මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලයේ සුපරීක්ෂය යටතේ සිදුකරන ලදි. නිල නිවාස පිළිසකර කර පරිපාලන කාර්යයන් සඳහා භාවිතයට ගැනීම මගින් කාර්යාල කුලියට ගැනීම වෙනුවෙන් වැයවන පිරිවැය අඩුකර ගැනීමට හැකිවිය. පරිපාලන වියදම් වෙනුවෙන් කොන්ත්‍රාත්තුවේ වෙන්කිරීමක් තිබෙන අතර, එම අගයේ අදහස කොන්ත්‍රාත්තුවේ පරිපාලන කාර්යයන් සඳහා සම්බන්ධ වන ඉංජිනේරුවරයාට අවශ්‍ය පරිපාලන පහසුකම් හා කාර්යාල උපකරණ ලබාගැනීම සඳහා වෙන්කරනු ලබන මුදල වේ. |
| | (ඉ) | අධිවේගී මාර්ග කළමණාකරණය ඒකකයේ පරිහරණය සඳහා ස්ථාවර වත්කම් ප්‍රසම්පාදනය කිරීමට අධිකාරිය සමාලෝචිත වර්ෂය තුළදී පියවර ගෙන තිබුණි. | |

| | | | |
|---|---|---|---|
| | | (i) ආරම්භක අදියරේදී ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. ඒ අනුව මිලදී ගැනීමට අවශ්‍ය වූ විෂයයන් නිසිලෙස හඳුනාගෙන නොතිබුණි. | අධිවේගී මාර්ග යනු අළුත්ම අත්දැකීමක් වන නිසා එයට අවශ්‍ය වත්කම් කලින් පැහැදිලිව හඳුනා ගැනීම දුෂ්කරය. එනිසා ආරම්භක අවස්ථාවේ දි මිලදී ගැනීමේ සැලසුම් සකස් කිරීම සිදුකල නොහැකිය. |
| | | (ii) ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා පත්කර තිබුණු ටෙන්ඩර් මණ්ඩලය , අධිවේගී මාර්ග කළමනාකරණ ඒකකයට අනුයුක්ත නිලධාරින්ගෙන් පමණක් සමන්විත විය. තවද, රු.මිලියන 2.905 ක පිරිවැයකට මිලදී ගෙන තිබුණු වානේ සේප්පු 50 ක් සම්බන්ධ ටෙන්ඩර් ලියකියවිලි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණු. | ටෙන්ඩර් මණ්ඩලය ප්‍රධාන කාර්යාලයේ නිලධාරින්ගෙන්ද සමන්විතය. මාර්ග සංවර්ධන අධිකාරියේ මිලදී ගැනීම් කමිටුවේ සේප්පු 50 ක් මිලදී ගැනීම සඳහා වන ටෙන්ඩර් මණ්ඩල තීරණ හා අදාල ලියවිලි තිබේ. |
| | | (iii) සාප්පු ක්‍රමය හරහා අත්‍යාවශ්‍ය පදනම මත අන්තර් හුවමාරු මධ්‍යස්ථානවල මෙහෙයුම් සඳහා භාවිතා කිරීමට රු.මිලියන 6.577 පිරිවැයකට විවිධ විෂයයන් මිලදීගෙන තිබුණි. කෙසේ වෙතත්, අදාල සැපයුම් කරුවන් එම වත්කම් සපයා තිබුනේ දින 20 සිට 166 දක්වා වූ කාල පරාසයක සැලකිය යුතු ප්‍රමාදයන් මතය. | බොහෝක් අයිතම ඇණවුම් කරන ලද අතර ඒවා වෙළඳපලේ පහසුවෙන් ලබා ගැනීමට නොහැකිය. එනිසා සැපයුම් කරුට ඒවා සැකසීමට හෝ මාර්ග සංවර්ධන අධිකාරියේ ඇණවුම ලැබුනු පසු ඇණවුම් කිරීමට හෝ සිදුවිය. එනිසා එම ප්‍රමාදය අනිවාර්යයෙන් සිදුවන්නකි. |
| | (ඊ) | ගම්පහ විධායක ඉංජිනේරු කාර්යාලය , එම කාර්යාලය සඳහා කම්කරුවන් 208 දෙනෙක් අනුයුක්ත කර තිබියදීත් මාර්ග සංවර්ධන කටයුතු සහ කැරගල පිහිටි ඇස්පෝල්ට් පිරියතෙහි වැඩ සඳහා අමතර කම්කරුවන් 15 දෙනෙකු පිටතින් ලබාගැනීමේ පදනම මත සේවයේ යොදවා ගෙන තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව සඳහා මිල ගණන් ඉදිරිපත් කළ සේවා සපයන්නන් තිදෙනා අතුරින් තෝරාගත් සැපයුම්කරු ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු වශයෙන් නොව ශ්‍රමිකයන් සපයන්නෙකු වශයෙන් ලියාපදිංචි වී තිබුණි. තවද, මහා මාර්ග ප්‍රමිත අනුප්‍රමාණ සමග සසඳන විට එක් කම්කරුවකු සඳහා ඉදිරිපත් කර තිබුණු අනුප්‍රමාණ නුපුහුණු ශ්‍රමිකයෙකු සඳහා 43% ක් කින් හා පුහුණු ශ්‍රමිකයකු සඳහා 84% කින් වැඩියෙන් එකඟ වී තිබිණි. | ගම්පහ විධායක ඉංජිනේරු කාර්යාලයේ ඒවන විට පැවති වැඩ ප්‍රමාණය ඉතා අධිකය. එම අධික වැඩ ප්‍රමාණය ඉටු කිරීමට සිටි කම්කරුවන්ගේ ප්‍රමාණය ප්‍රමාණවත් නොවිය. අනිකුත් ප්‍රාදේශීය අධිකාරී මගින්ද මෙම කොට්ඨාශයේ ශීඝ්‍ර මාර්ග සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම නිසා මෙම කොට්ඨාශයේ කම්කරුවන්ට ඉහල ඉල්ලුමක් පැවති අතර ඔවුන්ගේ කුලී ගාස්තුවද ඉහළ අගයක් ගන්නා ලදී. එනිසා මෙම අමතර කම්කරුවන් ඉතා ඉහළ අගයක් ගෙවා සේවයේ යෙදවීමට සිදු විය. කොන්ත්‍රාත් පදනම යටතේ කම්කරුවන් ලබා ගැනීමට කැඳවන ලද මිල ගණන් සඳහා සැපයුම් කරුවන් තිදෙනෙක් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි. කොන්ත්‍රාත්තුවේ හදිසි අවශ්‍යතාවය සලකා අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ සැපයුම්කරුට කොන්ත්‍රාත්තුව පිරිනමන ලදී. |
| | (උ) | සිරිතක් වශයෙන් , අධිකාරිය පිටස්තර පාර්ශවයන්ගෙන් වාහන කුළියට ලබාගනු ලබයි. අධිකාරියේ කටයුතු සඳහා පිටස්තර පාර්ශවයන්ගෙන් වාහන ලබාගැනීමේ ඵලදායිතාවය තීරණය කිරීම සම්බන්ධයෙන්වූ විගණනයේදී | |

| | | | |
|---|---|---|---|
| | | පහත කරුණු නිරීක්ෂණය විය. | |
| | | (i) වාහන කුලියට ලබා ගැනීම පිළිබඳ ඉදිරිපත් කල මිල ගණන් ඇගයීම සඳහා අධිකාරිය විසින් පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටුව රියදුරු හා ඉන්ධන සැපයීමෙන් තොරව වාහන සපයන්නන් සඳහා මහා මාර්ග ප්‍රමිත අනුප්‍රමාණයන්ට 10% පොදුකාර්යය හා 20% ලාභ තිරුවක් එකතු කරමින් උපරිම මිලක් ගණනය කිරීම අනුමත කර තිබුණි. කෙසේ වෙතත් , වාහන කුලියට සැපයීම සම්බන්ධයෙන් උපරිම අනුප්‍රමාණ තිර්ණය කිරීමේදී එවැනි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | අපගේ මහා මාර්ග උපලේඛන අනුපාතයන්හි (H S R) සඳහන් වාහන කුලී ගාස්තුව වන මිල 1993, 1998 ආදී වසර වලදී කුලියට ගන්නා ලද වාහන සඳහා අදාල වන මිල ගණන් වේ. එම මිල ගණන් වාහන කුලියට ලබා දීමට බලාපොරොත්තු වන මිල ගණන් හා සැසඳීමේදී ඉතා අවම මට්ටමක පවතී. මහා මාර්ග උපලේඛන අනුපාතයන්හි අගය ගණනය කරන සූත්‍රය, සාමාන්‍යයෙන් වාහන කුලියට දීමට බලාපොරොත්තු වන මිල ගණන් හා ගැනුම් මිල සමග සැසඳීමේදී කපා හරින අනුපාතය තිරණයට භාවිතා කරයි. |
| | | (ii) කොන්ත්‍රාත්කරු සපයන ලද වාහන වර්ගය වෙනස් කිරීම හා රියදුරු සහ ඉන්ධන සැපයීමේ පදනම හෝ රියදුරු හා ඉන්ධන නොමැතිව වාහන සැපයීමේ පදනම වෙනස් කිරීම හා ඒ මත ගාස්තු අය කළ අවස්ථා කිහිපයක් නිරීක්ෂණය විය. | වාහන කුලියට ලබාදීමේදී අදාල නියමයන් හා කොන්දේසි හි පරිච්ජේද අංක 12 ට අනුව ,වාහනයක් ක්‍රියාවිරහිත වීම ,අනතුරකට පත්වීම හෝ නඩත්තු කටයුතු වෙනුවෙන් වාහනය යොමු කරවීමේ දී සැපයුම්කරු විසින් සේවාව බාධාවකින් තොරව පවත්වාගෙන යාමට මුල් වාහනයට සමාන තත්වයෙන් යුතු වාහනයක් ලබා දීම සිදු කරනු ලබයි. එසේ නොමැතිව වාර්තාවේ දක්වන ලද සිද්ධීන් වාර්තා වී නොමැත. |
| | 3.2.4 | <u>**මතභේදයට තුඩුදුන් කරුණු**</u> | |
| | | පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| | (අ) | එවකට මහාමාර්ග දෙපාර්තමේන්තුවෙන් මාරු කරන ලදුව, අධිකාරියට අයත්ව තිබූ නාරාහේන්පිට පිහිටි ඉඩමක් 2009 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරියට අයත්ව තිබුණු ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි ඉඩමකට බදු පදනම මත හුවමාරු කර තිබුණි. අළුතින් අත් කර ගත් ඉඩම ශ්‍රී ලංකා රාමන්කද්කද නිකාය ආරක්ෂක සභාව විසින් පරිහරනය කර තිබුණු අතර 2009 මර්තු 25 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ලද අනුමැතය යටතේ 2010 හා 2011 වර්ෂවල අවස්ථා තුනකදී රු.මිලියන 50ක් එම සභාව වෙත ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ගණුදෙනුව සඳහා එළඹීමට පෙර ඉඩම් තක්සේරු නොකිරීම හේතුවෙන් එම ගෙවීම් තිරණය කිරීමේ පදනම විගණනයේදී නිශ්චය කළ නොහැකි විය. | මහා මාර්ග මහා ලේකම් කාර්යාලය සෑදීම සඳහා නාරාහේන්පිට පිහිටි ඉඩම ප්‍රමාණවත් නොවූ බැවින් ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි ඉඩම අත්පත් කරගන්නා ලදි. මේ සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රාමඤ්ඤ මහා නිකායේ අති පූජ්‍ය මහා නාහිමියන් සමඟ සාකච්ඡා ගණනාවක් පවත්වා අදාල ඉඩම හුවමාරු කිරීම සඳහා කැමැත්තද මෙම හුවමාරුව වෙනුවෙන් යම් මුදලක් ගෙවීමටද එකඟ වෙන ලදි. |
| | | | |

| | | | |
|---|---|---|---|
| | (ආ) | අඹේපුස්ස - ත්‍රිකුණාමලය මාර්ගයේ දඹුල්ල සිට හබරණ කොටසේ (කි.මී.21.5) පුනරුප්ථාපන හා වැඩි දියුණු කිරීම් සිදු කිරීම සඳහා 9% වාර්ෂික ස්ථාවර පොලියකට රු.මිලියන 1,534 ක ණය පහසුකමක් වානිජ බැංකුවකින් අධිකාරිය ලබා ගෙන තිබුණු අතර මේ සඳහා වර්ෂ දෙකක සහන කාල සීමාවකින් පසු ගෙවිය යුතු ණය වාරික හිලව් කිරීම සඳහා අධිකාරියේ මුල්‍ය තත්ත්වය හා අනාගත මුල්‍ය ප්‍රවාහයන් තක්සේරු කර නොතිබුණි. තවද , රු.මිලියන 1,534 ක්වු මුළු ණය මුදලින්, වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල වු රු.මිලියන 274 ක් ද ඇතුලත්ව 2011 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 453.7 ක් පමණක් උපයෝජනය කර තිබුණි. | වැඩ සඳහා කොන්ත්‍රාත්තුව මාස 20 ක කාලයක් තුලදී නිමකලයුතු අතර කොන්ත්‍රාත්කරු 2011 මැයි මාසයේ වැඩ ආරම්භ කර මාස 08 ක් තුලදී 2011 වසර අවසානයේදී වැඩය නිමකරන ලදී. වැඩය නිමකල කාලය හා සැසඳීමේදී කොන්ත්‍රාත්තුවේ මුළු දිග ප්‍රමාණයේ භෞතික ප්‍රගතිය 45% ක් වු අතර එය අපේක්ෂා කල මට්ටමට වඩා වැඩි අගයකි. ණය මුදල ප්‍රයෝජනයට ගැනීමේ ප්‍රමාදයත්, වැඩයේ භෞතික ප්‍රගතිය ප්‍රමාද නොවීමත් නිසා නිසැකවම රජයට මුදල් ඉතිරියක් සිදුවේ. පොළිය වශයෙන් බැංකුවට ගෙවිය යුතු වන්නේ ණය මුදලින් භාවිතයට ගන්නා ලද ප්‍රමානයට අදාල පොළිය වේ. |
| | 3.2.5 | <u>**වත්කම් කළමනාකරණය**</u> | |
| | | පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| | (අ) | පිළිවෙලින් මාර්ග හා පදික මං තිරු තත්ත්ව සමීක්ෂණය සඳහා මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය විසින් රු.මිලියන 92.689 ක් වටිනා බහු ක්‍රියාකාරි ජාලගත සමීක්ෂණ වාහනයක් හා රු.මිලියන 30.128 ක් වටිනා බර මිණුම් ඩිප්ලෙක්ටෝමීටරයක් ප්‍රසම්පාදනය කර අධිකාරිය වෙත 2010 වර්ෂයේදී භාර දී තිබුණි. ප්‍රගති වාර්ථා අනුව, සමාලෝචිත වර්ෂය තුලදී කි.මී. 3932.7 ක් දුර මාර්ග හා කි.මී.1,452.20 ක් දුර පදික මං තිරු සමීක්ෂණය කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළදී සමීක්ෂණ කිරීමට බලාපොරොත්තු වු මුළු දුර ප්‍රමාණයෙන් 54% ක් පමණක් සම්පුර්ණ කර තිබුණු බව අධිකාරියේ ප්‍රගති වාර්ථා වල දක්වා තිබුණි. | මෙම යන්ත්‍ර භාවිතය හා ප්‍රමාණය පිළිබඳ පෙර පළපුරුද්දක් මාර්ග සංවර්ධන අධිකාරියට නොමැති නිසා අත්දැකීමක් වශයෙන් 2011 වසර සඳහා වන වැඩසටහන සකස්කර ඇත. කෙසේ වෙතත් ඉදිරි වැඩසටහන් සකස් කිරීමේදී 2011 වසරේ එම යන්ත්‍ර වලින් ලබා ගන්නා ලද පළපුරුද්ද වැසි සුළං සහිත අයහපත් කාළගුණය හා වාහන ක්‍රියා විරහිත වීම වැනි වැඩ නැවැත් වීමට හේතු විය හැකි සාධකද සලකා බලයි. |
| | (ආ) | බේස්ලයින් මාවතේ සිදු කරන ලද සංවර්ධන වැඩ හේතුවෙන් අවතැන් වු පුද්ගලයින් නැවත පදිංචි කිරීම සඳහා 1999 වර්ෂයේදී අක්කර 11 රූඩ් 08 හා පර්චස් 38.3 කින් යුත් ඉඩමක් අත්තිඩිය ප්‍රදේශයෙන් අත්පත් කරගෙන තිබුණු අතර එය අදාල අරමුණ සඳහා උපයෝජනය කර ගෙන නොතිබුණි. අධිකාරිය අවස්ථා හතකදී රු.මිලියන 123 ක් ගෙවා තිබුණු අතර ඒ අතුරින් රු.මිලියන 28 ක් ජපන් අධාර ව්‍යාපෘතියක් විසින් මුල්‍යණය කර තිබුණි. තවද, 2005 වර්ෂයේ සිට අක්කර 2 ක ප්‍රමාණයක් සුනාමියෙන් පිඩාවට පත් වු පවුල් නැවත පදිංචි කිරීම සඳහා ඉඩ දී තිබුණු අතර, අක්කර 03 රූඩ් 01 පර්චස් 26.7 ක් වු වෙනත් කොටසක් 2007 සැප්තැම්බර් 06 දින සිට පෞද්ගලික සමාගමකට කුලියට | අත්තිඩියේ ඉඩමේ මුළු ප්‍රමාණය වන අක්කර 11 රූඩ් 02 පර්චස් 38.3 කින්, රජයේ තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද වටිනාකම වන රු 150,000 කට එක ඉඩම් කොටසක් පමණක් 2009 වසරේ සිට පුද්ගලික සමාගමකට කුලියට දී ඇත. අදාල කුලිය නියමාකාරයෙන් එකතු කර ගනී. |

| | | | |
|---|---|---|---|
| | | දී තිබුණි. තවද , සමාගම විසින් එදින සිට රු.150,000 ක මාසික කුලි මුදලක් පමණක් ගෙවා තිබුණු නමුත් 2008 වර්ෂයේදි මෙම මුළු ඉඩමේ කුලි වටිනාකම රු.500,000 ක් ලෙස තිරණය කර තිබුණි. | |
| | (ඇ) | අදාල මාර්ගවල ධාවනය වන අධි බරැති ට්‍රක් රථවල බර මැනිමට තැන්නේකුඹුර ඩිපෝවේ රු.654,679 ක් වටිනා කිරුම් තරාදියක් ස්ථාපිත කර තිබුණි. කෙසේ වෙතත් , රියදුරන්ගේ විරෝධතාවයන් හේතුවෙන් එහි වැඩ ආරම්භ කළ 2011 මැයි 20 දින සිටම මිනුම් කටයුතු අඩාල වී තිබුණු අතර කිරුම් තරාදිය එදින සිට නිශ්කාර්යව පැවතුණි. අදාල කිරුම් තරාදිය පටු ස්ථානයක ස්ථාපිත කර තිබුණු බව නිරික්ෂණය වු අතර එම ස්ථානයේ නිසි ආරක්ෂාවන් නොවිය. 2010 හා 2011 වර්ෂය සඳහා කිරුම් තරාදිය වෙනුවෙන් බලපත්‍ර ලබා ගැනිම සඳහා රු.153,753 ක් වැය කර තිබුණි. | රජයේ නිලධාරින් සමඟ පැවති ප්‍රගති සමාලෝචන රැස්විමක දී ජාතික මහා මාර්ග වලට වන හානිය වැලැක්විමට මහියංගනයේ සිට පැමිනෙණ ට්‍රක් රථ වල බර සහතික කිරිමට තැන්නේකුඹුර ඩිපෝවේ කිරුම් තරාදියක් ස්ථාපනයට තිරණය කරන ලදි. විවිධාකාර ප්‍රායෝගික ගැටළු හේතුවෙන් බලාපොරොත්තු වු ආකාරයට මෙම කාර්ය ක්‍රියාවේ යෙදවිමට නොහැකි විය. මෙම කිරුම් තරාදිය මාර්ග සංවර්ධන අධිකාරියේ තැන්නේකුඹුර මාර්ග නඩත්තු අංගනයේ ඇත. |
| | (ඈ) | 2011 අගෝස්තු මාසයේදි රු.මිලියන 1.4 ක පිරිවැයකට මිලදි ගෙන තිබුණු කාසි ගණනය කිරිමේ යන්ත්‍ර 20 ක් අධිවේගි මාර්ග කළමණාකරන ඒකකයේ ගබඩා පරිශ්‍රය තුළ මිලදි ගත් දින සිට නිශ්කාර්යව පැවති බව නිරික්ෂණය විය. අධිවේගි මාර්ග කළමණාකරන ඒකකයේ නිලධාරින් විසින් කළ පැහැදිලි කිරිම් අනුව අධිවේගි මාර්ගය පරිහරනය කරන්නන් සඳහා අවම ගාස්තුව රු.50 සිට තිරණය කරන ලද අතර එක් අන්තර් හුවමාරුවක් සඳහා ගාස්තුව රු.100 බැගින් වැඩි කර තිබුණි. ඒ හේතුවෙන් අධිවේගි මාර්ග මෙහෙයුම් සඳහා කාසි ගණනය කිරිමේ යන්ත්‍ර අවශ්‍යය නොවිය . | අධිවේගි මාර්ගය භාවිතා කිරිමේ ගාස්තු කිලෝ මිටර් පදනම මත ගණනයට මුලින් තිරණය කර තිබුන අතර ඒ සඳහා රු 10 ට අඩු කාසි වටිනාකම් භාවිතයට අවශ්‍ය විය. මෙම යන්ත්‍ර මිලදි ගැනිමෙන් පසු ගාස්තු ගණනය කරන පදනම වෙනස් කල නිසා ඒවා අවශ්‍ය නොවිය. කෙසේ වෙතත් මෙම යන්ත්‍ර වලින් ප්‍රයෝජනයක් ගැනිමට ඉදිරියේ දි බලාපොරොත්තු වේ. |
| | (ඉ) | 2010 මාර්තු 23 දින චීන ආධාර ව්‍යාපෘතියක් වෙතින් ලැබී තිබුණු මාර්ගවල කුඩා ගල් ඇතිරිමේ යන්ත්‍ර 11 ක් අදාල කාර්යයන් සඳහා උපයෝජනය නොකර අධිකාරියේ මොරටුව අඟුලානේ පරිශ්‍රය තුල තිබුණි. | මාර්ග වල කුඩා ගල් ඇතිරිමේ යන්ත්‍ර චීන ආධාර ව්‍යාපෘතියක් යටතේ ශ්‍රි ලංකා යුධ හමුදාව විසින් මාර්ග සංවර්ධන අධිකාරියට සපයන ලදි. මාර්ග සංවර්ධන අධිකාරියේ වැඩසටහන් අනුව දැනට ද්විත්ව මුදිත තාර ආලේප වැඩසටහන් අවම මට්ටමකින් කරමින් පවති. එනිසා සමහර යන්ත්‍ර නිෂ්ක්‍රියව පවති. මෙම යන්ත්‍ර වල පළල අඩි 15 ක් පමණ වන නිසා සම්මත මාර්ගයන්හි භාවිතයට ගැනිම අසිරු කරුණක් වේ. |
| | (ඊ) | යන්ත්‍ර ක්‍රියාකරුවන් බඳවා ගැනිම ප්‍රමාද විම හේතුවෙන් 2010 දෙසැම්බර් 11 දින මගනැගුම සමාගම් වෙතින් ලැබී තිබුණු ලියවන පට්ටල් යන්ත්‍ර 12 ක් එදින සිට නිශ්කාර්යව පැවතුණි. | යන්ත්‍ර ක්‍රියාකරුවන් මේ වන විට බඳවාගෙන ඇති නිසා යන්ත්‍ර ද භාවිතයේ පවති. |
| | | | |

| | | | |
|---|---|---|---|
| | (උ) | වාර්ෂිකව ඉතා සුළු තොග විෂයයන් ප්‍රමාණයක් නිකුත්වීම හේතුවෙන් ගබඩා පරිශ්‍රයේ තිබුණු රු.මිලියන 32.248 වටිනා තොග සෙමින් චලනය වන තොග වශයෙන් නිරීක්ෂණය විය. වංචාකාරී කටයුතු හේතුවෙන් අස්ථානගත වූ රු.329,964 ක් වටිනා තොග විෂයයන්ද ඊට ඇතුලත්ව තිබුණු අතර අදාල කරුණු පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | මේවා OECF ණය යෝජනා ක්‍රමය යටතේ ලැබුනු අමතර කොටස් හා අනිත් පරිභෝජ්‍ය ද්‍රව්‍ය වේ. මෙම අයිතම මාර්ග සංවර්ධන අධිකාරියේ භාවිතයට නොගන්නා නිසා විකිණීමට අවස්ථා ගණනකදි උත්සාහ කලද ගැණුම්කරුවකු සොයා ගැනීමට නොහැකි විය. අනවශ්‍ය අයිතම විකිණීමට ඉදිරියේදි පියවර ගනු ලැබේ. |
| | 3.2.6 | **<u>මානව සම්පත් කළමනාකරණය</u>** | |
| | (අ) | සේවක බලකාය බඳවා ගැනිම, අනුයුක්ත කිරිම , සංවර්ධනය හා වැටුප් ගෙවීම ඵලදායි ලෙස සිදු කිරිම සඳහා අධිකාරිය නිසි මානව සම්පත් සැලැස්මක් පිලියෙළ කර ක්‍රියාත්මක කර නොතිබුණි. 2003 ජුනි 02 දිනැති අංක පිඊඩී/12 දරණ රාජ්‍යය ව්‍යවසායන්හි යහ පාලනය සඳහා වු මහ පෙන්වීම් චක්‍රලේඛයේ 9.3.1 ඡේදය ප්‍රකාරව රාජ්‍ය ආයතනවල බඳවා ගැනිමේ හා උසස්කිරීමේ ක්‍රම වේදය, රාජ්‍යය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ එකඟත්වය ඇතිව රේඛිය අමාත්‍යංශය හා ආයතනයේ පාලක මණ්ඩලය විසින් අනුමත කළ යුතුය. කෙසේ වෙතත් , අධිකාරියේ බඳවා ගැනිම් හා උසස් කිරිමේ ක්‍රම වේදය සඳහා එකඟත්වය 2011 දෙසැම්බර් 31 වන විටත් ලබා ගෙන නොතිබුණි . | මානව සම්පත් කළමනාකරණ සැලසුම් පිළියෙල කිරිම රාජ්‍ය පරිපාලන ප්‍රතිසංස්කරණ කොමිසම මගින් පත් කරන ලද උපදේශක වරුන් විසින් සිදු කරයි. එලෙසම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ක්‍රම වේදය පිළියෙල කිරිමද මේ වන විට නිමකර ඇත. |
| | (ආ) | අධිකාරියේ කාර්ය බලකාය, සේවකයන් 8000 ඉක්මවා තිබෙන අතර අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට එහි කාර්ය බලකායේ ශක්තිය විශාල පිටුබලයක් වී තිබෙන නමුත් මානව සම්පත් කළමණාකරන කටයුතු සඳහා අධිකාරිය වෙනම අංශයක් පිහිටුවා නොතිබුණි. අධිකාරියේ සංවිධාන සටහන අනුව, අධිකාරියේ මානව සම්පත් සංවර්ධන කටයුතු පරිපාලන අධ්‍යක්ෂකගේ අධීක්ෂණය යටතේ පරිපාලන හා මුදල් අංශය යටතේ ඉටු කරනු ලැබේ. | මානව සම්පත් කළමනාකරණ අංශයක් නිර්මාණය කිරීමේ යෝජනාව රාජ්‍ය පරිපාලන ප්‍රතිසංස්කරණ කොමසමේ වාර්තාවේද අඩංගු වී ඇත. |
| | (ඉ) | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - මුදල් හා පරිපාලන, වත්කම් කළමනාකරණ පිළිබඳ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් සහ කාර්ය සාධන විගණනය, ග්‍රාමිය පාලම්, පුහුණු ,ප්‍රසම්පාදන යනාදි ක්ෂේත්‍රවල මධ්‍යම කළමනාකරණ මට්ටමේ වෙනත් නියෝජ්‍ය අධ්‍යක්ෂ යන ප්‍රධාන තනතුරු 2011 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ දෙකකට වැඩි කාලයක් පුරප්පාඩුව පැවතුණි. | වත්කම් හා කළමනාකරණ අධ්‍යක්‍ෂ ජනරාල් තනතුර 2011.12.31 දින වන විට පුරවා ඇත. පුරප්පාඩුව පවතින මුදල් හා පරිපාලන අධ්‍යක්‍ෂ ජනරාල්ගේ තනතුර සහ කාර්ය සාධන විගණන අංශයේ පුරප්පාඩු අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ ක්‍රියා පිළිවෙල අනුව සිදු කිරීමට නියමිතය. අනුමත සේවක සංඛ්‍යාව අනුව ග්‍රාමිය පාලම් අංශයේ හා පුහුණු අංශයේ නියෝජ්‍ය අධ්‍යක්‍ෂ තනතුරු පැවතියද, මෙම අංග දෙකේ දැනට පවතින ක්‍රියාකාරකම් අනුව නියෝජ්‍ය අධ්‍යක්‍ෂවරුන්ගේ සේවාව අවශ්‍ය නොවේ. එනිසා එම තනතුරු පුරවා නොමැත. |

| | | | |
|---|---|---|---|
| | (ඊ) | රාජ්‍ය ව්‍යවසායන්හි යහ පාලනය සඳහා මග පෙන්වීම වල 8.3.9 ඡේදයට අනුගතව නිකුත් කර තිබුණු 2003 ජුනි 02 දිනැති අංක පිඊඩී/12 දරණ චක්‍රලේඛය හා 2004<br><br>ජනවාරි 08 දිනැති පිඊඩී 21 දරණ චක්‍රලේඛය අනුව , රාජ්‍ය ව්‍යවසායන්, තම සම්පත් රේඛීය අමාත්‍යාංශයට හෝ වෙනත් ආයතන වෙත පරිහරණයට කිරීමට ඉඩ නොදිය යුතුය. කෙසේ වෙතත් ,අධිකාරිය මෙම විධිවිධානයට අනුකූල වී නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ පහත දැක්වේ.<br><br>**(i)** ලැබී තිබුණු තොරතුරු අනුව, 2011 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ සේවකයින් 72 ක් රේඛීය අමාත්‍යාංශයට හා වෙනත් බාහිර ආයතන වෙත නිදහස් කර තිබුණි . ඒ අතුරින් සේවකයින් 45 දෙනෙකු සඳහා එකතුව රු.මිලියන 25.892 ක් වූ වැටුප් හා අතිකාල වියදම් , අදාල ආයතන වලින් ප්‍රතිපූර්ණය කර ගැනීමට පියවර නොගෙන අධිකාරියේ ආදායම එරෙහිව අය කර තිබුණි. තවද , සමාලෝචිත වර්ෂයේ වෙනත් සේවකයින් 27 දෙනෙකු වෙත ගෙවා තිබුණු එකතුව රු.මිලියන 3.618 ක අතිකාල වියදම් අය කිරීමට පියවර නොගෙන ඔවුන්ගේ වැටුප් පමණක් අය කර ගෙන තිබුණි. | නිදහස් කරන ලද සේවකයින් 72 ගෙන් රේඛීය අමාත්‍යාංශයට නිදහස් කරන ලද සේවකයින් අමාත්‍යාංශය සමඟ මාර්ග සංවර්ධන අධිකාරියේ කටයුතු සම්බන්ධීකරණයට සෘජුවම සමබන්ධ වේ. ඔවුන් රේඛීය අමාත්‍යාංශයට අනුයුක්ත කර ඇති අතර , ඔවුන් මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් අමාත්‍යාංශයේ සේවයේ නියුක්තව සිටී. එනිසා ඔවුන්ගේ වැටුප් හා අදාල ගෙවීම් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් දැරිය යුතු වේ. අනිකුත් සේවකයින්ගේ අතිකාල ගෙවීම් ද ප්‍රතිපූර්ණය කිරීම හා අයකර ගැනීම සිදුකරයි. ඔබගේ වාර්තාවේ සඳහන් වන රු 3,618,634 අතිකාල ගෙවීම් අයකර ගැනීමට නොමැති බවද දන්වමි. |
| | | **(ii)** තවද , අධිකාරියේ කටයුතු වලට සෘජු සම්බන්ධයක් නොතිබුණු හා බාහිර ආයතන වෙත නිදහස් කළ සේවකයින් වෙත 2011 පෙබරවාරි 11 දිනැති අංක 2995/සිඑල් /14 දරණ මාර්ග සංවර්ධනය අධිකාරියේ පරිපාලන චක්‍රලේඛය මඟින් තීරණය කරන ලද අතිකාල වැඩ සඳහා උපරිම පැය ප්‍රමාණය ඉක්මවා<br>රු.මිලියන 1.520 ක අතිකාල මුදලක් ගෙවා තිබුණි. | වැඩවල කාර්යය පරිමාව සලකාබලා අතිරේක වැඩ ප්‍රමාණයන් සඳහා අතිරේක පැය ගණන සේවයේ නියැලීමට ඉඩදීමට සිදුවිය. එම අමතර පැයගණන් නියමාකාරයෙන් අනුමත කර ඇත. |
| | | **(iii)** ඊට අමතරව, 2010 වර්ෂයේදි අධිකාරියේ මුරකරුවන් 10 ක් හා රියදුරකු එවකට මහජන සම්බන්ධතා සහ මහජන කටයුතු අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබුණි. තවද, ඔවුන් සඳහා වැටුප් හා අතිකාල වශයෙන් රු.මිලියන 2.879 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබුණි. කෙසේ වෙතත් , අදාල සේවකයින්ගේ වර්තමාන සේවා ස්ථානය අධිකාරිය විසින් දැනගෙන නොතිබුණි . | මාර්ග සංවර්ධන අධිකාරිය මෙම සේවකයින් පිළිබඳව දැන සිටි අතර ,ඔවුන්ව යලිත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත නිදහස් කරවා ගැනීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |
| | (ආ) | ප්‍රාදේශිය කාර්යාල සමහරක් අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා පුද්ගලයින් සේවා නියුක්ත කර තිබෙන බව නිරීක්ෂනය විය. අධිකාරියේ ගම්පහ සහ මහනුවර දිස්ත්‍රික්ක වල පිහිටි කාර්යාල තුනක් විසින් පුද්ගලයින් | සමහර ප්‍රාදේශිය කාර්යාල වලට අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා පුද්ගලයින් සේවයේ නියුක්ත කර තිබුනේ ,එම පළාත් වල මග නැගුම ,රන් අරුණ වැනි විශේෂ ව්‍යාපෘතීන් |

| | | | |
|---|---|---|---|
| | | 231 ක් සේවා නියුක්ත කර තිබුණු බව හදිසි පරීක්ෂණ වලදී හෙළිදරව් විය. | භාර ගෙන ඉටුකිරීම වෙනුවෙනි. |
| | 3.2.7. | **<u>වාහන උපයෝජනය</u>** | |
| | | පහත නිරීක්ෂණයන් කරණු ලැබේ. | |
| | **(අ)** | යාන්ත්‍රික අංශයේ වාර්ථා අනුව , 2011 දෙසැම්බර් 31 දිනට වාහන 403 ක් අධිකාරිය සතුව පැවති අතර එම වාහන අධිකාරිය විවිධ ආයතන/ ව්‍යාපෘති හා අධිකාරියේ විවිධ අංශ වලට අනුයුක්ත කර තිබුණි. කෙසේ වෙතත් , 2011 වර්ෂය සඳහා අධිකාරිය විසින් වාහන 895 ක් රක්ෂණය කර තිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරිය සතුව වාහන 946ක් ඇති අතර , එයින් ප්‍රයෝජනයට ගතහැකි වාහන 895ක් පමණක් ඇති අතර එම වාහන රක්‍ෂණය කර ඇත. විගණක වරුන් විසින් ගණනය කර ඇත්තේ ප්‍රධාන කාර්යාලය , ප්‍රවාහන අංශය පළාත් භාර අධ්‍යක්‍ෂ කාර්යාලය, ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය හා විධායක ඉංජිනේරු කාර්යාල වලට වෙන් කර ඇති වාහන පමණි. ඔවුන් විසින් පහත අංශ හා වෙනත් ආයතන වෙත වෙන් කර තිබූ වාහන ගණනය කර නොතිබුණි.<br>❖ පර්යේෂණ හා සංවර්ධන අංශය , ග්‍රාමීය පාලම් ව්‍යාපෘති අංශය , යාන්ත්‍රික අංශය, අධිවේගී මාර්ග කළමනාකරණ අංශය .<br>❖ ව්‍යාපෘති කළමනාකරණ අංශය .<br>❖ පෙරමුසු අංගන.<br>❖ වෙනත් ආයතන . |
| | **(ආ)** | 2011 දෙසැම්බර් 31 දිනට බාහිර පාර්ශවයන් වෙත වාහන 20 ක් භාරදී තිබුණ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් , යාන්ත්‍රික අංශයේ එම වාහන භාර දුන් දිනයන් පිළිබඳ විස්තර නොවීය. 2011 වර්ෂය සඳහා එම වාහන බලපත් අළුත් කිරීම හා රක්ෂණය සඳහා රු.719,501 ක් ගෙවා තිබුණි. | බාහිර පාර්ශවයන් වෙත භාර දෙන ලද වාහන පිළිබඳ විස්තර යාන්ත්‍රික අංශයේ ඇති අතර , මෙයට අමුණා ඇත. මෙම වාහන මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වාහන වන අතර , අනතුරු සඳහා වන වගකීමද ,ඒවායින් වියහැකි අලාභයන් ද , ආදායම් බලපත්‍ර හා රක්‍ෂණ සහතික අළුත් කිරීමද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදුකල යුතු වේ. |
| | **(ඇ)** | ඉහත සඳහන් කල පරිදි බාහිර පාර්ශවයන් වෙත භාරදී තිබුණු වාහන පහක් අනතුරු වලට භාජනය වී තිබුණු බව නිරීක්ෂණය විය. ඒ පිළිබඳ වූ සමස්ථ පාඩුව පිළිබඳ | |

| | | | |
|---|---|---|---|
| | | විස්තර පහත දැක්වේ. | |
| | | **(i)** අනතුරු වලට වගකිව යුතු පාර්ශව පිළිබඳ තොරතුරු නොමැති වීම හේතුවෙන් වාහන හතරකට සිදු වූ හානි පිළිබඳ රක්ෂණ වන්දි අයදුම් කිරීමට නොහැකි වී තිබුණි. | එම වාහන 5න් , 57/4199 දරණ වාහනයේ අළුත්වැඩියාව අනතුරක් හේතුවෙන් නොවන අතර එය සාමාන්‍ය අළුත්වැඩියාවකි. එය අගුලාන යාන්ත්‍රික වැඩපලේ අළුත්වැඩියා කරමින් පවතී. ඉතිරි වාහන 4න් GV-3437 හා GG 9370යන වාහන වල අළුත් වැඩියාවන් මේ වන විට නිමකර ඇති අතර රක්‍ෂණ හිමිකම් ලැබිය යුතුව ඇත. GD-0015 දරණ වාහනය රක්‍ෂණ ආවරණය යටතේ අළුත්වැඩියා කරමින් පවතියි. GQ-1883 දරණ වාහනය දක්‍ෂිණ අධිවේගි මාර්ග ව්‍යාපෘතියට අනුයුක්ත කර තිබූ එකක් වන අතර එය අනතුරට භාජනය වන විට රියදුරු විසින් අනවසරව භාවිතා කර තිබුනි. ඔහු කොන්ත්‍රාත් පදනම මත දක්‍ෂිණ අධිවේගි මාර්ග ව්‍යාපෘතියට අනුයුක්තව සේවය කරන අයෙකි. රියදුරාගේ සේවය අවසන් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදි. මේ වන විට වාහනයේ අළුත්වැඩියා කටයුතු නිම කර ඇතිඅතර ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාව වෙත අළුත්වැඩියා වියදම ප්‍රතිපූර්ණය කරන ලෙස අභියාචනයක් ඉදිරිපත් කර ඇත. අපට අවබෝධ වන විදියට අපගේ රක්‍ෂණ හිමිකම A කමිටුව වෙත විශේෂ අනුමැතියක් සඳහා ඉදිරිපත් කර ඇති අතර ,දඩ සඳහා කිසියම් මුදලක් අඩු කිරීමෙන් පසු රක්‍ෂණ හිමිකමෙන් කොටසක් අප වෙත ලැබීමේ හැකියාව පවතී. |
| | | **(ii)** 2008 අප්‍රේල් මාසයේ දි ජනාධිපති ලේකම් කාර්යාලය වෙත භාර දි තිබුණු මෝටර් වාහනයක් 2008 අප්‍රේල් 20 දින මඩකලපුව ප්‍රදේශයේ දි අනතුරකට භාජනය වී තිබුණි. කෙසේ වෙතත් , අළුත් වැඩියා කිරීමට හෝ වගකිවයුතු පාර්ශවයන්ගෙන් හානිය අයකර ගානීමට 2011 දෙසැම්බර් 31 දින වනතුරුත් පියවර ගෙන නොතිබුණි. | අළුත්වැඩියා කටයුතු මේ වන විට නිමකර ඇති අතර වාහනය ක්‍රියාකාරීත්වයේ පවතී. |
| | | **(iii)** මඩකලපුව පොලිස් ස්ථානය විසින් නිකුත් කළ 2010 පෙබරවාරි 03 දිනැති ලිපිය අනුව , 2008 අප්‍රේල් මාසයේ දී ජනාධිපති ලේකම් කාර්යාලය වෙත භාර දි තිබුණු වෙනත් වාහනයක් අයථා පරිහරනය සම්බන්ධයෙන් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවට පත් වී තිබුණි. එම වාහනය 2010 දෙසැම්බර් 17 දින සිට අගුලාන පිහිටි වැඩ බිම් පරිශ්‍රය තුළ ගාල් කර තිබෙන බව නිරික්ෂණය විය. වාහනය අයථා පරිහරනයට යොදාගත් පාර්ශවයන්ට | අගුලාන යාන්ත්‍රික වැඩපලේ මෙම වාහනයේ අළුත් වැඩියා කටයුතු සිදුකරමින් පවතී. |

<table>
<tr><td></td><td></td><td>එරෙහිව පියවර ගැනීමට හැකි වනු පිණිස ඔවුන් හඳුනා ගැනීමට පියවර ගෙන නොතිබුණි.</td><td></td></tr>
<tr><td></td><td>(ඉ)</td><td>මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කළ 2011 සැප්තැම්බර් 09 දිනැති ලිපිය මගින් උපදෙස් දී තිබුණු පරිදි මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ හා ව්‍යාපෘති කළමනාකරණ ඒකකවල සියළුම වාහන 2011 සැප්තැම්බර් 14 හා 15 දිනවල භෞතික සත්‍යාපනය සඳහා ඉදිරිපත් කල යුතු විය. කෙසේ වෙතත් ,වාහන 169 ක් භෞතික සත්‍යාපනය සඳහා ඉදිරිපත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව , සත්‍යාපන කාර්යයයේ නිවරදි බව හා සම්පූර්ණත්වය පිළිබඳ විගණනයේ දි තහවුරු කිරීමට නොහැකි විය.</td><td>මෙම ඉදිරිපත් නොකරන ලද සියළුම වාහන නොවැලැක්විය හැකි රාජකාරි කටයුතු සඳහා වාහන භෞතික සත්‍යාපන දිනයේ දි භාවිතා කර ඇති අතර භෞතික පරීක්ෂාව සඳහා ලබාදිම කල නොහැකිව ඇත. එනිසා එම වාහන සඳහා වගකිව යුතු නිලධාරීන්ගෙන් වාහනයේ උපයෝජ්‍යතාවය හා ස්වභාවය පිළිබඳව සෘජු තහවුරු කිරීමක් ලබා ගැනීමට කටයුතු කරමින් පවති.</td></tr>
<tr><td></td><td>3.2.8.</td><td><u>අයවැය ගත පාලනය</u></td><td></td></tr>
<tr><td></td><td></td><td>අධිකාරිය, ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තරාත්මක අයවැය ලේඛනයක් ඉදිරිපත් නොකල බව නිරීක්ෂණය වු අතර 2011 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන විෂයන් සම්බන්ධව ශේෂ පත්‍රයේ දැක්වු රු. මිලියන 1,597 ක මුළු මුදල හා රු. මිලියන 1,504 ක් වු අයවැය ගත වෙන් කිරීම් අතර වෙනස් වීම් සම්බන්ධ හේතු පරීක්ෂා කිරීමට නොහැකි විය. තවද, අයවැය ලේඛනයේ පෙන්වා තිබුණු පාංශු පරීක්ෂාව සඳහා ගාස්තු , අධීක්ෂණ ගාස්තු හා දඩ මුදල් යනා දි ආදායම් ප්‍රභවයන් සහ ප්‍රසාද හා දිරිගැන්වීම් දීමනා හා වාහන සැපයීම් යනාදි පරිපාලන වියදම් සහ සත්‍ය ශේෂයන් අතර විශාල වෙනස්වීම් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝජනය කර නොතිබුණි.</td><td>මෙම ඉදිරිපත් නොකරන ලද සියළුම වාහන නොවැලැක්විය හැකි රාජකාරි කටයුතු සඳහා වාහන භෞතික සත්‍යාපන දිනයේ දි භාවිතා කර ඇති අතර භෞතික පරීක්ෂාව සඳහා ලබාදිම කල නොහැකිව ඇත. එනිසා එම වාහන සඳහා වගකිව යුතු නිලධාරීන්ගෙන් වාහනයේ උපයෝජ්‍යතාවය හා ස්වභාවය පිළිබඳව සෘජු තහවුරු කිරීමක් ලබා ගැනීමට කටයුතු කරමින් පවති.</td></tr>
<tr><td></td><td>4.</td><td><u>පද්ධති හා පාලන</u></td><td></td></tr>
<tr><td></td><td></td><td>විගණනයේ දි නිරීක්ෂණය වූ පද්ධති හා පාලනයන්ගේ අඩුපාඩු මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය යටතේ නිකුත් කළ මගේ සවිස්තරාත්මක වාර්තාවෙන් අධිකාරියේ අවධානය පිණිස යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු වේ.<br>(අ) මාර්ග නඩත්තු සහ සේවා දායක වැඩ<br>(ආ) සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනු හෙළිදරව් කිරීම<br>(ඇ) ප්‍රාදේශිය කාර්යාල කළමනාකරණය<br>(ඈ) වාහන උපයෝජනය<br>(ඉ) වත්කම් කළමනාකරණය<br>(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය</td><td>අපගේ වාර්තාවන්ට අනුව 2011 වසර සඳහා වන විචලනයන් පහත පරිදි වේ.<br><table><tr><th>ආදායම් /වියදම් අයිතමය</th><th>ඇස්තමේන්තු ගත අගය<br>රු මිලියන</th><th>සත්‍ය අගය<br>රු මිලි</th><th>විචලනය<br>(%)</th></tr><tr><td>පස් පරීක්ෂාව සඳහා වන ගාස්තු</td><td>60</td><td>86.35</td><td>43.33</td></tr><tr><td>සුපරීක්ෂණ ගාස්තු</td><td>7.8</td><td>45.45</td><td>482.69</td></tr></table></td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| | | | මාර්ග පිළිසකර කිරීමේ ගාස්තු 60 57.35 4.41<br>දඩ මුදල්/ අධිභාර 0.1 0.23 130<br>වැටුප් හා වේතන 1611.64 1477.73 (8.31)<br>දිරි දීමනා 56.33 41.58 (26.18)<br>සේවක: පුහුණු කිරීම් 13.48 7.6 (43.62)<br>කාර්යාල සැපයුම් 50.00 49.43 (1.14)<br>වාහන අළුත්වැඩියා හා නඩත්තුව 60.00 67.48 12.47<br><br>මාර්ග සංවර්ධන අධිකාරියේ අයවැය මූලිකවම වියදම් අයවැයකි. සේවක පුහුණු කිරීම් හා දිරිදීමනාවන් හි හැර ඉහත පෙන්වන ලද අනිත් වියදම් අයිතමයන් හි විශාල විචලනයක් නොමැත. සේවක පුහුණු කිරීම් ඇස්තමේන්තු ගත කරන ලද්දේ සිටින සේවකයන් හා සැලසුම් කරන නව බඳවා ගැනීම් යන දෙපාර්ශවයම ඉලක්ක කර ගෙනය. එලෙසම බොහොමයක් පුහුණු වැඩසටහන් සඳහා සම්පත් දායකත්ව පුද්ගලයින් අභ්‍යන්තරයෙන් යොදා ගෙන කරන ලද නිසා අවම වියදමක් දරන ලදි. දිරිගැන්වීම් හි වාසිදායක විචලනයට හේතු වන්නේ වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමයි. (අනුමත මාතෘ වැටුප් රහිත නිවාඩු වැඩි වීමයි.) අයවැය සකස් කරන විට සත්‍ය පුරෝකථනයන් සිදු කිරීමට අසීරු වේ. එම නිසා සතුටු දායක අයවැය ගත පාලනයක් වියදමට එරෙහිව යොදවා ගෙන ඇත. |
| | | **(අ)** මාර්ග නඩත්තු සහ සේවා දායක වැඩ | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ගනුදෙනු වල ප්‍රමාණයන් හඳුනාගෙන ඒවායේ සම්බන්ධතාවයන් අනුව මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. ශේෂ පත්‍රයේ හා ආදායම් ප්‍රකාශනයේ පෙන්වන ලද තොරතුරු වලට අමතරව, අදාල හා ප්‍රමාණාත්මක තොරතුරු සැලකිල්ලට ගෙන පිටු 18 කින් (පිටු 04-21 දක්වා) ගිණුම්කරන ප්‍රමිත හා සාමාන්‍ය සටහන් යටතේ අනාවරණය කර ඇත. එනිසා අපගේ විශ්වාසය ඔබගේ වාර්තාවේ 2.2.1. (අ) හා (ආ)හි සඳහන් කරන ලද කරුණු දෙක හැර මූල්‍ය ප්‍රකාශන සාධාරණව ඉදිරිපත් කර ඇති බවයි. එලෙසම පද්ධති හා පාලන යටතට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ඇතුලත් නොවන බවද සඳහන් කිරීම කැමැත්තෙමි. |

| | | | |
|---|---|---|---|
| | | **(ආ)** සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනු හෙලිදරව් කිරීම | මූල්‍ය ප්‍රකාශන වල සම්බන්ධිත පාර්ශවයන් (මග නැගුම සමාගම්) සමග සිදු කරන ගනුදෙනු සාරාංශයක් ලෙස අනාවරනය කර ඇත. මෙයදැගිණුම්කරන ප්‍රමිත භාවිතයට ගැනීමේදි හටගන්නා එක්තරා ගැටළුවක් වන අතර පද්ධති හා පාලනයන් සමග සිදුකල හැකි කිසිවක් නොමැති බව දන්වමි. |
| | | **(ඇ)** ප්‍රාදේශිය කාර්යාල කළමනාකරණය | සමහර සම්පත් හා කාර්යාල මණ්ඩලයේ හිඟකම හේතුවෙන් ප්‍රාදේශිය කාර්යාලවල සමහර ගැටළු පැනනැගී ඇත. නමුත් එම ගැටළු සාර්ථකව මැඩ පැවැත්වීමට පසුගිය අවුරුදු කිහිපයේ අපට හැකි වි ඇත. පසුගිය වසරේ සවිස්තරාත්මක පුහුණු වැඩසටහන් ප්‍රාදේශිය කාර්යාල මණ්ඩල සඳහා ප්‍රාදේශිය මට්ටමින් ද,ප්‍රධාන කාර්යාලයේ පුහුණු අංශයේ හා වෙනත් බාහිර ආයතනයන්හි දි පවත්වන ලදි. |
| | | **(ඈ)** වාහන උපයෝජනය | මාර්ග සංවර්ධන අධිකාරියේ වාහන වලින් 80% කට වැඩි ප්‍රමාණයක් අවුරුදු 16 කට වඩා පැරණි වන අතර , නිතරම බහුලව සිදුකරනු ලබන අළුත් වැඩියාවන් සඳහා ක්‍රියාවිරහිතවීම් වලින් සමන්විත නිසා මාර්ග සංවර්ධන අධිකාරියේ වාහන උපරිම භාවිතයෙන් ප්‍රයෝජනයට ගැනිම ඉතා අසීරුය. කෙසේ වෙතත් මෙම පැන නැගී ඇති අඩුපාඩු මග හරවා ගැනිමට සියළු උත්සාහයන් ගනු ලැබේ. |
| | | **(ඉ)** වත්කම් කළමනාකරණය | මෙම ඉඩම් වල පරම අයිතිය මාර්ග සංවර්ධන අධිකාරියට හිමිවි නොමැති අතර ,ඉඩම් කොමසාරිස්ගේ උපදෙස් අනුව මෙම ඉඩම් මැනුම් කටයුතු සිදුකර පිඹුරුපත් අදාල ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත යැවිම මගින් ඒවායේ අයිතිය මාර්ග සංවර්ධන අධිකාරියට ලබා ගැනිමේ ක්‍රියාවලිය සිදුකිරිමට නියමිතය. මෙම කාර්යයෙන් 75% ක් පමණ මේ වන විට සම්පූර්ණ කර ඇති අතර පිඹුරුපත් ද ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත යවා ඇත. මෙම ඉඩම් වල පරම අයිතිය ලැබුණු පසු නියමාකාරයෙන් භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | | (ඊ) කොන්ත්‍රාත් පරිපාලනය | කොන්ත්‍රාත් ගිවිසුම් වලට අදාලව ගැටළු පැන නගිනුයේ ව්‍යාපෘති නිමකිරීමේ ප්‍රමාදයන් හා මුල් කොන්ත්‍රාත් මුදල /පිරිවැය ඇස්තමේන්තු අගයන් ඉක්මවා යාම යනාදියයි. කොන්ත්‍රාත් නිමකිරීමේ කාලය දීර්ඝ කිරීමට හේතු වන්නේ ජල, විදුලි, දුරකථන වැනි උපයෝගිතාවයන් නැවත ප්‍රතිස්ථාපනයට සිදු වීම, අමතර වැඩ සිදුකිරීම ,අයහපත් වැසි, සුළං සහිත කාලගුණය ආදි අනිකුත් නොවලැක්විය හැකි හේතුන් වේ.<br><br>ඇස්තමේන්තු පිරිවැය / කොන්ත්‍රාත් වටිනාකම ආදිය වෙනස් වීමට හේතු වන්නේ අමතර වැඩ භාර ගැනීම , අතිරේක ප්‍රමාණන් සිදුකිරීමට සිදුවීම හා මාර්ගයන් හි මතුපිට පරිහානියට ලක්වීම යනාදියයි. නමුත් ඇස්තමේන්තු පිරිවැය , අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියකින් තොරව අඩුකිරීමට නොහැකි අතර , විචලන නියෝගයන් නිකුත් නොකිරීමටද අවශ්‍ය නිසි අවධානය යොමු කර ඇත. වෙළඳපල බලපෑම් මත සත්‍ය වශයෙන් බල පවත්වන මිල උච්චාවචනය ඇස්තමේන්තු පිරිවැය වැඩි වීමට හේතු වන අනික් කරුණු වේ. මෙම කරුණු සැලකිල්ලට ගෙන පිරිවැය විචලනයන් අවම කිරීමට හා කොන්ත්‍රාත් පරිපාලනය දැඩි කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය අවශ්‍ය පියවර ගෙන ඇත. පෙර වසර සමඟ සැසඳීමේ දී , අධිකව වැඩි වූ වැඩ පරිමාවට සරිලන ලෙස 2011 වසර තුල කොන්ත්‍රාත් පරිපාලනය ද වැඩි දියුණු කර ඇති බව දක්නට තිබුණි. |

**මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව – 2011**

**1. <u>මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය සාධනය</u>**

2011 වර්ෂය තුල මාර්ග සංවර්ධන අධිකාරයේ කාර්ය සාධනය පිළිබඳ සියලු විස්තර ඉහත සඳහන් වාර්තාවේ 4 – 8 පරිච්ඡේදවල සඳහන් කර ඇත. මාර්ග සංවර්ධන අධිකාරියේ වැදගත් ක්ෂේත්‍රවල කටයුතු පිළිබඳව කාර්ය සාධනයේ සාරාංශයක් පහත දැක්වේ.

1. **මාර්ග නඩත්තුව ක්‍රියාත්මක කිරීම:** වර්ෂය තුළ කි.මී.12,019.39 ක් දිගැති සම්පූර්ණ ජාතික මාර්ග ජාලය සාමාන්‍ය තත්ත්වයෙන් පවත්වා ගනිමින් නඩත්තු කරන ලදි. මීට අමතරව දේශීය අරමුදල් භාවිතා කරමින්, කි.මී. 1,191.38 ක් වැලි මුද්‍රිත තාර ආලේප කරන ලද අතර මාර්ග කි.මී. 619.54 ක් යථා තත්ත්වයට පත්කර, පෘෂ්ඨය නැවත අළුත්වැඩියා කරන ලදි.

2. **දේශීය අරමුදල් යටතේ මහාමාර්ග සංවර්ධනය :** 2011 වර්ෂය තුල මාර්ග පුළුල් කිරීමේ හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති 361 ක් ප්‍රදානය කල අතර, ව්‍යාපෘති 115 ක් නිමකරන ලදි. 2011.12.31 දිනට තවත් ව්‍යාපෘති 246 ක කටයුතු සිදුකෙරෙමින් පැවතුනි. ඊට අමතරව පිළිවෙලින් රු:මිලියන 3,278 ක හා රු:මිලියන 3,161 ක වියදමින්, දැයට කිරුළ වැඩ සටහන යටතේ ව්‍යාපෘති 72 ක් හා හම්බන්තොට කේන්ද්‍රීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති 19 ක කටයුතු ක්‍රියාත්මක කරන ලදි.

3. **පාලම් ඉදිකිරීම:** දේශිය අරමුදල් භාවිතා කරමින් දුබල පාලම් 76 කටයුතුවල නිරත විය. එක්සත් රාජධානි අරමුදල් යෙදූ වානේ පාලම් ව්‍යාපෘතිය යටතේ වානේ පාලම් 33 ක් නිමකරන ලද අතර, වානේ පාලම් 24 ක වැඩ කටයුතු සිදු කරමින් පවතී.

4. **මාර්ග හා පාලම් සැලසුම් කිරීම:** අන්තර්ජේදන 21 ක වැඩ නිමකරන ලද අතර, අන්තර්ජේදන 62 ක වැඩ ඉටුකෙරෙමින් පවතී. මාර්ග කි.මී. 284.2 ක සැලසුම් වැඩ නිමකරන ලද අතර, තවත් කි.මී. 682.23 ක වැඩ ඉටු කෙරෙමින් පවතී. තවද පාලම් 70 ක සැලසුම් වැඩ නිම කෙරිණි.

5. **මාර්ග හා පාලම් වැඩවල තත්ත්ව පාලන කටයුතු:** 2011 වර්ෂය තුළ පර්යේෂණ හා සංවර්ධන අංශය පළාත් 09 ක්ෂේත්‍ර රසායනාගාර හා මන්නාරම-පූනරීන් මාර්ගයේ (A032) පිහිටුවා ඇති විශේෂ ක්ෂේත්‍ර රසායනාගාරය යටතේ, මාර්ග ඉදිකිරීම් හා නඩත්තු තුලදි අඛන්ඩව තත්ත්ව පාලන වැඩ සඳහා උපදෙස් හා සහාය ලබාදෙන ලදි.

6. **ඉඩම් අත්පත් කර ගැනීම හා ප්‍රතිස්ථාපනය :** දේශිය අරමුදල් යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද මාර්ග හා පාලම් ව්‍යාපෘති සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉඩම් අත්පත් කර ගැනීම් මාර්ග සංවර්ධන අධිකාරියේ ඉඩම් අත්පත්කර ගැනීමේ හා ප්‍රතිස්ථාපන අංශය විසින් සම්බන්ධීකරණය කරන ලද අතර, 2011 වර්ෂයේදි වන්දි වශයෙන් රු:මිලියන 1249.85 ක් ගෙවන ලදි.

7. **පාරිසරික හා සාමාජීය ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කිරීම:** මාර්ග සංවර්ධන අධිකාරියේ පාරිසරික හා සමාජීය අංශය විසින්, විවිධ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවල පා.බ.ත./ආ.පා.ත. වාර්තා පිලියෙල කිරීම ඇතුළු පාරිසරික හා සමාජීය ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කිරීමේදි අඛන්ඩව සහාය ලබා දෙන ලදි.

8. **සැලසුම්කරණය හා වාර්තාකරණය:** වර්ෂය තුළ ව්‍යාපෘති යෝජනා 12 ක් ක්‍රියාත්මක කරන ලදි. ශක්‍යතා අධ්‍යයන තුනක් සිදුකරන ලදි. ස්ථානීය හා විස්තරාත්මක සිතියම් 200 ට වැඩි සංඛ්‍යාවක්

පිලියෙල කෙරිණි. මාර්ග කි.මී. 8, 874.70 තත්ත්ව දත්ත පළාත් කාර්යාලවලින් රැස්කර ගන්නා ලදි. පිළිවෙලින් මාර්ග කි.මී. 3, 932.78 හා 1, 452.20 ක මාර්ග තත්ත්ව විමර්ශන බහුකාර්ය ජාල සමීක්ෂණ රථය හා පතිත බර උත්ක්‍රමණ මානය මගින් පවත්වන ලදි. ස්ථාන 101 ක රථවාහන ධාරිතා ගණනයද ස්ථාන 7 කදි ඇක්සල් බර සමීක්ෂණද පවත්වනු ලැබිය.

9. **මාර්ග ආරක්ෂාව හා රථවාහන කළමනාකරණය:** 2011 වර්ෂය තුළ මාර්ග කොටස් 11 ක් සඳහා රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම් සැලසුම් කරන ලද අතර මාර්ග කොටස් 6 ක් සඳහා රථවාහන සංඥා හා මාර්ග සැලසුම් කිරීම් සමාලෝචනය කරන ලදි. වැදගත් මාර්ග ස්ථාන 11 ක් දෝෂ ස්ථාන ලෙස වැඩි දියුණු කිරීම සඳහා හඳුනාගන්නා ලදි.

10. **අධිවේගී මාර්ග සංවර්ධනය:** දක්ෂිණ අධිවේගී මාර්ගයේ කොට්ටාව සිට පින්නදූව දක්වා කොටස නිමකර 2011 නොවැම්බර් මස මහජනයා සඳහා විවෘත කරන ලදි. කොළඹ-කටුනායක අධිවේගී මාර්ගයෙන් 53% ක් නිමකර තිබිණි. පිටත වටරවුම් මාර්ගයේ කොට්ටාව සිට කඩුවෙල දක්වා කොටස් ඉදිකිරීම සිදුවෙමින් පවතින අතර එහි වැඩවලින් 35.43% ක් නිමවී ඇත. වර්ෂය තුළ කොළඹ-මහනුවර විකල්ප මාර්ගයේ පූර්ව ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පැවතිණි.

11. **වෙනත් විදේශාධාර අරමුදල් ව්‍යාපෘති:** වර්ෂය තුළ ක්‍රියාත්මක කෙරුණු වෙනත් විදේශ අරමුදල් ව්‍යාපෘති ගණන 68 ක් වන අතර ඒවා ක්‍රියාත්මක කිරීමේ විවිධ අදියරයන්හි පැවතිණි. මෙම ව්‍යාපෘතිවලට මාර්ග පුනරුත්ථාපන, මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම, මාර්ග නඩත්තුව හා පාලම් ඉදිකිරීම් වැඩ අයත් විය.

**සමස්ත මූල්‍ය සාධනය:** මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා 2011 වර්ෂය තුළ විදේශ හා දේශීය අරමුදල් ඇතුළුව සමස්ත අරමුදල් වෙන්කිරීම රු:මිලියන 118, 531 ක් වූ අතර, වාර්ෂික වියදම රු:මිලියන. 97, 817 ක් විය. සමස්ත අරමුදල් වලින් විදේශ අරමුදල් දායකත්වය 50% කි.

| අරමුදල් මූලාශ්‍රය | ප්‍රතිපාදන (රු:මි) | වියදම (රු:මි) |
|---|---|---|
| දේශීය අරමුදල් | 34, 365 | 31, 453 |
| විදේශ ආධාර ණය | 61, 685 | 46, 173 |
| විදේශ ආධාර ප්‍රදාන | 1, 810 | 1, 379 |
| ප්‍රතිපූර්ණ විදේශාධාර ණය | 1, 250 | 920 |
| ප්‍රතිපූර්ණ විදේශාධාර ප්‍රදාන | 200 | 1 |
| විදේශාධාරවලට සම්බන්ධ දේශීය අරමුදල් | 19, 221 | 17, 892 |
| **එකතුව** | **118, 531** | **97, 817** |

## විගණන විමසුම් හා විගණන වාර්තාවල සඳහන් අඩුපාඩු නිවැරදි කර ගැනීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(a) 2012 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කර ඇත.

(b) 2012 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කර ඇත.

(c) 2012 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කර ඇත.

(d) අවශ්‍ය පැහැදිලි කිරීම් කර ඇත.

(e) i (v) 2012 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කර ඇති අතර අවශ්‍ය පැහැදිලි කිරීම් e (ii) (iii) හා (iv) සඳහන් කර ඇත.

(f) 2012 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කර ඇත.

(g) අවශ්‍ය පැහැදිලි කිරීම් කර ඇත.

(h) 2012 ස්ථාවර වත්කම් ලේඛනයේ නිවැරදි කර ඇත.

2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(a) ව්‍යාපෘති කළමනාකරණ ඒකකවලින් ලැබිය යුතු ඉතිරි මුදල් 2012 වසරේදි අයකර ගෙන ඇත.

(b) අනවසර දැන්වීම් පුවරු ඉවත් කිරීමේ කටයුතුවල ප්‍රගතියක් පවති.

(c) දැනට පවතින ව්‍යාපෘතිවල වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර ඇත.

(d) උමං මාර්ගවල කුලි ගාස්තු අයකර ගැනීමට නිතිමය පියවර ගෙන ඇත.

(e) අවශ්‍ය පැහැදිලි කිරීම් කර ඇත.

2.2.3 නීති රෙගුලාසි සහ කළමනාකරණ තිරණ වලට අනුකුල නොවීම.

සඳහන් කරන ලද කරුණු සඳහා අවශ්‍ය පැහැදිලි කිරීම් ලබාදි ඇති අතර එමගින් පැන නගින ගැටළු විසඳිම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

2.2.4 නොසැසඳූ ශේෂ

(ඒ) හා (බී) හි සඳහන් කරන ලද දෝෂයන් නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

2.2.5 විගණනය සඳහා සාක්ෂි

(ඒ), (බී), (සි) හා (ඊ) ට අදාළ තොරතුරු විගණකාධිපති වෙත යවා ඇති අතර (ඩී) සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

2.2.6 අධිකාරිය විසින් පෞද්ගලික සමාගම් සමඟ කළ ගණුදෙනු

(ඒ) හා (බී) මගින් දක්වන ලද ගැටළු නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

3.1 මූල්‍ය කාර්ය සාධනය

එමගින් පැන නගින ගැටළු සඳහා විස්තරාත්මක පැහැදිලි කිරීමක් ලබා දි ඇත.

3.2.1 වාණිජමය නොවන මෙහෙයුම් කටයුතු

පැන නගින ලද ගැටළු සඳහා විස්තරාත්මක පැහැදිලි කිරීමක් ලබාදි ඇත.

3.2.2 වාණිජමය මෙහෙයුම් කටයුතු

(ඒ), (බී) හා (සී) මගින් පැන නගින ලද ගැටළු සඳහා විස්තරාත්මක පැහැදිලි කිරීමක් ලබාදී ඇත.

3.2.3 කොන්ත්‍රාත් පරිපාලනය

දක්වන ලද අවස්ථාවන් නිවැරදි කිරීම සඳහා සුදුසු පියවර ගෙන ඇත.

3.2.4 මත භේදයට තුඩුදුන් කරුණු

(ඒ) හා (බී) ගැටළු වලට අදාල විස්තරාත්මක පැහැදිලි කිරීමක් ලබා දී ඇත.

3.2.5 වත්කම් කළමනාකරණය

(ඒ) සිට (පී) දක්වා ගැටළු වලට අවශ්‍ය පැහැදිලි කිරීම් ලබාදී ඇත.

3.2.6 මානව සම්පත් කළමනාකරණය

දක්වන ලද අවස්ථාවන් නිවැරදි කිරීම් සඳහා සුදුසු පියවර ගෙන ඇත.

3.2.7 වාහන උපයෝජනය

(ඒ) සිට (ඩී) දක්වා පැන නගින ගැටළු නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

3.2.8 අයවැය පාලනය

සතුටුදායක අයවැයගත පාලනයන් වියදමට එරෙහිව ක්‍රියාත්මක කර ඇත.

4 පද්ධති හා පාලන

(a) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මාර්ග සංවර්ධන අධිකාරිය මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරයි.

(b) ආශ්‍රිත සමාගම් සමඟ පවතින ගණුදෙනු සඳහා වන හෙලිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සාරාංශ ගතව ඉදිරිපත් කරයි.

(c) ප්‍රාදේශිය කාර්ය මණ්ඩලවල දැනුම වැඩි දියුණු කිරීම සඳහා විවිධාකාර පුහුණු වැඩ සටහන් පවත්වා ඇත.

(d) අඩුපාඩු මැඩ පැවැත්වීම සඳහා සියලු උත්සාහයන් ගෙන ඇත.

(e) ඉඩම්වල පරම අයිතිය ලබාගත් පසු යෝග්‍ය පරිදි උපයෝජනය සඳහා අවශ්‍ය පියවර ගනු ලැබේ.

(f) පිරිවැය විචල්‍යතාවයන් අවම කිරීමට කොන්ත්‍රාත් පරිපාලන කටයුතු මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දැඩි කර ඇත.

**<u>මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියා මාර්ග පිළිබඳ සාරාංශය.</u>**

1 ටෙන්ඩර් ඇගයීමේ හා ප්‍රදානය කිරීමේදී සිදුවන ප්‍රමාදයන් අඩු කිරීමට අතිරේක තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීම සඳහා පියවර ගෙන ඇත.

2 ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා අදාල නියෝජිත ආයතන සමඟ සාකච්ජා කිරීමට පියවර ගෙන ඇති අතර, වන්දි ගෙවීම සඳහා භාණ්ඩාගාරය වෙතින් අරමුදල් ලබා ගන්නා ලදි.

3 භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ වෙන් කරන ලද මුදල් සීමාව තුළ වැඩ කිරීමට ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්ට හා පළාත්භාර අධ්‍යක්ෂවරුන්ට උපදෙස් දෙන ලදි.

4 ක්‍රියාත්මක නොවන කොන්ත්‍රාත් වැඩ ප්‍රමාණය අඩු කිරීමට උපදෙස් දෙන ලදි.

5 මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩ සටහන් පැවැත්වීම නොකඩවා සිදුකරන ලදි.

6 අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීමට පියවර ගන්නා ලද අතර, මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට පියවර ගන්නා ලදි.

මොරටුව විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය යටතේ පවත්නා ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ පාඨමාලාව හදාරන ලද පළමු කණ්ඩායමේ උපාධිධාරීන් 5 දෙනෙකු (ප්‍රවාහන ක්ෂේත්‍ර විශ්ලේෂක - Transport Systems Analyst) මාර්ග සංවර්ධන අධිකාරියේ සැලසුම් අංශයේ විශේෂිත වූ දැනුමක් අවශ්‍ය කාර්යයන් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලදි.

7 ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන පුනරුත්ථාපන හා මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉදිකිරීම් අධීක්ෂණ උපදේශක අංශයක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින්ම ස්ථාපනය කර ඇති අතර, මෙය මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලයේ ඉදිකිරීම් කළමනාකරණය සහ ව්‍යාපෘති කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමට බෙහෙවින් උපකාරී වී ඇත.

8 මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අවශ්‍ය වන ශක්‍යතා අධ්‍යයනය මාර්ග සැලසුම් සකස් කිරීම සහ කොන්ත්‍රාත් ලිපි ලේඛන සැකසීම මාර්ග සංවර්ධන අධිකාරිය විසින්ම ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කර ඇත. මෙමගින් මාර්ග සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමටත්, ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වන පිරිවැය අවම කර ගැනීමටත් හැකියාව ලැබෙනු ඇත. මෙය මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්ෂණික කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමටත්, තාක්ෂණික දැනුම වර්ධනය කිරීමටත් බෙහෙවින් උපකාරී වී තිබේ.